සිළුමිණ

சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 92 වැනි කාණ්ඩය 06 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ කුම්භ රවි 3 භාග නවම් පුර තියවක ඉරිදා ■ වර්ෂ 2021ක් වූ පෙබරවාරි මස 14 වැනි ඉරිදා මිල රු 80.00

සිළුමිණ සමඟ රසඳුන හා ක්‍රීඩා අතිරේක කියවමු

කාන්තා/ පිරිමි පොලිස් කොස්තාපල් තනතුරු ඇබෑර්තු ඇතුළත් ගැසට් පත්‍රය මෙවර

වටපිට/ මංගල යෝජනා/ ලුහුඬු දැන්වීම් සහ අනෙකුත් දැන්වීම්

පිට 37
පිට 44

↘03

සුදර්ශියට අත නොතබමු!

↘05

බදුල්ලේ නගර සභාවේ හුටපටය

↘09

විද්‍යා පීඨවලට කුඩම්මාගේ සැලකිලි

↘17

ටෝනි මාටින් ඝාතනයේ සුලමුල

↘22-23

විජය සමුගෙන වසර 33යි

↘25

හොරොව්පොතානේ 'අලි ගැහිලි'

තවත් රටවල් රැසක

සංචාරකයන්ට දොර ඇරේ

(තාරක වික්‍රමසේකර)

කොවිඩ් මර්දනයේදී මෙරට දක්වා ඇති සුවිශේෂී කාර්යභාරය නිසා ඉදිරියේදී ඉන්දියාව, ජර්මනිය, ඉතාලිය ඇතුළු රටවල් රැසකින් සංචාරකයන් මෙරටට පැමිණීමට කටයුතු කරනු ඇතැයි සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග කීය.

සංචාරක කර්මාන්තය නිසා මෙරටට ලැබුණු විශාල ආදායම අහිමි වී ඇති බව පැවසූ ඇමැතිවරයා ඊටත් වඩා ප්‍රබලම ගැටලුව වී ඇත්තේ සංචාරක කර්මාන්තයෙන් යැපුණු ලක්ෂ 3කගේ පමණ ආදායම් මාර්ගය අහිමි වීම බවද පෙන්වා දුන්නේය. යුක්රේන සංචාරකයන් මෙරටට ගෙන්වීමේ නියමු ව්‍යාපෘතිය අනුව ඉදිරියේදී සංචාරකයන් මෙරටට ගෙන්වීමට කටයුතු කර ඇතැයිද හෙතෙම අවධාරණය කළේය.

පාඩම් විභාග අහෝසියි

පෙළ පොත වෙනුවට පාසලට වැඩ පොතක් එයි!

සා.පෙළ සහ උ.පෙළ විභාග වෙනුවට වැඩ පොත!

(සුභාෂිණී ජයරත්න)

පාසල් පෙළ පොත් පාඩම් විභාග ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමට කටයුතු යොදා ඇතැයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය ලේකම් ආචාර්ය උපාලි සේදර සිළුමිණට පැවැසීය.

ඒ අනුව 2023 වසරේ සිට සිසුන්ට පෙළ පොත් භාවිතයෙන් විභාගවලට මුහුණ දීමට සිදු නොවන බවත් සිසුන්ට පෙළ පොත වෙනුවට වැඩ පොතක් හඳුන්වා දීමට කටයුතු කරන බවත් ලේකම්වරයා කීය.

>> 2 වැනි පිටුවට

ඩී.ආර්. විජයවර්ධන සමරුව 19 සහ 20

ලේක්හවුස් ආදි කර්තෘ ඩී.ආර්. විජයවර්ධන සමරු පින්කම පෙබරවාරි 19 සහ 20 දෙදින ලේක්හවුස් මන්දිරයේදී පැවැත්වේ. පෙබරවාරි 19 වැනිදා රාත්‍රී සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයක් පවත්වන අතර 20 දහවල් සපිරිකර සංඝගත දක්ෂිණාවක් පැවැත්වේ. ඩී.ආර්. විජයවර්ධනයන් පිළිබඳ සිළුමිණ පළ කරන විශේෂ ලිපි සිළුමිණ මෙවර කලාපයේ 28, 29 සහ 30 පිටුවල පළවේ.

වසර 05ක දැඩි පර්යේෂණ මත නිෂ්පාදනය වූ

ALOE RELIEF EXTRACT Research Product

මෙහි ක්‍රියාකාරිත්වය ලෙස
● සෛල ප්‍රතිදත්පාදනය ● සෛල ප්‍රකෘතිමත් කිරීම
● සෛල ප්‍රතිඔක්සිකාරක හැකියාව.
දිනපතා 30ml පානය කර නිරෝගිමත් වන්න.

මෙම Aloe Relief Extract ඖෂධයේ අඩංගු වන්නේ 100% ක් සම්පූර්ණ කෝමාරිකා පත්‍රයේ ශුෂය පමණකි. මෙහි කිසිදු රසකාරක හෝ ජලය එකතු කර නොමැත. මි.ලි.30 බැගින් දිනකට දෙවරක් මාස 6ක කාලයක් නොකඩවා ගැනීමෙන් Type 2 දියවැඩියාවෙන් මිදිය හැකිය.

රු. 795/- රු. 900/-

දියවැඩියාව සහ අනෙකුත් ගැටලු නිසා ඔබට ඇතිවන ලිංගික බෙලහීනතාවය සාර්ථකව සුවකර ගැනීමට Josh M කරල් සහ Oil

දියවැඩියාවෙන් මිදීමට

- දියවැඩියා රෝගීන්ට ප්‍රමාණවත් ඉන්සියුලින් ශ්‍රාවය නිෂ්පාදනය සඳහා අග්න්‍යාශයේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කරයි.
- බීටා සෛල ප්‍රජනනයෙන් ඉන්සියුලින් ශ්‍රාවය වැඩි කිරීම හේතු කොටගෙන බෙහෙත් මත යැපීම නැති කරයි.
- දියවැඩියාවේ අතුරු අබාධ වන ඇස්වල සහ අත්පා දැවිල්ල, හිරිවැටීම නැති කරන අතර නිතර නිතර මුත්‍රා පිට කිරීමේ අවශ්‍යතාවය අවම කරයි.
- දියවැඩියාවෙන් පෙළෙන්නන් ජීවිත කාලය පුරාම බෙහෙත් මත යැපිය යුතු වුවත් Aloe Relief Extract යුෂය නිසා දියවැඩියාවෙන් මිදී ඖෂධවලින් තොරව ජීවත්විය හැක.
- ශීතකරණයේ තබා භාවිතා කරන්න.

PDS -02/2021

ආයුර්වේද සූත්‍ර කමිටුව මඟින් අනුමත කර ඇත.

PJ PharmaCare (Pvt) Limited
සියලුම ගාමසි සහ දිවයිනේ ප්‍රමුඛ පෙළේ ගාමසි මගින් මිලදී ගත හැක.
0777 003 410 / 0741 365 335
655/6, ඇල්විටිගල මාවත, කොළඹ-05 www.lifefirst.care

සියලු රටවැසියන්ට එන්නත් ලබාදීමෙන් කොවිඩ්වලින් තොර දකුණු ආසියාවේ ප්‍රථම රට බවට ශ්‍රී ලංකාව පත් කරන බව ජනපති කාර්යසාධක බලකායේ ප්‍රධානියා කියයි

කොළඹ වරාය නගර ව්‍යාපෘති සමාගම විසින් ශ්‍රී ලංකා රජයට පීසීආර් යන්ත්‍රයක් සහ පරීක්ෂණ කට්ටල 5,000ක් පෙබරවාරි 12 වැනිදා පරිත්‍යාග කරන ලදී. එහි මුළු වටිනාකම රුපියල් කෝටි දෙකකට අධිකය. කොළඹ වරාය නගර ව්‍යාපෘතිය යනු වත්මන් කොළඹ මධ්‍යම වාණිජ කලාපයේ දිගුවක් ලෙසින් අලුතින්ම ඉදිවන නගර සංවර්ධන ව්‍යාපෘතියකි. මුහුද ගොඩ කිරීමෙන් බිහි කරන හෙක්ටයාර 269ක අලුත්ම භූමි ප්‍රමාණයක් වත්මන් කොළඹ වාණිජ කලාපයට සහ සම්බන්ධීකරණය කෙරේ.
මෙහිදී පරිත්‍යාගය බාර ගනිමින් ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ජනාධිපති කාර්යසාධක බලකායේ සභාපති බැසිල් රාජපක්ෂයන් කියා සිටියේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ පරිදි සියලු රටවැසියන්ට එන්නත් ලබා දී ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ කොවිඩ් 19 රෝගයෙන් තොර පළමු රට බවට පත් කරන්නට කටයුතු කරන බවයි. මෙම අවස්ථාවට රාජ්‍ය අමාත්‍යවරුන් වන විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහාචාර්ය චන්න ජයසුමන, විජිත බේරුගොඩ, පෝර්ට් සිටි කොළඹ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ජයින් හවුලින් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

සපුෂ්පික ශාක අඩක් වඳ වෙන ලකුණු

(නිහාල් පී. අබේසිංහ)

ජෛවීය අලුත් ජාතික රතු දත්ත තොරතුරු ග්‍රන්ථයට අනුව මෙරට සපුෂ්පික ශාකවලින් සියයට 48 ක්ම වඳවීයාමේ තර්ජනයට පත්වී ඇතැයි ජාතික උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රවීණ ජ්‍යෙෂ්ඨ උද්භිද විද්‍යාඥ ආචාර්ය සිරිල් විජයසුන්දර පවසයි.

>> 2 වැනි පිටුවට

මාධ්‍යවේදීන්ට කොවිඩ් එන්නත දෙන්න

>> 2 වැනි පිටුවට

රෝගීන් නිවසේ තබා ප්‍රතිකාර කිරීමට යෝජනා

>> 2 වැනි පිටුවට

ජයලාල් රෝහණ අවසන් කටයුතු ඉරිදා

ප්‍රවීණ කලාකරු ජයලාල් රෝහණගේ (56) අවසන් කටයුතු 14 ඉරිදා පස්වරු 4.30ට බොරැල්ල කනත්තේදී සිදු කෙරේ. ඔහු පසුගිය 11 වැනිදා හෘදයාබාධයකින් මියගියේ රාගම ශික්ෂණ රෝහලේදීය. දේහය ගණේමුල්ල, කොස්සින්න, ශ්‍රී සීලානන්ද මාවතේ අංක 50/3 නිවසේ තැන්පත් කර ඇති අතර මහජන ගෞරවය සඳහා කොළඹ 07 සුදර්ශි ශාලාව වෙත 13 සෙනසුරාදා සවස 6ට ගෙන ඒමට නියමිතව තිබුණි. ජයලාල් රෝහණයන් පිළිබඳ මෙවර සිළුමිණ කතු වැකිය (4පිටුව) ලියවී ඇත.

"පැණියට බැන්නා. ඉන්ජෙක්ෂන් එක ගේන්ට බෑක්, කිව්වා. ගෙනාවත් තමන්ගේ අයට විතරක් දෙයි, කිව්වා. අප්පා... මේ ඇත්තෝ විපක්ෂයේ දේශපාලනය කරන අපූරුව..."

පඬු කරඳ ගහට මොකද වෙන්නේ?

● නිහාල් පී. අබේසිංහ

අපේ රටේ ජෛව විවිධත්වය ලොව ඉහළම මට්ටමක පවතී. ලෝක ව්‍යාප්ත ජෛව විවිධත්වය උච්චතම ස්ථාන පිළිබඳව කළ අලුත් සමීක්ෂණ අනුව ලොව එවැනි සුවිශේෂී ජෛව විවිධත්වයෙන් යුතු ස්ථාන (Hot spot) 23 ක් ඇති බව සොයාගෙන තිබේ. ඉන් එක් ස්ථානයක් වන්නේ අපේ සුන්දර ශ්‍රී ලංකාවයි.

අපේ රටේ ජෛව විවිධත්වය පිළිබඳව මීට වසර 8 කට පමණ කළ විද්‍යාත්මක අධ්‍යයන අනුව අපේ රටේ ආවේණික ශාක විශේෂ 932 ක් තිබූ බව වාර්තා විය.

2020 අලුත්ම රතු දත්ත ලැයිස්තුව ළඟදීම නිකුත් කිරීමට නියමිත අතර ඒ රතු දත්ත ලැයිස්තුව අනුව 2020 වනවිට මෙරට සපුෂ්පික ශාකවලින් සියයට 48 ක් වඳ වී යාමේ තර්ජනයට පත්වී හමාර බවද ජාතික රතු දත්ත ලැයිස්තුව වැඩිවී ඇති බවද උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ජ්‍යෙෂ්ඨ උද්භිද විද්‍යාඥ ආචාර්ය සිරිල් විජයසුන්දර මහතා පවසයි.

පසුගිය දිනවල කතා බහට ලක්වූ පඬු කරඳ හෙවත් 'කෘඩියා සිලනිකා' ශාකයද අපේ රටට ආවේණික ලෝකයෙන් ම තුරන් වූ රතු දත්ත ලැයිස්තුවට අයත් ශාකයකි.

ගම්පහ දාරළුව දුම්රිය ස්ථානය අසල පිහිටි වන ලැහැබකින් හමුවූ පඬු කරඳ හෙවත් 'කෘඩියා සිලනිකා' ගස සොයා ගත්තේ මධ්‍යම අධිවේගයේ කඩවත - මීරිගම මාර්ග කොටස ඇතුළතට අයිති බිම් ප්‍රදේශයක තිබියදීය.

පේරාදෙණිය උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු ජාතික ශාකාගාරයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ආචාර්ය සුභානි රණසිංහ පවසන පරිදි මෙම පඬු කරඳ (Cradia zeylanica) ශාකය අපේ රටින් මුලින් හඳුනා ගත් බවට වාර්තා වී ඇත්තේ 1868 දීය. ඒ බෙන්තර ගඟ අසලදීය. ඊට පසු 1911 දී පේරාදෙණිය උද්භිද උද්‍යානයේ මේ ගස තිබී ස්වාභාවිකව මරණයට පත්වී ඇත.

මෙම ශාක විශේෂය 1998 වසරෙන් පසු යළි ලෝකයෙන් ම හමුවී නැති බව ද වඳවී යාමේ තර්ජනයට ලක්වී ඇති ශාක සම්බන්ධ දත්ත ලැයිස්තු ඇතුළත් අන්තර්ජාතික රතු දත්ත නාමාවලියේ 1998 සිට මෙහි නම සඳහන් බව ද ආචාර්ය සුභානි රණසිංහ පෙන්වා දෙන්නීය. තෙත් කලාපයේ පහත් බිම්වල විශාල ලෙස වැඩී තිබුණු ශාකයක් වන මේ පඬු කරඳ ශාක විශේෂය 2006 දීද ජාත්‍යන්තර රතු දත්ත නාමාවලියට ලෝකයෙන් ම වඳවී ගිය ශාක විශේෂයක් ලෙස එක්කර තිබේ. ඊට පසු 2012 ජාතික රතු දත්ත ලැයිස්තුවේ ද මෙය වඳවී ගිය ශාකයක් (Extinct) ලෙස නම්කර ඇති බවත් ශාකය යළි 2019 දී දාරළුවෙන් සොයාගෙන ඇත්තේ පරිසරවේදී උපාධි අපේක්ෂක ඉංජිනේරු හිමේෂ් ඩිල්රුවන් ජයසිංහ විසින් බවත් ආචාර්ය සුභානි රණසිංහ පවසන්නීය.

මෙම ශාකය 2019 දී සොයාගත් හිමේෂ් ඩිල්රුවන් ජයසිංහ පවසන්නේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් තමාට බාර දුන් මහනුවර අධිවේගී මාර්ගයේ කඩවත - මීරිගම කොටස පිළිබඳව පාරිසරික ඇගැයීම් වාර්තාවක් සකස් කිරීමේදී ගම්පහ - දාරළුව දුම්රිය ස්ථානය අසලදී මෙම ගස හමුවූ බවයි. මේ පිළිබඳව ඔහු උද්භිද උද්‍යානයේ ජාතික ශාකාගාරයට තොරතුරු ලබාදීමෙන් පසුව හා එහි මල් පරීක්ෂා කිරීමෙන් පසු මෙම ශාකය දැනට රතු දත්ත ලැයිස්තුවට ඇතුළත් 'පඬු කරඳ හෙවත් කෘඩියා සිලනිකා ශාකය බව උද්භිද විද්‍යානුකූලව ස්ථිරවම හඳුනාගෙන ඇත.

කෘඩියා සිලනිකා ශාකය ලංකාවේ තවත් තැන් 7 ක තිබෙනවා

පේරාදෙණිය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ආචාර්ය අචලා අත්තනායක

"පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය අචලා අත්තනායක මහත්මිය කළ ගවේෂණ අනුව මෙම පඬු කරඳ හෙවත් කෘඩියා සිලනිකා ශාකය ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ ස්ථාන 7 කින් සොයාගෙන ඇත. එම ස්ථාන 7 නම් ගම්පහ දාරළුව, බෙම්මුල්ල, හෙනරත්ගොඩ (උද්භිද උද්‍යානයේ ඇළ අසල), දොරණගොඩ, මීගමුව කදිරාන, කඩුවෙල හා කන්නිමහර යන ප්‍රදේශවලය. ඒ අනුව මෙම ශාකය අපේ රටේ තිබෙන්නේ දාරළුවේ පමණක් යන මතය බිඳ වැටෙන බව උද්භිද විද්‍යාඥයෝ පවසති.

ජාතික භික්ෂු පෙරමුණ ප්‍රමුඛ භික්ෂු සංවිධාන විසින් සාංඝික කරන ලද පඬු කරඳ ගස

"මේ ගසේ අත්තක් කැපුවත් මුලක් කැපුවත් වරෙන්තු නැතිව අත්අඩංගුවට ගන්න පුළුවන්"

- පරිසර නීතිඥ ආචාර්ය ජගත් ගුණවර්ධන

ස්ථානය අසලදී මෙම ගස හමුවූ බවයි. මේ පිළිබඳව ඔහු උද්භිද උද්‍යානයේ ජාතික ශාකාගාරයට තොරතුරු ලබාදීමෙන් පසුව හා එහි මල් පරීක්ෂා කිරීමෙන් පසු මෙම ශාකය දැනට රතු දත්ත ලැයිස්තුවට ඇතුළත් 'පඬු කරඳ හෙවත් කෘඩියා සිලනිකා ශාකය බව උද්භිද විද්‍යානුකූලව ස්ථිරවම හඳුනාගෙන ඇත.

එසේ වුවත් පසුගිය සතියේ මෙම ශාකය පිහිටි පරිසර පද්ධතිය ඇතුළත් ප්‍රදේශය මධ්‍යම අධිවේගය ඉදිකරන චීන සමාගමක පිරිසක් විසින් බුල්ඩෝසර් කර තිබේ. ඒ අනුව මෙම ස්ථානයේ තිබූ පඬු කරඳ ශාකය හැර තවත් වඳවී යාමේ තර්ජනයට ලක්ව තිබූ ශාක ප්‍රභේද 5කට අයත් ශාක 5 ක් හා ආරක්ෂිත ලැයිස්තුවේ ඇති ශාක වර්ග 5 ක් විනාශ කර ඇති බව ගම්පහ දිස්ත්‍රික් දිසා වන සංරක්ෂණ නිලධාරිනී දේවානි ජයතිලක පවසන්නීය.

"මෙතැන පඬු කරඳ ශාකය වගේ ම තවත් තර්ජනයට ලක්වී තිබූ ලොකු ගහක් තිබුණා. ඒකත් විනාශ කරලා." මෙම ස්ථානයට ගොස් ස්ථානීය පරීක්ෂණයක් කළ වන නිලධාරිනිය පෙන්වා දෙන්නීය.

වනජීවී අධ්‍යක්ෂ ජනරාල් චන්දන සූරියබණ්ඩාර මහතා පැවසූයේ මෙම ශාකය මෙම ස්ථානයෙන් ප්‍රවේශම් ලෙස ගලවා ගෙන වෙනත් ආරක්ෂක ස්ථානයක සිටුවීමට තමන් විරුද්ධත්වයක් නැති බව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට දන්වා ඇති බවයි.

ඊට අදාළ ලිපිය පසුගිය දෙසැම්බර් මාසයේදී යැවූ බවත් කෙසේ වුවත් මෙම ශාකය නොගැඹුරු ජලය සහිත පරිසර පද්ධතියක වනජීවී හෝ වන සංරක්ෂණ කලාපයක සිටු විය යුතු බවත් චන්දන සූරියබණ්ඩාර මහතා පවසයි.

මෙච්චර ලොකු ගහක් ගලවාගෙන ගොස් සිටෙච්චාට වර්ධනය වීම සැක සහිතයි

- ප්‍රවීණ උද්භිද විද්‍යාඥ ආචාර්ය සිරිල් විජේසුන්දර

මේ පිළිබඳව අප කළ විමසුමකදී කරුණු දැක්වූ ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලයේ වනවිද්‍යා මහාචාර්ය හේමන්තී රණසිංහ මහත්මිය පැවසූයේ අඩි 50 ක් පමණ උස ඇති බව කියන මෙතරම් විශාල ගහක් මෙම ස්ථානයෙන් ගලවා තවත් තැනක සිටුවීම අසාර්ථක කටයුත්තක් බවයි. මෙවැනි ගසක් තවත් තැනක සිටුවීමට කටයුතු කිරීම උද්භිද විද්‍යාත්මකව 'රූට් බෝල්' ලෙස හඳුන්වනවා. ඒ සඳහා මාස 6 ක පමණ සිට සූදානම් විය යුතුයි.

නමුත් එක්වරම කිසිඳු සූදානමක් නැතිව ඒ ගස ගලවා පෞද්ගලික ආයතනයක් විසින් නැවත සිටුවීම කිසිම විද්‍යාත්මක පදනමක් නැති කටයුත්තක්. කළ යුත්තේ මෙම ගස තිබෙන ස්ථානයේ ම එය ස්ථානීය සංරක්ෂණය කිරීම යැයි මහාචාර්ය වරිය පවසන්නීය.

මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත - මීරිගම කොටස භාරව කටයුතු කරන මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ ඩබ්ලිව්.කේ. කොඩිතුවක්කු මහතා පවසන්නේ මෙම ශාකය මෙම ස්ථානයෙන් ඉතා ආරක්ෂිතව ඉවත් කර එය අසල ම සංරක්ෂණ කලාපයක 'රූට් බෝල්' ක්‍රමයට සිටුවන බවයි.

"මේ වර්ගයේ ගස් 6 - 7 ක් අපේ රටේ විවිධ ප්‍රදේශවල තිබෙන බව වාර්තා වෙනවා. පේරාදෙණිය උද්භිද උද්‍යානයේ මේ වර්ගයේ පැළ තිබෙනවා. ඒ අනුව මේ ගස ලෝකයේම තිබෙන මේ වර්ගයේ එකම ගස කියන එක වැරැදියි.

කෙසේ වුවත් අපි මේ ශාකය ගලවා ඒ අසලම ප්‍රදේශයේ ආරක්ෂිත සිටුවන්න සැලසුම් කර අවසන්. මෙම ස්ථානයේ දුම්රිය මාර්ගය යන නිසා අධිවේගී මාර්ගයේ ගමන් මාර්ගය වෙනස් කරන්න අපට හැකියාවක් නැහැ. කෙසේ වුවත් මේ ගැටලුව නිරාකරණය කරන තුරු අධිවේගී මාර්ගයේ ඒ කොටසේ කටයුතු දැනට අපි තාවකාලිකව නතර කර තිබෙනවා යැයි කොඩිතුවක්කු මහතා පවසයි.

වමේ සිට ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වනවිද්‍යා මහාචාර්ය හේමන්තී රණසිංහ, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සිරිල් විජේසුන්දර, ගම්පහ දිස්ත්‍රික් වන නිලධාරිනී දේවානි ජයතිලක ඉංජිනේරු පරිසරවේදී හිමේෂ් ඩිල්රුවන් ජයසිංහ.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ජ්‍යෙෂ්ඨ උද්භිද විද්‍යාඥ ආචාර්ය සිරිල් විජේසුන්දර මහතා පවසන්නේ මෙවැනි අඩි 40 - 50 ක් උස යැයි කියන ශාකයක් ගලවා වෙනත් ස්ථානයක සිටුවීම අවදානම් සහගත ක්‍රියාවක් බවයි.

"එය 100% ක් සහතික කළ නොහැකි වැඩක්. පේරාදෙණිය උද්භිද උද්‍යානයේ මේ වර්ගයේ පැළ තිබුණත් ඒවා කොපමණ කාලයකින් මෙවැනි මහ ගසක් ලෙස වර්ධනය කිරීමට හැකියාව ලැබේ දැයි සැකසහිතයි. ඒ නිසා ස්ථානීය සංරක්ෂණය වැදගත්. කෙසේ වුවත් රටේ සංවර්ධන ක්‍රියාදාමයත් සිදුවිය යුතුයි යැයි ආචාර්ය සිරිල් විජේසුන්දර පවසයි.

මේ පිළිබඳව කරුණු දක්වන පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පවසන්නේ මෙම ශාකය මෙම ස්ථානයෙන් ඉවත් නොකරන ලෙස තමා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ප්‍රේමසිරි මහතාට දැනුම් දුන් බවයි.

මෙම ගස ඉවත් කිරීමට අත්‍යවශ්‍යම නම් සූරියවැව ප්‍රදේශයේ සිටින දැනට ඒ ප්‍රදේශයේ බෝ ගසක් ගලවා ඉවත් කර සාර්ථකව යළි සිටවූ තරුණයකුගේ සහාය ඒ සඳහා ලබා දිය හැකි බවත් ඇමැතිවරයා පවසයි. ඒ සඳහා වැය වන මුදල තමන් පෞද්ගලිකව වියදම් කිරීමට සූදානම් බව පවසන ඇමැතිවරයා මෙම ගස සුරැකීම පිළිබඳව දැඩි අවධානයෙන් පසුවන බව ද පවසයි. ප්‍රවීණ පරිසර නීතිඥ ජගත් ගුණවර්ධන මහතා පැවසූයේ මෙම ශාකය වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ ආරක්ෂිත ශාකයක් ලෙස නම් කර ඇති මෙම ශාකය කැපීම එහි අත්තකට මුලකට හානි කිරීම මෙන් ම ශාකය මැරීමට යම් යම් ද්‍රව්‍ය පාවිච්චි කිරීම වරෙන්තු නොමැතිව අත්අඩංගුවට ගත හැකි වරදක් බවයි.

ගස පිළිබඳ බලන්න වනජීවී හා වන සංරක්ෂණ ලේකම් සමඟ දිස්ත්‍රික් ලේකම් ඇවිත්

මෙවැනි විනාශකාරී කටයුතු කරන පුද්ගලයකට හෝ ඔහුට අනුබල දෙන අයකුට නඩු පැවරීමට වනජීවී සංරක්ෂණ, වන සංරක්ෂණ නිලධාරීන්ට මෙන් ම පොලිස් නිලධාරීන්ටත් හැකියාව ඇත. ඒ අනුව මෙම ශාකයට හානි කරන ඕනෑම ආයතනයකට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමේ අයිතිය ඇති බව අවධාරණය කරන බවත් ජගත් ගුණවර්ධන මහතා පවසයි.

මේ පිළිබඳව කරුණු දක්වන වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය සී.බී. රත්නායක මහතා පවසන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරු හා අමාත්‍යාංශ ලේකම්වරයා හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් මේ පිළිබඳ අධ්‍යනය කිරීමට එම ස්ථානයට ගොස් ඇති බවයි. ඒ අනුව එම ගස සුරැකීමට හැකි සෑම පියවරක්ම රජය ගන්න බවත් කිසිම නිලධාරියෙක් හෝ මේ ශාකය හුදෙකලා කර නොමැති බවත් ඇමැතිවරයා පවසයි.

මූල පිටින් ගලවාගෙන ගොස් ආරක්ෂිතව ළඟ තැනක සිටුවනවා

- මාර්ග සංවර්ධන ව්‍යාපෘති අධ්‍යක්ෂ ඩබ්ලිව්.කේ. කොඩිතුවක්කු

පසුගියදා කාඩියා සිලනිකා ශාකය නිරීක්ෂණය කිරීමට ගිය වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් බන්දුල හරිස්චන්ද්‍ර මහතා පැවසුවේ මෙවැනි විශාල මූල පද්ධතියක් සහිත ගහක් වෙනත් තැනක ප්‍රතිෂ්ඨාපනය කිරීම දැඩි අවදානම් සහගත කටයුත්තක් බවයි.

ලෝකයේ වෙනස් කිරීමට බැරි දෙයක් නැතැයි පැවසූ ලේකම්වරයා අධිවේගී මාර්ගය ගමන් කිරීමට යෝජිත මාර්ගය වෙනස් කිරීමට අපහසු හේතු මොනවාද යන්න මාර්ග සංවර්ධන අධිකාරියෙන් විමසයි. ඒ සමගම මෙම ගස මැදිකොට දෙපැත්තෙන් අධිවේගී මාර්ගය යාමට කටයුතු කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරින්ගෙන් ලේකම්වරයා ඉල්ලීමක් කළේය. ගහකොළ ඇතුළු මේ පරිසරය සුරැකෙන පරිදි හොඳම තීරණය සුදුසු වේලාවෙදි ගන්න බව පැවසූ බන්දුල හරිස්චන්ද්‍ර මහතා මේ ගස සුරැකීම වන ජීවී සංරක්ෂණ අධ්‍යක්ෂවරයාගේ වගකීමක් බවද පැවසීය.

මෙම ස්ථානයට ගිය ගම්පහ දිස්ත්‍රික් ලේකම් සුනිල් ජයලත් මහතා පැවසුවේ රටේ වුවමනාව වී ඇත්තේ මෙම ගසත් ආරක්ෂා කරගෙන සංවර්ධන කටයුතු සිදු කිරීම බවයි.

කෙසේ වුවත් ඒ අවස්ථාවේදි මෙම ස්ථානයට පැමිණි පුද්ගලයකු පවසා ඇත්තේ මෙම ගස සුරැකීම පිළිබඳව බැලීමට පසුගිය වසර දෙක ඇතුළත වාහන සිය ගණනකින් නිලධාරින් සිය ගණනක් මෙම ස්ථානයට පැමිණියත් එලක් නොවූ බවයි.

මෙම ශාකය පිළිබඳ කටයුතු අධ්‍යයනයේදී මධ්‍යම පරිසර අධිකාරියට ඇති බලතල අනුව මෙම ශාකය පිළිබඳ ඉදිරි වැඩකටයුතු සඳහා මාර්ග සංවර්ධනය අධිකාරියට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දුන් බව මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරි අමරසිංහ මහතා පවසයි.

කාන්තා කළමනාකරණ ආයතනය විසින් ක්‍රියාත්මක කරන 'top 50 professional and carrer woman awards Sri Lanka 2020' වෘත්තීය කාන්තා සම්මාන උලෙළේදී මාධ්‍ය අංශයේ වෘත්තීය දායකත්වය වෙනුවෙන් සම්මානයට පාත්‍ර වූ 'සිළුමිණ' ව්‍යාපාරික කර්තෘ ඉනෝකා පෙරේරා බණ්ඩාර අගයමින් ලේක්හවුස් ආයතනයේ සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්නයන් විසින් සමරු තිළිණයක් පිළිගැන්වූ අයුරු.

(සේයාරූව - සමන් ශ්‍රී වෙදගේ)

බ්‍රිතාන්‍ය කොවිඩ් ප්‍රභේදය ප්‍රදේශ කිහිපයකින්

(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

බ්‍රිතාන්‍යයේ ව්‍යාප්ත වෙමින් පවතින කොවිඩ් වෛරස ප්‍රභේදය (B.1.1.7) මෙරට ප්‍රදේශ කිහිපයකින් හඳුනා ගැනීමට හැකි වූ බව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආචාර්ය චන්දිම ජීවන්දර පවසයි.

ජනවාරි මාසයේ සිට පෙබරවාරි මාසය දක්වා ජෛව සාම්පල් 92 ක් මෙම ඩී.එන්.ඒ. පරීක්ෂණය සඳහා යොමු කළ බව ද හෙතෙම සඳහන් කළේය. අනෙකුත් ප්‍රභේදවලට වඩා 50% ක වැඩි වේගයකින් මේ වෛරස ප්‍රභේදය පැතිර යන බව ද ඔහු සඳහන් කළේය.

සා.පෙ. ප්‍රායෝගික පරීක්ෂණ පෙර පරිදි

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020 (2021 මාර්තු) හි සංගීතය, නැටුම් හා නාට්‍ය හා රංග කලාව විෂයයන්ට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ පෙර පැවති ආකාරයෙන් ම පැවැත්වෙන බව අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල ඩී.කේ. පෙරේරා පවසයි. එසේම මෙවර ප්‍රායෝගික පරීක්ෂණ, ලිඛිත විභාගය පැවැත්වීමෙන් පසුව සිදු කරන බව ද ඔහු පවසයි.

1 වැනි පිටුවෙන්

රෝගීන් නිවසේ තබා ප්‍රතිකාර කිරීමට යෝජනා

(තාරක වික්‍රමසේකර)

කොවිඩ් 19 දැඩි වසංගත තත්ත්වයකින් රට මුදා ගැනීම සඳහා කොවිඩ් රෝග පාලනය කිරීම සම්බන්ධව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉක්මනින් වෙනස් කළ යුතු බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සහකාර ලේකම් වෛද්‍ය නවීන් ද සොයිසා සිළුමිණට පැවසීය.

ඒ උදෙසා මේ වන විටත් තම සංගමය විසින් විශේෂඥ කණ්ඩායම් සමඟ සාකච්ඡා වට 4ක් පවත්වා ඇති බව පැවසූ වෛද්‍ය සොයිසා පැවසුවේ විදෙස් රටවල මෙන් රෝගීන් වැඩිවන විට ඊට අනුගතව ක්‍රමවේද වෙනස් කළ යුතු බවයි. ඉදිරි සතියේදී සියලු යෝජනා තාක්ෂණ කමිටුවට ලබා දෙන බවද ඔහු පැවසුවේය.

ඒ අනුව රෝග ලක්ෂණ නොපෙන්වන කොවිඩ් ආසාදිත රෝගීන් නිවාස හුදකලාවට පත් කිරීම වැනි ක්‍රමවේද අනුගමනය කළ යුතු බවත් සියල්ල නිරෝධායන පනතට අනුව කළ යුතු බවත් ඔහු පෙන්වා දුන්නේය.

දැඩි වසංගත තත්ත්වයෙන් වළක්වා ගැනීම සඳහා රෝගීන්ට ප්‍රතිකාර කිරීම පරීක්ෂණ පැවැත්වීම මෙන්ම නිරෝධායන කටයුතු සිදු කිරීම වත්මන් තත්ත්වයට ගැළපෙන ලෙසින් සිදු කළ යුතු බවද ඔහු පෙන්වා දුන්නේය.

මාර්තු මාසයේ රට තුළත් කොවිඩ් රෝගීන් දෙතුන් දෙනෙක් හමු වූ අවස්ථාවේදී අනුගමනය කළ ක්‍රියාමාර්ග රෝගීන් 900ක් 1,000ක් හමුවන තත්ත්වයකදී අනුගමනය කළ නොහැකි බවද ඔහු පෙන්වීය.

පාඩම් විභාග...

නව ක්‍රමයට අනුව 2023 වසරේදීම අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය වැඩ පොතට අනුව පැවැත්වෙන අතර 2025 වසරේ සිට අ.පො.ස උසස් පෙළ විභාගයත් සම්පූර්ණයෙන්ම පෙළපොතින් ඉවත් කර වැඩ පොතට අනුව පැවැත්වෙන බවද ලේකම්වරයා පැවසීය.

මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති බවත් සිසුන්ට පෙළ පොත හා විභාග මූලික අධ්‍යාපන ක්‍රමය වෙනුවට දැනුම භාවිතයෙන් කුසලතා වර්ධනය (Performance Test) කළ හැකි ක්‍රමවේදයකට අනුව ඉදිරියේදී පරීක්ෂණ පැවැත්වෙන බවද ඔහු පැවසීය. එහිදී සිසුන්ට පරීක්ෂණයන්ට අදාළ සම්මාන (Credit System) ලබා දීමේ ක්‍රමයක්ද ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බවද ඔහු කීවේය. ඒ අනුව නව වැඩ පොත ආරම්භයේදී 1,2 ශ්‍රේණි සඳහාත් ඉන්පසුව 6 සිට 10 ශ්‍රේණි සඳහාත් හඳුන්වා දෙනු ඇත.

අදාළ වැඩ පොතට අනුව වාර 3 සඳහා වැඩ පොත් තුනක් ලබා දෙනු ඇත.

මේ වසරේ සිට තෝරාගත් පාසල් 10ක නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර ඌව, සබරගමුව, මධ්‍යම පළාත් අධ්‍යාපන බලධාරීන් දැනුවත් කිරීමද මේ වන විට අවසන්ව කර ඇති බවත්, මාර්තු මස මැද සතිය වන විට පළාත් 9 ම අදාළ ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමේ කටයුතු අවසන් වන බවත් ලේකම්වරයා පැවැසීය.

මේ අතර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ජාතික පාසල් 1169ක් අලුතින් ආරම්භ කිරීමට සූදානම් වන අතර එම පාසල් ඉදිවීමෙන් අනතුරුව ශිෂ්‍යත්ව විභාග ක්‍රමයේද පැහැදිලි වෙනසක් සිදුවිය හැකි බව රාජ්‍ය ලේකම් උපාලි සේදර සිළුමිණට පැවැසීය. මෙම ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රීඩා විෂය අනිවාර්ය අංගයක් වන අතර මේ සියල්ලේම අරමුණ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයෙන් මේ වන විට සිසුන් පත්ව ඇති ආතතිය අවම කිරීම බව ඔහු වැඩිදුරටත් කීය.

සපුෂ්පික...

අලුත් රතු දත්ත පොතට අනුව අපේ රටේ සත්ව ශාක විශේෂ රැසක් වන විනාශය හා පරිසර දූෂණය නිසා වඳවී යමින් පවතී.

ඒ අනුව ජාතික රතු දත්ත ලැයිස්තුවට අයත් වන සපුෂ්පික ශාක ප්‍රමාණය ද 2012 ට වඩා වැඩිවී ඇති බවත් අවිධිමත් සංවර්ධන කටයුතු අවිධිමත් ඉඩම් පරිහරණය ද වනාන්තර විනාශය මෙන් ම මිනිස් ක්‍රියාකාරකම් ද මීට ප්‍රධාන හේතුව වීම බවත් ආචාර්ය සිරිල් විජේසුන්දර පවසයි.

විවාදයකට ලක්වී ඇති කෘඩියා සිලනිකා ශාක 7 ක් අපේ රටේ ස්ථාන කිහිපයකින් හමුවී තිබුණත් අඩි 50 ක් උස අඩි 50 කට ආසන්න ප්‍රදේශයක අතු විසිරී ඇති මේ ශාකය එම ස්ථානයෙන් ගලවා වෙනත් තැනක සිටුවා නැවත වර්ධනය කරවීම අසාර්ථක වීමට ඉඩ ඇති බවත් සිරිල් විජේසුන්දර කියයි.

මාධ්‍යවේදීන්ට කොවිඩ් එන්නත දෙන්නැයි කර්තෘ සංසදය ඉල්ලයි

කොවිඩ් වයිරසය මෙරට ඇරඹුණු 2020 මාර්තු මාසයේ සිට ජීවිත අවදානම නොකතා ජනතාව දැනුවත් කිරීමේ කාර්යයක නියැළී සිටින මාධ්‍යවේදීන් උදෙසා කොවිඩ් මර්දන එන්නත ලබා දීමේ කඩිනම් වැඩපිළිවෙළක් සකස් කරන ලෙස ශ්‍රී ලංකා කර්තෘ සංසදය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් අසේල ගුණවර්ධනයන්ගෙන් ලිඛිතව ඉල්ලීමක් කර තිබේ. ආයතනගත මාධ්‍යවේදීන් මෙන්ම ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ටද එන්නත ලබාදීමට විධිමත් කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නැයි ඉල්ලූ එම ලිපියට සංසදයේ සභාපති සිරි රණසිංහ සහ ලේකම් සිසිර පරණතන්ත්‍රී අත්සන් තබා ඇත.

'අපට සැදුණු අපේ ලෝකය' මංගල දැක්ම

හදිසි අනතුරකින් දෙමාපියන් අහිමිවී මහ වනය මැද සතුන් සමඟ හැදී වැඩුණු කුඩා දරුවකු වටා ගෙතුණු, සතුන් කථා කරන, ත්‍රාසය භීතිය කුතුහලය සපිරි වනාන්තරයේ අභියෝගවලට මුහුණදෙන සිද්ධි දාමයකින් යුත් 'අපට සැදුණු අපේ ලෝකය' ළමා චිත්‍රපටයේ මංගල දැක්ම 14 ඉරිදා සවස 6.30 කොල්ලුපිටිය ලිබර්ටි සිනමා හලේදී ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපති ජයන්ත ධර්මදාස මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. සුනිල් ටී. ෆිල්ම්ස් ඉදිරිපත් කරන 72 නිර්මාණය වන 'අපට සැදුණු අපේ ලෝකය' ප්‍රවීණ අධ්‍යක්ෂක ලාල් ප්‍රියදේවයන්ගේ 16 වැනි නිර්මාණයයි. මේනක රාජපක්ෂ, නෙහාරා පීරිස්, ඩන්දෙව් ඉපලවත්ත, කවීතා අංජලී, නිශානී හේරත් , මනීෂා මධුභාෂිණී, විමුක්ති සංජය, රජිත රොද්‍රිගෝ, වසන්ත දැරණියගල, සුනිල් හේරත් ඇතුළු පිරිසක් රංගනයෙන් දායක වෙති.

පිහිටවන්න

පොළොන්නරුව, අරුණලු උයන, ශාන්තිපුර, උණගලාවෙහෙර පදිංචි හෙට්ටිආරච්චිලාගේ නිමල් ගුණරත්න ට බී පොසිටිව්, ඕ නෙගටිව් හෝ ඕ පොසිටිව් වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මණින් බද්ධ කළ යුතුව ඇත. පරිත්‍යාගශීලියකු වේ නම් පහත දුරකථන අංකයන්ට අමතන්න. 0717730718 / 0771478998

*

මොරටුව, කල්දෙමුල්ල ඊබට් ලේන් අංක 84 බී පදිංචි එච්. දීපා දමයන්ති සිල්වාට (55) ඉතා ඉක්මනින් 'ඒ' පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළයුතු බව විශේෂඥ වෛද්‍යවරු නිර්දේශ කර ඇත. ඇයට වකුගඩුවක් පරිත්‍යාග කළ හැකි අයෙකු වේ නම් පහත දුරකතන අංකයට දන්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටී. 0710992928, 0769605674.

අම්ල තේනුවරගෙන් කෘති 2ක්

අම්ල තේනුවරගේ ප්‍රථම නවකතාව ' සක්වානුරාගී' හා තෙවන කාව්‍ය සංග්‍රහය ' කඳුළු බිඳුවක දෙපැත්තක්' මේ මස 20 වැනිදා ප.ව.6.00ට සිරිවිජයාරාම මහා විහාරයේදී ජනගත වීමට නියමිතය. මෙහි ප්‍රධාන දේශනය ගේය පද රචක ධම්මික බණ්ඩාර විසින් සිදුකරන අතර, නවකතාවේ විශ්ලේෂණය විශේෂඥ වෛද්‍ය රුමි රුබන් විසින් සිදු කිරීමට නියමිතය.

බන්දුල විජේවීර

ශ්‍රියන්ත මෙන්ඩිස්

දිපානි සිල්වා

විශ්ව කොඩිකාර

සුදර්ශියට අත නොතබනු!

කොළඹ 7 කලාකරුවන්ට අකැපද?

සිංහල සංස්කෘතික ආයතනය ඇරඹුණේ වසර 1954දී

මොන ප්‍රශ්න තිබුණත් සුදර්ශිය වෙනුවෙන් කලාකරුවන් එකතු විය යුතුයි

● හර්ෂා සුගතදාස

ආර්ය සිංහල ඇඳුමෙන් හා ඔසරියෙන් සැරසී කොළඹ විවාහ මංගල්‍යයකට සහභාගි වීමට ගිය ශ්‍රී ලාංකික ප්‍රභූ පිරිසකට ඊට ඇතුළුවීමට අවසර නොදීම හේතුවෙන් සිංහල සංස්කෘතිය පෝෂණය කිරීම උදෙසා ආයතනයක් ස්ථාපිත කිරීමේ වැදගත්කම මතු වූයේ ලංකාව ඉංග්‍රීසින්ගෙන් නිදහස ලබා තිබුණ වකවානුවකය. එනම් 50 දශකයේ මුල් භාගයේදීය. ඒ වන විට සිංහල සංස්කෘතික අංගවලින් සමන්විත කලා උලෙළකට කොළඹ කාන්තා විද්‍යාලයේ ශාලාව වෙන් කර තිබියදී එය පැවැත්වීමට ඉඩ නොදීමේ සිදුවීමකට මුහුණ දී සිටි මෙම පිරිසට එය ද ප්‍රබල ලෙස බලපා තිබිණි. මෙම ප්‍රභූ පිරිස විසින් "සිංහල සංස්කෘතික ආයතනය" 1954 වසරේදී පිහිටුවනු ලැබුවේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

ජේන් ඇම්. ද ෆොන්සේකාගේ සභාපතිත්වයෙන් ද ලොරානි සේනාරත්නගේ ලේකම් ධුරයෙන් ද සිරිමාවෝ බණ්ඩාරනායකගේ භාණ්ඩාගාරික ධුරයෙන් ද 1954 දී ඇරඹුණු සිංහල සංස්කෘතික ආයතනය එකල පවත්වාගෙන ගියේ වර්තමානයේ ගාමිණී මාතා වැඩිහිටි නිවාසය පිහිටි ස්ථානයේ කුලියට ගත් ගොඩනැගිල්ලකය.

ව්‍යවස්ථාවක් යටතේ කටයුතු සිදු කෙරුණු මෙම සිංහල සංස්කෘතික ආයතනයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ සිංහල සංස්කෘතියේ උන්නතිය සහ පෝෂණය වෙනුවෙන් කටයුතු කිරීමය. ඒ සඳහා සාහිත්‍යය, කලාව සහ නිර්මාණ ශිල්පය, නැටුම්, නාට්‍ය, සංගීතය, ජන සම්මත සාහිත්‍යය, හස්ත කර්මාන්ත, චිත්‍රපට, මැහුම් යන අංශ වෙනුවෙන් අනු මණ්ඩල පත් කෙරිණි. මෙම අංශවලින් පන්ති, වැඩමුළු, දේශන පවත්වා දැනුම බෙදා දෙනු ලැබිණි. සුනේත්‍රා බණ්ඩාරනායක, චන්ද්‍රිකා බණ්ඩාරනායක, රනිල් වික්‍රමසිංහ යන අය ද මෙම සිංහල සංස්කෘතික ආයතනයෙන් නැටුම් හැදෑරූ අය වෙති.

මේ අතරවාරයේදී කොළඹ මෙට්ලන්ඩ් පෙදෙස, කින්සි පාර, විජේරාම ආශ්‍රිත අක්කර 18ක භූමි භාගයක් 1963 දී ප්‍රභූ දානපතියකු විසින් රජයට පරිත්‍යාග කර තිබිණි. එවකට අගමැතිනිය වී සිටි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අක්කරයකුත් පර්චස් 29ක වපසරියකින් යුතු භූමියක් සිංහල සංස්කෘතික ආයතනයට භාර දුන්නේ 1963 නොවැම්බර් 07 වැනිදාය. එහි තිබූ ගොඩනැගිල්ලකට රැගෙන ආ සිංහල සංස්කෘතික ආයතනය පසුව "සුදර්ශිය" ලෙස හැඳින්වූවේ එම ගොඩනැගිල්ලේ නාමය සුදර්ශිය වූ නිසාය.

ඇල්.ජේ.ඇස්. සෙනෙවිරත්න, ආර්.ජී. සේනානායක, එච්.ආර්. ප්‍රේමරත්න, ජස්ටින් සමරසේකර, ඩී.ඒ. අබේසේකර මුදලිඳු, ඔස්ටින් ද සිල්වා, මැටිල්ඩා ද සිල්වා, ඇම්.ඩබ්ලිව්.ඇෆ්. අබේකෝන් වැනි අය සභාපතිත්වය දරන සමයේ ලොරානි සේනාරත්න, එරින් සේනානායක, නාලනී වික්‍රමසිංහ, සුජාතා ජයවර්ධන, ජානකී විජේවර්ධන යන අය ලේකම් තනතුර හෙබවූහ.

1969 දී ලේකම් තනතුරට පත්වූ දයානන්ද ගුණවර්ධන 1981 වන තුරු වසර 11ක් මුළුල්ලේ ලේකම් ධුරයට නිතරගයෙන් පත්වූයේ සිංහල සංස්කෘතික ආයතනයට ඔහුගෙන් සිදු වූ අතිමහත් මෙහෙවර නිසාමය. එම වකවානුවේදී සභාපතිත්වය දැරුවේ නාලනී වික්‍රමසිංහය. දයානන්ද ගුණවර්ධන විසින් 'ගජමන් පුවත' පොතේ පිළිගැන්වීමේ "ගජමන් පුවත් බිහි වුණේ සුදර්ශියෙනි. සුදර්ශිය ගොඩනැගීමෙහිලා පුරෝගාමීව කටයුතු කළ නාලිනි වික්‍රමසිංහ මැතිනියට මෙම පොත ගෞරවයෙන් පිරිනැමේ" යනුවෙන් සඳහන් කර තිබෙන්නේ ඇයගෙන් ද අනගි සේවයක් සුදර්ශියට ඉටු වූ නිසාය.

"මම සුදර්ශියට යන්න එන්න පටන් ගත්තේ 1975 ඉඳලා. මම ලයනල් වෙන්ඩ්ට් රංග ශිල්ප ශාලිකාවෙන් ආවාට පුහුණුවීම් කළේ සුදර්ශියේ. ඒ කාලේ චන්ද්‍රා කළුආරච්චි, මියුරි සමරසිංහ, සොමී රත්නායක වගේ අය නිතරම එතැනට ආවා ගියා. මම නවකයෙක්නේ. මම ඒ අය දිහැ හරි ආසාවෙන් බලාගෙන හිටියා. නාට්‍ය ශිල්පීන්ට ඉතා අඩු මුදලකට පුහුණුවීම් කරන්න තිබෙන එකම තැන සුදර්ශිය. ලංකාවේ සතරදිග්භාගයේ ඉඳලා කොළඹට එන කලාකරුවන්ට වගේම නවකයන්ටත් නවාතැන්පොළ වුණේ සුදර්ශිය. හමුවීම සුදර්ශියේ අඹ ගහයට කියලා තමයි කතිකා කර ගත්තේ" යනුවෙන් පැවසුවේ ප්‍රවීණ රංගන ශිල්පිනී දිපානි සිල්වා ය.

කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව විවෘත කිරීමේ උත්සවයට යැවූ ඇරයුම් පතෙහි "සුදර්ශිය ඉදිරිපිට" යනුවෙන් සඳහන් කර තිබුණේ 1973 වන විට සුදර්ශිය ඉතා ප්‍රසිද්ධ ස්ථානයක් වූ බැවිනි.

වසර 11ක් මුළුල්ලේ අගනා සේවයක් කළ දයානන්ද ගුණවර්ධනට "මට සමාවෙන්න" යනුවෙන් පවසා සිය බෑගයත් රැගෙන සුදර්ශියෙන් නික්ම යෑමට සිදු වූයේ බලය අල්ලා ගැනීමේ අරගලයක ප්‍රතිඵලයක් වශයෙනි. ඔහු නොකඩවා ලේකම් තනතුර හෙබවීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනා එල්ල විය. එදා සුදර්ශියෙන් ගිය දයානන්ද ගුණවර්ධන මිය යන තුරුම නැවතත් සුදර්ශියට පැමිණියේ නැත.

"මම දයානන්ද ගුණවර්ධන මුණගැහෙන්න 1973 දී ආවේ සුදර්ශියට. ඒ කාලේ මම රජයේ ලලිතකලා විද්‍යාලයේ ඉගෙනගන්නවා. පාසල් කාලේදීත් ගීත නාටකවල රඟපාලා තියෙන නිසා මම ඒ ගැන සෙවිල්ලෙන් ඉන්නකොට දවසක් සරසවිය පත්තරේ පළ කරලා තිබුණ නරිබෑණා නාට්‍යයේ නරියාගේ චරිතයට කෙනෙකු අවශ්‍යයි කියලා. මම ඒකට අයදුම් කළා. මට සම්මුඛ පරීක්ෂණයට සුදර්ශියට එන්න කියලා පෝස්ට්කාඩ් එකක් එව්වා. මමත් සුදර්ශියට ගියා. නරි වෙන්න කැමති 20ක් 30ක් ඇවිත් හිටියා. නටන්න, රඟපාන්න, සිංදු කියන්න කියපු හැමදේම මම කළා. අන්තිමට දයානන්ද ගුණවර්ධන මගෙන් ඇහුවා පිනුම් ගහන්න පුළුවන්ද කියලා. මට පිනුම් ගහන්න බැහැ කිව්වාම එහෙම නම් නරියෙක් වෙන්න බැහැ කියලා මාව ගායක කණ්ඩායමට බඳවා ගත්තා. 1975දී නරිබෑනා නාට්‍යයේ කපුරාල චරිතයට මාව ගත්තා. එදා ඉඳලා අද දක්වාම කපුරාල මමයි. ඊටපස්සේ පත්මාවති නාට්‍යයේ පොතේගුරු වුණේ මමයි. මේ සේරම නාට්‍යවල පුහුණුවීම් කළේ සුදර්ශියේ. සුදර්ශිය මා ඇතුළු බොහෝ කලාකරුවන්ට හොඳ තෝතැන්නක් වුණා. අපිට හොඳ ආලෝකයක් ලැබුණා." යනුවෙන් ප්‍රවීණ කලාකරුවකු වන බන්දුල විජේවීර විස්තර කළේය.

"මාමයි - බෑණයි" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වෙන රෝහණ බැද්දගේ සහ බන්දුල විජේවීර දෙපළට කලා ලොවේ දිගු ගමනක් යෑමට මඟ පෑදුණේ ද සුදර්ශිය නිසා බව තවදුරටත් සඳහන් කළේ බන්දුල විජේවීරය. ඒ, දයානන්ද ගුණවර්ධනගේ ජසයා හා ලෙන්චිනා නාට්‍යය සංගීතවත් කිරීමට සුදර්ශියට පැමිණි රෝහණ බැද්දගේ දැන හඳුනාගෙන මිතුරුවීමට සුදර්ශිය මුල්වූ බැවිනි.

"මම කලාකරුවකු වෙන්න අතපොත් තැබුවේ සුදර්ශිය මාතාවගේ හෙවණේ." යනුවෙන් පවසමින් සංවාදයට මුල පිරුවේ ප්‍රවීණ රංගන ශිල්පී ශ්‍රියන්ත මෙන්ඩිස්ය. ඔහු ඒ පිළිබඳව අදහස් දැක්වූයේ මෙලෙසිනි.

"70 දශකයේ අග භාගයේ ළමා හා යොවුන් නාට්‍ය රංග පීඨයත්, ජර්මන් සංස්කෘතික ආයතනයත් ඒකාබද්ධ වෙලා නාට්‍ය වැඩමුළුවක් පැවැත්වුවා. නෝබට් ජේ. මයර් මහාචාර්යවරයාගේ මූලිකත්වයෙන් තමයි එය පැවැත්වුවේ. ඒකෙ සම්මුඛ පරීක්ෂණයට මම ගියේ සුදර්ශියට. මට තවම මතකයි දිග පෝලිමක හිටගෙන ඉඳලා මම සුදර්ශියේ අඹ ගහ ළඟට කිට්ටු කරපු හැටි. ජයන්ත චන්ද්‍රසිරි, කමල් අද්දරආරච්චි, මම ඇතුළුව 25 දෙනෙක් එදා තේරුණා. අපි හැමදාම සුදර්ශියට ඇවිත් පුහුණුවීම් කළා. සුදර්ශියේ අඹ ගහ, නුගගහ අපේ කලා ජීවිතයේ වැදගත් ස්ථාන.

කලාකරුවන්ගේ පුහුණුවීම් සඳහා ඉතා අඩු මුදලකට ලබා දෙන සුදර්ශිය, ආයතනයේ නඩත්තුව සඳහා මුදල් උපයාගත්තේ පන්ති පැවැත්වීමෙනි. ශාලා කුලියට දීමෙන් ලැබෙන මුදලිනි.

එහෙත් 1980 වර්ෂයේදී සුදර්ශිය නඩත්තු කිරීමට ප්‍රමාණවත් මුදල් නොමැති බැවින් එවකට අගමැති ආර්. ප්‍රේමදාස මහතාට සුදර්ශියේ යතුර බාර දුන් පුවතක් ද වාර්තා වෙයි. නමුදු රජයකට කලාව කිරීමට නොහැකි බව පැවසූ ආර්. ප්‍රේමදාස මහතා යතුර ආපසු එවා හිඟ මුදල් පියවූවා පමණක් නොව 1980 අංක 42 දරන පනතින් සිංහල සංස්කෘතික ආයතනය සංස්ථාපිත ආයතනයක් බවට පත් කළේය. එඩ්වින් ආරියදාස, ලීල් ගුණසේකර, ලක්ෂ්මන් ජයකොඩි, නිමල් ලක්ෂපතිආරච්චි, ජීවන් කුමාරතුංග වැනි අය මෑත භාගයේ සභාපතිත්වයට පත් වුවද සුදර්ශියට පෙර තිබූ ගෞරවය අඩු වූයේ බල අරගලයට තරග වැදුණු කණ්ඩායම් නිසාය. සභාපති නිලවරණයේදී ඡන්ද පෙට්ටි ඔසවාගෙන යෑම වැනි පහත් පෙළේ අප්‍රසන්න සිදුවීම් පවා සුදර්ශියනේ වාර්තා වූ අයුරු අපට අමතක නැත. කෙසේ වුවද නිහාල් සිල්වාගේ මූලිකත්වයෙන් එළිමහන් රංග පීඨය ඉදිවීම, ගාමිණී ෆොන්සේකා ශාලාව - සුගතපාල ද සිල්වා ශාලාව ඉදිකිරීම, නාට්‍ය පාඨමාලා වැනි පාඨමාලා පවත්වාගෙන යෑම අගය කළ යුතුය.

"මම නළුවෙක් වුණේ මහේන්ද්‍ර පෙරේරාගේ නාට්‍යකරණ පාඨමාලාව හදාරලා. ඒ පාඨමාලාව පැවැත්වුණේ සුදර්ශියේ. ඒ නිසා 2007, 2008, 2009, 2010 අවුරුදු 4ම ගත කළේ සුදර්ශියේ. නුග ගහ යට හඬ පුහුණුවීම් කරපු හැටි, රටනෙල්ලි කකා ඒ ගහයට සංවාද පුහුණු වුණ හැටි මට තවමත් මතකයි. සුදර්ශිය කියන්නේ මගේ රංග කලාවේ තිඹිරිගෙය." යනුවෙන් පැවසුවේ මෑත පරම්පරාවට අයත් ජනප්‍රිය රංගන ශිල්පි විශ්ව කොඩිකාරය.

පරම්පරා ගණනාවක කලාකරුවන් බිහි කළ සුදර්ශිය පිහිටි කොළඹ හතේ බෞද්ධාලෝක මාවතේ අංක 375 දරන ස්ථානයට අයත් පර්චස් 189 ක භූමිය බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට යන පුවතක් ද අසන්නට ලැබේ.

මීට පෙර 2009 දීත් 2016 දීත් මෙම ස්ථානය ජපන් සංවිධානයකට දීමට දැරූ උත්සාහයක් අපේ මතකයේ ඇත. ඒ සෑම අවස්ථාවකම කලාකරුවෝ වීදි බැස ඊට එරෙහි වූහ. ඒ නිසාම එම උත්සාහයන් හකුළා ගැනීමට සිදු විය. "දේශපාලනික වශයෙන් ජාතීන් වශයෙන් කලාකරුවන් වෙනස් වෙන්න පුළුවන්. ඒත් සුදර්ශියේ හෙවණට එන කලාකරුවන් සියලුදෙනාම එකයි. එතැනදි අපි අතර මොනම ප්‍රශ්නයක්වත් භේදයක්වත් නැහැ. කලාව වෙනුවෙන් අපි සුදර්ශිය රැක ගත යුතුයි." යනුවෙන් ප්‍රවීණ රංගන ශිල්පි ශ්‍රියන්ත මෙන්ඩිස් පැවසුවේය. ප්‍රවීණ රංගන ශිල්පී දිපානි සිල්වා විමසුවේ කොළඹ හත කලාකරුවන්ට අකැපද යනුවෙනි. අධ්‍යක්ෂ මණ්ඩල තුළ කුමන ගැටලු තිබුණ ද කලාකරුවන්ට සුදර්ශිය තිබිය යුතුය යන්න ඇගේ අදහස ය.

"සුදර්ශිය කලාකරුවන් වෙනුවෙන් හැමදාමත් තියේවි කියලා මම විශ්වාස කරනවා." යන්න විශ්ව කොඩිකාරගේ අදහස විය.

මේ සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමට සිංහල සංස්කෘතික ආයතනයේ වත්මන් සභාපති ඩබ්ලිව්. ජයසිරි කලාකරුවා සම්බන්ධ කර ගත් විට ඔහු පැවසුවේ රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක සමඟ සාකච්ඡාවක් පවත්වා ඉන් අනතුරුව මාධ්‍යයට අදහස් දක්වන බවය.

NLB
ජාතික ලොතරැයිය

පෙබරවාරි 15 වනද සිට

දවසේ
දිනුම් අවස්ථා
වැඩිම
ලොතරැයිය

අර්ථ අපි චීනවා

ජීවිතයේ සිහිනයට වාසනාවේ ආශිර්වාදය...

සිළුමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2021ක් වූ පෙබරවාරි මස 14 වැනිදා ඉරිදා

රංග පාසලක් නික්ම ගිය වගයි!

අපි සැමොම ජීවන රඟමඬලේ රඟන නළුවන් වන්නෙමු යැයි කීවේ ශේක්ස්පියර් ය. යථාර්ථයත් මායාවත් අතර දෝලනය වෙන සාමාන්‍ය ජීවිතයේ සමහරු රඟපාති; තවත් සමහරු ඔහේ ජීවත් වෙති; තවත් සමහරු ලද ජීවිතයට අර්ථයක් සම්පාදනය වන අයුරින් දිවි සැරිය නිම කරති. ජීවත් වුවත් මළවුන් සේ වන මහා මිනිස් ප්‍රවාහයක් ඉදිරිපිට මැරුණත් ජීවත් වනවා සේ දැනෙන මිනිස්සු ඉදිරිට හමුවෙති. ඒ වාසනාව ලද්දන් අතර කලාකරුවන්ට හිමි වන්නේ මුඛ්‍ය ස්ථානයකි. සාමාන්‍ය ජීවිතයේ අතිශය සාමාන්‍ය මිනිසකු ව සිට, රඟහලේදී විශ්වවිද්‍යාලයක් වූ රංගධරයෙක් පසුගියදා දිවිමඬලෙන් සමු ගත්තේ ය. සමුගත්ත ද ඔහු අමරණීය මිනිසෙකි; කලාකරුවෙකි. ජයලාල් රෝහණ අපූර්ව කලාකරුවා පෙබරවාරි 11 වැනිදා දිවිමඬලෙන් සමුගනු ලැබීය. ඒ වන විට හෙතෙම 56 හැවිදිරි වියේ පසුවිය.

1964 නොවැම්බර් 1 වැනිදා කෝට්ටේදී උපන් ජයලාල් රෝහණයන්ගේ දෙමවුපියන් වූයේ වෘත්තියෙන් ගිනි නිවන භටයකු වූ අරුනෝලිස් අප්පුහාමිය. මව කරුණාවතී වීරසේකරය. පවුලේ වැඩිමලා වූ රෝහණට සහෝදරයෙක් හා සහෝදරියක් විණි. ජයලාල් රෝහණ පාසල් අධ්‍යාපනය හැදෑරූයේ කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙනි. ඒ 1971 වසරේය. 1976 වසරේදී පාසලේ වේදිකාගත වූ දැල් ඇදීම නම් ධීවර ගීත නාට්‍ය ජයලාල් රෝහණගේ ප්‍රථම වේදිකා ගමනයයි. එතැනින් ඇරඹී මඟ තව බොහෝ දුර යන්නට ප්‍රවේශය සම්පාදනය වන්නේ සයිමන් නවගත්තේගමයන් හමු වීමෙන් ඉනික්බිතිවය. වේදිකාවට පාතබන නළුවකු රංග පාසලක් හා සමවීමට බලපෑම් වන කරුණු කාරණා සියල්ල ජයලාල් රෝහණ ඉදිරියේ පෙළ ගැසෙන්නේ එතැන් සිට ය.

වසර 2005 සත්දින ප්‍රකාශනයක් ලෙස සුනිල් මාධව ප්‍රේමතිලකයන් ගැන ග්‍රන්ථයක් ප්‍රකාශිත ය. ඒ 'පෙරමුණක් නැති සෙනෙවියකුගේ කගපතක මුවහත' නමිනි. මේ කෘතියට ජයලාල් රෝහණ අපූරු ලිපියක් ලියයි. ඒ ලියැවිල්ලේ ගොඩනැඟීම හරහා ජයලාල් රෝහණයන්ගේ ගොඩනැඟීම ද සමානුපාතිකව එහි අන්තර්ගත ය. ඔහු පවසන පරිද්දෙන් කොළඹ කේන්ද්‍ර කරගෙන උප සංස්කෘතියක් ගොඩනැංවීමෙහිලා කිහිපදෙනෙක් පුරෝගාමී වූහ. මහජන පුස්තකාලය, සෝවියට් සංස්කෘතික මධ්‍යස්ථානය හා සුදර්ශිය මේ කල්ලියේ තෝතැන්න විය. මේ රස්තියාදුව හා සාකච්ඡා මහා කලාකරුවන් කිහිපපොලක්ම බිහිවීමට පදනම දැමුවේ ය. ඒ අතර ජයලාල් රෝහණ ද විය.

ඔහුගේ ජනතාවාදී දේශපාලන ප්‍රවේශයට ඔහුගේ පියා වාම ක්‍රියාකාරියකු වීමත් බලපාන්නට ඇත. සුඛනම්‍ය ශෝභන ජීවිතයක් කවදත් හිමි නොවූ ජයලාල් රෝහණට; ඒ වැනි ජීවිතයක් සඳහා අවැසි පොපියන චමත්කාරය සොයන ශෝභන මනසක් හිමි නොවන්නට ඉහත කී පන්නරය හා දැකීම බලපාන්නට ඇත.

ජයලාල් රෝහණට පියාගේ අභාවයත් සමඟ කටුක ජීවන අරගලයකට මුහුණ පෑමට සිදු විණි. 1985 වර්ෂයේදී පේරාදෙණිය සරසවියට ඇතුළත් වූ ඔහු විද්‍යා උපාධිධරයකු ලෙස ඉන් පිටවන්නේ 1995 වසරේදී ය. රටේ පැවති දේශපාලන තත්ත්වය නිසා දශකයකටත් අධික කාලයක් පේරාදෙණිය සරසවියේ ගත කළ ජයලාල් රෝහණ පැවති ආර්ථික අපහසුතා නිසා ම ඒ කාලය ඇතුළත කොළඹ වර්ණ රසායනාගාරයක වර්ණ ඡායාරූප මුද්‍රණකරුවකු ලෙස ද සේවය කර තිබේ. මේ සියල්ල ජීවන තක්සලාවේ අත්දැකීම් වූවා මිස ඒ කිසිවක් නිසා ඔහු නොතැවුණේ ය; ඒවා ආඩම්බරයක් කොට සැලකීය. අනතුරුව පේරාදෙණිය සරසවියෙන් ම සමාජ විද්‍යාව, දර්ශනය, නාට්‍ය හා රංග කලාව පිළිබඳ ව ඔහු පශ්චාත් උපාධියක්ද සතු කර ගත්තේ ය.

උපාධිධරයකු වූ ජයලාල් රෝහණ සිය ජීවන වෘත්තිය ලෙසින් තෝරා ගත්තේ ගුරු වෘත්තියයි. ඔහුගේ ගුරු දිවියේ මුල් ම පත්වීම ලැබුයේ තණමල්විල මහ විද්‍යාලයට ය. විද්‍යා ගුරුවරයකු ලෙස වෘත්තීය දිවිය ඇරඹූ ජයලාල් රෝහණට කෙටි කලකින් මීගමුව පිටිපන විද්‍යාලයට ස්ථාන මාරුවක් ලැබුණි. ඉන් අනතුරුව නුගේගොඩ ශාන්ත ජෝෂප් බාලිකාවේ නාට්‍ය හා රංග කලාව පිළිබඳ ගුරු වෘත්තිය වසර දහයක කාලයක් නිරත විය. ඔහු විශ්වවිද්‍යාල කිහිපයක ම බාහිර කථිකාචාර්යවරයකු වශයෙන් ද සේවය කළේ ය.

රංග අභ්‍යාස පුහුණු වැඩමුළු සඳහා රට වටේ පාසල්වලට ගිය ජයලාල් රෝහණ ගී ගයමින්, නටමින් හා රඟමින් සිය වසඟයට ප්‍රේක්ෂකාගාරය ගන්නා අයුරු මනමෝහනීය ය.

පුහුණු වැඩමුළුවෙන් පසු දරුවන් ඔහු වටකර ගන්නේ ඉමහත් ආදරයෙනි. නව - පැරණි කියා පරම්පරා බේදයකින් තොරව මේ මෑතකාලයේ ප්‍රේක්ෂකයන් නිම්හිම් නැතිව ආදරය කළ කලාකරුවන් සිටියේ අතළොස්සකි. ඒ අතර ජයලාල් රෝහණ සිටින්නේ ඉදිරියෙන් ම ය. කලාකරුවා යන පරිසමාප්ත අර්ථයෙන් ම ඔහු ඊට සාකල්‍යයෙන් ම සුදුසු වන්නේ අභ්‍යාසය හා න්‍යායික දැනුම් පරාසය යන ද්විත්ව සුදුසුකම ම දරන බැවිනි.

වසර 1987 'ලෝකා' කෙටි නාට්‍ය සඳහා ජයලාල් රෝහණ සම්මාන හතරක් දිනා ගත්තේ ය. ඒ හොඳ ම නළුවා, හොඳ ම අංග රචනය, හොඳ ම වේදිකා පරිපාලනය හා හොඳ ම ආලෝකකරණය වෙනුවෙනි. එතැනින් පටන් ගත් ඔහුගේ කලා දිවියේ සම්මානිත වීම් මේ වන විට අර්ධ ශතකය ද ඉක්මවා ගොසිනි. ඒ සියල්ලට වඩා අසමසම ජනතා සම්මාන හා ආදරණීය බැඳීම් වලින් ඔහු පොහොසත් ව සිටියේ ය. වේදිකාවෙන් පුංචි තිරයට ගොඩවෙන ජයලාල් රෝහණ ප්‍රේක්ෂක ආදරය නොඅඩුව ලැබුවේ 'ඉසුරුයෝගය' ටෙලි නාට්‍යයේ 'මුතුමිණ'ගේ චරිතයෙනි. මුතුමිණ චරිත නිරූපණය සඳහා ජයලාල් රෝහණට එම වසරේ, සුමති ටෙලි සම්මානය, OCIC සම්මානය, සහ රූපවාහිනී රාජ්‍ය සම්මානය ද හිමි විය.

මෙතෙක් ලේඛකයන්ට හසු නොවූ ඉසව් ස්පර්ශ කරමින් ඔහු කෘති තුනක් රචනා කර තිබේ. ඒ සබේ විදුලි විලක්කුව, සැබෑ මුහුණ හා වෙස් මුහුණ, හඬ වැඩුම යන කෘති ත්‍රිත්වයයි. ජීවන තක්සලාවෙන් ම ජීවිතයේ දුක සතුට විඳ, රංගනයෙන් වේදිකාවේ දිග් විජය කළ ජයලාල් රෝහණයන්, සරච්චන්ද්‍ර, දයානන්ද ගුණවර්ධන ආදී දැවැන්තයන්ගේ පරම්පරාවේ වත්මනිකයා ය. ජයලත් මනෝරත්නයන්ගේ නික්ම යෑමේ සංවේගය තවමත් සිතේ සක්මන් කරද්දී; ජයලාල් රෝහණයන් ද දිවිමඬලින් බැස යෑමේ සංවේගය මෙතරම් කලින් දරා ගන්නට සිදුවීම අභාග්‍යයකි.

මේ අර්බුද 'යහපාලන' ආණ්ඩුව සම අනුග්‍රහය දැක්වීම නිසයි

- මහාචාර්ය ගාමිණී සමරනායක

● සුභද්‍රා දේශප්‍රිය

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කවුන්සිලය 2006 මාර්තු මාසයේ ඇති කරන ලද ආයතනයකි. ඊට පෙර ස්ථාපිතව තිබුණේ එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ කොමිසමකි. එම කොමිසම පක්ෂග්‍රාහී මානව අයිතිවාසිකම් කඩ කරන ලද කොමිසමක් බවට යම් විවේචනයන්ට පවා ලක්විය. එම නිසා එය නව මුහුණුවරකින් 2006 වසරේදී නැවත පිහිටු විය. එහි කටයුතු ආරම්භ කෙරුණේ 2007 වර්ෂයේ සිට වන අතර එය සාමාජිකයන් හතළිස් හතකගෙන් සමන්විතව ඇති කරන ලදී.

ඒ අනුව අප්‍රිකානු ආසියානු කලාපමය වශයෙන් 13 දෙනෙකුගෙන් ද , නැගෙනහිර යුරෝපයෙන් 06 දෙනෙකුද ලතින් ඇමරිකානු රටවල් ඇතුළු කැනේඩියානු රටවලින් අට දෙනෙකු සහ යුරෝපය අවට රටවලින් 07 දෙනෙකු බැගින් මේ සඳහා සහභාගි කර ගන්නා ලදී. මේ සාමාජික රටකින් අවුරුදු තුනක කාලසීමාවකට යටත්ව සාමාජිකයන්ට නැවත පත්විය හැකියි.

යාපනයේ නගරාධිපති ඝාතනය

අපේ රටේ ත්‍රස්තවාදී ගැටුම වසර තිස් හතරක් දිවයන්නකි. මෙයට පාදකවූ කරුණු අතර යාපනයේ හිටපු නගරාධිපති ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා 1975 වසරේ ඝාතනය කිරීම සඳහන් කළ හැකිය. ඉන් පසු 1983 දී නැවත කෝලාහලයක් හටගනු ලැබිණි. එම ප්‍රශ්නය සම්බන්ධයෙන් එවකට හිටපු ජනාධිපතිවරුන් විසින් කිහිපවතාවක් සාමකාමීව විසඳීමට විශාල උත්සහයක් ගනු ලැබීය. එ

එහෙත් එල්.ටී.ටී.ඊය එය සාමකාමීව විසඳා ගැනීමට කිසිදු සහයක් දුන් බවක් නොපෙනේ. ඉන් අනතුරුව 2006 වසරේදී මාවිල් ආරු සොරොව්ව අවහිර කිරීමෙන් අනතුරුව රජයට මානුෂීය මෙහෙයුමක් ඇරැඹීමට සිදුවිය. ත්‍රස්තවාදය 2009 වසරේදී මුලිනුපුටා දමන ලදී.

ඉන් අනතුරුව ජනතාව අතර සංහිඳියාව ඇති කිරීමේ අරමුණින් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂයන් විසින් එල්එල්ආර්සී එනම්, උගත් පාඩම් කොමිසම පත් කරන ලදී. සංහිඳියාව සහ ප්‍රතිසංවිධානය ඇති කිරීම සඳහා 2010 වසරේදී එය ස්ථාපිත කෙරුණි. අනතුරුව ප්‍රථම වරට 2012 වසරේදී මානව හිමිකම් පිළිබඳ කොමිසම ඉදිරියට ශ්‍රී ලංකාව ප්‍රථම වරට කැඳවීය. මේ එල්එල්ආර්සී කොමිසම් වාර්තාව එහිදී ඔවුන්ට ප්‍රමාණවත් නොවන බව සඳහන් විය. නමුත් එදා යම් කිසි ආකාරයකට දේශීය යන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට ඉඩ දී තිබුණි. ඉන් අනතුරුව 2014 දී මැක්ස්වේ පරණගම කොමිෂම ද ඉන්පසු උදුලාගම කොමිසමද පත් කරනු ලැබිණි. පරණගම කොමිසම වරින්වර දීර්ඝ කරනු ලැබිණි. 2017 වසර දක්වාම එහි විමර්ශන කටයුතු කරනු ලැබිණි. මේ කොමිසම මගින් දරුස්මාන් වාර්තාව අනුව සිවිල් වැසියන් හතළිස් දහසක් පමණ මෙරට හමුදාව විසින් ඝාතනය කළ බවට චෝදනාව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප විය. මිෂෙල් බැෂෙලේ වාර්තාවත් දරුස්මාන් වාර්තාව මත සැකසී ඇත්තකි.

ඇමරිකාවේ ඉවත් වීම

මේ කොමිසමෙන් ඇතැම් අවස්ථාවලදී ඇමරිකාවත් ඉවත් වීම සුවිශේෂ කරුණකි. ඉන් අනතුරුව බැරක් ඔබාමාගේ කාලයේ දී නැවත ඇතුළත් විය. ඉන්පසුව ඩොනල්ඩ් ට්‍රම්ප් නැවත එයින් ඉවත් විය. ඇතැම් අවස්ථාවලදි සුඩානය වැනි රටවල් එම රටවල ගැටලු සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට මේ කොමිසමට ඉඩ ලබා දුන් බවක් නොපෙනේ. ඊට අමතරව ඇමරිකාවේ අබුගාරි හිරගෙදර සහ මො බොක්කේ සිර මැදිරි වල මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම් ගැන ප්‍රශ්න කිරීමක් මේ කොමිසම විසින් සිදු කර නැත.

මෙවර මේ කොමිසම මගින් මෙරට ආරක්ෂක ප්‍රධානින් 28 දෙනෙකුට තහංචි පැනවීමට උත්සාහ කර ඇත. ජනාධිපතිවරයා විසින් රජයේ තනතුරු සඳහා විශ්‍රාමික හමුදා නිලධාරීන් පත් කිරීම සම්බන්ධයෙන් සොයා බලමින් ඔවුන්ට ඇති අයිතීන්ට වඩා එහා යමින් මෙරට ස්වාධිපත්‍යයට ඇඟිලි ගැසීමක්ද සිදු කර ඇත.

ඇමරිකාව බ්‍රිතාන්‍ය වැනි රටවල් එයට හොඳ උදාහරණ සපයයි. බ්‍රිතාන්‍යයේ චර්චිල් ගේ සිය පවුලම හමුදා සේවයේ නියුතු අය විය. ඔහු 1948 වර්ෂයට පෙර ත්‍රස්තවාදී සංවිධානයක නායකයෙකි. අපේ රටට මේ අර්බුදය මේ තරම්ම උග්‍ර තත්ත්වයකට පත් වූයේ මේ රටේ 2015 දී පැවැති රජය ජිනීවා කොමිසමේදී සම අනුග්‍රහය දැක්වීම නිසාය.

ලෝකයේ ස්වාධිපත්‍ය සහිත නිදහස් රටක් පළමු වතාවට තමන්ගේ රටේ යුද අපරාධ සිදුවී ඇතැයි යන ප්‍රකාශය ජාත්‍යන්තරය හමුවේ පිළිගැනීම සිදු කර ඇත මෙය ඉතාමත් අවාසනාවන්ත තත්තවයකි.

සිංගප්පුරුවේ එකතුව

ඔවුන් 2012 වසරේදී ඔවුන් සිංගප්පුරුවේ ඩයස්පෝරාව සමඟ එකතුවී ඉන් පසුව 2015 දී රෙජින් චේන්ජ් ව්‍යාපෘතියකට සම්බන්ධ වී එවකට ජනාධිපතිවරයා පරාජයට පත්කිරීම අනුව එය සිදු කෙරිණි. ඒ අනුව ඔවුන් එහිදී පොරොන්දු වී තිබූ කරුණක් වූයේ ව්‍යවස්ථාව වෙනස් කර පෙඩරල් පාලනයක් ලබාදීමයි. ඒ කිසිවක් කිරීමට ඔවුන්ට හැකියාව නොතිබිණි. එයට පාර්ලිමේන්තුවේ සහය නොලැබිණි. එදා එයට සම්බන්ධ වූ එක්සත් ජාතික පක්ෂය පසුගිය මහ මැතිවරණයේදී අන්ත පරාජයකට පත් විය. ඔවුන්ට ජාතික ලැයිස්තුවෙන් පමණක් එක් ආසනයක් පමණක් හිමිවීම සිදුවිය. එක්සත් ජාතික පක්ෂයේ නායකයාගේ දේශපාලන බළ කඳවුරු වන කොළඹින් ඔහු ලබාගත් මනාප පවා ගණන් කිරීම සිදු නොවුණි.

මානව අයිතිවාසිකම් සම්බන්ධ කොමිෂම මගින් එල්ටිටිඊය යුද අපරාධ සිදු කළ බව පමණක් සඳහන් කරයි. නමුත් ඒ කිසිවක් පුළුල්ව සඳහන් කරන්නේ නැත. ලංකාවේ ඇතුළු රටවල් එකොළහක් මේ එල්ටීටීඊ අපරාධ පිළිබඳ විමර්ශනයට ලක් කිරීම සම්බන්ධයෙන් දැනුම්වත්ය. මේ සියලු සිදුවීම් ත්‍රස්තවාදි ක්‍රියා යටතේ සිදු කෙරිණි. සිවිල් වැසියන් හතළීස් දහසක් මරා දැමූ බව පමණක් ඒ වාර්තාවල සඳහන් විය .ඇත්තවශයෙන්ම සිවිල්වැසියන් යාපනය අතහැරීමෙන් අනතුරුව ලක්ෂ තුනක පිරිසක් මුලතිව් කැලයට රැගෙන යනු ලැබීය.

එසේම මිෂෙල් බැචලේගේ වාර්තාවේ විසි වැනි සංශෝධනය ගැන සඳහන් වෙයි. ස්වාධීන කොමිෂන් ඉවත් කිරීම පිළිබඳ කතා කිරීම ලංකාවේ ඇති අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගැසීමකි. එවකට යහපාලන රජය ඊට අමතරව 19 වැනි සංශෝධනයක් ගෙන එනු ලැබුයේ පෙඩරල් ආණ්ඩු ක්‍රමයක් ගෙන ඒම සඳහාය. නමුත් එයද අසාර්ථක විය. එවැනි දෙයක් කිරීමට වත්මන් රජයට කිසිදු අවශ්‍යතාවයක් නැත. ඒ නිසා 20 වැනි ව්‍යවස්ථාව ගෙන එන ලදි. එහිදී 19 වන ව්‍යවස්ථාවෙන් අඩුකරන ලද ජනාධිපතිවරයාගේ බලතල එලෙසම තබාගන්නා ලද නමුත් දෙවතාවකට වඩා ජනාධිපතිවරණයකට ඉදිරිපත් විය නොහැකි බව ස්ථාපිත කෙරුණි. එමෙන්ම සියලුම කොමිසන් සභා එලෙසම පත් කර ඇත.

මිෂෙල් බැසලේ ගේ අනෙක් යෝජනාව නම් මෙහි කරුණු අන්තර් ජාතික අධිකරණයක විභාග කිරීමට හැකියාව තිබිය යුතු බවයි. එය කළ නොහැකිය. බ්‍රිතාන්‍ය, මැසිඩාව, ජර්මනිය මොන්ටිගෝව වැනි රටවල් ප්‍රතිසංවිධානය සහ මිනිස් අයිතිවාසිකම් පිළිබඳව වගවීම පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවට තොරතුරු ඇත.

කෙසේ වුවද රජය මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමේදි සැලකිය යුතුයි.

පසුගිය වාරයේ යම් ජන්ද ප්‍රමාණයක් අපේ රටට ලැබි තිබුණි. යෝජනාවට පක්ෂව ජන්ද විසිපහක් ලැබුණි. ලංකාවට පක්ෂව 13ක් ද ජන්දය ලබා නොදුන් රටවල් 9ක්ද විය. මේ වන විට රජය සම්පූර්ණෙයෙන් ම 2015 අනුග්‍රහය දැක් වූ 30/1 , 34/1 සහ 40/1 යෝජනාවලින් ඉවත්වී ඇත. ඒ සඳහා වග නොවන බව සඳහන් කර ඇත. මෙවැනි දේ කාම්බෝජයට කිරීමට උත්සහ කළද එයද නොහැකි විය. මේ යෝජනා මෙරට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට පටහැනිය.

අපේ බලාපොරොත්තුව

ඊට අමතරව විදේශීය විනිශ්චයකරුවන් මෙරට නඩු ඇසීමේ හැකියාවක්ද නැත. ඒ බව දැනුවත්ව තිබියදී මේ යෝජනා නැවත නැවත ඉදිරිපත් කිරිම කරනු ලබයි. ඒ නිසා මේ වතාවේදී මේවා නිවැරැදි විය යුතුයි.

මිෂෙල් බැෂලේගේ පිටු දාහතක වාර්තාව මේ වන විටත් අපිට ලැබී ඇත. නමුත් රජය එයට එකඟ නොවී ඊට පිටු 19ක උත්තර වාර්තාවක් සපයා ඇත.

ඉන්දියාව ඇතැම් විට මේ අවස්ථාවේදී අපිට විරුද්ධව ජන්දය පාවිච්චි නොකිරීමට ඉඩ ඇත. චීනය, කියුබාව සහ රුසියාව අපිට පක්ෂව කටයුතු කරයි. වියට්නාමය සහභාගි විය හැකියි. එයත් අපිට පක්ෂව ජන්දය පාවිච්චි කිරීමට ඉඩ ඇත. ඒ නිසා අපිට බලාපොරොත්තුවක් ඇති කර ගැනීමට හැකියි. ත්‍රස්තවාදී කණ්ඩායමක් පරාජය කිරීම හේතු කොට ගෙන මෙවැනි චෝදනාවක් ඉදිරිපත් කිරීම් ලැබූ පළමු රට ලංකාව විය හැකිය. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය ලංකාවේ ස්වාධිපත්‍යට, ස්වාධීනත්වයට සම්පූර්ණව පටහැනි කරුණකි . ඔවුන් මේ වතාවේදී සිරියාවත් එමෙන්ම දකුණු සේමනයටත් යෝජනා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙයි. ඊට අමතරව ඔවුන් මෙසේ පරීක්ෂණ පවත්වන රටවල් වන බුරුමය, මියන්මාරය, තුර්කිය මෙන්ම යේමනය වැනි රටවල් දෙස බැලීමේදී පෙනී යන්නේ ඔවුන් කලක් යටත්ව සිට පසුව නිදහස ලැබූ රටවල් බවයි. ඒ අනුව බටහිර ආධිපත්‍ය එක්තරා ආකාරයකින් යළි නතු කර ගැනීමට උත්සාහ කරන බවක්ද පෙනේ. මානව අයිතිවාසිකම් වල ඒ අය සඳහන් කරන නිර්වචන වල ආර්ථික අයිතිවාසිකම් නොවෙයි.

යුද සමයේ දී එල්ටීටීඊ සංවිධානයට පවා ආහාර ලබා දීම සිදු විය. මේ නිසා යුද්ධයත් මානසික මුහුණුවරකින් සිදුවිය. එය මානුෂික මෙහෙයුමක් වූයේ එනිසාය. ඇත්ත වශයෙන්ම යුද්ධය කළේ මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටය. මූලික මිනිස් අයිතිවාසිකම් යනුවෙන් සඳහන් කරන්නේ ජීවිතය පිළිබඳ ආරක්ෂාව, නිදහස පිළිබඳ ආරක්ෂාව සහ දේපළ පිළිබඳ ආරක්ෂාව ඇති කිරීමය. මේ සියල්ල සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කර මිලේච්ඡ ඝාතනයන් සිදු කෙළේ එල්ටීටීඊ සංවිධානය විසිනි . එමෙන්ම ඔවුන් දෙමළ දේශපාලනඥයන්ද මරා දැමීය.

බිය ගැන්වීම හා තර්ජනය

කිසිම රටකට ඒ පිළිබඳව දඬුවම් දීමට බලයක් මේ කොමිසම සතුව නැත. සිරියාවේ රජය පෙරළා දැමීමට උත්සාහ කර බැරි වූ අවස්ථාවේ සිරියානු රජයට යුද අපරාධ චෝදනා ඉදිරිපත් කරන ලදී.

ඒ නිසා අපට කළ හැකි වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයට පැමිණිල්ල ගෙන ඒමයි. නමුත් ආරක්ෂක මණ්ඩලයට ඒකමතික භාවයක් නොමැති අතර කිසිදු විටක බටහිර රටවලට අවශ්‍ය ආකාරයට කටයුතු නොකරයි. විශේෂයෙන් චීනය සහ රුසියාව වැනි රටවල් එසේ නොකරනු ඇත. එම නිසා මෙය එක්තරා බිය ගැන්වීමක් නැත්නම් තර්ජනය කිරීමක් විය හැකිය. දෙමළ ජනතාව රැවටීමක් සහ දෙමළ දේශපාලනඥයන්ට යම්කිසි ආකාරයකට ඩයස්පෝරාව උසි ගැන්වීමක් පමණක් මෙතැනදි සිදුවිය හැකිය. නමුත් අපේ රටේ සියලු ජන කොටස්වල මානව අයිතිවාසිකම් ආරක්ෂා විය යුතුය.

එක්සත් ජාතික පක්ෂය මැතිවරණ නොපැවැත්වීමට හේතුව ව්‍යස්ථාව වෙනස්කොට ෆෙඩරල් ආණ්ඩු ක්‍රමයක් ඇති කිරීමට ඔවුන් බලාපොරොත්තු වීමය.

එම නිසා දැන් පළාත් සභා මැතිවරණය පවත්වා සියලු පළාත් සභා යථා තත්ත්වයට පත් කළ යුතුයි. මේ වන තුරු TNA පක්ෂය ඉල්ලා සිටින්නේ එය දෙමළ ජනතාවගේ අභිලාෂය ෆෙඩරල් ආණ්ඩු ක්‍රමයක් බවයි. ඔවුන්ට පෙර බණ්ඩාරනායක මහතා එය ඉල්ලා සිටියා. එමෙන්ම උඩරට සංගමය ඉල්ලුවා.

නමුත් ඒ කිසිවක් ඉටු වූයේ නැහැ. ශ්‍රී ලංකාව සියලු ජනතාවගේ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම මගින් කටයුතු කළ යුතුයි. එය කළ හැකි වන්නේ විදේශීය ආයෝජනයන්ට පහසුකම් ඇති කිරීම මගිනි. ඒ නිසා අපි මුළු ලෝකෙම ජනතාවගෙන් ඉල්ලා සිටින්නේද මෙරටට සංවර්ධනය කරා ගමන් කිරිමට ආධාර කරන ලෙසයි. මේ රටේ මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කරගනිමින් ආර්ථික සංවර්ධනයක් ගමන් කිරීම සහාය වීම අද දවසේ සියලු දෙනාගේ වගකීමයි.



බදුල්ල මහ නගර සභාවේ අලකලංචිය

● ටී. චන්ද්‍රෙස්කර

බදුල්ල මහ නගර සභාවේ බල අරගලය උත්සන්න වූ අතර මේ වසරේ අයවැය පරාද විය. එසේ අයවැයක් පරාද වුවහොත් ගතයුතු ක්‍රියාමාර්ග පළාත් පාලන විධිවිධාන පනතේ පැහැදිලිව සඳහන් කර ඇත. එම විධිවිධාන වලට අනුව නැවත වතාවක් අයවැය ඉදිරිපත් කළ යුතුය. එහෙත් එවැන්නක් සිදුවූයේ නැත. නගරාධිපති පුටුවට ඇතිවූ බල අරගලය මේ සියල්ලටම මුල්විය. මේ ගැන කිසිත් නොකියා සිදුවන්නේ කුමක් දැයි බදුල්ලේ ජනතාව බලා සිටිති.

පළාත් පාලනය යනු විමධ්‍යගත විෂයකි. එනිසා අද පළාත් සභාවද විසුරුවා හැර ඇත. අද පළාත් සභාවේ බලධාරියා ආණ්ඩුකාරවරයායි. එවන් පසුබිමක බදුල්ල මහ නගර සභාවේ කටයුතු අත්හිටුවා විශේෂ කොමසාරිස් පාලනයට ලක් කරමින් ඌව පළාත් ආණ්ඩුකාර ඒ.ජේ.එම්. මුසම්මිල් විසින් ගැසට් නිවේදනයක් නිකුත් කර තිබේ. මෙලෙස විශේෂ කොමසාරිස් ලෙස පත් කර ඇත්තේ පරිපාලන සේවා නිලධාරියකු වන ජීවන්ත හේරත් ය.

2018 පෙබරවාරි මස 10 වැනිදා පැවැති පළාත් පාලන මැතිවරණයෙන් බදුල්ල මහ නගර සභාව සඳහා තරඟ කළ දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අතරින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මන්ත්‍රීවරුන් 5 දෙනෙකුද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් මන්ත්‍රීවරුන් 8 දෙනෙකුද, එක්සත් ජාතික පෙරමුණෙන් මන්ත්‍රීවරුන් 9 දෙනෙකුද, ජනතා විමුක්ති පෙරමුණෙන් මන්ත්‍රීවරුන් 3 දෙනෙකුද වශයෙන් සභිකයින් 25 දෙනෙකු තේරී පත් වූහ. මෙහි බහුතර බලය හිමි තනි දේශපාලන පක්ෂය ලෙස එක්සත් ජාතික පෙරමුණ පත්ව සිටියත් පාලන බලය පිහිටුවීමට සෙසු පක්ෂ කිසිවක සහය හිමි නොවුණු අතර බලය පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හා ශ්‍රීලංකා නිදහස් පක්ෂය කම්කරු ඇමති නිමල් සිරිපාල ද සිල්වාගේ මූලිකත්වයෙන් සාකච්ඡා කර එහි එකඟතාව අනුව බලය පිහිටුවන ලද අතර, ඒ හරහා ආණ්ඩු පක්ෂයට ආසන 13 ක්ද, විපක්ෂයට ආසන 12 ක්ද හිමි විය.

නගරාධිපතිට දැන් බලයක් නෑ

බදුල්ල මහනගර සභා රැස්වීම් ශාලාවේදී නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති තෝරා පත්කරගැනීමේ රැස්වීම් 2018 මාර්තු මස 28 දා පළාත් පාලන කොමසාරිස් මංගල රංදෙණියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර නගරාධිපති තනතුර සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනයන් ලෙස ඩබ්ලිව්. ඩී. ප්‍රියන්ත අමරසිරිගේ හා එක්සත් ජාතික පෙරමුණ නියෝජනයක් ලෙස බදුල්ල මහනගර සභාවේ හිටපු නගරාධිපතිවරයකු,මෙන්ම විපක්ෂ නායකයා වූ ඇම්. ඩී. ඒ. හේමචන්ද්‍රගේ නම යෝජනා වූ අතර ඡන්දය විමසීමේදී හේමචන්ද්‍රට ඡන්ද 9ක් ලැබුණු අතර , ඡන්ද 12ක් ලබාගත් ප්‍රියන්ත අමරසිරි නගරාධිපති ධූරයටත්, නියෝජ්‍ය නගරාධිපති ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් පත් වූ අසිත නලින්ද රංගේ පත්විය. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු තිදෙනා ඡන්දය දීමෙන් වැළකී සිටියේය.

දෙපාර්ශ්වය එක්ව පාලනය කළත් විටින් විට මත භේද ගැටුම් ඇතිවිය. පාලක පක්ෂයේම දෙපිරිසක් අතර වූ කඹ ඇදීම් නිසා නගරයේ සංවර්ධනය ඇතුළු කටයුතු වලට නොයෙකුත් බාධා ඇතිව තිබිණි. නගර සභාවේ පාලනයට වසර දෙක හමාරක් ගතවනවිට එහි ගැටුම්කාරී තත්ත්වය තව තවත් උත්සන්න වන්නට විය. එම මත භේදාත්මක ගැටුම්කාරී තත්ත්වය මතම 2021 වර්ෂය සඳහා වූ අයවැය නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කළේ ඉකුත් දෙසැම්බර් මස 01 වැනිදාය.

එම අයවැය වැඩි ඡන්ද නවයකින් පරාජයට පත්විය. අයවැයට පක්ෂව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභිකයන් 8 දෙනා පමණක්ම ඡන්දය ප්‍රකාශ කළ අතර එක්සත් ජාතික පෙරමුණ, ජනතා විමුක්ති පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්ව අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළහ. ඌව පළාත් ආණ්ඩුකාර ඒ.ජේ.එම්. මුසම්මිල් විසින් බදුල්ල මහ නගර සභාවේ කටයුතු අත්හිටුවා විශේෂ කොමසාරිස් පාලනයට ලක් කර ඇත්තේ මෙවන් පසුබිමකය.

මේ පිළිබඳව ඌව පළාත් ආණ්ඩුකාර ඒ.ජේ.එම්. මුසම්මිල් අදහස් දැක් වූයේ මෙසේය.

"මේ හැම දේකටම මුල යහපාලන ආණ්ඩුව සමයේ ඇති කළ ක්‍රමවේදයයි. ඒ ක්‍රමවේදයෙන් පළාත් පාලන ආයතන සියල්ල විනාශ වුණා. මේ අය මේ දේ කරලා තියෙන්නේ පළාත් පාලන ක්ෂේත්‍රය ගැන කිසිම දැනුමක් නැතිවයි. ඒ නිසා අද හැම ප්‍රාදේශීය සභාවක්ම හරිම අමාරුවෙන් පවත්වාගෙන යන්නෙ. මේ ක්‍රමය හැකිතාක් ඉක්මනින් වෙනස්කරන්න ඕනෑ. බදුල්ල මහ නගර සභාවේ නගරාධිපතිවරයාට දැන් ඒ බලය නැතිවෙලා. තවදුරටත් සභාව පවත්වාගෙන යන්න බැරි තැනට පත්වෙලා. සභාවේ අය ඇවිත් නගරාධිපතිවරයා අයින් කරන්න කියලා ඉල්ලනවා. මට ඒක කරන්න බලය නෑ. මම නගරාධිපතිට කිව්වා එකතුවෙලා වැඩ කරගෙන යන්න කියලා. කාරක සභා සියල්ල 31 වැනිදාට කලින් පත් කරන්න කිව්වා.

නගරාධිපතිගේ පාලනය නීති විරෝධියි

ඒක සිදුවුණෙත් නෑ. අද නගර සභාව අක්‍රියයි. මුදල් වියදම් කරන්න බෑ. සංවර්ධන කටයුතු කරන්න බෑ. ඝන අපද්‍රව්‍ය එකතුකරන්න බෑ. කොටින්ම කියනවා නම් කිසිම දෙයක් කරන්න බෑ. නගරාධිපතිවරයාට සභාව තවදුරටත් පවත්වාගෙන යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. සියලු දේ ක්‍රියා විරහිතයි. මේක ජනතාවට ලොකු පාඩුවක්. මේක බදුල්ලේ හැමෝටම බලපාන දෙයක්. මේ තුළ තියෙන්නේ බල අරගලයක්. අද කොවිඩ් 19 වසංගතය බදුල්ලේ උත්සන්න වෙමින් පවතිනවා. එය පාලනය කරන්න අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගන්න මම උපදෙස් දීලා තියෙනවා.

(වමේ සිට) ඌව පළාත් ආණ්ඩුකාර ඒ.ජේ.එම්. මුසම්මිල්, බදුල්ල මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති අසිත නලින්ද රංගේ, විපක්ෂ නායක එම්.ඩී.ඒ.හේමචන්ද්‍ර, ජවිපෙ නාගරික මන්ත්‍රී නන්දන හපුගොඩගේ

බදුල්ල මහ නගර සභාවේ විපක්ෂ නායක එම්.ඩී.ඒ.හේමචන්ද්‍ර මේ තත්ත්වය ගැන මෙසේ පැවසීය.

"පසුගිය දෙසැම්බර් මාසේ 01 වැනිදා අයවැය ඉදිරිපත් කළා. අයවැයට පක්ෂව ඡන්ද 8 යි; විපක්ෂව ඡන්ද 17 ක් ලැබී අයවැය පරාජයට පත්වුණා. එසේ වුණාම 2012 විශේෂ පළාත් පාලන විධිවිධාන පනතට අනුව ඉදිරි ක්‍රියාමාර්ග එනම් මීළඟ පියවර ගතයුතුයි. අපි ඒ දේ කරන්න කියලා බල කළා. ඒ දේ කරවන්න කියලා ආණ්ඩුකාරතුමාට ලියුම් විශාල ප්‍රමාණයක් යැව්වා. ඒ එක ලියුමකටවත් මේ දක්වා පිළිතුරක් නෑ. පස්සේ අපි එතුමා සමග සාකච්ඡා කළා. පළාත් පාලන විධිවිධාන පනතට අනුව නගරාධිපතිවරයා විසින් දෙවන වරට අයවැය ඉදිරිපත් කළ යුතුයි.

යහපාලන නඩය ප්‍රයෝජන ගත්තා

එසේ නොකර මේ අය ඒ විධිවිධාන පනතට පටහැනිව කටයුතු කිරීම තරයේ හෙළා දකිනවා. මේ තත්ත්වය යටතේ මේ වසරේත් මාස එකහමාරක් නගරාධිපතිවරයා විසින් නගර සභාව පාලනය කිරීම නීති විරෝධි ක්‍රියාවක්. මේ ගැන ආණ්ඩුකාරවරයා නිකුත් කළ ගැසට් නිවේදනයට එරෙහිව අපි උසාවි ගියා. මහාධිකරණය මේ නියෝගය අවසන් කරන තුරු ගැසට් එක තහනම් කළා. එක රටක තිබිය යුත්තේ එකම නීතියක්. යාපනයට එක නීතියකුත් බදුල්ලට තව නීතියකුත් ක්‍රියාත්මක වන්නට බැහැ."

කෙසේ වෙතත් මෙම නගර සභාවේ කටයුතු මාස තුනකට අත්හිටු වූ ඌව පළාත් ආණ්ඩුකාරවරයා මේ පිළිබඳව විමර්ශනයක් කරන්නට විශ්‍රාමලත් විනිසුරුවරයෙක් පත් කළේය.

නගර සභාවේ සිද්ධිය පිළිබඳ බදුල්ල නගරාධිපති ඩබ්ලිව්.ඩී ප්‍රියන්ත අමරසිරිගේ අදහස මෙසේය.

"2018 පැවැති පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග එක්ව බලය පිහිටුවා මාර්තු මාසයේ වැඩ පටන් ගත්තා. වසර දෙක හමාරක් නගර සබාව පවත්වාගෙන ගියා. ඒ දවස්වලත් ගැටලු මතු නොවුණා නෙවෙයි; ප්‍රශ්න ඇති නොකළා නොවෙයි. අපි පාලනය බාරගත් ගමන් අපිට බලය තිබුණත් එකඟතාව හිමිවුණේ නෑ. අපි බාරගන්නකොට විශාල ණය කන්දරාවක් තිබුණා. ඒවාත් විසඳගෙන ජනතාවට සේවය කරගෙන ගියා. වසර දෙක හමාර වනවිට දේශපාලන කුමන්ත්‍රණ ඇති කරන්න පටන් ගත්තා. ඒකට හොඳම අවස්ථාව අයවැය ඉදිරිපත්කරන මොහොත. බලන්න 2015 යහපාලනය ගේන්න ශ්‍රීලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ එකතු වුණා වගේ මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න මේ යහපාලන සෙට් එක එකතු වුණා කියලයි මම හිතන්නේ.

අපි අයවැය හදලා මහජන නියෝජිතයන්ට ඉදිරිපත් කළා. ඒ අය සංශෝධන ඉදිරිපත් කළා ඒ සියලු සංශෝධනයන්ට යටත්ව දෙසැම්බර් 01 වැනිදා අයවැය ඉදිරිපත් කළා. මේ සභිකයන් ඉදිරිපත් කළ සංශෝධන සියල්ල පිළිගත්තා කියන්නේ ඒ සියලු දෙනා අයවැය පිළිගත්තා කියන එක තමයි. එසේ තිබිය දී මේ අය අයවැයට විරුද්ධව ඡන්දය දුන්නා. මේ කිසිම කෙනෙක් අයවැයට විරුද්ධව කතාකළේ නෑ. නියෝජ්‍ය නගරාධිපති කියන්නේ අපේ එකඟතාවට අනුව නගරාධිපති කටයුතු නොකළ නිසා අයවැයට විරුද්ධ වෙනවා කියලයි. තනතුරු තානාන්තර නිසා ඒවා නොලැබුණයි කියන පුද්ගලික මතිමතාන්තර නිසා ජනතාවගේ සුබ සිද්ධිය සඳහා ඉදිරිපත් කළ අයවැයට විරුද්ධවීම කොයිතරම් වරදක්ද? මේ අයවැය යෝජනා හදනකොට පක්ෂ පාට බැලුවේ නෑ. යෝජනාව සහ එයින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ ගැන විතරයි මම බැලුවේ.

බදුල්ල මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති අසිත නලින්ද රංගේ මෙසේ පැවසීය.

"බදුල්ල මහ නගර සභා මැතිවරණය පැවැත්වුණේ යහපාලන ආණ්ඩුව සමයේ. ඒ වෙලාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මෙහෙ ලොකු බලයක් තිබුණා. නිමල් සිරිපාල ද සිල්වා ප්‍රබල ඇමතිවරයෙක්, ඩිලාන් පෙරේරා රාජ්‍ය ඇමතිවරයෙක්, චාමර සම්පත් දසනායක ඌව පළාත් මහ ඇමතිවරයා මෙතරම් ප්‍රබල පිරිසක් සිටිය දී අපිට යහපාලනයේ සිටි එජාපය සමග නගර සභාව පිහිටුවන්නත් තිබුණා. නමුත් අපි එසේ නොකර පොහොට්ටුව සමග නගර සභාව පිහිටුවන්න පොහොට්ටුවේ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 13 දෙනාම එකතු වෙලා හිටපු නගරාධිපති නීතිඥ උපාලි නිශ්ශංක ගුණසේකර හා හිටපු මන්ත්‍රී නීතිඥ සුජීව ජයසිංහ ඉදිරිපිට එකඟතා ලියවිල්ලකට අත්සන් කළා. ඉස්සෙල්ලාම අපි කිව්වේ ආණ්ඩු බලය, පළාත් සභා බලය අපිට තියෙන නිසා මුල් කාර්තුවේ නගරාධිපතිකම අපිට ඕනෑ කියලා. අවසානයේ අගමැති මහින්ද රාජපක්ෂයන් මට කතා කරලා කිව්වා මෙයාට මුල් කාර්තුව දෙන්න කියලා ඊට පස්සේ අපි කැමැති වුණා. ඒ එකඟතාව අනුව වසර දෙකකින් ඒ කියන්නේ 2020 මාර්තු මාසයේ නගරාධිපතිකම මට දෙන්න ඕනෑ. නමුත් ඒ දිනවල කොරෝනා ප්‍රශ්නයත් සමග ඒ ගැන කතා කළේ නෑ. නගර සභාව පැවතියේ එක වැඩි ඡන්දයකින්. සභාව පිහිටවලා මාස 6 ක් යන්න කලින් අපේ මන්ත්‍රීවරයෙක් විපක්ෂයට ගියා ඒකෙන් 2019, 2020 අයවැය පැරදුණා. මේ සභාව පවත්වාගෙන යන්න අපි පුදුම කට්ටක් කෑවා. පසුව විපක්ෂයට ගිය ආතර් සිල්වා මන්ත්‍රී අයින් කරලා නාලක මන්ත්‍රීවරයා පත්කරලා මේක පවත්වා ගෙන ගියා. අන්තිමට පසුගිය ඔක්තෝබර් මාසයේ මම නගරාධිපතිකම ගැන මතක් කළාම ඒ දේ කරන්න ලෑස්ති වෙනවා. මේ අයවැය දිනුවාම දෙන්නම් කියලා අපි කාටත් හොරෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කච්චේරියට ආ වෙලාවේ දිගටම එයා නගරාධිපති ධූරයේ ඉන්නවා කියලා ලියුමක් දීලා. මේ වගේ එකඟතාව බින්ද නිසා තමයි අපි අයවැය පැරද්දුවේ".

ජනතා විමුක්ති පෙරමුණ නාගරික මන්ත්‍රී නන්දන හපුගොඩගේ අදහස මෙසේය.

මේ නගර සභා අර්බුදයේ දී ආණ්ඩුකාරතුමා ගත් ක්‍රියාමාර්ය පැහැදිලි නැහැ. මේ ක්‍රියාමාර්ගය ගන්න කලින් අපි එක්ක සාකච්ඡා කරන්න තිබුණා. අයවැය යළිත් ඉදිරිපත් නොකිරීම නගරාධිපතිගේ වරදක්. සභාව අත්හිටුවන්නේ නැතිව නගරාධිපතිව අත්හිටුවන්න තිබුණා. මේ තීරණය නිසා පුරවැසියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය, පරමාධිපත්‍ය නැතිවෙලා. අනෙක නගර සභා පාලකයන්ගේ අභ්‍යන්තර ප්‍රශ්නය ජනතාව පිට පැටවීම වැරදියි.

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ට කැකිල්ලේ තීන්දුවක්

කලකට ඉහත මෙරට රාජ්‍ය සේවය සැලකුණේ ඉතාමත් ගෞරවනීය වෘත්තියක් වශයෙනි. ඒ අනුව එකල විසු හැම දෙමාපියෙකුම දුටු සුන්දරම සිහිනයක් වූයේ තමන්ගේ දූ දරුවන් රාජ්‍ය සේවයට අයත් විවිධ තනතුරු තානාන්තර උසුලන අයුරු දැකගැනීමටය.

එකල ඔවුන් එසේ සිතීමට මුල් වූ හේතු සාධකයන්ද බොහෝමයක් තිබුණි.ඒ අතරින් ප්‍රධානම හේතුවක් වූයේ රාජ්‍ය සේවයේ පැවති රැකියා සුරක්ෂිත භාවයයි. එකල රාජ්‍ය සේවයේ දේශපාලන සුළි කුණාටු නොතිබීම ඒ සඳහා මුල්වූ ප්‍රධානතම හේතු සාධකය විය.එහෙයින් රටේ ආණ්ඩු මාරුවන වාරයක් පාසා රාජ්‍ය සේවකයන්ට දුරබැහැර පළාත් වලට දඬුවම් මාරුවීමක් ලබා දීම හෝ වැඩ තහනම් කිරීමක් එකල සිදු නොවූ අතර, රාජ්‍ය සේවයට අයත් සියලු සේවකයන්ට නිදහසේ තම රැකියාවන්හි නිරතවීමට ඉඩ ලැබී තිබුණේය.

වයස අවුරුදු 55 න් හෝ 60 න් පසු තම රැකියාවෙන් සමුගෙන විශ්‍රාම ලබන තත්කාලීන විශ්‍රාමිකයන්ට තමන්ගේ මරණය දක්වාම විශ්‍රාම වැටුපක් හිමිවීම රාජ්‍ය සේවකයාගේ හිමිකමක් ලෙස සැලකුණි. එපමණක්ද නොව විශ්‍රාමිකයා මිය ගිය පසු ඔහුගේ බිරිය ජීවත්ව සිටින තුරුම එකී විශ්‍රාම වැටුප ලබා ගැනීමටද නීතිමය හිමිකමක් ලැබී තිබුණේය.

ගතවූ කාලය තුළ බලයට පත්වූ ඇතැම් ආණ්ඩු ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර ණය දෙන ආයතන වල උපදෙස් මත එක්තරා අවස්ථාවකදී රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප වෙනුවට වෙනත් ක්‍රමවේද හඳුන්වා දුන් බවද අපට මතකය. එහෙත් කුමන හෝ වාසනාවක් නිසා අතීතයේ සිටම රාජ්‍ය සේවකයන් සතුව තිබුණ විශ්‍රාම වැටුප් අයිතිය ඊළඟට පත්වූ ආණ්ඩුව මගින් යළි සුරක්ෂිත කරනු ලැබුවෙන් අපේ රාජ්‍ය සේවකයන්ට නිදහසේ හුස්ම ගැනීමේ අවස්ථාව මේ දක්වාම ලැබී තිබුණේය.

එහෙත් දැන් මෙරට රාජ්‍ය සේවකයන්ගේ හිස මත තවත් හෙණ ගෙඩියක් පාත්වී ඇති බවක් අසන්නට ලැබේ.ඒ අනුව දැන් සිදුවී ඇත්තේ විශ්‍රාම යාමට සූදානමින් සිටින සියලුම රාජ්‍ය සේවකයන් වැන්දඹු හා අනත්දරු අරමුදලට ගෙවිය යුතු සියලුම දායක මුදල් තම මාසික වැටුපෙන් අයකර ගෙන ඇති බව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන තමන් මීට පෙර සේවය කළ සේවා ස්ථාන වලින් ලබා ගෙන විශ්‍රාම වැටුප් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු බවට කොන්දේසියක් පැනවී තිබීමය. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ එම කොන්දේසියට අනුව අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන රාජ්‍ය සේවකයන්ට සිදු වී ඇත්තේ එකී දායක මුදල තමන්ගේ පෞද්ගලික මුදලින් ගෙවා දැමීමටය.

එකී රාජ්‍ය සේවකයා එම දායක මුදල තම පෞද්ගලික මුදලින් ගෙවා අවසන් කරන තුරු ඔහුගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුව සැකසීම තාවකාලිකව නතර කෙරේ. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ එම චක්‍රලේඛයෙන් සිදු වන්නේ විශ්‍රාමිකයා කබලෙන් ලිපට වැටීමය.එසේ වන්නේ අදාළ පුද්ගලයා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වූ දින සිට ඔහුගේ මාසික වැටුප් ගෙවීම නිරායාසයෙන්ම නතර වන බැවිනි.

මෙරට කාලයක් තිස්සේ පැවැති ඇතැම් රාජ්‍ය දෙපාර්තමේන්තු ඒ ඒ වකවානුවල බලයට පත්ව සිටි ආණ්ඩු වලින් අහෝසි කර දමා ඇති අතර එම ආයතන වල සේවය කළ රාජ්‍ය සේවකයන්ට වෙනත් සේවා ස්ථාන වලට මාරුවීම් ලබා දී තිබුණේය. උදාහරණයක් වශයෙන් වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව, විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව වැනි දැනට අහෝසි කර ඇති රාජ්‍ය ආයතන දැක්විය හැකිය. මීට අමතරව තවත් සමහර දෙපාර්තමේන්තු වල තිබූ එම පැරණි ලිපි ලේඛන කාලයාගේ ඇවෑමෙන් අස්ථානගත වී හෝ විනාශ වී ගොස් තිබේ. ඒ අනුව යම් යම් කාල වකවානු වලදී එම ආයතන වල සේවය කළ රාජ්‍ය සේවකයන්ට එකී ලිපි ලේඛන වල පිටපත් ඉදිරිපත් කිරීම කිසිසේත්ම කළ නොහැකි කර්තව්‍යයකි.

එවන් තත්ත්වයකට මුහුණ පා සිටින රාජ්‍ය සේවකයන්ට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබා දී ඇති විකල්ප විසඳුම වන්නේ එකී ලිපි ලේඛන ඉදිරිපත් කළ නොහැකි කාලවකවානුවට අදාළ වැන්දඹු හා අනත්දරු අරමුදලේ දායක මුදල් තමන්ගේ අතින් ගෙවා දැමීමය. එහෙත් වත්මන් ජීවන වියදම හමුවේ ණය බරින් මිරිකී හෙම්බත්ව සිටින පහළ ශ්‍රේණිවලට අයත් රාජ්‍ය සේවකයන් අරඹයා එම විකල්ප ක්‍රියාමාර්ගය කෙතෙක් දුරට ප්‍රායෝගික දැයි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වරයාට නොවැටහීම කනගාටුවට කරුණකි. නැතහොත් ඔහු විසින් සිදු කර ඇත්තේ භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් ලැබෙන නියෝගය අවිචාරයෙන් යුතුව පිළිගැනීමද?

අනෙක් අතට සේවා ස්ථිරත්වයක් ලැබූ සියලුම රාජ්‍ය සේවකයන්ට මාසික වැටුපෙන් වැන්දඹු හා අනත්දරු අරමුදල සඳහා දායක මුදල් කපා ගැනීම ඔහු සේවය කරන රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සතු වගකීමයි. යම් ආයතන ප්‍රධානියෙකු විසින් අදාළ රාජ්‍ය සේවකයාගේ මාසික වැටුපෙන් එම දායක මුදල් අයකර ගෙන නැතිනම් එය එකී රාජ්‍ය සේවකයාගේ වැරැද්දක් නොවේ. එසේ වුවද දැන් සිදු වී ඇත්තේ කවුරුන් හෝ ආයතන ප්‍රධානියකු අතින් සිදුවී ඇති වැරැද්දකට වන්දි ගෙවීමට විශ්‍රාමිකයාට සිදු වීමය.

මානව හිමිකම් චෝදනා නගන්නේ අප දණ ගැස්වීමටයි

● තාරක වික්‍රමසේකර

තිස්වසරක යුද්ධය නිමා කිරීමේදී නාවික හමුදාවේ භාරදූර කාර්යයක් සිදු කළ හිටපු නාවික හමුදාපතිවරයකු වූ වත්මන් විදේශ අමාත්‍යාංශයේ ලේකම් අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ අද සිළුමිණ සමඟ එක්වන්නේ මානව හිමිකම් උල්ලංඝනය ගැන අපට නැඟෙන චෝදනා සහ විදේශ රැකියා සම්බන්ධයෙන් කරුණු දැක්වීමටයි.

❍ ජිනීවා මානව හිමිකම් සමුළුව ලබන 22 වැනිදා ආරම්භ වනවා කොහොමද සූදානම..

අපි ඒ සඳහා මුහුණ දිය යුතු වෙනවා. මේ වන විටත් මහ කොමසාරිස්වරිය විසින් අපට වාර්තාවක් එවා තිබෙනවා. අප එය නිරීක්ෂණය කරා. එහි දත්තයන් නීතිය හා අවබෝධතාවන්හි තිබෙන වැරැදි තැන් පිළිබඳව අපි කරුණු දක්වා ලිපියක් යොමු කර තිබෙනවා. එම ලිපිය මේ වන විටත් එක්සත් ජාතීන්ගේ වෙබ් අඩවියේ පළ කර තිබෙනවා. මහ කොමසාරිස්වරිය එම පිළිතුරු ලිපියට අනුව සැසිවාරයට කරුණු දක්වාවි. සමුළුවට සහභාගී වී කටයුතු කරන ආකාරය ගැන අපි මේ වන විටත් සාකච්ඡා කරමින් ඉන්නෙ.

❍ ජිනීවා මානව හිමිකම් සමුළුව ආරම්භය ආසන්න වන හැම අවස්ථාවකම අපට චෝදනා එල්ල වනවා...

ඔව් ඒ කතාව ඇත්ත. එල්.ටී.ටී.ඊ හිතවාදී ඩයස් පෝරාව විදේශ රටවල සිට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් වගේම විදේශ රටවල සිට ක්‍රියාත්මක වන මානව හිමිකම් සංවිධාන ශ්‍රී ලංකාවට පහර දීමක් සිදු කරනවා.

ඒ වගේම මෙරට නිදහසේ ජීවත්වන ඇතැම් පිරිස් ශ්‍රී ලංකාවට විරුද්ධව මානව හිමිකම් කොමිසමට වාර්තා යවනවා. ඒක ඇත්තටම රටට කරන ද්‍රෝහීකමක් විදිහටයි මම නම් දකින්නේ.

මේ අවස්ථාවේ අපි කොවිඩ් වසංගතයෙන් වූ ආර්ථික අර්බුදයෙන් බේරෙන්න කටයුතු කරනවා. ඒ අතරේ තවත් කෙනෙක් කියනවානම් තමන් ජීවත්වන රටටම සම්බාධක පනවන්න කියලා, එහෙමත් නැත්නම් රට අන්තර්ජාතික අධිකරණවලට ගෙන යා යුතුයි කියලා, තමන්ගේ රටේම පුද්ගලයන්ට සංචාරක සීමා පනවන්න කියලා ඒ පුද්ගලයන් ශ්‍රී ලාංකිකයොද කියල අපිට හිතා ගන්නවත් බැහැ.

එකම රටක එකම ජාතියක් ලෙස ඉදිරියට යන එකටයි අප කටයුතු කරන්නෙ. ඒත් මේ විදිහෙ අයත් එක්ක තමයි අපිට කටයුතු කරන්න වෙලා තියෙන්නෙ. මේ ඇතැම් වාර්තාවල සඳහන් වෙන දේවල් අන්තර්ජාතිකව කතා කළ යුතු දේවල් නෙමෙයි කියල පැහැදිලියි. කොමිසමකට කතා කළ යුතු ඒවා නෙමෙයි තියෙන්නෙ. මේ සියල්ල පිටුපස කොටි හිතවාදී ඩයස් පෝරාව ඉන්න බව පැහැදිලියි.

❍ දෙමළ ඩයස් පෝරාවේ ක්‍රියාකාරකම් මේ සමුළුවට කුමනාකාරයෙන් බලපායිද? ඔවුන්ගේ ක්‍රියාකාරකම් අඩුවෙලා නේද?

දෙමළ ඩයස් පෝරාව මෙහි පිටුපස ඉන්නවා කිව්වොත් ඒක වැරැදියි. මේ පිටුපස ඉන්නෙ කොටි හිතවාදී ඩයස් පෝරාවයි. දෙමළ ඩයස් පෝරාවට අයත් විශාල පිරිසක් ඉන්නවා. නමුත් ඒ සියලු දෙනාම කොටි හිතවාදීන් නෙමෙයි.

මීට මාස දෙකකට විතර කලින් අපට ඉතා පැහැදිලිව දකින්න ලැබුණා කොටි සංවිධානය විසින් යුරෝපයේ ඇමරිකාවේ කැනඩාවේ සංවිධානය කරපු විරෝධතාවලට සහභාගි වූයේ ඉතාම අඩු පිරිසක් බවට.



කොටි සංවිධානය 2009 වසර දක්වා ත්‍රස්තවාදී වැඩට මුදල් එකතු කරා. අදත් එකතු කරනවා. ඔවුන් සතුව ආයෝජනය කළ විශාල අරමුදල් තියෙනවා. එහි විශාල ප්‍රතිලාභ තියෙනවා. ඒ අරමුදල් හරහා ඔවුන්ට අන්තර්ජාතික මත ගොඩ නඟන්න පුළුවන්. ඒ වගේම මුදල්වලට අන්තර්ජාතිකව බලපෑම්කරන්න පුළුවන්. මේ වගේ තත්ත්වයක් සමඟ තමයි අපි මේ කටයුතු කරන්නෙ.

❍ මානුෂීය මෙහෙයුම අවසන් කිරීමෙන් පසු ලෝකයේ බොහෝ රටවලින් අපට ඉහළ ප්‍රතිචාර ලැබුණා. දැන් අප රටට හැමදාම මානුෂීය මෙහෙයුම සම්බන්ධව යුද අපරාධ චෝදනා එනවා. මොකක්ද මේ දෙබිඩි ප්‍රතිපත්තිය.

යුද අපරාධ ලෙස ගතහැකි සිද්ධාන්තයන් පැහැදිලිවම දක්වා තිබෙනවා. ඒ අතර සමූල ඝාතනයක් සිදු කිරීම, එක ජන කොට්ඨාසයක් එක පෙදෙසකින් ඉවත් කිරීම, මහා පරිමාණ ලෙසින් අයිතිවාසිකම් අහිමි කිරීම, දූෂණයට ලක්කිරීම යුද අවියක් ලෙස භාවිත කිරීම, ළමා සොල්දාදුවන් භාවිත කිරීම, ආහාර හෝ ජලය විශාල ප්‍රදේශවලට අහිමි කිරීම මෙවැනි දේවල් ඊට තමයි අයත්වන්නේ.

මේ කිසිවක් රජයේ හමුදාවන් අතින් සිදුවී නැහැ. අනෙක් පැත්තට ගෙන බැලුවොත් කොටි සංවිධානය විසින් මේ සියල්ල සිදු කරල තියෙනවා. ඔවුන් සමූල ඝාතන කොතරම් කරල තියෙනවද? කැබිතිගොල්ලෑවේ බස් බෝම්බයෙන් 90 ගාණක් ඝාතනය කළා. මහ බැංකුවේ 1,700ක් බෝම්බ ලොරියක් යවා ඝාතනය කළා. ශ්‍රී මහා බෝධියේ සිල් සමාදන් වුණු 125ක් පමණ ඝාතනය කළා, කාත්තන්කුඩියේ පල්ලියක යාඥා කරමින් සිටි 125ක් විතර සමූල ඝාතනය කරා. 1989 සටන් විරාම ගිවිසුම ඒක පාර්ශ්විකව කඩකරමින් පොලිසියේ 600ක පමණ නිලධාරීන්ට බාර වන ලෙස දන්වා ඔවුන් ඝාතනය කළා.

මාවිල්ආරු හරහා පානීය ජලය ලබාගත් ගොවීන් 25,000කට පමණ ජලය අහිමි කළා.

තිස් අවුරුද්දක් තිස්සේ ලෝකයේ දරුණුතම ත්‍රස්ත සංවිධානයක් අතර තිබුණු අභ්‍යන්තර යුද්ධයක් අපි නිමා කළා, ඒ වගේම ඒ යුද්ධයෙන් පසුවත් අපි ඉක්මනින් සාධාරණීය ලෙසින් ඉදිරියට ගමන් කරන බව පේනවා.

විදේශ අමාත්‍යාංශයේ ලේකම් අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ

ළමා සොල්දාදුවන් බඳවා ගත්තා. ඒ සියල්ල දෙස බැලූ විට පැහැදිලියි යුද අපරාධ එල්ල කළ යුත්තේ කාටද කියල.

❍ එතකොට හමුදාවට එල්ල වන චෝදනා සම්බන්ධයෙන් ඔබ දරන මතය..

රජයේ හමුදාව සිදු කෙරේ ව්‍යවස්ථාවෙන් රජය විසින් කළයුතු රටේ ජනතාවගේ ආරක්ෂාව සැලසීමයි. මේ රටේ ජනතාවගේ ජීවිත ආරක්ෂාව කර දීමයි. එය නොකරානම් තමයි එය අපරාධයක් වන්නේ.

යුද්ධය පැවතුණු වසර 30ක පමණ කාලයේදී ආසන්න වශයෙන් සතියකට 250කගේ පමණ ජීවිත අහිමි වුණා. ඊට සිංහල, දෙමළ මුස්ලිම් මෙන්ම ආරක්ෂක අංශ මෙන්ම එල්ටීටීඊ සංවිධානයේ අයත් ඇතුළත්. නමුත් 2009 මැයි19 දිනෙන් පසුව යුද්ධය නිසා අහිමි වූ ජීවිත ගණන '0' යි. මානව හිමිකම් කොමිසම අවධානය යොමු කළ යුතුයි යුද්ධය අවසන් වීමෙන් පසු ජනතාවගේ ජීවත් වීමේ අයිතිය ශ්‍රී ලංකාව විසින් ස්ථාපිත කිරීම ගැන. කෙනෙකුට ජීවත්වීමෙ අයිතිය පළමුව තිබිය යුතුයි. ජීවත් වුණොත් විතරයිනෙ මානව හිමිකම් ගැන කතා කරන්න පුළුවන් වෙන්නේ.

❍ අවසන් මානුෂීය මෙහෙයුමේදී වූ මේ සිදුවීම් ගැන අන්තර්ජාතිකව නිසි ලෙසින් ප්‍රචාරණයක් ලබා දීමට කටයුතු නොකරන්නේ ඇයි?

රජය අවසන් මෙහෙයුමේදී සිදු කළේ ජනතාව ත්‍රස්ත ග්‍රහණයෙන් බේරා ගැනීමයි. අවසන් සටනේදී පුදුමාතලන් හා වෙල්ලමුල්ලි වයික්කාල්හි එල්ටීටීඊ සංවිධානය ලක්ෂ 3ක ජනතාව මිනිස් පලිහක් ලෙසින් යොදා ගත්තා. ඒ මිනිස් පලිහෙන් එන්න උත්සාහ කළ ජනතාවට එල්ටීටීඊ පිරිස් වෙඩි තබන ආකාරය ගුවන් හමුදා යානයක් උපයෝගී කර ගනිමින් එවකට සිටි මෙරට තානාපතිවරුන්ට පෙන්නුවා. ඔවුන් ඒ බව පැහැදිලිවම සියැසින් දුටුවා. අප කෙළේ රට බේරගන්න මානුෂීය සාධාරණ යුද්ධයක්.

ඒ වගේම පැහැදිලිවම කියන්න ඕන ඇමරිකාවේ FBI එකෙන් 2008 වසරේදී හඳුන්වා දුන්නා ලෝකයේ ඉන්න දරුණුම ත්‍රස්තවාදී සංවිධානය එල්ටීටීඊය බවට. ඒ වගේම මරාගෙන මැරෙන ත්‍රස්තවාදය ඔවුන් පුරුදු කළ බවත් මරාගෙන මැරෙන ඇඳුම් කට්ටල නිර්මාණය කෙළේ ඔවුන් බවත් පෙන්වා දුන්නා. ඒ වගේම කාන්තාවන්ට මරාගෙන මැරෙන්න පුරුදු කෙළේ ඔවුන් බවත් පෙන්වා දුන්නා. එදා යුද්ධය අවසන් නොවුණානම් අදටත් ජනතාව ඝාතනය වෙනවා.

හොඳ ආරංචි වගේම නරක ආරංචිත් යනවනේ. 'හෝටල්වල නවතින්නම් කියල ගිහින් එයාර්පෝට් එකේදි සද්දයක් දැම්මහම සල්ලි නෑ කියල පැය ගාණක් තියාගෙන ඉදල රජයේ මධ්‍යස්ථානයකට යවනව කියල වගේ පණිවුඩත් යනවා.

❍ එවන් පැහැදිලි අන්තර්ජාතික කරුණු තිබියදීත් ඇයි මේ වනතුරුත් රජයට හැකියාවක් ලැබිලා නැත්තේ මේ අභූත චෝදනාවන්ගෙන් මිදෙන්න.

රජය හැම තිස්සෙම උත්සාහ කරනවා මේ අභූත චෝදනාවන්ට පිළිතුරු සපයන්න. ඒත් අපේ අවාසනාවට 2015 බලයට පත්වුණු රජය දක්වපු කරුණු අපට අවාසිදායක වුණා. 2019 වසරේත් එවකට හිටපු විදේශ ඇමැතිවරයාත් උත්සාහ කළා මේ තත්ත්වයෙන් මිදෙන්න. ඒත් ඒ රජය විසින් දක්වපු කරුණුවලින් මතුවුණේ 'අපි වැරැදි තමයි, ඒ වැරැදිවලට අපිත් දඬුවම් දෙන්න එකතු වෙන්නම් කියලා' යන කරුණක්.

❍ ඒ කෙසේ වෙතත්, ඇයි මේ තරම් සාධක තිබිලත් ඒ මතය වෙනස් කරන්න කටයුතු නොකරන්නේ.

අද අපි සමාජගත කරන්න උත්සාහ කරන්නේ එය තමයි. නමුත් අපි ගන්න උත්සාහය ඔවුන් පිළි ගන්නේ නැහැ. බටහිර රටවල බලවේග බොහොම බලගතුයි. සියල්ල මුදලට යන තත්ත්වයක් තියෙන්නෙ.

❍ ඔබ හිතන්නේ කොටි හිතවාදී ඩයස් පෝරාවට පමණක් ඔයතරම් බලයක් තියෙනව කියලද?

දැන් මතු වන්නේ මෙරට භූගෝලීය අවශ්‍යතාවය මෙන්ම උපාය මාර්ග යුද්ධයේ කොටසක් ලෙස යොදා ගැනීමයි. අපට මෙහිදී විමසන්න තියෙන්නෙ. ශ්‍රී ලංකාව විතරද මේ වගේ ප්‍රශ්න තියෙන රටකට තියෙන්න කියලා. අපි සංසන්දනාත්මතව බැලුවොත් ලෝකයේත් කලාපයේත් මානව හිමිකම් ඉහළින්ම රකින රටක් ලෙස ශ්‍රී ලංකාව හඳුන්වා දෙන්න පුළුවන්. අපේ රටේ නිදහස උපරිමයෙන්ම ලබා දී තියෙනවා, එය ඇතැමුන් අනිසි ලෙසින් භාවිත කරන බවයි පෙනෙන්නේ.

අපේ රටේ මාධ්‍ය නිදහස ඉහළින්ම තියෙනවා, එහිදී රජයේ හොඳ වගේම අඩුපාඩු දොස් ප්‍රචාරය කරන්න පුළුවන්. ඒ වගේම ප්‍රචාරය කරනවා. එය හොඳයි. නමුත් ඒ මාධ්‍ය නිදහස අයුතු ලෙස අරගෙන ජාතීන් අතර ගැටුම් ඇති කරන්න, නැත්නම් හිතාමතාම රජය අපහසුතාවට පත් කරන්න කටයුතු කරනවානම් එය බරපතළ වරදක්.

❍ අපි ඇත්තටම අපේ රටේ නිදහස ගැන දන්නවා, මානව හිමිකම් අනෙක් රටවලටත් වඩා රකිනවා. ඇයි මේ වගේ පොඩි රටක් අල්ලගෙන මේ අය මේ තරම් කෑ ගහන්නෙ.

එකක් මුදල් බලය, අනික අපිව දණගැස්වීමට ඇති ආසාව ඒ වගේම යම්කිසි බලවේගයකට අපිව නතුකර ගැනීමට ඇති අවශ්‍යතාවක් තියෙනවා.

තිස් අවුරුද්දක් තිස්සේ ලෝකයේ දරුණුතම ත්‍රස්ත සංවිධානයක් අතර තිබුණු අභ්‍යන්තර යුද්ධයක් අපි නිමා කරා, ඒ වගේම ඒ යුද්ධයෙන් පසුවත් අපි ඉක්මනින් සාධාරණීය ලෙසින් ඉදිරියට ගමන් කරන බව පේනවා.

ඒ වගේම ලොකයේ රටවල් 193කින් කොවිඩ් මර්දනය අතින් අපි 10 වන ස්ථානයට පත් වෙලා ඉන්නෙ. මේ අය මානුෂීය අයිතිවාසිකම් අවියක් ලෙසින් අරගෙන අප වට්ටලා ඔවුන්ට අවශ්‍ය ලෙසින් අප හැසිරවීමට ගන්නා උත්සාහයක් ලෙසින් මෙය හඳුන්වා දෙන්න පුළුවන්.

❍ විදේශයේ සිට පැමිණෙන ජනතාව බලෙන් හෝටල් කරා යොමු කරන බවට විපක්ෂයේ චෝදනාවක් තියෙනවා..

ගුවන් තොටුපොළ සම්පූර්ණයෙන්ම වසා තිබියදීත් විදේශ රටවල ඉදල මෙරටට 72,000කට අධික පිරිසක් ගෙන්වා තිබෙනවා. ඒ රටවල් 137කින් එයින් 35,000ක් විතර මැදපෙරදිග රටවලින් ගෙන්වා ගත්තා.

අප මේ සියල්ල කරන්නේ විධිමත් යාන්ත්‍රණයකට අනුවයි. අපේ ශ්‍රමිකයන් වෙනුවෙන් අප පෙනී සිටිය යුතුයි. නමුත් අප ගුවන් යානයක් සූදානම් කර ඔවුන් ගෙන්වා ගන්නේ මෙරට නිරෝධායන මධ්‍යස්ථානවල ඉඩ පහසුකම් ඇති අයුරින්. සාමාන්‍යයෙන් 9,000ක පමණ පිරිසක් අපට එකවර නිරෝධායන මධ්‍යස්ථානවල රැඳවිය හැකියි. ඒ ලෙස ඉඩකඩ ලැබෙන ලෙසින් අප මෙරටට පැමිණීමට ඉල්ලුම් කළ අය ගෙන්වනවා.

එහෙත් ඇතැම් අය සංවිධාන වශයෙන් අපට පවසා තිබෙනවා හෝටල් නිරෝධායනයට යොමු කරන බවත් ඔවුන් වෙනුවෙන් වෙනම ගුවන් යානා සූදානම් කර දෙන ලෙසත්. එසේ පැමිණෙන අය දෙදෙනෙක් එක් කාමරයක රැඳී සිටිනවානම් එක් අයකුට උපරිම රුපියල් 7500.00ක් හා එක් කාමරයක එක් අයෙක් නම් උපරිමය රුපියල් 12,500ක් ලෙසින් අදාළ හෝටල්වලින් නියම කළ මුදල් අය කරනවා.

එහෙත් ඇතැම් පිරිස් හෝටල්වල නැවතී නිරෝධායනයට කැමැත්ත පළකර මෙරටට පැමිණ මුදල් නොමැති බව පවසනවා. එවිට අප දැඩි අපහසුතාවකට පත්වනවා. ඒ වගේම අපේ රටේ හොඳ ආරංචි වගේම නරක ආරංචිත් යනවනේ.' හෝටල්වල නවතින්නම් කියල ගිහින් එයාර්පෝට් එකේදි සද්දයක් දැම්මහම සල්ලි නෑ කියල පැය 8ක් 10ක් හරි තියාගෙන ඉදල රජයේ මධ්‍යස්ථානයකට යවනව' කියල වගේ පණිවුඩත් යනවා.

එහෙම නැතිව කිසිදු අයකුට අපි බලකිරීමක් කරන්නෙ නැහැ හෝටල්වල නිරෝධායනය වෙන්න කියල.

❍ තවත් කොපමණ පිරිසක් පොරොත්තු ලේඛනයේ ඉන්නවාද මෙරටට පැමිණීමේ බලාරොත්තුවෙන්?

2020 මාර්තු මාසයේ විදෙස් ශ්‍රමිකයන් ගෙන්වන්න කටයුතු යොදද්දී 45,000ක් පමණ පිරිසක් මෙරටට පැමිණීමට අවශ්‍ය බව කිව්වා. ඒ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වෙනවා. කොහොමත් මේ වන විට තවත් 50,000ක් පමණ පොරොත්තු ලේඛනයේ ඉන්නවා.

නමුත් කලින් මැද පෙරදිග තිබුණු ගැටලු දැන් නැහැ. විශේෂයෙන් ඉන්න හිටින්න තැනක් නැතිව පාලම් යට උද්‍යානවල හිටපු ගැටලුව දැන් නැහැ. ඒ වගේම කියන්න ඕන එහෙම ඉන්න වෙලා තිබුණෙ එරට අනවසරයෙන් ඉන්න අයට බව. ඒ අයට රැකවරණයක් ඒ රටවලින් ලබන්න බැහැ.

❍ ඉදිරියේදී විදෙස් රැකියා වෙළෙඳ පොළේ ඉලක්කය ලෙස ඔබ දකින්නේ කුමක්ද?

අපි අනිවාර්යෙන්ම කුසලතා ඇති අය රැකියා සඳහා යොමු කළ යුතුමයි. කුසලතා නොමැති අය අඩු වැටුප් සඳහා යැවීම නොකළ යුතුයි. මේ වන විට බොහෝ රටවල වයස්ගත තැනැත්තන් බලා ගැනීම වෙනුවෙන් ඉල්ලුමක් ඇති වෙමින් තිබෙන්නේ. ඒ වෙනුවෙන් ඇති රැකියා අවස්ථා අප හඳුනා ගත යුතු වෙනවා. ඒ රටේ භාෂාව, හදිසි අවස්ථාවකදී ලබා දෙන ප්‍රථමාධාර, සෞඛ්‍ය පුරුදු මේ ලෙසින් කුසලතා ඇති කර පුහුණු සේවකයන් ලෙසින් විදෙස් ගත වන්නන්ට හොඳ ඉල්ලුමක් තියෙනවා. ඒ වගේම තොරතුරු තාක්ෂණයටත් හොඳ ඉල්ලුමක් තියෙනවා.

❍ අපට නව වෙළෙඳ පොළක් ලබා ගත හැකි රටවල් ලෙස දකින්නේ මොනවාද?

දැනට මැද පෙරදිග අපට කොහොමත් තියෙනවා, ඊට අමතරව ජපානය, උතුරු කොරියාව ජර්මනිය, රුමේනියාව, ස්පාක්සැය වැනි රටවලින් අපට වැඩි ඉල්ලුමක් තියෙනවා.

සේයාරූ - සමන්ත වීරසිරි

විපක්ෂයේ ඉන්නේ ජනතාව ඉල්ල කරපු පිරිසක්

කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා

රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත ද සිල්වා

● **භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

● **ආණ්ඩුව ඇතුළේ ලොකු අර්බුදයක් ඇති බවයි විපක්ෂය කියන්නේ?**

විපක්ෂය අපිට අර්බුද හදන්න කලින් ඔවුන් තුළ තිබෙන අර්බුදය විසඳා-ගත හොත් හොඳයි කියන කාරණය මම මුලින් ම කියන්න ඕන. විපක්ෂයේ ඇතුළේ මේ වනවිට භයානක තත්ත්ව-යක් තමයි උදාවෙලා තිබෙන්නේ. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාට විරුද්ධව සෑහෙන පිරිසක් සමගි ජනබලවේගය තුළ සිටිනවා. විශේෂයෙන් ම ඔහු සමඟ සම්බන්ධවෙලා සිටින පක්ෂ අතර මේ වනවිට ගැටුම් ඇතිවෙලා තිබෙනවා. ඒ මොකද සජිත් මහතාගේ ක්‍රියා කලා-පය අනෙක් පක්ෂ සමඟ ගැළපෙන්නේ නැහැ. ඔහු කියන්නේ එකක් කරන්නේ තවත් එකක්. විපක්ෂ නායක වෙන්න තවත් කිහිප දෙනෙකුම උත්සාහ කර-නවා. පක්ෂයේ නායකයා වෙන්න තවත් පිරිසක් පොර කනවා. අඩුම තරමේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂයේ කාර්ය භාරය සිදුවන්නේ නැහැ. විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙ-කුම අපගේ හිතවතුන්. ඔවුන් මේ අර්බු-දය පිළිබඳව පැහැදිලිව දන්නවා.

මේ විපක්ෂය තාම කරන්නේ සාම්ප්‍ර-දායික විපක්ෂයක ජවනිකාව විතරයි. මොකද රජය හොඳ දෙයක් කළත් ඒකට-ත් විරුද්ධයි. රජය අලුත් දෙයක් අලුත් අදහසක් ගෙනාවත් ඒකටත් විරුද්ධයි. හොඳ නරක මේ දෙකටම විරුද්ධයි. විපක්ෂයක් කියන්නේ රජය හොඳ වැඩක් කරනවා නම් ඊට සහය ලබාදෙන්න ඕන කණ්ඩායමක් පිරිසක්. අද එහෙම විපක්ෂ-යක් නොවෙයි තිබෙන්නේ.

අන්න ඒ නිසා තමයි මම මුලින් කිව්වේ අර්බුදය තිබෙන්නේ ආණ්ඩුවේ නොවෙයි. විපක්ෂයේ කියන කාරණය. ඒ නිසා විපක්ෂයට මම පැහැදිලිව කිය-නවා අනුන්ගේ ඇසේ තිබෙන ඉදිකට්ට ගැන කතා කරන්න කලින් තමන්ගේ ඇසේ තිබෙන පොල් පරාලය ගැන කතා කරන්න කියන කාරණය.

● **විමල් වීරවංශ අමාත්‍යවරයා සමඟ පොහොට්ටුව ඇති කර ගෙන තිබෙන ගැටුමක් පිළිබඳව මාධ්‍ය වාර්තා කරනවා. ඔබ මෙහිදී කුමන පාර්ශ්වයේද?**

ඇත්තටම ආණ්ඩුවේ නියෝජිතයන් හැටියට අපි අතර පාර්ශ්වයන් නැහැ. මේ රටට යහපතක් කරන්න මේ රට ගොඩනඟන පාර්ශ්වය තමයි අපගේ පාර්ශ්වය.

ඇත්තටම ඔය කියන ආකාරයේ ගැටු-මක් ඇත්තෙත් නැහැ. එකම කණ්ඩායමේ ඉන්න මැති ඇමැතිවරු, මන්ත්‍රීවරුන් තමන්ගේ පෞද්ගලික අදහසක් ඉදිරිපත් කිරීමක් ගැටුමක් හැටියට සැලකිය යුතු නැහැ. අපගේ රජය ඉතා ප්‍රජාතන්ත්‍ර-වාදී රජයක්. ඕනෑම අයෙකුට තමන්ගේ මත ඉදිරිපත් කරන්න පුළුවන්. මතයක් දරනවා කියන්නේ ආණ්ඩුව තුළ අර්බුද-යක් තියනවා කියන එක නොවෙයි. අපි මොන මතවල හිටියත් රජය රට වෙනු-වෙන් ගන්නා සෑම තීන්දු තීරණයකදීම එකට ඉන්නවා.

අනෙක් කාරණය තමයි විමල් වීරවංශ ඇමැතිතුමා ඇතුළු දේශයට ආද-රය කරන තවත් දේශපාලන පක්ෂ රාශියක් දැවැන්ත සහයක් ලබා දුන්නා ජනාධිපති-වරණයට මෙන් ම මහ මැතිවරණයට. අපි මේ බලය නිර්මා-ණය කිරීමේදී මේ කණ්ඩායම් දැවැන්ත ශක්තියක් ලබාදුන්නා.

ඇත්තටම පක්ෂ දේශපාලනයට එහා ගිය ජනතා විශ්වාසයක් අප කෙරෙහි තිබෙනවා. මේ රටේ ලක්ෂ 69 ජනතාව අපිව විශ්වාස කරලා තමයි අපිට ඡන්දය ලබාදී අපිව බලයට රැගෙන ආවේ. මෙහිදී සෙසු පක්ෂ වගේම පොදුජන පෙරමුණ විශාල කාර්ය භාරයක් ඉටු කළා.

මහින්ද සුළඟ ගැන කතා කරද්දී අපි සියලු දෙනා එක්ව දැවැන්ත දේශපාලන ව්‍යාපාරයක් ක්‍රියාත්මක කළා. ඇත්තටම අපි එක නිවසක සාමාජිකයන්. එක පවු-ලක් ලෙස කටයුතු කරන්නේ. මේ නිසා අපි අපගේ ගෙදර ප්‍රශ්නයක් මතු වුණාම ගෙදර ඇතුළේම විසඳා ගන්නවා.

අපගේ නිවසට හොඳ ගෘහ මූලි-කත්වයක් ලැබිලා තිබෙනවා. පවුලේ ප්‍රධානියා එසේත් නැත්නම් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අපිට හොඳ නායකත්වයක් ලබා දෙනවා. මේ නිසා අපගේ පවුල බිඳ වටටන්න කාටවත් බැහැ. ඒ වගේම අගමැති මහින්ද රාජපක්ෂ මහතා අත්දැකීම් ඇති මේ රටට ආදරය කරන තවත් ශක්තිමත් නායකයෙක්. ඒ නිසා අපිට මේ රට ගොඩනඟන්න පුළු-වන්.

සජිත් කියන්නේ එකක් කරන්නේ එකක්

විපක්ෂ නායකකමටත් කට්ටිය පොරකනවා

● **ගෝඨා ෆේල් කියලා දිගින් දිගටම විපක්ෂය කියනවා. ඇත්තටම 'ගෝඨා ෆේල්' ද?**

ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ෆේල් කියලා චෝදනා කරන අය පාස් ද කියලා මම මුලින් ම අහන්න කැමැතියි. මේ රට ජනතාව සියලු දෙනාම ෆේල් කරන්න කටයුතු කරපු පිරිසක් තමයි, ඔය විපක්ෂයේ ඉන්නේ. මේ රටේ ආරක්ෂාව, ජනතාවගේ ආර-ක්ෂාව, රටේ ආර්ථිකය සමාජය, සංස්කෘ-තිය හැම පැත්තකින්ම මේ රට විනා-ශය කරා ගෙන ගිය පිරිසක් අද අපිට චෝදනා කරනවා. අපි ෆේල් කියලා. අවු-රුදු පහකට ආසන්න කාලයක් තමන්ගේ ආණ්ඩුව දෙපැත්තකට අදිමින් ජනතාවට නොයෙක් කරදර හිරිහැර කරමින් අහිං-සක ජීවිත සිය ගණනක් ත්‍රස්තවාදීන්ට බිලිදෙමින් කටයුතු කරපු පිරිසක් අපෙන් අහනවා අපි ෆේල් ද කියලා.

ජනාධිපතිතුමන් ඉතාමත්ම හොඳින් තමන්ගේ හැකියාව ඔප්පු කරමින් යන අවස්ථාවක් මේක. 69 ලක්ෂයක් ජනතාව එතුමන් කෙරෙහි තැබූ විශ්වාසය තවදු-රටත් වැඩිවෙලා තිබෙනවා. තවමත් අවු-රුද්දක් විතරයි ගත වෙලා තිබෙන්නේ. ඒ අවුරුද්ද තුළ ජනාධිපතිවරයා විශාල වැඩ කොටසක් සිදු කරලා තිබෙනවා. රටේ ජාතික ආරක්ෂාව, වර්තමානය තුළ ආර්ථිකය මුළු ලෝකයම බැට කමින් සිටින අවස්ථාවක රටක් හැටියට අපි ඉතාමත්ම ශක්තිමත්ව ඉදිරියට ගමන් කරමින් සිටිනවා.

මේ සියලු කටයුතු මැද රටේ සංවර්ධ-නය ඉතා ඉහළින් සිදු කරමින් සිටිනවා. ඒ සඳහා ඔහු ලබා දෙන නායකත්වය ආගම් අතර සුහදතාව වැඩි කරමින් මෙරට සහජීවනය ගොඩනැංවීම සඳහා කටයුතු කරනවා. මේ අතර අවස්ථාවාදීන් කිහිපදෙනෙක් යම් යම් මත පතුරවනවා. මේ කරුණු සියල්ලම බැලුවාම අපි පාස්ද නැද්ද කියන එක ඕනෑම අයෙකුට පැහැ-දිලිව පෙනෙන්නේ අපි ඉතා ඉහළින් ම පාස් කියන එකයි.

අපි මේ රටේ ඉතිහාසය තුළ ජනා-ධිපතිවරුන් රැසකගේ ක්‍රියා කලාපයන් දැක තිබෙනවා. තව අවුරුදු හතරක් තිබෙනවා ගෝඨාභය ජනාධිපතිවරයාට. ජනතාවට දැක බලාගත හැකියි ඉදිරියේදී මේ රට කොච්චර දුරට පාස් කරනවාද කියන කාරණය.

● **රජය පිහිටුවලා මාස හයකට අධික කාලයක් ගතවෙලා තිබෙනවා. ඇමැති-වරයෙක් හැටියට සෑහීමකට පත්වෙන දෙයක් කරලා තිබෙනවාද?**

අපි මේ රජය භාර ගන්න කොට යහපාලන රජය මේක නැත්තටම නැති කරලා තිබුණේ. රටක් හැටියට ගොඩනැ-ගෙන්න අපිට දැවැන්ත අභියෝග රැසක් තිබෙනවා. මේ වනවිට අපි සාමූහිකව මේ අභියෝගයන් එකිනෙක ජයගනිමින් සිටිනවා.

දේශපාලන නායකයෙකු ලෙස නොවෙයි. මේ මාතෘභූමියට ආදරය කරන විශේෂයෙන් ම වෘත්තීය ගුරුවර-යකු ලෙස කටයුතු කරන බිම් මට්ටමේ සිටින ජනතාවත් එක්ක ඉන්න සාමාන්‍ය පුද්ගලයෙකු හැටියට මට මගේ ජන-තාව සමඟ මේ රජයේ ක්‍රියා කලාපය දකිද්දී පැහැදිලිව පෙනෙනවා. මේ රට ඉතා සාර්ථකව ගොඩනඟන්න පුළුවන්. දැනටමත් ගොඩනඟමින් සිටින දැවැන්ත වැඩපිළිවෙළක් ක්‍රියාත්මකව තිබෙන බව අමාත්‍යාංශ ගන්නා තීන්දු තීරණව-ලින් පෙනී යනවා. අඩු පාඩු තිබෙනවා. අඩු පාඩු නැතිව නොවෙයි. අපි ඒ අඩු පාඩුවලට හේතු හොයමින් විසඳුම් ලබා-දෙමින් හැකි උපරිම අයුරින් මේ රට ගොඩගැනීම සඳහා ක්‍රියාත්මක වෙමින් සිටිනවා. අමාත්‍යාංශ පිහිටුවලා තවම මාස හයයි. නමුත් සෑම අමාත්‍යාංශයක් ම මේ කෙටි කාලය තුළ දැවැන්ත වැඩ-පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. දැනටමත් ජේන වැඩ කොටසක් අපි කරලයි තියෙන්නේ.

වෙන කිසිම ආණ්ඩුවකට නොතිබූ දැවැන්ත ගැටලුවක් අපිට තිබෙනවා. ඒ කොවිඩ් වසංගතය මුළු ලෝකයම වෙළා-ගෙන තිබෙන අවස්ථාවක තමයි අපි මේ සියලු කටයුතු කරන්නේ. රටේ මූල්‍ය වැඩි ප්‍රමාණයක් අද ජනතාවගේ ජීවිත බේරා ගැනීම සඳහා අප රජය විසින් කොවිඩ් වසංගතය වෙනුවෙන් වැය කරනවා.

● **කොරෝනා දෙවැනි රැල්ල පාලනය කිරීමට රජයට නොහැකි වන්නේ ඇයි?**

කොවිඩ් වසංගතයට අපගේ රට මුහුණ දෙන විදිය අසාර්ථකයි කියලා කාට-වත් කියන්න බැහැ. රටක් හැටියට අපි ඒ සඳහා ඉතා හොඳින් මුහුණ දෙමින් සිටිනවා. පළමු රැල්ල අපි ඉතා හොඳින් පාලනය කළා. හැබැයි දෙවැනි රැල්ල පාලනය කිරීමට නොහැකි වුණා කියන චෝදනාව මේ ආණ්ඩුවට එල්ල කරන්න කාටවත් බැහැ.

විපක්ෂය බංකොළොත් වෙලා ඉන්න අවස්ථාවක රජයට එල්ල කරන බොරු චෝදනාවක්. ඇත්තටම මේ සඳහා පිළි-තුරු ලබා දිය යුත්තේ අපි රටක් හැටියට ඉන්න ස්ථාවරය ගැන සතුටුවෙන ගමන්.

ලෝකයේ ප්‍රබල රටවල් කියන රටව-ල්වල දස දහස් ගණනින් මිනිස්සු මැරෙ-නවා. ලක්ෂ ගණනින් මිනිස්සු රෝගීන් බවට පත්වෙනවා. ලෝකයේ බොහෝ රටවල්වල ජනතාව කෑම වේලක් ලබා-ගන්න දිගු පෝලිම්වල සිටිනවා. සමහර රටවල ජනතාවට කන්න බොන්න නැහැ. රටක් හැටියට අපිට එවැනි තත්ත්වයක් නැහැ. අපගේ ජනතාවට රජය මේ පහ-සුකම් සියල්ල ලබාදෙනවා.

විපක්ෂය බලන්නේ කොරෝනාව-ලින් හරි මේ ආණ්ඩුව පෙරළා දමන්න. පසුගිය දවස්වල නැගෙනහිර ජැටියේ එල්ලීලා ආණ්ඩුවට බොරු චෝදනා කළා. දේපළ රටේ සම්පත් විකුණනවා කියලා. කොරෝනා කියන්නේ ගෝලීය අර්බුදයක් දෙවන රැල්ල පැමිණෙන්නේ වෛරසය වෙනස් වෙලා. රෝගය බෝවීමේ වේගය වැඩිවෙමින් එය පාල-නය කිරීම ඉතාම අපහසු කාර්යයක්. නමුත් අපි මෙය ඉතා ඉක්මනින් අවසන් කරනවා. රටක් හැටියට සාර්ථකවම මේ වසංගතය හමුවේ එය පරාජය කරමින් සිටිනවා. කොවිඩ් එන්නත් ලක්ෂ 90 ගෙන්වීමට රජය, ජනාධිපතිතුමා කටයුතු කරමින් සිටිනවා. දැනටමත් කොරෝනා එන්නත රජය විසින් ලක්ෂ ගණනකට ලබාදෙමින් සිටින්නේ.

ඡායාරූපය - විමල් කරුණාතිලක

සුපිරි වාහන කෑලිවලට විකුණන හොරු කල්ලියක්

මත්තෙගොඩින් සොරකම් කරන ලද වීසෙල් රථය පැහැර ගැනීමට පැමිණි සැකකරුවන් අත්අඩංගුවට ගත් මත්තෙගොඩ පොලිස් ස්ථානාධිපති සුමේධ විමල ගුණරත්න ප්‍රමුඛ නිලධාරී කණ්ඩායම

● **අමිල මලවිසූරිය**

කොරෝනා වසංගතයත් සමඟ මෙරටට ආනයනය කරන ඇතැම් භාණ්ඩ සඳහා ආනයන සීමා පැනවීමටත් නැතිනම් ආනයනය තාවකාලිකව තහනම් කිරීමටත් පසුගිය කාලයේ රජය තීන්දු තීරණ ගැනිණි. ඒ කොරෝනා වසංගතය නිසාවෙන් රට තුළ උද්ගතව ඇති ආර්ථික අවපාතය යම් පමණකට හෝ අවම කරගනිමින් රටේ ආර්ථිකය ස්ථාවරව තබා ගැනීමේ අටියෙනි.

ඒ අනුව යතුරුපැදි, ත්‍රිරෝද රථ ඇතුළු රථවාහන ආනයන-යද තාවකාලිකව නතරකොට අමතර කොටස් ආනයනයටද සීමා පැනවීමට රජය තීන්දු කළේය. එහෙයින් මේ වන විට රට තුළ පවත්නා රථවාහනවල මිල ගණන්ද යම් පමණක ඉහළ යෑමක් දක්නට ලැබෙන අතරේ රථවාහන අමතර කොටස්හි හිඟයක්ද වෙළෙඳපොළේ දක්නට වේ. එලෙස රථවාහන සහ අමතර කොටස් ආනයන සීමා නිසාවෙන් රට තුළ රථවාහන වංචා පිළිබඳවද බොහෝ ප්‍රදේශවලින් පසුගිය දිනවල වාර්තා-වීම් සිදුවිණි.

එවන් රථවාහන වංචනිකයන් ඉහළ යාමට බන්ධනාගාර තුළ කොරෝනා ව්‍යාප්තියත් සමඟ සුළු වැරැදි නිසාවෙන් රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටි දසදහසකට අධික රැඳවියන් පිරිසක් ඇප මත මුදා හැරීමත් හේතු වී ඇති බව පොලිස් විමර්ශනවලදී සැල වේ.

ඇතැම් වංචනිකයන් විසින් අමතර කොටස් ලබාගැනීමට රථවාහන සොරකම් කරද්දී තවත් වංචනික පිරිස් විසින් රථවා-හන ලියකියවිලිද වංචනික ආකාරයෙන් සකසා මහා පරිමාණ-යෙන් වංචා සිදුකර ඇත. ඒ අනුව පසුගිය හත්වැනිදා දහවල් කාලයේදී කඩුවෙල ප්‍රදේශයේදී වයස අවුරුදු 26ක පුද්ගලයෙක් මිරිහාන බස්නාහිර දකුණ විශේෂ විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනුණේ පසුගිය මාස කීපයක සිට මහා පරිමාණ රථවාහන වංචා සිදුකිරීම නිසාවෙනි.

එකී සැකකරුගෙන් සිදු කළ ප්‍රශ්න කිරීම්වලදී, නොයෙක් වර්ගයේ මෝටර් රථ සඳහා භාවිත කළ ලිපි ගොනු 40කට ආසන්න ප්‍රමාණයක් සහ වාහනවල අංක තහඩු ලබාගැනීමට ඉදිරිපත් කළ ව්‍යාජ පැමිණිලි පිටපත් රැසක්ම සොයා ගැනිණි. ඊට අමතරව වාහන ලියාපදිංචි කිරීම සඳහා උපයෝගී කර-ගන්නා ව්‍යාජ ලිපිලේඛන ගොනු කිහිපයක්ද හමු විණි.

සැකකරු පිළිබඳව වැඩිදුර විමර්ශනයේදී හෙළි වී තිබුණේ රථවාහන අංක තහඩු සහ ලිපිලේඛන පිළිබඳව ඔහු කලෙක සිටම විවිධාකාරයේ වංචා සිදුකර ඇති බවයි. විශේෂයෙන්ම සැකකරු විසින් යම් රථයක් හිමිකරුවකු විසින් කුලී රථ ආය-තනයකට ලබාදුන් පසු එවැනි රථයක් ඔහු විසින් හෝ තෙවැනි පාර්ශ්වයක් විසින් ලබාගෙන ඇත. පසුව එම රථයේ තිබෙන සැබෑ අංකය ඉවත්කොට එවැනිම වර්ගයේ වෙනත් රථයක අංකයක් භාවිත කොට එම රථය හොර රහසේ විකුණමින් සැකකරු මහා පරිමාණ රථවාහන ජාවාරමක් සිදුකර තිබූ බවයි.

එසේම එම සැකකරු සන්තකයේ තිබී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව බාරයේ තිබිය යුතු රථවාහනයක මුල් පිටපත් ගොනුවක්ද සොයා ගැනීමට බස්නාහිර දකුණ විශේෂ විමර්ශන ඒකක නිලධාරීන්ට හැකිවිණි. ඒ පිළිබඳවද පුළුල් විමර්ශනයක් සිදුකරන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ ද කීවේය.

මේ අතරේ පසුගිය දෙවැනිදා තවත් 'අමුතු' තාලයේ වාහන සොර මගඩියක් වාර්තා වූයේ මත්තෙගොඩ පොලිස් වසමෙනි. පසුගිය දිනෙක මත්තෙගොඩ පුද්ගලයෙක් රුපියල් ලක්ෂ 52ක් පමණ වටිනාකමින් යුත් සුඛෝපභෝගී වෙසෙල් වර්ගයේ මෝටර් රථයක් විකිණීම සඳහා අන්තර්ජාලයේ ජනප්‍රිය වෙබ් අඩවියක දැන්වීමක් පළ කෙරිණි. ඒ දුරකථන අංක කීපයක්ද සඳහන් කරමිනි. එම දුරකථන අංකවලට ඇමැතුම් රැසක්ම ලැබිණි. අනතුරුව දෙවැනිදා සවස හතට පමණ වැන් රථයකින් අදාළ වෙසෙල් රථය පරීක්ෂාවට පුද්ගලයන් හතර දෙනෙක් පැමිණි බවකි.

ඒ මොහොතේ පැමිණි පුද්ගලයින් තිදෙනෙක් රථයේ හිමිකරු සමඟ රථය පරීක්ෂාවට (Test Run) යැයි පවසමින් හෝමා-ගම, නියඳගල ප්‍රදේශයට වෙසෙල් රථයෙන් ගමන් කෙරිණි. එලෙස ගමන් කරමින් සිටියදී එක්වරම රථයේ ගිය අයෙක් රථයේ හිමිකරුට පිහියක් පෙන්වා බියගන්වා රථයෙන් ඇද දමා රථය පැහැරගෙන ගිය බව මත්තෙගොඩ පොලිසියට පැමිණි-ල්ලක් කෙරිණි.

ඒ අනුව මත්තෙගොඩ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමේධ විමල ගුණරත්න ප්‍රමුඛ නිලධාරී කණ්ඩායම රථයේ හිමික-රුගේ ජංගම දුරකථනයට ලැබී තිබූ දුරකථන ඇමැ-තුමක අංකයක් ඔස්සෙ සිදුකළ සූක්ෂ්ම විමර්ශන-යක ප්‍රතිඵලයක් ලෙස පැය කීපයක් තුළ රතු පැහැති රථය වෙන්නප්පුව, කඩවත පාරේ නිවෙසක පිහිටි ගරා-ජයක තිබියදී සැකකරුවන් සයදෙනෙකු සමඟ පොලිස් බාරයට ගැනිණි.

අත්අඩංගුවට පත් සැකක-රුවන්ගෙන් අනාවරණය වී තිබුණේ ලක්ෂ 52ක් පමණ වටිනාකමින් යුත් පැහැරගත් රථය ඉතාලියේ වසර විස්සකට අධික කාලයක් සිට මෙරටට පැමිණි පුද්ගලයකුට රුපියල් ලක්ෂ 13කට විකුණු බවයි. ප්‍රසංග වාස් නමැති ඉතාලියේ සිට පැමිණි පුද්ගලයා මෙරට ප්‍රසිද්ධ ෆිනෑන්ස් ආයතනයකින් අනතුරකට පත්ව තිබූ පැහැරගත් වර්ගයේම රථයක් මිලට ගෙන තිබුණේ රුපියල් ලක්ෂ විස්සකටයි. ප්‍රසංග මත්තෙගොඩින් පැහැරගත් රථය ලක්ෂ 13කට මිලට ගෙන එහි කොටස් ගලවා ෆිනෑන්ස් ආයතනයෙන් මිලට ගත් රථය අලුත්වැඩියා කිරීමට සැලැසුම් කර තිබිණි. දංකොටුව, වෙන්න-ප්පුව සහ කොස්වත්ත ප්‍රදේශවල පදිංචි වයස අවුරුදු 20ත් 40ත් අතර පසුවන එකී වංචාකරුවන් පිරිස රථය පැහැර ගැනී-මට පැමිණ තිබුණේ කුලියට ගත් සුදු පැහැති වෑන් රථයකිනි. රථය පැහැරගත් ප්‍රධාන සැකකරු කෙවින් නමැත්තාද ගරාජ් හිමියෙකි. ඔහු සිය ගරාජයේ වූ අලුත්වැඩියාවකට ගෙනැවිත් තිබූ රථයක අංක තහඩුවක් ගලවා ගෙනවිත් පැහැරගත් රථයට සවිකොට එම රථය වෙන්නප්පුවට රැගෙන ගොස් තිබුණේය.

මෙවැනිම තවත් මහා පරිමාණ රථවාහන ජාවාරමක් ඉකුත් ජනවාරි මාසයේදීද අනාවරණය කරගැනීමට මුල්ලේරියාව පොලිසිය සමත් විය. වාහන කුලී පදනමට ලබා දෙන ආයත-නවලින් ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත්කොට වාහන ලබාගෙන ඊට ව්‍යාජ ලිපි ලේඛන සකසා වෙනත් පාර්ශ්වයන්ට විකුණන පුද්ගල කණ්ඩායමක් පිළිබඳව එහිදී අනාවරණය වූහ.

එම කණ්ඩායම රථවාහන කුලී ආයතනවලට ගොස් ව්‍යාජ රියැදුරු බලපත්‍ර, ව්‍යාජ හැඳුනුම්පත් හෝ ව්‍යාජ විදුලි බිල්පත්ද ඉදිරිපත්කොට එකී පිරිස කුලී ආයතනයට ආසන්නව වෙසෙන බවට අඟවමින් මෙකී ජාවාරම සිදුකර ඇත.

ඔවුහු එලෙස ලබාගත් වාහන පසුව කොටස්කර විකුණමින් නැතිනම් චැසි අංක සහ එන්ජින් අංක වෙනස්කොට වෙනත් පාර්ශ්වයන්ට විකුණා තිබිණි.

අදාළ රථවාහන කුලියට දුන් ආයතන ලියකියවිලිවල අදාළ ලිපිනයන්ට ගොස් පරීක්ෂාවේදී එවැනි ලිපිනයක් හෝ පුද්ග-ලයෙක් හෝ නැති බව හෙළි වීමත් සමඟ සිදුව ඇත්තේ මහා පරිමාණ රථවාහන වංචාවක් බවට සැලවීමත් සමඟ පොලි-සියට පැමිණිලි කෙරිණි. ඒ අනුව සිදුකළ විමර්ශන ඔස්සෙ මුල්ලේරියාව පොලිසිය මඟින් සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගැනිණි. ඒ, යක්කල සහ මීරිගම පදිංචි දෙදෙ-නෙකි. සැකකරුවන්ගේ අනාවරණයන් අනුව ව්‍යාජ ආකා-රයෙන් ලියකියවිලි සකසා විකුණන ලද රථවාහන 17ක්ද මුල්ලේරියාව පොලිසිය විසින් සොයා ගැනිණි. එසේම එකී සැකකරුවන් දෙදෙනාට ව්‍යාජ ලිපිනයන්, ලියවිලි සකසා දුන් ගම්පහ, මගලේගොඩ පුද්ගලයෙක්ද අත්අඩංගුවට ගැනීමට පොලිසිය සමත් වූහ.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනය පිළිබඳ දර්ශනශූරී උපාධිය (PhD) සහ අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති උපාධිය (MPhill)

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීමයි.

අධ්‍යයන මාධ්‍ය - මෙම වැඩසටහන ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

ඇතුළත්වීමේ මූලික සුදුසුකම්

අධ්‍යාපනය පිළිබඳ දර්ශනශූරී උපාධිය	අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති උපාධිය
අයදුම්කරුවන් පහත එක් සුදුසුකමක් හෝ සපුරා තිබිය යුතුය. 1. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව දර්ශනපති උපාධිය. හෝ 2. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ 9 වන මට්ටම හෝ ඊට ඉහළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ශාස්ත්‍රපති උපාධිය (අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ සැළසිය යුතු පර්යේෂණ පංචකයක් සහිත විය වඩාත් සුදුසුය.) හෝ 3. සම්මාන 0-4 යට අනුව අවම වශයෙන් GPA අගය 3.00 සහිතව හෝ දෙවන පන්තිය හෙළ අංකයේ සාමාර්ථයක් සහිතව අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ හයවන මට්ටමේන් ලැබූ පෞරවි උපාධිය. හෝ 4. සනාතන සහාව පිළිගනු ලබන සමාන හෝ උසස් සුදුසුකම්. සහ 5. **අධ්‍යාපන පීඨය මඟින් නියම කර ඇති අනෙකුත් සුදුසුකම් අවශ්‍යතාවන්.**	අයදුම්කරුවන් පහත එක් සුදුසුකමක් හෝ සපුරා තිබිය යුතුය. 1. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව SLQF 7 හෝ ඉහළ මට්ටමේ සුදුසුකම්. හෝ 2. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් පාඨමාලා සම්මාන 30 සහිත SLQF 6 වන මට්ටමේහි ලැබූ පෞරවි උපාධියක්. හෝ 3. සනාතන සහාව පිළිගනු ලබන සමාන හෝ උසස් සුදුසුකම්. සහ 4. **අධ්‍යාපන පීඨය මඟින් නියම කර ඇති අනෙකුත් සුදුසුකම් අවශ්‍යතාවන්.**

අධ්‍යාපන පීඨය මඟින් නියම කරනු ලබන සුදුසුකම් ඇතුළත්වීමේ සුදුසුකම්

- SLQF 9 හෝ ඉහළ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් තෝරීම් ක්‍රියාවලියෙන් පසුව සලකා බලනු ලැබේ.
- එම වැඩසටහන සඳහා ලියාපදිංචි වීමට පෙර සියලුම අයදුම්කරුවන් විසින් අධ්‍යාපන පීඨය මඟින් පවත්වනු ලබන පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය. (සම්මාන 18ක පර්යේෂණ සංරචක සහිත දෙවර්ෂ ශාස්ත්‍රපති උපාධිය සහිත අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

තෝරා ගැනීමේ ක්‍රමවේදය

1 අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයක් උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත සහ ඉහළම අධ්‍යාපන සුදුසුකමේහි ඡායාපිටපත්,
2 පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ බව දැක්වෙන සහතිකයේ පිටපතක්,
3 අධ්‍යාපන පීඨයේ වෙබ් අඩවියේ දැක්වෙන ආකෘතියට අනුව සකස් කළ විස්තරාත්මක පර්යේෂණ යෝජනාවලියක් ඉදිරිපත් කළ යුතුය.

අයදුම් පත්‍රය අධ්‍යාපන පීඨයේ වෙබ් අඩවියෙන් බාගත (Download) කරගත හැකිය https://www.ou.ac.lk/programmes-faculty-of-edu/

යෝජනාවලිය සඳහා ආකෘතිය අධ්‍යාපන පීඨයේ වෙබ් අඩවියෙන් බාගත (Download) කරගත හැකිය: https://www.ou.ac.lk/programmes-faculty-of-edu/

වැඩි විස්තර සඳහා සහකාර ලේඛකාධිකාරී (aredu@ou.ac.lk), අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ, ශ්‍රී ලංකාව.

ලේඛකාධිකාරී - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ.

මහ සඟරුවණේ දෙමවුපියන්ට හිසට සෙවණක් දෙන 'මිහිඳු නිවහන'

● නිහාල් පී. අබේසිංහ

අපේ බුද්ධ ශාසනය සුරැකීමට අපේ මහා සංඝරත්නයේ අනාගත පැවැත්ම අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් අඩු ආදායම් ලාභී පවුල්වලින් ශාසනයට පූජා කළ සාමණේර හිමිවරුන්ගේ දෙමවුපියන් සුරැකීම ද ශාසනයේ උන්නතිය උදෙසා උතුම් කටයුත්තක් වේ.

එය අරමුණු කරගෙන වත්මන් රජය සසුන්ගතව මහණදම් පුරමින් සම්බුදු සසුන රැක ගැනීම උදෙසා නම් කුල දරුවන් ශාසනයට පූජා කළ දෙමවුපියන්ට උපහාර පිදීම අරමුණු කරගෙන 'මිහිඳු නිවහන' නමින් නව නිවාස සංවර්ධන වැඩසටහනක් ආරම්භ කර ඇත.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව සසුන්ගතව මහණ දම් පුරමින් සම්බුදු සසුන රැක ගැනීම උදෙසා තම කුල දරුවන් ශාසනයට පූජා කළ දෙමවුපියන්ට උපහාර පිණිස මෙම "මිහිඳු නිවහන" නිවාස ව්‍යාපෘතිය ආරම්භ විය.

ඒ අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මෙහෙයවීමෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මෙහි සමාරම්භක උලෙළ අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සියඹලාණ්ඩුව බුද්ධම පුරාණ රජමහා විහාරයේදී පැවැත්විණි.

මේ යටතේ මෙම වසර තුළ නිවාස 2,000 ක් ඉදිකිරීමට නියමිතයි. මිහිඳු නිවහන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට "මිහිඳු නිවහන ව්‍යාපෘතිය" යටතේ දක්වා ඇති සුදුසුකම් අනුව තෝරාගත් මවුපියන් පදිංචි ප්‍රදේශවල මෙම නිවාස ඉදිකිරීම සිදුවේ.

මෙම නිවාස ඉදිකිරීම සඳහා මේ වන විට රුපියල් ලක්ෂ 12,000 ක් වෙන්කර තිබේ. ඉදිකෙරෙන එක් නිවසක සම්පූර්ණ වටිනාකම රුපියල් ලක්ෂ 06කට අධික වේ.

හිත නිවනින් නිවුනත් ගත නිවහන ගැන සිත නිවනක් නැති මාපියන් වෙත පිදෙන "උත්තම ගෘහ පූජාවක්" ලෙස මෙම ව්‍යාපෘතිය අර්ථ ගන්වා ඇත. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් මෙම මිහිඳු නිවහන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" යටතේ, සම්බුද්ධ ශාසනය ප්‍රමුඛස්ථානයේලා ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිමය තීරණය මත පිහිටා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

මෙම නිවාස සාදා දීමෙන් සම්බුද්ධ ශාසනය රැක ගැනීමට ඉවහල් වන මූලික කාරණා 04ක් ඉටුවන බව මිහිඳු නිවහන් ව්‍යාපෘතියේ කමිටු සාමාජික නිවාස රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩබ්ලිව්.එම්. ආනන්ද මහතා පවසයි. භික්ෂූන් වහන්සේලාට ගෙදර දොර ප්‍රශ්නවලින් මිදී නිදහසේ ශාසනික කටයුතුවලට නිරත වීමට හැකිවීම ඇතුළු කරුණු කිහිපයක් මෙමගින් සම්පූර්ණ වේ.

කැලණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය පූජ්‍ය ඉඳුරාරේ ධම්මරතන හිමියන්ගේ යෝජනාවක් අනුව මිහිඳු නිවහන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. පූජ්‍ය වලස්මුල්ලේ විමලධම්ම හිමියන්ගේ මූලිකත්වයෙන් පිහිටුවා ඇති අනුකම්ටුවේ, පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි, පූජ්‍ය අලුත්පොළ ගුණරත්න හිමි, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩබ්ලිව්.එම්. ආනන්ද, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සුනන්ද කාරියප්පෙරුම, බී.කේ. රංජිත් යන මහත්වරු ඇතුළු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ සහ ග්‍රාමීය නිවාස ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීහු පිරිසක් සාමාජිකයෝ ලෙස කටයුතු කරති.

මොනරාගලදී පැවැති 'මිහිඳු නිවහන' සමාරම්භක උලෙළේදී අදහස් දැක්වූ අගමැති මහින්ද රාජපක්ෂ මහතා පැවසුවේ මේ වැඩපිළිවෙළ යටතේ භික්ෂූන් වහන්සේගේ දෙමවුපියන්ට නිවාස 2,000ක් ඉදිකිරීමට මේ වසරේ රුපියල් ලක්ෂ 12,000ක් වෙන් කර ඇති බවයි.

'මිහිඳු නිවහන' වැඩසටහනේ සන්නස් පත්‍රය ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක මකුලෑවේ ශ්‍රී විමල මහා නාහිමියන් වෙත අගමැති මහින්ද රාජපක්ෂයන් විසින් පිරිනැමූ අවස්ථාව.

එම උත්සවයේදී අගමැතිවරයා මෙසේය කිය. අපි මේ නිවාස ව්‍යාපෘතිය ඒ නමින් නම් කරන්නේ මේ රටට බුදුදහම ගෙනාපු ඒ ශ්‍රේෂ්ඨ මිහිඳු මාහිමියන්ව සිහිපත් කරන්න. මිහිඳු මාහිමියන් වහන්සේ එදා ධර්මය විතරක් නෙමෙයි මහා ශිෂ්ටාචාරයකුත් මේ රටේ ආරම්භ කරන්න පදනම දැම්මා. මිහිඳු හිමියන් වෙනුවෙන් දේවානම්පියතිස්ස රජතුමා එක දවසක් තුළ ගෙයක් ඉදිකරලා, ඒ ගෙදර මැටි බිත්ති වේළන්න හුළු එළි ඇල්ලුවා කියලා තමයි ඉතිහාස කථාවල තියෙන්නේ.

ඒ නිසා මේ භික්ෂූන් වහස්සේලාගේ දෙමවුපියන් වෙනුවෙන් ආරම්භ කරන නිවාස ව්‍යාපෘතිය "මිහිඳු නිවහන" කියලා නම් කිරීම ඉතාම යෝග්‍යයි කියලා මම හිතනවා. පසුගිය යහපාලන ආණ්ඩුව විශාල වශයෙන් ශාසනයෙන් පළිගත්තා කියන එක නායක හාමුරුවනේ, මම අමුතුවෙන් කියන්න ඕන නැහැ.

"එහෙම තිබුණ යුගයක් පහුකරලා අපි දැන් එය වෙනස් කරමින් තිබෙනවා. වෙනස් කරලාත් තියෙනවා. එදා භික්ෂූන් වහන්සේලාට සිරගෙවල් වෙන් කරපු ආණ්ඩුව වෙනස් කරලා අද අපි භික්ෂූන් වහන්සේලාගේ දෙමවුපියන්ට හිසට සෙවණක් දෙන යෝධ නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න පටන් ගන්නවා යැයිද එහිදි අගමැතිවරයා පැවසීය.

'මිහිඳු නිවහන' ප්‍රතිලාභී පවුලකට අගමැති මහින්ද රාජපක්ෂයන් විසින් පළමු දීමනා චෙක්පත ප්‍රදානය කළ අවස්ථාව. නිවාස රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ හා කෘෂිකර්ම රාජ්‍ය ඇමති ශෂීන්ද්‍ර රාජපක්ෂ යන මහත්වරු මෙහි වෙති.

මේ පිළිබඳව අදහස් දැක්වූ අස්ගිරි මහා විහාරයීය කාරක සංඝ සභාවේ මහා ලේඛකාධිකාරී, සමස්ත ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ගරු උප සභාපති ආචාර්ය මැදගම ධම්මානන්ද නාහිමි, කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘතික අධ්‍යන අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන නාහිමි.

"මේ නිසා ශාසනයට එකතුවෙන සඟ පරපුරට ලොකු අත්වැලක් දිරිගැන්වීමක් ලැබෙනවා. මේක දිගුකාලීන ප්‍රතිඵල දෙන වැඩපිළිවෙළක්. ඒ සමග රජය මේ වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම පිළිබඳව ජනපතිටත් අගමැතිටත් ස්තුතිවන්ත වෙනවා. කෙසේ වුවත් සසුනට සම්බන්ධ වන සාමණේර වහන්සේගේ දෙමවුපියන්ට ඉඩම් නැත්නම් එයත් ලබාදීමට කටයුතු කිරීම සුදුසු බවද ආචාර්ය මැදගම ධම්මානන්ද හිමිපාණෝ පැවසූහ.

අප කළ විමසීමදී මේ පිළිබඳව කරුණු පළකළ "මිහිඳු නිවහන" වැඩසටහනේ සැලසුම් නිර්මාතෘ කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන නාහිමි පවසන්නේ මේ වැඩසටහන නිර්මාණය කළේ යුද්ධයෙන් පීඩාවට පත් පවුල්වලින් ශාසනයට එක්වූ සාමණේරවරුන්ගේ සිතට පිළිසරණත් සමග ඒ හිමිවරුන්ගේ දුප්පත් දෙමවුපියන්ගේ හිසට සෙවණක් ලබාදීම අරමුණු කරගෙන බවයි.

පසුගිය තිස් අවුරුදු යුද්ධය නිසා අපේ රටේ දුප්පත් ගම්වලින් හමුදාවට ගිය තරුණයන් 30,000 ක් පමණ නැතිවුණා. ඒ අයගේ බිරියට හා දරුවන්ට සරණක් අවශ්‍ය තත්ත්වයට පත්වුණා.

විශේෂයෙන් ඒ අයගේ තරුණ දූවරුන් ඒ පවුල්වලදීම ආරක්ෂා කරන්න වුණා. ඒත් ඒ පවුල්වල පිරිමි දරුවන්ට පිහිටවීමට කවුරුවත් ඉදිරිපත් වුණේ නෑ. ඒ අවස්ථාවේ අපේ සංඝරත්නය ඔවුන් සුරැකීමට කටයුතු කළා. ඒ අනුව ඒ තාත්තා නැති පිරිමි දරුවන් සමහරු ශාසනයට එකතු වුණා. ඒ සාමණේර වහන්සේ දැන් උසස් අධ්‍යාපනය ලබමින් සිටිනවා. ඒ සමහර අයගේ දැන් අදහස ඒ අයගේ අම්මලා තාත්තාලට පිහිට වෙන්න හා පවුලේ බාල සොහොයුරන්ට සොහොයුරියන්ට පිහිටවීමට ගමට ගෙදරට යාමටයි. ඒ තත්ත්වය වළක්වා ඒ හාමුදුරුවන් ශාසනය තුළ රඳවා ගැනීමටත් ඒ හාමුදුරුවරුන්ගේ ගැටලුවට තිරසාර විසඳුමක් ලබාදීමටත් තමයි මේ 'මිහිඳු නිවහන' වැඩපිළිවෙළ අපි සකස් කරලා ඒ යෝජනා මාලාව අගමැතිතුමාට බාර දුන්නේ. අගමැති මහින්ද රාජපක්ෂ මහතා හා රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මහතා මේ මිහිඳු නිවහන වැඩපිළිවෙළ නිවාස අමාත්‍යාංශය හරහා ක්‍රියාවට නැංවීමට කටයුතු කරනවා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා.

මේ සඳහා ශාසනාරක්ෂක මණ්ඩල මගින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉල්ලුම්පත් කැඳවූවා. ඒ අනුව දැනටම ඉල්ලුම්පත් 1700 ක් ලැබී තිබෙනවා.ඒ තරුණ හිමිවරුන්ගේ දුප්පත් අම්මලා තාත්තාලට මේ මගින් වසරකට ගෙවල් 2000 ක් ලබාදෙන්න අපේක්ෂා කරනවා යැයිද මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමිපාණෝ පැවසූහ.

වමේ සිට පිළිවෙළින් අස්ගිරි මහා විහාරයීය කාරක සංඝ සභාවේ මහා ලේඛකාධිකාරී, සමස්ත ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ගරු උප සභාපති ආචාර්ය මැදගම ධම්මානන්ද නාහිමි, කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘතික අධ්‍යන අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන නාහිමි.

මේ වැඩපිළිවෙළ සමාරම්භක උත්සවයේදී ඌව පළාතේ දුප්පත් දෙමවුපියන්ට 50කට රුපියල් ලක්ෂයක ආධාරයක් දුන්නා. ඒ අයට තවත් රුපියල් ලක්ෂ 5ක් නිවාස ඉදිකිරීම අනුව ලබා දෙනවා. ඒ ඉදිකිරීම් කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්මික නිලධාරීන් ලවා අධීක්ෂණය කරනවා.

තවත් දෙමවුපියන් 250කට අපි දැනටමත් ආධාර දෙන්න සූදානම්. ඉතිරි අයදුම්පත් 1400 සලකා බලා ඒ අයටත් 'මිහිඳු නිවහන' වැඩපිළිවෙළ යටතේ නිවාස ඉදිකිරීම සිදුකරනවා. මේ වසරේ නිවාස 2000ක් හදන්න සූදානම්. උන්වහන්සේ පැවසූහ.

මේ පිළිබඳව අදහස් දක්වන නිවාස රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් කීර්ති රංජිත් අබේසිරිවර්ධන මහතා පවසන්නේ මිහිඳු නිවහන වැඩපිළිවෙළ යටතේ ඉදිකරන මුල් නිවෙස් 50 ඉදිරි මාස හත ඇතුළත අවසන් වනු ඇති බවයි.

"අපි මුලින්ම ඒ පවුල්වලට ලක්ෂයක ආධාර දෙනවා. ඊට පස්සේ අවස්ථා 3කද රුපියල් ලක්ෂ 5 දෙනවා. ඒ ගෙවල් සාදන්න ගමේ අයත් උදවු වෙනවා. පරිත්‍යාගශීලීන්ට ද 'මිහිඳු නිවහන" වැඩපිළිවෙළට එක්වෙන්න පුළුවන් ලේකම්වරයා පවසයි.

● සුරේකා නිල්මිණි ඉලංගකෝන්

ගෝලීය කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව මෙම සති අන්තය වන විට දස කෝටිය ඉක්මවා තිබූ අතර මරණ සංඛ්‍යාව ලක්ෂ 24ට ආසන්නව ඇත. ආසාදිතව සුවය ලැබූ සංඛ්‍යාව කෝටි 8කට අධිකය.

මේ දිනවල මෙරටද කොවිඩ් වයිරසසේ ශීඝ්‍ර ව්‍යාප්තියක් දැකිය හැකිය. ඉකුත් සතිය ආරම්භ වූයේ කොවිඩ් ව්‍යාප්තිය පාලනය කිරීමේ අරමුණින් හුදෙකලා කර තිබූ බොරැල්ල පොලිස් වසමේ ප්‍රදේශ 4 ක්, පූගොඩ පොලිස් වසමේ එක් ප්‍රදේශයක්, මිනුවන්ගොඩ පොලිස් වසමේ ප්‍රදේශ 4 ක් සහ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් ප්‍රදේශයක් හුදෙකලා බවින් නිදහස් කරමිනි.

රටම ශීඝ්‍රයෙන් කොවිඩ් වසංගතයට ගොදුරු වෙමින් තිබෙන පසුබිමක රජය ප්‍රමුඛ සෞඛ්‍ය අංශ එය පාලනය කිරීම සඳහා උපරිම ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සිටියද ඇතැම් විට තවමත් ඒ සඳහා මහජනතාවගෙන් ලැබෙන සහයෝගය සතුටුදායක නොවන පුවත්ද අසන්නට ලැබේ.

සති අන්තය වන විට එන්නත් ලැබූ සංඛ්‍යාව ලක්ෂ 2කට ආසන්නයි

ඉකුත් 8 වැනිදා මුන්දලම උඩප්පුව ප්‍රදේශයේ පිරිසක් ජෛව පටල පරීක්ෂාවකට රැගෙන යෑමට පැමිණි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට බැණ වැදී සිරුරට ගිනි තබා ගන්නා බවට තර්ජනය කිරීමෙන් පසුව උඩප්පුව පොලිසිය මැදිහත්ව එම පිරිස පරීක්ෂණවලට යොමුකිරීමේ පුවතක එවැන්නකි. එසේ කලහකාරී ලෙස හැසිරී තිබුණේ උඩප්පුව පොලිස් වසමේ කොරෝනා ආසාදිතයන් වාර්තා වී තිබූ ඇති නිවාස තුනක පදිංචිකරුවන්ය.

කොලොන්නාව නාගහමුල්ල ප්‍රදේශයේ නිවෙසක එකම පවුලේ මව, පියා, දරුවන් ඇතුළු 10 දෙනකුට කොරෝනා ආසාදනය වී ඇති බව වාර්තා වීමත් සමග ඔවුන් සියලු දෙනා ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමුකර තිබේ.

කැගල්ල මහ රෝහල සඳහා රුපියල් මිලියන 284ක් වටිනා පී.සී.ආර් යන්ත්‍රයක් ප්‍රදානය කිරීම සහ අංග සම්පූර්ණ රසායනාගාරයක් විවෘත කිරීම පසුගියදා සිදුවූයේ ජනපති සහ අගමැති උපදෙස් අනුව රාජ්‍ය ඇමති කනක හේරත්ගේ ඉල්ලීමක් අනුවය. කැගල්ල මහ රෝහලට පී. සී.ආර් යන්ත්‍රයක් හා රසායනාගාරයක් නොමැතිකමෙන් මේ දක්වාම දිස්ත්‍රික්කයේ පී. සී. ආර්. සාම්පල පිට පළාත්වල රෝහල්වලට යැවීමට සිදුවූ අතර එම පරීක්ෂණවල ප්‍රතිඵල ප්‍රමාද වීම නිසා වෛද්‍ය කාර්ය මණ්ඩලය විවිධ අපහසුතාවට මුහුණ පා සිටියහ.

රුසියානු එන්නත ගැනත් බලාපොරොත්තු දල්වයි

අඹන්පොල ප්‍රදේශයේ පසුගිය ජනවාරි 21 දින පැවති මංගල සාදයකින් පසු මනාලයා හා මනාලිය ඇතුළු 136කට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බව සෞඛ්‍ය අංශ තහවුරු කළේය.

එම මංගල උත්සවයේ දෙවැනි දිනය මිනුවන්ගොඩ ප්‍රදේශයේ පවත්වා ඇති බවත් මෙම මංගල උත්සව අවස්ථා දෙකටම 260 කට ආසන්න පිරිසක් එක්වී ඇති බවත් සෞඛ්‍ය අංශ පවසයි. ආසාදිතයන් අතරින් 40 දෙනකු අඹන්පොල, බොරවැව , දිගන සහ කොහල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර ආසාදිතයන් 96 දෙනකු මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන්ය.

73 වැනි නිදහස් සමරුම් උත්සවයට සහභාගි වී සිටි වැල්ලම්පිටිය වෙන්නවත්ත සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු කඳවුරේ භටයන් 8 දෙනකුද කොවිඩ් ආසාදිතයන් ලෙස හඳුනා ගෙන ඇත.

ඌව පළාතේ කොරෝනා වයිරසය ආසාදිත යැයි සැක පුද්ගලයන්ගෙන් ලබාගත් ජෛව සාම්පල නියදි 800ක් පමණ බදුල්ල මහා රෝහලේ පී.සී. ආර් පරීක්ෂණාගාරයේ ගොඩගැසී ඇතැයි බදුල්ල වසංගත රෝග විශේෂඥ වෛද්‍ය ශාන්ත ගමගෙදර පැවසීය.

ඒවා පරීක්ෂා කිරීමට දින තුනක් පමණ ප්‍රමාද වන නිසා බදුල්ල මහ රෝහලට තවත් පී.සී.ආර් යන්ත්‍රයක් අත්‍යවශ්‍ය බව හෙතෙම අවධාරණය කළේය.

සියලු පුරවැසියන්ට කොවිඩ් එන්නත

නිරෝධායන නීති කැඩූ ආයතන 1,400ට විරුද්ධව නඩු

ගම්පහ පොදු වෙළෙඳ සංකීර්ණය ආශ්‍රිතව කොවිඩ් ආසාදිතයන් වාර්තා වීම හේතුවෙන් එම වෙළෙඳ සංකීර්ණය තාවකාලිකව වසා දැමුණේ සතිය ආරම්භයේදීය. ගම්පහ වෙළෙඳ ප්‍රජාව මූලික කරගනිමින් පී.සී.ආර් පරීක්ෂණ 1200ක්ද පසුගිය බ්‍රහස්පතින්දා සිදුකෙරුණේ තවදුරටත් ආසාදිතයන් හඳුනා ගැනීමේ අපේක්ෂාවෙනි.

ලොව දෙවැනි වයස්ගතම තැනැත්තිය මෙන්ම යුරෝපයේ වයස්ගතම තැනැත්තිය ලෙස හැඳින්වෙන ප්‍රංශ ජාතික ඇන්ඩ්‍රේ නම් කන්‍යා සොයුරිය ඇගේ 117 වැනි උපන්දිනයට දින කිහිපයකට පෙර කොරෝනා රෝගයෙන් සුවය ලබා ඇති බව විදෙස් මාධ්‍ය වාර්තා කළේය.

ඉකුත් ජනවාරි 16 දින ඇයට කොරෝනා වැලඳී ඇතැයි තහවුරු වූ අතර පසුගිය 11 වැනිදා ඇය සිය 117 වැනි උපන්දිනය සමරන විට රෝගයෙන් සම්පූර්ණයෙන්ම සුවය ලබා සිටි බව වාර්තා විය.

පළමු පාසල් වාරය ආරම්භයේ සිට පසුගිය සතියේ මැද දක්වා ගතවූ කාලය තුළ ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් 48ක පාසල් දරු දැරියන් 95 දෙනකුට හා ගුරුවරු තිදෙනකුට කොරෝනා ආසාදනය වී ඇති බැව් ගාල්ල දිස්ත්‍රික් ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය වෙනුර කේ.සිංගාරච්චි පැවසීය.

එම ආසාදිතයන්ගේ පළමු පෙළ ආශ්‍රිතයන් ලෙස පාසල් දරු දැරියන් 197 දෙනෙකු හා ගුරුවරු 19 දෙනෙකු හඳුනාගෙන ඇති බවත් ඔවුන් සියලු දෙනා නිරෝධායනය කිරීමට කටයුතු කර ඇති බවද හෙතෙම පැවසීය.

වයිරසය ආසාදනය වූ පාසල් දරු දැරියන් 95 දෙනාගෙන් පාසල් 21ක දරු දැරියන් 33 දෙනකුටම වයිරසය ආසාදනය වී ඇත්තේ ඉකුත් සති දෙක තුළදී බවද ආනාවරණය වී ඇත. කෙසේවෙතත් ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල්වල කොරෝනා පොකුරක් නිර්මාණය වීමට ඉඩ නොදි එය ඉතා සාර්ථක ලෙස පාලනය කොට ඇති බවද ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

ඉකුත් බ්‍රහස්පතින්දා රාත්‍රියේ කොවිඩ් ආසාදිත මරණ 4ක් වාර්තා වූයේ මෙරට සමස්ත කොවිඩ් ආසාදිත මරණ සංඛ්‍යාව 379 දකවා ඉහළ නංවමිනි. සතිය තුළ සිදුවූ මරණ සංඛ්‍යාව විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ ඉකුත් සතිය තුළ මරණ 40ක් වාර්තා වී ඇති බවයි.

ගතවූ සතිය තුළ මෙරටින් දෛනිකව වාර්තා වූ ආසාදිතයන් අතර වැඩිම සංඛ්‍යාව වූ 976 ක් වාර්තා වූයේ ඉකුත් 9 වැනිදාය. 11 වැනිදා වාර්තා වූ දෛනික ආසාදිතයන් සංඛ්‍යාව 942ක් වූ අතර 10 වැනිදා ආසාදිතයන් 955ක් වාර්තා විය.

මේ දිනවල මෙරට ආසාදිතයන් වාර්තා වීමේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කළද ඊට සමාන්තරව සුවය ලබන්නන්ගේ සංඛ්‍යාවේද වැඩිවීමක් දක්නට ඇත. මෙරට සුවය ලැබූ වැඩිම සංඛ්‍යාව වාර්තා වූයේ ඉකුත් 6 වැනිදාය.

එදින 1133 දෙනකු සුවය ලබා රෝහල්වලින් පිටව ගොස් තිබිණි. ඒ අනුව මේ වන විට මෙරට කොවිඩ් ආසාදිතයන් සුවවීමේ ප්‍රතිශතය සියයට 90.56කි. මරණ ප්‍රතිශතය පවතින්නේ තවමත් සියයට 0.52 අගයකි. මේ වන විට කොවිඩ් ආසාදනය වීමෙන් රෝහල්වල ප්‍රතිකාර ලබමින් සිටින සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 8.9කි.

මේ අතර මාර්තු 1 වැනිදා සිට අවුරුදු 30 සිට 60 දක්වා වයස්වල සිටින සියලු පුරවැසියන්ට කොරෝනා මර්දන එන්නත ලබාදෙන බව වසංගත හා කොවිඩ් රෝග පාලන රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ පැවසුවාය.

11 වැනි සිකුරාදා වන විට කොරෝනා මර්දන එන්නත 1,78,087කට ලබාදී ඇති බවත් ඔවුන්ගෙන් කිසිවකුට මේ දක්වා ප්‍රබල අතුරු ආබාධ හටගෙන නොමැති බවත් වාර්තා වේ.

කොවිඩ් එන්නත ලබා දීමේදී තරුණ හෝ ආර්ථික වශයෙන් වැදගත් පුද්ගලයන්ට ප්‍රමුඛත්වය ලබා දීමට කිසිසේත් සිදු නොකරන බවත් මෙතෙක් හඳුනාගෙන ඇති සියලු කණ්ඩායම් වෙත සමාන්තරව එන්නත ලබා දෙන බවත් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හේමන්ත හේරත් මහතා පැවසීය.

මේ සම්බන්ධයෙන් නොයෙක් මත මාධ්‍ය හරහා සහ සමාජයේ ප්‍රචාරය වන බවත් ඒවායේ සත්‍යතාවක් නොමැති බවද නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහන් කළේය.

ආදරවන්තයන්ගේ දිනයේදී සාද, සම්භාෂණවලට වැට

මේ අතර ජනමාධ්‍යවේදීන් සඳහා එන්නත ලබාදීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය ඇමති කෙහෙළිය රඹුක්වැල්ල මහතා බලධාරීන් සමග සාකච්ඡා කර ඇති බවත් ඊළඟ එන්නත් තොගය ලැබීමෙන් පසු ජනමාධ්‍යවේදීන් සඳහා එන්නත් ලබාදීමේ සූදානමක් ඇති බවද රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් නාලක කලුවැව පැවසීය.

කොවිඩ් වයිරසයේ ව්‍යාප්තිය පාලනය කිරීමේ අරමුණින් රජය ප්‍රමුඛ සෞඛ්‍ය අංශ විසින් පනවා ඇති නිරෝධායන නීති කඩකළ පුද්ගලයන්ගේ සංඛ්‍යාව ඉකුත් සිකුරාදා වන විට 3,095 දක්වා ඉහළ ගොස් තිබිණි. එමෙන්ම සෞඛ්‍ය නීතිරීති උල්ලංඝනය කළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන 1400කට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කර ඇති බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ පැවසීය.

කොවිඩ් වයිරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සති අන්තයට යෙදී ඇති ආදරවන්තයන්ගේ දිනයේදී කණ්ඩායම් ඒකරාශී වන සාද, ප්‍රියසම්භාෂණවලට සහභාගිවීමෙන් වැළකී සිටින ලෙසද පොලිසිය තරුණ තරුණියන්ගෙන් ඉල්ලා සිටී.

මේ අතර ශීඝ්‍රයෙන් පැතිර යෑමේ හැකියාවක් ඇති බ්‍රිතාන්‍ය නව කොවිඩ් ප්‍රභේදයේ ආසාදිතයන් කොළඹ, අවිස්සාවේල්ල, බියගම හා වව්නියා යන ප්‍රදේශවලින් හඳුනාගත් බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය චන්දිම ජීවන්දර ප්‍රකාශ කළේය. අහඹු නියදිවලින් එම ආසාදිතයන් හඳුනාගෙන ඇත. මේ අතර බ්‍රිතාන්‍ය පුරා ඉක්මනින් පැතිර යන නව වයිරස් ප්‍රභේදය කොළඹ, අවිස්සාවේල්ල, බියගම සහ වව්වියාව යන ප්‍රදේශවලින් ලබාගත් සාම්පල් වලින් සොයාගෙන ඇති බව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආචාර්ය, වෛද්‍ය චන්දිම ජීවන්දර පවයයි.



කුඩම්මාගේ සැලකිලි ලබන විද්‍යා පීඨ

● සුභාෂිණී ජයරත්න

සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ලංකාව පුරා පිහිටි විද්‍යා පීඨ විශ්වවිද්‍යාල මට්ටමට උසස් කිරීමට තීන්දු කිරීම ජාතික කර්තව්‍යක් වුවද,මේ වන විට එම ක්‍රියාදාමය අවුල් කිරීමට යම් පිරිස් උත්සාහ ගනිමින් පවතින බව ඊට නැඟෙන ප්‍රධාන චෝදනාවකි. ලංකාවේ විද්‍යා පීඨ ආරම්භ වන්නේ විද්‍යායතන පනතින් 1985 වසරේදීය.

මහවැලි, පස්දුන් රට, සියනෑ, යාපනය, මඩකලපුව,හාපිටිගම, වයඹ, නිල්වලා, රුහුණු හා සාරිපුත්ත ඇතුළු විද්‍යාපීඨ 19 මේ වන විට පාලනය හා යටිතල පහසුකම් සංවර්ධනය කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යාපීඨ කොමසාරිස් යටතේ ඇති විද්‍යා පීඨ ශාඛාවෙනි. විද්‍යා පීඨ ආරම්භ කර මේ වන විට වසර 36 ක් ගෙවී ඇතිද එහි විෂය මාලා සංවර්ධනය හා සහතික පත්‍ර ප්‍රදානයට තවමත් බලය ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනයටය. වසර දෙකක එම පාඨමාලාවෙන් අනතුරුව අධ්‍යාපනවේදි උපාධිය හිමිවන මෙම පිරිස ගුරු වෘත්තියේ නියැළෙති. මේ වන විට විද්‍යාපීඨවලට වසරකට සිසුන් 4000 ක් බඳවා ගන්නේ වසරකට විශ්‍රාම ගන්වන ගුරු පිරිසට සමගාමීවය. අධ්‍යාපන ඇමැතිවරයා යටතේ ඇති විද්‍යා පීඨ සම්බන්ධ ඕනෑම වෙනස් කිරීමකට හෝ සංවර්ධනය කිරීමකට විෂය භාර ඇමැතිවරයාට හැකි වන්නේය.

> **‘අධ්‍යාපන ඇමැතිවරයාගේ කැබිනට් පත්‍රිකාව හකුළන්න උත්සාහ කරනවා,**

ලංකාවේ විද්‍යා පීඨයන්ට සමගාමීව තායිලන්තයේ ආරම්භ වූ පූර්ව සේවා ගුරු පුහුණු ආයතනය වසර 5 ක් යාමට ප්‍රථම විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් වුවද ලංකාවේ අනාගතය බාර ගැනීමට සිටින දරු පිරිසකගේ නැණ නුවන පැදිමේ ජාතික කර්තව්‍යයට මඟ පෙන්වන

අපේ ගුරු පරපුරට තවමත් එවැනි අවස්ථාවක් මතුව නැත. එසේම විද්‍යාපීඨ සම්බන්ධයෙන් මේ වන විට ගැටලු බොහෝමයක් තිබුණද මේ වන විටත් ඊට නිසි විසඳුම් ලැබී නැත්තේ ඊට කකුලෙන් අඳින පිරිස්ද ඇති බව මීට සම්බන්ධ පිරිසකගේ අදහසය.

“ මුල් අවුරුදු 10 අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යාපීඨ ශාඛාවේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ සිටියේ මේ විෂය සම්බන්ධ දැනුම ඇති පිරිස්. ඉන්පසු විද්‍යා පීඨ සම්බන්ධ දැනුමක් නැති පිරිස් පත්වුණා. ජාතික අධ්‍යාපන ආයතනය විද්‍යා පීඨ ගැන අවධානයක් යොමු කළේ නැහැ. වසර 11 කට පෙර හඳුන්වා දුන් විෂය මාලාවමයි අදටත් භාවිත කරන්නේ. ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන වුණේ නැහැ. ඒ වගේම මේ වන විට ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිටින්නේ තුන් දෙනයි. එයින් දෙදෙනෙකු පාසලක ගුරු පත්වීමක් හෝ ලබපු අය නෙමෙයි. අනිත් කෙනාට ජාතික අධ්‍යාපන ආයතනය සම්බන්ධ අත්දැකීම් නැහැ.

> **‘විද්‍යා පීඨ සියල්ලේම කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර කරන මධ්‍යස්ථාන පවත්වලා,**

මේ විද්‍යාපීඨ සම්බන්ධ සියලු කටයුතු සිදුවන්නේ මේ තිදෙනා අතිනුයි. විද්‍යා පීඨ තුළ පි.එච්.ඩී උපාධි ලබාගත් 22 ක් ඉන්නවා. ඒ අයටත් උපදෙස් ගන්න වෙලා තියෙන්නේ මේ අයගෙන්. මේ අයගේ තීන්දු තීරණ මීට කොතරම් අදාළ වේද? එක් අවස්ථාවක මහරගම විද්‍යාපීඨයේ ව්‍යවසායකත්ව හා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කළා. අවුරුදු 3 ක පාඨමාලාවක් වුවත් මේ පිරිස් එය වසරකින් අවසන් කළා. විද්‍යා පීඨ ආචාර්ය මහාචාර්යවරු සිය පරීක්ෂණවලින් පෙන්වා දුන්නේ මේවා දියුණු වෙන්න නම් ඉහත ගැටලු විසඳා විශ්වවිද්‍යාල මට්ටමට උසස් විය යුතු බව. 2004 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදි හිටපු විද්‍යා පීඨ ප්‍රධාන කොමසාරිස් නිහාල් හේරත් පවා මේ ගැන කිව්වා. එසේම මහාචාර්ය ප්‍රසාද් සේතුංග සිය පර්යේෂණයකදි පෙන්වා දුන්නේ විද්‍යා පීඨ ජාතික අධ්‍යාපන ආයතනය සමඟ යන ගමන කිසිදු ප්‍රගතියක් නැති බව. මේ සියල්ල නිසා අධ්‍යාපන ඇමැතිවරයා විසින් එකාබද්ධ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ගත්තා, විද්‍යා පීඨ සියල්ල එක් විශ්වවිද්‍යාලයක් යටතට එක් කිරීමට. මෙම යෝජනාවට මේ වන විට නිතී කෙටුම්පත් කිරීමට ලක් වෙලා. ඒත් මේ කැබිනට් පත්‍රිකාව හකුළන්නට යම් පිරිසක් උත්සාහයක් දරමින් පවතිනවා. ඔහු වෑයම් කරන්නේ මෙය ජාතික අධ්‍යාපන ආයතනයෙන් නොගලවා එහිම තව දුරටත් පවත්වා ගෙන යාමටයි. “

ඒ සමස්ත ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා නිලධාරීන්ගේ සංගමයේ ලේකම් එම්.කේ.එස් ධම්මික මිරිහානයි.

ගුරු අධ්‍යාපනය සම්බන්ධ මෙවැනි භාරදූර වගකීමක් මෙසේ ලඝු කොට තකන්නේ ඇයිද යන්න ඔවුන්ගේ තර්කය වී ඇත්තේය. මේ වන විට වසර 3කින් ඔවුන් ලබන්නේ අධ්‍යාපනවේදි උපාධිය පමණි. එයින් ගුරු වෘත්තිය හැරුණු කොට ඔවුන්ට වෙනත් වෘත්තියකට පිවිසීමට නොහැකිය. නමුත් විශ්වවිද්‍යාල මට්ටමට උසස් කිරීමේදී එම සහතිකය අධ්‍යාපනවේදී ගෞරව උපාධියක් දක්වා උසස් වෙයි. එවිට ජාත්‍යන්තරය දක්වා වූ රැකියාවන්හි නියැලීමට ඔවුන්ට හැකිවෙයි. මේ වන විට විද්‍යාපීඨවල ඉගෙනුම් ලබන සිසුන්ගෙන් 90% ක්ම කාන්තාවන්ය. පිරිමි සිසුන් ඉන්නේ 10% ක් පමණි. එසේ වීමට මේ සහතිකයට ලැබෙන පිළිගැනීම එකම හේතුව වී ඇත්තේය. එසේම විද්‍යා පීඨවලින් ඩිප්ලොමාව ලබා ගන්නා සිසුවෙක් 3-1 ශ්‍රේණියට පත්වීමක් ලැබෙද්දී විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනවේදී ගෞරව උපාධියක් ලබන්නෙකුට 2-11 පත්වීමක් ලැබන්නේය. කෙසේ වෙතත් මෙම සංගමයේ ප්‍රධාන චෝදනාව වී ඇත්තේ එම කැබිනට් අනුමැතිය ක්‍රියාත්මක කිරීම බලතල ඇත්තේ අධ්‍යාපන ලේකම්වරයාට බවය.

“ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුවිය යුත්තේ යමකුගේ පෞද්ගලික වුවමනාකම් මත නෙමෙයි. මීට අදාළ විද්වතුන් සියලු දෙනා එකම තැනකට එකතු වී පුළුල් සංවාදයක් හරහා මේ වෙනස සිදු කළ යුතුයි. මේ රටේ පිළිගත් අධ්‍යාපන යාන්ත්‍රණයක් තියෙනවා.එහෙත් බලධාරින් තමන්ගේ ගමනක් පමණයි යන්නේ. ජාතික අධ්‍යාපනය ආයතනය තමන්ගේ වගකීම් පවා හරිහැටි වටහා ගෙන නැහැ. ඒ නිසා මේ සියල්ල වළ පල්ලට වැටෙනවා. අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල බවට පත් කළ යුතුයි. ඒ සඳහා මෙහි භෞතික, මානව සම්පත් හා විෂයමාලා සංවර්ධනය කළ යුතුයි. ඊට සුදුසු විද්වත් මණ්ඩලයක් පත් කළ යුතුයි. ...“

ඒ පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා අධ්‍යාපන අංශයේ අංශාධිපති ආචාර්ය ප්‍රභාත් ඒකනායකය.

විද්‍යා පීඨ සිසුන්ද බලාපොරොත්තුවෙන් පසුවන්නේ මේවා අදාළ ප්‍රතිසංස්කරණයන්ට ලක් වීමෙන් අනතුරුව විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමේ කාර්ය කෙරෙන තුරුය. ඒ සඳහා විද්‍යා පීඨයන්හි දැනට පවත්නා ගුණාත්මක බව තවත් ප්‍රවර්ධනය විය යුතු බව ඔවුන්ගේ අදහසය.

“ විද්‍යා පීඨයකින් බිහි වන්නේ පන්ති කාමරයට පමණක් සීමා වූ ගුරු පිරිසක් නෙමෙයි. ඔවුන් සියලු ප්‍රායෝගික දැනුමින් සන්නද්ධයි. එහෙත් මේ ගුරුවරුන්ට සාධාරණයක් ඉටු වී නැහැ. අපි ඉල්ලන්නේ විෂය මාලාව සංවර්ධනය කර අවුරුදු හතරකින් අපිව එළියට දාන්න. උසස් පෙළ කර විද්‍යා පීඨයකට බඳවා ගන්න වසර 2-3 ක් යනවා. මේ නිසා සිසුන්ගේ කාලය පවා නිරපරාදේ ගෙවී යනවා. මේ සියල්ල අවසානයේදී අපිට ලැබෙන්නේ ඩිප්ලෝමාවක් පමණයි. නැවතත් අධ්‍යාපනවේදී උපාධිය ගන්න තව කාලයක් වෙහෙසෙන්න සිදු වෙනවා.....“ ඒ සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සිසුවෙකු වන කොරතොට ධම්මසිද්ධි හිමිය. කෙසේ වෙතත් විද්‍යා පීඨ සම්බන්ධව මතුවෙමින් පවතින මෙම චෝදනා සම්බන්ධයෙන් අදළ බලධාරීන් පවසන්නේ මෙවැනි අදහසකි. මේ වන විට විද්‍යා පීඨ භාර අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන කොමසාරිස් ඊ.එම්.එස් ඒකනායක ඊට ලබා දුන්නේ මෙවන් පිළිතුරකි.

> **‘විෂයමාලාව වසර 11 ක් යල් පැනපු එකක්,**

“ විද්‍යා පීඨයන්හි විෂය මාලා නිර්දේශ හා ඇගයීම් කටයුතු කරන්නේ ජාතික අධ්‍යාපන ආයතනයෙන්. පසුගිය කාලයේ විෂයමාලා සම්බන්ධව සුළු වෙනස්කම් කිහිපයක් සිදු කළා. නමුත් පුළුල් වෙනසක් සිදුවූයේ නැහැ. නමුත් අධ්‍යාපනවේදි උපාධිය දක්වා ප්‍රවර්ධනය කිරීමේ කාර්ය මේ වන විට ආචාර්ය උපාලි සේදර රාජ්‍ය ලේකම්වරයාගේ මූලිකත්වයෙන් වූ කමිටුවක් හරහා සිදු කරනවා. 2022 සිට බඳවා ගන්නා සිසුන් අධ්‍යාපනවේදි උපාධිය වසර 4 දක්වා දිගු කරනවා. ඒ සමඟම විෂයමාලා සකස් කිරීමද සිදුකෙරෙනවා. විෂයමාලා සංශෝධනයේ ගැටලු තිබිය හැකියි. ජාතික අධ්‍යාපන ආයතනයේ යම් යම් අඩුපාඩු තිබිය හැකියි. එහි සම්පත්දායකයන් අඩුවිය හැකියි. එසේම විද්‍යා පීඨ ඉදිරියට ගෙන යන්නේ කෙසේද යන්න නියාමනය කිරීම සඳහා මේ සියලු අංශ එකතු වී විශේෂ ආයතනයක් පිහිටවිය යුතු බව මගේ අදහසයි.“ ඒ ප්‍රධාන කොමසාරිස් ඊ.එම්.එස් ඒකනායකයි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය ලේකම් ආචාර්ය උපාලි සේදර මේ පිළිබඳ සිළුමිණ කළ විමසීමකදී පිළිතුරු දුන්නේ මේ අයුරිනි.

“ ජාතික අධ්‍යාපන ආයතනයේ යම් යම් අඩුපාඩු තියෙනවා. එම නිසා එහි තත්ත්වය අපි උසස් කළ යුතුයි. එය පාලනයට සුදුසු යාන්ත්‍රණයක් සැකසිය යුතුයි. ජාතික අධ්‍යාපන ආයතනය තුළ අධ්‍යාපන පීඨ පාලනය සඳහා පාලක සභාවක් ඇති කළ යුතුයි. ඒ වගේම විශ්වවිද්‍යාලවල තිබෙන අවුල් සහගත බව විද්‍යා පීඨවලට ගෙන ඒම සුදුසු නැහැ. නමුත් විද්‍යා පීඨ ආචාර්යවරුන්ගේ වැටුප් අපි විශ්වවිද්‍යාල ආචාර්ය වැටුප් තලයට සම කරනවා වගේම ඒ පහසුකම්ද ලබා දෙනවා. මෙහිදි අපි රජයේ වත්මන් ආදායම ගැනත් සැලකිලිමත්විය යුතුයි. සියලුදේ කළ යුත්තේ තිබෙන පහසුකම් අනුවයි. ඒ වගේම විශ්වවිද්‍යාලවලට වඩා ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන විශේෂඥයන් විශාල පිරිසක්, එනම් 197 දෙනෙක් ඉන්නවා. ජාතික අධ්‍යාපන ආයතනය කියන්නේ අධ්‍යාපනයේ හදවත. මේ ආයතනයට පිටුපා යාමේ අවශ්‍යතාවයක් නැහැ. දැනට පාසල්වලට වර්ග 14 ක ගුරුවරු අවශ්‍යයි. අපි මේ සිසු පිරිස බිහිකළ යුතුවා සේම මේ සියලු සිසුන්ගේ විෂයමාලා සංවර්ධනය කිරීම තුළින් ජාත්‍යන්තර මට්ටමක් දක්වා යාමට අවශ්‍ය සුදුසුකම්වලින් ඔවුන් පරිපූර්ණ කළ යුතුයි...“ ඒ රාජ්‍ය ලේකම් ආචාර්ය උපාලි සේදරය.

කෙසේ වෙතත් මේ වන විට කොවිඩ් වසංගතය හේතුවෙන් විද්‍යා පීඨ සියල්ල වසා ඇති අතර විද්‍යා පීඨ සියල්ලේම කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර කරන මධ්‍යස්ථාන පවත්වා ඇති බව සමස්ත ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා නිලධාරීන්ගේ සංගමයේ ලේකම් එම්.කේ.එස් ධම්මික මිරිහාන පැවැසීය. ඔවුන් පවසන්නේ අධ්‍යාපන ආයතන වශයෙන් එවන් සත්කාරක සේවාවන්ට ලබා දුන් එකම අධ්‍යාපන ආයතනද මෙය වන බවයි. එවන් කැප කිරීමක් කළ මෙම ආයතනවලට ඔවුන් පැවැසූ කුඩම්මාගේ සැලකිලි හිමි වන්නේ ඇයිද යන්න ඔවුන්ගේ තර්කය වී ඇත්තේය.

එම්.කේ.එස් ධම්මික මිරිහාන

ප්‍රධාන කොමසාරිස් ඊ.එම්.එස් ඒකනායක

ආචාර්ය උපාලි සේදර

එම්.කේ.එස් ධම්මික මිරිහාන

දෙමළ ජාතික සන්ධානයේ පා ගමන කවුරු රැවටීම සඳහාද

● ටී. චන්ද්‍රෙස්කර

දෙමළ ජාතික සන්ධානය බිහිවන්නේ 2002 දීය. එතැන් පටන් දෙමළ ජාතික සන්ධානය සිදුකළ එකම දේශපාලනය කොටි සංවිධානයට ආ වැඩීම හා දෙමළ ජනතාවගේ ප්‍රශ්න ජාත්‍යන්තරයට කියමින් ඒ සඳහා විදේශීය රටවලින් ඩොලර්වලින් විශාල ආධාර ලබා සුඛෝපභෝගීව ජීවත්වීමය. දෙමළ ජාතික සන්ධානයේ පැවැත්මට සහය වූයේ ජාත්‍යන්තරයේ සිටි කොටි හිතවාදී බලවේග පමණි.

ජිනීවා මානව හිමිකම් කවුන්සලයට ශ්‍රී ලංකාව ගැන චෝදනා එල්ල කරමින් විරෝධතා දැක්වීමෙන් කොටි හිතවාදීන්ගේ ජාත්‍යන්තර පැවැත්ම තව තවත් ශක්තිමත් වන අතර ඒ සඳහා අවශ්‍ය පසුබිම සකසා දී ආදායම් උපයා ගැනීමත් ඒ වෙනුවෙන් උතුරේ ජනතාව රැවටීම දෙමළ ජාතික සන්ධානයේ මූලික ප්‍රතිපත්තිය වෙයි.

වසරක් පාසා පැවැත්වෙන ජිනීවා මානව හිමිකම් කවුන්සලයේ සැසිවාරයට දෙමළ ජාතික සන්ධානය සූදානම් වන්නේ ආන්දෝලනාත්මක විරෝධතා, උද්ඝෝෂණ, රටේ නීතිය උදහසට ලක්කරන ක්‍රියා සිදුකිරීමෙනි. ජිනීවා මානව හිමිකම් කවුන්සලය ආරම්භයේ පටන් මේ දක්වා සැසිවාර 45 ක් පවත්වා ඇත. එහි 46 වන සැසිවාරය මෙමස 22 වැනිදා සිට මාර්තු මස 19 වැනිදා දක්වා ජිනීවා හි දී පැවැත්වීමට නියමිතය. මෙම සැසිවාරයට පෙරාතුව මානව හිමිකම් කොමසාරිස් විසින් ඉදිරිපත් කළ සියලු යෝජනා ආණ්ඩුව ප්‍රතික්ෂේප කර තිබිණි. එය ජිනීවා මානව හිමිකම් කවුන්සලය තවත් රටක පෞද්ගලිකත්වයට කරන අත පෙවීමට මරු පහරකි. අනෙක් පැත්තෙන් එම ක්‍රියාව නිසා කවුන්සලය යම් විදිහකින් ලැජ්ජාවට පත්ව තිබේ. මෙනිසාම මෙවර සැසිවාරය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වඩාත් උණුසුම් වාතාවරණයක් ගැනීමට ඉඩ ඇත.

> **‘මේ බලවේගයන් හි කතාවලට රැවටුණු උතුරේ ජනතාව තවදුරටත් රැවටෙන තැනක නැත,**

දෙමළ ජාතික සන්ධානයේ නියෝජිතයින් සෑම වසරකම පාහේ ජිනීවා මානව හිමිකම් කවුන්සලය නියෝජනය කරනු ඇත. එසේ ජිනීවා යෑමට පෙර ශ්‍රී ලංකා ආණ්ඩුවට එරෙහිව තවත් චෝදනා ගොනුකිරීමට හැකිවන ආකාරයෙන් වැඩපිළිවෙළක් දෙමළ ජාතික සන්ධානය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ පොතුවිල් සිට පොලිකණ්ඩි දක්වා විරෝධතා පා ගමනක් දියත් කිරීමය. මෙතෙක් උතුරු පළාත හා දෙමළ ජනතාව පමණක් මුල්කරගෙන හර්තාල් උද්ඝෝෂණ පැවැත්වූ දෙමළ ජාතික සන්ධානය ප්‍රමුඛ දෙමළ පක්ෂ හා රාජ්‍ය නොවන සංවිධාන මෙවර විරෝධතා සඳහා නැගෙනහිර පළාත ද වතුකරයේ ජනතාව ද සම්බන්ධ කරගෙන තිබේ. ඊට හේතු වූ කාරණා බොහොමයක් ඇත. මෙතෙක් මේ බලවේගයන් හි කතාවලට රැවටුණු උතුරේ ජනතාව තවදුරටත් රැවටෙන තැනක නැත. මේ ජනතාව දවසින් දවස මේ බලවේග ප්‍රතික්ෂේප කරමින් සිටීමය.

ඊට හොඳම නිදසුන පසුගිය පාර්ලිමේන්තු මහ මැතිවරණයයි. එම මැතිවරණයේ දී දෙමළ ජාතික සන්ධානයේ මහ ලේකම් මෙන්ම එම පක්ෂය තරග කළ ඉලංගයි තමිල්අරසු කච්චි පක්ෂයේ නායක මාවයි සේනාධිරාජා පරාජයට පත්කිරීමය. මෙසේ දෙමළ පාර්ශවයන්ට උතුරේ බලය ගිලිහි යාම නිසා මෙම විරෝධතා පෙර මෙන් උතුරේ පමණක් පවත්වනු ලැබුවහොත් එය අසාර්ථක වන බව තේරුම් ගෙන උතුරට කළ දේ නැගෙනහිරට ද කරන්නට මේ විරෝධතාව නැගෙනහිර පළාතෙන් ආරම්භ කරන්නට යෙදුණි.

මෙවර ඔවුන් ආරම්භ කළ පොතුවිල් සිට පොලිකණ්ඩි දක්වා වූ විරෝධතා පාගමන ආරම්භ වූයේ ඉකුත් 3 වැනිදාය. එම පෙළපාළිය නිසා අභියෝග රැසක් මතුවීමේ අවදානමක් පැවතිණි. එබැවින් මුලින්ම කලවංචිකුඩි මහෙස්ත්‍රාත් අධිකරණයෙන් තහනම් නියෝගයක් නිකුත් කෙරුණේ මෙලෙසිනි. 2021 -02-01 දින කලවංචිකුඩි පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක උපුල් ගුණවර්ධන AR/31/2021 යටතේ කරන ලද ඉල්ලීමකට අනුව දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රාසමානික්කම් රසපුත්තිරන් සානක්කියන්ට එරෙහිව කලවංචිකුඩි මහෙස්ත්‍රාත්වරයා විසින් කලවංචිකුඩි පොලිස් බල ප්‍රදේශය ඇතුළු ප්‍රදේශවල 2021 මාර්තු මාසයේ මානව හිමිකම් උල්ලංඝන චෝදනා සනාථ කරන ආකාරයෙන් ජිනීවා හි පැවැත්වීමට නියමිත සැසිවාරය නොමග යවන ආකාරයෙන් සංවිධානය කර ක්‍රියාත්මක කරන විරෝධතා අත්හිටුවීමේ නියෝගයක් නිකුත් කිරීමට කොරෝනා ව්‍යාප්තිය හා ආණ්ඩුවට එරෙහිව ජනතාව පෙලඹවීමෙන් ජාතීන් අතරත් ආගම් අතරත් අසමගිය ඇතිකිරීමේ අරමුණක් ඇති බව මෙම අධිකරණය පිළිගන්නා හෙයින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රයේ 106(1) වගන්තිය යටතේ මෙම නියෝගය පනවන බව සඳහන් කර තහනම් නියෝගයක් පනවා තිබිණි. තවද එම විරෝධතා පා ගමන මන්නාරම දිස්ත්‍රික්කයට ඇතුළු වීම වළක්වාලමින් මන්නාරම මහේස්ත්‍රාත් එම්ගගනේෂරාජා 3 වැනි බදාදා තහනම් නියෝගයක් නිකුත් කළේය. මන්නාරම පොලිසිය විසින් මෙම පාගමන නිසා ජාතීන් අතර සාමය කඩවීම් සිදුවිය හැකි බවටත්, නිදහස් දිනයට බාධා වියහැකි බවත් සඳහන් කරමින් පෙඩරල් පක්ෂයේ නායක මාවෙෙ සේනාධිරාජා, යාපනය මහ නගරාධිපති මනිවන්නන්, දෙමළ ජාතික සන්ධානයේ එම්. ඒ. සුමන්දිරන් ඇතුළුව යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා තවත් 14 දෙනෙකුට එරෙහිව දෙන ලද බී වාර්තාවකට අනුව 3 වැනිදා සිට 6 වැනිදා දක්වා බලපැවැත්වෙන පරිදි මෙම නියෝගය නිකුත් කෙරිණි. එමෙන්ම යාපනය මහෙස්ත්‍රාත් අධිකරණය ද, මුලතිව් අධිකරණයද මෙවැනිම තහනම් නියෝගය ලබා දී ඇත. ඒ සියලු නියෝග නොතකා මොවුන් සිය පාගමන පවත්වනු ලැබීය.

දෙමළ ජාතික සන්ධානයේ මෙහෙයවීමෙන් උතුරු නැගෙනහිර සිවිල් සංවිධාන සම්මේලනය නමින් රාජ්‍ය නොවන සංවිධාන 21 ක නමින් ලිපියක් ජිනීවා මානව හිමිකම් කවුන්සලය වෙත යවා ඇත.

එම ලිපියේ සඳහන් කර ඇති කරුණු මෙසේය,

*දෙමළ ජනතාවගේ කොවිල් කඩා පන්සල් හැදීම තුළින් දෙමළ ප්‍රෙද්ශවල ඉඩම් අත්පත්කරගෙන දෙමළ ඉතිහාසය හා පාරම්පරික ප්‍රදේශ සිංහල බවට පත්කිරීම‘

* කොරොනා මගින් මිය යන මුස්ලිම් අයගේ සිරුරු ඥාතීන්ගේ විරෝධය මත ඉස්ලාම් ආගමට පටහැනිව ආදාහනය කිරීම

* වතුකරයේ දෙමළ ජනතාවගේ රුපියල් දහසක වැටුප් වැඩිවීමේ ඉල්ලීමට ආණ්ඩුව ප්‍රතිචාර නොදැක්වීම.

* යුද්ධය අවසන් වූ දා පටන් දෙමළ ප්‍රදේශ හමුදාකරණය කර සිංහල අයට පක්ෂව දෙමළ ඓතිහාසික සංකේත විනාශ කර සිංහල ජනයා දෙමළ ප්‍රදේශවල පදිංචි කරවීම.

* පශු සම්පත් කර්මාන්තයේ වෙසෙන දෙමළ ජනතාව නොයෙකුත් ප්‍රශ්න වලට මුහුණ දෙන අතර ඔවුන්ගේ ප්‍රදේශ සිංහල ජනතාව ආක්‍රමණය කර ගවයන් මරා දමති.

* දෙමළ තරුණයන්ට අනිසි චෝදනා එල්ලකරමින් ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගෙන සිරගතකරයි. ඒ නීතිය දැන් මුස්ලිම් අයට එරෙහිව ද ක්‍රියාත්මක කරයි.

* දෙමළ දේශපාලන සිරකරුවන් වසර ගණනාවක් විමර්ශනවලින් තොරව සිරගතකර සිටියි. සිංහල අයට නොකඩවා නිදහස දෙයි. එහෙත් දෙමළ සිරකරුවන් නිදහස් කරන්නේ නැත.

* අතුරුදන්වූවන්ගේ ඥාතීන් දිගටම විරෝධතා දැක්වූවත් ආණ්ඩුව ඔවුනට පිළිතුරු දෙන්නේ නැත.

* යුද්ධයෙන් මියගිය දෙමළ ජාතීන් සිහිකිරීමේ අයිතියට තහංචි පනවා ඇත. එය අනුස්මරණ සංකෙත විනාශ කිරීමෙන් පැහැදිලි වෙයි.

* මේ අසාධාරණය හෙළිකරන මාධ්‍යවේදීන් හා දෙමළ සමාජ ක්‍රියාකාරීන් ඉලක්ක කරමින් සිටියි.

මේ ලිපියේ ඇති විශේෂත්වයක් වන්නේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් හා වතුකරයේ දෙමළ ජනතාව වෙනුවෙන් දෙමළ ජාතික සන්ධානය හඬ නැගීමයි. කොරෝනා මගින් මියයන මුස්ලිම් අයගේ සිරුරු ඔවුන්ගේ ඥාතීන්ගේ විරෝධය මත ආදාහනය කිරීම. මෙය මුස්ලිම් ජනතාවගේ කතිකාවට ලක්ව ඇති ගැටලුවක් බව සත්‍යයකි. ඒ ගැටලුව ගැන කතාකරන්න මුස්ලිම් නියෝජිතයන් ඕනෑ තරම් සිටිය දී මෙම ගැටලුව ඇදගෙන ඇත්තේ තමන්ට තවත් ලකුණු දා ගැනීමේ පියවරක් ලෙසිනි.

> **‘උතුරු නැගෙනහිර සිවිල් සංවිධාන සම්මේලනය නමින් රාජ්‍ය නොවන සංවිධාන 21 ක නමින් ලිපියක් ජිනීවා මානව හිමිකම් කවුන්සලයට,**

එමෙන්ම වතුකරයේ දෙමළ ජනතාවගේ රුපියල් දහසක වැටුප් වැඩිවීමේ ඉල්ලීමට ආණ්ඩුව ප්‍රතිචාර නොදැක්වූ බව කියමින් වතුකරය ද මුළාකිරීමට සැරසෙන බවක් පෙනේ. කොටි සංවිධානය ද වරක් වතුකරයේ ජනතාව ගැන කතා කරන විට එදා සෞම්‍යමූර්ති තොණ්ඩමන් ප්‍රභාකරන්ට කීවේ ඔබ වතුකරයට අතදාන්න එන්න එපා, මම වතුකරය ගැන බලාගන්නම් කියාය. අද ඔවුන්ගේ ලිපියට වතු ජනතාවගේ නම ඇඳාගෙන ඇත්තේ ඔවුන්ගේ වාසියට මිස වෙනත් කිසිවකට නොවේය. මෙවන් අවස්ථාවාදීන්ට එරෙහිව වතුකරයේ හා මුස්ලිම් ජනතාව නැගී සිටිය යුතුය.

දෙමළ ජාතික සන්ධානය හා ඔවුන්ගේ කටුකන සංවිධානවල විරෝධතා ගැන ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායක වී.ආනන්ද සංගරි නිවේදනයක් නිකුත් කර තිබිණි. එහි මෙසේද සඳහන් කර තිබිණි. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීන් හා ඔවුන්ගේ සගයන් ඉකුත් වසර 10 ක් තිස්සේ ජිනීවා ගිහින් සිදු කළේ කුමක්දැයි විමසන ආනන්ද සංගරි යුද්ධය අවසන් වී වසර දහයකටත් අධික කාලයක් ගත වී ඇතත් කිසිවක් සිදුකරන්නට ජිනීවාවලටත් නොහැකි වූ තැන දෙමළ ජාතික සන්ධානය මේ වසරෙ විසඳුමක් ලැබේවි කියා දෙමළ ජනතාව තුළ බොරු විශ්වාසයක් ගොඩනඟා රැවටීමට කටයුතු කරමින් සිටින බවට චෝදනා කරයි. කෙසේ වෙතත් කොවිඩ් 19 වසංගතයට මුළු රටම මුහුණ දෙමින් සිටියදී අප රටට කොරෝනා පැතිරවීමය. එසේ කළ දෙමළ ජාතික සන්ධානය ප්‍රමුඛ රාජ්‍ය නොවන සංවිධාන පෙළපාළිය අවසානයේ සඳහන් කළේ අධිකරණය පැන වූ තහනම් නියෝග පොලිස් හමුදා බාධාවන් බිඳගෙන මෙම පෙළපාළිය සාර්ථකව නිම කළ බවය.

දෙමළ ජාතික සන්ධානය සිදු කරන්නේ ඒ කිසිවක් ගැන කිසිදු සැලකිල්ලක් නොදක්වා රට තව තවත් අනතුරට ලක්කරමින් පොතුවිල් සිට පොලිකණ්ඩි දක්වා වූ විරෝධතා පාගමන හරහා දිගටම

මූල්‍ය විනය අනුව කරන අපේ විදෙස් ණය ගනුදෙනු

● ජයසිරි මුණසිංහ

රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල්

මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය එස්. ආර්. ආටිගල

එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අගය විශාල ලෙස උච්චාවචනයට බඳුන්වීම වළක්වාලමින් විනිමය අනුපාත ස්ථාවර මට්ටමක රඳවා තබාගැනීම ප්‍රඥා ගෝචර ක්‍රියාවලියකි. මෙහිදී ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය අනුපාත දැඩිව අධීක්ෂණය කරමින් ශ්‍රී ලංකාවට වාසිදායක ලෙස තම මුදල් ඒකකය පවත්වාගෙන යාමට වෙරදරයි.

මෙලෙස ශ්‍රී ලංකා රුපියලෙහි අගය අවප්‍රමාණය වීමට බලපාන සාධක පිළිබඳව අවධානය යොමුකොට ඉන් මිදීමට අවශ්‍ය බාහිර සහයෝගයන් ලබාගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ලැබේ. එවැනි සහයෝගයක් ශ්‍රී ලංකාවට මීට මාස 6කට ප්‍රථම ඉන්දියානු මහ බැංකු සැලසුම් කළ අමෙරිකානු ඩොලර් මිලියන 400ක විදේශ මුදලක් ලබාදීමය. එය නියමිත පරිදි තුන්මසකින් පසු ගෙවා නොදමා නැවත වතාවක් මාස 3කට එම ගෙවීම දීර්ඝ කරගෙවා අවසන් කළේ කීර්තිමත් ඉතිහාසය හා බැඳුණු විශ්වාසය ජාත්‍යන්තරව නැවත වතාවක් සනිටුහන් කරමිනි.

ශ්‍රී ලංකාව නිදහසින් පසු ඉතිහාසයේ කිසිම රටකට හෝ විදේශීය ආයතනයකට ගෙවිය යුතු ණය සඳහා වන පොලිය සහ වාරික නිසි පරිද්දෙන්ම ආපසු ගෙවා දමන රටකි. මේ නිසාම ජාත්‍යන්තරයෙන් ශ්‍රී ලංකාව කෙරෙහි විශාල කීර්තියක් හා විශ්වාසයක් ගොඩනැගී ඇත. එය වඩාත් තීව්‍ර වූයේ ඉකුත්දා ඉන්දියාවට ගෙවූ ඩොලර් මිලියන 400ක මුදල නියමිත පරිදි ගෙවා දැමීම නිසාය.

ශ්‍රී ලංකාවේ කොළඹ වරායේ නැගෙනහිර ජැටිය සංවර්ධනය කිරීම සඳහා ඉන්දියානු ආයෝජකයකුට ලබාදීමට කටයුතු නොකොට ඒ වෙනුවට බටහිර ජැටිය සංවර්ධනය කිරීමට වැඩි හිමිකාරිත්වයක් යටතේ ඔවුන්ට පැවරීමට යන බවට මතයක් රටේ ගොඩනැගී තිබේ. එනමුත් මෙම වරායේ ගනුදෙනුව සහ විදේශ විනිමය ශක්තිමත්ව පවත්වා ගැනීමේ වැඩපිළිවෙළ අතර කිසිඳු සහසම්බන්ධතාවයක් නැතැයි අමුතුවෙන් කිව යුතු නොවේ යැයි මුදල් ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන සහ ආර්ථික ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මහතා අවධාරණය කළේය.

මෙම එකිනෙකට සමපාත නොවන සිද්ධි 2ක් මුල්කරගෙන කරුණු දැන හෝ නොදැන ඇතැම්දෙනා රජයට චෝදනා කරමින් සිටී. ඉන්දියානු සේවකයෝ සහ ඉන්දියානු රජය ශ්‍රී ලංකා රජය සමඟ අමනාපකමක් මතුකරගෙන ඇතැයි ඇතැමෙක් ප්‍රකාශ කරති. එනමුත් කරුණු හරිහැටි අධ්‍යයනය කර බැලීමේදී මෙම කරුණු 2ක අතර කිසිදු සම්බන්ධතාවයක් නොමැති බව සක්සුදක් සේ පැහැදිලිව දක්නට ලැබෙන බව අජිත් නිවාඩ් කබ්රාල් මහතා කියයි. එසේ නම් සිදුවූයේ කුමක්ද?

ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් ලබාගත් එක්සත් ජනපද ඩොලර් මිලියන 400ක මුදල ආපසු ගෙවීමේ දිනය සම්පූර්ණ වීමත් සමඟ එය නිසි පරිදි ගෙවා අවසන් කර දැමීමට මහ බැංකුව කටයුතු කළේය. මෙලෙස ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කළේ ඉන්දියානු රජයට නැගෙනහිර ජැටිය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලුව නිරාකරණය කර ගැනීමට කටයුතු කරමින් සිටියදීය. මේ නිසාම මේ සන්සිද්ධීන් 2ක එකිනෙකට ගළපා ගැනීමට ඇතැම් දෙනා විවේචන හා විවිධ අර්ථකථනයන් දීමට උත්සාහ කළද ඒවා සියල්ල සත්‍යයෙන් සහ බොරු අවලාදවලින් පිරි ඒවා බව පසක් කර දිය යුතුය. ඒ සම්බන්ධයෙන් රජය විවේචකයන්ට කරුණු කීමට හෝ පිළිතුරු ලබාදීමට ඉදිරිපත් වන්නේ නැත. අප නිවැරැදි දේ සිදුකරමින් කොතරම් අසීරු, අමාරු අභියෝග මැද පවා මෙරට ආර්ථිකය මනාව හසුරුවාලීමට හැකි කළමනාකරණ ක්‍රමවේද ඔස්සේ ඉදිරියට රැගෙන යාමට පමණක් මුල්තැන දී ක්‍රියාකරන බව අවධාරණය කිරීමට කැමැත්තෙමි.

මුදල් අමාත්‍යාංශයේ සහ මහ භාණ්ඩාගාරයේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා සඳහන් කළේ විදේශ විනිමයේ අගය ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය නම් ඉන්දියාවෙන් පමණක් නොව චීනයෙන් වුව විදේශ සංචිත ගෙන්වා ගැනීමට පසුබට නොවන බවය. එලෙස ඉදිරියේදී එක්සත් ජනපද ඩොලර් බිලියන 2.5ක මුදලක් ලබාගැනීමට ද දැනටමත් පියවර ගනිමින් සිටින බව ද ආටිගල මහතා පෙන්වා දුන්නේය.

මේ අන්දමට ශ්‍රී ලංකා රුපියලේ අගය ආරක්ෂා කරගැනීමට ආරක්ෂක වැඩපිළිවෙළ සිදුකරන අතර ඇතැමෙකු සෑම දෙයටම දේශපාලනය ඇදා ගැනීමට සහ පක්ෂ, පාට කණ්ණාඩිවලින් බලා විවේචන ඉදිරිපත් කිරීමට පියවරගෙන තිබීම පිළිබඳව බුද්ධිමත් ජනතාව තීරණයක් ගනු ඇති බව තම විශ්වාසය යැයි ද ආටිගල මහතා අවධාරණය කළේය.

මෑතකදී මහ බැංකුව ඉන්දියාවට බේරුම් කළ ඩොලර් මිලියන 400ක කතාව පිළිබඳව මෙලෙස සමාජයේ විවිධ කතාබස් පැතිර ඇති මොහොතක එහි ආර්ථික වටිනාකම කුමනාකාරයේ බලපෑමක් සිදුකරන්නේදැයි විමසා බැලීමට අප ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු අධ්‍යක්ෂ ප්‍රවීණ ආර්ථික විශේලේෂක වින්සන් මර්වින් ප්‍රනාන්දුගෙන් විමසීමක් කළෙමු.

එහිදී ඔහු දැක්වූයේ මෙවන් අදහසකි.

ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් නීති පනතේ 113 වැනි වගන්තියට අනුව රජයේ ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම ඉටුකිරීමට කටයුතු කරයි. ඒ අනුව මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව තිබේ. මෙම දෙපාර්තමේන්තුව හරහා මූලික වූ ක්‍රියාකාරකම් 5ක් සිදුවේ. ඒවා නම්,

1. ආණ්ඩුවේ අයවැය ලේඛනයේ සඳහන් දළ ණයගැනීම් අවශ්‍යතාව සපුරා ගැනීමට අරමුදල් රැස්කර දීම.
2. නියමිත කාලය තුළ රජයේ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම.
3. රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පියවීමේ පහසුකම් සුමටව සිදුකිරීම සඳහා ලංකා සෙකියු (Lankasecure) පද්ධතිය මඟින් පහසුකම් සැලසීම.
4. මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS)රාජ්‍ය සුරැකුම්පත් ලේඛනය පවත්වාගෙන යාම.
5. අවදානම් කළමනාකරණය සඳහා ණය සංයුතියේ සිදුවන වෙනස්වීම් පිළිබඳ විශ්ලේෂණාත්මක කටයුතුවල නියැලීම.

මෙම ක්‍රියාදාමයන්ට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව තවත් සුවිශේෂී කටයුත්තක් සිදු කළේය. එනම්, මෑතකදී ඉන්දියානු මහ බැංකුවෙන් ලබාගත් ඩොලර් මිලියන 400ක ගනුදෙනුව රාජ්‍ය ණය පිළිබඳ ගනුදෙනුවකට වඩා වැදගත්කොට සලකන 'SWAP' ගනුදෙනු විශේෂයක් සිදුකිරීමය. මෙය අන්තර්ජාතික ණය උපකරණයකි. එමෙන්ම එය කෙටිකාලීන ගනුදෙනු විශේෂයකි. එම ගනුදෙනුව කල්පිරෙන විට පියවා දැමීම කළ යුතුයි.

මෙහිදී සිදුවූයේ මාස 3කට ලබාගත් එම SWAP ගනුදෙනුව කල්පිරීමේ කාලය සම්පූර්ණ වූ නිසා මහ බැංකුව රජය වෙනුවෙන් ඉන්දියාවට ගෙවා දැමීමය. එය හා නැගෙනහිර ජැටිය අතර කිසිම සම්බන්ධයක් නැත. අවශ්‍ය නම් යළිත් එවැනිම SWAP ගනුදෙනුවක් ඉන්දියාව සමඟ කරගැනීමට ශ්‍රී ලංකාවට අවස්ථාව තිබේ.

පුද්ගලයකු හෝ වේවා, රටක් හෝ වේවා තමන් ලබාගත් ණය මුදලක් නිසි ලෙස ආපසු ගෙවූ විට නැවත ණය මුදල් ලබාගැනීමේදී එය ධනාත්මක තත්ත්වයක් ඇතිකරන්නක් වේ. සරලව කිවහොත් තමා ලබාගත් ණය නිසි පරිදි ගෙවන්නේ නම් එය යහපත් ලක්ෂණයකි. මූල්‍ය විනය සහ මූල්‍ය විශ්වාසනීයත්වය පිළිබිඹු කරන සන්සිද්ධියක් වනු ඇත. එහිදී ණය මුදල් ආපසු ගෙවීම නිසා රටේ විදේශ සංචිත අඩුවීම සිදුවිය හැක. එය ප්‍රශ්නයක් කරගත යුතු නොවේ.

ඒ මන්ද හොඳම ක්‍රියාව වනුයේ නිසි පරිදි ඕනෑම ණය මුදලක් ගෙවීම යහපත් කටයුත්තක් වන බැවිනි. එලෙස කටයුතු කිරීම තුළින් රටට ද, කීර්ති නාමයක් හිමිවේ. පුද්ගලයකුට වුවද එය එලෙසම කීර්ති නාමයක් ගෙනෙන්නක් වේ. ඒ නිසා ඉදිරියට තවදුරටත් ඕනෑම ගනුදෙනුවක් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව මේ තුළින් උදා වී ඇත. එලෙස ණය ලැබීම ඔස්සේ යළිත් විදේශ සංචිත ශක්තිමත් වීම සිදුවේ.

එමෙන්ම විදේශ විනිමය අභියෝගයට ලක්වූ අවස්ථාවක එය සමනය කරගැනීමට ද ඉන් ඉඩ ප්‍රස්ථාවක් හිමිවන බව අමුතුවෙන් කිව යුතු නොවේ. ඒ නිසා මේ අවස්ථාවේ ඉන්දියාවට ඩොලර් මිලියන 400ක මුදල ගෙවීම සම්බන්ධයෙන් අනවශ්‍ය බියක් හෝ කලබලයක් හෝ ඇතිකරගත යුතු නොවේ.

සිළුමිණ The Silumina

Tender/OTHER ADVERTISEMENTS

silumina.advt@lakehouse.lk 011 242 9351 - 071 782 9018

ලංසු සඳහා ආරාධනයයි (IFB)

ආරක්ෂක අමාත්‍යාංශය

SUPPLY APPLICATOR TRAINING AND APPLICATION SUPERVISION OF WALL GRANULAR BASED EXTERIOR COATING SYSTEM FOR BLOCKS 01, 02, 03 AND 04 OF DEFENCE HEADQUARTERS COMPLEX AT AKUREGODA

කොන්ත්‍රාත් අංක : DHQC/EX GRAN COAT 1234/2020

1. ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන්, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ශ්‍රී ලංකා රුපියල් මිලියන 215 ක පිරිවැයකට (VAT හැර) ඇස්තමේන්තුගත කර ඇති Supply, Applicaton Training and Application Supervision of wall Granular Based Exterior Coating Systems for Blocks 01, 02, 03, and 04 සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් දැන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ.

   The Works consist of Supply, Applicator Training and Application Supervision of Wall Granular Based Exterior Coating System for Block 01, 02, 03 and 04 of Defence Headquarters Complex at Akuregoda. The Time for Completion for the Whole of the Works shall be 168 Days.
2. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය යටතේ සිදුකරනු ලැබේ..
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධුලේඛනගත නොවී සිටිය යුතු අතර, අඩුම තරමින් වසර 05 ක කාලයක් සඳහා ශ්‍රී ලංකාව තුළ වලංගු ව්‍යාපාර ලියාපදිංචියක් සහිත විය යුතුය. ලංසුකරුගේ අවශ්‍ය පළපුරුද්ද සහ පසුගිය සේවා වාර්තාව සඳහා සහාය දැක්වීමට අවැසි ලේඛනගත සාක්ෂි. ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. මෙම අපේක්ෂිත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් හා යෝග්‍යතාවය ලැබීමට, ලංසුකරු තමන් විසින් ඉදිරිපත් කරනු ලබන Granular based exterior texture coating systems සඳහා නිෂ්පාදකයා දේශීය නියෝජිත හෝ නිෂ්පාදකයාගේ විය යුතුය.

   Granular Coating Systems නිෂ්පාදකවරයා, උචිත කර්මාන්තමය ප්‍රමිති තත්ත්වයන්ට අනුකූලවන සේ නවතම නිෂ්පාදන කර්මාන්ත පහසුකම් සහිත පිළිගත් ආයතනයක් විය යුතු වන අතර, සේවා යෝජකයාගේ අවශ්‍යතාවයනට අදාළ වන ලෙස Coating ලබාදීමේ ශක්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

   Granular Coating පද්ධති නිෂ්පාදකවරයා, නිත්ත වර්ග, ප්‍රයිමර්, ජල රෝධක රසායනික ද්‍රව්‍ය හා Adhesive නිෂ්පාදනය හා සංවර්ධනය කිරීම සඳහා වන ISO 9001 සහ 14001 සහතිකලාභී සහ සේවාස්ථ නිෂ්පාදන පහසුකම් සහිත අයවලුන් විය යුතුය.
4. කොන්ත්‍රාත් ප්‍රදානයට අවශ්‍ය සුදුසුකම් අතරට මේවාද ඇතුළත්ය.
   - පසුගිය වසර පහ තුළ ඉටුකළ ඉදිකිරීම් කාර්යයන්හි වාර්ෂික වටිනාකමේ සාමාන්‍ය අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 325 ක් විය යුතුය.
   - ලංසුකරු වෙත කාර්ය සම්පූර්ණ කළ ප්‍රමාණය 1500m^2 නොඅඩු wall granular Coating Systems ස්ථාපිත කිරීමේ ව්‍යාපෘති අවම වශයෙන් තුනක් ඉටුකළ පළපුරුද්ද තිබිය යුතු අතර, එම ව්‍යාපෘතියෙහි හෝ සමාන ස්වභාවයේ වෙනත් ව්‍යාපෘතියක කාර්ය වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 4.5 කට නොඅඩු විය යුතුය. එමෙන්ම මෙම ව්‍යාපෘති වසර පහක් ඇතුළත නිමා කොට තිබිය යුතුය.
   - තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණය වෙනත් කොන්ත්‍රාත්තුමය බැඳීම්වලට වෙන්කළ පසුව හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කෙරෙනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර ශ්‍රී ලංකා රුපියල් මිලියන 100 ක් විය යුතුය.
5. උනන්දුවක් දක්වන ලසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, බත්තරමුල්ල, පැලවත්ත, අකුරේගොඩ පාර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ වෙතින් ලබාගත හැකි අතර, එම ලිපිනයේදීම 2021 පෙබරවාරි 15 වන දින සිට 2021 මාර්තු 09 දින දක්වා රාජකාරි දිනවල 0900 පැය හා 1500 පැය අතර, කාලය තුළ නොමිලයේ අදළ ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.
06. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් තිස්හය දහසක් (ශ්‍රී ලංකා රුපියල් 36,000.00) ගෙවීමෙන් හා කොළඹ 03, බාලදක්ෂ මාවතේ, අංක 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපති වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2021 පෙබරවාරි 15 දින සිට 2021 මාර්තු 09 දින දක්වා, 0900 පැය හා 1500 පැය අතර කාලය තුළ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින් හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ නමට ගත් බැංකු අණකරයක් මගින් කළ යුතුය.
07. ලංසු, පිටපතක් සහිතව පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදීමෙන් හෝ පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් 2021 මාර්තු 10 වන දින 1400 පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ, නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.
08. ලංසු 2021 ජූනි 09 වන දින දක්වා (ලංසු විවෘත කළ දින සිට දින 91) වලංගු විය යුතුය.
09. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් නිකුත් කළ ශ්‍රී ලංකා රුපියල් විසි දෙලක්ෂයක් (ශ්‍රී ලංකා රුපියල් 2,200,000.00) වටිනා ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය. එම ලංසු ඇපකරය, ආකෘතියෙන් කොන්දේසි විරහිත හා ඒක්ෂණ බැඳුම්කරයක් විය යුතු අතර, 2021 ජූලි 07 වන දින (ලංසු විවෘත කළ දින සිට දින 119) දක්වා වලංගු විය යුතුය.
10. මේ සම්බන්ධ පෙර – ලංසු හමුවක් 2021 පෙබරවාරි 23 වන දින 10.30 පැයට, බත්තරමුල්ල, පැලවත්ත, අකුරේගොඩ පාරේ, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේදී පැවැත්වීමට නියමිතය.
11. යම් ලංසුකරුවෙකු හට මෙම ව්‍යාපෘතියෙහි එකම ඒකකයෙහි හෝ වෙනත් ඒකකයන්හි පැකේජ කිහිපයක් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට අවශ්‍ය වෙතොත් ලංසුකරු විසින් එක් එක් කොන්ත්‍රාත්තුවක් යටතේ අවශ්‍ය සුදුසුකම් / නිපුණතා නිර්ණායක වෙන් වශයෙන් සනාථ කළ යුතුය. එසේ නොවුවහොත්, ලංසුකරු එක් ලංසුවකට වඩා ප්‍රදානය කිරීමට සුදුසුකම් නොලබනු ඇත.
12. ඉහත අයිතම 11 ට අමතරව, යම් ලංසුකරුවකු දැනටමත් තෝරාගනු ලැබ ඇති / මෙම ව්‍යාපෘතියෙහි ඒකකයක / ඒකකවල ඕනෑම පැකේජයක කොන්ත්‍රාත්කරුවකු ලෙස කටයුතු කරනුයේ නම් ඔහු විසින් මෙම ලංසු පැකේජය සඳහා විශේෂිත පිරිවිතර / සුදුසුකම් නිර්ණායක යටතේ තම මූල්‍ය හා තාක්ෂණ අවශ්‍යතා සනාථ කළ යුතුය. එසේ නොවුවහොත්, මෙම ලංසුව ප්‍රදානය සඳහා ලංසුකරු සුදුසුකම් නොලබනු ඇත.
13. ලංසුකරුවන් විසින් 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ (අදළ වෙතොත්) ලබාගත් ලියාපදිංචි සහතිකය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබාගත් ලංසුලේඛන සමග ඉදිරිපත් කළ යුතු බවට දැඩිව උපදෙස් දෙනු ලැබේ.
14. ලංසුකරු විසින් අදළ ලංසු විවෘත කරනු ලබන දිනයේ දී එම අවස්ථාවට සහභාගි වීමට අපේක්ෂිත අයවලුන්ගේ නම් හා ජාතික හැඳුනුම්පත් අංක / විදේශ ගමන් බලපත්‍ර අංක අදළ විවෘත කිරීමේ දිනයට අවම වශයෙන් රාජකාරි දින තුනකට (03) පෙර, කොළඹ 03, බාලදක්ෂ මාවතේ, අංක 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

ඉහත අයිතම 7 සඳහා යොමු කළ ලිපිනය වනුයේ.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC)
ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03.

දුරකථනය - 0094-11-2439381 / 0094-11-2390719
ෆැක්ස් - 0094-11-2390720
ඊමේල් - procurement@defence.lk

ලංසු සඳහා ආරාධනයයි (IFB)

ආරක්ෂක අමාත්‍යාංශය

අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ ඒකක 04 සඳහා

SUPPLY AND INSTALLATION OF GRANITE FLOORING, WALL CLADDING AND PANTRY TOPS FOR BLOCK 04 OF DEFENCE HEADQUARTERS COMPLEX AT AKUREGODA

කොන්ත්‍රාත් අංක : DHQC/GRANITE 3/2020

1. ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන්, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ ඒකක 03 සඳහා, පහත විස්තර කොට ඇති පරිදි හා **ශ්‍රී ලංකා රුපියල් මිලියන 269 ක** (වැට් හැර) ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත, Granite Flooring, Wall Cladding and Pantry Tops සැපයීම හා ස්ථාපනය සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් දැන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ.

   මෙම කාර්යයට, අකුරේගොඩ ආරක්ෂක මූලස්ථානයේ ඒකක 04 සඳහා Granite Flooring, wall cladding and pantry tops including decorative items, counter tops, thresholds, paving, steps of staircases and surfaces of ledges සැපයීම හා ස්ථාපනය අයත්වේ. මෙම සියලුම වැඩ සම්පූර්ණ කිරීම සඳහා **කාලය දින 140 කි.**
2. ලංසුකරණය, ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවූවකු විය යුතු අතර, අඩු තරමින් වසර 05 ක ශ්‍රී ලංකාවේ වලංගු ව්‍යාපාර ලියාපදිංචිය සමග ශ්‍රී ලංකාව තුළ අඛන්ඩව ගෘහයිටි වැඩ සැපයීම හා ස්ථාපනය පිළිබඳ වසර 05 ක පළපුරුද්ද සහිත අය විය යුතුය.
4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම්වලට පහත සඳහන් සුදුසුකම් ද ඇතුළත් වේ.
   - පසුගිය වසර පහ (5) තුළ ඉටුකළ ඉදිකිරීම් කර්මාන්තවල වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍ය ශ්‍රී ලංකා රුපියල් මිලියන 100 ක් විය යුතුය.
   - පසුගිය වසර පහ (05) තුළ ශ්‍රී ලංකාව තුළ ගෘහයිටි වැඩ සැපයීම හා ස්ථාපනය පිළිබඳ ව්‍යාපෘති අඩු තරමින් 1 ක් වත් සාර්ථකව නිමා කොට තිබිය යුතු අතර, අඩු තරමින් ඉන් එක් ව්‍යාපෘතියක වටිනාකම ශ්‍රීලං රුපියල් මිලියන 100 ට අඩුනොවිය යුතුය.
   - ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම්වල අවම වටිනාකමේ අනෙකුත් කොන්ත්‍රාත්තුමය බැඳීම් සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවිය හැකි යම් අත්තිකාරම් ගෙවීම් හැර ශ්‍රී ලංකා රුපියල් මිලියන 160 කට නොඅඩු විය යුතුය.
5. අභිලාෂී ලංසුකරුවන්ට වැඩිමතත් තොරතුරු බත්තරමුල්ල, පැලවත්ත, අකුරේගොඩ පාර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධ්‍යක්ෂ වෙතින් ලබා ගැනීමටත්, **2021 පෙබරවාරි 15 දින සිට 2021 මාර්තු** 08 දින දක්වා කාර්යාල දිනයන්හි 0900 පැය සිට 1500 පැය දක්වා ලංසුකරණ ලිපිලේඛන එම ලිපිනයේදී ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය,
6. කොළඹ 03, බාලදක්ෂ මාවත, නො. 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ශ්‍රී ලංකා රුපියල් හතලිස් එක් දහසක් (ශ්‍රීලංරු. 41,000.00) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව **2021 පෙබරවාරි 15 දින සිට 2021 මාර්තු** 08 දින තෙක් කාර්යාල දිනයන්හි **0900 පැය සිට 1500 පැය දක්වා** අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් / ආරක්ෂක අමාත්‍යාංශයේ සරප් වෙත කළ යුතුය.
7. ලංසු අනුපිටපතකින් යුතුව **2021 මාර්තු 09 දින 10.00 පැයට** හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. නැතහොත් එම ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාර ගැනීමේ අවසාන වේලාව ඉකුත් වූ වහාම, එම අවස්ථාවට සහභාගි වීමට රිසි ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ.
8. ලංසු **2021 ජූලි මස 06** දින දක්වා වලංගු විය යුතුය. **(ලංසු විවෘත කරන දින සිට දින 119 ක්)**
9. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියලත් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කළ ශ්‍රී ලංකා රුපියල් විසිහත් ලක්ෂයක් (ශ්‍රී ලංරු. 2,700,000.00) ලංසු සුරක්ෂණයක් එවිය යුතුය. මෙම ලංසු සුරක්ෂණය 2021 අගෝස්තු 03 දින තෙක් (ලංසු විවෘත කරන දින සිට දින 147 ක්) වලංගු විය යුතුය.
10. බත්තරමුල්ල පැලවත්ත, අකුරේගොඩ පාරේ ආරක්ෂක හමුද මූලස්ථාන සංකීර්ණ වැඩබිම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේදී 2021 පෙබරවාරි 23 දින 13.00 පැයට පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙන අතර, පූර්ව ලංසු රැස්වීම අවසානයේදී එදිනම එම ස්ථානයේදීම 13.30 පැයට වැඩබිම පරීක්ෂා කර බැලීමට අවස්ථාව ඇත.
11. යම් ලංසුකරුවකු මෙම ව්‍යාපෘතියේම, ඒකකයේම හෝ වෙනත් ඒකකයක පැකේජ කීපයකට ලංසු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ නම්, එක් එක් කොන්ත්‍රාත්තුව යටතේ අවශ්‍ය වන සුදුසුකම් / යෝග්‍යතා නිර්ණායකයත් වෙන් වෙන්ව සනාථ කළ යුතුය. එසේ නොවුවහොත් එක් ලංසුවකට වඩා ප්‍රදානය කිරීමට සුදුසුකම් නොලබයි.
12. ඉහත අයිතම 11 ට අමතරව, යම් ලංසුකරුවකු මෙම ව්‍යාපෘතියේම ඒකකයෙහිම හෝ වෙනත් යම් පැකේජයක දැනටමත් කොන්ත්‍රාත්කරුවකු ලෙස තෝරාගනු ලැබ දැනට කටයුතු කරන අයෙක් නම් මෙම පැකේජය සඳහා විශේෂයෙන්ම පිරිවිතර /යෝග්‍යතා උපමානයන් යටතේ ඔහුගේ මූල්‍ය හා තාක්ෂණික අවශ්‍යතාව සනාථ කළ යුතුය. එසේ නොවුවහොත් මෙම ලංසුව ප්‍රදානය කිරීමට සුදුසුකම් නොලබයි.
13. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකය (අදළ වන විට) අමාත්‍යාංශයෙන් ලබාගන්නා ලංසුකරණ ලිපිලේඛන සමග ඉදිරිපත් කරන ලෙස ලංසුකරුවන්ට තදින් අවවාද කෙරේ.
14. ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි වන පුද්ගලයාගේ නම/ ජාතික හැඳුනුම්පත් අංකය/ විදේශ ගමන් බලපත්‍රය අඩු තරමින් ලංසු විවෘත කරන දිනට දින 3 කට ප්‍රථම කොළඹ 03, බාලදක්ෂ මාවත, නො. 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ, ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස ලංසුකරුවන්ට දැනුම් දෙනු ලැබේ.

ඉහත අයිතම අංක (07) හි සඳහන් ලිපිනය මෙසේය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03.

දුරකථනය - 0094-11-2439381 / 0094-11-2390719
ෆැක්ස් - 0094-11-2390720
ඊමේල් - procurement@defence.lk

ජාත ග්‍රාමය සුජාත කළ තුඩාවේ ගුණවර්ධන පඬිතුමා

දකුණු ලක අප්‍රකට ග්‍රාම නාම රැසක් රට පුරා ප්‍රචලිත වීමට බලපෑ එක් හේතුවක් වූයේ ඇතැම් ග්‍රාම වලින් ජනිත වූ පඬිවරුන්ගේ ඥාන ප්‍රභා මණ්ඩලයයි. එකුන් විසි වන සියවසේ සිදු වූ ධර්ම ශාස්ත්‍ර පුනරුත්ථාන ව්‍යාපාරය ඈත ගම්දනව්වලද නැණ පහන් සිළු දැල්වීමට හේතු කාරක විය.

මාතර තුඩාවේ ග්‍රාමයේ ජනිතව එසේ ජාත ග්‍රාමය ප්‍රචලිත කළ පඬිරුවනකි, තුඩාවේ ගුණවර්ධන පඬිතුමා. 1825 වර්ෂයේ ජුනි මස 25 වෙනි දින මෙලොව එළිය දුටු දොන් අන්ද්‍රිස් තුඩාවේ ගුණවර්ධනගේ පියා මලවර ආරච්චිගේ දොන් ජානිස් අභයවර්ධන ගුණසේකරය.

මව දෝන දිසානා විජයසේකර හාමිනේ නම් වූවාය. නිවෙස ආසන්නයේ විසූ වැඩිහිටියකු වෙතින් පස් හැවිරිදි වියේදී අකුරුකරණයට එළඹි අන්ද්‍රිස් දරුවා ශාස්ත්‍රයට දැක්වූ විශේෂ උද්‍යෝගය නිසාම නොබෝ කලකින් වැලිගම පොල්වත්තේ තිහුම්මිකාරාමාධිපති මිරිස්සේ ගුණසාර හිමියන් වෙතින් පැවිදි බව ලැබ තුඩාවේ සුමනසාර නමින් ප්‍රසිද්ධ විය.

කලක් මිරිස්සේ ගුණසාර හිමියන් වෙතින් ශාස්ත්‍ර හදාළ සුමනසාර සාමණේර නම වැඩි දුර අධ්‍යාපනය ලැබීම සඳහා මිහිරිපැන්නේ ධම්මරතන හිමියන් වෙත යොමු කෙරිණ. ධම්මරතන හිමියන් වෙතින් සිංහල භාෂාව සහ කාව්‍ය ශාස්ත්‍රය ප්‍රගුණ කළ සාමණේරයෝ ස්වෝත්සාහයෙන් පාලි, සංස්කෘත භාෂා මනා සේ ප්‍රගුණ කළහ.

මෙතරම් උත්සාහයෙන් ශාස්ත්‍ර ප්‍රගුණ කොට ව්‍යක්ත භික්ෂුවක් බවට පත්වූවද කෙටි කලකින් කිසියම් හේතුවක් නිසා උපැවිදිව කලක් වෙළඳාම් කටයුතුවල නිරතව තිබේ. මේ කාලයේදී මෙතුමාට ජේම්ස් ද අල්විස් මහතා හමු වූ අතර තම අනාගත මාවත යොමු වී තිබෙන්නේ ශාස්ත්‍රීය කටයුතු ඔස්සේ බව අල්විස් මහතා පැවසූ වදන් තරයේ සිතට ගෙන කොළඹ බලා පිටත්ව ශාස්ත්‍ර අධ්‍යයනයෙහි ආසක්ත වූ ඡාත්‍ර ගණයාට ප්‍රාචීන ශාස්ත්‍ර ඉගැන්වීමෙහි නිමග්න වී තිබේ. ජේම්ස් ද අල්විස් මහතාද තුඩාවේ අන්ද්‍රිස් ගුණවර්ධන පඬිවරයා වෙතින් ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර හදාළ බව පැවසේ.

ඉගැන්වීමෙහි හසල බව පතළ වීමත් සමඟ රජය විසින් සිවිල් නිලධාරීන්ට සිංහල ඉගැන්වීම සඳහා 1860 වර්ෂයේ මෙතුමන් නිල වශයෙන් පත් කෙරිණ. ඊට අමතරව එවක "නෝමල් ඉස්කෝලය" නමින් ප්‍රසිද්ධව තිබුණු ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ස්ථාපනය කොට තිබුණු විද්‍යාලයේ ආචාර්යවරයකු ලෙසද කටයුතු කර තිබේ.

පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගේ සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ කෘතියෙහි තුඩාවේ අන්ද්‍රිස් ගුණවර්ධන පඬිවරයා වෙතින් ශාස්ත්‍ර හදාළ දෙස් විදෙස් බොහෝ පිරිසකගේ නම් සඳහන් වෙයි.

"එකල ඇටර්නි ජනරාල් ධූරය දැරූ චාර්ල්ස් ලෙසාර්ඩ් මහතා ද, සැළලිහිණි සන්දේශය ඉංග්‍රීසියට නැගූ මැක්රිඩ් දිසාපතිතුමා ද, බී. ගුණසේකර ආණ්ඩුවේ භාෂා පරිවර්තක මුදලිතුමා ද, ඩබ්ලිව්. පී රණසිංහ නීතඥ මහතා ද,මහාවංශය ඉංග්‍රීසියට නැගූ විජයසිංහ මුදලිතුමා ද, මෙතුමාගෙන් කොළඹදී ඉගෙනගත් ශිෂ්‍යයෝ වූහ.

ඩබ්ලිව්. ඇෆ්. ගුණවර්ධන වාසලමුදලිතුමා, ජෝන් කවිතිලක පඬිතුමා, රාමඤ්ඤ නිකායේ මහා නායකව සිටි ඤාණින්දාසභමහ ස්ථවිරතුමා සද්ධම්මයුක්තික නිකායේ නායකධුරයක් දරමින් ගන්දර විසූ සරණංකර මහාස්ථවිරතුමා ආදීහු මාතර පළාතේදී උගත් ශිෂ්‍යයෝ වූහ.

සමකාලීන සෙසු පඬිවරුන් අනුදත් ශාස්ත්‍රීය ප්‍රතිපදාවේ එක් අංගයක් වූයේ සම්භාව්‍ය සිංහල සාහිත්‍ය ග්‍රන්ථ ශාස්ත්‍රීය සංස්කරණයන්ට බඳුන් කොට ප්‍රකාශයට පත් කිරීමය.

ඒ ශාස්ත්‍රීය ප්‍රතිපදාව අනුදත් තුඩාවේ අන්ද්‍රිස් ගුණවර්ධන පඬිතුමා සිදත් සඟරාවට සම්පූර්ණ පදගතාර්ථ සන්නයක් ලියා පළ කළ අතර මුවදෙව් දා වත, කුස දා වත, කාව්‍යශේඛරය, පරෙවි සන්දේශය, යන සම්භාව්‍ය කාව්‍ය ග්‍රන්ථ සංස්කරණයට ලක් කොට ප්‍රකාශයට පත් කළේය. මීට අමතරව කව්මිණි කොඩොලට ව්‍යාඛ්‍යාවක් ද සම්පාදනය කළේය.

කොළඹ කවියේ සමාරම්භක කවියකු වන මෙතුමන් විසින් කාව්‍ය ග්‍රන්ථ දෙකක්ද රචනා කරන ලදි. වේල්ස් රාජ කුමාර චරිතය සහ ප්‍රන්ස නෘත්‍ය කාව්‍ය ඒ කාව්‍ය කෘති දෙකය. මේ කෘති දෙක විශේෂ වැදගත්කමක් උසුලයි.

ප්‍රන්ස නෘත්‍ය කාව්‍යය 1867 වර්ෂයේ ප්‍රකාශිතය. ඒ කෘතිය රචනා කර තිබෙන්නේ 1856 වර්ෂයේ ලංකාවට පැමිණි ඉතාලි නර්තන කණ්ඩායමක් කොළඹ මල්වත්තේ සතියක කාලයක් තිස්සේ නැවතී ප්‍රදර්ශනය කරන ලද නර්තන ප්‍රසංග විෂය කර ගෙනය.

නන් විරිතෙන් බැඳි කවි පන්ති හතළිහකින් පරිමිත මේ කාව්‍ය සමකාලීන කොළඹ සමාජයේ සිදු වෙමින් පැවති සංස්කෘතික විපරිවර්තනය සහ බටහිර සංස්කෘතික නිර්මාණ දෙස ස්වදේශකයන් විස්මපත්ව ප්‍රතිචාර දැක්වූ ආකාරය සම්භාව්‍ය සිංහල කාව්‍යයේ රචනා රීතිය අනුයමින් රචනා කර තිබේ.

වර්තමානයේ අතිශය දුර්ලභ මේ කෘතියෙන් එක් නිදසුනක් මෙහිලා දක්වන්නේ තුඩාවේ අන්ද්‍රිස් ගුණවර්ධන පඬිතුමාගේ කවිත්වයෙන් අංශු මාත්‍රයක් වත්මන් පරපුරට හඳුන්වා දීමේ රිසියෙනි.

හෙළ ස රන් රඟ දෙන සඳෙහි
හැඳිවත් ඉවත්වත නැණින් යුතු දන
එම ක ලු න් තුනු පහස ලොබ
කර අනඟ දෙන නෙක වෙහෙස විඳිමින
පෙළපෙළින් වට බලා සිටි ලෙස
සිහිමුළා පත් වෙමින් කෙලෙසින
මිහිලොලින් බිඟු තඹර වට බම
බමා උන් වැනි තද විඩාවෙන

මෙතුමන් විසින් වේල්ස් රාජ කුමාර කාව්‍යය රචනා කරන ලද්දේ 1870 වර්ෂයේදී සිදු වූ වික්ටෝරියා රජිනගේ පුත්‍ර ඇල්බට් කුමරුගේ ලංකා සම්ප්‍රාප්තිය නිමිති කොට ගෙනය. මේ කෘතියද සමකාලීන සමාජ සංස්කෘතික ප්‍රකාශනයක් ලෙස ඓතිහාසික වැදගත්කමකින් යුක්ත වූවකි.

කොළඹ ජීවිතයට ස්ථාවර පදනමක් සකස් වූ පසු තුඩාව් පඬිතුමා යුග දිවිය ඇරඹුවේ වැල්ලවත්තේ විසූ ආරොන් ෆොන්සේකා ආරච්චි මහතාගේ දියණියන් සමගිනි.

ප්‍රථම දරු ප්‍රසූතියෙන් පසු බිරිඳගේ අභාවය සිදු විය.

මේ කාලය වන විට තුඩාවේ පඬිතුමාට වැලිගම පළාතේ විවාහ ලේකම් පදවිය ලැබුණු නිසා කොළඹ පදිංචිය අතහැර වැලිගම ප්‍රදේශයේ පැලෑන ග්‍රාමයේ පදිංචි වී ශිෂ්‍ය ගණයාට ශාස්ත්‍ර ඥානය ලබා දෙමින් ශාස්ත්‍රීය කටයුතුවල නිරතව තිබේ.

මේ කාලයේදී රජය විසින් තුඩාවේ පඬිතුමන්ට මුහන්දිරම් නාමය පිරිනමන ලදි.

පැලෑන ග්‍රාමයේ විසූ සේරසිංහ මුහන්දිරම් මහතාගේ බාල සොහොයුරියක වූ දෝන ගිමාරා සේරසිංහ හාමිනේ සමඟ විවාහ දිවියට නැවත එළඹි තුඩාවේ පඬිතුමාට දාව පුතුන් සත් දෙනෙකුද දියණියන් සිවු දෙනෙකුද උපන් අතර ඒ අතුරින් එක් පුත්‍රයෙක් පැවිදි බිමට පිවිස පැලෑනේ වජිරඥාන නමින් මහත් ප්‍රසිද්ධියට පත් විය.

පී. පණ්ඩිත ගුණවර්ධන නමින් යුත් තවත් පුත්‍රයෙක් දුම්රිය දෙපාර්තමේතුවේ අධිකාරිවරයකු ලෙස සේවය කරමින් සාහිත්‍යකරණයේ ද නිමග්න වෙමින් පියාගේ සාහිත්‍ය උරුමය පවත්වාගෙන ගියේය.

1890 වර්ෂයේ ජුනි මස 17 වෙනි දින තුඩාවේ අන්ද්‍රිස් ගුණවර්ධන පඬිතුමා දිවියෙන් සමුගන්නා විට සැට පස් වැනි වියට එළඹෙමින් සිටියේය.

යුක්තිය වෙනුවෙන් හඬ නැඟූ වදාකඩ නවරත්න සමුගනී

● **එම්.පී. කුමාර**
කොටදෙනියාව සමූහ

1980 වසරේ පැවැති රාජ්‍ය සේවා ලංකා වැඩ වර්ජනයේදී සේවය අහිමි වූ රාජ්‍ය සේවකයා මාධ්‍යවේදියකු ලෙස ඉදිරි කටයුතු පියවර තබනු ලැබීය. සහජයෙන්ම කවියකු මෙන්ම ලේඛකයකු, ගත් කතුවරයකු ලෙස හැකියාවක් තිබූ නමක් දිනාගනිමින් කාගේත් හද දිනූ වදාකඩ නවරත්න වන ඔහු පසුගිය 8 වැනිදා සිය ජීවන ගමනට තිත තැබුවේය. වයඹ පළාතේ වදාකඩ හිරිපත්ඇල්ලේ විසූ ආර්.එම්. ඩිංගිරි බණ්ඩා හා ලීලාවතී විජේසුන්දර යුවළේ දරුවන් එකොළොස් දෙනාගේ පවුලේ දෙවැන්නා ලෙස නවරත්න උපන්නේ 1948 මැයි 19 වැනිදාය.

ගමේ පාසලෙන් අකුරු කළ නවරත්න 1972දී මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ආනමඩුව කාර්යාලයේ වැඩ පරීක්ෂකවරයෙකු ලෙස පත්වීමක් ලබාගත්තේය. ඔහු ඉඩ ලද අවස්ථාවන්හි ගමේ ඇවිදින්නට ඔහු ගියේය.

උරුමවූ හැකියාව නිසා කවියෙන් අයිරින් තරුණියගේ ආදරය ජය ගන්නට ඔහු සමත් විය.

අයිරින් ධවල පුෂ්පා වූ ඇගේ ආදරණීය නාමය රමණී විය. 1973 ජනවාරි 23 වැනිදා මේ යුවළ අතිනත ගත්තේ කොට්ටුකච්චිය මැල්ලන්කුලමේදීය. ඔවුන්ට දරුවන් සිවු දෙනෙකි.

මේ අතර 1980 වැඩ වර්ජනය ආවේය. දැඩි වාමාංශික අදහස් දැරූ නවරත්න ඊට එක්වූයේ දෙවරක් නොසිතමිනි. ප්‍රතිඵලය නොසිතුවක් වූයේය. රැකියාව අහිමිවුවත් ඔහු සිතින් කඩා වැටුණේ නැත.

තමන්ගේ දේශපාලන අදහස් ක්‍රියාවට නංවමින් ජනතාව දැනුම්
න්ගත් නවරත්තයන් මහජන පක්ෂයේ ආනමඩුව ආසන සංවිධායකවරයෙකු ලෙස පත්වීම් ලැබුයේ මේ අතරය.

වදාකඩ නවරත්නයන්ගේ දේහයට ගෞරව දක්වන පවුලේ සාමාජිකයින්

දේවබණ්ඩාර සේනාරත්නයන් සමඟ ආනමඩුවේ ඔහු නොගිය නිවසක් නොවීය. දේශපාලන කටයුතු කරන අතරේ දරුමල්ලන් රැකීමේ වෑයම ඔහු කිසිවිටෙක අත් නොහළේය.

ගොවිතැනේ යෙදුණේ ඒ නිසාමය. වැසි සමයට ගංවතුර ගලා යද්දී ඔහු මී ඔයේ ජලකඳ තරණය කරමින් ගොවිතැන් කටයුතුවල යෙදුණු හැටි බිරිය රමණී කියන්නේ තම සැමියා යුතුකම් ඉටු කරන්නට ගත් වෙහෙස සිහිපත් කරමිනි.

වසර හයකට ආසන්න කාලයක් මේ ආකාරයට ජීවන ගමනේ යෙදුණු නවරත්න රමණී යුවළ දරු සිවු දෙනා සමඟ ගමෙන් පියමං කළේ එන හැටියකට මුහුණ දෙන්නටය. ගමන නතරවූයේ දාරළුව පෙදෙසිනි.

ඔහු දිනකර පුවත්පතේ සේවයට එක්වෙමින් මාධ්‍ය ජීවිතයට පිවිසියේය. කලක් එහි සේවය කළ හෙතෙම ලංකාදීපට එක්වූයේය.

එතැනින්ද ගමන නතර වූයේ නැත. සත්දින, මැදපෙරදිග, සටන, ඇස, ලක්දිව, ත්‍රී ශූලය, තරණය, රාජාලියා, යන පුවත්පත්වල සේවය කරන අතරේ 'සත්දින' පුවත්පතේ කර්තෘවරයා ලෙස ද කලක් සේවය කළේය. රාජාලියා පුවත්පතේ නොනිල කතුවරයා වූයේද ඔහුය. උපතින්ම හපන්කම් දැක්වූ කවි කලාව ඉදිරියට ගෙන යමින් කවි පුවත්පතේ කතුවරයා ලෙස කාව්‍යකරණයට ලබාදුන් පිටිවහල ඉමහත්ය.

මේ අතර මේ කැදැල්ලට තවත් සාමාජිකයෙක් එක්වූයේය. මේ දරු පිරිස ගීතිකා සරස්වතී , ගීත් චින්තක , ගීත් ක්‍රිෂ්ණ , ගීතාංජනී සුරංගිකා , තුලසි බණ්ඩාර ලෙස නම් කෙරිනි.

1989 හීෂණ සමයේ සිදුවූ ක්‍රියාදාමයන්ට එරෙහිව ඔහු නිර්භයව පෑන මෙහෙයවූයේය. කලක් තාවකාලික නිවහන්හි ගතකළ

නවරත්නයන් 1992 වනවිට මීරිගම විජය රජදහන සිය ස්ථිර වාසභවනය කරගත්තේය.

ඔහු ඉරිදා පුවත්පතේ සේවය කරන අතර අවස්ථා ගණනාවකදීම යුද පුවත් වාර්තාකරණයට ගියේ යුද බිමේ බිහිසුණු බව අමතක කරමිනි.

තෙවැනි නැගිටීම, වවුල්කැලේ තීන්දුව, වැල්ලේ ලේ මල්, හීෂණයේ දිනපොත, වමේ වේදිකාවේ වෙඩි උණ්ඩය, නවකතා පාඨක ලොවට ඔහු උරුම කළේ තමන්ගෙන් සමාජයට විය යුතු වගකීමක් ඉටු කරන්නටය එක්සත් ජාතීන්ගේ සහන කවි සම්මේලනයේ සභාපතිවරයා ලෙසත් තම්මැන්නා කවි සමාජයේ අනුශාසකවරයා ලෙසත් ඔහු කළ සේවය අපමණය. උපතින්ම ගෙනා කවි හැකියාව ඔප් නංවන්නට පී.බී. අල්විස් පෙරේරා, ඉන්ද්‍රා කුමාරනායක, මිල්ටන් කුමාරනායක, කවිකිවිඳියන්ගෙන් ලත් ආභාසය ඔහු නිතර මෙනෙහි කළේ හදබැතියෙනි.

නවරත්නයන්ගේ කලා හැකියාවන් නිසාම 2019 දී කලාභූෂණ සම්මානයෙන් පිදුම් ලැබීම ඔහුගේ ජීවිතයේ අමරණීය සන්ධිස්ථානයකි. මෑතක් වන තුරුම පුවත්පත් හා බැඳුණු දිවියක් ගතකළ මේ සත්පුරුෂයා කෙටි කලක් නිවහනට වී ගත කළේය. කවිසිතට පණ පෙවූ නවරත්නයෝ ආදරණීය ජනයාගෙන් සමුගෙන ගියේ 10 වැනිදා පස්වරුවේය.

"සරල ජීවන වෘත්තියක් තුළින් ජීවිතය ජයගන්න
නිර්මාණශීලී රැකියාවක් ඔබත් අරඹන්"

හස්ත කර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන සඳහා
ආධුනිකයින් බඳවා ගැනීම - 2021

මැටි, සෙරමික්, වේවැල්, පත් ආශ්‍රිත, දැව කැටයම්, ලාක්ෂා, හණ, බඳින්, බීරළු වෙන්ද, අත් වෙන්ද, කැටින් වෙන්ද, පේෂ කර්මාන්ත, සම් භාණ්ඩ, උණබට, කඩදාසි ආශ්‍රිත, අත් එම්බ්‍රොයිඩරි, සාම්ප්‍රදායික චිත්‍ර, කෘත්‍රිම මල් සැකසීම, තල්කොළ ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් සඳහා පාඨමාලා ආරම්භය

- පුහුණුව, අමුද්‍රව්‍ය, උපකරණ ඇතුළු සියල්ල නොමිලේ
- හෝරා ගැනීමට පාඨමාලා රැසක්
- NVQ පාඨමාලා
- පූර්ණකාලීන හා සති අන්ත පාඨමාලා
- දිවයින පුරා මධ්‍යස්ථාන 75 ක්
- වෙළඳපොල ඉලක්ක කරගත් විශේෂිත නිෂ්පාදන පුහුණුව
- පුහුණුව අවසන් කරන සැමට ස්වයං රැකියා ඇරඹීමට නොමිලේ උපකරණ කට්ටලයක් සමඟ ඔබ පෙන්වීම.
- පාඨමාලා කාලය මාස 06
- පාඨමාලා ආරම්භය 2021 පෙබරවාරි මස 22

අ/අ	දිස්ත්‍රික්කය	හස්ත කර්මාන්ත පුහුණු මධ්‍යස්ථානය	ශිල්ප ක්ෂේත්‍රය
1	ගාල්ල	හබරාදූව	පත්, වැටකේ, ඉඳිකොළ, වේවැල්, උණබට, බීරළු වෙන්ද
2		බෙන්තොට	වැටකේ
3		දළුවැල්ල	පැදුරු හා පැදුරු ආශ්‍රිත භාණ්ඩ
4		සිප්නාරා, ගාල්ල, කොටුව	බීරළු වෙන්ද, පත්, ඉඳිකොළ
5		අම්බලන්ගොඩ	වැටකේ, පත්
6		මිහිඳුපුර	වෙස් මුහුණු
7	මාතර	වේරදූව	බීරළු වෙන්ද හා වැටකේ
8		පහළ අපරැක්ක	බීරළු වෙන්ද, වැටකේ
9		යටියන	මැටි භාණ්ඩ
10	හම්බන්තොට	අඟුල්මිඩුව	ලාක්ෂා භාණ්ඩ
11		නැගෙනහිර මිද්දෙණිය	රටා පැදුරු
12		කාවන්තිස්සපුර	තලකොළ, වේවැල්
13		මුල්කිරිගල	තලකොළ, පත්
14	කුරුණෑගල	කොළඹගම	තලකොළ
15		නාරංකොඩ	තලකොළ
16		නුගවෙල	තලකොළ
17		මිද්දෙපොල	තලකොළ, පත්, වේවැල්
18		මාවී ඇල	පත්, රෙදි
19		රම්බඩගල්ල	ඉරටු, පත්
20		ගල්වංගුව	කඩදාසි පල්ප්
21		යක්විල	මැටි භාණ්ඩ
22		ගනුතරය	තලකොළ / ලාක්ෂා
23		හබරව	තලකොළ
24		වාරියපොල	කෘත්‍රිම මල් / පත් සහ තලකොළ
25		බැද්දේගම	තලකොළ, හණ
26		හල්මිල්ලකොටුව	ගල්ලැහැ පත්, තලකොළ
27	පොළොන්නරුව	සදුරුවෙල	පත් භාණ්ඩ
28		ලංකාපුර	පත් භාණ්ඩ
29		මහමිපිටිය	වේවැල්, පත්
30	අනුරාධපුර	සාලියපුර	කඩදාසි පල්ප්
31		කොච්චියාගම	කඩදාසි පල්ප්
32		සවරන්කුලම	පත් / තල්කොළ / තලකොළ
33	කොළඹ	බත්තරමුල්ල	සාම්ප්‍රදායික පන්සල් චිත්‍ර, බීරළු වෙන්ද, වේවැල්, අත් වෙන්ද, දැව කැටයම්, සම් භාණ්ඩ, පත්
34	කළුතර	මුලන්සිංහල	වේවැල්, පත්, බට
35		සලලුගම	පත් භාණ්ඩ
36		පොතුපිටිය	පත් / වැටකේ
37		ඉත්තෑපාන	පත් භාණ්ඩ
38	ගම්පහ	එරාගොඩ	සෙරමික් භාණ්ඩ
39		සුරිකොටුව	මැටි භාණ්ඩ
40		වීරගුල	මැටි භාණ්ඩ
41		තුණමිල්ල	මැටි භාණ්ඩ
42		සිඩිණිගම	තලකොළ
43		ඉඳිපරපේ	කෘත්‍රිම මල්, තලකොළ, බීරළු වෙන්ද
44		වලව්වත්ත	තලකොළ, වේවැල්, බීරළු වෙන්ද
45		වැලිය	දැව කැටයම්
46		පිනදෙණිය	කෘත්‍රිම මල්, තලකොළ
47		අත්තනගල්ල	බීරළු වෙන්ද
48		දෙල්වල	තලකොළ
49	මහනුවර	පොල්ගොල්ල	පේෂකර්මී, බීරළු වෙන්ද, ලාක්ෂා, හණ, තලකොළ, රෙදිපිළි හා මැලුම්
50		පනාවිගම	මැටි භාණ්ඩ
51		රන්මල්කඩුව	කඩදාසි පල්ප්
52		හේනාවල	හණ භාණ්ඩ
53	ගුවරළිය	දෙගිලේ	හණ භාණ්ඩ
54		තිල්දණ්ඩාහින්න	හණ භාණ්ඩ
55	මාතලේ	වැහිගල	තලකොළ භාණ්ඩ
56		හපුවිද	ලාක්ෂා භාණ්ඩ
57	මොණරාගල	නන්ඉපුරාව	වේවැල්, බට, තලකොළ
58	කෑගල්ල	මොලගොඩ	මැටි, සම් භාණ්ඩ, හණ
59		අඹේපුස්ස	තලකොළ, මැටි භාණ්ඩ
60		බදුළුපිටිය	හණ භාණ්ඩ
61	රත්නපුර	කුරුවිට	උණබට හා වේවැල්
62		හිරණ්ඩගම	පොල්කටු භාණ්ඩ
63		විසිලිය	හණ භාණ්ඩ
64	මඩකලපුව	පුදුකුඩිඉරුප්පු	මැටි භාණ්ඩ
65		පේතාලෙ	මැටි භාණ්ඩ
66		මීරාන්කාර්නි	පැදුරු, තල්කොළ
67		මයිලම්පාවලි	පැදුරු, තල්කොළ
68		රාජපුරම්	පැදුරු ආශ්‍රිත
69	ත්‍රිකුණාමලය	ගෝමරන්කඩවල	පැදුරුආශ්‍රිත
70	යාපනය	නිරවේලි	තල්කොළ භාණ්ඩ
71	බදුල්ල	සම්මානන්තාඩ	තැටින් වෙන්ද හා අත් වෙන්ද
72	අම්පාර	දෙහිඅත්තකණ්ඩිය	රෙදි පින්තාරු / සාම්ප්‍රදායික චිත්‍ර
73	පුත්තලම	රාල්මිඩුව	වේවැල් භාණ්ඩ
74		මාරවිල	අත් වෙන්ද

අයදුම්පත් හා වැඩිදුර තොරතුරු සඳහා

දකුණු පළාත	- 091-2226758	මධ්‍යම පළාත	- 081-2494646
බස්නාහිර පළාත	- 011-2906966	සබරගමුව පළාත	- 035-2228788
ඌව පළාත	- 074-0738956	වයඹ පළාත	- 037-2267703
නැගෙනහිර පළාත	- 077-2145325	උතුරු පළාත	- 077-6034349

ජාතික ශිල්ප සභාව
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
ශිල්පීය පුහුණු අංශය, රෝහිණා මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
දුරකථන : 011-2787604 ෆැක්ස් : 011-2177336 Facebook : National Crafts Council

කොමිෂන් සභාවලට ඇයි මෙච්චර බය!

"කැලෑ උසාවිවලින් අපිව නවත්තන්න බැහැ." යනුවෙන් ජාතික ජන බලවේගය නායක, ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මෙසේ ප්‍රකාශ කළේ පසුගිය 02 වැනිදා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවති සම්මන්ත්‍රණයකදීය. "ජනාධිපතිගේ කැකිල්ලේ කොමිසම මොකද කළේ?" යනුවෙන් මෙම සම්මන්ත්‍රණය සංවිධානය කර තිබුණේ ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා ජනතා ව්‍යාපාරය නැමැති සංවිධානයකි. අනුර දිසානායක මෙහිදී ප්‍රකාශ කරන්නේ ඔහුගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමට වර්තමාන ආණ්ඩුව කටයුතු කරමින් සිටින බවයි.

"අපි වංචා දූෂණ කළා කියලා නඩු දාන්න නොහැකි නිසා ගෝඨාභය, මහින්ද, බැසිල් ඇතුළු පිරිස ඊනියා කොමිෂන් අටවාගෙන මර්දනයට සූදානම් වෙනවා. ඊට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදී අරගලය වෙනුවෙන් ජනතාව සමඟ එකතු වෙනවා." යනුවෙන් අනුර කුමාර දිසානායක ප්‍රකාශ කරයි.

එතකින් නොනැවතී අනුර කුමාර දිසානායක තවදුරටත් චෝදනා කරනු ලබන්නේ මෙසේය.

"මීට අවුරුද්දකට විතර කලින් ආණ්ඩුව නියෝජනය කරන පක්ෂ නායකයන්ගේ රැස්වීමකදී බැසිල් රාජපක්ෂ විශේෂ ප්‍රකාශයක් කරමින් අධිකරණ ක්‍රියාවලිය හරහා මේ අයව කොටු කරගන්න දරන ප්‍රයත්නය නිෂ්ඵලයි. ඒ නිසා අධිකරණයෙන් එළියේ ක්‍රියාදාමයක් ආරම්භ කරන්න ඕන." යැයි පවසා තිබෙනවා.

"එවැනි කැලෑ උසාවිවලින් අපේ ක්‍රියාකාරීත්වය නතර කළ නොහැකියි" යනුවෙන් අනුර කුමාර දිසානායක ප්‍රකාශ කරයි.

අනුරගේ කැලෑ උසාවි කතාවලට හොඳම පිළිතුරු ලබා දෙන්නේ ඔහු නියෝජනය කරන ජනතා විමුක්ති පෙරමුණේම හිටපු ප්‍රධානීන්ය.

කැලෑ නීතිය මුල්වරට මෙරටට හඳුන්වා දුන්නේ ජනතා විමුක්ති පෙරමුණ සහ ඔවුන්ගේ තවත් සංවිධානයක් වන දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය බව රහසක් නොවේ.

1986 වසරේ සිට 1990වසර දක්වා ක්‍රියාත්මක වුණු ජනතා විමුක්ති පෙරමුණේ දෙවැනි කැරැල්ලේදී ක්‍රියාත්මක වුණු කැලෑ උසාවිය සමහරුන්ට අද අමතක වුවද ජනතා විමුක්ති පෙරමුණේ වර්තමාන නායක අනුර කුමාර දිසානායක විසින් එම කැලෑ උසාවිය සහ එමගින් ක්‍රියාත්මක වුණු කැලෑ නීතිය යළි ආවර්ජනය කිරීමට අවශ්‍ය වාතාවරණය සකසමින් සිටී.

එවකට පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කැරැල්ල මර්දනය කිරීමට දරුණු පියවර ගත් අතර ඊට සමගාමීවම ජනතා විමුක්ති පෙරමුණෙන් ද කැලෑ උසාවිය හා කැලෑ නීතිය ක්‍රියාත්මක කළ බව රහසක් නොවේ. තුණ්ඩු කැබැල්ලෙන් කඩවල් වැසීමේ සිට එය ක්‍රියාත්මක නොකරන පිරිස් ඝාතනය කිරීම දක්වා කැලෑ උසාවි වලින් ඝාතන සංස්කෘතියක් ඇති වූ බව බොහෝ දෙනෙකු දන්නා කාරණයකි.

ජනතා විමුක්ති පෙරමුණේ මෙම කැලෑ උසාවි සහ කැලෑ නීතිය හමුවේ රටේ බුද්ධිමතුන්, විවිධ ක්ෂේත්‍රවල කලාකරුවන් පමණක් නොව මහා සංඝරත්නය සහ හමුදාව, පොලිසිය ඇතුළු ආරක්ෂක අංශ සාමාජිකයන් ද ඝාතනයට ලක්විය.

කොළඹ සරසවියේ උප කුලපති මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර, මොරටුව සරසවියේ උපකුලපති මහාචාර්ය චන්ද්‍රරත්න පටුවනවිතාන ඝාතනය කරන ලද්දේ ජනතා විමුක්ති පෙරමුණ විසිනි.

රටක් වසඟයට පත්කළ සිංහල සිනමාවේ ජනප්‍රියම නළුවා ලෙස සැලකෙන ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායක විජය කුමාරතුංග කැරලිකරුවන් විසින් වෙඩි තබා ඝාතනය කොට මේ මස 16 වැනිදාට හරියටම වසර 33 කි. ජනප්‍රියතම රූපවාහිනී හා ගුවන්විදුලි නිවේදක ප්‍රේමකීර්ති ද අල්විස් කැරලිකරුවන් විසින් ඝාතනය කොට වසර 32 ක් පමණ ගත වේ.

විචිත්‍ර ධර්ම දේශකයාණන් වහන්සේ නමක් වූ පූජ්‍ය කොටිකාවත්තේ සද්ධාතිස්ස හිමියන් ද කුරිරු ලෙස ඝාතනය කළේ ජනතා විමුක්ති පෙරමුණය. ජනතා විමුක්ති පෙරමුණෙන් වෙඩි තබා යම් පුද්ගලයකු ඝාතනය කළ හොත් එම පුද්ගලයාගේ අවසන් කටයුතු සිදුකිරීමට නියෝග ලබා දුන්නේ ජනතා විමුක්ති පෙරමුණේ කැලෑ උසාවියේ නියෝගවලට අනුවයි.

ඝාතනය කරන ලද පුද්ගලයාගේ දේහය අවසන් කටයුතු සිදුකිරීම සඳහා ගෙනයන විට එය දණහිසෙන් පහළට සිටින සේ දේහය තැන්පත් මිනීපෙට්ටිය ගෙන යන අය ඔසවාගෙන යා යුතුයි.

නැතහොත් එතැන සිටින ඔත්තුකරුවකුගේ තොරතුරකට ජනතා විමුක්ති පෙරමුණේ කැලෑ උසාවිය යළි ක්‍රියාත්මක වී දේහය දණහිස්වලින් ඉහළට ඔසවාගෙන යන පුද්ගලයාටත් අවසන් ගමන් යෑමට වැඩකටයුතු සලස්වයි. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක කැලෑ උසාවි ගැන මතක් කළ විට ජනතා විමුක්ති පෙරමුණේ දෙවැනි කැරැල්ලේදී ක්‍රියාත්මක කැලෑ උසාවිවල නීතිය ගැන නිතැතින්ම මතකයට නැගේ.

දියයට ඔබාගෙන සිටින බෝලයක් යළි මතුවන සේ එම කැලෑ උසාවිවල කතා අනුර කුමාරගේ කැලෑ උසාවි කතාවත් සමඟ යළි කරළියට පැමිණ තිබේ.

2015 ජනවාරි මස 08 වැනිදා බලයට පත්වුණු යහපාලන ආණ්ඩුව ක්‍රියාත්මක කළේ නිවැරදි නීතියද? කැලෑ නීතිය ද කියා විමසිය යුත්තේ අනුර කුමාර දිසානායකගෙන්මයි.

හේතුව යහපාලන ආණ්ඩුව බලයට ගෙන ඒම සඳහා විශාල දායකත්වයක් ලබා දුන් කොටස්කරුවකු වූයේ ජනතා විමුක්ති පෙරමුණයි.

2015 ජනවාරි 08 වැනිදා පැවති ජනාධිපතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ සෑම ක්‍රියාමාර්ගයක්ම ගත්තේ මහින්ද රාජපක්ෂ පරාජය කොට මෛත්‍රීපාල සිරිසේන දිනවීම සඳහාය.

ඒ අනුව යහපාලන ආණ්ඩුව කෙතරම් පිස්සු නැටුව ද එය ආරක්ෂා කරගැනීමේ යම් යම් උපක්‍රමශීලී පිළිවෙත් ජනතා විමුක්ති පෙරමුණ විසින් දියත් කළ බව නොරහසකි.

දූෂණ විරෝධී කමිටුව සහ ජාතික විධායක සභාවේ සැලකිය යුතු බලයක් ගෙන රාජපක්ෂ ආණ්ඩුවේ සිටිය කවුරුන්ගෙන් කවුරුන්ද සිරගත කරන්නේ යන්න තීරණය කිරීමේ ක්‍රියාවලියේදී අනුර කුමාර දිසානායක ප්‍රමුඛ ජනතා විමුක්ති පෙරමුණට විශාල වගකීමක් පැවරී තිබිණ.

අනුර කුමාර දිසානායක කැලෑ උසාවි කියමින් ජනාධිපති විමර්ශන කොමිසමට චෝදනා කරන විට යහපාලන ආණ්ඩුවේ එවකට අධිකරණ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි ලබාදෙමින් ප්‍රකාශ කළේ කුමක්ද?

"යහපාලන ආණ්ඩුව කැලෑ නීතිය භාවිත කර දේශපාලන දඩයමේ ගියා." යනුවෙන් විජයදාස රාජපක්ෂ ජනාධිපති කොමිෂන් සභාව හමුවේ සාක්ෂි ලබාදෙමින් ප්‍රකාශ කළේ 2020 වසරේ ජූලි මස 29 වැනිදාය.

"මේ දූෂණ කමිටුව පිහිටවූයේ දූෂණ වළක්වන්න. හැබැයි ඒකට අරමුණ වූයේ රාජපක්ෂ පවුල සිරගත කිරීමටයි. ඊට අමතරව රාජපක්ෂ සහායකයන් සිරගත කරවීමත් අරමුණක් වුණා. මේ කමිටුවල සාමාජිකත්වය ජවිපෙට ලබාදී තිබුණා. කමිටු ක්‍රියාත්මක වන්නේ මැතිවරණයට පෙර අනුර කුමාරගේ සහාය මැතිවරණයේදී ගන්න අවශ්‍ය නිසා. ඔවුන්ට දීපු බලාපොරොත්තුවක් කියලා මට පැහැදිලියි. එහෙම නැත්නම් ආණ්ඩුවේ මීට වඩා ජ්‍යෙෂ්ඨයන් සිටියා." යනුවෙන් විජයදාස රාජපක්ෂ සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කළේය.

ජාතික විධායක සභාවේ සහ දූෂණ විරෝධී කමිටුවේ වැඩි බලයක් අනුර කුමාර දිසානායක ඇතුළු ජනතා විමුක්ති පෙරමුණට ලබාදී තිබෙන්නේ යහපාලන ආණ්ඩුවේ තවත් ජ්‍යෙෂ්ඨයන් සිටියදී බව විජයදාස රාජපක්ෂ විසින් පෙන්වා දෙයි.

"එම කමිටු රැස්වීම් දෙකකට මං ගියා. එක් අවස්ථාවක කියවුණා, ඇවන්ගාඩ් සිද්ධිය පාදක කර ගෝඨාභය අත්අඩංගුවට ගැනීම ස්වර්ණමය අවස්ථාවක් කිව්වා. එම අවස්ථාව මඟහරින්න එපා එම අවස්ථාවේදී මං කලින් පැවසූ පරිදි නීතිඥවරයකු ලෙස සැබෑම තත්ත්වය පැහැදිලි කර අධිකරණ ඇමැති ලෙස එකඟ වෙන්නේ නැහැ කිව්වා.

2016 ජනවාරි 29 වැනි දින ජනාධිපතිතුමා සමඟ සාකච්ඡාවක් තිබුණා. එහිදී ජාතික විධායක සභාවේ සාමාජිකයන් විසින් පොලිස් නිලධාරීන්ගෙන් දිගින් දිගටම ප්‍රශ්න කළා. එහිදී කිව්වා, නිදහස් දිනයට පෙර යෝෂිත අත්අඩංගුවට ගන්න කියලා. පසුව මං මාධ්‍යයෙන් දැක්කා යෝෂිත අත්අඩංගුවට ගෙන තිබෙනවා."

විජයදාස රාජපක්ෂ කියන ආකාරයට ජාතික විධායක සභාවෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල නිලධාරීන්ට යම් යම් ඉලක්ක ලබාදී කෙතරම් බලපෑමක් සිදු කරන්න ඇද්ද යන්න තේරුම් ගැනීම එතරම් අපහසුවක් නොවේ.

එපමණක් නොවේ, අල්ලස් කොමිසමේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරිය දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ ප්‍රකාශ කළේ තමන්ට ද විශාල වශයෙන් යම් යම් දේශපාලන බලපෑම් එල්ල වූ බවයි.

විශේෂයෙන්ම ඇවන්ගාඩ් ආයතනයේ සභාපති නිශ්ශංක සේනාධිපති සමඟ දුරකතනයෙන් පැවැත්වූ සාකච්ඡාවක දී මෙම බලපෑම් පිළිබඳව යම් යම් තොරතුරු හෙළි විය.

නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් සුහද ගමලත් ද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ නීතිපති දෙපාර්තමේන්තුවට ද දැඩි දේශපාලන බලපෑම එල්ල වූ බවයි.

තමන් අරලියගහ මන්දිරයට ගෙනවිත් ජාතික විධායක සභාවේ සාමාජිකයන් නීතිපති දෙපාර්තමේන්තුවට, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට(FCID) එකට බලපෑම් කළ බවත් සුහද ගමලත් විසින් පෙන්වා දෙන ලදී.

FCID භාරව සිටි ප්‍රධානී නියෝජ්‍ය පොලිස්පති රවි වෛද්‍යාලංකාර ද ප්‍රකාශ කළේ FCID ආයතනයට දැඩි ලෙස දේශපාලන බලපෑම් සිදුකළ බවයි.

දැනට සිර ගතවී සිටින රන්ජන් රාමනායකගේ හඬපටවලින් තවදුරටත් සිදුකරන ලද දේශපාලන බලපෑම් සහ නීතිය නැවුණු හැටි ඉතා හොඳින් පැහැදිලි වේ.

රහස් පොලිසියේ ප්‍රධානියකු වූ ශානි අබේසේකරට ඇතැම් විමර්ශන සම්බන්ධයෙන් ලබාදුන් දුරකථන ඇමතුම්වලින් යහපාලන ආණ්ඩුව කාලයේ දී කෙතරම් බලපෑමක් නීතිය ක්‍රියාත්මක කළ ආයතනවලට සිදු වුණාද කියා තේරුම් ගැනීමට අපහසු නොවනු ඇත. "අනේ ශානි... වැඩේ නියමෙට යනවා. නාමල් කවද්ද ඇතුළට යන්නේ. යෝෂිත ඇතුළට ගන්නේ කවද්ද? වැඩේ හොඳට කරගෙන යන්න. අපිට මේ දෙන ආතල් එක නම් කඩන්න දෙන්න එපා." යනුවෙන් රන්ජන් රාමනායක කරන ලද බලපෑම් ඔහුගේම හඬපට හරහා සමාජගත වී ඇත.

ජාතික විධායක සභාවට නීත්‍යානුකූල බලයක් නැති බවත් එය ආණ්ඩු ක්‍රියාවලියකුත් නොවන බවත් ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක ජනාධිපති විමර්ශන කොමිසම හමුවේ සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කළේය.

"දූෂණ විරෝධී කමිටුව" පිහිටුවීම සඳහා අනුමැතිය දුන්නේ යැයි හිටපු අගමැති රනිල් වික්‍රමසිංහයන් පවසන "ජාතික විධායක සභාව" ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නීත්‍යානුකූල බලයක් ඇති ආයතනයක් නොවන බව අනුර කුමාර දිසානායක ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි ලබාදෙමින් කියා සිටියේය.

රටේ වංචා දූෂණ සෙවීමට එක්රැස්වූ දේශපාලන කණ්ඩායම් රාශියක් ජාතික විධායක සභාව සමන්විත වූ බවත් දූෂණ වංචා සෙවීමට එක්රැස් වූ දේශපාලන සන්ධානයකට පැමිණි මැති ඇමතිවරුන් රජයේ දේපළ භාවිතා කරමින් දූෂණ සෙවීමේ කාර්යයේ නිරත වූ නිසා එම සභාවෙන් 2015 ජනවාරි මැයි 10වැනිදා ඉවත් වූ බවත් අනුර කුමාර දිසානායක ප්‍රකාශ කරයි.

මෙහිදී ඉතා බරපතළ කාරණා කිහිපයක් මතු වේ.

ජාතික විධායක සභාව නීත්‍යානුකූල පිහිටුවන ලද ආයතනයක් නොවන බව අනුර කුමාර දිසානායක පිළිගෙන ඇත.

එසේ නම් නීති විරෝධී ආයතනයක් හරහා මෙරට නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම අනුර කුමාර දිසානායකම පවසන ආකාරයට කැලෑ උසාවියක් හෝ කැලෑ නීතියක් නොවන්නේ ද?

එසේ කැලෑ නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ අනුර කුමාර දිසානායක මෙම ජනාධිපති කොමිසමට කැකිල්ලේ කොමිසම යනුවෙන් හඳුන්වන්නේ කෙසේද? එසේ හැඳින්වීමට අනුර කුමාර දිසානායකට තිබෙන සදාචාරාත්මක අයිතිය කුමක්ද?

තමන් කැලෑ උසාවි හරහා කැලෑ නීතිය ක්‍රියාත්මක කිරීමට දායක වෙමින් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා නීත්‍යානුකූලව පිහිටුවා ගන්නා ලද ජනාධිපති විමර්ශන කොමිසමට ජනාධිපතිගේ කැකිල්ලේ කොමිසම යනුවෙන් අපහාස කිරීම කෙතරම් යුක්ති සහගත ද? එපමණක් නොව ජනාධිපති විමර්ශන කොමිසමට කැඳවූ අවස්ථාවේදී එහි පැමිණීමට එතරම් කැමැත්තක් නොදැක්වූ අනුර කුමාර දිසානායක ජනාධිපති විමර්ශන කොමිසම් සභාවේ නීත්‍යානුකූලභාවය ගැන ද යම් යම් ප්‍රශ්න කිරීම් ද සිදුකළ බව රහසක් නොවේ. යහපාලන ආණ්ඩුව යටතේ නීති විරෝධී ආයතන පිහිටුවාගෙන අරලියගහ මන්දිරයට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් කැඳවා නීතිය නැවීමට බලපෑම් කරමින් ක්‍රියාකළ අනුර කුමාර දිසානායක ජනාධිපති කොමිසමට කැකිල්ලේ කොමිසම වශයෙන් චෝදනා කිරීම පදනම් විරහිත බව ඔනෑම පුද්ගලයෙකුට වැටහෙන සරල කාරණයකි.

යහපාලන ආණ්ඩුවේ කැකිල්ලේ තීන්දු ගැන විමර්ශනය කර ඊට අදාළව නීතිමය ක්‍රියාමාර්ග නිසි ලෙස ගැනීමට සැරසෙන විට කැකිල්ලේ කොමිසම කියමින් එම ජනාධිපති විමර්ශන කොමිසමට අපහාස කරමින් අනුර කුමාර දිසානායක, සරත් ෆොන්සේකා වැනි යහපාලන ආණ්ඩුවේ නායකයන් හැසිරෙන්නේ එම ජනාධිපති කොමිෂන් සභාවට තිබෙන බිය නිසා ද?

දේශපාලන වේදිකාවේ දී සිංහනාද කරන අනුර කුමාර දිසානායක, සරත් ෆොන්සේකා ජනාධිපති කොමිසමට මෙතරම් බියක් දක්වන්නේ ඇයි?

කෙතරම් බියක් දක්වන්නේදැයි කිවහොත් කැකිල්ලේ කොමිසම යනුවෙන් සම්මන්ත්‍රණ පැවැත්වීමට අනුර කුමාර දිසානායක කටයුතු කරන්නේ කැලෑ උසාවියට වඩා නීතිගරුක උසාවියට තිබෙන බිය නිසා ද? යන සැකය මතුවේ.

"දූෂිතයන්ට දඬුවම් ලබාදීම සඳහා ජාතික විධායක සභාවට දේශපාලන පක්ෂ සම්බන්ධ වුණා." යනුවෙන්ද අනුර කුමාර දිසානායක ප්‍රකාශ කරයි.

දූෂිතයන් සිටිනවා නම් ඔවුන්ට එරෙහිව දඬුවම් කිරීම සඳහා රටකට නීතියක් ඇත. එම නීතියට අනුව ක්‍රියා නොකර නීති විරෝධී ආකාරයෙන් මෙසේ ක්‍රියා කරන්නේ ඇයි?

නීත්‍යානුකූලව කටයුතු කරන විට අසත්‍ය චෝදනා ගොනු කර විමර්ශනය කළ නොහැකි අතර නීත්‍යානුකූලව නොවන ආකාරයට කටයුතු කරන විට ඕනෑම ආකාරයකට නීතිය නැවිය හැකි බව මේ වන විට යහපාලන ආණ්ඩුව විසින් ඔප්පු කර තිබේ.

එසේ නීත්‍යානුකූලව කටයුතු කළා නම් යහපාලන ආණ්ඩුවට අවශ්‍ය දිනවලට පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට හෝ සිරගත කිරීමට නොහැකි වනු ඇත.

උදාහරණයක් ලෙස නිදහස් දිනයට පෙර යෝෂිත රාජපක්ෂ සිරගත කිරීමට නොහැකි වනු ඇත.

නාමල්, යෝෂිත මාස 03 ක් බන්ධනාගාරගත කිරීමට නොහැකි වනු ඇත.

බැසිල් රාජපක්ෂ, විමල් වීරවංශ, උදය ගම්මන්පිල, මහින්දානන්ද අලුත්ගමගේ, ජොන්ස්ටන් ප්‍රනාන්දු, ජයන්ත සමරවීර ඇතුළු ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 16 කට ආසන්න පිරිසක් බන්ධනාගාර ගතකිරීමට නොහැකි වනු ඇත.

රන්ජන් රාමනායකලාට දිගින් දිගටම ආතල් දීමට ද නොහැකි වනු ඇත.

නීතියෙන් ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි නිසා නීත්‍යානුකූල නොවන ආකාරයට ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් දූෂණ විරෝධී කමිටුව, ජාතික විධායක සභාව, FCID වැනි ආයතන පිහිටුවීමට එවකට පැවති යහපාලන ආණ්ඩුව කටයුතු කර තිබුණි.

FCID ආයතනය හරහා බොහෝ දේශපාලන පළිගැනීම් සිදු කළත් එම ආයතනයේ නීති විරෝධී ආයතනයක් බව මේ වනවිට සාක්ෂි සහිතව ජනාධිපති විමර්ශන කොමිසමේ දී හෙළි වී තිබේ.

එවැනි නීතිවිරෝධී ආයතන හරහා කැලෑ නීතිය ක්‍රියාත්මක කිරීමට දායක වූ අනුර කුමාරලා, සරත් ෆොන්සේකලා ජනාධිපති කොමිසමට කැකිල්ලේ කොමිසම කියමින් තවදුරටත් අපහසු කරන්නේ රෙදි ඇඳගෙනද? කියා සාධාරණ ප්‍රශ්නයක් මේ වන විට සමාජය හමුවේ පැන නැගී තිබේ.

මේ අතර දේශපාලන පළිගැනීම් පමණක් නොව යහපාලන රජය සමයේ රාජ්‍ය සේවය විනාශ කිරීමට ද දූෂණ විරෝධී කමිටුව මුල් වූ බව ආර්ථික පුනර්ජීවන හා දිළිඳුකම නැති කිරීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ සම ලේකම් ඩී.එස්. ජයවීර දේශපාලන පළිගැනීම් ගැන සොයා බලන ජනාධිපති විමර්ශන කොමිසම හමුවේ සාක්ෂි ලබාදෙමින් පැවසීය.

මෙරට රාජ්‍ය අංශය පමණක් නොව දේශීය ව්‍යාපාරිකයන්ට, ඉදිකිරීම් සමාගම්වලට මෙන්ම රාජ්‍ය නිලධාරීන් රැසකට මෙම නීති විරෝධී FCID ආයතනයට යාමට සිදුවිය.

රාජ්‍ය නිලධාරීන් විශාල පිරිසක් දැඩි මානසික පීඩනයකට ලක්වූ අතර දේශපාලනඥයන්ට අමතරව 3,000කට අධික රාජ්‍ය නිලධාරීන් ඇතුළු පිරිසක් FCID නීති විරෝධී ආයතනයට ගෙන්වා දැඩි ලෙස බලපෑම් සිදු කරන ලදී.

මෙවැනි නීති විරෝධී ආයතන හරහා ඇතැම් පාර්ශ්වවලට අවශ්‍ය වී තිබුණේ රට අරාජිකත්වයට පත්කිරීමට ද මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ කාලයේ දී බරපතළ වංචා දූෂණ සෙවීමට ජනාධිපති කොමිෂන් සභාවක් පත් කළ අතර එම වාර්තාව ඉතා ඉහළින් ම වර්ණනා කරමින් පිළිගැනීමට ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කර තිබණි.

එම වාර්තාව ඉහළින්ම වර්ණනා කළ ජනතා විමුක්ති පෙරමුණ දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවට මෙතරම් බියක් දක්වන්නේ ඇයි?

දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව ගැන ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායකගෙන් පසුව වැඩියෙන්ම කතා කරන්නේ සමගි ජන බලවේගයේ සභාපති ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකායි.

ජනාධිපති කොමිෂන් සභා වාර්තාව විවේචනය කරමින් ඔහු චෝදනා එල්ල කරන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාටයි.

විවෘතව යුද පිටියේ ගෝඨාභය අනාරක්ෂිතව ගියා මෙන් දේශපාලනයේදී ද ඔහු අනාරක්ෂිතව ගමන් කරමින් සිටින බව සරත් ෆොන්සේකා ප්‍රකාශ කරන්නේ දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ ඔහුගේ ද නම තිබෙන බැවිණි.

තමන් නිර්දෝෂී නම් අනුර කුමාරලා, සරත් ෆොන්සේකලා ජනාධිපති කොමිසමට මෙතරම් බියක් දක්වන්නේ ඇයි?

සියලු සර්ප විෂ මඩින එකම එන්නත ලංකාවෙන්

● හර්ෂා සුගතදාස

රුක්මණි දේවිය රඟපෑ චිත්‍රපටයක නයකු දෂ්ට කිරීමෙන් ඈ මිය ගොස් භූමිදානය කළ පසුව, ඇගේ ස්වර්ණාභරණ ගැනීමට පුතුන් වළ හාරන විට ඈ නැඟිට එන ආකාරය තවමත් මසිතෙහි නිදන්ගත වී තිබෙන්නේ එදා කුඩා දැරියකව සිටි මා තුළ හට ගත් භීතිය හා විස්මය නිසාය. රුක්අත්තන ලීයෙන් තැනූ පෙට්ටියක මෘතදේහය තැන්පත් කළ විට සර්ප විෂ ඊට උරා ගැනීම නිසා ඇය ප්‍රකෘති තත්ත්වයට පත් වූ බව එදා මට කියා දුන්නේ මගේ පියා ය. සැලෝලයිඩ් පටවල සර්ප දෂ්ටනයෙන් මිය ගිය අය පියවි සිහිය ලැබුවද සැබෑ ලෝකයේ නම් එවැනි සිදුවීම් දක්නට ලැබෙන්නේ නැත. ඒ වෙනුවට අසන්නට ලැබෙන්නේ සර්ප දෂ්ටනයෙන් මිය යන අවස්ථා ය.

ලංකාවේ සර්ප දෂ්ටනයෙන් වසරකට මිය යන සංඛ්‍යාව 100ක් පමණ වේ. ලංකාවේ සර්ප විශේෂ 105ක් පමණ සිටියද සෑම සර්පයකුම දෂ්ට කළ පමණින් මිය යන්නේ නැත. මෙම සර්ප විශේෂ උග්‍ර විෂ, සුළු විෂ සහ නිර්විෂ යනුවෙන් හඳුනා ගෙන ඇත. නාගයා, තිත් පොළඟා, පොළොන් තෙළිස්සා, තෙල් කරවලා, මාපිලා, මූදු කරවලා උග්‍ර විෂ සහිත සර්ප විශේෂ ලෙස සැලකේ.

"ඇත්තටම සර්ප විෂ කියන්නේ එන්සයිම මිශ්‍රණයක්. ගොදුරු ගිලපු අවස්ථාව, කෝපයෙන් ඉන්න අවස්ථාව ආදි වශයෙන් සර්පයා සිටින අවස්ථාව අනුව විෂ වෙනස් වෙන්න පුළුවන්. ඉස්සර නම් ලංකාවේ සර්ප දෂ්ටනය වාර්තා වුණේ කුඹුරු ආශ්‍රිතව. ඒත් දැන් කුඹුරුවල ගොයම් කපන්නත් යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කරන නිසා සර්ප දෂ්ටන අවස්ථා වෙනස් මුහුණුවරක් ගෙන තිබෙනවා. අද සර්ප දෂ්ටනය සිද්ධ වෙන්නේ මනුෂ්‍යයා සහ පරිසරය අතර ඇති ගැටුම නිසා." යනුවෙන් පැවසුවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න ය. ඔහු ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ සර්ප දෂ්ටන කොමිසමේ සම සභාපතිවරයා වෙයි.

බටහිර වෛද්‍ය ක්‍රමයට අනුව සර්ප දෂ්ටනයකදී සිදු කෙරෙන ප්‍රතිකාරය වන්නේ සර්ප විෂ ලබා ගෙන සකස් කර ගත් ප්‍රතිවිෂ එන්නත් කිරීමය. මෙම එන්නත් දැනට ගෙන්වනු ලබන්නේ ඉන්දියාවෙනි.

"ප්‍රතිවිෂ එන්නත් පිටරටින් ගෙන්වන විට අපට සංකීර්ණ ගැටලු මතු වෙනවා. මොකද ඉන්දියාව එන්නත් නිෂ්පාදනය කරන්නේ ඒ රටේ සර්පයන්ගේ විෂ අරං. ඒවා ලංකාවේදී වෙනස් වෙන්න පුළුවන්. උදාහරණයක් හැටියට ලංකාවේ මූදු කරවලා හිටියාට ඉන්දියාවේ නැහැ. ඒ වගේ අවස්ථාවලදි අපි සතා හඳුනාගෙන ඒ සතාගේ ප්‍රමාණයට අනුමාන කරන විෂ අනුව එන්නත් ලබා දෙනවා.

මහාචාර්ය එස්. ඒ. එම්. කුලරත්න

මහාචාර්ය ජයන්ත රාජපක්ෂ

ඒත් ගැටලු මතු වෙනවා. ඒ නිසා තමයි ලංකාවට ගැළපෙන එන්නත් නිෂ්පාදනයක් ගැන අපි හිතුවේ." යනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයන්ත රාජපක්ෂ පැහැදිලි කළේය.

මෙම එන්නත ලබා දීමේදී සර්පයා හඳුනාගැනීමට අවශ්‍ය නැහැ

මීට අවුරුදු තුනකට පමණ පෙර මේ සම්බන්ධයෙන් විදේශ රටවල්වල පැවැත්වූ වැඩමුළු, සාකච්ඡාවලට සහභාගි වීමෙන් ලබා ගත් දැනුම ද ඔහුට මෙහිදී ප්‍රයෝජනවත් විය. මහාචාර්ය ජයන්ත රාජපක්ෂගේ ප්‍රතිවිෂ එන්නත් නිෂ්පාදනය කිරීමේ පර්යේෂණයට මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න සහ ජ්‍යෙෂ්ඨ සර්ප විශේෂඥ ඇන්සලම් ද සිල්වා යන අය ද දායක වූහ.

සර්පයන් සමඟ කටයුතු කිරීමේදී වනජීවී දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍ය බැවින් ප්‍රථමයෙන් එය ලබා ගැනිණි. ඉන්පසුව විවිධ ප්‍රදේශවලින් අල්ලා ගත් සර්පයන්ගේ විෂ විධිමත් ක්‍රමවේදයකට ලබා ගනු ලැබීය. ඒවායේ අන්තර්ගත විෂ ප්‍රමාණයන් මැනීමෙන් අනතුරුව අධි ශීතකරණයක විෂ තැන්පත් කර පවුඩර් බවට පත් කර ගෙන තිබේ. මේ සඳහා ඉන්දියාවේ රසායනාගාරයක සහයෝගය ලැබුණු බව ද සඳහන් කළ යුතුය.

"සර්ප විෂ හොඳින් දරා ගත හැකි සත්වයකු තමයි අශ්වයා. ඒ නිසා අපි අපේ පර්යේෂණයට අශ්වයන්ව තෝරා ගත්තා. මෙහිදී මාස 9ක් විතර මයික්‍රෝග්‍රෑම් ප්‍රමාණයේ සර්ප විෂ නිශ්චිත ක්‍රමවේදයකට අශ්වයන්ට එන්නත් කළා.

අශ්වයන් තුළ ප්‍රතිදේහ නිෂ්පාදනය වූ පසුව පර්යේෂණ කරමින් නියමිත කාල වකවානුවේදී අශ්වයන්ගේ රුධිරය ලබාගෙන එහි ප්ලාස්මාව (ප්‍රෝටීන්) විතරක් වෙන් කරගෙන අශ්වයාගෙන් ලබා ගත් රුධිරය පිරිසිදු කර නැවතත් අශ්වයන්ට දුන්නා. සර්ප විෂට එරෙහිව අශ්වයාගේ ශරීරයේ නිපදවා තිබුණු ප්‍රතිදේහ රුධිර ප්ලාස්මාවෙන් වෙන් කර ගත්තා. ඊටපස්සේ සාවුන් මීයන් යොදාගෙන අශ්වයන්ගෙන් ගත්ත ප්‍රතිදේහ එන්නත් කර නැවත ලබා දී සාර්ථකත්වය නිරීක්ෂණය කළා. මේ විදිහට අපි දිගින් දිගටම පර්යේෂණ කරලා තමයි සර්ප ප්‍රති විෂ එන්නත් නිෂ්පාදනය සාර්ථක කර ගත්තේ." යනුවෙන් විස්තර කළේ මහාචාර්ය ජයන්ත රාජපක්ෂ ය.

ලංකාවේ නිෂ්පාදනය කිරීමෙන් විදේශ විනිමය ඉතිරි කර ගන්න පුළුවන්

මෙම ප්‍රතිවිෂ එන්නතේ ඇති විශේෂත්වය වන්නේ සර්පයා කවරකු වුවද මෙය ලබා දීමට හැකි වීමයි. මෙතෙක් ප්‍රතිවිෂ එන්නත් ලබා දීමේදී සර්පයා අනුමාන වශයෙන් හෝ හඳුනාගැනීම වැදගත් විය. එහෙත් මෙම එන්නත නිෂ්පාදනය කර තිබෙන්නේ ලංකාවට ආවේණික සර්ප විෂ එකතුවකිනි. එබැවින් මෙයින් ඇති විය හැකි සංකූලතා ඉතා අල්ප බව මහාචාර්ය ජයන්ත රාජපක්ෂගේ අදහස ය.

අද වන විට සාර්ථකත්වයට ළඟා වී ඇති මෙම ප්‍රතිවිෂ එන්නත් නිෂ්පාදනය තවත් මාස කීපයකින් ජනතාව වෙත ලබා දිය හැකි බව සඳහන් කළ මහාචාර්ය ජයන්ත රාජපක්ෂ, ලංකාවට වාර්ෂිකව අවශ්‍ය වන ප්‍රතිවිෂ එන්නත් 80,000ක් පමණ මෙරටදීම නිෂ්පාදනය කිරීමට හැකි වීම ඔවුන් ලැබූ සුවිශාල ජයග්‍රහණයක් බව පැවසීය. ඔහු එසේ පැවසීමට හේතු වූයේ එන්නත් ආනයනය වෙනුවෙන් වැය වන විදේශ විනිමය ඉතිරි කර ගැනීමට හැකි වන බැවිනි. එහෙත් මෙම ප්‍රතිවිෂ එන්නත් කර්මාන්තයක් ලෙස ලංකාවේ නිෂ්පාදනය කිරීමට පහසුකම් නොමැති වීමත් නිෂ්පාදනය කළ ද ඊට විශාල මුදලක් වැය කිරීමට සිදු වීමත් නිසා ප්‍රතිවිෂ ඉන්දියාවට යවා එහි නිෂ්පාදනය කිරීම වඩාත් ලාභදායි බව ඔහු සඳහන් කළේය.

මෙම එන්නත දියර සහ පවුඩර් වශයෙන් නිෂ්පාදනය කිරීමේ බලාපොරොත්තුවක් මහාචාර්ය ජයන්ත රාජපක්ෂ සතු ය. දියර වශයෙන් තිබෙන එන්නත් අධි ශීතකරණයක ගබඩා කළ යුතු අතර දීර්ඝ කාලයක් තබා ගත නොහැකි නිසා පවුඩර් මගින් ප්‍රතිවිෂ සකස් කිරීමට සැලසුම් කර තිබෙන්නේ ලංකාවේ අධි ශීතකරණ නොමැති ග්‍රාමීය රෝහල්වලට පවා මෙම එන්නත් ලබා දීමේ අරමුණ පෙරදැරි කරගෙනය.

"ඇත්ත වශයෙන් ම ලංකාවේ සර්ප දෂ්ටනයෙන් මිය යෑමට බලපාන කරුණු අතර ප්‍රතිවිෂ ඖෂධ නැතිකම ප්‍රධාන වශයෙන් බලපානවා. දුෂ්කර, ග්‍රාමීය රෝහල්වලට රැගෙන එන රෝගීන්ට ප්‍රතිවිෂ එන්නත් දීමට හැකියාවක් නැහැ. රෝගියාව වෙනත් රෝහලකට රැගෙ යන විට අසාධ්‍ය වෙනවා. ඊට අමතරව ඉන්දියාවෙන් ගෙන්වන ප්‍රතිවිෂ ඖෂධය අසාත්මික වූ අවස්ථා තිබෙනවා. මොකද ඒ ඖෂධය දෙන්න සර්පයාව නිවැරදිව හඳුනා ගැනීමත් වැදගත්. සර්පයා හරිහැටි හඳුනා නොගැනීම නිසා ඖෂධය අසාත්මික වෙන්න පුළුවන්. ප්‍රමාද වී රෝහලට පැමිණීම සහ සර්ප විෂ අධික ප්‍රමාණයක් ශරීරගත වී තිබීම යන කාරණා නිසාත් රෝගීන් මරණයට පත් වෙනවා. සර්ප දෂ්ටනයෙන් මිය යන ප්‍රමාණය බින්දුව කර ගැනීමට තමයි අපි උත්සාහ කරන්නේ. ප්‍රතිවිෂ එන්නත ලංකාවේ නිෂ්පාදනය කෙරෙනවා නම් අපිට ගොඩාක් ප්‍රශ්න අඩු කර ගෙන මිය යන ගණන අඩු කර ගැනීමට හැකිවේවි කියලා විශ්වාස කරනවා." යනුවෙන් මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න සඳහන් කළේය.

මෙහිදී ඔහු තවත් වැදගත් කරුණක් පැවසීමට අමතක කළේ නැත. ඒ, කුණකටුවන් දෂ්ට කළ විට ඉන්දියාවෙන් රැගෙන එන ප්‍රතිවිෂ ඖෂධය ඊට ප්‍රතිකාර සඳහා නොගැළපෙන බවයි.

"සාමාන්‍යයෙන් කුණකටුවාව සලකන්නේ මඳ විෂ සහිත සර්ප ගණයට. කුණකටුවෙක් දෂ්ට කළාම මැරෙන්නේ

උග්‍ර විෂ සර්පයන් 6කගේ විෂට සරිලන ලෙස නිපදවා තිබෙනවා

නැහැ. ඒත් වකුගඩු අකර්මණය වීම වගේ අතුරු ආබාධ ඇති වෙනවා. ඒනිසා කුණකටුවන්ටත් උග්‍ර විෂ සහිත සර්ප කොට්ඨාසයට උසස්වීමක් දෙන්න වේවි" යනුවෙන් මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න පැවසුවේ සිනාසෙමිනි.

"විෂසෝර සර්පයා - අත නැර මෝඩයා" යන ජනවහරට අනුගත වෙමින් සර්පයන් මරා දමන අයගේ ඊළඟ ප්‍රහාරය කුණකටුවන්ට ද එල්ල විය හැකිය. එහෙත් පරිසරයේ සමතුලිතතාව රැක ගැනීම සඳහා සර්පයන්ගේ ඉමහත් සේවාවක් සැලසෙන බව ද අප අමතක නොකළ යුතුය.

අපචාර කළ කපුවා කපෝති

● අමිල මලවිසූරිය

විසිඑක් වැනි සියවසටද එළැඹ දියුණුවෙන් දියුණුවටම යන ලෝකයක මිනිසුන් ජීවත් වුවත් ඇතැම්හු තවමත් මිථ්‍යාදෘෂ්ටික මත පසුපසම හඹා යති. ඇතැම් දෙනා එවැනි මිථ්‍යාදෘෂ්ටික ක්‍රියාවන්ගෙන්ද අවංකවම ජනතාවට සෙතක් ශාන්තියක් සිදු කිරීමට කැපවෙද්දී තවත් පිරිසක් ගුරුකම්, යන්ත්‍ර-මන්ත්‍ර, තොවිල්-පවිල් සිදු කරනවා යැයි පවසන සිය කට්ටඩි රස්සාවෙන් නැතිනම් කපු රස්සාවෙන් සිදු කරන්නේ ම අහිංසක ජනයා මුළාවේ දැමීමකි. ඇතැම්හු පල් හොරුය. තවෙකෙක් වනචරයන් නැතිනම් මල් කැකුළු වන් ළමා ළපටින්ද දූෂණය කරන පාපතරයන්ය.

මෙකී කට්ටඩියාත් එලෙසම කාන්තාවන් කිහිපදෙනෙක්ම අමාරුවේ දමමින් බාල වයස්කාර දැරියක්ද ගැබිනියක් බවට පත්කළ 'වල්' කට්ටඩියෙකි. මේ එකී කතාන්දරයයි.

ඉකුත් 2020 දෙසැම්බර් 02 වැනිදා කන්තලේ පොලිස් කොට්ඨාසයේ සූරියපුර පොලිසියට 42 හැවිරිදි මල්ලිකා පත්මකුමාරි නමැති කාන්තාවක පැමිණිල්ලක් ඉදිරිපත් කළාය.

"සර්... මගේ දෙවැනි දුව ගෙදරින් ගිහින්... හොයන්න තියෙන හැමතැනකම හෙව්වා... ඉන්න තැනක් සොයාගන්න නැහැ..."

වයස අවුරුදු 15 යි මාස 10ක් වූ එම දැරිය පිළිබඳ සූරියපුර පොලිස් ස්ථානයේ පොලිස් පරීක්ෂක උපාලි ශාන්තගේ මෙහෙයවීමෙන් විමර්ශන ඇරඹිණි. එහිදී අනාවරණය වූයේ දැරියගේ පියා පවුලේ හැලහැප්පිලි නිසාවෙන් හංවැල්ල ප්‍රදේශයේ වෙනම නිවෙසක වාසය කරන බවයි.

එම දැරිය හංවැල්ලෙ පියා වෙසෙන නිවෙසට ගොස් පසුගිය ඔක්තෝබර් පාසල් නිවාඩු සමයේ මාසයක පමණ කාලයක් විසූ බව පොලිසිය සිදුකළ විමර්ශනවලින් හෙළි වූහ. ඒ අනුව දැරියගේ පියාගෙන් සූරියපුර පොලිස් නිලධාරීන් ලබාගත් ප්‍රකාශ අනුව ඇය හංවැල්ලේදී හඳුනාගත් කට්ටඩියකු සමඟ පලාගොස් ඇති බව අනාවරණය වූයේ එම කට්ටඩියා විසින් දැරියගේ පියාට දී තිබූ දුරකථන ඇමැතුමක් මඟිනි. දැරියගේ පියා පොලිසියට කීවේ,

"සර්... දුව ගෙදරින් ගියාට පස්සෙ මට කෝල් එකක් ආවා... ඒ මගේ මල්ලිගෙ ගෙදර තොවිලයක් කරන්න ආවා කට්ටඩියාගෙන්... 'දුව මාත් එක්ක ඉන්නෙ... එයාට ගෙදර එන්න බෑ කියනවා...'කට්ටඩියා එහෙම කිව්වා..."

ඒ අනුව බාල වයස්කාර දැරියක කට්ටඩියකු විසින් අපහරණය කිරීමක් සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 10 වැනිදා නැවතත් සූරියපුර පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කෙරුණේ දැරියගේ දෙමාපියන් විසිනි.

එහිදී විමර්ශන නිලධාරිහු එකී කට්ටඩියා සතුව තිබූ දුරකථන අංක දෙකක් ඔස්සෙ විමර්ශන සිදු කරමින් ඔවුහු පලා ගොස් සිටින ඉසව්ව අනාවරණය කරගැනීමට උත්සාහ කළහ. එහිදී එක් දුරකථන අංකයකින් හෙළි වූයේ කට්ටඩියා හදාවඩාගත් කාන්තාවගේ නමින් එම දුරකථන අංකය ඇති බවයි. ඇයගෙන් විමසූ විට කියා තිබුණේ 2005 වසරෙන් පසු කට්ටඩියා එම නිවෙසට නොපැමිණි බවයි.

අනෙත් අංකය ඔස්සෙ විමර්ශන සිදු කෙරිණි. එම අංකයේ හිමිකාරිය, කට්ටඩියාගේ පෙර සිටි යක්කල පෙම්වතියකි. ඇයද පොලිසියට කියා තිබුණේ ඔහු සමඟ කිසිඳු සබඳතාවක් මේ වන විට නොමැති බවයි. ඒ කිසිදු විමර්ශනයකින් සැකකාර කට්ටඩියා සිටින ඉසව්වක් පිළිබඳව හෝඩුවාවක් නොවීය.

සැකකාර කට්ටඩියා සහ අපහරණයට ලක්වූ දැරිය

පොලීසිය මාධ්‍යයට නිකුත් කළ සැකකාර කට්ටඩියාගේ ඡායාරූපය

ඒ අනුව පසුගිය 06 වැනිදා දැරිය අපහරණය කළ ජාතික හැඳුනුම්පත් 820903595V අංක දරන සුබසිංහ ආරච්චිගේ ශ්‍රී නමින්ද කුමාර නමැති කට්ටඩියකු ලෙස පෙනී සිටින ස්ථිර ලිපිනයක්ද නොමැති 39 හැවිරිදි පුද්ගලයකුගේ ඡායාරූපයක්ද සමඟින් පොලිස් මාධ්‍ය කොට්ඨාසය මාධ්‍ය නිවේදනයක් නිකුත් කෙළේය.

කට්ටඩියාගේ රූවද සහිතව ඒ පිළිබඳව පුළුල් ප්‍රචාරයක් සැණින් විදුත් සහ මුද්‍රිත මාධ්‍ය ඔස්සෙ සිදු විණි. එම මාධ්‍ය ප්‍රචාරයත් සමඟ කන්තලේ ප්‍රදේශයෙන් වෙනත් ප්‍රදේශයක් වන හාලිඇළ පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයේ 38112 සාජන් ජයසිංහට හාලිඇළ පොලිස් ස්ථානයට කිලෝමීටර් දහයක් පමණ ඇතින් පිහිටි අළුගොල්ල, උඩුකොහුවිල ප්‍රදේශයේ පුද්ගලයකුගෙන් තොරතුරක් ලැබුණේය.

"සර්... ප්‍රවෘත්තිවලට පෙන්නපු කට්ටඩියා වගේ කෙනෙක් ගෑනු ළමයෙක් සමඟ අපේ ළඟපාත ගෙදරක ඇවිල්ලා ඉන්නවා... දැන් මාසයක් විතර වෙනවා ඇවිල්ලා... ඔහු පසුගිය දින කීපයේම වටේම ගෙවල්වල කට්ටඩි වැඩත් කළා..."

සාජන් ජයසිංහට ලැබුණ එම තොරතුර පිළිබඳව හාලිඇළ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රුවන් ගුණතිලක දැනුවත් කිරීමෙන් පසු ස්ථානාධිපතිවරයාගේ උපදෙස් මත එහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කේ. දයානන්ද ප්‍රමුඛ කණ්ඩායමක් අදාළ නිවෙස සොයා ගියේය. ඒ පසුගිය අටවැනිදා පෙරවරුවේයි. හාලිඇළ පොලිසියට කිලෝමීටර් දහයක් පමණ ඇතින් වූ අළුගොල්ල, උඩුකොහුවිල එම නිවෙස පිහිටි ප්‍රදේශය තරමක් කැලෑබද ප්‍රදේශයකි.

පොලිස් නිලධාරිහු අදාළ නිවෙසට යන විට පෙරදා රාත්‍රියේ විදුත් මාධ්‍ය ඔස්සෙ තමා පිළිබඳව ප්‍රචාරය වීම නිසාවෙන් නමින්ද කට්ටඩියා දැරියද රැගෙන රාත්‍රියේම වෙනත් නිවෙසකට පලා ගිය බව නිවැසියන්ගෙන් සැල වූහ. එම නිවෙස් හිමියන් කීවේ,

"මහත්තුරු හොයන කෙනා මීට මාසයකට විතර කලින් අවුරුදු 21ක් වන විවාහක බිරිය යැයි පවසමින් ගෑනු ළමයෙක් සමඟ මෙහෙට ආවේ... අපි හඳුනගත්තෙ මීට අවුරුදු තුන හතරකට පෙර තොවිලයක් කරන්න ඇවිත්..."

එම නිවෙසේ ගත කළ සමයේදී අවට නිවැසියන්ගේද කට්ටඩි වැඩ කරමින් ඔහු යහමින් මුදල්ද උපයාගෙන තිබූ බව පොලිසියට හෙළි විණි. එම නිවෙසෙන් පලා ගියත් ඔහුගේ යතුරුපැදියක්ද නිවෙසේ තිබී පොලිස් බාරයට ගැනිණි. පසුව ඔහු පලා ගිය නිවෙසද පොලිසියට හඳුනා ගැනීමට හැකි විණි. ඒ, ඊට කිලෝමීටර් දෙකක් පමණ ඇතින් වූ අළුගොල්ල ප්‍රදේශයේම නිවෙසකි. රුපියල් හයදහසක කුලියකට එම නිවෙසට ගොස් තිබුණේය.

පොලිස් නිලධාරීන් අට වැනිදා දහවලේම එම නිවෙසටද ගියේය. සැකකාර කට්ටඩියා ඒ වන විට එම නිවෙසේ දැරිය සමඟ විසූහ.

හාලිඇළ පොලිසියට රැගෙන ආ දෙදෙනාගෙන් ප්‍රශ්න කෙරිණි. එහිදී අනාවරණය වූයේ අහස-පොළොව නුහුළන අපරාධයකි. ඒ, පහළොස් හැවිරිදි දැරිය සිවුමස් ගැබිනියක් බවයි. හුංගම, මුලන ප්‍රදේශයේ අයෙක් වන බාල වයස් දැරිය අපහරණය කළ සැකකාර කට්ටඩියා මීට පෙරද කාන්තාවන් තිදෙනෙක්ම ඇසුරු කළ වල් කට්ටඩියෙකි. ඒ, යක්කල, කළගෙඩිහේන සහ මින්නේරියේ කාන්තාවන් තිදෙනෙකි. ඉන් එක් කාන්තාවක් උපාධිධාරිනියකි. කට්ටඩි වැඩවලට ගොස් චාටු බස්වලින් රවටාගෙන ඇති එම කාන්තාවන් තිදෙනාගෙන් මින්නේරියේ කාන්තාව නිත්‍යානුකූලව විවාහ කරගෙන කට්ටඩියාට දාව දරුවෙක්ද සිටී. ඇගෙන් මේ වන විට දික්කසාද වී සිටින කට්ටඩියා එම දරුවාට නිසි පරිදි නඩත්තු මුදල්ද නොගෙවන බවයි.

නමින්ද කුමාර නමැති වල් කට්ටඩියාගෙන් පොලිසිය විමසූයේ අපහරණය කළ දැරිය හමුවූ ආකාරයයි.

"මං මීට මාස කීපයකට පෙර හංවැල්ල පැත්තෙ තොවිලයක් කරන්න ගියා... ඒ ළඟපාත ගෙදරකයි මෙයා හිටියේ... එදා තමයි මුලින්ම දැක්කෙ..."

එදින කට්ටඩියා විසින් වහසි බස් කියා දැරිය වසඟයට ගෙන තිබුණේය. එදින දැරියගේ අත පරීක්ෂාකොට කට්ටඩියා පවසා ඇත්තෙ දැරියට අංජනම් බැලීමේ හැකියාවක්ද තිබෙන බවයි. එසේම හැලහැප්පිලි මැද දෙපසට වී සිටින දැරියගේ මව සහ පියාද තමාගේ ශාන්තිකර්ම මඟින් එක්කිරීමටද හැකි බව කියමින් එදින කට්ටඩියා විසින් ඇයව වසඟයට ගැනීමට සමත්ව ඇති බවද පොලිසියට අනාවරණය විණි.

ඒ අනුව එදින රාත්‍රියේම මෙකී වනචර පාපතර කට්ටඩියා විසින් දැරිය සමඟ යහන්ගත වී ඇත්තේ ඇයට ශාන්ති කර්මයක් කරන බවට කියා තනිව කාමරයකට ගෙන ගොසිනි. පසුව දැරිය හංවැල්ලෙන් සූරියපුරට ගියද දුරකථන ඔස්සෙ කට්ටඩියා සමඟ සබඳතා පවත්වා තිබුණය. දිනක් දැරියට පවසා ඇත්තෙ,

"ඔයා ගෙදරට හොරෙන් එන්න... මට ඔයාව හම්බවෙන්න ඕනෙ..."

දැරියද ඔහු කියූ සැණින් පසුගිය දෙසැම්බර් 02 වැනිදා සූරියපුර මවගේ නිවෙසෙන් පලා ගියාය. අනතුරුව කට්ටඩියා මුණ ගැසී දෙදෙනා වෛද්‍ය රසායනාගාරයකට ගොස් දැරියගේ මුත්‍රා පරීක්ෂාවක්ද කර තිබුණය. ඉන් දැරිය ගැබිනියක් බව හෙළි වීමත් සමඟ කට්ටඩියා, දැරියද රැගෙන සිය කට්ටඩි වැඩ කිරීමට ගොස් හඳුනාගත් නිවෙස් කීපයකට යමින් පසුගිය දිනවල කල් ගත කෙරිණි. එම නිවැසියන්ට හඟවා ඇත්තෙ දැරිය 21 හැවිරිදි තමා නිත්‍යානුකූලව විවාහ කරගත් කාන්තාව බවයි. එලෙස මීට මාසයකට පෙර හාලිඇළ නිවෙසට ගිය බවද සැකකරු පාපෝච්චාරණය කෙරිණි.

මේ වන විට දැරිය වෛද්‍ය පරීක්ෂණයක් සඳහා බදුල්ල රෝහලට ඇතුළත්කර ඇත. සැකකාර කට්ටඩියා හාලිඇළ පොලිසිය විසින් පැමිණිල්ල සටහන් වූ සූරියපුර පොලිසියට බාර දුන්නේය. සූරියපුර පොලිසිය විසින් සැකකාර කට්ටඩියා පසුගිය 11 වැනිදා කන්තලේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළේය.

සූරියපුර පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක උපාලි ශාන්ත සහ හාලිඇළ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රුවන් ගුණතිලකගේ උපදෙස් මත එහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කේ. දයානන්ද ප්‍රමුඛ සාජන්වරුන් වන 38112 ජයසිංහ, 54167 ලාල්, කොස්තාපල්වරුන් වන 40922 එදිරිසිංහ, 82996 කුමාර, කොස්තාපල්වරියන් වන 8321 ලක්මාලි සහ 7554 හර්ෂණී යන නිලධාරිහු මෙකී විමර්ශනවලට එක් වූහ.

සූරියපුර පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක උපාලි ශාන්ත

හාලිඇළ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රුවන් ගුණතිලක

හාලිඇළ පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කේ. දයානන්ද

දින ගණනාවක් සිදුකළ විමර්ශනවලින් ප්‍රතිඵලයක් නැති හෙයින් සූරියපුර පොලිස් ස්ථානාධිපතිවරයා විසින් උසස් පොලිස් නිලධාරීන්ගේ උපදෙස් මත පොලිස් මාධ්‍ය කොට්ඨාසයට දැන්වූයේ සැකකරු පිළිබඳ සොයා ගැනීමේ අරමුණින් මාධ්‍යය සහාය ලබා ගැනීමටයි.

රනිල් - හරින් හමුවෙන් පසු අලුත් සන්ධානයක පෙර නිමිති

කොවිඩ් වසංගතය ආරම්භවූ අවස්ථාවේ සිට මෙරට තුළ පැවැති දැවැන්ත ගැටලුවක් නිමා කර ගැනීමට අගමැති මහින්ද රාජපක්ෂ පාර්ලිමේන්තුවේදී සිදු කළ ප්‍රකාශයකට හැකි විය.



කොවිඩ් ආසාදිතව මිය යන මුස්ලිම් ජාතිකයන්ගේ මෘත දේහ භූමදානය කිරීමට අවසර ලබා නොදීම සම්බන්ධව දැනට වසරකට ආසන්න කාලයක් නිර්මාණය වී තිබූ මත ගැටුමක් අගමැතිවරයාට අවසන් කිරීමට හැකිවීම රජය එක් පැත්තකින් ලද ජයග්‍රහණයකි.

කොරෝනා රෝගය වැලඳී මිය යන මුස්ලිම් ජාතිකයන්ගේ මෘතදේහ ආදාහනය කළ යුතු බවට සෞඛ්‍ය නිර්දේශ මත මෙතෙක් ක්‍රියාත්මක වූ ක්‍රමය ඉදිරියේදී වෙනස් වනු ඇත.

කොවිඩ් ආසාදිතව මිය යන මුස්ලිම් ජාතිකයන්ගේ මෘත දේහ භූමදානය කිරීමට අවසර ලබා නොදීම සම්බන්ධයෙන් රජයට දැඩි විරෝධතාවක් නිර්මාණය වී තිබුණේය. එය දේශපාලන ආරවුලක් බවට පත්වන තැනටම ඉහළ ගොස් දේශපාලන වාසි ලබා ගනිමින් සමගි ජනබලවේගය විසින් භූමදානයට අවසර ඉල්ලා කොළඹදී විරෝධතා ව්‍යාපාර කිහිපයක් ම පැවැත්වීම හේතුවෙන් ආණ්ඩුවේ මෙන් ම විපක්ෂයේ මුස්ලිම් මන්ත්‍රීවරුන්ට සිය ඡන්ද දායකයන්ගෙන් ගැලවුමක් නොවූයේ ඔවුන් දැඩි ලෙස විශ්වාස කරන ආගමික පසුබිමක් තුළය.

පොහොට්ටුවේ ප්‍රශ්නයට අගමැතිගෙන් තිත

පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම්.එස්. මරික්කාර් පාර්ලිමේන්තුවේදී අගමැති මහින්ද රාජපක්ෂ වෙත ප්‍රශ්නයක් යොමු කරමින් මේ බැව් විමසා සිටියේය.

"සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ ඇමතිවරිය පාර්ලිමේන්තුවේ අහපු ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් කොවිඩ් රෝගය ජලයෙන් බෝවිය නොහැකි බව ප්‍රකාශ කළාය. ඒ නිසා මළ සිරුරු භූමදානය කිරීම විද්‍යාත්මකව අහිතකර තත්ත්වයක් නොවෙයි" මරික්කාර් මන්ත්‍රීවරයා යොමු කළ ප්‍රශ්නයට පිළිතුරු ලබාදෙමින් කීවේය.

ඒ අනුව මත ගැටුම් රැසකට හේතු වූ ගැටලුවකට පිළිතුරක් ලැබී ඇතත් ඒ සම්බන්ධයෙන් වන නිරෝධායනය නීතිය වෙනස් කරමින් ගැසට් නිවේදනයක් ප්‍රකාශයට පත්වන තෙක් භූමිදානයට අවසර හිමි නොවන බවට ද සෞඛ්‍ය අංශ සඳහන් කරයි.

මෙම තීරණය සම්බන්ධයෙන් පකිස්ථානු අගමැතිවරයා රජයට මෙන්ම අගමැති මහින්ද රාජපක්ෂ මහතාට විශේෂ ස්තුතිය පුද කරමින් ට්‍යුටර් පණිවුඩයක් නිකුත් කර තිබුණි. ඇමෙරිකානු එංගලන්ත ඇතුළු මෙරට මහ කොමසාරිස්වරු රැසක් ද මෙම තීරණය සම්බන්ධයෙන් රජයට ප්‍රශංසා කළහ.

මේ අතර පකිස්ථානයේ අග්‍රාමාත්‍ය ඉම්රාන් ඛාන් මේ මස 22 වැනිදා ශ්‍රී ලංකාවට නිල සංචාරයක් පැමිණීමට නියමිත බව විදේශ පුවත් සේවා වාර්තා කර තිබේ.

වතු කම්කරුවෙකුට දිනකට රුපියල් දහසක වැටුපක් ලබාදීමට රජය මුල සිටම කළ යෝජනාවට වතු සමාගම් දිගින් දිගටම විරෝධය පළ කළේය. වතු කම්කරු සංගම් නායකයන් එම ගැටලුවේ නොපෙනෙන පැත්තක් පිළිබඳව ඉකුත් සතියේ අදහසක් ප්‍රකාශ කළේ ය.

වතු නැවත බදු දීමට ආණ්ඩුවේ අදහසක් තිබුණා. රුපියල් දහසක වැටුපක් ලබාදීමට අකමැති වතු සමාගම්වලින් වතු ටික නැවත රජයට ගන්නා බවත් කියනවා" වතු කම්කරු සංගම් නායකයෝ කියති.

මේ අතර ආණ්ඩුව අර්බුද ගණනාවක හිරවී ඇතැයි දේශපාලන විචාරකයන් සඳහන් කරන අතර ආණ්ඩුවේ මැති ඇමැතිවරු සඳහන් කරන්නේ කිසිදු ගැටලුවක් ඇතිවී නොමැති බවයි.

ආණ්ඩුව තුළ සිටින වෙනත් පක්ෂවල පෞද්ගලික මතයන් ඉදිරිපත් කරන බවත් එය ආණ්ඩුවේ මතය නොවන බවත් ජ්‍යෙෂ්ඨ ඇමැතිවරු පවසති.

සියලු පක්ෂ පවුලක් ලෙස රටවෙනුවෙන් කටයුතු කරන බවත් පවුලේ සහෝදරයන් අතර යම් ගැටුමක් හටගන්නත් එය ඉතා ඉක්මනින් සමතයකට පත් වන බව ආණ්ඩුවේ පසුපෙළ මන්ත්‍රීවරු පෙන්වා දෙති.

ඇමැති විමල් වීරවංශ ඉරිදා පුවත්පතකට සම්මුඛ සාකච්ඡාවක් ලබාදෙමින් කළ ප්‍රකාශය පොදුජන පෙරමුණ ආණ්ඩුව උණුසුම් කිරීමට හේතු වූයේ ය. විමල් සමඟ ආණ්ඩුවේ මේ ගැටුමට හේතු වූයේ වරාය නැගෙනහිර ජැටියයි.

නැගෙනහිර ජැටිය ඉන්දියාවට විකුණා දැමීමට සූදානම් වන බව වෘත්තීය සමිති ගෙන ගිය අරගලයට තල්ලුවක් දෙමින් විමල්, වාසු, උදය ඇතුළු පිරිස පසුගිය සතියට පෙර සිට වෙනම පක්ෂ නායක රැස්වීම් පවත්වමින් කටයුතු කිරීම මේ ගැටුමේ ආරම්භය විය. මෙය පොදුජන පෙරමුණු ලේකම් සාගර කාරියවසම්ගේ දැඩි දෝෂ දර්ශනයට ලක්වූ අතර කැබිනට් මණ්ඩලය තුළ එවැනි තීරණයක් නොගෙන තිබියදී විමල් ඇතුළු පිරිස එලෙස කටයුතු කිරීම සාමූහික වගකීම උල්ලංඝනය කිරීමක් බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් බහුතරයකගේ අදහස විය. පසුගිය කැබිනට් රැස්වීමේදී අළුයට ගිනිපුපුරු ලෙස තිබූ අතර ඒවා නැවත මතු වූයේ විමල් පසුගිය සති අන්තයේ පුවත්පතට කළ ප්‍රකාශය නිසාය.

මේ ප්‍රකාශය ඉරිදා පුවත්පතේ පළ වූ විට පසුදින සාගර, සංජීව ඇතුළු පිරිසක් ඊට උත්තර දුන්හ. ඔවුන් කීවේ විමල්ට පොදුජන පෙරමුණේ පක්ෂ නායකත්වය ගැන කතා කරන්නට කිසිදු සදාචාරාත්මක අයිතියක් නොමැති බවය.

පසුගිය අගහරුවාදා ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් රැස්වීම පාර්ලිමේන්තුවේ කමිටු කාමර අංක 01 දී පැවැතියේ මෙවැනි පසුබිමක් තුළය. ඇමැති ප්‍රසන්න රණතුංග මේ රැස්වීමට පැමිණියේ විමල් වීරවංශ ඇමැතිවරයාගේ අදාළ ප්‍රකාශය ඇතුළත් පුවත්පතේ පිටුව ද රැගෙනය. සතියේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව විමල්ගේ කතාව ගැන ප්‍රශ්නය ඇද්දේ රාජ්‍ය ඇමැති නිමල් ලන්සා ය. වාද විවාද රැසක් ඒ මොහොතේ සිදුවිය. ලන්සා, වාසු, ප්‍රසන්න හා ගම්මන්පිල ඊට එක්වූහ.

සඳුදා සවස අගමැති මහින්ද පක්ෂ නායක රැස්වීමක් කැඳවා තිබුණේ මේ ගැටුම විසඳීම සඳහාය.

"දැන් අපි මේ වාදය අවසන් කරමු. අපි අතර අනවශ්‍ය මත භේද ඇති වුණාම ඒකේ වාසිය විපක්ෂයටයි" අගමැති මහින්ද කීවේය.

ආණ්ඩු පක්ෂ රැස්වීම අවස්ථාවේ ඇමැති විමල් හිටියේ මීගමුවේ අධිකරණ කටයුතු තත්ත්වයකට සහභාගි වෙමිනි. විමල්ගෙන් මාධ්‍යවේදියකු ඇසුවේ සාගරගේ ප්‍රකාශය ගැනය. පොදුජන පෙරමුණෙන් මහින්ද ඉවත් විය යුතු බවට කළ ප්‍රකාශය සම්බන්ධයෙන් විමල් ජනතාවගෙන් සමාව ගත යුතු බව පවසා තිබුණි. විමල් ඊට අපූරු උත්තරයක් දුන්නේය. මහින්ද සුළඟ අරඹා යළි මහින්ද බලයට පත් කිරීම වරදක් නම් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති කරවීමට කැපවීම වරදක් නම් තමන් ඊට ජාතියෙන් සමාව ඉල්ලීමට සූදානම් බවය.

ඉම්රාන් බාන්ගේ මෙරට සංචාරයෙන් වාසි කාටද?

මේ අතර මේ දිනවල කතා බහට ලක්ව සිටින ජාතික නිදහස් පෙරමුණේ නායක ඇමැති විමල් වීරවංශ හා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහලේකම් සාගර කාරියවසම් පසුගිය බදාදා පාර්ලිමේන්තුවේදී මුනුණට මුනුණ හමුවූහ. ඇමැති මහින්ද පාර්ලිමේන්තුවේ භෝජනාගාරයේ සිට දිවා ආහාරය ගෙන පිටතට පැමිණෙමින් සිටියේය. සාගර කාරියවසම්, ලොහාන් රත්වත්ත, නිමල් ලන්සා, මහින්ද අමරවීර, දයාසිරි, සහන්, නිශාන්ත වැනි මැති ඇමැතිවරු මහින්ද සමඟ වූහ. මේ අතර ඇමැති විමල් දිවා භෝජනය ලබා ගැනීමට භෝජනාගාරයට එමින් සිටියේය.

"කෝ විමල් කොහෙද හිටියේ මම උදේ දැක්කේ නැනේ" අගමැති මහින්ද විමල්ගේ කරට අත දමා ගනිමින් කීවේය.

"මම පොඩි වැඩකට ගියා. අගමැතිතුමා දැන් ආවේ" විමල් කීවේය.

විමල් හා සාගර අතර කිසිදු කතා බහක් සිදු නොවූ අතර දෙදෙනා, දෙදෙනා දෙසම හොරෙන් බලා අහක බලා ගන්නා අයුරු දුටු එතැන සිටි මැති ඇමැතිවරුන්ගේ කට කොනකට සිනහවක් නැගෙනු දක්නට ලැබුණි.

සිරගතව සිටින රන්ජන් රාමනායකට පාර්ලිමේන්තුවට පැමිණීමට අවසර ලබාදෙන්නැයි ඉකුත් දිනවල විපක්ෂය කථානායකවරයාගෙන් දැඩි ලෙස ඉල්ලීම් කළේය. මරණ දණ්ඩනය නියම වී සිටින රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකරට පාර්ලිමේන්තුවට පැමිණීමට අවසර ඇත්නම් රන්ජන් රාමනායකට එම වරප්‍රසාදය නැත්තේ ඇයි දැයි විපක්ෂනායකවරයා ඇතුළු මන්ත්‍රීවරුන් පිරිසක් කථානායකවරයාගෙන් ප්‍රශ්න කර සිටියහ.

බන්දුලගේ 'රජවාස' විවෘතයට ජනපති ඇවිත්

රන්ජන් රාමනායක මහතා නැවත නඩු කටයුත්තකට ගිහින්. අධිකරණයේ නඩුවක් තියෙනවා. අධිකරණයේ යම් තීන්දුවක් දුන් පසුව අපි ඒ ගැන සලකා බලනවා යැයි කථානායක පිළිතුරු දුන්නේය. ඒ අනුව ඔහුට නඩුව නිමවන තුරු පාර්ලිමේන්තුවට පැමිණීමට නොහැකි වනු ඇතැයි ද එක දිගට මාස තුනක් පාර්ලිමේන්තුවට නොපැමිණීම මන්ත්‍රී ධුරය අහෝසි වීමට හේතුවක් යැයි නීති විශාරදයෝ පවසති.

එක්සත් ජාතික පක්ෂ නායකයා හමුවීමට ඉකුත් සතියේ සඳුදා පැරැණි මිත්‍රයකු පැමිණියේය. පැමිණෙන බව කලින් ම දැන්වීම නිසා නායක රනිල් වික්‍රමසිංහ ද ඔහුගේ පැමිණීම බලාපොරොත්තුවෙන් කොළඹ සිය නිවසේ රැඳී සිටියේය. ඒ වෙන කිසිවකු නොව සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හරින් ප්‍රනාන්දුය. දේශපාලනික වශයෙන් කණ්ඩායම් දෙකක සිටින පිරිස එක කණ්ඩායමක් බවට පත් කිරීම හරින්නේ මෙම විශේෂ හමුවේ මූලික ඉලක්කය වී තිබුණි.

"කොහොමද සර්" යැයි හරින් නායකයා දුටු විගස සිනාසෙමින් ඇසුවේය.

"හොඳයි හොඳයි හොඳින් ඉන්නවා" යැයි රනිල් හරින්ව අසුන් පනවමින් කීවේය.

"මොකද විශේෂයෙන් ම මේ පැත්තේ" රනිල් හරින්ගෙන් විමසීය.

"මේ ආණ්ඩුව ගෙන යන ප්‍රජාතන්ත්‍ර විරෝධී ගමනට එරෙහිව අපි එකට හිටගන්න ඕන. අපි එක පෙරමුණක් හදන්න ඕන. මේ සඳහා අපි ඔක්කොම එකට එකතුවෙන්න ඕන. එක්සත් ජාතික පක්ෂය මෙතනට එන්න ඕන ඒක අවශ්‍ය හොඳ දෙයක් හරින් කීවේය.

සජිත් අලුත් සංවිධායකයන් සමඟ දිවා භෝජනයක

"අලුත් කණ්ඩායමකට මම පාර්ලිමේන්තුව භාරදීලා තියෙන්නේ. පිටුපස ඉඳන් තමයි ඔවුන්ගේ ගමනට සහය ලබාදෙන්නේ. ඔයාලා රුවන්ලා කොහොමත් එකට වැඩ කරපු අයනේ. මේ ගැන රුවන් එක්ක කතා කරන්න" රනිල් පිළිතුරු ලබා දුන්නේය.

ඉන්පසු දෙදෙනාම ආගිය තොරතුරු රැසක් කතා බහ කිරීමෙන් අනතුරුව හරින් හිටපු නායකයාගේ නිවසින් පිටව ගියේ රහස් රැසක් ඉතිරි කර තබාය. එය නම් සන්ධානයක පෙර නිමිත්තක් දැයි සැකයක් පවතී.

සිරිකොත පක්ෂ මූලස්ථානයේදී නායක රනිල්, නියෝජ්‍ය නායක රුවන්, මහලේකම් රංගේ බණ්ඩාර සහ සභාපති වජිර හමු වූහ. ඔවුන් එහිදී පක්ෂයේ යාන්ත්‍රණය සම්බන්ධ කතා බහ කළේය. සංවිධායකවරුන් පත් කිරීම සම්බන්ධව ද මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනු ලැබුණි.

රන්ජන් වෙනුවෙන් නීතිමය මැදිහත්වීම් රැසක්

නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථාන භූමියේ ස්ථාපිත කරන ලද රජවාස වෙළෙඳ සංකීර්ණය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය බ්‍රහස්පතින්දා විවෘත විය. ජනපති එහිදී එහි තිබූ විවිධ නිපැයුම් රැසක් නිරීක්ෂණය කළේය.

වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතාගේ අදහස අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ මෙම ප්‍රදර්ශනාගාරය පුළුල් කර රජවාස සංකීර්ණය ඉදිකර ඇත. එය රාජ්‍ය හා පෞද්ගලික ආයතන 78 ක් සමන්විතය.

සමගි ජනබලවේගයේ ආසන සංවිධායකවරුන් පත් කිරීමෙන් පළමු අදියර පසුගිය සතියේ පැවැත්වුණේ විපක්ෂ නායක හා සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාසගේ ප්‍රධානත්වයෙන් ය.

අදියර දෙකක් යටතේ ආසන සංවිධායකවරුන් පත්කරන අතර පළමු අදියරේදී පත් කළේ සංවිධායකයන් එකසිය හත් දෙනෙකි. ඇතැම් ආසනවලට මුලින් සිටි ආසන සංවිධායකටම පත්වීම් ලැබුණු අතර සමහර ආසනවලට පත්වී තිබුණේ අලුත් මුහුණුය.

"හැම අයෙක්ම අවංකව වැඩ කරන්න. සංවිධායකකමක් දීලා ඔබතුමන්ලාට පක්ෂයෙන් ගරු කිරීමක් කරලා තියෙනවා.

ඒ වගේ ම ඔබතුමන්ලා ජනතාව වෙනුවෙන් වැඩ කරන්න. අකාර්යක්ෂම දුර්වල අය සම්බන්ධයෙන් තීන්දු ගැනීමට දෙවරක් මම හිතන්නේ නැහැ. සජිත් කීවේය.

පත්වීම් ලබාදීමෙන් පසුව සවස සියලු දෙනාට දිවා භෝජන සංග්‍රහයක් හා වැඩමුළුවක් සංවිධානය කර තිබුණි. ඊට පෙර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ මන්ත්‍රී කණ්ඩායම් රැස්වීමක් ද පැවැත්වුණි.

පාර්ලිමේන්තුවේදී විපක්ෂයට ලැබෙන කාලය අසාධාරණ ලෙස අඩු කරනවා. මේ ගැන කතා කළ යුතු වෙනවා." පාඨලී චම්පික රණවක මන්ත්‍රීවරයා පෙන්වා දුන්නේය.

රන්ජන් රාමනායකට පාර්ලිමේන්තු කැඳවා ගැනීමට අපි පාර්ලිමේන්තුව තුළ මැදිහත්වීම් කරන්න ඕන" මහලේකම් රංජිත් මද්දුම බණ්ඩාර යෝජනා කළේය.

රන්ජන් වෙනුවෙන් නීතිමය මැදිහත්වීම් රැසක් කරන්න මම කටයුතු කරගෙන යනවා." සජිත් රන්ජන් වෙනුවෙන් ගෙන තිබෙන නීතිමය තත්ත්වය පැහැදිලි කළේය.

ඔහු සිටි මේසයේ රාජිත සේනාරත්නල සරත් ෆොන්සේකාල, තිස්ස අත්තනායක සහ මහලේකම් රංජිත් මද්දුම බණ්ඩාර සිටියහ. ආසන සංවිධායකවරුන්ට වැඩමුළුව පැවැත්වුණේ සවස් වරුවේය. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා පක්ෂය ජයග්‍රහණය කරා ගෙන යාම සඳහා වන මනස සකස් කිරීමේ දේශනයක් පැවැත්වූයේ වීඩියෝවල සංඛ්‍යා ලේඛනවල දත්ත ඉදිරිපත් කරමින්ය.

මීළඟ ජනාධිපතිවරණයට තවත් දින හය සියයක් විතර තමයි තියෙන්නේ. අපි මේ ගත කරන වේලාවත් වැදගත්. අපිට ජයග්‍රහණය කරා යෑමට මේ මොහොතේ සිට අපි වැඩ කළ යුතුයි" හරින් කීවේය.

"ඒක මරු කතාව' හරින්ගේ කතාව අවසානයේ සජිත් කීය.

විපක්ෂනායක ජංගම සේවාවලට පැමිණි පාසල් ළමුන්ගේ දෙමාපියන් සඳහන් කර සිටියේ නිල ඇඳුම් සහ පෙළ පොත් ගැටලුවයි.

මේ සම්බන්ධව විපක්ෂනායකවරයා අධ්‍යාපන ඇමැතිවරයාගෙන් පාර්ලිමේන්තුවේදී තොරතුරු විමසා සිටියේය.

එක පැත්තකින් ශිෂ්‍යත්වයේ ප්‍රශ්න අනෙක් පැත්තෙන් දරුවන්ට නිල ඇඳුම් දුන්නා කියලා බොරු කියනවා. කාටද මේ ප්‍රෝඩාව කරන්නේ."

පාර්ලිමේන්තු ලොබියේදී අශෝක් අබේසිංහ සජිත් කීවේය.

මේ අතර සමගි ජනබලවේගයේ බුද්ධි මණ්ඩලය පසුගිය සතියේදී රැස්වූයේ ආණ්ඩුවේ පරිසර විනාශය ගැන අවධානය යොමු කරමින් ය.

"ගස් කැපීම වෙනුවට ගස් වැවීමේ වැඩපිළිවෙළක් අපි හදන්න ඕන. අපි යන තැනට ඵලදායි දෙයක් කරන්න ඕන" සජිත් කීය.

"ඔබතුමා ජංගම සේවයේදී මේ ගැන අවධානය යොමු කරන්න" විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් යෝජනාවක් ආවේය.

මේ අතර සාධාරණ සමාජයක් ජාතික ව්‍යාපාරය ද ජානකී හෝටලයේදී මේ ගැන සාකච්ඡා කිරීමට සමාජ ක්‍රියාකාරීන් කැඳවා තිබුණි. පාඨලී චම්පික රණවක රාජිත සේනාරත්න මනුෂ නානායක්කාර, රවි කරුණානායක, නවීන් දිසානායක ඇතුළු මන්ත්‍රීවරු නීතිඥයෝ ද පිරිසක් මේ සඳහා එක්වූහ.

මේකට විරුද්ධව තැන් තැන්වල හුදකලා සටන් කිරීමෙන් වැඩක් නැහැ. අපි හැමෝම එකට එකතුවෙලා පොදු වේදිකාවකදී මේ සඳහා සටන් කළ යුතුයි. සාධාරණ සමාජයක් සඳහා ජාතික ව්‍යාපාරයට මේ සඳහා කණ්ඩායම් එක් කළ හැකියි. මේක දේශපාලන පක්ෂයක් නොවන නිසා සියලුම දේශපාලන පක්ෂවල නායකයින් මෙතැනට එකතු කරන්න පුළුවන්" මනුෂ යෝජනා කළේය.

හැමෝටම මේකට එන්න කියන්න. මම ආයිමත් ඡන්දෙ ඉල්ලන බලාපොරොත්තුවක් නෑ. රටට දෙයක් කරන්නයි මට අවශ්‍ය. ඒ නිසා හැමෝම මෙතැනට එකතු කරන්න පුළුවන්" කරු ජයසූරිය කීවේය.

පරිසරයේ මහිමය විඳින්න නිබඳ එය සුරකින්න

පරිසරය රකින්නට, පාරිසරික සංචාරක කර්මාන්තය වගකීමෙන් යොදාගනිමු

ඉනෝකා පෙරේරා බණ්ඩාර

සොබාදහමෙන් ඇත්ව එය විනාශ කර දමමින්, එවිට ක්‍රියාකාරකම්වල නියැලුණු මනුෂ්‍යයා ඉන් පාඩම් උගෙනීමට පටන් ගෙන තිබේ.

එනම්, ලොව නොයෙකුත් ජීවන් වුවන් අඩු වැඩි වශයෙන් සොබාදහමේ විනාශයන්ට සහ දඬුවම් විඳීමට පටන් වන්නට අප සැමට සිදුව තිබේ.

පසුගිය කෝවිඩ රෝග... වසංගත තත්ත්වයක්... අධික කඳු දියවීම්... ගිනි කඳු පුපුරා යාම්... සංවෘතර... තායයුම්... අකලට වැසි... ගුළිපුලං... සුනාමි... ආදි මේ විපත් සියල්ල සොබාදහම උරණ වී ලබා දෙන දඬුවම් බව, පමා වී හෝ

මනුෂ්‍යයා තේරුම් ගන්නට පටන් ගෙන තිබේ.

එහෙයින් සොබාදහම වෙත යළි සමීප වන්නට, ඒ ඇසුරේ ජීවත් වන්නට, එහි අපිරිය තෙපට සහ සිසුරට විඳගන්නට හැකි සම ක්‍රමයක් වෙත මේ මිනිසා ළඟාවෙමින් සිටියි. ඒ අනුව පරිසර සංචාරක කර්මාන්තය යනු, සොබා දහම විඳින්නට සහ සොබාදහම ඇසුරේ ජීවත් වන්නට මනුෂ්‍යයා තල්පරගත්, සොදුරුතම ක්‍රමවේදයයි.

එහිදී මිනිසා පරිසරය විඳිනුයේ, පරිසරය රැකීමේද මූලික කරුණක් ලෙස සලකමිනි.

එහෙයින්, පරිසර සංචාරක කර්මාන්තය වෙතින් උපයන මුදලින් කොටසක් මෙම සංරක්ෂණ කටයුත්ත සඳහා ද

පරිසර නිසනාමි නෝවල්, මෙවැනි මග පෙන්වන්නන් යොදා ගැනීමට හේතුව වන්නේ, ඉතාමත් ගොඩා පරිසර සංචාරක කර්මාන්තය විඳීමට එන සංචාරකයන් මෙම වනාන්තර පද්ධතීන් පිළිබඳ පරිපූර්ණ අර්ථ නිරූපණයක් බලාපොරොත්තු වන නිසාය.

ඒ අනුව, පරිසර විචරණය (nature interpretation) සහ ගවේෂණය (research) යනු, මෙම සොබාදහම පදනම් කරගත් සංචාරක ව්‍යාපාරයේ ප්‍රධාන අංග දෙකකි. පරිසර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමෙහිලා දැඩිව බලපාන මෙම දෙඅංගය ඇතුළු, යටිතල පහසුකම් සැපයීම... ඊමෙහෙට උදාන් ඇති කිරීම... ගමන

සංස්කෘතිය ඉස්මතු වන පරිදි එහි වටිනාකම සංචාරක ව්‍යාපාරයට යොදා ගැනීම... දැලු කෙළීම, කුමුරු වැඩ, නොයෙකි කැවීම, වැවේ ගොල ගැල්ලීම, ඔරු පැදීම... ආදී ගමේ ක්‍රියාකාරීත්වයට සංචාරකයින් දායක කරගැනීම... වැනි සියලු කාරණා සඳහා ESCAMP සිය දායකත්වය ලබා දෙයි.

එමෙන්ම, හිවෙස් ලැගුම් (home stay) වැනි සංකල්ප ඔස්සේ, සංචාරකයන් හට ගම ගම හා එහි සංස්කෘතිය විඳින්නට සලස්වා, ඔවුන් ගමේ රඳවා ගනිමින්, ඔවුන්ට විඳීමට සුවදායි වාසස්ථානයක් ගම

අනිවාර්යයෙන් යෙදවිය යුතු අතර, එම වනාන්තර අවට ජීවත් වන ජනතාවගේ සුබසිද්ධිය උදෙසා ද යම් කොටසක් වෙන් විය යුතු බව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පටන් ක්‍රියාත්මක

ජීවවිවිධ හෙවත්, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ, අනුර සතුරුසිංහ මහතා පවසයි.

එසේම, මොහෝ රටවල පරිසර සංචාරක කර්මාන්තය සඳහා වැඩිපුර තැමිණෙනුයේ වියදම් කිරීමට හැකියාව ඇති ඉතා පැලැන්තියේ සංචාරකයන් වන අතර, ශ්‍රී ලංකාවේ ද වනාන්තර ආශ්‍රිතව උසස් තත්ත්වයෙන් යුතු එවැනි පරිසර තිසනාමි, පුද්ගලික අංශයට අයත් හෝටල් කිහිපයක්ම ක්‍රියාත්මක වනුයේ, ඉහළ අයකිරීම්වලට යටත්ව ය.

එමෙන්ම,මෙම පරිසර සංචාරක කර්මාන්තය සඳහාම වෙන් වූ උසස් දැනුමක් ඇති සංචාරක මග පෙන්වන්නන් (ඇතැම් විට විදේශීය සංචාරක මග පෙන්වන්නන්) මේ සඳහා යොදා ගැනේ. ඔවුහු මොහෝ විට, විෂය පිළිබඳ දැන උගත් අයවලුත් වන අතර, වනාන්තරය සතුන් සහ උන්ගේ චර්යාවන් හා ඛෙදුණු ස්වභාවික කාරණා පිළිබඳ දෙස් විදෙස් දැනුමින් පොහොසත් පුද්ගලයින් වේ.

සංචාරකයා වෙත දැනුම සහ සොබා දහමේ අභිමන්ත්‍රණ විස්ද්‍රනිය අන්දැනීමක් ලබා දෙන එවැනි

සොබාදහම ආරක්ෂා කිරීම නීතිවලින්ම කරන්න පුළුවන් දෙයක් නෙවෙයි, එය හදවතින්ම එන ආකල්ප ලෙස ක්‍රියාත්මක කරන්නට ඕනේ

සතුරු ම පාදා දීම, නියමු ව්‍යාපෘතියක් සේ මේ වන විටත් ක්‍රියාත්මක බව, අනුර සතුරුසිංහ මහතා පවසයි.

"අපි මේ වන විටත් සිංහරාජ, තලල්ස් සහ හුරුලු, ගල්ගිය වැනි, වන රක්ෂිත ආශ්‍රිත ගම්මානවල පරිසර සංචාරක කර්මාන්තය ආරම්භ කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරමින් සිටිමුව.

ඒ අනුව, ගම් ගෙදරටම ඇද, සුව පහසු නිදන කාමරයක් සහ තාත කාමරයක් ඉදිකිරීමට අවශ්‍ය දැනුම සහ සහයෝගය මේ නියමු ව්‍යාපෘතිය ඔස්සේ ඔවුන්ට ලබා දෙමුව.

රාත්‍රී සංචාර, වනජීවීන් නැරඹීම, රාත්‍රී තැල් රැඳීම, පැලේ සිට අලි නැරඹීම පමණක් නොව, ගම් හා බැඳුණු විවිධ සංස්කෘතික ක්‍රියාකාරකම් විඳීමට සංචාරකයන් පොළඹවනවා.

ඒ වගේම, ගමේ ගෙවල්වල කැදෙන කැලපයක්, කැණි ආප්පයක්, වත්වුවක් හෝ නිතුල් හතුරු සමග කකට කෝප්පයක්, බෙලි මල් විදුරුවක් රස විඳින්නට මේ සංචාරකයන්ට අවස්ථාව සලසන්නට ග්‍රාමීය ජනතාව උනන්දු කරවනවා.

ප්‍රමිතියෙන් යුතු පිරිසුදු ආහාර වේලක් විදේශිකයන්ට පිළිගැන්වීම ඔස්සේ, ගමේ ආර්ථිකය තංවන්නට අපි මේ වනාන්තර ආශ්‍රිත ගම්මානවල ජනතාවට නියමු ව්‍යාපෘති පෙන්වා දෙනවා. තවත් අනෙකුත් එවිට, කියෙන කැටියට ගම විඳින අතර, සරලව ජීවන් වීමේ අනය සංචාරකයන් අතර ප්‍රචලිත වනවා. "ශ්‍රී ලාංකිකයන් ගේ සරලකම සහ සංග්‍රහශීලී බව මෙන්ම, සොබාදහම විනාශ නොකර විඳ ගන්නා ආකාරය, ලොවට ගෙනයන්නට මෙය එක්තරා විදියකට ඉතා හොඳ අවස්ථාවක් . ඒ වගේම, මෙය තව අත්හදා බැලීමක්

අනිත, පරිසර සංචාරක කර්මාන්තය

ශ්‍රී ලාංකිකයන් ගේ සරලකම සහ සංග්‍රහශීලී බව මෙන්ම, සොබාදහම විනාශ නොකර විඳ ගන්නා ආකාරය, ලොවට ගෙනයන්නට මෙය එක්තරා විදියකට ඉතා හොඳ අවස්ථාවක්

දැනට වැඩි වශයෙන් සිදුවන්නේ, පුද්ගලික අංශයේ සැදීමක් වශයෙන් පමණයි. නමුත් මේ සුම රක්ෂිතයන්ම හා වනාන්තරයන්ම, සතා සීපාවා ඇතුළු මේ මහපොළවේ සෙනෙහිත අපිමිය රජයටයි. ඒ නිසා රජය සහ පුද්ගලික අංශය මෙන්ම, වනාන්තර ආශ්‍රිත ගැමි ජන සමාජයද මේ සඳහා එකතු විය යුතුයි. මොකද, රජයේ වගකීම වන්නේ මේ වන සම්පත ආරක්ෂා කර ගැනීම සහ එයින් රටට ආදායම් මාර්ග උපදවා ගැනීම වන නිසා.

ESCAMP ව්‍යාපෘතියේ අපි, මේ තුන් අංශය සඳහාම දිය හැකි උපරිම දායකත්වය ලබා දෙමින්, පරිසර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට මේ ව්‍යාපෘති ඔස්සේ, අවශ්‍ය සියලු සහයෝගය ලබා දෙනවා. ඒ නිසා රජයට සුවවත් අවශ්‍ය

ආයෝජනයින් හේ වගකීමකින් තැදවා, වනාන්තර තැරැඹීමේ ලොව ප්‍රතලිතම සංකල්පයක් වන වියත් මංපෙත් (canapy walk) වැනි සංකල්පයක් අපේ රටට හඳුන්වා දෙන්නට, ඒවා ක්‍රියාත්මක කිරීමේ බලය ඇත්තේ රාජ්‍ය අංශයට වන නිසා, අපට තැකියාව ඇත්තේ, මෙවැනි අදහස් යෝජනා ලෙස ඉදිරිපත් කිරීමට සහ අවශ්‍ය සහයෝගයක් ලබා දීමට පමණයි.

විශේෂයෙන්, පරිසර සංචාරක කර්මාන්තය පිළිබඳ කියැවෙන අර්ථ නිරූපණ මාර්ග වන, පෝස්ටර්, අත්පත්‍රිකා, සංඥ, ලුවරු නිර්මාණය වෙනුවෙන් අපගේ ව්‍යාපෘතිය විශාල සහයෝගයක් දක්වනවා. ස්වාභාවික මංපෙත් හෙවත්, වනාන්තර සුළු වන මංපෙත් තවත්තු කිරීම, තැරැඹුම් උන්කඩ මං පලතුණු අසල ඇති කාම ප්‍රවරු, සංඥ, ලුවරු හෙවත් තවත්තු කිරීම, කරමන්තන් ගේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, වනාන්තර පිළිබඳ වූ පර්යේෂණ පිළිබඳ විස්තර පත්‍රිකා මෙම ඔධාස්ථාන සුළු ගබඩා කිරීම, මග පෙන්වන්නන්ගේ දැනුම සහ ආකල්ප වර්ධනය කිරීමට අවශ්‍ය වීම... යන කරුණුත් රීට අදාළයි.

ඒ වගේම,සංචාරකයන්ටත් මේ සම්බන්ධයෙන් බරපතළ වගකීමක් ඇති බව කියන්න කැමැතියි. අපි මේ මොන දේ කළත් වැඩක් නැහැ , සංචාරකයන් සොබාදහම සහ වනාන්තර විනාශ වන ලෙස හැසිරෙනවා නම්..."

සතුරුසිංහ මහතා අවධාරණය කරන්නේ, වනාන්තරය විඳීන සුළු කෙනකුගේ කරයේ මහත බලාගත යුතු බරපතළ කාරණාවක් පිළිබඳව ය.

"මේවා විඳගන්න නම්, පළමුවෙනුව, මේවාට යන අය සහ රටක් ලෙස අපි හැමෝම සොබාදහම ආරක්ෂා කර ගත යුතුයි. නමුත් සොබාදහම ආරක්ෂා කිරීම, නීතිවලින්ම කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. එය හදවතින් ම හා යුතු

දෙයක්. ආකල්ප ලෙස වර්ධනය කර ගත යුතු දෙයක්. වනාන්තර , සම්පතක් ලෙසයි. අප දකින්න ඕනේ. වනාන්තර, ඒ ආශ්‍රිත මෙම්මානවලට සහ රටට අදායම් මාර්ග උපයා ගත හැකි ආකාරයට, කළමනාකරණය කරන්න ඕනේ. එසේ කළොත් පමණයි, පරිසර සංචාරක කර්මාන්තය ඉදිරියටත් විඳගන්න අපිට අවස්ථාව තිබෙන්නේ..."

වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යාංශය
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
ESCAMP
පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය

මේ තමයි ඔබ අපට ලිවියයුතු ලිපිනය:
වනජීවී අධ්‍යක්ෂක
පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP),
82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
escamp.pd@gmail.com

ග්‍රැෆික් ශිල්පියාගේ මළසිරුර පුංචි ලෝකාන්තයෙන් සොයාගත්

ත්‍රාසජනක මෙහෙයුම

මිය ගිය දිනුර

අධික මීදුම නිසා මොනවත්ම පෙනුණෙ නෑ; මිනිය හමුවුණේ නොර්වුඩ් කණ්ඩායමට

● **ප්‍රසන්න පත්මසිරි**-ඌව පළාත් සමූහ

පුංචි ලෝකාන්තයේ රැයක් ගත කරන්න දිනුර ගිය දවසේ මම යාළුවන් සමඟ රාත්‍රී ගෙදර ඉද්දී මට එයාට කරදරයක් වගේ දැණුනා. නින්දෙන් නැගිටලා මම එයාට කෝල් කළත් ආන්සර් කළේ නෑ. මට එයා ඉන්න තැනට හොයාගෙන යන්න හිතුණා. යාළුවන් සමඟ මම යන්න පිටත්වුණත් මොනවද වුණේ කියලා මම දැනගෙන හිටියේ නෑ 'ඩී. දිනුර විජේසුන්දරගේ බිරිය වන නීතිඥ ශ්‍රීමාලි ධර්මපාල හැඬූ කඳුළින් යුතුව කියයි. මඩොල්සිම පුංචි ලෝකාන්තයේ රැයක් කුඩාරම්ගතව අසිරිය විඳීමට ගිය පිරිසක් අතර සිටි අයකු රාත්‍රි කාලයේ අතුරුදන් වීමෙන් පසු දින තුනක් තිස්සේ වනයේ සිදු කළ මෙහෙයුමක් අතරතුරදී ඔහුගේ මෘත දේහය ලෝකාන්තය පාමුල දොරපොද ප්‍රදේශයේ ගල්තලාවක තිබියදී සොයාගෙන තිබේ.

කළුතර මග්ගොන ප්‍රදේශයේ පදිංචි සිරස මාධ්‍ය ආයතනයේ ත්‍රිමාණ සජීවිකරණ ශිල්පියකු ලෙස කටයුතු ඔහු නමින් ඩී. දිනුර විජේසුන්දර(34) ය. පුංචි ලෝකාන්තය ලුණුගල හා මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර කොකාගල වතුයායේ බෑවුමක පිහිටා තිබේ. මෙය අතිරමණීය ස්ථානයක් වන අතර ඉතා අවදානම් ස්ථානයකි. දිනපතා දේශීය විදේශීය සංචාරකයන් මෙහි අසිරිය විඳින්නට පැමිණෙති. කෙතරම් සංචාරකයන් පැමිණියත් මෙහි කිසිදු පහසුකමක් නොතිබීම නිසා පැමිණෙන පිරිස් දැඩි අසීරුතාවට පත්වන අවස්ථාද බොහොමයකි.

මේ ස්ථානයට මීදුම නොමැති අවස්ථාවලදි බිබිල, මහියංගන, අම්පාර, මඩකළපුව වැනි ගම්මාන හොඳින් දිස්වේ. නිතර පවතින සුළඟ හා ඝන මීදුම නිසාම අවට පරිසරය දැක ගැනීමට බොහෝවිට සංචාරකයන්ට නොහැකිය. එහෙත් නිතර සංචාරකයන් පැමිණ කුඩාරම්ගතව මේ සුන්දර ස්ථානයේ රාත්‍රිය විනෝදයෙන් ගත කරති. දිනුර විජේසුන්දර වෛද්‍යවරුන් හයදෙනෙකු හා තවත් මිතුරන් පස් දෙනෙකු සමඟ පසුගිය හයවැනිදා දවල් මහියංගනයට පැමිණ ඇත. රාත්‍රී කඳවුරුගතව සිටීමට මහියංගන රෝහලේ වෛද්‍යවරයකු සංවිධානය කර තිබූ අතර ඔවුන් මීගහකිවුල පිටමාරුව මාර්ගය ඔස්සේ පුංචි ලෝකාන්තය වෙත පැමිණ ඇත්තේ පසුගිය හය වැනිදා සවස පහට පමණය.

එතැන් පටන් ඔවුන් මීදුමෙන් වැසී ගිය අධික සීතල සහිත පරිසරයේ තිබෙන ලෝකාන්තය අසල කඳවුරුගතව විනෝද වෙමින් සිටියදී මැදියම් රැය වන විට සුළඟත් ධාරාණිපාත වැස්සක් ඇද වැටී ඇත. එනිසා අලුයම එකට පමණ සියලු දෙනා පැමිණි වාහන වලට නැවත දිවගොස් තිබේ.

වාහනවලට පැමිණි අය අතර දිනුක නොසිටි බව ටික වේලාවකින් දැනගත් මිතුරන් පිරිස නැවත කඳවුරු බැඳි ස්ථානයට ගොස් සෙවීම් කළත් හමු නොවූ නිසා මඩොල්සිම පොලිසියටද පැමිණිලි කර තිබේ.

ඉන් අනතුරුව මඩොල්සිම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක විමල් චන්ද්‍රසිරි ප්‍රමුඛ පොලිස් නිලධාරීහු පිරිසක් පුංචි ලෝකාන්තයට පැමිණ සෝදිසි කළත් අතුරුදන් වූ අය හමු නොවූහ.

රැය ගෙවී උදේ එළිය වැටෙද්දී අතුරුදහන් පුද්ගලයා ලෝකාන්තයෙන් පහළ ප්‍රපාතයට වැටුණු බවට එම ස්ථානයේ තිබුණු සාක්ෂි අනුව පොලිසිය සිදු කළ පරීක්ෂණ වලින් සැකයක් ඇති විණි. පසු බදුල්ල යුද හමුදා කඳවුරේ නිලධාරීන්ට අතුරුදන්ව සිටි දිනුර සෙවීමේ වගකීම පැවරිණි.

එතැන් පටන් යුද හමුදා විශේෂ කාර්ය බළකා නිලධාරීන්ගෙන් යුත් කණ්ඩායම් කිහිපයක් ප්‍රදේශයට පැමිණ ප්‍රදේශයේ පැවති ඝන මීදුම, වර්ෂාව හා සුළඟ සමඟ පැවති කළුවර බාධාවක් නොකරගෙන මෙහෙයුම් දියත් කළේය. දින දෙකක් තිස්සේ ලෝකාන්තය ප්‍රදේශයෙන් හා පහළ බිබිල, එගොඩ කොටගම, දොරපොද, රඹක ප්‍රදේශවල ඝන වනය තුළ අතුරුදන් පුද්ගලයා සෙවීමේ මෙහෙයුම් ආරම්භ කළේය. ප්‍රදේශයේ පැවති අධික වර්ෂාව, මීදුම හා අන්ධකාරය නිසා දින දෙකේදීම මෙහෙයුම් කටයුතු අසාර්ථක විය. මෙහෙයුම් සිදු කරද්දී එගොඩ කොටගම ප්‍රදේශයට පැමිණ සිටි අතුරුදන් දිනුරගේ බිරිය වන නීතිඥ ශ්‍රීමාලි ධර්මපාල ඇතුළු පවුලේ ඥාතීන් හා මිතුරන් දිනුර හමුවෙන තෙක් නොඉවසිල්ලෙන් බලා සිටියේය.

යුද හමුදාව දිනුර සොයා මෙහෙයුම් සිදු කරන අයුරු

දිනුරගේ දේහය ගෙන එන අයුරු

සිරුර මීටර් 50ක් පහළට ගන්න පැය 2 1/2 ගිය බව

මෙහෙයුම කළ හමුදා නිලධාරීන් කියයි...

එගොඩ කොටගම ග්‍රාම සේවක හේමන්ත වික්‍රමසිංහ තෙදින තුළම මෙහෙයුමට සහභාගීවූ අයට පහසුකම් සලසයි...

දිනුර සිය බිරිය නීතිඥ ශ්‍රීමාලි ධර්මපාල සමඟ

දිනුර මව සහ සිය සහෝදරයා සමඟ

තුන්වැනි දින යුද හමුදා විශේෂ බළකායේ ගලවා ගැනීමේ කණ්ඩායම් කිහිපයක් පුංචි ලෝකාන්තයට බැස දිනුර සොයන්නට තීරණය කළේය. පුංචි ලෝකාන්තයෙන් පහළට කඹ මගින් එක් කණ්ඩායමක් බසිද්දී තවත් කණ්ඩායමක් එගොඩ කොටගම හරහා ලෝකාන්තය පාමුල මෙහෙයුම් සිදුකළේය. ලෝකාන්තයේ සිට අඩි 1,200ක් පමණ පහළ තිබූ ගල්තලාවක දැඩි හානියට පත්ව තිබූ දිනුරගේ මෘත දේහය සවස 3.30ට පමණ හමු වූයේ එයින් පසුවය.

'මෙම මෙහෙයුම ඉතාම අසීරු ගමනක්. මාර්ගය හරහා කන්දේ බෑවුම වැඩියි. පොඩ්ඩක් හරි ලිස්සුවොත් හොයාගන්න වෙන්නේ නෑ. කොහොම අසීරු වුණත් අපි බාරගත්ත වගකීම අතහැරියේ නෑ. දින තුනක් තිස්සේ වනයේ ගත කළ අත්දැකීම් අමතක වෙන්නේ නෑ' මෙහෙයුම් සංවිධානය කළ විශේෂ බළකා සේනාධිපති බ්‍රිගේඩියර් තුෂාර මහලේකම් පැවසීය.

පුංචි ලෝකාන්තයේ බෑවුමට මායිම්ව තිබූ බිබිල එගොඩ කොටගම ගම්වාසීන්ට ද මේ නව අත්දැකීමෙන් සසල වී සිටියහ. ගමේ ග්‍රාම නිලධාරි හේමන්ත වික්‍රමසිංහ ඇතුළු ගම්මුත් හමුදාවේ සහායට ඉදිරිපත්වූයේ ද ස්වේච්ඡාවෙන්මය. ග්‍රාම නිලධාරි හේමන්ත මහතා යුද හමුදාවේ නිලධාරීන්ට දිවා රාත්‍රියට අවශ්‍ය සියලු පහසුකම් සපයා දී තිබිණ.

09 දින සොයාගත් මෘත දේහය ගල් පර්වත ඇතුළු ඝන කැලෑවක් මැදින් සැතපුම් 8ක පමණ දුරක් වාහනයක් හමුවන තෙක් ගෙන ඒමට තිබූ අසීරුතාව නිසාත් ප්‍රදේශයේ පැවති කළුවර, ඝන මීදුම නිසාත් මෙහෙයුම් සිදුකළ කණ්ඩායම මෘත දේහය වැටී තිබූ ස්ථානයේ එදින රාත්‍රිය නිරාහාරව ගත කර තිබේ.

පසුදින එනම් 10 දින ඕජස් ගලමින් තිබූ දිනුරගේ මෘත දේහය පොලිතීන් බෑගයක ඔතා කරට ගත් නිලධාරීන් පැය තුන හතරක කාලයක් ඝන වනයේ තිබෙන ගස්, වැල්, ගල්, පර්වත, දිය කඩිති මතින් එගොඩ කොටගම ගම්මානය වෙත පැමිණියේය. පසුව පොලිසිය බාරයට ගත් දිනුරගේ මෘත දේහය පී. සී. ආර් පරීක්ෂණයකට ලක්කර මහේස්ත්‍රාත් පරීක්ෂණය හා පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීමට බදුල්ල මහ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කළේය.

යුද හමුදා විශේෂ කාර්ය බළකා නිලධාරීන් විසින් කැලයේ සිට කොටගම ගම්මානයට කර මතින් ගෙනා මෘත දේහය පිළිබඳව මහේස්ත්‍රාත් පරීක්ෂණය හා පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු සඳහා 10 දින සවස මඩොල්සිම පොලිසියට බාරදීමෙන් පසු බදුල්ල මහ රෝහලට ගෙනවිත් මෘත ශරීරාගාරයේ තැන්පත් කිරීමට පොලිසිය කටයුතු කළේය.

පස්සර මහේස්ත්‍රාත් අධිකරණයේ වැඩ බලන මහේස්ත්‍රාත් සරත් වීරසිංහගේ නියෝගය මත මෘත ශරීරය පී.සී.ආර් පරීක්ෂණයකට ලක්කිරීමෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කිරීමට බදුල්ල මහ රෝහලේ අධිකරණ වෛද්‍යවරයාට පැවරිය. පී.සී.ආර් පරීක්ෂණය වාර්තාව අනුව කොරෝනා ආසාදිතයකු නොවුණ නිසා බදුල්ල මහ රෝහලේ අධිකරණ විශේෂඥ වෛද්‍ය රුවිර නදීර විසින් පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීය. එහිදි මරණයට හේතුව ශරීරයේ අභ්‍යන්තර හා බාහිර කොටස් වල බාහු හා අස්ථි බිඳීමෙන් ඇතිවූ බරපතළ තුවාල නිසා සිදුවූ මරණයක් බවට තීන්දු විය.

පසුව මෘත ශරීරය මියගිය අයගේ බිරිය වන නීතිඥ ශ්‍රීමාලි ධර්මපාලට බාරදුන් අතර ආදාහන කටයුතු 12 දින කළුතර මග්ගොන ප්‍රදේශයේදී සිදු කිරීමට නියමිත ය.

ලෝකාන්තයෙන් ප්‍රපාතයට ඇද වැටුණ දිනුර විජේසුන්දරගේ දේහය සොයාගැනීමේ මෙහෙයුම් කටයුතු වලට බදුල්ල යුද හමුදා කඳවුරේ බ්‍රිගේඩියර් අනුර දිසානායක, කර්නල් ප්‍රියන්ත රාජපක්ෂගේ උපදෙස් මත යුද හමුදා විශේෂ කාර්ය බළකා නිලධාරීන් කටයුතු කළේය. ඌව පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රොෂාන් ප්‍රනාන්දුගේ උපදෙස් මත මඩොල්සිම හා බිබිල පොලිස් ස්ථානවල නිලධාරීන්ගේ ද සහාය ලැබිණි. එගොඩ කොටගම ග්‍රාම නිලධාරි හේමන්ත වික්‍රමසිංහගේ ප්‍රධානත්වයෙන් ගම් වැසියන් මෙහෙයුම් කණ්ඩායම් සඳහා අවශ්‍යතා සැපයීය.

ලග්න පලාපල

(2021 පෙබරවාර 14 ඉරිදා සිට 20 සෙනසුරාදා දක්වා)

බොහෝ ප්‍රශ්න ගැටලු විසඳෙනු ඇත. චන්ද්‍රයා 08 වැන්නෙන් ඇරඹෙන මේ සතිය තුනටියට කිසියම් අතුරු ආබාධයක් විය හැකි නමුත් කල්පනාකාරි වුවහොත් එය මඟ හරවා ගත හැකිය. තම පවුලට එකතු වන නව සාමාජිකයකු නිසා පවුලේ සමගිය තහවුරු වනු ඇත.

මේෂ ලග්නය
පවුලේ අය අතර සුහදත්වය

මේෂ ලග්නයට අනුව මෙම සතිය ඔබට දිගටම සුබයි. ආර්ථික ප්‍රතිලාභයත් සමඟ සතුටුදායක ආයෝජනයකට අත පොවයි. කිසියම් ආකාරයක සතුට රජයන ක්‍රියාවකින් ඔබ දිරිමත් කරයි. බොහෝවිට ගම්පියසෙන් දුරස්වීමට වුවද සිදු වෙයි. ශරීරය වෙහෙසා කරන කටයුතු වලින් උපරිම ඵල ලැබෙයි. සතිය මැද ප්‍රිය සම්භාෂණයකට සහභාගි වීමට අවස්ථාව උදා වෙයි. ඒ නිසාම නිවසේ සාමාජික සාමාජිකාවන් අතර සුහදත්වය දලුලන සතියකි.

වෘෂභ ලග්නය
ධනය නිලය උසස් වේ

වෘෂභ ලග්නයට අනුව ඔබට රැකියා ස්ථානගත අභිවෘද්ධිය උදාවන සතියකි. තම කීමට අනුව ප්‍රධානීන් විසින් ක්‍රියාත්මක කරන නව වැඩපිළිවෙළක් සාර්ථක වෙයි. ඒ නිසාම ධනය, නිලය උසස් වනු ඇත. තම විවේකි සුවය සඳහා ආගමික සිද්ධස්ථාන කීපයකට යාමට ඔබට හැකි වේ. ජලාශ්‍රිත උවදුරු පෙනෙන්නට ඇති නිසා ප්‍රවේශම අත්‍යාවශ්‍ය වෙයි. තම සහායට කටයුතු කරන අය වෙතින් ලැබෙන සහයෝග වෙනදාටත් වඩා වැඩිවන සතියකි.

මිථුන ලග්නය
නව ඥාති සබඳතා

මිථුන ලග්නයට අනුව පෙර පින් මහිම මතු වේ. ඉඩම් නිවාස හිමිකම් මතු කෙරේ. තමාගේ සහෝදර සහෝදරියන් වෙතින් සුහදත්වය පළවන වකවානුවකි. උත්සාහයේ තරමට ප්‍රතිඵල උදා වේ. දරුවකු නිසා කිසියම් ප්‍රතිලාභයක් උදාවනු ඇත. ශරීර සෞඛ්‍ය අතින් නම් ප්‍රවේශම් විය යුතුය. දණහිස ආශ්‍රිත කිසියම් අසුඛ තාවයකට තුඩුදීමට ඉඩ ඇත. ඉඩමක් නිසා ඇති වී තිබූ මත ගැටුමක් සමනයකට පත්වේ. නව ඥාති සබඳතා ගොඩනැගෙන සතියකි.

කටක ලග්නය
වැයපස ඉහළ යයි

කටක ලග්නයට අනුව සතිය ආරම්භය අසුබ විය හැකි වුවත් සතිය මැද භාගයේ සිට පාර්ශ්වවල දැඩි කැපවීම ඔබ වෙත යොමුවනු ඇත. සතුරා කවුද, මිතුරා කවුද යන්න දැන ගැනීමට හැකිවන තත්ත්වයක් මතු වේ. සෙසු අය සිය අතේ දුරින් තබාගෙන කටයුතු කිරීමට සිතන්න. තම අත්උදවුකරුවකු විසින් කරන වංචාවක් තමාට හෙළි කර ගැනීමට හැකි වේ. අත්හැර දමා තිබූ කටයුතු අතර අඩක් නිමවා තිබූ නිවෙසක් යළි ගොඩනැගීම සඳහා පසුබිම වැටේ. පිටරටක සිටි ළඟම ඥාතියකු යළි ඔබට සමීප වන ලකුණු පෙනේ. එය සුබවාදි සුසංයෝගයකි.

සිංහ ලග්නය
තම සේවකයකු නිසා ගැටලු

සිංහ ලග්නය හිමි ඔබට මෙම සතිය ආරම්භය හා අවසානය සුබවාදී වෙතත් සතිය මැද භාගය ප්‍රවේශම්ව යා යුතුව ඇත. තම සේවකයකු නිසා ගැටලු සහගත තත්ත්වයක් උදාවීමට පුළුවන. අනුන් ඕනවට වඩා විශ්වාස කිරීම සුදුසු නැත. එහෙත් වන්නට තිබූ විශාල පාඩුවකින් අත් මිදීමට හැකිවීම නිසා ඉදිරි සැලසුම් ක්‍රමානුකූලව කරගෙන යෑමට අවස්ථාව උදා වේ. උගුරේ ආසාදිත තත්ත්වයක් ද පෙන්නුම් කරන නිසා අධික සීතල ආහාරපාන අවම කිරීම සුබ වෙයි.

කන්‍යා ලග්නය
කටයුතු රැසක් සාර්ථක වේ

කන්‍යා ලග්නයට අනුව ඔබට මෙම සතිය ආරම්භයේ ගැටලු කීපයකට මුහුණ දීමට සිදු වුවත් සතිය මැද භාගයේ සිට දිගටම සුබයි. මංගල යෝග උදාවීම, මෙතෙක් යුග දිවියේ පැවතුණු ගැටලු නිරාකරණය වීම ඒ අතර වෙයි. තමාට ඇලුම් කරන ආදරය කරන කෙනෙකු ඍජුවම තමාට සිය කැමැත්ත ප්‍රකාශ කිරීම නිසා සිතේ සතුට ඇති කෙරෙන අතර ඉදිරි කටයුතු රැසක සාර්ථක නිමාවක් දැකීමට ඔබට හැකිවෙයි.

තුලා ලග්නය
නව අපේක්ෂාවක් ඉටු වේ

තුලා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතිය සමබර කෙරෙන සතියකි. දරුඵල අපේක්ෂා කරන අයට වාසනාවන්ත දරු සම්පත් ද නව රැකියා ආයෝජනවලට අවස්ථා ද උදා වෙයි. යටි බඩේ කිසියම් ආසාදිතයක් නැතහොත් දැඩි උෂ්ණතාව නිසා මතු කෙරෙන පීඩාකාරි තත්ත්වයක් උද්ගත විය හැකිය. කෙසේ නමුදු තම ජීවිතයට නව අපේක්ෂාවන් එකතු වන අතර සාර්ථක යුග දිවියකට ද මඟ පෑදෙනු ඇත. සතිය අවසානයේ කිසියම් ආර්ථික පාඩුවක් ඇති විය හැකි නිසා කල්පනාකාරි වන්න.

වෘශ්චික ලග්නය
දරුවන්ගේ කටයුතු වෙනුවෙන් යොමු වේ

වෘශ්චික ලග්නය හිමි ඔබට වාහන, ඉඩම්, නිවාස හා කිසියම් ආර්ථික ප්‍රතිලාභයක් සමඟ සතිය ආරම්භ වේ. බොහෝ දෙනෙකු ඔබගේ කටයුතු වලට අත් උදවු ලබා දේ. ඒ සඳහා මූල්‍ය පහසුකම් ද බාධාවකින් තොරව හිමි වනු ඇත. දරුවන්ගේ කටයුතු වෙනුවෙන් දැඩි කැපවීමක් කිරීමට පෙලඹෙන සතියකි. ඉඩමක් නිසා මැදිවී සිටි නීති ගැටලුවකින් නිදහස් වීමට හැකි වේ තම සහකරුට හෝ සහකාරියට එල්ලවන චෝදනාවකින් නිදහස් වීමට පුළුවන් වේ. රාජ්‍යතාන්ත්‍රික ඇප උපකාර ද නොඅඩුව ලැබෙනු ඇත.

ධනු ලග්නය
ශක්තිමත් ඥාති සබඳතා

ධනු ලග්නයට අනුව ඔබගේ කටයුතු බාධාවකින් තොරව ඉදිරියට ගලා යයි. තම ඥාති

මකර ලග්නය
අධිෂ්ඨානය සහිත පියවරක්

මකර ලග්නය හිමි ඔබට මෙම සතිය අන් සියලු ලග්නවලට වඩා සුබවාදි වෙයි. තම ආදායම් තත්ත්වය ඉහළ යාම, ඒ ආදායම් කිසියම් ප්‍රයෝජනවත් කටයුත්තකට යොමු කිරීම ආදි යහපත්කම් උදා වේ. ඉඩම් ලාභ හා වාහන නිවාස ලාභ මෙන්ම යටපත්ව තිබූ ධන සම්පතක් යළි ඔබට හිමි වෙමින් වාසනාව උදාවන අතර ගෘහ ජීවිතය ඉතා සුබවාදි වෙයි.

කුම්භ ලග්නය
ණය මුදල් ප්‍රතිලාභ හිමි වේ

කුම්භ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා ලග්නයේ සිට ගමන් ආරම්භ කරන නිසා සිතේ සතුට සමාදානය මතු කෙරෙන අතර නිර්මාණශීලී අදහස් උදහස් ජය ලබන බව පෙනේ. ඒ අනුව ග්‍රන්ථකරණය පිළිබඳ තිබූ අරමුණක් මුඳුන්පත් කර ගැනීමට හැකි වේ. විවාහ අපේක්ෂාවෙන් සිටින අයගේ තම බලාපොරොත්තු ඉටුවනු ඇත.

මීන ලග්නය
විවාහ ගැටලුවලට විසඳුම්

මීන ලග්නයට අනුව ඔබේ කේන්ද්‍රයේ චන්ද්‍රයා 12 වැන්නේ සිට ආරම්භ කරන සතිය දින දෙකතුනක් සිතට යම් අසහනකාරී අදහස් උදහස් කීපයක් මතු කෙරෙන අතර සතිය මැද භාගයේ සිට සතිය අවසානය තෙක් සුබවාදි වෙයි. විවාහ ස්ථානගත ගැටලු පැවතුණේ නම් ඒවා සමනය වී සිතට සැහැල්ලුවක් උදා කෙරේ. තම එදිනෙදා කටයුතු අතර රැකියාවට අමතර ආදායම් මාර්ගයක් පැදීම හා තමාට ලැබීමට තිබී අන් සතුවූ දේපළක් යළි තමාට හිමි වන ලකුණු පෙනේ.

පකිස්ථාන් අගමැතිගේ ජයග්‍රාහී ඉණිම

පිටුව 18

බෙල්ලන්විල තෙන්නිමන් වැනසෙයි

පිටුව 21

විජය ඝාතකයාගේ පැටිකිරිය

පිටුව 23

ගෑස් පහෙන් ඇරඹුණු ගෑස් විප්ලවේ

පිටුව 24

ටෝනි මාටින් ඝාතනයේ සුලමුල හෙළිවුණේ මෙහෙමයි

පරිවේෂණාත්මක සාක්ෂි හා විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව පසුගිය දශක තුනක කාලයක් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නම් වූ ඔහු ලංකාවේ මෙතෙක් ආන්දෝලනයකට තුඩු දුන් නඩු බොහෝමයක රජය වෙනුවෙන් පැමිණිල්ල මෙහෙය වූ හිටපු ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකි. තවත් විටක ඔහු ජූරි සභාව ඇමතීමේ විශිෂ්ටයකු විය. මිරුසුවිල් නඩුව, ඇඹිලිපිටිය සිසු ඝාතනය, කොබෙයිගනේ අවුරුදු කුමාරි ඝාතනය, රගර් ක්‍රීඩක ටෝනි මාටින් ඝාතනය, හෝකන්දර සය පුද්ගල ඝාතනය, බටලන්ද කොමිසම, විනිසුරු සරත් අඹේපිටිය, කටුනේරිය ප්‍රදේශයේ සිදු වූ ද්විත්ව ඝාතන වැනි රට හෙල්ලූ නඩු වෙනුවෙන් ඔහු දැක්වූ දායකත්වය විශිෂ්ටය. සිළුමිණ ඔබ වෙත ගෙන එන්නේ හිටපු ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්නගේ ඒ මතකාවර්ජනයයි.

2015 දෙසැම්බර් 3 වැනිදා ජනාධිපති නිතිඥ සරත් ජයමාන්නයන් සිය 'යළි මැවෙන අපරාධ' ග්‍රන්ථය එළි දැක් වූ අතර එම අගනා ග්‍රන්ථයේ අරටුව වූයේ මෙම රගර් ක්‍රීඩකයාගේ නඩු තීන්දුවයි.

එම ග්‍රන්ථය එළිදැක් වූ පසු කතෘ අඥාත ලිපියක් ලැබෙන්නේ කෘතිය සම්බන්ධයෙන් මෙවැනි අදහසක් මතු කරමිනි. 'මකුළුවකු සියුම් කෙඳි අදිමින් පැටලෙන්නාට මිඳී යා නොහැකි පරිදි පරිපූර්ණ දැලක් වියන්නේ යම් සේද, සිත්තරුවකු කැන්වසයේ හැම සියුම් තැනම එක ලෙස තෙලිතුඩක් මෙහෙයවා මතුකර උත්කෘෂ්ට නිර්මාණයක් මතු කරන්නේ යම් සේද අභිචෝදකයා ද සන්සුන්ව, රටාවකට වියමනක් හෝ පරිපූර්ණ සිතුවමක් කරන්නෙකු බවට පත්විය යුතුය.' දශක තුන හතරකට පෙර එදිරිවීර සරච්චන්ද්‍රයන් සිංහබාහු නාටකයෙන් ගල් ලෙනක් නොවූ වේදිකාව ගල් ලෙනක් කළේ යම් සේද, අපරාධ නඩුවලදී ඒ හා සබැඳි සිදුවීම් කොතරම් අපූරුවට පෙළ ගස්වා විනිසුරු මනසේ සිත්තම් කළ හැකිද යන්න හෙළි කළේ ඔහුගේ මෙම කෘතියෙනි.

රගර් ක්‍රීඩක ටෝනි මාටින්ගේ මරණය සියයට 90 ක්ම භාණ්ඩ මත රඳා පැවතුණු නඩුවක් වන හෙයින් මෙය මෑත යුගයේ පරිවේෂණීය සාක්ෂි මත ඔප්පු කළ විරල නඩුවකි.

සිද්ධිය දිනමිණ පුවත්පත වාර්තාකර තිබුණේ මෙසේය.

ඒ ටෝනිගේ තොප්පියමද? සාක්ෂි මතු වූ හැටි

ටෝනි මාටින් යනු 80 දශකයේ කොළඹ හැව්ලොක් ක්‍රීඩා සමාජයට සම්බන්ධව තරග කළ අවුරුදු 35 ක් වයසැති තරුණ රගර් ක්‍රීඩකයෙකි.

ඔහු වාසය කළේ හැව්ලොක් ක්‍රීඩා සමාජය අසල හයිලෙවල් පාරට මුහුණ ලා පිහිටි නිවසකය. 1986 වසරේ ඝාතනයට ලක්වන තෙක්ම ගත කළේ තනිකඩ ජීවිතයකි. ඔහුගේ නිවස කොටස් දෙකකින් යුතුවිය. එක් කොටසක ඔහු ජීවත් වූ අතර ඇනෙක්සිය කාමරයකින් හා ශාලාවකින් සමන්විත විය. වයෝවෘද්ධ ඔහුගේ මව එම ඇනෙක්සියට යාබද ප්‍රධාන නිවසේ වාසය කළාය. ඇනෙක්සිය ඇතුළතින් මවගේ නිවසට ඇතුළු වීමට දොරක් තිබුණද එම දොර වැසෙන සේ මවගේ නිවසේ අල්මාරියක් තබා තිබුණි. ඇනෙක්සියට ඉදිරියෙන් ඇතුළු වීම සඳහා වෙනමම දොරක්ද, මවගේ නිවසට ඇතුළු වීම සඳහා වෙනමම දොරක්ද විය. මෙම ඇනෙක්සිය හා මවගේ නිවස තාප්පයකින් වටව තිබූ අතර එම භූමියට ඇතුළු වීම සඳහා හයිලෙවල් පාරට මුහුණ ලා අඩි 7 ක් පමණ උසැති ඇතුළතින් අගුළු දැමිය හැකි ගේට්ටුවක් විය.

1986 මැයි 16 වැනිදා අලුයම 2.45 ට පමණ ටෝනිගේ මවට ඇනෙක්සිය පැත්තෙන් ' මමී...මමී.. යනුවෙන් කලබලයක ස්වරූපයෙන් කෑගසන හඬ ඇසී තිබුණි. තම පුතා කරදරයකට මුහුණ දෙන්නේ යැයි අනතුරක සේයාවක් දැනුණු මව හැකි ඉක්මනින් බම්බලපිටිය පොලිසියේ හදිසි ඇමතුම් අංකයට කතා කර තිබුණි. විනාඩි 15 කින් පමණ පොලිස් කණ්ඩායමක් එම ස්ථානයට ළඟා වූ අතර එවිට ඔවුන් මුලින්ම දුටුවේ හයිලෙවල් පාරට මුහුණ ලා ඇති ගේට්ටුව විවෘතව ඇති බවකි. යකඩ ගේට්ටුව වැසූ විට ප්‍රධාන පාරේ සිට බලන්නකුට ගේ ඇතුළත පෙනෙන්නේ නැත. ගේට්ටුවෙන් ඇතුළට යද්දි පොලීසිය දුටුවේ ඇනෙක්සිය ඉදිරිපස කොටසේ ටෝනිගේ වාහනය නතර කර ඇති බවකි. එසේම ඇනෙක්සියට ඇතුළු වන දොර අසල ඇති ජනේලයේ සිට ප්‍රධාන ගේට්ටුව දක්වා වූ පාර ලේ වලින් සමන්විත පාවහන් සලකුණුද විය.

ඇනෙක්සියේ දොරකඩට පැමිණි විට පොලිස් නිලධාරීන් දුටුවේ එහි ඉදිරි දොර වසා ඇති ආකාරයත්, එහි ලී ජනේල රාමුවට සම්බන්ධ කර ඇති යකඩ රාමුව ඉවත් කර බිම දමා තිබූ ආකාරයත්ය. ඒ අනුව යමකු ජනේලයෙන් ඇතුළු වූ හා පිටවී ඇති ආකාරය පැහැදිලිවිය. නමුත් පොලිස් නිලධාරීහුද එම පාරෙන්ම ඇතුළු වුවහොත් ස්පර්ශ සාක්ෂි වෙනස්විය හැකි හෙයින් ඇනෙක්සියට ඇතුළු නොවී මව සිටින ප්‍රධාන නිවසේ දොරකඩට ගොස් ඇයට කතා කර මව කී තොරතුරු අනුව ඇයගේ කාමරයේ වූ අල්මාරිය ඉවත් කර එතැන වූ දොරටුවෙන් ටෝනිගේ ඇනෙක්සියට ඇතුළු විය. ඇනෙක්සියේ පිහිටි ටෝනි මාටින්ගේ කාමරයට ගිය පොලිස් නිලධාරීන්ට පෙනුණේ ටෝනි මාටින් ලේ විලක් මැද මරා දමා තිබූ ආකාරයයි. ඔහුගේ නිරුවත් දේහය ඇඳ අසල වැටී තිබුණු අතර අපරාධකාරයෝ ඒ වන විටත් එතැනින් පලා ගොස් තිබුණි. මෙහි මූලික විමර්ශන පොලිස් පරීක්ෂක ශාන්ති කුමාර, පොලිස් සැරයන් නිලාබ්ඩීන් ඇතුළු පොලිස් නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් අතින් සිදුවිය.

උදේ 9 ට පමණ මහේස්ත්‍රාත්වරයා අපරාධය වූ ස්ථානයට පැමිණි අතර ඔහුගේ නියෝගයෙන් ඇඟිලි සටහන් විශේෂඥයා හා අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය සල්ගාදු ද එම ස්ථානයට කැඳවනු ලැබීය. මූලික නිරීක්ෂණ වලින් පසුව දේහය පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු සඳහා පොලිස් මෘත ශරීරාගාරයට යන්නේ මරණ පරීක්ෂකවරයා විසින් මරණය සිදුවූ ආකාරය පිළිබඳ වාර්තාවක් අධිකරණයට ලබාදිය යුතු බැවිනි. පශ්චාත් මරණ පරීක්ෂණයෙන් අනාවරණය වූයේ මියගිය ටෝනි මාටින්ගේ සිරුරේ තුවාල 88 ක් පමණ ඇති බවකි. මෙයින් බොහෝමයක් තියුණු ආයුධයකින් සිදුවූ ඒවා වන අතර සමහර ඒවා කැපුම් තුවාල විය. එහිදි අනාවරණය වූ වැදගත්ම කරුණ වූයේ ගෙල තියුණු ආයුධයකින් කපා තිබීම හා මිටියක් වැනි ආයුධයකින් නළලට පහර දීමක සලකුණක් තිබීමය. ඊට අමතරව ටෝනි තම ජීවිතය බේරා ගැනීමට අපරාධකාරයන් හා යම් සටනක යෙදුණු බවට කැපුම් තුවාල ඔහුගේ දෑතේ තිබීමය.

අපරාධ වෛද්‍යවරයාගේ නිගමනය වූයේ මෙම තුවාල හේතුවෙන් විනාඩි කිහිපයක් තුළ ඔහුගේ මරණය සිදු වන්නට ඇති බවකි. මෙම නඩුවේ ඇසින් දුටු සාක්ෂිකරුවකු නොවීය.

ටෝනි මාටින්ගේ දේහය වැටී තිබුණේ ඔහුගේ කාමරයේ බිම වූ කළාලය මතය. එහි දැඟලීමේ සලකුණුද විය. මේ අතර ඇඟිලි සටහන් පරීක්ෂණ කටයුතුද ආරම්භ විය. ඇඟිලි සටහන් කාර්යාලයේ අතිරේක පරීක්ෂක පොලිස් පරීක්ෂක මුතුබණ්ඩා, උප පොලිස් පරීක්ෂක ජයසිංහ මෙන්ම ඡායාරූප ශිල්පි පොලිස් සැරයන් බැසිල් බර්ට්‍රම් ඇතුළු ඇඟිලි සටහන් පරීක්ෂණ කණ්ඩායම විසින් මුළු ඇනෙක්සියම පිරික්සන්නට වූයේ සැක කටයුතු ඇඟිලි සටහන් පිරික්සීමටය. ඔහුගේ නිවසේ වූ ඇඟිලි සටහන් මරණකරුගේ මෙන්ම එහි ආගිය අයගේ ඒවාද තිබිය හැකි බැවින් මේ කටයුතු සිදු කෙරුණේ ඉතා සුපරීක්ෂාකාරි ලෙසය. මේ අතර ටෝනිගේ ඇනෙක්සියේ කාමරයට ඇතුළු වන දොර අසල බිත්තියේ ලේ යැයි සැක කටයුතු තෙත් සහිත යැයි අනුමාන කළ හැකි පැල්ලමක් විය. එයද ඡායාරූපගත කළ අතර අදාළ ස්ථානවල අංක සහිත ලේබල් ගැසීමද සිදුවිය. රජයේ රස පරීක්ෂක ද පැමිණ අදාළ පරීක්ෂණ කටයුතු සිදු කළ අතර ටෝනිගේ මවගෙන් මේ නිවසට ආගිය පුද්ගලයන් පිළිබඳ අනාවරණය කර ගන්නට පොලීසියට හැකිවිය. ජයසේන නම් සේවකයා ගැන තොරතුරු මතුවන්නේ මෙම ප්‍රශ්න කිරීම්වලදීය.

තනියම ජීවත් වූ ටෝනිගේ නිවස අස්පස් කිරීමේ කාර්යය සඳහා එන ජයසේන නැමැත්තෙක් විය. ඔහු දවල් කාලයේ කොළඹ ජාතික රෝහලේ කම්කරුවකු ලෙස සේවය කර සවස් කාලයේ ඇනෙක්සියට පැමිණ එය සුද්ධ පවිත්‍ර කොට රාත්‍රියට නිදා ගැනීමට යන්නේ ටෝනි ට අයත් නුගේගොඩ පිහිටි නිවෙසකටය. 1986 මැයි මස 14 වැනිදාත් ඔහු රාත්‍රිය දක්වා ටෝනිගේ නිවසේ නාන කාමරයේ රෙදි සෝදමින් සිට ඇති අතර එදින රාත්‍රී 10.30 ට පමණ ටෝනිගේ ඇනෙක්සියේ දොරකඩට පැමිණි යමකු ටෝනි...ටෝනි ... කියා කතා කරන හඬ ඇසී ඇත. එවිට ටෝනි ජයසේනට පවසා ඇත්තේ "චීනා ඇවිත් කතා කරනවා. එක්කන් එන්න "කියාය. ඔහු ජනේලය අසලට පැමිණ මිදුල දෙස බලන විට දැක ඇත්තේ මෙම නඩුවේ 2 වැනි විත්තිකරු වන ජයසේන දන්නා හඳුනන ' චීනා' හෙවත් චුයි පොං ෂික් සමඟ තවත් අයකු පැමිණ ඇති බවකි. ඔහු මේ නඩුවේ 1 වන විත්තිකරු වන රිකාඩෝ බ්‍රැඩ්ලි කීගල්ය. ජයසේන 1 විත්තිකරුව දැක නොතිබුණු අතර නැවත ගෙට ගොස් ටෝනිට පැවැසූයේ චීනා පමණක් නොව වෙනත් අයකුද පැමිණ ඇති බවකි. එවිට ටෝනි පවසා ඇත්තේ චීනා පමණක් එක්කා ගෙන එන ලෙසත් අනෙකාට නිවසේ ඉදිරිපස වූ ශාලාවේ වාඩි වී සිටීමට සලස්වන ලෙසත්ය. ඉදිරිපස දොරටුව අසලට පැමිණි ජයසේන දෙනොටම නිවසට පැමිණෙන ලෙස ආරාධනා කර 1 වැනි විත්තිකරු සාලයේ වාඩි කරවා දෙවැනි විත්තිකරු පමණක් ඇනෙක්සියේ පිටුපසට වන්නට පිහිටි ටෝනිගේ කාමරයට ගෙන ගොස් ජයසේන පෙරළා පැමිණ සාලයේ නතර වීය. අනතුරුව 2 වැනි විත්තිකරු ටෝනි සමඟ සාකච්ඡාවෙන් පිටත්ව ගොස් ඇත. මේ දෙදෙනා ජැකට් දෙකක් හැඳ තිබූ අතර අතේ හෙල්මට් දෙකක් විය. මේ නිසාවෙන් ඔවුන් දෙදෙනා පසුපසින් ගේට්ටුව

දක්වා ගිය ජයසේනට පෙනුණේ ඔවුන්ට යන්නට මෝටර් බයිසිකලයක් නැති බවත් දෙදෙනාම පාර දිගේ ඇවිද ගිය බවත්ය.

මෙහිදී තවත් ප්‍රහේලිකාවක් ජයසේනට මතු වන්නට විය. සවස ජයසේන ටෝනිගේ නිවසට පැමිණ තිබුණේ ඇතුළතින් ගේට්ටුවේ අඟුල ලා ගෙනය. මේ නිසා ගේට්ටුවට එළියෙන් අත දමා යමකුට ගේට්ටුව විවෘත කිරීම අපහසු බව ජයසේනගේ සාක්ෂියේදි ප්‍රකාශ විය. තමන්ට මතුවූ සැකය ජයසේන එවලේම ගෙට ගොස් ටෝනිට පවසා ඇති අතර ටෝනිගේ පිළිතුර වි ඇත්තේ " චීනා මගෙන් සල්ලි වගයක් ගත්තා. ඒකට ඇපයක් විදියට වාහනයේ පොත තිබුණේ මා ගාව. මම අද දවල් ඒ පොත ඉල්ලුවා. ඒ ගැන කතා කරන්නයි ආවේ..." යනුවෙනි. 14 වැනිදා මේ දෙදෙනා පැමිණි ඇත්තේ ඝාතනය සිදු කිරීමට වන අතර නැවත හැරී යන්නේ එදින ජයසේන සිටි නිසාවෙනි.

මේ සිදුවීමෙන් පසු චීනා අතුරුදහන් වන අතර, ඔහු තම යහළුවකු වන ඉම්රාන්ගේ හැඳුනුම්කම මත යන්නේ කෑගල්ලේ පිහිටි යහළුවකුගේ නිවසටය. මේ අතර පසුදින පුවත්පත්වල හැව්ලොක් ක්‍රීඩා සමාජයේ සමාජිකයකු මරා දැමූ ආකාරය ඔහුට පෙන්වන්නේ එම නිවැසියන්වමය. ඔහු ටෝනි දන්න වගක්වත් නිවැසියන්ට නොහැඟෙන්නට වග බලා ගන්නා අතර; ඒ සිදුවීමෙන් අනතුරුව නැවතත් ඔහු කොළඹට පැමිණ තැනින් තැන සැඟවී සිටින්නේය. දින 10 කට පසු 2 වැනි විත්කරු සිය කාරයත් සමඟ අත්අඩංගුවට පත්වන අතර ඔහුගේ ඇඟිලි අතර සුවවෙමින් පවතින තුවාලයක්ද විය. මහාචාර්ය සල්ගාදු යටතේ මේ පිළිබඳව ද පරීක්ෂණ සිදුවන්නට විය. මේ අතර 1 වැනි විත්තිකරු අත්අඩංගුවට පත්වන අතර ඝාතනය සම්බන්ධයෙන් වැදගත් තොරතුරක් මතු වන්නේ අපරාධ බිමෙනි. ඒ ටෝනි වැටී සිටිය තැනින් හමුවන පොලු කැබලි තුනකිනි. පොලිසිය ඉන්පසුව යන්නේ සැක කටයුතු 1 වැනි විත්තිකරුගේ නිවසටය. 1 වැනි විත්තිකරුගේ නිවසේ කනප්පුවක් වෙයි. එහි කකුල් 3 න් මේ වන විට තිබී ඇත්තේ දෙකක් පමණි. අනතුරුව මෙම සැක කටයුතු පොලු කැබලි තුනත්, කනප්පුවත් මුට්ටු සාක්ෂි පිළිබඳ විශේෂඥයන්ට යොමු වන්නේ ඔවුන් තුළ මේ පිළිබඳව ඇති හසල දැනුම නිසාය. එවකට අතිරේක රජයේ රස පරීක්ෂක ඒ. ආර්. එල්. විජයසේකර, එදිරිසිංහ හා ජයවීර යන නිලධාරීන්ගේ සැසඳීම්වලට අනුව මෙය කනප්පුවේ එක් කකුලක් බවට සනාථ කර ගන්නට හැකිවිය. ඒ කනප්පුවේ සිදුරේ විශ්කම්භය, වර්ණය ආදි භෞතික ලක්ෂණය සැසඳීමෙනි.

ටෝනිගේ මෘත දේහය ඉවත් කළ විට එහි කළාලය යට වූ මිටියක් සොයා ගන්නට අපරාධ විමර්ශකයන්ට හැකිවිය. එම මිටිය යකඩ හිසකින් සමන්විත වූ නමුත් එහි අල්ලන ලී කොටස කැඩී ගොස් තිබුණි. එම කොටස අපරාධ වූ ස්ථානයේ දක්නට නොතිබුණි. නමුත්

අපරාධය වූ සැණින් එම ස්ථානය නිරීක්ෂණය කළ වෛද්‍ය සල්ගාදුට එම මිටිය නිරීක්ෂණයට හසුව තිබුණේ නැත. මෙය විත්තියේ නීතිඥයන්ට සතුටට කරුණක් වුවද එය කෙසේ හෝ බිඳ දැමීම පැමිණිල්ලට සිදු වන්නේය. කෙසේ වෙතත් අදාළ ස්ථානයේ වූ මිටිය පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ අධිකරණ වෛද්‍යවරයාට ටෝනිගේ දේහය සමඟ ලැබෙන අතර; ඔහු ඥාණාන්විතව එම මිටිය දේහය මත තබා ඡායාරූපයක්ද ගෙන තිබූ අතර; එම ඡායාරූපය භාණ්ඩ ලැයිස්තුවට ඉදිරිපත් කිරීමට මහාධිකරණය අවසර දුන්නේය. මෘත දේහයේ වූ තුවාල අතරින් නළලේ වූ කවාකාර හැඩයකින් සමන්විත තැලුම් තුවාලයක් තිබුණු අතර; එම තුවාලයට යටින් පිහිටි හිස් කබල පුපුරා ගොස් තිබුණි. මිටියේ පරිධිය, තුවාලයේ පරිධිය හා තුවාලයේ හැඩය අනුව පශ්චාත් මරණ පරීක්ෂකවරයා තීරණය කළේ මෙය මිටියෙන් සිදු කර ඇති බවකි.

ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ මූලික විමර්ශණවලින් පසුව මේ වන විට කොළඹ මහාධිකරණයේ අංක 2 යටතේ නඩුව විභාගයට ගැනෙන්නේය. පැමිණිල්ල මෙහෙයවන්නේ එවකට රජයේ අධි නීතිඥ සරත් ජයමාන්නය.

මේ අතර 1 වන විත්තිකරු අපරාධය වූ ස්ථානයේ සිට එකතු කර ගත් සියලු දේ මල්ලක දමා එය වැල්ලවත්ත වූ ධර්මාරාම ඇළකට විසිකර තිබුණි. ඔහුගේ මඟ පෙන්වීම මත එය සොයා ගත් අතර එහි තිබී අපරාධ ස්ථානයේ තිබී හමුවූ මිටියෙන් කැඩුණු ලී කොටස යැයි සැක කළ කොටසක් හමු විය. මෙම ඝාතනයේ දෙවැනි විත්තිකරුවද අපරාධය සිදුවී දින 10 කට පසු අත්අඩංගුවට ගන්නා අතර; ඔහු විසින් පෙන් වූ පරිදි ධර්මාරාම පාරේ ඇළක තිබී තවත් මල්ලක් සොයා ගත්තේය. මරණකරුට අයත් යැයි සැක කළ හැකි තොප්පියක්ද, ජැකට්ටුවක්ද ඒ තුළ තිබී ඇණ කිහිපයක්ද හමුවිය. සාක්ෂි ආඥා පනතේ 25 වන වගන්තියට අනුව විත්තිකරුවන්ගේ ප්‍රකාශ මත යම් භාණ්ඩයක් සොයා ගත්තේ නම් එය නඩුවට අදාළ නම් පැමිණිල්ලේ සාක්ෂියට ඉදිරිපත් කළ හැකි වෙයි. මල්ලේ තිබී සොයා ගත් මිට හා මිටියේ කොටස් මූට්ටු විශේෂඥයන්ට යවන අතර; ඔවුන් ඒ දෙකම එකක් බවට සනාථ කර ගන්නේය. මීට අමතරව සොයා ගත් කැප් තොප්පිය ටෝනිගේ බවට ඔප්පු කිරීම ඊළඟ අභියෝගය විය. මේ වන විට විත්තිය වෙනුවෙන් ජනාධිපති නීතිඥ අර්ඩ්ලි පෙරේරා හා ආර්.අයි අබේසේකර පෙනී සිටියහ. පැමිණිල්ලේ නීතිඥයන්ට තවත් අභියෝගයක් වූයේ මේ වන විට ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ ඇති වූ ගින්නකින් නඩු භාණ්ඩ විනාශ වී ගොස් තිබීමය. නමුත් සියල්ල ලේඛනගතව තිබීම පැමිණිල්ලේ වාසියට හේතුවක් විය.

කැප් තොප්පිය ටෝනිගේ බවට සනාථ වූයේ ජයසේනගේ සාක්ෂි විමසීමේදීය. රජයේ අධි නීතිඥ සරත් ජයමාන්නයන්ගේ ප්‍රශ්න කිරීම් හා ජයසේනගේ පිළිතුරු දිම් සිදුවූයේ මේ ආකාරයෙනි.

"ටෝනිගේ නිවසේ ඇඳුම් හෝඳන්නේ තමාද? - ඔව්"

"ඔහු උදේට මොකද කරන්නේ? - දුවන්න ගොල්ෆේස් එකට යනවා"

"උදේට පිනි බානවට දාන්නේ මොනවද?- තොප්පියක් දාගෙන යන්නේ'

"මොනවගේ එකක්ද?- කැප් තොප්පියක්"

පැමිණිල්ලේ සාක්ෂි විමසීමෙන් අනතුරුව අර්ඩ්ලි පෙරේරාගේ හරස් ප්‍රශ්න විමසීම ආරම්භ විය.

"තමන් වැඩකරන ටවුන් හෝල් එකේ ජාතික රෝහල ඉදිරිපිට පෙට්ටි කඩ තියෙනවා නේද?-ඔව්"

"එහි එල්ලපු ඇඳුම්, තොප්පි තියෙනවද?- ඔව්"

"එයත් මේ තොප්පියත් එකවගේ නේද? - ඔව්"

"එහෙනම් මේක ටෝනිගේ කියා කියන්න බැහැ නේද? - ඇයි සර් එහෙම කියන්නේ. මේ තොප්පියේ ඉස්සරහ ඉරුණා. මමමයි එක්ස්රේ කොළයක් දාලා මේක මහගෙන ආවේ.." විත්තිය දැඩි අපහසුතාවට පත්කරමින් මෙම තොප්පිය ටෝනිගේ බවට සනාථ විය.

රගර් ක්‍රීඩක ටෝනි මාටින්ගේ ඝාතන නඩුවේ දෙවැනි විත්තිකරුගේ ඇඟිලි අතර තිබී සිරීම් තුවාලයක්ද, කැපුම් තුවාලයක්ද අධිකරණ වෛද්‍යවරයාට නිරීක්ෂණය විය. ඔහුගේ මතය වූයේ එම විත්තිකරු පිහියකින් මරණකරුට පහරදීමේදී එයින් ආරක්ෂා වීමට මරණකරු දැරූ ප්‍රයත්නයේදි විත්තිකරු අතේ වූ පිහියකින් තුවාල සිදුවී ඇති බවකි.

1 හා 2 වැනි විත්කරුවන්ට විරුද්ධ පැමිණිල්ලේ සාක්ෂි අවසන් වූ පසු විත්තිකරුට තමාට අවශ්‍ය නම් තම ස්ථාවරය දැක්වීමට අවස්ථාව දීමට විනිසුරු තීරණය කළේය. ඒ අනුව පළමු විත්තිකරුගේ ප්‍රකාශය වූයේ මේ ආකාරයෙනි." මම මිනිමැරුම කළේ නැහැ. එදා මම ක්ලබ් එකට ගිහින් ගෙදර ගියා. කාරයේ දොර අරින කොට මගේ ගෙදර බල්ලා ඇවිත් ඇඟට පැනලා මාව සීරුවා. ඒ නිසයි අත තුවාල වුණේ..?"

රජයේ අධිනීතිඥ සරත් ජයමාන්න සිය අවසන් දේශනයේදි විත්තිවාචිකයට ප්‍රතිප්‍රහාර දුන් ආකාරය හා විනිසුරු මනසේ සිදුවීම් පෙළ සිත්තම් කළ ආකාරය ලබන සතියේ

කනප්පුවේ අතුරුදහන් කකුල තුනට කැඩී අපරාධ බිමෙන් හමුවෙයි

ටෝනි මාටින්ගේ ඝාතනය සිදුවූ කාමරය

ටෝනි මාටින් ඝාතනය සිදුවීමෙන් පසු දර්ශනය



1. නාන කාමරය
2. මරණකරුගේ ඇඳ
3. රූපවාහිනිය
4. බුමුතුරුණුව
5. මරණකරුගේ කාමරයට ඇතුළුවන දොර
6. මෙට්ට දැමූ පුටුවක්
7. කඩා දැමූ ටෙලිෆෝනය
8. යකඩ සේප්පුව
9. කුඩා මේසය
10. මවගේ කාමරයේ අල්මාරිය
11. මවගේ කාමරය
12. ඇනෙක්සියට ඇතුළුවන දොර
13. ආලින්දයේ පුටු සැටිය
14. ජනේල
15. ගලවා දමා තිබා තිබූ ජනේල ග්‍රිල් එක
16. මරණකරුගේ වාහනය නවතන ස්ථානය
17. ඇනෙක්සියට ඇතුළුවන ගෙට්ටුව

• ටිරෝනි වෑවලගේ

ක්‍රිකට් ජයගෙන, රටත් දිනවන්නට වෙහෙසෙන පකිස්ථාන අගමැති ඉම්රාන් ඛාන්

1992 ලෝක එක්දින ක්‍රිකට් තරග ශූරතාවය දිනූ නායකයා වන ඉම්රාන් ඛාන්

එම 1992 වසරය. ලංකාවේ අපට මෙන්ම දකුණු ආසියාව පුරාම ක්‍රිකට් උන්මාදය දරුණුවට පැතිරගොස් අවසන්ය. ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් ක්‍රිකට් ක්‍රීඩාංගණය ක්‍රිකට් ලෝලීන්ගෙන් පිරී තිබුණේ එම වසරේ ක්‍රිකට් ලෝක කුසලාන අවසන් මහා තරගය සඳහා තරග වදින එංගලන්තය සහ පකිස්ථානය අතර තරගය දැක බලා ගැනීමටය. ඒ වන විටත් ඔහු 39වැනි වියේ පසුවූයේය. එම තරගය මගහැරුණේ නම් ඔහුට යළිත් ක්‍රිකට් ලෝක කුසලානයක් ක්‍රීඩා කිරීමට අවස්ථාව නොලැබෙන්නට ඉඩ තිබිණි. එහෙත් ඔහු ලැබෙන අවස්ථාවක් එසේ පහසුවෙන් අතහැර ගන්නා වර්ගයේ පුද්ගලයකු නොවේ. අවසන් තරගය දක්වා දැක්වූ දස්කම් හේතුවෙන් පකිස්ථාන ක්‍රීඩකයන් තුළ ඒ වන විට මනා විශ්වාසයක්ද ගොඩ නැගී තිබිණි. ඔහු ආරම්භක පිතිකරුවකු ලෙස පිටියට ගොස් එක් කළ ලකුණු 72 කොන්ක්‍රිට් පදනමක් වැනි ශක්තියක් කණ්ඩායමට ලබා දුන්නේ ක්‍රීඩකයන්ගේ මානසිකත්වය තවදුරටත් ඉහළ දමමිනි.

අවසානයේ එකින් එක එංගලන්ත ක්‍රීඩකයන් පකිස්ථාන පන්දු යවන්නන් විසින් ක්‍රීඩාගාරය දක්වා හරවා යැවෙද්දී එංගලන්ත අවසන් කඩුල්ල ඔහු දවා ගන්නේ එවර ලෝක කුසලානය වෙනුවෙන් ඔහුගේ වන අයිතිවාසිකම තහවුරු කරමිනි.

ඔහු එදා තමා නිරත වී සිටි ක්‍රීඩාවේ උපරිමය තම රටට ලබා දුන්නේ එසේය. එයින් සෑහීමකට පත් වූ ඔහු වියපත්ව ක්‍රිකට් අත්හැර තම ජීවිතයේ වෙනත් අරමුණු ඔස්සේ කටයුතු කරමින් සිටියේය. එහෙත් ඔහුට එසේ බලා සිටින්නට බැරි තරමට පකිස්ථානය දුක් විඳිමින් සිටියේය. වරින් වර බලයට පැමිණි පාලකයෝ පකිස්ථානය අගාදයට ඇද දමමින් සිටියහ. ලෝක බලවතුන්ගේ බළල් අතක් ලෙස ඔවුන්ට ඕනෑ හැටියට නැටවෙන්නට පකිස්ථානයට සිදුවී තිබිණි. ඔහු

තම නිසල ජීවිතයට නැවතීමේ තිත තැබුවේය. මහා දේශපාලන ජීවිතයක මුල් පිටුව පෙරළූ ඔහු මහා වගකීම් කන්දරාවක්ද සමඟ පකිස්ථානයේ බර තම කර මතට ගත්තේය.

ඉම්රාන් ඛාන් නම් වූ එදා මෙල්බර්න් පිටිය දෙවනත් කළ ඒ පැහැපත් හීන්දැරි තරුණයා අදත් බාහිර පෙනුමේ වැඩි වෙනසකින් තොරව දේශපාලන පිටියේ දස්කම් දක්වමින් සිටින්නේය.

වර්ෂ 1952 දී පකිස්ථානයේ පෙෂාවර්හි පශ්තූන් පවුලක එකම පිරිමි දරුවා වූ ඉම්රාන් උපතින්ම දක්ෂයකු වූයේය. ඔහු නිරතවූයේ යමකද එය දක්ෂ ලෙස කිරීමේ හැකියාවක් ඔහු සතු විය. අධ්‍යාපනය ලබන අතරම ක්‍රිකට් වෙනුවෙන් තමා තුළ පවතින දක්ෂතාව හඳුනාගත් ඉම්රාන්ට වයස 18දී පූර්ණ කාලීන ක්‍රිකට් ක්‍රීඩකයකු වීමේ වරම හිමි විය. ක්‍රීඩාවේ උපරිමය දක්වා ගොස් විශ්‍රාම ගත් ඔහුගේ ජීවන ඉලක්ක අතර පකිස්ථාන් ජනතාව වෙනුවෙන් යම් මෙහෙයක් කිරීමද විය. ඔහු තම මව අනුස්මරණය කරමින් රෝහල් ඉදි කිරීමේ මහා කර්තව්‍යයට අත ගැසූ අතර ඔහුට පිළිකා රෝහලක්ද ඇතුළුව රෝහල් තුනක් පකිස්ථාන ජනතාවට තිළිණ කිරීමට හැකියාව ලැබිණි.

ඔහු දේශපාලනයට පිවිසෙන්නේ ඉන් පසුවය. ඔහුට මුල සිටම ඔහුගේම වූ දර්ශනයක් විය. තමන් කෙරෙහි වූ විශ්වාසය හේතුවෙන්ම ඔහු තමාගේම ඉලක්ක මත කටයුතු කළේය.

කාගේ හෝ අඩි පාරේ යාම, කාගේවත් බළල් අතක් වීම ඔහු මුල සිටම ප්‍රතික්ෂේප කළේය. ඔහු තමන්ගේම කියා දේශපාලන පක්ෂයක්ද පිහිටුවා ගන්නේ ඒ අනුවය. ඔහු ඉල්ලා සිටියේ නම් ඕනෑම දේශපාලන පක්ෂයක් ඔහු සාදරයෙන් තම පිළට කැඳවා ගනු ඇත. එහෙත් ඔහු ඒ සියල්ල ප්‍රතික්ෂේප කර තමන්ගේම ගමනක් සංවිධානය කර සිටියේය.

ඔහු 1996 වසරේදී තමන්ගේ නායකත්වයෙන් යුත් පකිස්තාන් තරීක් ඉ - ඉන්සාෆ් පක්ෂය පිහිටුවා ගත්තේය. ඒ වන විටත් පකිස්තානය තුළ ප්‍රධාන පක්ෂ දෙකක් වූ අතර, ඒ පක්ෂ දෙක තට්ටු මාරු ක්‍රමයට රට පාලනය කරමින් සිටියේය. ඉම්රාන් ඛාන් කියන පුද්ගලයා තනි මිනිසකු ලෙස කෙතරම් බලවත්ද යත්, ඉතා කෙටි කලක් ඇතුළත තම දේශපාලන පක්ෂය රටේ ප්‍රධාන පක්ෂ දෙක සමඟ කරට කර තැබීමටත්, තවත් කෙටි කාලයක් ඇතුළත පැවති ප්‍රධාන පක්ෂ දෙකම පසු කරමින් ජනතා ආකර්ෂණය මත ආණ්ඩුවක් පිහිටුවීමටත් හැකියාව ලබා ගත්තේය.

ඒ වන විට පකිස්ථානයේ දේශපාලනඥයන්ගේ අමනෝඥ ක්‍රියා ජනතාවට තිත්ත වී තිබූ අතර, ඔවුන් වංචා, දූෂණ මගින් ගොඩ ගසාගත් මුදල් කන්දරාවන් මිස රටට, ජනතාවට කළ සේවයක් නොමැති බව ජනතාව හොඳින් තේරුම් ගෙන තිබුණහ. ඒ බව තේරුම් ගැනීමට තරම් බුද්ධියක් පකිස්ථාන ජනතාවට විය. නවාස් ශරීෆ් මූල්‍ය වංචා හේතුවෙන් සිරගත වන විට, ඇමරිකානු සහයෙන් කළ හමුදා කුමන්ත්‍රණයෙන් බලයට පැමිණි පර්වේස් මුෂාරෆ් ටද දූෂණ චෝදනා එල්ල වන විට ජනතාව තමන් වෙතට දිගු කෙරෙමින් පැවති ඉම්රාන් ගේ දේශපාලන හස්තයේ නිරායාසයෙන්ම එල්ලීමට කටයුතු කළහ.

ඉම්රාන් පකිස්ථානයේ 22වැනි අගමැතිවරයා වන්නේ එසේය. එහෙත් 2018 දී ඉම්රාන් අගමැති පුටුවට පැමිණෙන විට පකිස්ථානයට ඉතිරිව තිබුණේ මහා ණය කන්දක් සහ දේශසීමාව සඳහන් වූ බිම් කඩක් පමණි. එහෙත් මුල සිට පටන් ගැනීමට ඉම්රාන්ට අපහසුවක් වූයේ නැත.

ඔහු රට තුළ දේශපාලන මෙන්ම ආර්ථික ප්‍රතිසංස්කරණද ආරම්භ කළේය. ඔහු බලයට පැමිණෙන විට රටේ ගෙවුම් ශේෂය පවැතියේ සතියක කාලයක වැය පියවා ගැනීමට පමණක් විය. ඔහු වහාම මිතුරන්ගෙන් උපකාර ඉල්ලා සිටියේය. උපකාර ද හිමි විය. එහෙත් ඒ උපකාරවලට හිලව්වට රටේ කැලි විකිණීමට ඉම්රාන් කටයුතු කළේ නැත.

ඔහු පටි තද කර ගන්නා ලෙස ඉල්ලා සිටියේය. ඒ රටේ ජනතාවගෙන් නොවේය. තම ඇමති මණ්ඩලයෙනි. සුඛෝපභෝගී මෝටර් රථ ඇමති මණ්ඩලයට ලබා දීම ප්‍රතික්ෂේප කර සිටියේය. තම නිවසේද ඇතුළුව ඇමති මණ්ඩලයේ සෑම කෙනෙකුගේම නිවෙස්වල කිරි හරකෙක් ඇති කිරීමට ඔහු අනුබල දුන්නේ ස්වයං පෝෂණය නිවසෙන් ඇරඹීමට අවවාද නොව ආදර්ශ ලබා දෙමිනි.

ණය උගුලක හිර වූ රටට නායකත්වය දීම අභියෝගයක් කොට ගනිමින් ප්‍රථමයෙන්ම ඉම්රාන් අසීරු පියවර රාශියකින් තරමක් ස්ථිර පදනමක් කරා රට රැගෙන ඒමට සමත් වූයේය. එමගින් රටේ මූල්‍ය තත්ත්වය තරමක් ස්ථායී තත්ත්වයක පවත්වා ගැනීමටද ඔහුට හැකියාව ලැබිණි.

ඔහුම මූලිකත්වය ගනිමින් වංචා, දූෂණවලට වැට බැඳීමේ මහා වැඩපිළිවෙළක් ආරම්භ කළේය. පෙර සිටි පාලකයන්ම වංචා දූෂණ සිදු කරනු ලබා සිටි පකිස්ථාන ජනතාවට ඉම්රාන්ගේ අවංක වැඩ පිළිවෙළ ආශිර්වාදයක්ම විය. රටේ අනාගතය ගැන සිතූ ඔහු පරිසර හිතකාමී බලශක්ති ප්‍රභවයන් රට තුළ ස්ථාපිත කිරීමේ මහා වැඩපිළිවෙළක් ආරම්භ කළේය. වන වගාවට මුල් තැන දුන්නේය. රටේ පැවති වනෝද්‍යාන ආරක්ෂා කිරීමට නීති සම්පාදනය කළේය. වනාන්තර ආරක්ෂා කිරීමට කටයුතු කළේය. බඳු වංචාකරුවන් කෙරෙහි නීතිය තදින් ක්‍රියාත්මක කරමින් බඳු එකතු කිරීමේ වැඩපිළිවෙළ ප්‍රතිසංස්කරණය කළේය. පකිස්ථානයේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රවල වර්ධනයට කෙසේ හෝ මුදල් වෙන් කිරීමට කටයුතු කළේය. මේ සියල්ල කිරීමට ණය බරින් මිරිකෙමින් තිබූ පකිස්තාන ආර්ථිකයෙන් මුදල් සොයා ගැනීමට ඉම්රාන් හැකි විය. එයට ප්‍රධාන හේතුව ඔහු මුදල් වංචා නොකිරීම විය. රජ කරවන්නට පරපුරක් නොතිබූ ඉම්රාන් මුළු පකිස්ථාන ජනතාවටම සැබෑ පියෙකු විය.

තරුණ වියේදී ඉම්රාන් බොහෝ විනෝදමත් ජීවිතයක් ගත කළ අයෙකි. ඔහුට බොහෝ පෙම්වතියෝද වූයේ ක්‍රිකට් ක්‍රීඩාවෙන් ලැබුණු ජනප්‍රියත්වය නිසාවෙන්මය. කොටින්ම කිවහොත් හිටපු පකිස්ථාන අගමැතිනි බෙනාසීර් භුතෝද ඉම්රාන්ගේ පෙම්වතියන්ගේ ලැයිස්තුවේ වූ බවට කසුකුසු ඇසෙන්නට ලැබී තිබේ.

ඉම්රාන් ඛාන් ගේ ප්‍රථම දියණිය උපත ලබා ඇත්තේද ඔහු සමඟ නිත්‍යානුකූලව විවාපත් නොවූ කාන්තාවක් සමඟ පැවති සම්බන්ධයකිනි.

පසුව ඔහුට වෙනත් කාන්තාවන්ගෙන් ලැබුණු තවත් දරුවන් සිටින බව ලොස් ඇන්ජලිස් අධිකරණයකදී ප්‍රකාශ වූයේ මෙලෙස ඉම්රාන්ගේ දරුවකුට මවක වූ කාන්තාවක් පැවරූ නඩු විභාගයක් අතරතුරදීය.

කෙසේ වුවද ඉම්රාන් නිත්‍යානුකූල විවාහ තුනක් සිදු කර ගත්තේය.

ඉම්රාන් ඛාන් ස්වකීය ප්‍රථම කසාදය සිදුකර ගත්තේද බොහෝ කල් බලා ඉවසිල්ලේ සිටීමෙන් පසුවය. ඇය ජෙමීමා ගොල්ඩ්ස්මිත් නම් වූ බ්‍රිතාන්‍ය ජාතික කාන්තාවකි. ඇයගේ පියාගෙන්ද ඇයට විශාල ධනයක් උරුමව තිබූ අතර ඇය ජනමාධ්‍ය ඇතුළු වෘත්තීන් කිහිපයකම නිතර වූවාය. විවාහයෙන් පසු ඇය ඉස්ලාම් ආගම වැලඳගත් අතර, ඉම්රාන්ට පුතුන් දෙදෙනෙක්ද ලබා දුන්නාය. පසුව පකිස්ථාන ජීවිතයට හුරු වීමේ අපහසුතාව හේතු කොට ගනිමින් ජෙමීමා ඉම්රාන්ගෙන් දික්කසාද වූවාය.

ඉම්රාන් ඉන්සපු විවාහ කර ගත්තේ රේහම් ඛාන් ය. ඇය බ්‍රිතාන්‍ය පකිස්ථාන මිශ්‍ර පවුලක සාමාජිකාවක් වූ අතර, මාධ්‍යවේදිනියක්, සිනමා අධ්‍යක්ෂිකාවක් ද වූවාය. ඇයගෙන් ද දික්කසාද වූ ඉම්රාන් පකිස්ථානයේ අගමැදි වීමට මාස හයකට පෙර බුෂ්රා බිබී සමඟද විවාපත් වූයේය.

මෙලෙස ඉතා අපහසුවෙන් පකිස්ථාන ආර්ථිකය ගොඩ නඟන විට කඩාපාත්වුණු කොවිඩ් වසංගතයෙන් යළි දැවැන්ත අභියෝගයකට මුහුණ දීමට ඉම්රාන්ට සිදුවිය. එහෙත් ඔහු පැවති දැඩි සීමාකම් මැද ජනතා ජීවිත ආරක්ෂා කිරීමට කටයුතු කළේය.

ලෝකයට අසාධිතයන් සංඛ්‍යාව සම්බන්ධව බොරු සංඛ්‍යා ලේඛන ඉදිරිපත් නොකළ ඉම්රාන් දුගී බව අතර වසංගතයක් සමඟ සටන් කරන්නේ කෙසේද යන්නට ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් පැසසුම් ලැබුවේය.

කෙතරම් මූල්‍ය අපහසුතා තිබුණද ඔහු පසුගිය වසරේ නොවැම්බර් වන විට ඩොලර් මිලියන 900ක මුදලක් වෙනර කරමින් පවසා සිටියේ කොවිඩ් වෙනුවෙන් පැමිණෙන පළමු එන්නත තම ජනතාවට ලබා දී ජීවිත ආරක්ෂා කිරීමට කටයුතු කරන බවයි.

ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි ස්වකීය දෙවැනි ධූර කාලය සඳහා ජනවරම ඉල්ලීමට ඔන්න මෙන්න කියා තිබියදී ඇටවූ කාශ්මීර යුද උණුසුමට ඉම්රාන් ඛාන් මෛත්‍රියෙන් පිළිතුරු දුන්නේය. තම ජනතාවට බෝම්බ දැමීමට පැමිණ කඩා වැටුණු ඉන්දීය යානයේ නියමුවා ගෞරවයෙන් සහ ආරක්ෂිතව ඉන්දියාවට යළි බාර දුන් ඉම්රාන් දේශපාලන ඉවසීම මෙන්ම, අනුන් කපන උගුල්වල නොවැටීම සම්බන්ධයෙන්ද ලෝක මට්ටමේ උදාහරණ අතරට එක් වූයේය.

ඉතින් එවන් වූ අපූරු නායකයකු නුදුරේදී අප රටට පැමිණීමට නියමිතය. අපි ඔහු ගෞරවයෙන් පිළිගන්නේ ඔහු ගෞරවය ලැබීමට ඉතා සුදුසු නායකයකුද වන නිසාවෙන්මය.

- 1952 - ලාහෝර් හිදී සිවිල් ඉංජිනේරු ඉක්රාමුල්ලා බාන්ගේ එකම පිරිමි දරුවා ලෙස උපත ලැබීය.
- 1992 - පකිස්ථාන ක්‍රිකට් කණ්ඩායමේ නායකයා ලෙස ලෝක කුසලානය දිනා ගැනීමට දායකත්වය සැපයීය.
- 1996 - පකිස්ථාන ටෙහ්රීක් ඉ - ඉන්සාෆ් දේශපාලන පක්ෂය පිහිටුවීය.
- 2002 - ප්‍රථම වරට එරට පාර්ලිමේන්තුව නියෝජනය කිරීමේ අවස්ථාව දිනා ගත්තේය.
- 2018 - පකිස්ථානයේ 22වැනි අගමැතිවරයා ලෙස තේරී පත්විය.

පාකිස්ථානය

අගනුවර - ඉස්ලාමාබාද් විශාලතම නගරය - කරච්චි

භාවිත වන භාෂා - ඉංග්‍රීසි, උර්දු, පශ්තූන්, පන්ජාබි

ආගම - ජනගහනයෙන් සියයට 96.28ක ආගම ඉස්ලාම් වේ

ඩොමීනියන් නිදහස ලැබීම - 1947 අගෝස්තු 14

ඉස්ලාමීය ජනරජයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම - 1956 මාර්තු 23

භූමි ප්‍රමාණය - 8,81, 913 වර්ග කිලෝමීටර්

ජනගහනය - 207.8 මිලියන (2017 වන විට)

මුදල් ඒකකය - පකිස්ථාන රුපියල

යුග යුග බැඳි ඉපැරණි මිතුදමක අසිරිය

පාකිස්ථාන අගමැති ලබන 22දා ශ්‍රී ලංකාවට

24දා පාර්ලිමේන්තුව අමතයි

ජිනීවා මානව හිමිකම් සමුළුවේදී පාකිස්ථානයේ සහාය ශ්‍රී ලංකාවට

ඔවුන් වහරන්නේ උර්දු බසයි. එම බසට අනුව පකිස්ථානය යනු 'නිර්මල දේශය'යන්නයි. ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් තම යටි අරමුණු වෙනුවෙන් දෙකඩ කරන ලද බිම් කඩක ඔවුහු මේ නිර්මල දේශය ගොඩනැඟූහ. ඒ ගොඩනැඟුණු දේශයෙන් සැමදා ශ්‍රී ලංකාව වෙත මිත්‍රත්වයේ දෑතම දිගු විය. පකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර පවතින ද්විපාර්ශ්වික සබඳතාවල විශේෂ ස්වභාවය වන්නේ එකී මිත්‍රත්වයමය.

භූමි ප්‍රමාණය අතින් එතරම් විශාල නොවූවද ලෝකයේ වැඩිම ජනගහනය අතින් පස්වැනි තැන දිනා ගැනීමට පකිස්ථානය සමත් වී තිබේ.

එමෙන්ම ලෝකයේ සත්වැනි විශාලම හමුදා බලයද පකිස්ථානය සතුය. ලොව බලවත්ම ඉස්ලාම් රාජ්‍ය අතරට කලක් එක්ව සිටි පකිස්ථානය විසිවැනි සියවසේ අගභාගය වන විට න්‍යෂ්ටික බලය ලබා ගැනීමේ ආසන්න අවස්ථාවේ පසුවීමට තරම් ශක්තිමත් රටක් විය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිෂේධ බලය හිමි රටවල් අතරට පකිස්ථානයද එක් විය යුතු යැයි එම යුගයේදී දිගින් දිගටම යෝජනා විය.

එහෙත් වසර 2000න් පසුව ලෝක දේශපාලනයේ සිදුවූ වෙනස් වීම් මත දුෂ්කර කාලයක් ගෙවීමට පකිස්ථානයට සිදුවූ අතර ආර්ථිකමය මෙන්ම සමාජයීය වශයෙන්ද පීඩාවට පත්වීමට එරට ජනනතාවට සිදු විය.

එහෙත් ඒ කිනම් තත්ත්වයක් යටතේ වුවද ශ්‍රී ලංකාව සමඟ පැවති ශක්තිමත් මිත්‍රත්වයට හානි වීමට දෙරටම කිසිඳු ඉඩක් දුන්නේ නැත. ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය පැවති අවස්ථාවේ පකිස්ථානය ශ්‍රී ලංකාවට නිතර යුද ආධාර ලබා දීමට ඉදිරිපත් විය. එකල ශ්‍රී ලංකා හමුදාවට අවශ්‍ය බොහෝ අවි ආයුධ මිලදී ගැනීම සිදුවූයේ පකිස්ථානයෙනි. කිනම් බාධක පැමිණියද පකිස්ථානය නොකඩවා ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන්ට යුද පුහුණුව ලබා දීමට කටයුතු යෙදීය.

එපමණක්ද නොව එල්ටීටීඊ හිතවාදීන්ගෙ උසිගැන්වීම් මත බටහිර රටවල් ශ්‍රී ලංකාවට මානව හිමිකම් චෝදනා එල්ල කළ සෑම අවස්ථාවකදීම පකිස්ථානය ශ්‍රී ලංකාවේ ආරක්ෂාව වෙනුවෙන් ඉදිරිපත් විය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී අඛණ්ඩව ශ්‍රී ලංකාව වෙනුවෙන් පෙනී සිටි එකම රට පකිස්ථානය විය.

ස්වභාවික විපත් අවස්ථාවලදීද දෙරට හුවමාරු කරගත් මිත්‍රත්වය අවියෝජනීය විය. බොහෝ අවස්ථාවලදී පකිස්ථානය බලවතා මෙන්ම ධනවතාද වූ අතර ශ්‍රී ලංකාවට සහෝදරත්වයෙන් සැලකීමට කටයුතු යොදනු දැකගත හැකි විය.

පෙරළා ශ්‍රී ලංකාවෙන් ලැබෙන වාසි අවම වුවද පකිස්ථානය කිසිදා ශ්‍රී ලංකාව සමඟ ඇති මිත්‍රත්වය අවැඩදායී සේ නොසලකනු දැක ගත හැකි විය.

ඇමරිකාවට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව පකිස්ථානයට ත්‍රස්ත තර්ජනවලට මුහුණ දීමට සිදුවිය. අසල්වැසි ඇෆ්ගනිස්ථානය ඇමරිකානු හමුදා ප්‍රහාර සහ තලේබාන් ප්‍රතිප්‍රහාරවලින් බිමට සමතලා වන විට පකිස්ථානයට ඒවායේ අතුරු ප්‍රතිඵලවලින් මිදීමට හැකියාවක් ලැබුණේ නැත.

එමෙන්ම ඉරාකය ඇතුළු මුස්ලිම් ලෝකයට එල්ල වූ ප්‍රහාර හමුවේ පකිස්ථාන ආර්ථිකයටද බලවත් හානි සිදුවිය.

අන්තවාදී ඉස්ලාම් සංවිධාන පකිස්ථාන සාමාන්‍ය ජන ජීවිතය උඩු යටිකුරු කර දමද්දී එරට ආර්ථිකය තවදුරටත් ශක්තිමත් වූයේ නැත.

උදාහරණ ලෙස 2009 වසරේ ලාහෝර් නගරයේදී එරට සංචාරයක නිරත වෙමින් සිටි ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට අන්තවාදී ඉස්ලාම් කණ්ඩායමකින් එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය දැක්විය හැකිය. එම ප්‍රහාරයෙන් පසු පකිස්තාන ක්‍රිකට් ක්‍රීඩාවට අත්වූ කණගාටුදායක ඉරණමෙන් මිදීමට තවත් බොහෝ කල් ගත විය.

මේ වන විට ශක්තිමත් නායකත්වයක් යටතේ පකිස්ථානය යළි ශක්තිමත්ව නැගී සිටිමින් පවතින බව පැහැදිලිවම දක්නට තිබේ. එරට ආර්ථිකය ශක්තිමත් වෙමින් පවතින අතර, කොවිඩ් වසංගතයෙන් පසු තවදුරටත් ශක්තිමත් ආර්ථිකයක් පවත්වා ගැනීමට පකිස්ථාන නායකත්වයට හැකියාව ලැබෙනු ඇති බවට අනාවැකි කල්තබාම පැවසිය හැකිය.

සාක් කලාපීය සාමාජික සුහදත්වය මෙන්ම ඉපැරණි මිත්‍රත්වයද, අසල්වැසි සබැඳියාවද ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර දිගු කාලීන බැඳීමට හේතු ලෙස දැක්විය හැකිය. දෙරට අතර පවතින ආනයන අපනයන ශක්තිමත් තත්ත්වයක පවතින අතර දෙරටම එකිනෙකා මත පරායත්ත වන්නේද, එකී පරායත්තභාවය තවදුරටත් ශක්තිමත් වන්නේද මේ ඉපැරණි මිත්‍රත්වයම හේතුකොටගෙන බව පැවසිය හැකිය.

ඇමරිකානු නව ජනපති ජෝ බයිඩන් සමඟ පිළිසඳරක යෙදුණු අවස්ථාවක්

දේශපාලන කඹයේ සර්කස් පෙන්නන තුර්කියේ එර්දගොන්

දේශපාලනය යනු කඹය මත දක්වන සර්කස් ක්‍රීඩාවක් වැනිය. අති සියුම්ව, මනා සංයමයකින් යුක්තව ඉවසීමෙන් කඹය මත ගමන් කරන සර්කස් ක්‍රීඩකයා සාර්ථකව කඹයේ කෙළවරට පැමිණෙන්නේය. දේශපාලනයද එවැනිමය. විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය යනු කකුලෙන් ඇදිම්, වෙට්ටු දැමීම් රාශියක් මැද නොසැලී පාලනය ගෙන යෑමය. මෙවැනි වටාපිටාවක ලෝක දේශපාලනයේ ප්‍රබලයන් අතරට මැදිවීම යනු තත්ත්වය තවත් බැරෑරුම් වීමකි.

> මේ දිනවල එර්දගොන්ට ස්වකීය පාලනයේ ප්‍රථමවරට දැවැන්ත විරෝධතාවන්ට මුහුණ දීමට සිදුවී තිබේ. ඒ විරෝධතා එල්ල වෙමින් පවතින්නේ තුර්කි උසස් අධ්‍යාපන සිසුන්ගෙනි. ඔවුන්ගෙ චෝදනාව වී ඇත්තේ එර්දගොන් ඉතා සූක්ෂ්මව රටේ ප්‍රබල තනතුරුවලට තමන්ගේ හිතවාදීන් පත්කර ගන්නා බවයි. පසුගියදා ඉස්තාන්බුල් සරසවියේ රෙක්ටර්වරයා ලෙස එර්දගොන්ගෙ හිතවාදියකු පත් කිරීමත් සමඟ මේ විරෝධතා ආරම්භ වූ අතර, දින කිහිපයක් පුරා එම විරෝධතා පාලනය කර ගත නොහැකි තරම ප්‍රබලව ඇවිළී ගියේය.

තුර්කි ජනාධිපති එර්දගොන් ද එවැනි සාර්ථක දේශපාලන සර්කස් ක්‍රීඩකයෙකි. ඔහු පසුගිය වසර කිහිපය පුරාවටම නොසැලී කඹය මත දස්කම් දක්වන්නේ එක් පසෙකින් රුසියාවත්, අනෙක් පසින් ඇමරිකාවත් කඹය තදින් සොලවද්දීය. දැන් ඒ මදිවාට මේ දිනවල තුර්කි උසස් අධ්‍යාපනය ලබන සිසුන්ද එර්දගොන්ගේ කඹය සෙලවීමට දායක වෙමින් සිටිති. මේ සියල්ල මැද එර්දගොන් තවමත් නොදැවී දේශපාලන පිටියේ ලකුණු රැස් කරමින් සිටින්නේය.

රුසියානු ජනාධිපති එර්දගොන් ගැන පැවසීමට කරුණු බොහෝය. ඔහු දේශපාලනයේ හොඳින් තෙම්පරාදු වූවෙකි.

තුර්කියේ අගනුවර වන ඉස්තාන්බුල්හි නගරාධිපති ලෙස සේවය කිරීමෙන් පසු, තුර්කි අගමැති ලෙස සේවය කිරීමෙන් පසු ජනාධිපති ධූරයට පැමිණි එර්දගොන් මනා දේශපාලන දැනුමකින් සහ ඉවකින් යුතු පුද්ගලයකු ලෙස හඳුනා ගත හැකිය. දේශපාලනයේ තමන්ටම මාවතක් තනා ගැනීමේ අවශ්‍යතාවයෙන් පෙළුණු එර්දගොන් 2001 වසරේදී සාධාරණය සහ සංවර්ධන පක්ෂය යනුවෙන් තුර්කියේ නව දේශපාලන පක්ෂයක්ද පිහිටුවා ගන්නේය. 2014දී ඔහු ජනාධිපති දක්වා පැමිණෙන්නේ මේ පක්ෂයේ කර මතිනි.

එර්දගොන් ගේ පාලනය විශේෂ වන්නේ ඔහුගෙ අසල්වැසි රාජ්‍යයන්ගේ පැවති දේශපාලන වාතාවරණයට සාපේක්ෂවය.

තුර්කියට යාබදව පිහිටි ඉරාකය ඇමරිකන් හමුදා විසින් බිමට සමතලා කරන අතර, ඉරාකයට යාබද ඉරානයද කලාපීය චණ්ඩියා ලෙස ඇමරිකාවට අභියෝග කරමින් සිටින්නේය. මේ අතර අරාබි වසන්තය යටතේ ලිබියාව ඇතුළු රටවල් රැසක පාලනයන් පෙරළා දැමෙන්නේය. යාබද සිරියාවේ ගොඩනැගෙන අන්තවාදී ඉස්ලාම් කණ්ඩායම් සිරියාව යුද බිමක් කරන අතර ඇමරිකාව මෙන්ම රුසියානු හමුදාද ඉස්ලාමීය අන්තවාදීන්ට බැට දෙන්නේ සිරියාව සුසාන භූමියක් බවට පත් කරමිනි.

ස්වකීය අසල්වැසියන් මෙලෙස කනගාටුදායක අත්දැකීම් ලබමින් සිටියදී තුර්කිය පමණක් සාර්ථක ඉදිරි ගමනක නියැළෙන්නීය. එසේ වීමට එර්දගොන්ගේ නිසඟ දේශපාලන දැක්ම බෙහෙවින් උපකාරී වූ බව පැවසිය යුතුමය.

එර්දගොන් ඇමරිකාවෙන් චෝදනා ලබන්නේ රුසියාවේ පුටින් පාලනයට බොහෝ හිතවත්කම් සහිත බව පවසිමිනි. එහෙත් එර්දගොන් ඇමරිකාවට ද හිතවත්ය. එපමණක්ද නොව එර්දගොන් තම තුර්කි භූමියේ පමණක් නොව අවටද ක්‍රියාත්මක වන ඉස්ලාමීය සංවිධාන සමඟද හිතවත්ය.

ඔහු තම විදේශ ප්‍රතිපත්තිය හඳුන්වාදෙන්නේ 'නව ඔටෝමාන්' විදේශ ප්‍රතිපත්තිය යනුවෙනි. ඔටෝමාන් තුර්කීන් යනු මැද පෙරදිග කලාපය අතික්‍රමණය කළ ආක්‍රමණශීලී පිරිසකි. එර්දගොන් ගේ ආක්‍රමණය ඉතා සියුම්ය. ඔහුට විදේශ ආක්‍රමණය කිරීමේ අරමුණක් නැතිවද තම රටේ මුල් බැස ගැනීමේ අරමුණ ඉතා බලවත්ය. එබැවින් ඔහු අසල්වාසී රටවල ගිනි තම ගෙන ගනිමින් - නොගනිමින්, බලවතුන්ගේ සිත් රිදවමින් - නොරිදවමින් ඉතා සියුම් ගමනක නිතර වෙමින් සිටින්නේය.

එර්දගොන් යන මේ ගමන ඉතා අසීරු බව අමුතුවෙන් කිව යුතු නොවේ. ඔහු මූලිකව රුසියානු නායක පුටින්ට සහයෝගය දැක්වූ බව සැබෑය. සිරියාවේ මුස්ලිම් අන්තවාදීන් මර්දනයට ඇමරිකාව පස්ස ගැසූ විට ඉදිරියට පැමිණි පුටින් අයිඑස් ත්‍රස්තවාදීන්ට රිදෙන්නට ගැහුවේය.

ඒ සඳහා පුටින්ගෙ හමුදාවලට සහය සේවා ලැබුණේ තුර්කියෙනි. පුටින් ලද අවසරයෙන් මිසයිල නාශක රුසියානු අවි තුර්කියේ ස්ථාපිත කිරීමට කටයුතු කළ අතර ඒවා ඉවත් කරන ලෙස ට්‍රම්ප් පාලනය නිතර එර්දගොන්ට කන්කෙඳිරි ගෑවේය. දැන් බයිඩන් පාලනයද එසේ කිරීමට පටන් ගෙන ඇති නමුත් එර්දගොන් ඒ සියල්ලන්ට සැනසිය හැකි පිළිතුරු දෙමින්,එහෙත් මිසයිල නාශක අවි ඉවත් කිරීම කල් දමමින් සිටින්නේය.

දැන් මේ දිනවල එර්දගොන්ට ස්වකීය පාලනයේ ප්‍රථමවරට දැවැන්ත විරෝධතාවන්ට මුහුණ දීමට සිදුවී තිබේ. ඒ විරෝධතා එල්ල වෙමින් පවතින්නේ තුර්කි උසස් අධ්‍යාපන සිසුන්ගෙනි. ඔවුන්ගේ චෝදනාව වී ඇත්තේ එර්දගොන් ඉතා සූක්ෂ්මව රටේ ප්‍රබල තනතුරුවලට තමන්ගේ හිතවාදීන් පත්කර ගන්නා බවයි. පසුගියදා ඉස්තාන්බුල් සරසවියේ රෙක්ටර්වරයා ලෙස එර්දගොන්ගෙ හිතවාදියකු පත් කිරීමත් සමඟ මේ විරෝධතා ආරම්භ වූ අතර, දින කිහිපයක් පුරා එම විරෝධතා පාලනය කර ගත නොහැකි තරම ප්‍රබලව ඇවිළී ගියේය.

පසුගිය සතියේ පමණක් ඉස්තාන්බුල් නගරයෙන් සිසුන් 250කට අධික පිරිසක් සහ අන්කරා නගරයෙන් 69ක පිරිසක් අත්අඩංගුවට ගැනීමට කටයුතු කළද විරෝධතාකරුවන් පාලනය කර ගැනීමට පොලීසිය පසුගිය සතිය අවසාන වන විටත් සමත් වී තිබුණේ නැත. සිසුන්ගේ සහයට සරසවි අධ්‍යයන කාර්ය මණ්ඩලද එක්වීමෙන් තත්ත්වය තවත් බැරෑරුම් වූ අතර මේ වන විට මාසයක පමණ කාලයක් පුරා විරෝධතා පැවැත්වෙමින් තිබෙන්නේය.

මේ විරෝධතා සම්බන්ධව තම මතය පවසමින් එර්දගොන් කියා සිටියේ විරෝධතාකරුවන් සිසුන් නොව 'ත්‍රස්තවාදීන්' බවයි. එමෙන්ම මෙවැනි විරෝධතාවලින් තමා බියපත් කිරීමට නොහැකි බවද එර්දගොන් වැඩිදුරටත් පැවසීමට අමතක කළේ නැත. මෙවැනි ක්‍රියා මගින් තුර්කියේ 'ජාතික අධ්‍යාත්මික වටිනාකම්වලට හානි වීමට ඉඩ දිය නොහැකි බවද' ඔහු පවසා සිටියේය.

එර්දගොන් එසේ පවසා සිටියද තුර්කිය පවතින්නේ වතුර රත්වෙමින් පවතින හැළියක් තුළ බවට බොහෝ සාක්ෂි පවතින්නේය.

වසංගතයට පෙර සිටම එරට රැකියා වියුක්තිය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවති අතර, එයට වැඩියෙන්ම මුහුණ දුන්නේ සරසවි අධ්‍යාපනය අවසන් කළ පිරිසයි. මේ වන විට තුර්කියේ රැකියා වියුක්තිය සියයට 29 දක්වා ඉහළ නැඟ තිබේ. සියයට 37.9ක් උපාධිධාරීන් පිරිසක් රැකියා වියුක්තියෙන් පසුවන බවට නවතම වාර්තා ද ලැබී තිබේ.

තත්වය මෙසේ වන විට එර්දගොන් තම ඉදිරි සැලසුම් කෙසේ සකස් කරනු ඇතිද යන පැනය මතු වේ. එර්දගොන් යනු අන්තර්ජාතික ගැටුම් අතර හිස බේරාගෙන සිටි පාලකයෙකි. එබැවින් තම පාලනයේ පවතින රටතුළ අභ්‍යන්තර ගැටුම් ඔහුට ගැටලුවක් වේදැයි සිතීම උගහටය. කෙසේ වුවද දේශපාලනය යනු කඹය මත දක්වන සර්කස් රංගනයකි. අඩිය ලිස්සා ගිය හොත් කොයි මොහොතේ බිම පතිත වේ දැයි පැවසිය නොහැකිය.

සක්වළගල

වීරෝනි වෑවලගේ

ප්‍රසංගයට පෙර විරාමයක්

පසුගිය මාසයේදී රොයිටර් සමාගමට සේවය ලබා දුන් ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පීන් ඉදිරිපත් කළ සියලුම ඡායාරූප අතරින් හොඳම පුවත් ඡායාරූපය ලෙස ප්‍රථම ස්ථානය මේ ඡායාරූපයට හිමි විය. හිටපු ඇමරිකානු ජනාධිපතිවරයාට එරෙහිව දෙවැනි දෝෂාභියෝගය ඉදිරිපත් වූ අවස්ථාවේ එයට ජනතා විරෝධතා එල්ල වෙතැයි යන සැකය මත කැඳවා තිබූ අති විශාල හමුදා භට පිරිස් තම රාජකාරි ඇරඹීමට පෙර කැපිටල් ගොඩනැගිල්ල ඇතුළත මඳක් විවේකයෙන් රැඳී සිටියේ මෙසේය.

මියන්මාර ජනතාව හමුදා පාලනයට එරෙහිව විරෝධතාවල

මියන්මාරයේ පාලනය හමුදාව විසින් අත්පත් කර ගැනීමෙන් මේ වන විට සති දෙකක් ඉක්ම ගොස් තිබේ. දක්නට ලැබෙන අති සුවිශේෂී කරුණ වන්නේ එරට ජනතාව ඉතා ධෛර්යමත්ව හමුදා පාලනයට එරෙහිව විරෝධතා පැවැත්වීමට එක්වීමය.

රටේ පාලනය හමුදාව විසින් අත්පත් කර ගැනීමත් සමඟ රටින් පිට, විශේෂයෙන්ම ගිණිකොන ආසියානු රටවල ජනතාව සමඟ එක්වූ මියන්මාර් දයස්පෝරාව හමුදා පාලනයට එරෙහිව විරෝධතා පැවැත්වූවද එය රට තුළ ව්‍යාප්ත වීමට සතියක පමණ කාලයක් ගත විය.

මේ වන විට එරට ජනතාව හමුදා පාලනයට එරෙහිව විරෝධතා පැවැත්වීමට තරම් ධෛර්යමත් වී තිබේ. රැන්ගුන් ඇතුළු ප්‍රධාන නගරවලට එක්වූ ජනතාව මේ වන විට අඛණ්ඩව සතියක පමණ කාලයක් පුරා විරෝධතා පවත්වමින් සිටිති.

විරෝධතා පාලනය කිරීමට හමුදා පාලනය සිදු කළ ප්‍රථම ක්‍රියාව වූයේ රට තුළ සමාජ මාධ්‍ය තහනම් කිරීමයි. එහෙත් එසේ කිරීමෙන් විරෝධතා මර්දනය කිරීමට උත්සාහ කළද තවමත් ඔවුන් ප්‍රගතියක් අත් කර ගැනීමට සමත්ව නැත.

එමෙන්ම අවුන් සාන් සුකීගේ දේශපාලන පක්ෂ කාර්යාලය බිමට සමතලා කර දැමීමටද හමුදා පාලනය පසුගියදා කටයුතු යෙදීය.

ගොඩනැගිලි බිමට සමතලා කිරීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය අතුගා දැමිය හැකි යැයි සිතන හමුදා පාලන චින්තනය සම්බන්ධව එරට ජනතාවට පැහැදිලි අවබෝධයක් ඇතැයි සිතෙන්නේ අඛණ්ඩ ජනතා උද්ඝෝෂණ දෙස බැලූ විටය.

මේ වන විට ලොව පුරා රටවල් රැසක රාජ්‍ය නායකයෝ මියන්මාරයේ බල පෙරැළිය විවේචනයට ලක් කර ඇති අතර චීනයද ඒ අතර සිටීම ඉතා සුවිශේෂ කරුණක්ව තිබේ.

ලොව වටා

ඉන්දියාවට කඩා වැටුණු ග්ලැසියරය

උතුරු ඉන්දියාවේ උත්තරාකන්ද ප්‍රදේශයේ පසුගියදා මහා ජලගැලීමකට මුහුණ දීමට සිදුවිය. කිසිඳු පූර්ව ලක්ෂණයකින් තොරව ඉතාම හදිසියේ සිදුවූ මේ ජලගැලීමට හේතුව වී තිබුණේ හිමාලය කඳු ආශ්‍රිතව සිදුවූ ග්ලැසියර කඩා වැටීමකි.

ගම් දනව් යට කරමින්, පාලම් කඩා බිඳ දමමින් ක්ෂණිගව ගලා ආ මේ මහා ජල ධාරාව වැඩියෙන්ම හානි සිදු කරණු ලැබුවේ උත්තරාකන්ද් ප්‍රදේශයේ ජල විදුලි බලාගාරයක් ඉදි කරමින් සිටි කම්කරුවන් පිරිසකටය. ජල ගැලීම හේතුවෙන් කොටුවූ එහි සේවකයන් පිරිසක් මේ වන විට මුදා ගැනීමට සමත්ව තිබුණද 170කට අධික පිරිසක් තවමත් අතුරුදන්ව ඇතැයි ප්‍රකාශිතය.

ඇස්ට්‍රාසෙනෙකා නවත්තන්න එපා ලෝක සෞඛ්‍ය සංවිධානය කියයි

දකුණු අප්‍රිකාවේ පැතිර යන කොවිඩ් වයිරස ප්‍රභේදයට ප්‍රතිශක්තිය ඇති නොකළද දැනට ලොව පුරා රටවල එන්නත් කෙරෙමින් පවතින ඇස්ට්‍රාසෙනෙකා එන්නත නවත්වා දැමිය යුතු නැති බව ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දී තිබේ. දකුණු අප්‍රිකානු වයිරස් ප්‍රභේදයට ප්‍රතිශක්තිය ඇති නොකරන බව දැනුම්වත් වීමත් සමගම එරට ජොහැන්නස්බර්ග් නගරයේ සිදු කෙරෙමින් පැවති ඇස්ට්‍රාසෙනෙකා එන්නත් කරන වැඩපිළිවෙළ නවත්වා දැමීමට එරට බලධාරීන් කටයුතු යෙදීය.

එහෙත් ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන්නේ සෙසු රටවල සිදු කෙරෙමින් පවතින එන්නත්කරණ මේ හේතුවෙන් නවත්වා දැමිය යුතු නොවන බවයි. කොවිඩ් වයිරසයේ සෙසු ප්‍රභේදවලට ඇස්ට්‍රාසෙනෙකා එන්නත මනාව ප්‍රතිශක්තිය ඇති කරන බැවින් එසේ නවතා දැමිය යුතු නොවන බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ අදහස වී තිබේ. මේ වන විට ලෝකයේ දුගී රටවල් බහුතරයක ලබා දෙමින් පවතින්නේද ඇස්ට්‍රාසෙනෙකා එන්නතයි.

පසුගිය වසරේ චීනයේ බබලා අඩුවෙලා

පසුගිය 2020 වසරේ චීනයේ නව දරු උපත් සංඛ්‍යාව පෙර වසරට වඩා සියයට හැත්තෑපහකින් පමණ අඩු වී ඇතැයි වාර්තා වේ. මේ සංඛ්‍යා ලේඛන උපුටා දක්වා ඇත්තේ එරට නව දරු උපත් ලියාපදිංචි ආයතනය මගිනි.

චීනයේ එක් පවුලකට එක් දරුවකු යන නීතිය 2016 වසරේදී වෙනස් කරනු ලැබූයේ අනාගත චීන ශ්‍රම බළකාය භයානක ලෙස හැකිළෙනු ඇති බවට පළවූ අනාවැකිය සමගිනි. එහිදී පවුලකට දරුවන් දෙදෙනෙකු වශයෙන් එම නීතිය සංශෝධනය කරනු ලැබීය.

එහෙත් පසුගිය වසරේ පැතිර ගිය වංසගත තත්ත්වය හේතුවෙන් නව දරු උපත් සිදුවීම මෙලෙස විශාල වශයෙන් පහත වැටෙන්නට හේතුව ලෙස අනුමාන කර තිබේ.

ඇමරිකාවේ හැකර්වරයකුගෙන් වතුරට වස

ඇමරිකාවේ ෆ්ලොරිඩා ප්‍රාන්තයේ ජල සැපයුම සිදු කෙරෙන පරිගණක පද්ධතියට බලහත්කාරයෙන් ඇතුළු වූ හැකර්වරයකු උග්‍ර විෂ රාසයන ද්‍රව්‍යකින් විශාල ප්‍රමාණයක් ජලය ටැංකිවලට මුසු කිරීමට උත්සාහ දරා තිබේ.

ඔහු මේ උත්සාහය දරා ඇත්තේ ෆ්ලොරිඩාහි ඔල්ඩ්ස්මාර් ජල පිරිපහදු ස්ථානයේදීය. එහිදී ජලය පිරිසිදු කිරීමට යොදන සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ප්‍රමාණය ඉතා විශාල අගයක් ලෙස පද්ධතිය මගින් ඉබේ ක්‍රියාත්මක වීමට අණ ලබා දීමට හැකර්වරයා කටයුතු කර තිබේ. ඔහුගේ අරමුණ සාර්ථක වී නම් අති විශාල සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් සාන්ද්‍රණයක් සමඟ ජනතාව වෙත යැවෙන ජලය පානය කිරීමෙන් විශාල ජීවිත සංඛ්‍යාවක් හානි වීමට ඉඩ තිබූ බව පැවසේ. කෙසේ වුවද මේ මහා ව්‍යසනය සිදුවීමට පෙර වළක්වා ගැනීමට ෆ්ලොරිඩා බලධාරීන්ට හැකියාව ලැබිණි.

බිට් කොයින් අහසට

එලොන් මස්ක්ගේ ටෙස්ලා සමාගම විසින් ඩොලර් බිලියන 1.9ක වටිනාකමකින් යුත් 'බිට්කොයින්' මිලදී ගැනීමෙන් පසු එක් බිට්කොයින්එකක අගය ඩොලර් 43,968 දක්වා ඉහළ ගොස් ඇතැයි වාර්තා වේ.

ඒ අනුව එක්වරම බිට්කොයින් එකක මිල වැඩිවී ඇත්තේ සියයට 14ක ප්‍රමාණයකිනි. බිට්කොයින් යනු අන්තර්ජාල මුදල් ඒකකයක් වන අතර, එය භෞතික භාවිතයේ නොමැති අතත්‍ය එහෙත් අන්තර්ජාල භාවිතයේදී අති විශාල වටිනාකමකින් යුත් මුදල් ඒකකයි.

මීට අමතරව භාවිතයේ පවතින තවත් අන්තර්ජාල මුදල් ඒකක කිහිපයක් මිලදී ගැනීමෙන් ඒවායේ වටිනාකම ඉහළ දැමීමටද එලෝන් මස්ක් කටයුතු කර ඇතැයි වාර්තා වේ. ඩොගෙකොයින් ඒ අතරින් එක් මුදල් ඒකකයක් වන අතර එහි මිල එක්වරම සියයට 50කින් ඉහළ ගොස් ඇතැයි වාර්තා වේ. මෙසේ කිරීමට හේතුව ටෙස්ලා සමාගම ස්වකීය ආයෝජන සැලැස්ම යාවත්කාලීන කිරීම බව එලෝන් මස්ක් ට්වීටර් පණිවිඩයක් මගින් පවසා තිබේ.

ජවිපෙ, ඉකුත් දශක පහක් ඇතුළත කැරලි දෙකකට නායකත්වය දුන්නේය. ප්‍රථම කැරැල්ල 1971 අප්‍රේල් ක්‍රියාත්මක වූ අතර එහිදී ඝාතනයට ලක් වූ සංඛ්‍යාව 5,000කට ආසන්නය. ජවිපෙ 2වැනි කැරැල්ල 1986න් ඇරඹී 1990 න් අවසන් වූ අතර එහිදී 60,000කට අධික පිරිසක් ඝාතනයට ලක් වූහ. සිළුමිණෙහි පළවන මෙම ලිපි මාලාව එම කැරලි දෙක ඇතුළත ජවිපෙ නායකත්වයේ දෘෂ්ටිමය මඟ පෙන්වීමකට යටත්ව, එහි ප්‍රායෝගිකත්වය ක්‍රියාවට නැඟූ කැරලි නායකයන්ගේ සත්‍ය කතාවයි.

18 කොටස

මෙහි පළමු කොටස ගිය සතියේ පළ වූ අතර, කොටස් තුනකින් සමන්විත ලිපි පෙළේ මේ පළවන්නේ දෙවැන්නයි...

ජවිපෙ 2වැනි කැරැල්ලේදී රට හෙල්ලූ සන්නද්ධ බළකා

නුවරඑළිය- චන්ද්‍රානන්ද බළකාය :

ජවිපෙ 2වැනි කැරැල්ල තුළ ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක 19 තුළ වසර 1986 සිට 1989 දක්වා කටයුතු කළ සන්නද්ධ දිස්ත්‍රික් ලේකම්වරුන් අතරින් එකම භික්ෂූන් වහන්සේ වන්නේ උඩුගම්පොල චන්ද්‍රානන්ද හිමි හෙවත් තාරකය. සිය ගණනක් භික්ෂූහු උපැවිදි වී කැරැල්ලට එක්වූව ද චන්ද්‍රානන්ද හිමි අවසානය තෙක් උපැවිදි නොවීය. එහෙත් එම කාලය තුළ තාරක නමින් ගිහියකු ලෙසින් පෙනී සිටි අයෙකි.

ළමා කාලයේදී දරිද්‍රතාවෙන් දැඩි පීඩා විඳි උන්වහන්සේ උපදින විට සිය පියා මව හැරදා ගොස් තිබිණි. කුලී වැඩ කරමින් දැඩි දුෂ්කරතා මධ්‍යයේ සිය පුතු හදා වඩා ගත් මවද රෝගී වීමෙන් පසු ඇය විසින්ම සිය පුතු පන්සලට මහණ කිරීම සඳහා යොමු කළාය. පිරිවෙන් අධ්‍යාපනයෙන් පසු ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපනය හැදෑරූ උන් වහන්සේ අනතුරුව ජවිපෙ පූර්ණකාලීනයකු විය. කරාතේ ශිල්පය හොඳින් ප්‍රගුණ කළ චන්ද්‍රානන්ද හිමි දෙසතියක සන්නද්ධ පුහුණුවක් ලැබුවේ හම්බේගමුව රක්ෂිතයේ ජවිපෙ කඳවුරකදීය.

නුවරඑළිය දිස්ත්‍රික් බළකාය ලෙස නම්කළ උඩුගම්පොල චන්ද්‍රානන්ද හිමි, කැරැල්ලේ භික්ෂු බළකාය ලෙස නම් කළ කුඩහපොල හිමිගේ සිතුවමක්, කෑගල්ල දිස්ත්‍රික් සන්නද්ධ බළකාය ලෙස නම් කළ එම්. එච්. පියසේන හෙවත් මිලින්ද සේරම්, රත්නපුර දිස්ත්‍රික් සන්නද්ධ බළකාය ලෙස නම් කළ බී. ඩී. බන්දුවර්ධන, කැරැල්ලේ බුද්ධි අංශය ලෙස නම් කළ 1971 අප්‍රේල් දෙනියායේ කැරලි නායකයකු වූ ජයතිස්ස, කැරැල්ලේ සහන සේවා අංශය ලෙස නම් කළ කතරගම ප්‍රේමවතී මනම්පේරි මෙහි වමේ සිටය.

අනතුරුව මාතලේ දිස්ත්‍රික්කයේ එක් කලාපයක සන්නද්ධ නායකයා වශයෙන් දඹුල්ලේ පන්සලක සිට මෙහෙයවීම් කළ උන්වහන්සේ 1988දී නුවරඑළිය දිස්ත්‍රික් සන්නද්ධ ලේකම් බවට පත්වූහ. නුවරඑළිය පන්සලක සහ රාගල නිවසක සිට එම කටයුතු වලට ක්‍රියාකාරීව එක්වූ චන්ද්‍රානන්ද හිමි ඒ පිළිබඳව ආරක්ෂක අංශ අවධානය යොමුවීමත් සමඟම නායක උපදෙස් පරිදි සන්නද්ධ ලේකම්කමින් ඉවත්ව සමාජ ක්‍රියාකාරකම්වල නිරත වූහ.

දායකයන් අතර ජනප්‍රියව සිටි උඩුගම්පොල චන්ද්‍රානන්ද හිමි අලව්ව තුඹුල්ල පන්සලේ වැඩ සිටියදී 1989 මැයි 18 වෙඩි තබා ඝාතනයට පත්කරන ලදී. ජවිපෙ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ අතුකෝරලපුර (කුරුණෑගල) දිසා සංවිධානය 1989 මැයි 27 පුවත්පත් නිවේදනයකින් කියා සිටියේ ප්‍රා සංවිධානය එයට වගකිව යුතු බවය. ජවිපෙ විසින් නුවරඑළිය දිස්ත්‍රික් සන්නද්ධ අංශය පසුව චන්ද්‍රානන්ද බළකාය ලෙස නම් කරන ලදී.

කුරුණෑගල නිමල් කරුණාතිලක බළකාය:

අඹේවෙල උපන් අලව්ව මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලත් නිමල් කරුණාතිලක හෙවත් රන්ජන් 1988 මුල් භාගයේදී නුවර දිස්ත්‍රික් සන්නද්ධ ලේකම් ලෙස කටයුතු කරමින් සිටියදී 1988 මැයි 01 ජේරාදෙණියේ ඊරියවැටියේ නිවසක රහසිගතව පිහිටා තිබූ බෝම්බ නිෂ්පාදනය කරන ස්ථානයකදී බෝම්බයක් පිපිරීමෙන් එම ස්ථානයේදීම මරුමුවට පත්විය. රන්ජන්ට උපහාරය පළකරනු වස් ජවිපෙ කුරුණෑගල සන්නද්ධ අංශය නිමල් කරුණාතිලක බළකාය ලෙස නම් කළේ ඉන් අනතුරුවය.

එයට ප්‍රථම රන්ජන් කුරුණෑගල දිසා ලේකම් අමරසිරි යටතේ එම දිසා කමිටුවේ ක්‍රියාකාරි සාමාජිකයෙකු විය. එවකට රන්ජන් සමඟ කුරුණෑගල දිසා කමිටුවේ සෙසු සාමාජිකයන් වූයේ කුලියාපිටිය කලාප ලේකම් උපාලි ජයවීර, සඳලංකාවේ පතිරණ, නන්දන, වීරක්කොඩි සහ ගුණසේකරය.

නුවර දිස්ත්‍රික් ලේකම් ලෙස රන්ජන් පත්වීමෙන් පසු උඩුනුවර හමුදා ජංගම මුර සේවයේ යෙදෙන භට කණ්ඩායම් 2කින් අවි පැහැර ගැනීම, නුවර නගරයේ මැරයකු වශයෙන් ප්‍රකටව සිටි සුදුහුම්පොල සුනිල් නගරයේදීම ඝාතනය කිරීම, බෝවලවත්තේ පොලිස් ඔත්තුකරුවන් 'ඉවත් කිරීම' යන කටයුතු සිදු කිරීමෙන් අවධානය යොමුකර ගත්තෙකි.

ජේරාදෙණිය ඊරියවැටිය බෝම්බ නිෂ්පාදන කළ නිවසේ බෝම්බයක් පිපිරීමෙන් රන්ජන් සමඟ එම ස්ථානයේදීම මියගිය අතර අනෙක් තැනැත්තා වූයේ නුවර ප්‍රාදේශීය අංශයේ ඉදිරිපෙළ කැරලිකරුවකු වූ මාතලේ කිවුලේ උපන් හසලක පදිංචිව සිටි ජයසේකරය.

රාත්‍රී සිදුවූ මෙම සිද්ධියෙන් පසු රන්ජන් සහ ජයසේකර යන දෙදෙනාගේම මළ සිරුරු ඉදිරිපස ඉඩමක රහසිගතව වළලා ආචාරය පුදකර එම නිවස අතහැර අලුයම වන විට පළා යෑමට සෙසු 9 දෙනෙකු ගෙන යුත් කැරලිකරුවන් පිරිස සමත්විය. ඉන් බහුතරය ජේරාදෙණිය සරසවියේ ඉංජිනේරු සහ ශාස්ත්‍ර පීඨයේ සිසුන් විය. බරපතළ තුවාල ලැබූ ජේරාදෙණිය සරසවියේ ඉංජිනේරු පීඨයේ සිසු පදවියේ උපන් පාලිත වික්‍රමසිංහ හෙවත් ඩී. සී පාලිත රෝහල් ගත කරනු ලැබීය.

කෑගල්ල- මිලින්ද සේරම් බළකාය :

මනම්පිටිය කඩවත්මඩුවේ පදිංචිව සිට මාතලේ හේවයලාගේ පියසේන හෙවත් මිලින්ද සේරම් 1952 ජූනි 5 උපන්නේ මවගේ උපන් ගම වන කෑගල්ල පුවක්දෙණියේය. ගොවියකු වූ ඔහුගේ පියා කුරුණෑගල වරකාවැහැර පදිංචි මාතලේ හේවයලාගේ රනාය. මව සුදුහත්ත හේවගේ එංගෝය. එම දෙපළට දරුවන් 5ක් වූ අතර ඉන් තෙවැන්නා එම්. එච්. පියසේන හෙවත් මිලින්ද සේරම්ය. පියසේන ගේ සෙසු සොහොයුරන් වූයේ දියෝනිස්, රපියෙල් සහ සේනකය. එකම සොහොයුරිය සෝමාවතිය. නව ගොවි ජනපද පිහිටුවීම යටතේ මනම්පිටිය කඩවත්මඩුවේ මහවැලි ඉඩම් හිමිවීමෙන් පසු පියසේන ගේ පවුලේ සියලුදෙනා කුරුණෑගල වරකාවැහැර සිට පොළොන්නරුවට 1974දී සංක්‍රමණය විය.

වරකාවැහැර රඹුකන්දල විද්‍යාලයෙන් පහේ ශිෂ්‍යත්වය සමත් වූ පියසේන හෙවත් මිලින්ද සේරම් පසුව ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලයට වැල්ලවාය සහ මොනරාගල පොලිසිවලට පහරදීම සිදුවිය.

අනුර ගේ නායකත්වයෙන් 20 දෙනෙකු පමණ පොලිසිය වටකර පහර දුන්නද එය අසාර්ථක විය. එහිදී කැරලිකරුවන් අතින් පොලිස් කොස්තාපල් ගුණසේකර සහ සේනස් දෙදෙනාද මරුමුවට පත්විය. අනතුරුව අප්‍රේල් 5වැනිදා වැල්ලවාය පොලිසියේ අත්අඩංගුවට පත් අනුර එහිදී ඝාතනයට පත්විය.

මොනරාගල සන්නද්ධ අංශය ජවිපෙ 2වැනි කැරැල්ලේදී නම් කෙරුණේ අනුර බළකාය නමිනි.

මේ ඉන් කිහිපයක් පිළිබඳ විස්තරයකි.

ශිෂ්‍ය අංශය- නිමල් බාලසූරිය බළකාය :

නිමල් බාලසූරිය යනු මොරටු සරසවියේ ඉංජිනේරු පීඨයේ දෙවන වසරේ සිසුවෙකි. කුරුණෑගල හෙට්ටිපොල උපන් බාලසූරිය අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ(අන්තරේ) 1988 මාර්තු 01 සිට මැයි 08 දක්වා කැඳවුම්කරුය.

අන්තරේ කැඳවුම්කරු වශයෙන්ම සිටියදීම හෙතෙම බෝම්බයක් රැගෙන අදාළ ඉලක්කය පෙන්වීමට යාමේදී එම බෝම්බය පිපිරී එය රැගෙන ගිය මොරටුවේ සුනිල් බන්දුල සොයිසා සමඟම 1988 මැයි 08 පස්වරු 7.35ට පමණ වැල්ලවත්ත කුරේ මාවතේදී මරුමුවට පත්විය. රස පරීක්ෂණ වාර්තා අනුව මහේස්ත්‍රාත් පරීක්ෂණයේදී කියවුණේ බෝම්බය අතේ පිපිරුණු බවකි.

ජවිපෙ කැරලිකරුවන් විසින් 1989 අගෝස්තු 03 ඝාතනය කළ ප්‍රකට ධර්ම කථික කොටිකාවත්තේ සද්ධාතිස්ස හිමි ගේ දේහයට අවසන් ගෞරව දක්වන පිරිසක්.

ජාතික ශිෂ්‍ය මධ්‍යස්ථානය 1988 ජූනි 14 මරදාන කාර්මික විද්‍යාලයේදී රහසිගතව පිහිටුවීමට පෙර එහි ව්‍යුහය සකස් කිරීමේ ප්‍රථම රැස්වීම මොරටු සරසවියේ පැවති අතර එහිදී ගත් තීරණ 2ක් වූයේ එම වසරේ පටන් ජූනි 20 ජාතික ශිෂ්‍ය වීර දිනය ලෙස රටපුරා සැමරීම සහ ශිෂ්‍ය අංශයට වෙනම සන්නද්ධ අංශයක් නිමල් බාලසූරිය නමින් පිහිටු වීමටත්ය. ඒ අනුව 1988 ජූනි 20 නිමල් බාලසූරිය බළකාය ශිෂ්‍ය අංශයේ සන්නද්ධ බළකාය ලෙස ස්ථාපිත විය.

බාලසූරිය බළකාය පිහිටුවීමෙන් පසු ජවිපෙ අරමුණ වූයේ ශිෂ්‍ය අංශයෙන් පෙරට ආ සන්නද්ධ කැරලිකරුවන් දෙවන වටයට සූදානම් කිරීමය.

ජවිපෙ 2වැනි කැරැල්ලේ දේශපාලන මණ්ඩලයේ 13 දෙනා ගෙන් 8ක් සහ මධ්‍ය කාරක සභාවේ 35 දෙනා ගෙන් 11ක් ශිෂ්‍ය ව්‍යාපාරයෙන් ජවිපෙට එක්වූ අය වෙති.

නිමල් බාලසූරිය බළකායේ ප්‍රථම නායකයා වූයේ ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨයේ තෙවන වසර සිසු 84/85 කණ්ඩායමේ සාමාජික තෙලිජ්ජවිල ජෝන් ඩෙල්ෆ් වත්තේ හමුදා අනුබණ්ඩයේ රඳවාගත් අතර 1990 පෙබරවාරි 24 ඝාතනය කර බෙලිඅත්ත ගලගම පාළු ළිඳකට දමා තිබිණි. කොළඹ සරසවි උප කුලපති මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර 1989 මාර්තු 08 කොළඹ සරසවිය තුළදී ද ස්වාධීන ශිෂ්‍ය සංගමයේ සභාපති කේ. එල් ධර්මසිරි 1989 ඔක්තෝබර් 20 කොටහේනේදී ද, ජේරාදෙණිය සරසවියේ සහකාර ලේඛකාධිකාරි ඩී. ඊ. නාගහවත්ත 1989 ඔක්තෝබර් 04 සරසවිය තුළදීම ඝාතනය කිරීම වැනි ජවිපෙ ක්‍රියාකාරකම්වලට එරෙහිවූ සරසවි පද්ධතියේ සහ පාසල් ක්ෂේත්‍රයේ විදුහල්පතිවරුන් ගේ ඝාතන වලට බාලසූරිය බළකාය සම්බන්ධ විය.

ජේරාදෙණිය සහකාර ලේඛකාධිකාරි නාගහවත්ත ඝාතනයෙන් පසු ආරක්ෂක අංශ 1989 ඔක්තෝබර් 05 ඝාතනය කරන ලද තරුණයන් 18 මළසිරුරු ගලහ පාරේ ස්මාරකය සහ සනාත මන්දිරය අසලට දමා තිබිණි.

විජේවීර ඝාතනයෙන් පසු එනම් 1989 නොවැම්බර් 13න් පසු ජවිපෙ නායකත්වයට පත්වූ සමන් පියසිරි ප්‍රනාන්දු විසින් බාලසූරිය බළකායට වැඩි බරක් යෙදූ අතර කොළඹ දිස්ත්‍රික්කයේ සන්නද්ධ අංශයේ මුල්තැන ගත්තේ ඔවුන්ය.

ආරක්ෂක රාජ්‍ය ඇමති රන්ජන් විජේරත්න ඝාතනයට බෝම්බ පිරවූ කාර් රථයක් පුපුරවා හැරීම සැලසුම් කළේ ද බාලසූරිය බළකාය විසිනි. මෙම බළකායේ නායක ශ්‍රීවර්ධන ගේ මෙහෙයවීමෙන් 12 දෙනෙකු ගෙන් යුත් මරාගෙන මැරෙන කණ්ඩායමක්ද 1989 දෙසැම්බර් පිහිටුවන ලදී. එම කණ්ඩායමේ බහුතරය පාසැල් සිසුන් වේ.

ඔවුන් අතර චානක, ජයකොඩි, හිරන්ත, කපිල, නීල්, ජයවර්ධන ද සරසවි සිසු සිසුවියන් වූ ජේරාදෙණියේ ජනක සෙනෙවිරත්න හෙවත් රොබට්ද, ජයවර්ධනපුර ඉරේෂා පොල්ගම්පල හෙවත් දීපානිද, මොරටු එන්. ඩී. ටී සිසු රංජිත් ඇතුළු කිහිපදෙනෙක්ද විය. බාලසූරිය බළකායට දිස්ත්‍රික් නායකයන් වශයෙන්ද පත්ව සිටියේ සරසවි සිසුන්ය.

නිදසුනක් ලෙස එම බළකායේ කොළඹ දිස්ත්‍රික් නායකයා වූයේ ජයවර්ධනපුර සරසවියේ කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨයේ සිසු දෙනගම උපන් ගරුසිංහ ප්‍රේමදාසය. මහරගම විද්‍යාකර මාවතේ නැවතී සිටි ගරුසිංහ නුගේගොඩ විල්බට් අයියා ගේ බත් කඩේ අසලදී 1989 සැප්තැම්බර් 17 අත්අඩංගුවට ගැනීමෙන් පසු ඝාතනයට ලක්විය. ජවිපෙ ශිෂ්‍ය සංවිධානය වන සමාජවාදී ශිෂ්‍ය සංගමයේ සන්නද්ධ අංශය ලෙසද 1989 මැද භාගයේ සිට නිමල් බාලසූරිය බළකාය පත්විය.

ඒ වනවිට සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික කමිටුවට බස්නාහිර සහ සබරගමු කලාප භාරව කොළඹ වෛද්‍ය පීඨයේ අතුල සේනාරත්න හෙවත් චිරන්තද, දකුණු කලාපය භාරව මොරටුව එන්.ඩී.ටී සිසු නිරංජන් හෙවත් පාලිතද මධ්‍යම පළාත භාරව ජයවර්ධනපුර සරසවියේ නන්දසිරිද, උතුරු මැද කලාපය බාරව ජේරාදෙණිය සරසවියේ නිස්මි හෙවත් කමල්ද, ඌව සහ නැගෙනහිර බාරව රුහුණු සරසවියේ ධර්මසිරි හෙවත් ප්‍රසන්න හෙවත් ලසන්තද, කොළඹ දිස්ත්‍රික්කය භාරව රුහුණු සරසවියේ අනුර හෙවත් රාමනායකද විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය(අන්තරේ) නියෝජිතයා ලෙස කොළඹ වෛද්‍ය පීඨයේ වෙනුර එදිරිසිංහද, සන්නද්ධ අංශය භාරව මොරටු සරසවියේ ශ්‍රීවර්ධන දිසානායක හෙවත් සිරිවර්ධනද ජවිපෙ දේශපාලන මණ්ඩලය වෙනුවෙන් ඩී. එම්. ආනන්ද අයත් විය.

මොවුන් ගෙන් නිරංජන්, නන්දසිරි, ධර්මසිරි, අනුර හැර සෙසු සියල්ලෝම ඝාතනයට පත්විය. මාතර මාලිම්බඩ උපන් අනුර වර්තමානයේ මොනරාගල ගුරුවරයෙකු වන අතර මිදිගම උපන් ධර්මසිරි පස්සර විදුහලක ගණිත ගුරුවරයෙකි. නිරංජන් හෙවත් පාලිත ව්‍යාපාරිකයෙකු වන අතර නන්දසිරි රේගුවෙන් භාණ්ඩ නිදහස් කරගැනීමේ ආයතනයක කළමණාකරුවෙකි.

නිමල් බාලසූරිය බළකායේ නායකයා වන සිරිවර්ධන, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ නායකයකු වන උපුල් නානායක්කාර සහ ජවිපෙ අලුතෙන් පත්වූ දේශපාලන සභික උපාලි ජයවීර අතර සාකච්ඡාවක් 1989 දෙසැම්බර් 08 කිරුළපන ස්විට් හවුස් ආයතනයේ පැවති අතර එහිදී තීරණය වූයේ අන්තරේ තාවකාලික විසුරුවා එහි ශක්තියද නිමල් බාලසූරිය බළකායට යෙදීමය.

එම තීරණය ජේරාදෙණිය සරසවියේ සිසු නායකයකු වූ නිස්මි විසින් 1989 දෙසැම්බර් 09 නුගේගොඩ පාගොඩ පාරේ ආරිය බුලේගොඩගේ නිවසේ රැස්වූ අන්තරේ ක්‍රියාකාරිකයන්ට දැනුම් දෙන ලදී.

ඉතිරි කොටස ලබන සතියේ



කොළඹ සරසවි උපකුලපති මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර සිය කාර්යාලය තුළදී නිමල් බාලසූරිය බළකායේ වෙඩි පහරට ලක්ව 1989 මාර්තු 08 මරුමුවට පත්ව සිටියේ මෙසේය.

පළාත් සභා ගිවිසුමට වසරක් පිරීමට එරෙහිව 1988 වසරේ පැවති විරෝධතා පෙළපාළියක්

ගම්පහ- රංජි බළකාය :

රංජිත් දසනායක(පොඩි රංජි) යනු කැරලිකරුවන්ට තිරස්චින ලෙස වධදුන් බවට චෝදනාව ලත් පැලියගොඩ ප්‍රචණ්ඩ ක්‍රියා මර්ධන ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක වික්‍රමසිංහට 1988 ජනවාරි 1 වෙඩි තැබීමට යෑමේදී ගම්පහ කිරිල්ලවලදී මරුමුවට පත්වූ අයෙකි. ජවිපෙ සන්නද්ධ අංශයට මුල් කාලයේදී වඩාත් ක්‍රියාශීලී පිරිසක් එක්වූ දිස්ත්‍රික්ක අතර ගම්පහද විය.

දෙවැනි කැරැල්ලේ ගම්පහ සන්නද්ධ අංශය නම් කෙරුණේ රංජි බළකාය නමිනි.

ජවිපෙ 2වැනි කැරැලි වකවානුව තුළ දිස්ත්‍රික්ක සන්නද්ධ බළකායන්ට අමතරව විශේෂ සන්නද්ධ බළකායන්ද ක්‍රියාත්මක විය.

වෙන්නප්පුව පදිංචි ගාමිණී මාලසිංහය. නුගේගොඩ නාවලදී 1988 දෙසැම්බර් 08 ගාමිණී මාලසිංහ ආරක්ෂක හමුදා මගින් පැහැරගෙන යෑමෙන් පසු ඝාතනයට ලක්විය.

අනතුරුව බාලසූරිය බළකායේ නායකයා වූයේ රුහුණු සරසවියේ කෘෂි පීඨයේ සිසුවකු වූ හම්බන්තොට දෙබරවැව පදිංචි ඥාණසිරි පල්ලියගුරු හෙවත් බෙනටිය.

පසුව ඥාණසිරි ගාල්ල දිස්ත්‍රික් සන්නද්ධ ලේකම් ලෙස 1989 අග භාගයේදී වැඩ බාරගත් විට නිමල් බාලසූරිය බළකායේ නායකයා වූයේ මොරටු සරසවියේ එන්.ඩී.ටී. සිසු දිවුලංකඩව උපන් අනිල් පියරත්න හෙවත් පීරිස්ය.

ඥාණසිරි 1989 සැප්තැම්බර් මස ගාල්ල ඉඳුරුවේදී අත්අඩංගුවට පත්ව

මාතලේ දිස්ත්‍රික් සන්නද්ධ ලේකම් වඩුවලාගේ ගෙදර මුනිදාස හෙවත් තුසිත මුනිදාස 1988 ජූනි 01 රාත්‍රී දඹුල්ලේ මිරිස්ගෝනියාව පාලම අසලදී ආරක්ෂක අංශ මගින් තබන ලද වෙඩි ප්‍රහාරයකින් මරුමුවට පත්ව වැටී සිටි අන්දම ඊට පසුදින උදෑසන දිස්වූයේ මෙසේය.

මොනරාගල- අනුර බළකාය:

වසර 1971 අප්‍රේල් කැරැල්ලේදී පළමු වෙඩිල්ල තැබුවේ ඉලන්දාරි දේව නිල්සන් හෙවත් වැල්ලවායේ අනුරය. කරන්දෙණියේ උණගස්වෙල ග්‍රාමයේදී 1947 මැයි 28 වැනිදා උපන් අනුරට සොයුරු සොහොයුරියන් 4කි. ඔවුහු නම් ඩේලින්, නෙල්සන්, ඥනදාස සහ ආරියවතිය. පියා වූ ඒමේල් කුරුඳු කම්කරුවෙකි. උණගස්වෙල පාසලේ ප්‍රාථමික අධ්‍යාපනය ලත් අනුරද පසුව කුරුඳු තැලීමට යොමු විය.

කරන්දෙණියට ජවිපෙ ගෙන ආ උණගස්වල ඉහළ පාරේ පදිංචිව සිටි ගාමිණී බාස් ගේ නායකත්වය යටතේ පසුව පුත්තලම දිසා ලේකම් වූ විල්සන් ආරියරත්න හෙවත් හේරත් හරහා අනුර ජවිපෙට එක්විය.

අම්පාර දිස්ත්‍රික් ලේකම් නිශ්ශංක සමඟ 1968 පූර්ණකාලීනයකු ලෙස අම්පාරට ගිය අනුර පසුව ජවිපෙ විසින් පවත්වාගෙන ගිය කිරින්ද, තණමල්විල සහ කැලැත්තෑවේ ගොවිපොළවල සේවය කළේය. පසුව මොනරාගල දිස්ත්‍රික්කයේ තාවකාලික දිස්ත්‍රික් ලේකම් වූ අනුර පසුව එම වගකීම කරන්දෙණිය ඉද්දමල්දෙණියේ ප්‍රේමසිරි දේවප්‍රිය හෙවත් ප්‍රේමසිරි ගමගේට පැවරුණු පසු වැල්ලවාය පොලිස් කොට්ඨාසයේ ලේකම් විය.

සන්නිවේදනයේ අඩුලුහුඬුකමක් නිසා 1971 අප්‍රේල් 4 අලුයම කලක් මුළුල්ලේ තිරස්චීන වද බන්ධනවලට මුහුණ දුන්නද කිසිවෙක් පාවා නොදීම නිසා පසුව ඝාතනය විය. වධකාගාරය තුළදීද ඔහු විමුක්ති ගී ගැයූ බවද කියති. ඔහු ගේ සිරුර මනම්පිටිය තේක්ක කැළේදී පුළුස්සා දමනු ලැබීය. වසර 2001දී ජවිපෙ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ එස්. කේ. සුබසිංහ ගේ මැදිහත්වීමෙන් මිලින්ද සේරම් අනුස්මරණ ශාලාව නමින් වැලිකන්ද ප්‍රාදේශීය සභාවට අයත් කඩවත්මඩුවේදී ප්‍රජා ශාලාවක්ද ඉදිකර තිබිණි

බෙල්ලන්විල අභයභූමියත් අනතුරේ

කොළඹට ළඟම අභයභූමියත් වැනසෙන ලකුණු

● සුභාෂිණි ජයරත්න

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි අභය භූමි අතරින් බෙල්ලන්විල- අත්තිඩිය අභය භූමියට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන, දෙහිවල, කැස්බෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනට අයත්ව පිහිටා ඇති මෙයට, හෙක්ටයාර 372 ක භූමි ප්‍රමාණයක් අයත්වන අතර වර්තමානයේදී බෙල්ලන්විල - අත්තිඩිය අභයභූමිය වන-ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වේ.

මෙය නොගැඹුරු තෙත් බිමක් වන අතර නගරාසන්නයේ පිහිටි සොඳුරු පරිසර පද්ධතියකි. මෙම තෙත් බිම බොල්ගොඩ ගංගා ද්‍රෝණියේ ඉහළ ජල පෝෂක ප්‍රදේශය තුළ පිහිටා ඇති අතර තෙත්බිම බොල්ගොඩ ඇළ හරහා බොල්ගොඩ ගංගා පද්ධතියේ පිටාර බිම්වලට සම්බන්ධය. තවද පෘතුගීසි යුගයේ සෑදූ ඇළ මාර්ගද, කුඩා විල්ද, අත්තිඩිය වගුරු තෙත් බිම් මේ පද්ධතිය තුළ පිහිටා ඇත. මෙය 1980 වසරේදී අධ්‍යාපනික හා සංරක්ෂණ කලාපයක් ලෙස ප්‍රසිද්ධ වූ අතර අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත් වූයේ 1990 ජූලි 25 වැනිදාය. එසේ අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත් වූයේ මෙම කලාපය ආරක්ෂිත ප්‍රදේශයක් කිරීමේ දැඩි අවශ්‍යතාව මතු වූ නිසා ය.

මෙම අභයභූමිය හරහා අවට ප්‍රදේශවල ජනතාවට හිමි වන්නේ සුවිශේෂී වරප්‍රසාද ය. බෙල්ලන්විල, අත්තිඩිය, බොරලැස්ගමුව, පැපිලියාන, නැදිමාල, රත්මලාන, නුගේගොඩ දකුණ හා වේරහැර යන ප්‍රදේශයන්ට ලැබෙන වර්ෂාවේ අතිරික්ත ජලය ගලා එන්නේ මේ ප්‍රදේශයට වන හෙයින් එමගින් ගංවතුර තර්ජනයන්ට ලක් වීමේ අවදානම වැළකෙන්නේ මෙම තෙත්බිම නිසාවෙනි. තවත් පැත්තකින් මෙම අභයභූමිය සංක්‍රමණික පක්ෂීන්ගේ රජ දහනකි. විශාල සත්ත්ව විවිධත්වයේ ළැඟුම් පළක් වන මෙහි ලංකාවට ආවේණික සත්ත්ව විශේෂ බොහෝමයක් ජීවත් වන ජලාශ්‍රිත භූමියකි. ශ්‍රී ලංකාවට ආවේණික කිඹුල් විශේෂ, පිඹුරු විශේෂ, ඉබ්බන්, මීමින්නන්, හඳුන් හා කොළ දිවියන්, කුරුළු විශේෂ 150 ක් මෙන්ම මත්ස්‍ය වර්ග හා සමනල් විශේෂ රාශියක් මෙහි වෙසෙති.



කෙසේ වෙතත් මේ වන විට මෙම අභයභූමියේ විනාශය ආරම්භ වී ඇතිබව පරිසරවේදීන් දිගින් දිගටම අනතුරු හැඟවීම් කළ ද මේ වන විටත් ඊට නිසි පිළියම් යෙදීමට අපොහොසත් වී ඇත්තේය. මෙම අභය භූමිය හෙක්ටයාර් 372 ක අභයභූමියක් වුවද මේ තුළ පෞද්ගලික ඉඩම් බොහෝමයක් ඇති අතර රජය සතු ඉඩම් ප්‍රමාණය අඩුය. කෙසේ වෙතත් මෙහි ඉඩම් හිමිකාරත්වය පිළිබඳ නිශ්චිත අදහසක් නැත. වර්තමානයේ මෙම අභය භූමිය තුළ කැළි කසළ විශාල ලෙස දැමීම නිසාත් මෙම තෙත් බිම හා ඒ ආශ්‍රිත අනිකුත් ප්‍රදේශවල සිදුවන අඛණ්ඩ ගොඩකිරීම් හේතුවෙන් මෙම අභයභූමිය අඛණ්ඩව විනාශයට ළං වෙමින් පවතියි. කැළි කසළ වලින් ගොඩ කිරීම ආරම්භ කර ගොඩ වූ එම ඉඩම අත්පත් කර ගැනීම සිදුවන අතර, අද වන විට මේ බොහෝමයක් ස්ථානවල ජනාවාස හා කර්මාන්ත-ශාලා මෙන් ම වාහන නැවැතුම් පොළවල් ද ඉදි කර ඇත. බෙල්ලන්විල විහාරස්ථානයේ රථගාල පුළුල් කිරීම සඳහා අභය භූමියේ විශාල තෙත්බිම් ප්‍රමාණයක් ගොඩකර තිබුණි. මාලනී බුලත්සිංහල මාවතේ පිහිටි කර්මාන්තශාලා පුළුල් කිරීම සඳහා අධික ලෙස අභය භූමිය ගොඩකර තිබුණි. මීට අමතර ව අභය භූමිය තුළ බොල්ගොඩ ඇළට දකුණින් පිහිටි තෙත්බිම් සියල්ලම ගොඩකර විශාල වශයෙන් ජනාවාස ව්‍යාප්ත කර තිබේ. කරුණාරත්න මාවත, හරමානිස් පාර හා විකුම් පෙදෙස වැනි අභය භූමිය තුළ මාර්ග සකස් කර ගොඩකරමින් ජනාවාස ව්‍යාප්ත කර තිබේ. මීට අමතර ව වේරුස් ගඟ ආශ්‍රිත ප්‍රදේශවල ද මේ අයුරින් මහා පරිමාණයෙන් අභය භූමියේ තෙත්බිම් ගොඩ කිරීම සිදු කර තිබේ. කර්මාන්තශාලා අපද්‍රව්‍ය සෘජු ව බැහැරලීම හේතුවෙන් අභයභූමිය හරහා ගලා බසිනා දිය දහරා සියල්ල ම පාහේ දූෂණයට ලක් ව තිබේ. මෙම දූෂණයන්ගේ ප්‍රතිඵලයක් ලෙස අභය-භූමිය පුරා ම වෙල් ආත්තා, හම්බුපන්, බෙරුදිය නිල්ල හා ජපන් ජබර වැනි දරුණු ආක්‍රමණික ශාක ලෙස ව්‍යාප්ත ව ඇත්තේ විනාශ කිරීමට නොහැකි පරිදිය.

මේ එම අනවසර ඉදි කිරීම් වලට එක් උදාහරණයකි.

"මේ වන විට මෙහි ඇති ප්‍රබලම ප්‍රශ්නයක් වන්නේ එක්තරා හිමිනමක් විසින් මේ ප්‍රදේශයේ සිදු කර ඇති නීති විරෝධී ක්‍රියාදාමයයි. මෙම භූමිය තුළ අක්කර දෙකක ඉඩමක වැඩිහිටි නිවාසයක් තියෙනවා. එහි භාරකාරත්වය ඇත්තේ මේ හිමිනමට. එම නිවාසයට පැත්තකින් පිටිටනියක් තියෙනවා. මෙයට ආසන්න කොටසක් සංවර්ධන කටයුතුවලට කියා උන්වහන්සේ ඉල්ලා ගත්තා. නමුත් වන ජීවී දෙපාර්තමේන්තුවෙන් එය ලබා දුන්නේ නිසි කොන්දේසිවලට අනුවයි. එහෙත් පසුව ඒ කොන්දේසි උල්ලංඝනය වෙලා. මෙහි නීති විරෝධී ලෙස මීටර් 30 ක කොන්දේසිය උල්ලංඝනය කර ඇළ වෙන්කර ගැනීම් කර ඇති අතර මීටර 3 ක පරතරයක්වත් නැති නීති විරෝධී කම්බි වැටක් ගැහුවා. එපමණක් නෙවෙයි, වන ජීවී දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් නියෝගයන්ට අනුව ගස් සිටුවාත් නැහැ. තිබෙන ගසුත් කපලා දාලා. " ඒ මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ බලධාරියෙකි. හෙක්ටයාර් 0.7 කින් යුත් මෙම විශේෂිත බිම් කොටසේ නැගෙනහිරින් මායිම් ව ඇත්තේ තෙල් ඇළ නම් මාර්ගයෙනි. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෙම කොටස ලබා දීමේදී ලිඛිතව කොන්දේසි කිහිපයක් ඇතුළත් කර ඇත. නමුත් මේ වන විට එම කොන්දේසි බොහෝමයක් උල්ලංඝනය වී ඇතිද, බලධාරීහු කිසිවක් මේ පිළිබඳ සොයා නොබැලීම කනගාටුවට කරුණකි. මෙහි ප්‍රධාන කොන්දේසියක් වූ ඇළ රක්ෂිතයේ සිට මීටර් 30 ක පරතරයක් තුළ කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සිදු නොකළ යුතු බවත්, ගස් සිටුවීමෙන් මීටර් 30 ක භූමි ප්‍රදේශයක් ආරක්ෂා කළ යුතු බවත් සඳහන් වුවත් ඒ කිසිවක් සිදු නොවී ඇත. කෙසේ වෙතත් මේ පිළිබඳ වන ජීවී දෙපාර්තමේන්තුවේ බලධාරීහු පවසන්නේ මේ වන විට ලබා දුන් අවසරය අත් හිටුවා ඇති බවත්, අනවසර කිසිදු ඉදිකිරීමටක ඉඩ නොදෙන බවත්ය.

බෙල්ලන්විල අත්තිඩිය අභයභූමියට මිල කළ නොහැකි වටිනා සම්පතකි. එහි භූමියේ වටිනාකමද ඉහළය. මේ නිසා මේ පරිසරය තුළ ශීඝ්‍රයෙන් සිදුවන ජනාවාසකරණය හේතුවෙන් සතුන්ට හිමි අයිතිය අහිමි වී ඇත්තේය. මෙම ජල පෝෂිත ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් බොහෝමයක් සිදු වන්නේ පියවරෙන් පියවරය. මේ පිළිබඳ අදහස් දක්වන පරිසරවේදීහු පවසන්නේ අදාළ පිරිස් මේ පිළිබඳ කිසිදු පියවරක් නොගන්නා බවකි.

නමුත් කොළඹ දිස්ත්‍රික් අඩවි ආරක්ෂක කලාපය භාර නිලධාරීහු පවසන්නේ මේ වන විට මෙම විනාශය අවම කිරීමට අවශ්‍ය සෑම පියවරක්ම ගනිමින් පවතින බවකි.

"අපි මේ අභයභූමිය ආරක්ෂා කිරීමට මීට වඩා වෙහෙසක් දැරිය යුතුයි. මේ වන විට මෙම අනවසර අත්පත් කර ගැනීම් වළක්වන්නත් ඒ පිළිබඳ පහසුවෙන් සොයා ගන්නත් මේ වටා ඇළ මාර්ගයක් ඉදිකරමින් යනවා. ඒ වගේම යම් අය නීති විරෝධී ක්‍රියා කර ඇත්නම් මුලින්ම ඒ අය දැනුම්වත් කරනවා. එසේ නොහැකි වුවහොත් අධිකරණ ක්‍රියාමාර්ග හරහා නඩු දමා දඩ අය කර ගැනීම් සිදු කරනවා. මෙම අභයභූමිය වටා පාරක් නැහැ. එම නිසා උපක්‍රමශීලිව අත්පත් කර ගැනීම් සිදු කරනවා. ඒ වගේම මෙහි පවත්නා ඉඩම් බොහෝමයකගේ හිමිකාරත්වය පිළිබඳ ගැටලු තියෙනවා. මේ නිසා කැස්බෑව ප්‍රාදේශීය ලේකම් හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව හරහා නිශ්චිත පිඹුරුපත් සැකසීමක් කරනවා. මේ නිසා ඉදිරියේදී කිසිවකුටත් එම අනවසර අත්පත් කර ගැනීම් සිදු කරන්න බැහැ....."ඒ කොළඹ දිස්ත්‍රික් භාර අඩවි ආරක්ෂක සමන් ලියනගමය.

ලංකාවට ආවේණික වඳුරු විශේෂයක් වන කොළ වඳුරන්ගේ වාසස්ථානය මෙම භූමියයි. මේ වන විට වාහනවලට හසුව මියයාමෙන් හා ජනාකීර්ණ වීම නිසා මෙම වඳුරු ගහනය ශීඝ්‍රයෙන් අඩුවෙමින් පවතියි. ඒ හා සමගාමීව මෙම පරිසර පද්ධතිවලට නුසුදුසු සත්ත්ව හා ශාක ගහන වැඩිවෙමින් පවතියි. විශේෂයෙන්ම ආක්‍රමණික ශාක වර්ග වන ජපන් ජබර මෙන්ම සැල්වීනියා යන ශාක වර්ග හා ආක්‍රමණික සතුන් වන කැට ෆිෂ්, රතු කන් ඉබ්බා වැනි සතුන්ගේ ගහනය වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතියි. විශේෂයෙන් මිනිසුන් විසින් පරිසර පද්ධතියට ගෙනැවිත් මුදා හරින රතු කන් ඉබ්බා මාංශ භක්ෂක සතකු වන නිසා මොවුන්ගේ වර්ධනය මේ පරිසර පද්ධතියට ගෙන දෙන්නේ දැඩි හානියකි. කෙසේ වෙතත් පරිසරවේදීහු පවසන්නේ බෙල්ලන්විල අත්තිඩිය වන විනාශයට ලොකුම හේතුවක් වී ඇත්තේ මිනිස් ක්‍රියාකාරකම් බවකි.

සංචාරක කර්මාන්තයේදී අබල්ලන්විල අත්තිඩිය අභය භූමියට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මෙය නගරයක් තුළ පිහිටි ස්වභාවික පරිසර පද්ධතියකි. රත්මලාන ගුවන් තොටුපළේ සිට ඉතා පහසුවෙන් මෙම පරිසර පද්ධතියට ළඟා වීමේ හැකියාව පවතින අතර නගරයේ අවිවේකී ජීවන රටාවෙන් මිදීමට මේ පරිසර පද්ධතිය දක්වන්නේ සුවිශේෂී මෙහෙයකි. මේ වන විට ආක්‍රමණික ශාක ඉවත් කිරීමට විශාල වෙහෙසක් දරන්නට සිදු වී ඇත්තේය. එපමණක් නොව විවිධ කාලවලදී මෙම වගුරු බිම දඩයක්කරුවන්ගේ පාරාදීසයක් වී තිබුණි. එදා සිටි සත්ව හා කුරුළු විශේෂ බොහෝමයක් විනාශ වී ඇත. මෙසේ හෙයින් මෙම අභයභූමිය වහා ආරක්ෂා කර ගැනීම බලධාරීහු සතු වගකීමකි.

අත්තිඩිය තෙත්බිමේ අනවසර ඉදිකිරීම්

'බොර්න් එගේන්' රැල්ල

● ගිවන්ත අර්ථසාද්

'බෝර්න් එගේන්'යන වදන, මෙම අවස්ථාවේ කුනාටුවක් සේ විහිද යනු ඇස ගැටෙයි. 1999 දී, අප රටේ සුපිරි පන්තියේ ව්‍යාපාරිකයෙක් තමා හඳුන්වා ගත්තේ, "අයි ඇම් අ බෝර්න් එගේන් ක්‍රිස්ටියන්"යනුවෙනි. ඔවුන්ගේ සභාවේ අමුතු කටයුතුද බලාගන්නට ඉඩ ලැබුණෙන්, මා සාමාජිකත්වය දරන මෙතොදිස්ත සභාවේ එවක මහා නායක, ගෞරවනීය ඩුලිප් ප්‍රනාන්දු දේවගැතිවරයා හමුවී, මේ විස්තරය පවසා, 'තව අවුරුදු දහයක් පමණ ගතවෙත්දී, ප්‍රධාන ධාරාවේ කිතුනු සභාවනට මෙය අභියෝගයක් වීමටඉඩ තිබෙන බැව්'පැවසීම්. මා පැවසූ වසර දහය ගතවන්නටත් පළමුව, 'බෝර්න් එගේන්'පිළිලය අප රටේ සෑම කිතුනු සභාවකම ඔඩු දුවන්නට පටන්ගෙන තිබිණි. ඒ අතර, 'බෝර්න් එගේන්'නම් පිළිලය මතට වෙනත් විධාකාරයේ නම් ඇඳාගත්, කිතුනු යැයි හඳුන්වා ගන්නා කුඩා සභා හතු පිපෙන්නාක් මෙන් බිහිවෙමින් පවතී; මේ එකක්වත්, ප්‍රධාන ධාරාවේ කිතුනු-කතෝලික සභාවන්ගේ ශාඛාවෝ නොවෙති.

ඒ, එදා ය; 2011 වසරේදී පමණ, රෝමානු කතෝලික සභාවේ, කොළඹ අගරදගුරු, අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින්, තම සභාවට එල්ලව තිබෙන මෙම ආක්‍රමණය ගැන ජනමාධ්‍යයන්ට හෙළිදරව් කරන ලද්දේය. මෙම රැල්ලට මුල්වූයේ කවුරුන්ද?

ඒ, කැන්සාස්ප්‍රාන්තයේ, ටොපේකාහි, කලෙක මෙතොදිස්ත දේවගැතිවරයකුව සිට ඉන් ඉවත්වූ, චාර්ල්ස් ෆෙක්ස් ෆාර්හැම් නමැත්තාය; 1901 වසරේදී, 'බෙතෙල්'නම් දේවධර්ම විද්‍යාලයෙහි ඇතිවූ සිද්ධියක් පදනම් කරගෙන, 'බෝර්න් එගේන්' වාදය ට මූලික පදනම ඔහු විසින් තනන ලද්දේය. මෙයින් බිහිවූ රැල්ලේ හැරැවුමක්වූ සෞභාග්‍යයේ දේව වේදය, අදත් ඇමෙරිකාවේ සුප්‍රසිඩය; රූපවාහිනී සුබස්නයනගාමියෝ යැයි හඳුන්වාගත්, කෙනත් හා ග්ලෝරියා කොප්ලන්ඩ් යුවළ විසින් මෙහි ප්‍රචාරාත්මක වැඩපිළිවෙළ දියත්කරන ලද්දේ, 1942 පමණේදීය. මොවුන් පවසා ඇත්තේ, සෞභාග්‍යය උදාකර ගැනීම සඳහා දෙවියන් වහන්සේට අතමිට පුරවා දීම මත, ප්‍රතිලාභද, වෛද්‍යවරුන්ගෙන් හා ඖෂධයන්ගෙන් තොරව සුවයද ලැබෙන බවකි. වෛද්‍යවරුන් හා ඖෂධ දෙවියන්වහන්සේගේ නිර්මාණයක් බව ශුඩ බයිබලය දක්වතත්, මේ වූ කලී, ශුඩ බයිබලයේ ඉගැන්වීම් මායාකර්මයකට පෙරැළීමකි. සංවර්තනය කරණ කොටගෙන, පාපී ජීවිතයෙන් විමුක්තිය ලැබීමත්, ධනවත් වීමත් සමඟ, ඒ මත ලැබෙන වෙනත් ප්‍රතිලාභ අතර, ඖෂධ නොමැතිව, දිව්‍යමය සුවය ලබාදීම ද, එහි අංගයන්ය.

● සංවාදයට ඒවෑතාසී

තමන්ගේ සැපපහසුව තකා අධිමානුෂික බලය යොදා ගැනීම, මෙම දර්ශනයේ හරය ලෙස දැක්වෙයි. ශුඩ බයිබලයේ ඇතැම් පද පමණක් උපුටා දක්වමින් තම අදහස් ඔප්පු කිරීමට යත්න දරන මොවුහු, ශුඩ බයිබලයේ කේන්ද්‍රීය තේමාව වන, යේසුස් වහන්සේ සමඟ පෞද්ගලික සම්බන්ධතාවක් ඇතිකර ගැනීම අමතක කිරීමට කටයුතු සලස්වා තිබෙයි. මේ සඳහා 'බෝර්න් එගේන්'කල්ලියේ යෝජනාව වන්නේ, 'එපිස්ට්‍රොෆේ'යන ග්‍රීක වචනයෙන් අදහස්වන සංවර්තනය හෙවත් හැරීම අත්‍යාවශ්‍ය බවය. සංවර්තනය යනු, වෙනස්වූ හිතක බාහිර ලක්ෂණයකි. "ඔබ ගමන්කර තිබෙන්නේ වැරැදි පාරේය; හැරී නැවත මුලට ඇවිත්, නිවැරැදි පාරේ යන්නැ'යනුවෙන් කියැවෙන්න සම්පිණ්ඩනය කරගත්, රෝම හමුදා හේවායන්ට අණ කළ'මෙටනෝයයා', ග්‍රීක වචනයකි. එය, යේසුස් වහන්සේ පැමිණි විට, ඔවුන්වහන්සේ හා පෞද්ගලික සම්බන්ධතාව ඇතිකර ගැනුම පිළිබඳව, ස්නාවකයොහන් නැමැත්තා කළ පූර්ව දැනුම් දීමක් විය.කතෝලික හා කිතුනු ප්‍රජාව, තම පාප ගැන මනඃස්ථාපනය වන්නේ මෙහි අර්ථය අදාළ කරගෙනය. බෞඩ ප්‍රජාව පන්සිල්හි පිහිටන්නා සේ, කතෝලික හා කිතුනු සැමගේ අභිප්‍රාය විය යුත්තේ, අලුතෙන් ඉපැදුණු කෙනකු මෙන් ජීවත වීමය. එක්වරක් පන්සිල් ගත් විට, ඒ මුළු ජීවිතයට සෑහේය යන්න, ආචාර්ය ඊ. ඩබ්ලියු. අදිකාරම්ගේ මතය විය. ඒ අනුවම, එක්වරක් මනඃස්ථාපනය වීම, කිතුනු ජීවිතයකට ද ප්‍රමාණවත්ය. එහෙත්, පෘථග්ජනයන් හැමට, ඒ කළ නොහැකිය; හැමදා, වැරැදි පාරේ ගොස්, නැවත හැරී මනඃස්ථාපනය වීම, කිළිටි වන ඇඳුම් ලොන්ඩරියටය වන්නාසේ, යළි යළිත්, 'බෝර්න් එගේන්'වීමකි.

කරුණු එසේව තිබෙයි. කතෝලිකයෙක් යනු කිතුනුවෙකි; කිතුනුවෙක්නු කතෝලිකයෙකි; සත්‍යයෙන්ම, සෑම කතෝලිකයෙක්ම හෙවත් කිතුනුවෙක්ම, 'බෝර්න් එගේන්' ය. මේ අපභ්‍රංශය කුමක්ද? ඉංගිරිසියෙන් 'බෝර්න් එගේන්'යනු, 'අලුතෙන් යළි ඉපැදුණු'යනුයි. හුදෙක් මේවදන කිතුනුවන් හා බැඳුණක් වුවද, 'මෙහි සත්‍යාර්ථය, ඕනෑම ධර්මතාවක් අදහන, ඕනෑම අයෙකු සඳහා පොදුවේ භාවිත කළ හැක්කක්ය'යනුවනේ කීම සත්‍යයක් නොවෙයි. එසේනම්, මේ පිළිබඳව මධ්‍යස්ථව සිත මෙහෙය වුවහොත්, 'බෝර්න් එගේන්ක්‍රිස්ටියන්'යනුවෙන් කියන ආකාරයටම, 'බෝර්න් එගේන්බුඩිස්ට්'යනුවෙන්ද වැහැරිය හැකි බව පෙනී යනු ඇත.

යේසුස් වහන්සේ වෙතට එක් රාත්‍රියක රහසිගතව පැමිණි නිකොදේමුස් ඉශ්‍රායෙල්හි කීර්තිමත් ගුරුවරයෙකි. යේසුස්වහන්සේ ඔහුට පැවසූ අලුතෙන් ඉපැදීම ('බෝර්න් එගේන්') ගැන වටහා ගැනුමට අපොහොසත්වූ ඔහු, ප්‍රශ්න කෙළේ, "නැවත උපදින්නට, මහලු මා, යළිත් මව්කුසට ඇතුළු වන්නේ කෙලෙසකද?"යනුවෙනි. නිකොදේමුස්එහි සත්‍යාර්ථය වටහා ගත්තේ පසුවය.

ශුඩ බයිබලය දක්වන පරිදි, වෛද්‍යවරුන් හා ඖෂධ දෙවියන් වහන්සේගේ නිර්මාණයක් වුව ද, තවමත් අවශ්‍ය ඖෂධ පිළිබඳව අනාවරණය නොකර ගත් රෝග ගණනාවක් තිබෙයි; එවැනි රෝග, දෙවියන් වහන්සේ සුව කරන බව, ගෞරවනීය දේවගැති තියඩෝර් එච්. පෙරේරා පවසා තිබෙයි. ශ්‍රී ලංකාවේ සුව කිරීමේ කිතුනු නිවාසයන්හි ආරම්භකයා වූ මෙතුමා, එක්දහස් නමසිය හතළිස් ගණන් වල අගභාගයේ, ඌරුබොක්ක ග්‍රාමීය රෝහල භාරව සිටි, කොළඹ වෛද්‍ය විද්‍යාලයෙන් සමත්වූ ඇපොතිකරි වෛද්‍යවරයා විය. රෝහලට ගෙන ආ, අධික ලෙස රුධිරය වහනය ඇති කාන්තාවකට, කොතෙක් ප්‍රතිකාර කළද, ඒ නොනැවතී ඇය මියැදෙමින් සිටින බව මොහුට පසක්වූයෙන්, දෙන්නට වෙනත් බෙහෙතක් නැති තැන, ඔහු ලෙඩ ඇඳ ළඟ දණින් වැටී, ඇයට සුවය ඉල්ලා යාච්ඤා කරන විට, ඒ රෝගී කාන්තාව සුවපත් වූවාය. මේ අත්දැකීම ඔහුගේ චිත්තාභ්‍යන්තරය සසල කෙළෙන්, තම ඇපොතිකරි වෛද්‍ය ධුරයෙන් සමුගෙන, මෙතොදිස්ත සභාවේ දේවගැතිවරයකු බවට පත්ව, දිව්‍ය සුවය ලැබ ගැනුම පිළිබඳව කටයුතු ආරම්භ කෙළේය. එහිදී එතුමාණන්ගේ ආස්ථානය වූයේ, යට පැවසූ ඊනියා 'බෝර්න් එගේන්'කල්ලිය, යේසුස් වහන්සේ හා සමඟ පෞද්ගලික සම්බන්ධතාවක් ඇතිකර ගැනීම අමතක කරවීම වෙනුවට, ශුඩ බයිබලය දක්වන අදහස හා සබැඳි, යේසුස් වහන්සේ සොයමින් ඔවුන් වහන්සේ හා සමඟ පෞද්ගලික සම්බන්ධතාවයක් ඇතිකර ගැනීම මත දිව්‍ය සුවය අත්විඳිය හැකි බව ය. ඇතැම්'බොර්න් එගේන්'කල්ලි, තමන්ගේ යාච්ඤා පම්පලෝරි අන්තර්ජාලයේ මුදා හරිත්දී, එතුමාණන් මොරටුවේ, ගල්පිටහබඩ ඇරැඹි දෙව්සුව සේවාව නම්වූ, කිතුනු සභාවක් නොවන සුවකිරීමේ නිවාසය, වසර පනසක් තුළ, නිහඬවම තම මෙහෙවරේ යෙදෙයි.

ඖෂධයෙන් සුවනොවූ තැන, තැනැ තැනැ යමින්, කොහෙන් හෝ සුවය ලැබ ගැනුමේ බර ඇත්තේ, රෝගයෙන් පෙළෙන්නාටය. අත ඇති දේ වියදම් කර හමාර වුවද, ණයට ගෙන හෝ එක් එක් අය කියන කියන තැනට යන්නේ, අන්තිමේදී දියේ ගිලෙන්නට යන්නේ, තමා බැවින්, පිදුරු ගසේ එල්ලී හෝ තම ජීවිතය බේරා ගැනුම ඔහුගේ හෝ ඇයගේ එකම අභිප්‍රාය කරගෙනය.

සුව කළ නොහැකි රෝගයකට තමන් ගොදුරු වුවහොත්, අන්‍යයන් විසින් තමා ගැන නිර්දය අන්දමට මුද්‍රිත මාධ්‍යයන්හිත්, අන්තර්ජාල අඩවිවලත් සටහන් තබමින්, තමා අධෛර්‍යයට පත්කරනු ලැබුවහොත් කුමක් කරන්නේද?

(මෙම ලේඛකයා ශ්‍රී ලංකා මෙතොදිස්ත සභාවේ ගිහි දේශක හා සන්නිවේදන සම්බන්ධීකාරකයකු වශයෙන් ද, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ, ජාතික රූපවාහිනීයේ සහ ස්වාධීන රූපවාහිනීයේ කිතුනු උපදේශක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කළේය)

සිනමා කැමරාව පවා ආදරය කළ සුපිරි නළුවා විජය

● ඒ. ඩී. රන්ජිත් කුමාර

විජය කුමාරතුංග යනු සිංහල සිනමාවේ දිදුලන තරුවකි. ඔහු අද ජීවතුන් අතර නැත. විජය කුමාරතුංගයන් අද ජීවතුන් අරත සිටියා නම් ලබන පෙබරවාරි 09 වැනි අඟහරුවාදාට වසර 76 කි. ශ්‍රී ලංකාවේ ප්‍රථම සුපිරි නළුවා වූ ගාමිණී ෆොන්සේකාගෙන් පසු ජනප්‍රිය සම්මාන උරුමක්කාරයා වූයේ විජය යි. 1967 සිට 1981 තෙක් සරසවිය සම්මාන උලෙළවල ජනප්‍රිය නළුවා ලෙස අති විශාල පාඨක ජන්ද මලු ගණනින් කූපන් ලැබූ නළුවා ලෙස මිය යනතෙක්ම ජනප්‍රිය කිරුළට හිමිකම් කීවේ විජය යි. තමා වෙනුවෙන් තමා විසින්ම ජනප්‍රිය නළුවා සඳහා කූපනයක්වත් නොයැවූ අය අතර මා දැන සිටියේ ගාමිණී හා විජය පමණි.

"මේ පාර දැනට ජනප්‍රිය කූපන් වැඩි එන්නේ විජයට. "වරක් 1982 වසරේ සරසවිය සම්මාන උලෙළට කිට්ටු දිනක මට හමු වූ ගාමිණී අයියාට මම කීවෙමි.

"මම පත්තරයෙන් දැක්කා. විජයට ජනප්‍රිය සම්මානය ලැබෙන්න තිබුණේ මීට ඉස්සෙල්ලා." ගාමිණී අයියා කීවේය.

1982 සිට 1987 දක්වා ජනප්‍රිය නළුවාට හිමි සරසවි සම්මාන දිනූ විජය එදා මෙදා තුර දේශීය සිනමාව බිහි කළ ජනප්‍රියතම සුපිරි තරුව (The Most Famous Srilankan Mega star) වූයේය.

"මම නළුවෙක් වූයේ ගාමිණී නිසා බව විජය කීවේ මේ ලියුම්කරු 1986 වසරේ ලියූ "ගාමිණී : හෙළ සිනමාවේ සක්විති" කෘතිය සඳහා ඔහුගේ මතකය ගැන විමසූ විටය.

"සීදූවේ එක්තරා සංගීත සංදර්ශනයක ප්‍රධාන අමුත්තා ලෙස 1966 වසරේ ගාමිණී පැමිණි අවස්ථාව මම ඇත සිට බලා හිටියා. එදා ගාමිණී වේදිකාවට නැග එහි රැස්ව සිටි දහස් දෙනාට ආචාර කළාම නැගුණු අත්පොළසන් හඬ තවමත් මගේ හිතේ රැව් දෙනවා. ඒ කාලයේ පොලිසියට බැඳීමට සිටි මට "අනේ මටත් ගාමිණී වගේ නළුවෙක් වෙන්න ඇත්නම්" කියලා සිතුණා. ගාමිණී ආපසු තම රථය වෙත යනකොට සින්දු ඇහිල්ල පැත්තක තියල සෙනඟ ඔහු වට කරගෙන ගියා. දෛවය කියන්නේ මා සිනමා නළුවෙක් වී ගාමිණී සමඟ එකට රඟපෑවේ "හතර දෙනාම සූරයෝ" චිත්‍රපටයේ.

විජය ගැන නොයෙක් දේ ඔබ අසා ඇති. විජේගේ ජීවිතයේ තොරතුරු මේ ලියුම්කරු "සරසවිය" පත්‍රයට ලිපි සියයකට කිට්ටු විශේෂාංග ලියා ඇත. විජය මිය ගිය පසු වරෙක විජයගේ සොහොයුරියක් වූ රූපා කුමාරතුංග (හිටපු පළාත් සභා මන්ත්‍රීනි) අපට කී කතාවක් මේ මොහොතේ මතක් වෙයි.

"අපේ තාත්තා මිය යන විට මට අවුරුදු 07 යි. මට වැඩිමල් අක්කා විජියන්ට අවුරුදු 08 යි. විජයට අවුරුදු දෙකයි. පවුලේ වැඩිමලා වූ සිඩ්නි අයියට (ජනප්‍රිය සිනමා රංගන ශිල්පී ජීවන් කුමාරතුංග ගේ පියා) අවුරුදු 10ක් විතර ඇති. මට මේ වෙලාවේ එක්තරා මිහිරි නත්තලක් මතක් වෙනවා. සෑම අවුරුද්දකම දෙසැම්බර් 24 වෙනිදා ඉතාමත් සතුටු දවසක්. කොළඹ රැකියාව කළ සිඩ්නි අයියා එදාට එන්නේ අපිට සෙල්ලම් බඩු අරගෙන. එදා අයියා එන්න රෑ වුණා. අයියා එනකල් ඇඳට වෙලා විජය මල්ලිත්, මමත් නොනිදා හිටියා. ඔන්න අයියා එන අඩි ශබ්දය එනවා. අපි දෙන්නා ඇස් පියාගෙන නිදාගෙන නිදි වගෙ ඉන්නවා. අයියා අපි ගාවට එනවා.

"අනේ අපේ පුංචි කොල්ලයි, කෙල්ලයි හොඳටම නිදි. අපි මේ ගෙනාපු සෙල්ලම් බඩු දුප්පත් ළමයින්ට දෙමු." අයියා අපිට ඇහෙන්න තනිවම තොල් මතුරනවා.

අපි එක පාරටම 'අපි නිදි නැතෝ' එකවර කෑගසාගෙන නැගිටිනවා. අයියා අපිව බදාගෙන තුරුළු කරගෙන, "ඔන්න අපේ පුංචි පැටියට ගෙනාව ලස්සන කාර් එකක්. ආ.... මෙන්න පුංචි නංගිට ගෙනාව ඉබ්බෙක්. ඔයා ඉබ්බි වගේ නේ." අපි රෑ දොළහට පල්ලියට ගියා. ගෙදර ඇවිත් තෑගි පාර්සල් කඩා බැලුවා. මට ලැබුණ ඉබ්බා වයින් කළාම ඌ ගේ පුරාම යනවා.

"මටත් ඕනෑ ඉබ්බෙක්. මට කාර් එක එපා." විජය ගෙදර වහලේ උළු ගැලවෙනකන් ඇඬුවා. "ඉන්න මම හෙට වැඩට ගිහින් එන කොට ඉබ්බෙක් ගෙනත් දෙන්නං" අයියා විජයගෙ හිස අතගාලා කිව්වා. එදා විජය කුතුහලයෙන් බලන් හිටියේ අයියා එනකම්. කිව්වා වගේම අයියා ලස්සන ඉබ්බෙක් විජයට දුන්නා. හරි ආඩම්බරයෙන් එය තුරුළු කරගෙන කාමරයට ගියා. අපි දෙන්නාව කොළඹ එක්ක ගිය දවසක කොටුවේ ඔර්ලෝසු කණුව ළඟ තිබුණ සෙනෙවිරත්න සෙල්ලම් බඩු කඩෙන් මොනව හරි අරන් දීලා, මරදානේ බුහාරි හෝටලයට එක්ක ගිහිං බිරියානියි, වටලප්පනුයි කන්න දෙනවා."

කෝවිලගේ විජය ඇන්තනී 1945 වසරේ පෙබරවාරි 09 වෙනිදා සීදූවේ උපත ලැබුවේය. ඔහුගේ පියා වූ බෙන්ජමින් කුමාරතුංග ගම් හතක් භාර ගම්මුලාදැනියෙක් විය. මව වූයේ මිනුවන්ගොඩත්, දිවුලපිටියත් අතර පිහිටි මැඩේමුල්ලේ උපන් කාන්තාවකි. විජයට රඟපෑම පිහිටියේ තම පියාගෙන්ද? විනෝදයට රඟ පෑ මේ ගම්මුලාදැනියා පල්ලියට ආධාර පිණිස ගමේ නාට්‍යවලත්, පසුව ටවර් හෝල් නාට්‍ය කීපයකත් රඟ පෑ ජනප්‍රිය නාට්‍යවල රඟ පෑ බවත්, ඔහු ප්‍රකට ටවර් නිළියක වූ පර්ල් වාසුදේවි සමඟ ගත් පින්තූරයක් තවම මහගෙදර එල්ලා ඇති බව රූපා අපට පැවසුවාය. ගමේ කඩවසම් තරුණයෙක් ලෙස විජය කැපී පෙනී සිටි බව කීම අරුමයක් ද? රූපා අක්කා අපට පැවසුවේ විජය වයස අවුරුදු 14 වන විට ගමේ රූබර යුවතියන්ගේ ආදරය දිනාගෙන සිටි බවය. ගමේ ලස්සන කෙල්ලක් විජයට අසීමිත ලෙස ප්‍රේම කිරීම ගෙදරට ද එක්තරා වධයක් විය.

"විජය එල්ලේ ක්‍රීඩාවට දක්ෂයි. සීදූවේ "සමරැස" එල්ලේ ක්‍රීඩා සමාජයේ දක්ෂතම ක්‍රීඩකයා වූ විජය ගේ ක්‍රීඩා කෞශල්‍යය දැක බලා ගැනීමට එක් අවසාන එල්ලේ තරගයක් බැලීමට ධනවත් පවුලක ගැහැනු ළමයෙක් පැමිණියා. ඇයගේ ප්‍රේමය වැඩි දුර නොගියේ විජය ඒ කාලෙම සිනමා රංගනයට පිවිසීම නිසා. විජය කුඩා කාලයේ සිටම මානව හිතවාදී, අනුන්ගේ දුකේදී පිහිට වූ මිතුරන්ට කල්‍යාණ මිතුරකු වූ, අයුක්ති, අසාධාරණයට එරෙහි වූ චරිතයක්. පුංචි කාලේ ඉඳලම විජයට වාමාංශික අදහස් තිබුණා. එයට හේතුව සිඩ්නි අයියා තද සමසමාජ පක්ෂිකයකු වීමයි. මගේ මාමා කාලෝ ෆොන්සේකා (අම්මගේ සහෝදරයෙක්) ගෙදරට ගෙනෙන "සමසමාජය" කියන පුවත්පත් පාර්සලය ගමේ බෙදා දෙන්නේ විජය. සිඩ්නි අයියා උපතින් පෝලියෝ රෝගියෙක් වූ නිසා බයිසිකලයක නැගී පත්තර බෙදා දුන්නේ විජය, සීදූව, කටාන, මීගමුව, දිවුලපිටිය දක්වා පත්තර බෙදා හැරලා ගෙදර එන්නේ ඇඳිරි වැටුණට පස්සේ. ඒ කාලේ මීගමුවේ පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර හෙක්ටර් ප්‍රනාන්දු සමඟ කාලෝ මාමා ගෙදර ඇවිත් සිඩ්නි අයියා එක්ක දේශපාලනය ගැන කතා කරනවා පාසල් යන විජය අහගෙන හිටියා. ඇන්. ඇම්, කොල්වින් කතා කරන රැස්වීම් බලලා විජය ගෙදර ඇවිත් ගස් කොළං වලට ඒ වගෙ කතා කරනවා. විජය එතකොට කොටහේනේ ශාන්ත බෙනඩික්ට් විද්‍යාලයට යන්නේ. එක දවසක් රන් පදක්කමක් අරන් විජය ඇවිත් ප්‍රීතියෙන් සිඩ්නි අයියට පෙන්නුවා.

"අයියේ මම අද ඉස්කෝලේ කරීක තරගයෙන් පළමුවැනියා වුණා. මේ මට ලැබුණු රන් පදක්කම."

අයියා, විජයගෙ ඔළුව අත ගාලා "මල්ලි ඔක විවියන් අක්කට දෙන්න. එයා පරෙස්සම් කරයි." කිව්වා.

"මල්ලි ගැන කියන්න ගොඩක් දේවල් තියෙනවා. පොත් දෙක තුනක් වුණත් ලියන්න කරුණු තියෙනවා." රූපා කීවාය.

විජය ගායකයෙක් හැටියට හැකියාව පෙන්වා ඇත්තේ ශාන්ත බෙනඩික්ට් විද්‍යාලයීය පාසල් වේදිකාවෙනි. සී. ටී. ප්‍රනාන්දුගේ ගීත ගයා පාසලේ දක්ෂතම ගායකයා වූයේ විජය බව ඔහුගේ පන්ති සගයකු වූ ප්‍රකට කණ්ඩායම් ගායකයකු වූ මිල්රෝයි ධර්මරත්න අපට කීවේය.

දිනක් ගුරුවරයකුගෙන් ප්‍රමාද වී පාසලට පැමිණීම නිසා බැණුම් ඇසීමෙන් පසු පාසල් වේදිකාවේ විජය දුක්බර විලසින් ගායනා කළේ මිල්ටන් පෙරේරා එකල ගැයූ ජනප්‍රිය ගීතයක්.

"වැඩ කරලා ඉවර නොමැත දෙවියනේ

මොකටද මා දුප්පත් වී ඉපදුණේ"

මේ ගීතය විජය ඉතා දුක්බර ස්වරයකින් ගැයුවාද යත් පාසල් සිසුන්ගේ පමණක් නොව අර බැණ වැදුණු ගුරුවරයාගේ ද සිත් සසල වුණා. කෙසේ වෙතත් අනාගතයේ නළුවකු වන බවට ඉඟි පළ කරමින් විදුහලේ රඟපෑවේ එකම එක නාට්‍යයක පමණයි. "පණ්ඩුකාභය" නම් වූ මේ නාට්‍යයේ කුමාරයකු ලෙස අගේට ඔහු රඟපෑවා."

විජයගේ සමකාලීන මෙන්ම පන්ති සගයන් වූ රොබින් ප්‍රනාන්දු, රවීන්ද්‍ර රන්දෙනිය, සුදේශ් ගුණරත්න ආදීන් ගැන තොරතුරු මීට පෙර සිළුම්ණේ මේ ලිපි පෙළෙන් සඳහන් කර තිබුණි.

ශාන්ත බෙනඩික්ට් විද්‍යාලයෙන්, කඳානේ ඩී මැසනඩ් විද්‍යාලයේ ඉගෙනීමට ගිය විජය ගැන එහි ගුරුවරයකුව සිටි ලෙස්ලි බොතේජු (චිත්‍රපට විචාරක) වරක් අපට කියා තිබුණි. විජය සිටි පන්තියට ඉගැන්වූ මේ ගුරුවරයාට දඟකාර සිසුන්ගේ උසුළු විසුළු, කොළ කැලි ගුලි කොට ගැසීම්, කඩදාසි කුරුල්ලන් යැවීම් නිසා ඉගැන්වීමට එපා විය. මේ ශිෂ්‍යයන් අතර කැපී පෙනුණෙ විජයයි. ගුරුවරයා විජය ගුරු මණ්ඩලයේ විවේකාගාරයට කැඳවීය.

"ඔයා පාසල් එන්නේ ඇයි?"

"ඉගෙන ගන්න"

"කාගෙන්ද ඉගෙන ගන්නේ"

"ගුරුවරුන්ගෙන්"

"එහෙනම් අද හවස පන්තියට එන කොට ඔය දැඟලිල්ල නවත්වල එන්න."

"සර් එන්න. අපි දඟලන්නෙ නෑ."

ඉන්පසු වූ වෙනස ලෙස්ලි බොතේජු මෙසේ විස්තර කළේය.

"මා එදා පන්තියට ඇතුළු වූයේ වේවැල අත ඇතිවයි. පන්තියේ කිසි හැල හොල්මනක් නැත. මීයට පිම්බා වගේ නිශ්ශබ්ද ය. පොත් දිග හැරගෙන ළමයි හිටියෙ. ටික වේලාවක් ඒ අයට අවවාද දෙන්න සිදු වුණා. එතැන සිට මට කිසිම අවහිරයක් වුණේ නෑ. මම මේ උදාහරණය ගෙන හැර පෑවේ විජය තුළ එදා ද නායකත්වය සඳහා නිසඟ චරිතයක් වූ බව කියන්නට ය."

විජය සුපිරි තරුවක් වූ කාලයේ මම මද්දහනේ ගුවන් විදුලි කාර්යාලය දෙසට ගමන් කරමින් සිටියා. මා පසුකර මෝටර් බයිසිකලයක් නතර වුණා. එහි දෙදෙනෙක් සිටියා. එක් අයෙක් විජයයි.

"කොහෙද සර් මේ අව්වේ"

මම කාරණය කීවා.

"මණික්, උඹ ටිකකට බැහැපන්. මම සර්ව ඇරලවල එන්නම්."

ඒ විජය ය. එසේ බිමට බැස්ස වූයේ චිත්‍රපට අධ්‍යක්ෂ මණික් සන්දසාගරය. මා ගුවන් විදුලියට ඇරවලා ඔහු ගියා. විජය කොතරම් නිහතමානී උදාර පුද්ගලයෙක් ද?" ලෙස්ලි අපට කීවේය.

විජය "හන්තානේ කතාවෙන්" තම සිනමා රඟපෑම ඇරඹූ අතර ඒ චිත්‍රපටය තිරගත වීමට පෙර ඔහුට චිත්‍රපට 11ක රඟපෑමේ වරම් ලැබුණේය.

ජනප්‍රිය ධාරාවේ "හතර දෙනාම සූරයෝ", තුෂාරා, සුසී, සංගීතා, නොම්මර 17, මමයි රජා, රජ වැඩකාරයෝ, ඔබටයි ප්‍රියේ ආදරේ, උන්නත් දහයි මළත් දාහයි, නැවත හමුවෙමු චිත්‍රපටවල මෙන්ම අහස් ගව්ව, දියමන්ති, එයා දැන් ලොකු ළමයෙක්, බඹරු ඇවිත්, මරුවා සමඟ වාසේ, පොඩි මල්ලී, කරුමක්කාරයෝ, පාර දිගේ, කැඩපතක ඡායා, මධුසමය වැනි චිත්‍රපටවලින් විජය තම රංගන ප්‍රතිභාව විදාරණය කළේය. විජය චිත්‍රපට පසුබිම් ගායකයකු ලෙස පාර දිගේ, ගඟ අද්දර, ඉන්දුට මල් මිටක්, ආරාධනා, හිමකතර, හිත හොඳ චණ්ඩියා, කවුළුව, අහිංසා, නොම්මර 17, රන්දෙණියේ සිංහයා, දොළොස් මහේ පහන, වරදට දඬුවම, සමාව, සහරාවේ සිහිනය චිත්‍රපට ගී ගැයූ අතර 'සහරාවේ සිහිනය' චිත්‍රපටයේ 'වළාකුලක් ගෙන' ගීතය සඳහා 1991 හොඳම ගායකයා ලෙස ද 'දොළොස් මහේ පහන' චිත්‍රපටයේ 'පෙමක සුවඳ දැනිලා' ගීතය සඳහා 1992 දී ද සරසවිය සම්මාන හිමි විය. 'කැඩපතක ඡායා' චිත්‍රපටයේ නිර්මාණ රංගනය වෙනුවෙන් OCIC සම්මානය ද 1990 වසරේ හොඳම නළුවා ලෙස ස්වර්ණ සංඛ සම්මාන දිනා ගත්තේය. ඒ විජයගේ කලා ජීවිතේ තවත් පැත්තක් ය.

විජයගේ විවාහය ගැන අසා රූපා අක්කා විමතියට පත් වූවාය. ඇය ඒ වන විට සිටියේ විදේශගතවය. 1977 මහා මැතිවරණයේදී ඒ වන විට කටාන ආසනයට ශ්‍රී.ල.නි. පක්ෂයෙන් තරග කොට එ.ජා. පක්ෂයේ විජයපාල මැන්දිස්ට පරාජය වී සිටියේය. විජයගේ අම්මා රූපා අක්කාට මෙසේ ලියා යැව්වාය.

"විජය මල්ලී බණ්ඩාරනායක පවුලේ චන්ද්‍රිකාව කසාද බඳින්න යනවා."

"අම්මා අපිට ඒ වගේ පවුලකට සම්බන්ධ වෙන්න පුළුවන්ද?" රූපා අම්මාට ලියා යැව්වාය.

"පුතාගේ කැමැත්තක්. එයා කැමති ඕන දේකට මම කැමතියි."

විවාහය සිදුවිය. ඒ 1978 වසරේ පෙබරවාරි 20 වෙනිදාය. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් හා හෙක්ටර් කොබ්බෑකඩුව මහතා සාක්ෂියට අත්සන් තැබුවේය.

විජය නැක්සලියිට් චෝදනාව මත සිරගත වූ කාලය ඔහුගේ අභාග්‍ය සම්පන්නම කාලය විය. විජය අත්අඩංගුවට ගත් බව ගාමිණී ෆොන්සේකාට දැන ගන්න ලැබුණේ ටෝනි රණසිංහගෙනි. ටෝනි ගාමිණීට කීවේ විජය වකුගඩු අසනීපයෙන් පෙළෙන නිසා ඔහුගේ තත්ත්වය අසාධ්‍ය විය හැකි බව ය. ගාමිණී එවකට සිටි රාජ්‍ය නායකයන් සමඟ සාකච්ඡා කළ අතර චන්ද්‍රිකා මහත්මිය ජනාධිපති ජයවර්ධන මහතා හමුවීමට කටයුතු කළේය. දින දෙක තුනකින් ජනාධිපතිතුමා චන්ද්‍රිකා මහත්මිය කැඳවා කරුණු විමසා තේ පැන් සංග්‍රහයක් කර විජය වහාම යුද හමුදා රෝහලට පිටත් කළ බව ගාමිණී අපට කියා ඇත. සිර අඩස්සියේ දුක්ඛිත ජීවිතයක් ගත කළ විජය එයින් එළියට ආවේ මිනිස්කමින් වඩාත් පොහොසත් මිනිසකු ලෙස බව ගාමිණී එදා කීවේය.

විජය තමාට මුල්වරට හමුවීම ගැන චන්ද්‍රිකා මහත්මිය යළි ආවර්ජනය කළේ 2008 වසරේ යෙදී තිබුණ ඔහුගේ 20 වැනි ගුණානුස්මරණ උලෙළ දා තිරගත වන වාර්තා චිත්‍රපටයට අවශ්‍ය පිටපත සකස් කිරීමට හා ඒ සඳහා චිත්‍රපට පින්තූර ලබා ගැනීමට මට කළ ඉල්ලීමට ඇය හමු වූ අවස්ථාවේදීය. එදා චන්ද්‍රිකා මහත්මිය සමඟ කළ පිළිසඳරේ දී මා ඇසූ ප්‍රශ්නයකදී ඇය තම ආදර අන්දරය ගැන මතක් කළාය. මේ කතාව 2008 වසරේ විජේගේ ගුණානුස්මරණය වෙනුවේ මා එකල ජාතික පුවත්පතකට ලිපියක් ලීවෙමි.

"1977 වන විට මම විජය රඟපෑ චිත්‍රපට දෙක තුනකට වඩා දැක තිබුණේ නෑ. මගේ නැන්දණියක් වන සීවලී රත්වත්ත මැතිනිය නිෂ්පාදනය කළ 'පෙම්බර මධූ' මම නැරඹූ විජයගේ මුල්ම චිත්‍රපටය. විජය මා ජීවමානව දැක ගත්තේ 1977 ජූලි මාසයේ පාර්ලිමේන්තුව විසුරුවට පස්සේ. මේ මැතිවරණයට නාම යෝජනා ලැබූ සංවිධායකයන් අම්මා අතින්ම පත්වීම් ලියුම් බාර දීමේ උත්සවයක් ශ්‍රී.ල.නි.ප. යෙන් පැවැත්තුවා. කටාන ආසනයට ශ්‍රී.ල.නි.පයෙන් තරග කරන විජය මා දුටුවේ නෑ. අපි දවල් කෑමට මගේ බත් පාර්සලය ගන්න ශාලාවට ගිය වෙලාවේ මම දැක්කා අනුර එක්ක විජය කතා කරමින් සිටිනවා. අනුර මට කතා කළා.

"චන්ද්‍රිකා මෙහෙ එන්න. ඔයා විජය හම්බවෙලා නැහැ නේද?" කියලා හඳුන්වල දුන්නා.

එදා හවස තිබුණ රැස්වීමේදි විජය මා දෙස උනන්දුවෙන් බලා සිටියා. ඊට පස්සේ බොරු හේතු හදාගෙන මාව හොයා ගෙන අත්තනගල්ලට ආවා. මම රැස්වීම්වල කතා කරලා ගෙදර එන්නෙ රෑ වෙලා. විජය කිහිපවතාවක්ම මාව හමුවෙන්න ඇවිත් රස්තියාදු වෙලා මහ රෑ ගිය බව ආරංචි වුණා. එක දවසක් මම එනකොට විජය, සුනේත්‍රා අක්කා එක්ක කතා කර කර හිටියා.

"මෙයා ඔයාව කටානේ රැස්වීම්වලට ගෙනියන්න බලන් ඉන්නේ." අක්කා කිව්වා.

විජයගේ ආරාධනයෙන් මම කටානේ රැස්වීම් කිහිපයක කතා කළා. විජය මාව බලන්න අත්තනගල්ලට ආව බව මට වැටහුණා. අපි දෙන්නා අතර ආදර සම්බන්ධයක් ඇතිවුණේ ඔය ආකාරයට."

විජය සිය බිරිය චන්ද්‍රිකා කුමාරතුංග, දුව යශෝධරා සහ පුතු විමුක්ති දරුවන් සමඟින් සිනමා සම්මාන උළෙලකට සහභාගිවීමට පැමිණෙමින්

දශක තුනකට පෙර කලා ලොවේ දැවැන්තයන් කිහිපදෙනෙක් (වමේ සිට) එච්. ආර්. ජෝතිපාල, ගාමිණී ෆොන්සේකා, විජය සහ ජෝ අබේවික්‍රම

'නැක්සලයිට්' කුමන්ත්‍රණ චෝදනාවක් මත ආණ්ඩුව විසින් 1982 නොවැම්බර් 19 අත්අඩංගුවට ගත් විජය මැගසින් බන්ධනාගාර රෝහලේ සිටියදී බිරිය චන්ද්‍රිකා සුවදුක් විමසන අයුරු. දෙමසකට පසු විජය මුදා හරින ලදී.

විජය අද අප අතර නැත. කලාකරුවන්ගේ හිතවතකු වූ, මගේ මාධ්‍ය ජීවිතයේ දිගු කාලයක මාධ්‍ය මිතුරකු වූ සිරි කහවල සෑම කලාකරුවකුගේම උපන් දින දැන සිටියේය. ඔහු ඒ හැම කලාකරුවකුටම හිමිදිරි පාන්දර දුරකථනයෙන් සුබ පතයි. විජයගේ සමීපතම මිතුරා, සහෝදර හිතවතා, දේශපාලන සගයන් අතර ළඟම සිටියේ සිරි ය. විජයගේ උපන්දිනය යෙදී ඇති පෙබරවාරි 09 දින උපන් සිරි කිසිදා එය සැමරුවේ නැත. තම හද බැඳි මිතුරා වෙනුවෙන් එදිනට සිරි සොවින් අතීත සැමරුම් අතර සිටීමට හිත හදාගෙන ඇත.

සුපිරි තරුවක් වන්නේ කෙසේ ද? සුප්‍රකට ඇමෙරිකානු චිත්‍රපට අධ්‍යක්ෂවරයකු වූ හොවාඩ් හෝකස් මෙසේ කියා ඇත.

"කැමරාව සමහර විට පුද්ගලයන්ට කැමැත්ත දක්වයි. කැමරාව එසේ කැමැත්ත දක්වන පුද්ගලයන්ට වැරදි ද කළ නොහැකිය. කැමරාව ප්‍රිය මනාප රූප සතු පුද්ගලයන් සිය ග්‍රහණයට ගනී."

විජයට ඒ වාසනාව තිබූ බවත්, කැමරා කෝණය කොතනක පිහිටනු ලැබුවත්, විජය ප්‍රියමනාප පුද්ගලයකු බවට පත් කරන බව විජයගේ පාසල් ගුරුවරයකු වූ චිත්‍රපට විචාරක ලෙස්ලි බොතේජු කියා තිබුණි.

සන්නිවේදන සංවාද

● මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

දැනුම බලය වේ

සහභාගි වන කණ්ඩායම කෙතරම් කුඩා වුව ද ඔවුන් වෙනුවෙන් යමක් පැහැදිලි කරලීම මහාචාර්ය විල්බර් ශ්‍රාම්ගේ සිරිතක් බව වටහා ගැනීමට මට කල්ගත වුණේ නැත.

"මම අද කැමතියි ඥානය එහෙමත් නැත්නම් 'දැනුම' (Knowledge) ගැන යමක් පැහැදිලි කරදීමට" යි එනම් තම කතිකාව හෙවත් සංකථනය (discourse) පටන්ගත්තේ ඒ අයුරිනි. දැනුම පැහැදිලි කරදීමට පර්යාය හා සමාන අර්ථ දෙන යෙදුම් සමුදායක් ඇති බව අපට සිහිපත් වීමට වැඩි වේලාවක් ගතවූයේ නැත.

"දැනුම හෙවත් ඥානය හැම භාෂාවකටම පොදු උරුමයක්. ඉංග්‍රීසි බසින් Know, Knowledge, Knowledgeable, Knowing යන යෙදුම් අනික් භාෂාවලින් දෙන අර්ථවලට සමාන බවත් මට දැනගැනීමට පුළුවන්කමක් ලැබුණා. ඉස්සර කාලේ විශ්ව කෝෂයට (Encyclopedia) කිව්වේ, Book Knowledge (ඥානකෝෂය) කියල. ඒක කාටවත් වෙනස් කිරීමට පුළුවන්කමක් නෑ. හැම විෂයකටම ඊට අදාළ ඥානයක් තිබෙන බව අමතක කරන්නට හොඳ නැහැ. ඒ නිසා 'ඥානය' යන්නට 'සන්නිවේදනාර්ථ' (Communication Meanings) බහුලයි. කලින් කලට මානව ඥානය පුළුල් වෙනවා. අද අපි 'ඥානය' වෙනුවෙන් දෙන අර්ථ තව කලකදී වෙනස් වෙනවා. ඒකට හේතු සමුදායකුත් හොයාගෙන තිබෙනවා. එක් ප්‍රධාන හේතුවක් තමයි, 'මානව ගවේෂණ' (human explorations). මානවයා කියන්නේ එක තැනක හිඳින්නට පුළුවන් වර්ගයේ සතෙක් නොවේ. මානවයා තැන් තැන්වලට ගිහිල්ල නව පන්නයේ අත්දැකීම්වලට ගොදුරු වෙනවා. අලුත් දේවල් නිපදවනවා. මානවයා තරම් මේ ලෝකේ නිපදවීමේ සූරයෙක් තවත් ඇද්දැයි හිතන්නටත් අමාරුයි. මානවයා සෙවිල්ලෙන් බැලිල්ලෙන් විතරක් සෑහීමකට පත්වන්නේ නෑ. මානවයා ගැටුම්වලට මුහුණ දෙනවා. මානවයා අභියෝගවලට මුහුණපානවා.

"මේ නිසා මොකද වෙන්නේ?"

"මොකද වෙන්නේ?"

"තම තමන්ගේ උන්හිටි තැන් වෙනස් වෙනවා. ඒ විතරක් ද? හොයා ගත්තු දේවල් වෙනස් වෙනවා. ඒ විතරක් ද මුළු මහත් චින්තන විධි ක්‍රමත් (Thinking patterns) රටාවනුත් වෙනස් මුහුණුවරක් ගන්නවා. මානවයාට විතරයි මේ ලෝකේ භාෂාවක් භාවිතයට ගැනීමට පුළුවන් වී තිබෙන්නේ. ඒ නිසා අකුරු කරවීමෙන් පටන් ගත් මානවයා බොහෝ දුරක් ගමන් කරල මාධ්‍ය පාලකයකු (Media Controller) බවට පත්වී සිටිනවා. අපට පුළුවන්කමක් ලැබිලා තිබෙනවා මානවයාව ප්‍රධාන කොටස් තුනකට දමන්න. මොනවද ඒ කොටස් තුන?"

"මොනවාද ඒ?"

"මානවයා සොයන්නෙක් හෙවත් ගවේෂකයෙක් (Human being is a seeker or an explorer). මානවයා මහා ගුරුවරයෙක් (Human being is a great - teacher). මානවයා මහා චින්තකයෙක් (Human being is a great thinker). මේ නිසා ඔහුට කළ නොහැකි කාර්යයක් මේ මිහිපිට ඇතැයි සිතන්නට අමාරුයි. ඒත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා මානවයාට. මොකක්ද ඒ? මානවයා ලබාගත් දැනුමෙන් නිසි පල ප්‍රයෝජන මානවයාම ලබාගන්නවාද?"

"කුමක්ද අපේ ප්‍රතිචාර?"

අපේ ගුරු තුමාණන්ගේ මුහුණේ හිනා රැල්ලක් මතු වේ.

"මේ හැම දැනුමක් ලබාගත් මානවයා සතුටින් ද ජීවත්වන්නේ? නෑ! මානවයා අතෘප්තිමත්, අසහනයෙන් පෙළෙන සත්වයෙක්. ඔහු ඒ තත්ත්වයෙන් මිදීමට සදාතනික සටනක නියැළී සිටිනවා."

අප මේ සටහන අවස්ථාවේදීත් ඒ සටන් ස්වභාවය අපට වටහාගත හැකි ය.

"දැනුම බලය වේ (Knowledge is Power) යැයි කීවේ මහා දාර්ශනික කාල් මාක්ස්ය.

මගේ සිහියට ආවේ මුනිදාස කුමාරතුංගයන් ලියූ කවකි.

"දැනුම ලබාදෙන දෙවියෝ
අකුරුය ඉන් නොවනු වියෝ
වූ අකුරු මැනැවින් සෙවියෝ
මුළු ලොව සලකන කවියෝ"

විජය මැරූ ලයනල්ගේ කතාව

● ධර්මන් වික්‍රමරත්න

ශ්‍රී ලංකා මහජන පක්ෂය ටී. බී ඉලංගරත්න ඇතුළු ශ්‍රීලනිප ජෙෂ්ඨයන් සමඟ 1984 ජනවාරි 22 වැනිදා පිහිටුවීමට පුරෝගාමී නායකත්වය දෙන ලද්දේ විජය කුමාරතුංග විසිනි. විජයගේ නායකත්වයේ අපරිණත බව හේතුවෙන් පසු කලක ටී.බී ඉලංගරත්න ඇතුළු ජෙෂ්ඨයන් රැසක් මහජන පක්ෂයෙන් ඉවත්වූ අතර එයට ඔසී අබේගුණසේකර වැනි අය පසු ආදේශ විය. ඉන්දු ලංකා ගිවිසුමට කොන්දේසි විරහිතව පැරණි වාමාංශික පක්ෂ සහ දෙමළ බෙදුම්වාදී කණ්ඩායම් සමඟ ශ්‍රී ලංකා මහජන පක්ෂය සහාය දුන් අතර විජය එහි පුරෝගාමී නායකත්වයක් උසුලන ලදී. කැම්බල් පිටියේදී 1988 ජනවාරි 28වැනිදා පැවති පක්ෂයේ සිවුවන සංවත්සර රැස්වීම එහි අභිෂේකයක් විය. සමසමාජ, කොමියුනිස්ට්, මහජන පක්ෂය යන පක්ෂ සමඟ එක්වී එක්සත් සමාජවාදී පෙරමුණ පිහිටු වූ අතර එය මැතිවරණ කොමසාරිස්වරයා විසින් පෙබරවාරි 11වැනිදා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙසින් ප්‍රකාශයට පත් කළේය. එම පෙරමුණට නව සමසමාජ පක්ෂයේද සහාය හිමි විය. එම පෙරමුණේ මංගල රැලිය 1988 පෙබරවාරි මස 21 සුගතදාස ක්‍රීඩාංගණයේ පැවැත්වීමට කටයුතු යොදා තිබිණි.

ජවිපෙ සන්නද්ධ අංශය වන දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය ද්‍රවිඩ ඊලමට පක්ෂ වාමාංශිකයන් නම් කළේ තුන්වන සතුරු හමුදාව ලෙසිනි. ඒ අනුව තුන්වන සතුරු හමුදාව අතුගා දැමීම දේශප්‍රේමී අරගලයේම කොටසක් බවට 1988 ජනවාරි 25වැනිදා නිකුත් කළ නියෝගයක සඳහන් විය. ඒවන විට ජවිපෙ මගින් 1987 නොවැම්බර් 29වැනිදා ඝාතනය කළ අනුරාධපුරයේ නන්දන මාරසිංහ සහ 1988 පෙබරවාරි 11වැනිදා ඝාතනයවූ කොමියුනිස්ට් පක්ෂයේ පොළොන්නරුවේ ගාමිණී මැදගෙදර ගේ අවමඟුල් උත්සවයන්ටද විජය සහභාගි වූ අතර එම ඝාතනයන් තරයේම හෙළා දකිනු ලැබීය.

ඉන්දු ලංකා ගිවිසුමට සිය ප්‍රසංශාව පළ කර සිටි විජය ඉන්දිය හමුදාව ශ්‍රී ලංකාවට පැමිණීමෙන් වාර්ගික අර්බුදය විසඳා ගැනීමට හැකිවනු ඇතැයි සිය සතුට පළ කර සිටියේය. ජවිපෙ ඉන්දු ලංකා ගිවිසුමට එරෙහිව මතවාදය ඉදිරිපත් කළ අතර මහජන පක්ෂය සහ විජයද දේශද්‍රෝහීන් ලෙස නම් කෙරිණි. ජවිපෙ ඝාතනවලට එරෙහිව රජයේ ආරක්ෂාවට පරිබාහිරව මහජන පක්ෂයේම ආරක්ෂක වළල්ලක් විජය විසින් ගොඩනගා ගැනීමට කටයුතු කළේය. ඒ අනුව 1987 ඔක්තෝබර් මසදී උමා මහේස්වරන්ගේ නායකත්වයෙන් යුත් ප්ලොට් සංවිධානයේ වවුනියාවේ අවි පුහුණු කඳවුරක පුහුණුවකට මහජන පක්ෂයේ කණ්ඩායමක් තෝරා යවන ලදී. විජය ඝාතනය වීමට පෙර අවස්ථා තුනකදී එසේ අවි පුහුණුව සඳහා කණ්ඩායම් තුනක් රහසිගතව යවා තිබිණි.

උදෑසන හලාවතට ගොස් පැමිණ ආපසු නාරහේන්පිට පොල්හේන්ගොඩ පාරේ සිය නිවසින් පිටතට එමින් සිටියදී යතුරුපැදියකින් පැමිණි තුවක්කුකරුවන් දෙදෙනකු විජය ඝාතනය කළේ ඒ. කේ. 47 වර්ගයේ ගිනි අවියකිනි. ඒ 1988 පෙබරවාරි 16වැනිදා පස්වරු 12.20ටය. විජයගේ මුහුණට ද වෙඩි තබා තිබූ බැවින් එය විකෘති වී තිබිණි. එබැවින් මෘත දේහයේ උඩ කොටස ආවරණය කිරීමට සිදු විය. පසුව පොලිසියට හිස් පතොරම් කොපු 14ක් හමු විය.

විජයගේ ආදානය 1988 පෙබරවාරි 21 වැනිදා කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ දී පැවති අතර එය නාරාහේන්පිට සිට පුරහල හරහා ගෙන ආවේ විශාල පෙළපාළියකිනි. අවමඟුල සජීව ලෙස රජයේ රූපවාහිනියෙන් විකාශය කළ අතර එය ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට අවමඟුලක් සජීව ලෙස විකාශය කළ අවස්ථාව ලෙස සැලකේ. විජය කුමාරතුංග ඝාතනය කිරීමට වෙඩි තැබූ එම අවස්ථාවේදී වෙඩි වැදී තුවාල සිදුවූ මහජන පක්ෂයේ රාගම ශාඛාවේ සහකාර ලේකම් සහ චිත්‍ර ශිල්පී සරත් උපාලිද බරපතළ ලෙස රෝගාතුරව සිට 1988 අප්‍රේල් 25වැනිදා කොළඹ මහ රෝහලේදී මිය ගියේය.

කුමාරතුංග ඝාතනයෙන් පසු ජවිපෙ සන්නද්ධ අංශය වන දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය නිවේදනයක් මගින් වගකීම බාරගෙන තිබිණි. එමෙන්ම මවුබිමේ සියලු සතුරන්ට දඬුවම් දීමේ සන්නද්ධ සේනාංකය මැයින් 1988 පෙබරවාරි 21වැනිදා 'විජය කුමාරතුංග යැව්වේ ඇයි?' මැයින් පත්‍රිකාවක් මුද්‍රණය කර බෙදා හැර තිබිණි. එහි මෙසේද සඳහන් විය. 'අප විසින් දඬුවම් කරනුයේ මවුබිමේ සතුරන්ට පමණි ඒ හැර අපේ දේශපාලනයට එකඟ නොවූවද දෝහීන් නොවූ කිසිවෙකුට හෝ පොදු මහජනයාට හෝ අපි කිසිදු හිංසාවකට ඉඩ නොතබමු'.

විජය කුමාරතුංග ඝාතන තීරණය සැලසුම් කළේ එවකට ජවිපෙ කොළඹ දිසා ලේකම් ලලිත් විජේරත්න හෙවත් ජයන්තය. තොරතුරු සෙවීම කොලොන්නාවේ පියසිරි ගෙනි. සාකච්ඡා පැවැත්වූවේ පිළියන්දල සෙන්ට් මිචල් හෝටලයේදීය. ලයනල් රණසිංහට කොන්ත්‍රාත්තුව ලැබී තිබුණේ ටාසන් වීරසිංහගේ මාර්ගයෙනි. විජය ඝාතනය සඳහා යොදවාගත් තුවක්කුව එවකට එජාප ආණ්ඩුවේ ඇමතිවරයකු වූ ගාමිණී ලොකුගේගේ ආරක්ෂක භටයකු ගෙන් ජවිපෙ පැහැරගත් ගිනි අවියකි.

විජය ඝාතනයට සම්බන්ධ යතුරුපැදිය පදවා ගෙන ගිය සැකකරු වූයේ ටාසන් වීරසිංහ හෙවත් හේරත්ය. ඔහු කළුතර පයාගල පදිංචිකරුවෙකි. ටාසන්ගේ පවුලේ සහෝදර සහෝදරියන් 9 දෙනෙකු වූ අතර ඉන් සිවු දෙනෙකු පිරිමිය. ටාසන්ගේ එක් සොහොයුරියක්වූ වීරසිංහ ලීලාවතී සිල්වා පානදුර බාලිකා විදුහලක ගුරුවරියකි. පවුලේ 8වැනියා වූ ටාසන් උපන්නේ 1958 ජනවාරි 13දාය. කලක් කළුතර ඇසෝසියේටඩ් මෝටර්වේස් සමාගමේ සේවය කළ ඔහු පසුව ලංගම රියදුරකු ලෙස කළුතර සිට



(වමේ සිට) විජය ඝාතනය සැලැසුම් කළ එවකට ජවිපෙ කොළඹ දිසා ලේකම් ලලිත් විජයරත්න හෙවත් ජයන්ත, ජවිපෙ යුද පුහුණු කඳවුරු සම්බන්ධීකරණය කළ මහරගම නාවින්නේ සුනිල් පතිරණ හෙවත් රොඩිනි සහ පො. කො. ඩයස් සමඟ ලයනල් අත්අඩංගුවට ගත් පො.කො. බර්නාඩ් බැසිල්.

යටදොල දක්වා ධාවනය වූ ලංගම බස්රථයේ කලක් කටයුතු කළ අතර පසුව රැකියාව අතහැර පූර්ණකාලීනව ජවිපෙට එක්විය.

විජය කුමාරතුංග ඝාතනය කළ 1961 මැයි 12 උපන් පාලම්මුල්ලලාගේ ලයනල් රණසිංහ 27 හැවිරිදිය. පියා 1930 අප්‍රේල් 19 කෑගල්ල පාලමුරේදී උපන් පාලම්මුල්ලලාගේ තේගිරිස්ය. ඔහු කුරුවිට පොලිසිය ඉදිරිපිට හුණු කඩයක් පවත්වා ගෙන ගියේය. මව දෙල්ගමුවේ උපන් වැලිකලගේ සිසිලින් ය. ජාතික විමුක්ති අරගලයකින් සමාජවාදය උදා කිරීමේ උපායමාර්ගික ගමන් මඟ අනුව ක්‍රියාවට නැඟූ ජවිපෙ 2වැනි කැරැල්ලේදී ඝාතන 41ක් සිදු කළ ලයනල් රණසිංහ උපන් සහ ජීවත්වූ නිවෙස්වලට ගිය මේ ලේඛකයා ඔහුගේ පවුලේ අය හමුවිය. ඔවුන් පැවසූ පරිදි ලයනල් යනු ජවිපෙ නායකත්වයේ දෘෂ්ටිමය මඟපෙන්වීමකට යටත්ව ප්‍රායෝගිකත්වය ක්‍රියාවට නැඟූ මිනිසෙකි. එය දරිද්‍රතාව සහ සමාජ වැඩිමලාය.

ලයනල්ගේ මල්ලී වන සුනිල් අයියාට වඩා වසරකින් බාලය. ලයනල්ට වයස අවුරුදු 2ක් වන විට පියා විසින් මව සහ දරු දෙදෙනා අතහැර වෙනත් විවාහයක් කර ගත්තේය. ඔහුගේ එම විවාහයෙන්ද ලයනල්ගේ පියාට දාව දියණියන් දෙදෙනෙකු සහ පුතකු සිටී. ලයනල්ගේ පියාගේ නංගී වන නන්දාවතී විසින් ලයනල් සිය නිවසට ගෙන ගිය අතර ඔහුට වෙනස් කරන බවට චෝදනා කළ මව පසුව ලයනල්ව යළි

ලයනල් රණසිංහගේ මව වන වැලිකලගේ සිසිලින් සහ එකම සොහොයුරා සුනිල් රණසිංහ

මහ ගෙදරට ගෙනාවේය. නැන්දාගේ නිවසේ සිටින විට දෛනික කුලියට කළුගල් කැඩීමටද ලයනල් යොමුකර තිබූ අතර පාසැල්ද යවා තිබුණේ නැත.

ලයනල්ගේ මව පසුව හොරණගේ ලියනෝරිස් ප්‍රනාන්දු සමඟ විවාහවී හොරණ මූණගමට සංක්‍රමණය වූවාය. ඇයගේ නව සැමියා සහ ලයනල්ගේ සුළු පියා හොරණ නගර සභාවේ සේවය කළ අතර උග්‍ර එක්සත් ජාතික පාක්ෂිකයෙකි. අගමැති ප්‍රේමදාස විසින් ජනතා අයිතියට පවරා දී ඇති නිවසක්ද ඔහුට 1979දී හිමිවිය. ලයනල් සහ මල්ලී සුනිල් රත්නපුර කුරුවිට පිහිටි මිත්තණියගේ නිවසේ තවදුරටත් වාසය කළෝය. ලයනල් සහ සුනිල් පාසැල් ගියේ කුරුවිට මහා විද්‍යාලයටය. විෂයන් 7 ක් සම්මාන සමාර්ථ හතරක් සමඟ අපොස සාමාන්‍ය පෙළ සමත්වූ ලයනල් ඉගෙනීමට දක්ෂයෙකි. සිය සොහොයුරාට තග් බලය දැමූ තවත් සිසුවෙකුට ලයනල් පහර දුන්නේ පස්වැනි ශ්‍රේණියේ සිටියදී අත්වැඩ කරන කතුරකිනි. ලයනල් සතුන්ට ආදරේය. ඔහු කෑම කන විට කුරුවිට ගෙදර අවට සිටින ලේනුන් දෙතුන් දෙනෙකුම ඔහු ළඟට පැමිණීම සුලබ දසුනකි. ලයනල් කරාතේ ඉගෙන ගත්තේ නන්ද සිරිවර්ධනගෙනි. කුංෆු ඉගෙන ගත්තේ සීවලී ගුරුතුමා ගෙනි. මෙම පන්ති හොරණ සහ බොරැල්ලේ පැවැත්විණි.

මේ වනවිට ලයනල්ගේ මව දෙවැනි විවාහයෙන් දියණියන් තිදෙනෙකු බිහිකළ අතර ඔවුන් නම් චූලා දමයන්ති, අනෝමා දමයන්ති සහ ශිරානිය. ඒ අනුව ලයනල්ගේ පවුලේ සොයුර සොයුරියන් සංඛ්‍යාව ලයනල් සමඟ පහකි. අපොස සාමාන්‍ය පෙළ හොඳින් සමත්වීමෙන් පසු ලයනල් සහ සුනිල් සැලක් අසල කඩල විකිණීමට ගියේ ජීවනබරට තල්ලුවක් දෙමිනි. ඉදහිට කුලීවැඩටද ගියේය. කේටරින් වැඩවල නිරතවූ මවද පොළේදී එළවළු අලෙවි කිරීමට සහ කඩල විකිණීමටද ඉඩ ඇති අවස්ථාවන්හිදී එක්වූවාය.

හොරණ විද්‍යාර්ථ විද්‍යාලයේ උසස් පෙළ ඉගෙනුම ලබමින් සිටියදී 1978දී ජවිපෙ දේශපාලන පන්තිවලට සහභාගිවූ අතර ඒ වන විට ඔහුට අවුරුදු 16කි. ජවිපෙ වෙනුවෙන් ඔහුට කොක්ක ගැසුවේ හොරණ විද්‍යාර්ථ විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සිසුවකු වූ යාගල පදිංචි ජයසිරිය. හොරණ ශිලරත්න පාරේ පිහිටි ජවිපෙ කාර්යාලයේදී ලයනල්ට ජවිපෙ දේශපාලන පන්ති පවත්වන ලද්දේ යටියන්තොට චන්ද්‍රසිරිය. කොළඹ සරසවියේ මහා ශිෂ්‍ය සංගමයේ 1979/80 සභාපතිවරයාවූ යටියන්තොට චන්ද්‍රසිරි එහි විද්‍යාපීඨ සිසුවකු වූ අතර 1982දී උපාධිධාරියකු වශයෙන් පිට විය. ජවිපෙ ජනාධිපතිවරණයට තරඟ කර 1982 පරාජයට පත්වීමෙන් පසු ජවිපෙන් ඉවත්වූ චන්ද්‍රසිරි වර්තමානයේ ව්‍යාපාරිකයෙකි.

ලයනල් රණසිංහ ජවිපෙට එක්කිරීමට හවුල් වූ අය අතර තවත් ප්‍රමුඛයන් දෙදෙනකු වන්නේ කොළඹ වෛද්‍ය පීඨයේ සිසු හොරණ මූණගම පදිංචි නිහාල් අබේසිංහ සහ පොකුණුවිට පදිංචි තිලක්ය.

ජවිපෙට පූර්ණකාලීනයකු ලෙස ලයනල් සම්බන්ධ වන්නේ 1981දීය. අප්‍රේල් 5 විරු සමරුවක් 1981 අප්‍රේල් 2වැනිදා කළුතර නගර ශාලාවේදී ජවිපෙ ලේකම් ලයනල් බෝපගේ ගේ ප්‍රධානත්වයෙන් පැවති අතර රෝහණ විජේවීර පිළිගැනීමට එහිදී රතු භටයෙක් ලෙස රාජකාරි කළේ ද ලයනල් රණසිංහය. ලයනල්ගේ මව පුතාගේ දේශපාලන කටයුතු පිළිබඳව බියපත්ව සිය සොහොයුරාට අයත් කැකිරාවේ හේනකට ලයනල් යැවූවද ඔහු ගොවියකු වශයෙන් ජීවිකාව ගෙන ගියේ වසරකට අසන්න කාලයක් පමණි. පෞද්ගලික ආරක්ෂක සමාගමක ආරක්ෂක නිලධාරියකු ලෙස පසුව සේවය කළේය.

යළිත් හොරණට පැමිණ 1984දී බ්‍රහස්පතින්දා සහ සිකුරාදා පොළේ එළවළු සෙසු දිනයන්හිදී රටකජුදු විකුණූ ලයනල් ජවිපෙ පූර්ණකාලීන දේශපාලනයට 1986දී එක්වන්නේ බටගොඩ ගමගේ ජයවර්ධන මගිනි. යුද හමුදා ස්වෙච්ඡා බළකායට බැඳීම සඳහා ලයනල් වරෙක සම්මුඛ පරීක්ෂණයට ගිය අතර ඒ සඳහා තෝරාගැනීමෙන් පසු රපෝර්තු කරන ලෙසට ලිපියක්ද 1987 මැයි 6 වැනිදා ලැබිණි. එහෙත් එම දිනයේ ඔහු ජවිපෙට අරමුදල් රැස්කිරීම සඳහා කළ මංකොල්ලකෑමක් සම්බන්ධයෙන් පොලිස් අත්අඩංගුවේ පසුවිය.

ලයනල් රණසිංහ ඇතුළු 5 දෙනෙකු ජවිපෙට අරමුදල් සපයා ගැනීම සඳහා කළ මංකොල්ලයකදී 1987 අප්‍රේල් 12 හොරණ පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන තිබිණි. හඳුනා ගැනීමේ පෙරට්ටුවක් සඳහා බන්ධනාගාරයේ සිට ඔවුන් ගෙනයන විට බොල්ගොඩ පාලම අසළදී ජේලර්ලාට පහරදී පලා ගියේ පිටතින් ලැබුණ ජවිපෙ සහායද සමගිනි. පොලිසිය ලයනල් අත්අඩංගුවට ගැනීමට නිවෙසට පැමිණි අතර ඒ වන විටද ඔහු නිවසින් පැන ගොස් තිබිණි. ඉන් පසු ලයනල් නිවසට මව බැලීමට ආවේ ඉඳහිටය. ලයනල් හමුවීමට නිවසට එන ජවිපෙ කළුතර දිස්ත්‍රික් සාමාජිකයෝද ඉන් පසු නිවසට පැමිණියේ නැත.

අවි පුහුණුව සඳහා ජවිපෙ අවි පුහුණු කඳවුරු කිහිපයකින්ම ලයනල් පුරුදු පුහුණු වී සිටියේය. ප්‍රථමයෙන් 1986 දෙසැම්බර් 13වැනිදා නෙළුව සිංහරාජයේදී දින 5ක පුහුණුවක් ද, 1987 මාර්තු කුරුවිට ශ්‍රීපාද අඩවියේදී සතියක අවි පුහුණුවක්ද 1988 මාර්තු 17වැනිදා රත්නපුර එරත්න ශ්‍රීපාද අඩවියේදී නැවත සතියක අවි පුහුණුවක්ද ලබා ගන්නා ලදී. මෙහිදී කටුනායක ගුවන් හමුදා කඳවුරේ ආකෘතියක් තනා එයට පහරදී යටත් කරගෙන අවි පැහැර ගැනීමේදී පෙරහුරුවක්ද පවත්වන ලදී. මෙහිදී හමුදාවෙන් පලා ආ ජවිපෙ සාමාජිකයන් විසින් යුද පුහුණුව ලබාදුන් අතර ඔත්තු බලන ආකාරය, වෙඩි තැබීම ඇතුළු බොහෝ දෑ උගන්වනු ලැබීය.

ජවිපෙ විසින් හමුදා සහ පොලිස් ගණනාවකට පහරදී අවි ලබාගැනීමේ ප්‍රහාර ගණනාවකටම ලයනල් ඉදිරි පෙළ ක්‍රියාකාරිකයකු වශයෙන් සහභාගී විය. මෙම ප්‍රහාරයන්හිදී ලයනල් ඇතුළු ජවිපෙ කැරළිකරුවන් විසින් එම කඳවුරුවල නවීනතම අවි පැහැරගැනීමට සමත් විය. පක්ෂයට අරමුදල් රැස්කිරීම සඳහා කොල්ල කෑමට ගිය කැරලිකරුවන් කිහිප දෙනා අතර ලයනල්ද ඉදිරියෙන්ම සිටියේය. ජවිපෙ දේශපාලන පීඩනය නිසා රැඩිකල් දේශපාලනයට එක්වූ තරුණයකුගේද කතාවකි.

හොරණ රත්නපුර පාරේ මූණගම ජාතික නිවාස සංකීර්ණයේ පදිංචිව සිටි ඔහු ගාමිණී නොහොත් මහින්ද නොහොත් ජයතිලක ලෙසද හැඳින්විණි. ලයනල්ගේ මව වන වැලිකලගේ සිසිලින් නෝනාට දරුවන් පහකි. ලයනල් සහ ඔහුගේ කනිටු සොහොයුරාවූ සුනිල් මවගේ ප්‍රථම විවාහයේ දරුවන්ය; ලයනල් පවුලේ හොරණ නිවසට කැඳවාගෙන ආවේ වැඩිදුර උසස් අධ්‍යාපනය ලබාදෙන්නටය. ඒ අනුව හොරණ විද්‍යාරතන විද්‍යාලයට ඇතුළුවූ ලයනල් වාණිජ විෂය ධාරාව හැදෑරීය. මුළු පවුලටම ආර්ථික දුෂ්කරතා රැසක් කෙටි කලකින් උද්ගත වූයේ ලයනල්ගේ මව දරුවන් 5 දෙනෙකු සමඟ යළිත් තනිවීමෙනි. ලයනල් සහ සුනිල් මල්ලී හොරණ නගරයේ මත්පැන් අලෙවි නය කර තිබිණි. ඉන් කිහිප දෙනෙකු මෙසේය. එජාප මහලේකම් නන්දලාල් ප්‍රනාන්දු 1988 මැයි 20 දහවල් 11.30ට ඝාතනය කළේ ටී.56 තුවක්කුවකින් අමුතුම ආකාරයකිනි. ලෑලි පෙට්ටියක තුවක්කුව සඟවා එය උඩින් ලී කුඩු දමාගෙන පාපැදියක බැදගෙන පැමිණියේය. වැල්ලවත්ත අනුලා මාවත අසල කඩයක් ඉදිරිපිට පාපැදියේ රෝදයක නුලං බැස ඇතැයි එහි නතර කළ ලයනල් සංඥාව ලැබෙන විට පෙට්ටියෙන් ස්වයංක්‍රීය ගිනි අවිය රැගෙන නන්දලාල් ප්‍රනාන්දු නිවසින් පිටත්ව අනුලා මාවතින් වැල්ලවත්ත මාර්ගයට වාහනය දමනවාත් සමගම වෙඩිතබා එහි සිටි තවත් කැරලිකරුවකු පදවාගෙන පැමිණි යතුරුපැදියෙන් තුවක්කුවද රැගෙන පලා ගියේය. කොළඹ සරසවියේ උපකුලපති මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර 1989 මාර්තු 8වැනිදා ද, ඇමති වීරසිංහ මල්ලිමාරච්චිගේ පුත් කොළඹ නාගරික මන්ත්‍රී ජයන්ත මල්ලමාරච්චි 1989 පෙබරවාරි 15 මැතිවරණයදා මට්ටක්කුලියේදී ද, එජාප නාගරික මන්ත්‍රීවරුන් වූ ලෙස්ලි රණගල බොරැල්ලේදීද, කිරිවත්තුඩුවේ ග්‍රාමෝදය මණ්ඩලයේ සභාපති, ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ පොලිස් නිලධාරීන් කිහිපදෙනකු, එජාප ජාතික සේවක සංගමයේ වරාය ඇතුළු ස්ථාන කිහිපයක ඉහළ පෙළේ නිලධාරීන් තිදෙනකු, ඉන්දියාවේ මුල්පෙළේ ව්‍යාපාරිකයන් 2ක් ඇතුළු පිරිසක් එයට අයත් වූහ.

ලයනල්ලාගේ පවුලේ සැමට ජවිපෙ දෙවැනි කැරලි සමය වූ 1986 සිට 1989 දක්වා විවිධ තාඩන පීඩනවලට ලක්විය. අයියා ලයනල් ඉල්ලා මල්ලීවන සුනිල් ආරක්ෂක හමුදා මගින් අත්අඩංගුවට ගෙන වසර 2කට ආසන්න කාලයක් මිරිහාන පොලිසියේ කඳවුර, පැලවත්තේ රැඳවුම් කඳවුර, මැගසින් බන්ධනාගාරය ඇතුළු ස්ථාන කිහිපයක රඳවා තබාගන්නා ලදී. ලයනල් රණසිංහ අවසාන වරට පවුලේ අයකු හමුවූයේ මරදානේ සුමනදාස පෙරේරාගේ නිවසේදීය.

ලයනල් රණසිංහ 1989 මාර්තු 14 පෙරවරු 9.20ට කොළඹ බෞද්ධාලෝක මාවතේදී බිල්ලකු බවට පත්වූ කැරලිකරුවකුගේ මඟ පෙන්වීම අනුව පොලිස් අපරාධ විමර්ශන අංශයේ පො.කො. ඩයස් (15381) හා පො. කො. බර්නාඩ් (2342) මගින් අත්අඩංගුවට ගන්නා ලදී. ලයනල් මවට සිය පුතා වූ ලයනල් අවසාන වරට රහස් පොලිස් අත්අඩංගුවේදී දැකගන්නට ලැබුවේ 1989 සැප්තැම්බර් 27වැනිදාය. පසුව හෝමාගම පොලිසියට ගෙන ආ ලයනල් රණසිංහ 1989 සැප්තැම්බර් 28 පස්වරු 10ට පෙබරවාරි 16වැනිදා පත් කළේය. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු පද්මනාදන් රාමනාදන්ගේ සභාපතිත්වයෙන් යුත් එම කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයන් වූයේ අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු සරත් නන්ද සිල්වා සහ කොළඹ මහාධිකරණයේ විනිසුරු ධර්මසිරි ජයවික්‍රමය. රාජ්‍ය පරිපාලන සේවයේ උපාලිද සිල්වා කොමිසමේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ අතර එහි සහකාර ලේකම්වරයා වූයේ එඩ්වඩ් ගීගනගේ ය.

කොමිසමේ සාක්ෂි විභාගය 1995 අප්‍රේල් 14වැනිදා ආරම්භ කරන ලද අතර එය 1995 දෙසැම්බර් 15වැනිදා දක්වා මාස 08ක් සාක්ෂි විභාග කරන ලදී. කොමිසම ඉදිරියේ පුද්ගලයන් 72ක් සාක්ෂි දුන් අතර එම සාක්ෂි පිටපත වෙළුම් 15කින් සහ පිටු 3,441කින් සමන්විත විය. ජනාධිපති කොමිසම් සභාව විසින් පවත්වන ලද පරීක්ෂණයේ සම්පූර්ණ වාර්තා 1996 පෙබරවාරි 29වැනිදා බාර දෙන ලදී.

අනතුරුව සහකාර පොලිස් අධිකාරි චන්ද්‍රා වාකිෂ්ඨ සහ අපරාධ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ එවකට සිටි අධ්‍යක්ෂ චන්ද්‍රසේන ජයවර්ධන හෙවත් චන්ද්‍රා ජයවර්ධන යන දෙදෙනාට එරෙහිවද නඩු කටයුත්තක් ක්‍රියාත්මක විය. කොළඹ කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ප්‍රනාන්දු 2002 ඔක්තෝබර් 23වැනිදා ඔවුන් දෙදෙනා නිදහස් කළේය.

ඝාතනයට ලක්වන විට ලයනල් අවිවාහකයෙකි. වසර 2ක කාලයක් අනේකවිධ වද බන්ධන වලට ලක්ව ජීවත්වීමට වාසනාව ලැබූ සොහොයුරා සුනිල් රණසිංහ වර්තමානයේ ත්‍රිරෝද වෘත්තියේ නිරත වන අතර කේටරින් සේවයේද යෙදේ. නැඟණියන් තිදෙනා විවාහකය. ලයනල්ගේ සුළු පියාද 1985දී මිය ගොස් තිබිණි. ජවිපෙ නියෝජනය කරමින් 90 දශකයේදී හොරණින් පළාත් පාලන ඡන්දයකදී අපේක්ෂිකාවක්ද වූ ලයනල්ගේ මව 2006 දී ජීවිතයෙන් සමු ගත්තාය.

ජවිපෙ 2 වැනි කැරැල්ලේදී දුබලතා සහ සීමා බොහෝ තිබුණ ද එම බරපතළ වැරදි පවා කැරලිකරුවන් අතින් සිදුවූයේ තමන් ඇදහූ පක්ෂය වෙනුවෙන් සිය කාර්යයෙහි නියුතු වූ නිසාය. අගතිගාමී නොවී ඒ දෙස බලන පිටස්තර අයට පවා එය ප්‍රතික්ෂේප කළ නොහැකි කරුණකි. එහෙත් ඒ කිසිවක් ඔවුන් ඇදහූ දේශපාලන ව්‍යාපාරය විසින් පිළිනොගැනීම ඊට සම්බන්ධ වූ අයගේ බේදවාචකය විය.

පාලම්මුල්ලලාගේ ලයනල් රණසිංහ 1985 දී සිය නිවෙසේදී (වමේ) හොරණ පොලීසිය මගින් 1987 අප්‍රේල් 12 අත්අඩංගුවට ගැනීමෙන් පසු (මැද) සහ විජය ඝාතනයට පැමිණි යතුරු පැදිය පැදවූ කළුතර පයාගල ටාසන් වීරසිංහ හෙවත් හේරත්

විජය කුමාරතුංගට වෙඩි තැබීමට යොදාගත් යතුරු පැදිය

ලයනල් රණසිංහ විසින් විජයට අමතරව ඝාතනය කරන ලද 41 දෙනා අතරින් කිහිප දෙනෙක් වමේ සිටය. කොළඹ සරසවියේ උප කුලපති මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ටෙරන්ස් පෙරේරා, කොළඹ නගර සභා එජාප මන්ත්‍රී ජයන්ත මල්ලිමාරච්චි, නාරාහේන්පිට කඩාකප්පල් ක්‍රියා මර්දන ඒකකයේ උප පොලිස් පරීක්ෂක ටී. සී. ජේ. රාජපක්ෂ සහ බස්නාහිර පළාත් සභා එජාප මන්ත්‍රී සුනිල් ගුණතිලක ය.

සිළුමිණ

තරංග

බුලත්සිංහල වතුරාන වගුරුබිමේ කතාව

හොර වැල්

සුවඳ ශාකය (දැන්විමි පුවරුව පිටුපස) සහ වතුරානේ විනාශ කළ සුවඳ ශාකවල මුල් (රවුම තුළ)

හොර වැල් - සුවඳ ශාක ඇති ලොව එකම වනය සුරකිමු

● නන්දන ශ්‍රී කෝට්ටේගොඩ

ලොව කිසිදු රටකට නොමැති ජෛව විවිධත්වයෙන් පෝෂිත බුලත්සිංහල වලව්වත්ත වතුරාන වගුරු වනාන්තරය සංරක්ෂණය කර පුළුල් කළ යුතු බව පරිසරවේදීන් හා උද්භිද විද්‍යාඥයන් අවධාරණය කරති.

තෙත් භූමි පරිසර කලාප ආරක්ෂා කිරීම සඳහා වන අන්තර් ජාතික රැම්සා සම්මුතිය ආරම්භ කර මේ වර්ෂයට අඩ සියවසකි. 1971 පෙබරවාරි 02 දින ඉරාකයේ 'රැම්සා නගරයේදී මෙම සම්මුතිය බිහි විය. 1978 දී අපේ ශ්‍රී ලංකාව ද මෙම ගිවිසුමට අත්සන් තබා තෙත් බිම් සංරක්ෂණය පිණිස පුරෝගාමී කඳවුරට එක් විණි. වතුරාන වගුරු වනාන්තර ද තෙත් බිමකට සමාන පරිසර කලාපයකි. නිරතුරුව වතුරට යටවී වතුරානේ අණට කීකරුව හැඩ ගැසුණු හා නිර්මාණය වන භූමි කලාපයයන් නිසා වතුරාන නම ජනිත වී ඇති බව භාෂා විශ්ලේෂකයන් වෙන්ව අපේ ඉපැරැණි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ මතයයි.

අපි තෙත් බිම් පිළිබඳව රැම්සා සම්මුතිය සිහිපත් කළේ ද වතුරාන අමතක කර තෙත් බිම් සංරක්ෂණය සිහිනයක් පමණක් නිසාය.

වර්ෂයේ 10 -12 වරකට වැඩිය ගංගා ගැලීමෙන් අඩි 20 – 30 තරමේ උසින් යුතුව වතුරාන ගං වතුරින් වැසී පවතී. ගංවතුරට හැඩ ගැසුණු ශාක ප්‍රජා වගා වතුරට ඉහළින් ආනක් වියනක් සේ වර්ධනය වී පැවැතීම මෙහි ඇති විශේෂත්වය වේ. බුලත්සිංහල වතුරාන පිළිබඳව පරිසරවේදී චිරාත් භාරත විග්‍රහ කරන්නේ මේ අයුරිනි.

ප්‍රාග් ඓතිහාසික යුගයේ අපේ ආදිතම මානවයන් ජීවත්ව සිටි පාහියංගල සමීපයේ කුකුළේ ගඟ නිම්නයේ මෙම වලව්වත්තට යාබද නිවසේ ඉපදී ලෝකයේ ජෛව සම්පත් සංරක්ෂණයට කැපව සිටින කීර්තිමත් උද්භිද විද්‍යාඥ මහාචාර්ය නිමල් ගුණතිලකයන් නිසා තමයි මෙම භූමි කලාපය විශ්ව කීර්තියට පත් පරිසර පද්ධතියක් ලෙසට හඳුනා ගැනීමට පත්වුණේ.

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ අධ්‍යක්ෂකව සිටි (1820 දී - 1825 කාලයේදී) ඇලෙක්සැන්ඩර් මුන් ප්‍රථමයෙන් ම හොරවැල් ශාකය හඳුනා ගෙන ඇත. ඒ මගුරු ගංගාව ආශ්‍රිත වගුරු වනාන්තර තුළින් ය. 1826 න් පසුව මෙම ශාකය ගැන කිසිදු තොරතුරක් වාර්තා වී නැත. හෙන්රි ට්‍රයිමන් ද FOLORA Of Celon අත්පොතේ මෙම ශාකය ගැන සඳහන් කර තිබුණි.

අනතුරුව අවුරුදු 160 පමණ පසුව මිහිමතින් මෙම හොරවැල් ශාකය සොයා ගැනීමේ අසිරිමත් සාක්ෂිය ඉදිරිපත් කරන මහාචාර්ය නිමල් ගුණතිලකයන්ගේ හඬට අපි සවන් දෙමු.

"අපේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආරාධිත මහාචාර්යවරයකු ලෙසට ඒ. එච්. ජී. එච්. කොස්ටමාන්ඩ් මහාචාර්යතුමා මට කීවා. නිමල් හොරවැල් කියලා ශාකයක් කළුතර ඔයාලගේ පළාතෙන් සොයාගෙන තිබුණා. දැන් ඒ ශාකය ලෝකයේ කොහේවත් නැහැ. අපි යළිත් ඒ ගැන අධ්‍යයනයක් කරලා බලමු දැයි යෝජනා කළා. වලව්වත්ත කියලා අපේ නිවසට ආසන්නයේ වගුරු බිමක් සහිත කලාපයක් තියෙනවා. පරීක්ෂා කරල බලමු.

මේ එකඟතාව අනුව 1979 දී මහාචාර්ය නිමල් ගුණතිලකයන් සිය නිවසට ඔලන්ද ජාතික උද්භිද විද්‍යාඥ කොස්ටමාන්ඩ් සමඟ පැමිණියේය. වලව්වත්තේ අයිතිකරුවන් වන වෛද්‍ය මහින්ද විජේසේකර පවුලේ සහයෝගය හා අවසරය ලබාගෙන වතුරාන වගුරු වනය ඇතුළට ගොස් අධ්‍යයනය හා පර්යේෂණ කටයුතුවල නියුතු වී දින ගණනකට පසුව මෙම හොරවැල් ශාකය යළි හඳුනා ගත්තේ ය.

අවුරුදු මිලියන ගණනාවක් තිස්සේ කුකුළේ ගඟ, යටගම්පිටිය ගඟ, මගුරු ගඟ හා පැළැන්ද යන ගංගා වත් පිටාර ගැලීමෙන් රොන්මඩ විශාල වශයෙන් තැන්පත්ව ශාක හා සත්ව කොටස් ද එයට මිශ්‍රවී මෙම අතිශය සංවේදී පරිසර පද්ධතිය නිර්මාණය වී ඇති බව පරිසරවේදීන් පෙන්වා දෙන අතර එක්සත් ජාතීන්ගේ පරිසර සම්මානලාභී කිරන්තිඩියේ ප්‍රඥාසේකර දැන් පරිසරවේදී අශෝක හරිස්චන්ද්‍රයන් පවසන්නේ "අපි ලංකාවේ ප්‍රථම පරිසරගම සංරක්ෂණය කරන අවධියේ මහාචාර්ය නිමල් ගුණතිලක සමඟ මේ වතුරානේ අධ්‍යයන කටයුතුවලට ඇවිද්දා. අපි එදා ඉදලාම වතුරාන සතු අගය හඳුනාගෙන සිටියා යැයි පවසමින්, වතුරාන මතු පරපුරේ යහපත සඳහා අදට වඩා සංරක්ෂණය කළ යුතුව ඇති බව ද පෙන්වා දෙයි.

මධ්‍යම පරිසර අධිකාරියේ අධීක්ෂණය සඳහා මෙම වතුරාන පිළිබඳව ඉල්ලීම් රාශියක් කරමින් සුවිශේෂ කාර්ය භාරයන් ඉටු කළ දේශීය උරුම ගවේෂණ පදනමේ සභාපති ඉන්දික විතාන හෙළි කර සිටින්නේ වතුරේ අණට, වතුරාන ක්‍රියාත්මක වුවත් වතුරාන ලෝක ප්‍රජාවගේ මතු උරුමයක් බවට සංරක්ෂණය කිරීමේ කාර්යයේදී රාජ්‍ය අණ ක්‍රියාත්මක වන ආකාරය නම් උදාසීන වී පවතින බවයි.

ස්ථිර මුරකරුවෙකු පත්කළ යුතුයි. තොරතුරු නිලධාරියකු සිටිය යුතුය. තොරතුරු නිලධාරියකු නැත. සීමා මායිම් ගැසට්ටුවට සීමාවී ඇත. පාසල් ප්‍රජාව දැනුම්වත් කිරීම සිදු කළ යුතුය.

මිහි මතින් තුරන් වී ගියා යැයි විශ්වාස කළ හොරවැල් එදා ශාකය මෙසේ යළි සොයා ගැනීමෙන් පසුව කොස්ටමන්ඩ් හා නිමල් ගුණතිලකයන් තම වගකීම එතැනින් නතර කළේ නැත.

"අපි මෙය හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනයන්ට හෙළි කරමු. කතිකාවකින් පසුව මහාචාර්ය කොස්ටමන්ඩ් වතුරාන වැදගත්කම පිළිබඳව හෙළි කළේය. ජනාධිපති ජයවර්ධන ක්ෂණිකව ක්‍රියාත්මක විය. කළුතර මහ දිසාපතිවරයාට වතුරාන සංරක්ෂණය කරන්නැයි ජනපති නියම කළේය. වතුරාන වගුරු වනාන්තරයේ අගයත් එය සංරක්ෂණය කිරීම පිළිබඳවත් අවධානය යොමු වුණේ ද ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම ඇස් ඇරුණේ අනතුරුවය.

පහත රට තෙත් කලාපීය වනාන්තර ගණයට අයත් වලව්වත්ත වගුරු වනාන්තරය හෙක්ටයාර් 6.2045 කින් යුතුය. තෙත් කලාපයට අයත් ශාක බහුලව දක්නට ඇත.

මහාචාර්ය නිමල් ගුණතිලක, කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය දේවක වීරකෝන් ආචාර්ය හරේන්ද්‍ර කත්‍රි ආරච්චි, පශ්චාත් උපාධි අධ්‍යයන අපේක්ෂිකා වීනාවී ලක්ෂ්මන් යන පර්යේෂකයන් හා පර්යේෂිකාවන් 1980 සිට 2020 දක්වා මෙම වගුරු වනාන්තරයට පැමිණ එහි ජෛව අගය මුළු ලොවටම හෙළි කරමින් සිදු කරගෙන යනු ලබන සේවය අතිවිශිෂ්ටය.

මේ අතර මෙම වගුරු වනයේ සංරක්ෂණ කටයුතු සඳහා ග්ලෝබල් 500 එක්සත් ජාතීන්ගේ පරිසර සම්මානලාභී කීරන් කිසියේ ප්‍රඥාසේකර (උපැවිදි) නම අශෝක හරිස්චන්ද්‍ර ගෙයින් ගෙට ඇවිදිමින් පරිසර ධර්මදේශනා පවත්වමින් ද පැළ සිටුවමින් ද කළ සේවයත් දේශීය උරුම ගවේෂණ පදනමේ සභාපති ඉන්දික විතාන ඇතුළු සංරක්ෂකයන් දේශබන්දු ගම්ලත්, චිරාත් භාරත ඇතුළුවූ පරිසරවේදීන්ගේ දායකත්වයක් අමතක නොවන බව පරිසර සංවිධාන පෙන්වා දෙති.

මහාචාර්ය නිමල් ගුණතිලක, ප්‍රාදේශීය ලේකම් ප්‍රසාද් පෙරේරා, වතු අධිකාරි චාමර මුණසිංහ සහ චිරාත් භාරත වමේ සිටය.

වතුරාන වගුරු වනාන්තරයේ ජෛව විවිධත්වය හා එහි සංරක්ෂණය පිළිබඳව 2007 සිට විශාල දායකත්වයක් සපයනු ලබන පරිසර නීතිඥ ආචාර්ය ජගත් ගුණවර්ධන ද අපගේ සංවාදයට එක්විය.

හොරවැල් හා සුවඳ ශාකය පවතින ලොව එකම වගුරු භූමිය වලව්වත්ත වගුරු වනාන්තරයයි. වලව්වත්ත වගුරු වනාන්තරය අයිති වලව්වත්ත වැවිලි සමාගම වෙතයි. මේ වනවිට මධ්‍යම පරිසර අධිකාරිය මගින් මෙම සුවිශේෂී පරිසර ප්‍රදේශය 2009 අප්‍රේල් 24 දින 1598/21 දරන විශේෂ ගැසට් පත්‍රය මගින් පෞද්ගලික අයිතිය තිබියදී වතු සමාගමට අයත් සංරක්ෂණය කළ යුතුවූ භූමියක් ලෙස නම් කර තිබෙනවා යැයි කීය.

මෙම වගුරු වනාන්තරයේ පවතින තවත් සුවිශේෂ සත්ව හා ශාක පද්ධතින් පිළිබඳව සොයා බලන විට දී මෙහි විශේෂ ශාක 141 පවතින අතර එයින් 51% ඒකදේශීය ශාකයන් ය. ශාක තුළ 51 කට අයිතියැයි අනාවරණය විය.

නා කුලයට අයිති සුවඳ ශාකය වතුරාන වනයටම පමණක් ආවේණික තවත් වටිනා ශාකයකි. අපේ ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය නා ගසයි. ජාතික වෘක්ෂය බටු නා ගසවන අතර දිය නා නම් තවත් නා ගස් වර්ගයක් ද වේ.

මහාචාර්ය ගුණතිලකයන් විසින් 1985 දී සුවඳ නා නමින් හැඳින්වෙන නා වර්ගය වතුරාන 'වගුරු බිමෙන් සොයා ගනු ලැබීය. සුවඳ ගස අඩි 100 පමණ උසට වර්ධනය වන මල් පිපෙන ගසකි. මෙම සුවඳ ගස මෙම භූමියේ හැර ලොව කිසිදු රටක නැත.

සංරක්ෂණය කළ යුතු මෙම වගුරු බිමේ විජේසේකර පවුලෙන් පසුව දැනට මෙම වලව්වත්ත (වතුරාන වගුරු බිම ද සහිත) පෞද්ගලික සමාගම යටතේ පාලනය භාරව සිටින්නේ චාමර මුණසිංහය.

මෙය අපගේ ඉඩමක් වුවත් වතුරාන වගුරු වනාන්තර කලාපය මධ්‍යම පරිසර අධිකාරියේ අධීක්ෂණයට යටත්වයි පවතින්නේ. වතු සේවකයකු විසින් තාවකාලිකව වතුරාන මාර්ගෝපදේශක කාර්ය ඉටු කළත් ඔහුට තමා විසින් වැටුප් ගෙවීම් සිදු කරන බව ද හෙළි කළේය. සිය සේවකයකු මාර්ගෝපදේශක කාර්යභාරයට ඉදිරිපත් කළ ද එහි සීමාවක් පවතින බව ද ඔහු පවසයි.

අපිට මෙය ආභරණයක් තමයි ලෝකයේ එකම සුවිශේෂී භූමියක් වීම නිසා මම සතුටින් සිටින්නේ. තවදුරටත් සංරක්ෂණය වනවා දැකීම මාගේත් සිහිනයක්, ඔහු දැඩි අපේක්ෂාවෙන් හෙළි කළේය.

මධ්‍යම පරිසර අධිකාරියේ වගකිව යුතු නිලධාරීන් කිහිප දෙනෙකුම සම්බන්ධ කරගෙන වතුරානේ යථාර්ථය විමසීමට ගත් සියලු උත්සාහයන් අසාර්ථක වූ අතර එහි කළුතර දිස්ත්‍රික් තොරතුරු නිලධාරිනිය වන ප්‍රියංගනී ගුණතිලක කීවේ පාසල් දරුවන් ගුරුවරුන් වතුරානට රැගෙන ගොස් දැනුවත් කිරීමේ ක්‍රියාවලිය කොරෝනා වසංගතය නිසා නතර වූ බව මේ අතර සුරකිමු ශ්‍රී ලංකා සංවිධානයේ සභාපති පාහියංගල ආනන්ද සාගර හිමි රජයේ පරිසර අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටියේ වතුරානට රාජ්‍ය අණ වහාම ක්‍රියාත්මක විය යුතු බවයි. එසේ නොවන හොත් මේ වතුරානත් පොත පතටම සීමා වී වැළලී යනවා නිසැක බවකි.

වතුරාන වගුරු වනාන්තරය ප්‍රාග් ඓතිහාසික පාහියංගල ඇතුළුව මුළු ලොවම මවිත කළ පාරිසරික හා ජෛව සම්පත්වලින් ආඪ්‍යවූ බුලත්සිංහල ගොඩනැගීමේ ක්‍රියාවලියේ රාජ්‍ය දායකත්වයට බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළින් ලැබෙන ප්‍රබල නායකත්වය මෙහෙයවන්නේ ප්‍රාදේශීය ලේකම් ප්‍රසාද් පෙරේරාය.

අපි 'සිළුමිණ' යොමු කළ ප්‍රශ්න හා ගැටලු සියල්ල පිළිගත් ප්‍රාදේශීය ලේකම්වරයා පැවැසුවේ 'අනාගතයේදී ඉතා සුබදායි අයුරින් වතුරාන සංරක්ෂණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගය ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බවයි.

ලංකාවට ගෑස් භාවිතය හඳුන්වාදී වසර 150 යි

● නිෂානි ලසිතා හේරත්

වසර 150 ඉහත දී ගෑස් පහ හන්දියෙන් ආරම්භ වූ ශ්‍රී ලංකාවේ ගෑස් ක්ෂේත්‍රය ලිට්රෝ ගෑස් ලෙස විශාල වර්ධනයක් කරා පැමිණ ඇත.

පසුගිය කොවිඩ් සමයේ ලෝක ප්‍රජාව මුහුණ දුන් දරුණු අභියෝග හමුවේ ශ්‍රී ලාංකික ජනතාවට ලබාදුන් සේවය උදෙසා ලිට්රෝ ගෑස් සමාගම පසුගියදා ජාතික හා ජාත්‍යන්තර සම්මාන දෙකකින් ද පිදුම් ලැබුවේය.

ජාත්‍යන්තර එල්.පී.ගෑස් ආයතනය (W.L.P.G) හා ARGUS ජාත්‍යන්තර ආයතනය විසින් කොවිඩ් සමයේ ජාත්‍යන්තර ප්‍රජාව මුහුණදුන් ගෝලීය අභියෝග හමුවේ තම සේවය හා වගකීම ජනතාවට නොපිරිහෙලා ඉටුකිරීම වෙනුවෙන් මෙම සම්මාන දිනීය.

ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය මගින් කොවිඩ් සමයේ පාරිභෝගික ජනතාවට නොකඩවා ලබාදුන් සේවාව හා මෙහෙවර උදෙසා මෙන් ම ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවන තත්ත්වය යථාවත් කරදීමට උරදීම සඳහා SLMI Restrat Kecialance සම්මානය ද දිනා ගැනීමට ලිට්රෝ ගෑස් ආයතනය සමත් විය. එකල කොළඹ නගරය ආලෝකවත් කිරීමට විදුලි ආලෝකය නොතිබුණේ ය. අටසිය ගණන්වල ඉංග්‍රීසි ආණ්ඩු කාලයේ දී කොළඹ නගරයට ආලෝකය ලබා දීම සඳහා ගෑස් පහ මංසන්ධිය අසල විශාල ගෑස් කර්මාන්ත ශාලාවක් තිබී ඇත. මංමාවත් පහ සඳහා ගෑස් ලාම්පු භාවිත කිරීම මගින් මේ මංසන්ධිය ජනතාව අතර ගෑස් පහ යන නාමය යොදාගෙන ඇත.

එකල ගෑස් පහ ලෙස නම් කර ඇති මංසන්ධි 5 වන්නේ සෙක්කු වීදිය, (වර්තමානයේ ශ්‍රී කදිරේෂන් වීදිය) ශ්‍රී බෝධිරාජ මාවත, වේල්ල වීදිය, ආදුරුප්පු වීදිය, වර්තමානයේ ශ්‍රීමත් රතනජෝති සරවනමුත්තු මාවත සහ කෙළින් වීදියයි.

ගෑස්පහ හන්දියේ පැරණි දසුනක්

ගෑස්පහ හන්දියේ වර්තමාන දසුනක් (ඡායාරූපය - නිරෝෂණ බටේපොල)

ලිට්රෝ ගෑස් වර්තමානයේ බෙදා හරින අයුරු

ගෑස්පහෙන් ඇරඹුණු ගෑස් විප්ලවේ

මේ මංසන්ධි පහ අද වනවිට විවිධ මාවත් ඔස්සේ ද බෙදී ඇත. ඉංග්‍රීසි ආණ්ඩු කාල වකවානුවේ කොළඹ ප්‍රදේශයට ආලෝකය බෙදා දුන් ගෑස් කුලුන අදටත් ගෑස්පහ මංසන්ධියේ දක්නට ලැබේ. එහි තිබූ ගෑස් බල්බය වර්තමානය වනවිට කොළඹ පැරණි නගර ශාලාවේ කෞතුකාගාරයේ සංරක්ෂණය වෙමින් පවතී.

ගෑස් පහ හන්දියේ විදුලි ආලෝකය නැති මුත් ගෑස් ලාම්පුවල ආලෝකය විදුලි ආලෝකයෙන් ලැබෙන එළිය පරයන ආලෝකයකින් හාත්පස එකලු කළේ ය.

ගෑස්පහ හන්දියේ අතීත මතකයන් පිළිබඳ කොළඹ 12 මධ්‍යම පාර අංක 189 දරන තැන කරත්ත කුලියට ලබාදෙන දෙමළ හින්දු අයකු වන සෙල්වම් කුමාර (53)ගෙන් මා විමසූ අතර මේ ඔහුගේ හඬයි.

ලිට්රෝ ගෑස් සමාගමේ වර්තමාන සභාපති අනිල් කොස්වත්ත

"මේ ගෑස්පහ හන්දියේ වටරවුම ළඟ ඒ කාලේ ගෑස්වලින් පත්තුවෙන ගෑස් ලාම්පු 5 ක් තිබුණා. ඒක රෑ එළිවෙනකම් පත්තු වුණා. බෝධිරාජ මාවතේ ක්‍රිස්තියානි පල්ලිය ළඟ ගෑස් කොම්පැණියේ සිට පොළව යටින් තමයි ලාම්පු එළිය කරන්න ගෑස් ලබා දුන්නේ. විදුලි ආලෝකය ලැබුණාට පස්සේ ගෑස් ලයිට් ඉවත් කළා. පැරණි ගෑස්පහ හන්දියේ පරණ ගොඩනැගිල්ලක් තිබුණා. ඒක උඩ ගෙවල් තිබුණා. යකඩ කණු, ලෑලි සොල්දර දාලා ගල්වලින් බැඳලා තිබුණේ. මේ ළඟ මොහොමදියා හෝටලය, සිටි බේකරිය කියා කඩ දෙකක් තිබුණා. ඒ කාලේ හිර ගෙවල්, මාළු කඩේ, කඩ පේළි ගෙවල් සේරම තිබුණා. ට්‍රෑම් කාර් දිවුවා. වෙළෙඳාමට ආපු විදේශිකයෝ නාට්ටාමිලා, හැම ජාතීන් ම හරි හරිට තිබුණා. දැන් නම් ගෑස්පහ විතරක් නෙමෙයි මුළු කොළඹටම හාත්පසින් වෙනස්."

ගෑස්පහ හන්දියේ වසර 30 ක් තැඹිලි අලෙවි කරන ඇන්ටනී ප්‍රැන්සිස් (64) මෙසේ කීය. "ඒ කාලේ ගෑස්පහ හන්දියේ පැරණි රා කඩයක් තිබුණා. ගෑස්වලින් රෑ පුරා පත්තු වුණු ලාම්පු 5 ක් තිබුණා. රික්ෂෝ කරත්තේ කුලිය සත 10 යි. තැඹිලි ගෙඩියක් රුපියල් 5 ට විත්කේ මම. මම විවාහවෙලා නෑ. ඒ කාලේ රා බෝතලයක් රුපියල් 15 යි. මම නම් රා බීච්චේ නෑ. හෙට්ටියාවත්ත, කොටහේන, තොටළඟත් රා තිබුණා"

මේ අයුරින් මීට සියවස් එක හමාරක් වසර 150 ට පමණ පෙර හඳුන්වා දුන් ගෑස් භාවිතය අද වනවිට ලිට්රෝ ගෑස් ලංකා සමාගම ලෙස විශාල වර්ධනයක් කරා පැමිණ තිබේ.

ගෑස් ලාම්පු හා ගෑස් බලයෙන් ධාවනය වූ ට්‍රෑම් කාර් එකල සාමාන්‍ය දසුනක් වූ අතර ගෑස් ක්ෂේත්‍රයේ පුරෝගාමියා වූ සිලෝන් ගෑස් සහ ජල සමාගම එවකට කොළඹ නගරයේ සිට රත්මලාන දක්වා ඉතා දියුණු LPG බෙදාහැරීමේ ජාලයක් කළමනාකරණය කර ඇති බව ඉතිහාසය පෙන්වා දෙයි.

කාලානුරූපව සිලෝන් ගෑස් සහ ජල සමාගම බොහෝ අදියර කරා වර්ධනය වුවත් රාජකීය ෂෙල් සමාගම ප්‍රවිෂ්ට වීමත් සමඟ එය ජාත්‍යන්තර කළමනාකරණයට ලක්විය.

ෂෙල් ගෑස් සමාගම 2010 දී ලිට්රෝ ගෑස් ලංකා සමාගම ලෙස නව දිශානතියකට යොමුව ඇත. වසර 150 අධික ගෑස් ක්ෂේත්‍රයේ මූලාරම්භය පිළිබඳව ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී අනිල් කොස්වත්ත කීවේ ශ්‍රී ලංකාවේ ගෑස් ක්ෂේත්‍රය තුළ ලිට්රෝ ගෑස් සඳහා සුවිශේෂ උරුමයක් පවතින අතර ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන බලශක්ති අවශ්‍යතාවක් ලෙස LPG ස්ථාපිත කිරීම බලශක්ති ඉතිහාසයේ වැදගත් අංගයක් බවයි.

ගෝලීය ගෑස් මිල ඉහළ ගියත් මිල ගණන් තරගකාරී ලෙස පවත්වා ගනිමින් පාරිභෝගිකයන්ට ආර්ථික වාසි ලබා දෙමින් නොකඩවා ස්ථාවර වර්ධනයක් පවත්වා ගැනීමට හැකිවී ඇති බව ද කීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට හා ජනාධිපති කාර්ය සාධක බළකායේ මග පෙන්වීමට අනුව LP ගෑස් වැනි අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ස්ථාවරව පවත්වා ගැනීම ප්‍රධාන කරුණකි. දිවයින පුරා නියෝජිතයන් 42, අලෙවි නියෝජිතයන් 1500 ක් හා දීප ව්‍යාප්ත අලෙවි නියෝජිතයන් 14000 ක් සමන්විත ජාලයක් හරහා ක්‍රියාත්මක වේ. කෙරවලපිටිය, මාබිම සපුගස්කන්ද හා හම්බන්තොට LPG පර්යන්ත ඇත. අද වනවිට 76% වැඩි වෙළඳපළ කොටසකට හිමිකම් කියමින් ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස රටේ ආර්ථිකය උදෙසා රුපියල් බිලියන 45 පිරිවැටුමක් උපදවන අතර ශ්‍රී ලංකාව පුරා මිලියන 04 අධික ගෘහ අවශ්‍යතා සපුරයි.

නවෝත්පාදන සඳහා යොමු වෙමින් පාරිභෝගිකයන්ට පහසුවෙන් ගෑස් ලබාගැනීමට ලිට්රෝ ගෑස් Home Delivery Mobile APP යෙදුම හා බාධාවකින් තොරව පහසුවෙන් සම්බන්ධ වීමට සරල ඉලක්කම් 4 න් යුත් (1311) ක්ෂණික දුරකතන අංකයක් ද හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාවේ එල්.පී.ගෑස් ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා මාවත සකස් කිරීම වසර 150 ඓතිහාසික ජයග්‍රහණයක් බවත්, එහි ඉදිරි ගමනත් ඉතා සාර්ථකව සිදුවන බවත් කොස්වත්ත පැවැසීය.

ලංකාවේ අංක එකේ සල්ලිකාරයා

පිටුව 26

ණය ගන්න ඇප වෙන්න කලින්, මේ ගැනත් දැන ගන්න

පිටුව 27

බොදු පුනරුදයේ නිහඬ විප්ලවවාදියා ඩී. ආර්. විජයවර්ධන

පිටු 28–30

කොමිෂන් සභා ගැන විද්වත් මත

පිටුව 31

හොරොව්පොතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයේ 'අලි ගැහිලි'

● ලලිත් චාමින්ද

අලි රැළේ නායකයා ඇතින්නකි. අලි රංචුවක රැඳී සිටීමට හොඳින් වැඩුණු නාඹර වියේ පසුවන පිරිමි සතුන්ට ඉඩක් නැත. අලි පවුලක සිටිය හැක්කේ වැඩුණු ගැහැනු සතුන් හා ගැහැනු පිරිමි පැටවුන්ට පමණි. මේ නිසා අලි පවුලක පිරිමි සතුන් වයස අවුරුදු නමය දහය වෙද්දී අලි රංචුව අත්හැර යති. එසේ නොගියහොත් අලි පවුලේ වැඩිමහලු ඇතින්නියන්ගෙන් විසුමක් නැත. වැඩිමහලු ඇතින්නියන් විසින් එම පිරිමි සතුන් රැළෙන් පන්නා දමති. එසේ පන්නා දමන අලි; තනි අලියා නැතහොත් තනි පිරිමි අලියා ලෙස හඳුන්වයි. තනි අලියා ප්‍රචණ්ඩකාරිය.

2011 වර්ෂයේ දී කරනු ලැබූ අලි සංගණනයට අනුව ලංකාව පුරා කරණු ලැබූ නිරීක්ෂණයන්ගෙන් සියයට 32.1ක් තනි අලි වේ. මෙරට වන අලි ගහනය අවම වශයෙන් 5879ක් වන අතර ඉන් තනි අලින් සංඛ්‍යාව 1887කි. අලි මිනිස් ගැටුම මේ වනවිට බරපතළ සමාජ ප්‍රශ්නයක් බවට පත්ව ඇත්තේය. අලි මිනිස් ගැටුම හේතුවෙන් වසරකට මිනිස් ජීවිත හැට හැත්තෑවක් පමණ අහිමි වෙති. එමෙන්ම වන අලින්ගේ ජීවිත ද 200ක් 300ක් අතර සංඛ්‍යාවක් අහිමි වෙති. ශාරීරික හා නිල දේපළ හා වගා හානිද විශාල වශයෙන් සිදුවේ. 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 28 වැනිදින වනවිට අලි මරණ 368ක් වී ඇත. මිනිස් මරණ සංඛ්‍යාව 110කි. දේපළ හානි 993කි. ශාරීරික හානි 55කි.

ඉදි කළ අලි වැටේ ගුණාත්මභාවය පිළිබඳ ගැටලු

මෙකී අලි මිනිස් ගැටුමට විසඳුමක් ලෙස ඉතා ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන වන අලි අල්ලා විවිධ පළාත්වල ජාතික වනෝද්‍යාන වෙත මුදාහැරීමට කටයුතු කරනු ලැබීය. එහෙත් වන අලින් නැවතත් මුල් නිජබිම වෙත පැමිණ පෙර පරිදිම ජනතාවට පීඩාකාරී ලෙස හැසිරුණහ. මේ නිසා ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන වන අලින් අල්ලා පුනරුත්ථාපනය කිරීම සඳහා අලි රැඳවුම් මධ්‍යස්ථාන 04ක් ඉදිකිරීමට 2012 වර්ෂයේ අයවැය යෝජනා මගින් ප්‍රතිපාදන වෙන්කොට තිබුණි. එහි පළමු අදියර ලෙස 2012 මාර්තු මස 17 වැනිදින දිනැති අංක 12/0151/549/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අනුරාධපුර කලාපයේ හොරොව්පොතාන ප්‍රදේශයේ හෙක්ටයාර් 997ක භූමි භාගයක් තුළ වන අලි සංරක්ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට අනුමැතිය ලැබී තිබුණි. රුපියල් මිලියන 345ක් වැයකොට හොරොව්පොතාන අලි සංරක්ෂණ මධ්‍යස්ථානය ඉදිකළ අතර එය 2015 වර්ෂයේ දී විවෘත කරනු ලැබීය.

මේ අතර හොරොව්පොතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයේ කාර්යසාධනය සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය මගින් විශේෂ විගණනයක් සිදුකරනු ලැබීය. ඒ අලි සංරක්ෂණ මධ්‍යස්ථානය ආරම්භ කිරීමෙන් වූ අරමුණු ඉෂ්ඨ වුවාද යන්න පිළිබඳ සොයා බැලීම සඳහාය. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම මින් පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ තක්සේරු කිරීම සඳහා පාරිසරික ඇගයීම් වාර්තාවක් සකස් කළ යුතුය. එහෙත් ඒ සම්බන්ධව කිසිදු ඇගයීමක් සිදුකොට නොතිබුණි. ප්‍රාථමික හා ද්විතික වනාන්තරවල වර්ග කිලෝමීටරයකට අලි දැරිය හැකි සංඛ්‍යාව 02කි. හෙක්ටයාර් 997ක වපසරියකින් යුතු මෙම රැඳවුම් මධ්‍යස්ථානය පිහිටි වනාන්තරය ද්විතියික ලක්ෂණවලින් යුතු වනාන්තරයකි. එහෙත් මෙම තත්ත්වය නොසලකා ප්‍රචණ්ඩකාරී අලි 30ක් වර්ග කිලෝමීටර් 9.97ක තුළ රැඳවීමට කටයුතු කර තිබූ බව ජාතික විගණන කාර්යාලව මගින් නිකුත්කොට ඇති වාර්තාවේ සඳහන් වේ. හොරොව්පොතාන ජාතික වනෝද්‍යානයෙන් සියයට 58ක් පමණ මෙම රැඳවුම් මධ්‍යස්ථානය සඳහා යොදා ගැනීම නිසා වනයේ ජීවත්වූ අනිකුත් සතුන්ට වාසභූමි අහිමිව ඇත. 2015 ව වර්ෂයේ සැප්තැම්බර් මස 04 දින සිට 2019 වර්ෂයේ ජුනි 25 වැනි දින කාලය තුළ මෙකී අලි රැඳවුම් මධ්‍යස්ථානය වෙත ප්‍රචණ්ඩකාරී අලි 52 කු ඇතුළත් කර තිබුණි. ජාතික විගණන කාර්යාලය මගින් නිකුත්කොට ඇති වාර්තාවට අනුව ඉන් දැනට ඉතිරිව ඇත්තේ අලි 09 දෙනෙකු පමණි. 12 දෙනකු මියගොස් ඇති අතර ඉතිරි අලි 31 දෙනා එම ස්ථානයෙන් පැන ගියාද, මියගියාද යන්න පිළිබඳ තොරතුරු වනජීවී දේපාර්තමේන්තුව සතුව නොතිබූ බව ද විගණන වාර්තාවේ සඳහන්ව ඇත. රැඳවුම් මධ්‍යස්ථානයට ඇතුළත් කළ අලින්ගේ සෞඛ්‍ය තත්ත්වය දුර්වල මට්ටමක තිබූ අතර එම සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ පසුවිපරමක් සිදුකොට නොතිබූ බවද විගණන වාර්තාවේ සඳහන් වේ.

ආහාර සැපයීම වෙනුවෙන් රුපියල් ලක්ෂ 66ක් මුදලක් වැඩිපුර ගෙවලා

මෙකී රැඳවුම් මධ්‍යස්ථානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ දේපළ ජීවිත හා වගා හානිකරන අලින් අල්ලා දැමීම තුළින් අලි මිනිස් ගැටුම අවම කිරීමය. එහෙත් එම අරමුණට පටහැනිව සත්වෝද්‍යානයට අයත් අලින් දෙදෙනෙකු මෙකී මධ්‍යස්ථානයට මුදා හැරීමට කටයුතු කර තිබුණි. එම අලින් දෙදෙනා අලි සංරක්ෂණ මධ්‍යස්ථානයට ඇතුළත් කරනවිට යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවී තිබේ. කෙසේවුවද ප්‍රමාණවත් ආහාර නොලැබීම නිසා 2016 වර්ෂයේ දී ජයතු නම් අලියා මියගොස් තිබූ අතර මරණ පරීක්ෂණ වාර්තාවේ සඳහන්ව ඇත. අනික් අලියා මියගියාද නැතහොත් ජීවත්ව සිටිද යන්න පිළිබඳ තොරතුරු දේපාර්තමේන්තුව සතුව නොවිය.

අලි රැඳවුම් මධ්‍යස්ථානය වටා කිලෝමීටර් 16කින් යුතු විදුලි වැටක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 159.48ක් වැය කොට ඇති අතර එහි ගුණාත්මක භාවය පිළිබඳ ගැටලුවක් පැවති බව ද විගණන වාර්තාවේ සඳහන් වේ. රුපියල්. 3,312,778 වියදමක් දරා ජලධාරිතාව ලීටර් 20000කින් යුතු පොකුණු 05ක් සහ ජල ධාරිතාවය ලීටර්2000ක් වූ පොකුණු 04ක් 2018 හා 2019 වර්ෂවලදී ඉදිකොට ඇත. ඉදිකරනු ලැබූ පොකුණු හා දිය වළවල් සඳහා ජලය පිටතින් ගෙනවිත් පිරවිය යුතුය. හොරොව්පොතාන ජාතික උද්‍යාන කාර්යාලයට ජල බවුසරයක් නොමැතිවම හා මෙම ප්‍රදේශවල ජල හිගකම නිසා ජල පොකුණු හා දිය වළවල් සඳහා ජලය සැපයීමට නොහැකිවී තිබූ බවද විගණනයේ දී අනාවරණය වී ඇත.

සාමාන්‍යයෙන් වැඩුණු අලියකුගේ දෛනික ආහාර අවශ්‍යතාව කිලෝග්‍රෑම් 300ක් වන අතර පැය 17ක් පමණ කාලයක් ආහාර ගැනීමට ගතකරනු ලබයි. සතුන්ට ආහාර ලබාදීමේ දී එම සත්වයාගේ දෛනික ආහාර අවශ්‍යතාව වන කිලෝග්‍රෑම් 300ට අමතරව කිලෝග්‍රෑම් 100ක් හෝ ඊට ආසන්න ප්‍රමාණයක් ලබාදිය යුතු වේ. මෙකී අලි සංරක්ෂණ මධ්‍යස්ථානයේ වන අලි 30ක් පමණ රඳවා තබාගතහොත් දිනක ආහාර අවශ්‍යතාව කිලෝග්‍රෑම් 12000ක් පමණ වේ. මෙකී රැඳවුම් මධ්‍යස්ථානය පිහිටි වනාන්තරය ද්විතික ලක්ෂණවලින් යුතු වනාන්තරයකි. මේ නිසා එම ආහාර ප්‍රමාණය රැඳවුම් මධ්‍යස්ථානය ඇතුළත පිහිටි ශාඛවලින් ලබාගත නොහැකිය.

2018 නොවැම්බර්මස 01 දින සිට 2019 ඔක්තොබර් 31 වැනිදින දක්වා කාලය තුළ රැඳවුම් මධ්‍යස්ථානයේ අලි 30 දෙනෙකු සඳහා දෛනිකව කොස්කොළ මිශ්‍ර කොළ හා වට්ටක්කා කිලෝග්‍රෑම් 2800 බැගින් සැපයීම සඳහා රුපියල්. 26,133,700 ක කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. එහෙත් මේ පිළිබඳ සිදුකළ භෞතික පරීක්ෂාවේ දී කොළ අතු ආහාරයට නොගැනීම හේතුවෙන් විශාල කොළ අතු ප්‍රමාණයක් ඉතිරිවී වේ. ගොස් තිබුණි. බාහිරින් සපයන ආහාර පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදුකර නොතිබූ බව ද විගණන වාර්තාවේ සඳහන් කොට ඇත.

ව්‍යාපෘතිය අරම්භ කිරීමට පෙර පරිසර අධ්‍යයනයක් කරලා නැහැ

අලි 09ක් හිටියත් 30 දෙනෙකුට ආහාර සපයලා

අලි 12ක් මිය ගිහින්; 31 දෙනකු ගැන තොරතුරු නැහැ

අහාර සඳහා අලි නොකන සියඹලා කොළත් දිලා

හොරෝව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට 2019 වර්ෂයේ ජුලි මස සිදුකරනු ලැබූ අලි සංගණනයට අනුව මෙම මධ්‍යස්ථානයේ සිටින අලි සංඛ්‍යාව 09ක් වුවද අලින් 30 දෙනෙකු සඳහා අහාර සපයා තිබූ ජාතික විගණන කාර්යාලය මගින් නිකුත්කොට ඇති විගණන වාර්තාවක සඳහන් වේ. 2019 වර්ෂයේ අගෝස්තු මස 01වැනි දින සිට ඔක්තෝබර් මස 31 වැනි දින දක්වා කාලය තුළ වැඩිපුර අලි 21 දෙනෙකුට ආහාර සැපයීම වෙනුවෙන් රුපියල්. 6,559,245 මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති බව ද විගණන වාර්තාවේ දැක්වේ.

එමෙන්ම බාහිරින් සපයන අහාර ද්‍රව්‍යවල බර කිරීම සඳහා අවශ්‍ය උපකරණ හොරව්පතාන වනජීවී කාර්යාලයේ නොතිබූ අතර ඒ සඳහා පුද්ගලික සහල් මෝලක තරාදිය භාවිත කොට තිබුණි. ආහාරවල බර කිරීම සඳහා අධීක්ෂණ නිලධාරියකු රඳවා නොතිබූ බැවින් ආහර ද්‍රව්‍යවල බර නිවැරදි දැයි තහවුරු කරගැනීමකින් තොරව ගෙවීම් කොට ඇති බව ද විගණනයේ දී අනාවරණය වී ඇත. එමෙන් අහාර සැපයීම සම්බන්ධ ගිවිසුමේ සියඹලා කොළ සැපයිය යුතු බව සඳහන් වුව ද සියඹලා කොළ අලි ආහාරයට නොගන්නා බව අනාවරණ වී ඇති බව ද විගණන වාර්තාවේ දැක්වේ. එමෙන්ම මෙකී මධ්‍යස්ථානයට ඇතුළත් කළ අලින්ගෙන් 12 දෙනෙකු මියගොස් තිබූ අතර ඉන් අලි 05 දෙනෙකු මියගොස් ඇත්තේ ප්‍රමාණවත් ආහාර නොමැතිවීම හා මන්දපෝෂණය හේතුවෙන් බවට නිරීක්ෂණය වී ඇති බව ද විගණන වාර්තාවේ දැක්වේ. අලියා සංක්‍රමණික සත්වයෙක් වන අතර දිනකට කිලෝමීටර් 20ක් 25ක් දුර ගමන් කරයි. විශේෂයෙන්ම වනගත පිරිමි අලින් මඳ කිපෙන කාලයේ දී වර්ග කිලෝමීටර් 600ක පමණ පුළුල් ප්‍රදේශයක ගමන් කරයි. හෙක්ටයාර් 997ක්වූ වපසරියකින් යුතු රැඳවුම් මධ්‍යස්ථානයක් තුළට මෙම අලින් කොටුකර තැබීමෙන් නිදහසේ ජීවත්වීමට අවශ්‍ය පරිසරය අහිමිවී තිබූ බවද විගණන වාර්තාවේ දැක්වේ.

වන අලි සුරක්ෂිතව ජීවත්වෙනවාද යන්න සොයා බැලීම සඳහා අනතුරට පත්වුවහොත් සොයාගැනීම සඳහා අනුගමනය කරන ක්‍රමවේදය වන්නේ කරපටි පැලඳ වීමයි. එහෙත් හොරොව්පොතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයේ කරපටි පැලඳවීම සිදු කර තිබුණේ අලි තිදෙනෙකුගේ පමණි. මේ නිසා රැඳවුම් මධ්‍යස්ථානයට ඇතුළත්කර තිබූ අනිකුත් අලින් 49 දෙනාගේ හැසිරීම් රටා අධ්‍යයනය කිරීමට සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

ඒ විතරක් නොව රැඳවුම් මධ්‍යස්ථානයට ඇතුළත් කරනු ලැබූ අලි 51 දෙනාගෙන් 15 දෙනෙකුගේ සෞඛ්‍ය තත්ත්වය ඇතුළත් කරන අවස්ථාවේ දුර්වල මට්ටමක තිබී ඇත. එහෙත් එම අලි සම්බන්ධයෙන් කිසිදු පසුවිපරමක් සිදුකොට නොතිබූ බවද විගණනය මගින් අනාවරණය කොට ඇත. එමෙන්ම රැඳවුම් මධ්‍යස්ථානයට ඇතුළත් කළ අලි 51 දෙනාගේ ආහාර අවශ්‍යතා සෞඛ්‍ය පහසුකම් සම්බන්ධයෙන් සොයා බැලීමට විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. අලි රැඳවුම් මධ්‍යස්ථානයේ කළමණාකරණය කිරීමේ කාර්ය නිසිපරිදි සිදුකොට නොතිබූ බවට නිරීක්ෂණය වූ බවද විගණන වාර්තාවේ දැක්වේ.

වන අලි සංගණනයට අනුව වන අලින්ගෙන් සියයට 67.2ක් වනජීවී රක්ෂිත කලාප වල ද, සියයට 27.8ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රක්ෂිත වලද, සියයට 3.2ක් ස්වාධීනව විසිරී ඇති වන ළැහැබ වලද සැරිසරති. අලි මිනිස් ගැටුමට සෘජු ලෙස සම්බන්ධ වන්නේ විසිරී ඇති වන ළැහැබ්වල සැරිසරන අලින් බව වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විශ්වාසයයි.

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි. ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ජායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න. සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි. සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ. සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261

දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351

විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

වාණිජ මණ්ඩලී

BCI සරසවියේ ප්‍රථම ශිෂ්‍යයාට ජනපති සුරතින් ඇතුළත් වීමේ ලිපිය

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ජනවාරි 15වැනිදා සිකුරාදා, මීගමුවේ පිහිටි BCI සරසවියේ (16 වන බෙනඩික්ට් කතෝලික උසස් අධ්‍යාපන සරසවිය) විශේෂ චාරිකාවක නිරත විය.

ඒ කොළඹ අගරදගුරු අතිදැකුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ආරාධනාවකට අනුවය. මෙම වැඩසටහන දැඩි සෞඛ්‍යාරක්ෂිත ක්‍රියා පිළිවෙත් අනුගමනය කරමින් හා සීමාසහිත සහභාගීත්වයකින් යුතුව සංවිධානය කර තිබිණි.

මෙම වැඩසටහන සඳහා අතිදැකුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්, BCI සරසවියේ අධ්‍යක්ෂ ගරු ක්වින්ටස් ප්‍රනාන්දු පියතුමන්, ගරු අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස්, සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍යය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යය සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලේ, ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා, බස්නාහිර පළාත් ආණ්ඩුකාර එයාර් වීෆ් මාෂල් රොෂාන් ගුණතිලක, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සුදන්ත ලියනගේ, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සභාපති මහාචාර්ය අජන්ත ධර්මසිරි මහතා, BCI සරසවියේ අධ්‍යයන සභාවේ සාමාජිකයන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී විය.

2020 වසරේ හොඳම ආයතනික සමාජ සත්කාර අංශයේ ලෝකඩ සම්මානය ඇට්ලස් දිනයි

ශ්‍රී ලංකාවේ විශාලතම හා ජනප්‍රියම අධ්‍යාපන හා ලිපි ද්‍රව්‍ය නිෂ්පාදන සැපයුම්කරු වන ඇට්ලස් සමාගම පසුගියදා පැවති SLIM සන්නාම විශිෂ්ටතා සම්මාන උළෙලේදී (SLIM Brand Excellence),'ඇට්ලස් සිප්සවි' වැඩසටහන වෙනුවෙන් 'වසරේ ආයතනික සමාජ සත්කාර සන්නාමය' කාණ්ඩයේ ලෝකඩ සම්මානය දිනාගැනීමට සමත්විය.

පසුගිය මූල්‍ය වර්ෂයතුළ පාසල් දරුවන් 11,200කට වැඩි ප්‍රමාණයකට සෘජු සමාන අධ්‍යාපන අවස්ථා බිහිකිරීමට දායක වූ මෙම ඇට්ලස් 'සිප්සවි' වැඩසටහන, අතිශය වටිනා ආයතනික සමාජ සත්කාර වැඩසටහනක් බව දිවයිනේ ප්‍රමුඛතම අලෙවිකරණ වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් සම්මාන උළෙලේ විනිශ්චය සභාවේ මතය විය. ආරම්භයේ පටන් ම ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන සිසු දරුවන් දහස් ගණනකට සමාන අධ්‍යාපන ප්‍රවේශ ලබාගැනීම වෙනුවෙන් මෙම වැඩසටහන හරහා කැපීපෙනෙන කාර්යභාරයක් ඉටුකර තිබේ.

මෙම ජයග්‍රහණය පිළිබඳ අදහස් දක්වමින් ඇට්ලස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ අසිත සමරවීර මහතා පැවසුවේ, ඇට්ලස් සමාගමේ සෑම කටයුත්තකදී ම ළමුන්ගේ ඉගෙනීමේ අවශ්‍යයතා කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමුවන බව ය.

SLTC සහ Deakin සරසවිය අතර හවුල්කාරීත්වය ශක්තිමත් කරමින් විශ්ව අධ්‍යාපනික මධ්‍යස්ථානය ආරම්භ කෙරේ

තාක්ෂණික අධ්‍යාපනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වන Sri Lanka Technological Campus (SLTC), මෑතකදී කොළඹ SLTC Trace Expert City හිදී Virtual ක්‍රමයට පවත්වන ලද විශේෂ උත්සවයකදී ඕස්ට්‍රේලියාවේ Deakin University සමඟ ඇතිකරගෙන ඇති හවුල්කාරීත්වය තවදුරටත් දීර්ඝ කිරීම සඳහා වන ගිවිසුමට අත්සන් තැබී ය.

Deakin විශ්ව විද්‍යාලය යනු උසස් තත්ත්වයේ හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෘප්තිමත් වන ආකාරයේ අධ්‍යාපනයක් ලබාදීම සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියාවේ ප්‍රමුඛතම විශ්ව විද්‍යාලයක් ලෙස සැලකේ. මෙම අවස්ථාවට සමගාමීව Centre for Global Education ආයතනය නිල වශයෙන් ආරම්භ කිරීමද සිදුකරන ලදි.

මෙම ආයතනය, දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ජාත්‍යන්තර තලයේ අධ්‍යාපනයක් සහ ඒ සඳහා අවශ්‍ය සම්පත් පිරිනමන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වනු ඇත. හවුල්කාරීත්ව ගිවිසුම සඳහා Deakin University වෙනුවෙන් එහි නියෝජ්‍ය උපකුලපති (ජාත්‍යන්තර සම්බන්ධතා) මහාචාර්ය ගැරී ස්මිත් විසින්ද, SLTC ආයතනය වෙනුවෙන් එහි නිර්මාතෘ-සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ඉංජිනේරු රංජිත් ජී. රූබසිංහ මහතා විසින්ද අත්සන් තබන ලදි.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් Deakin University හි විද්‍යා, ඉංජිනේරු සහ ඉදිකිරීම් පීඨයේ සහකාර පීඨාධිපති මහාචාර්ය බාස්කරන් මහතා මෙසේ පැවසී ය. "Deakin Cloud Campus මගින් විදේශ රටවල සිටින සිසුන්ට සැබෑ විශ්ව විද්‍යාල අත්දැකීමක් ලබාදෙන අතරම ඔවුන්ට ඕස්ට්‍රේලියාවේ විශ්ව විද්‍යාලය සමඟ සෘජුව සම්බන්ධ වීමේ අවස්ථාව ඇතුළුව තවත් පහසුකම් රාශියක් සලසා දෙනවා.

මෙම එකඟතාවේ තවත් විශේෂත්වයක් වන්නේ 'Bachelor of Artificial Intelligence' පාඨමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා SLTC ආයතනයට මේ යටතේ අවසර ලබාදී තිබීමයි.

මෙරට අංක එකේ සල්ලිකාරයා ඉෂාර නානායක්කාර

● චන්දිමා එදිරිමාන්න

ගත වුණු වසර කීපය පුරාම මෙරට අංක එකේ බිලියනපති ව්‍යාපාරිකයා ලෙස පිළිගැණුනේ කවුරුත් නම කිවු පමණින් හඳුනන අති දක්ෂ ශූර ව්‍යාපාරිකයකු වන ධම්මික පෙරේරායි. ව්‍යාපාර ලෝකය තුළ ඉතා වෙහෙස, මහන්සියෙන්, කැප කිරීම් රැසක් කර අභියෝග අතරින් දිරියෙන් ඉදිරියට ආ ධම්මික පෙරේරාගේ ව්‍යාපාරික ලොව රජ කිරුළට අභියෝග කරමින් මේ වන විට තවත් දේශීය ව්‍යාපාරිකයකු කරළියට පැමිණ ඇත.

ඔහු නමින් ඉෂාර නානායක්කාරයි. LOLC සමූහ ව්‍යාපාරයේ හිමිකරුවා මෙන්ම තවත් ප්‍රකට ව්‍යාපාරික සමාගම් රැසක ද හිමිකාරත්වය ඔහු විසින් හොබවන අතර ඔහුට අයත් LOLC සමූහ ව්‍යාපාරය මෙරට කොටස් වෙළෙඳපොළේ ඇමරිකානු ඩොලර් බිලියනය ඉක්මවන වත්කම් හිමි වූ පළමු ස්ථානයේ රැඳෙන සමාගම බවට අභිෂේක ලබන්නට පසුගිය ජනවාරි මාසයේදී සමත්කම් දක්වන ලදී. ඒ අනුව පසුගිය ජනවාරි මස 27 වැනි දින කොටස් වෙළෙඳපොළ ගනුදෙනු අවසන් වෙත්දී කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තු සමාගම් අතුරින් ඉහළම ප්‍රාග්ධනයක් හිමි සමාගම බවට LOLC සමූහ ව්‍යාපාරය පත් විය.

මින් පෙර ශ්‍රී ලංකාවේ ධනවත්ම පුද්ගලයා බවට පත්ව සිටි වැලිබල් වන් සමාගමේ සභාපති ධම්මික පෙරේරා පළමු වරට මෙරට ධනවත්ම ව්‍යාපාරිකයා ලෙස අභිෂේක ලැබුවේ 2013 වසරේදීය. සම්පත් බැංකුව,හේලීස් සමූහ ව්‍යාපාරය වැනි ක්ෂේත්‍ර ගණනාවකට අයත් ප්‍රකට ව්‍යාපාර රැසක වැඩිම කොටස් අයිතිය ලබමින් එම සමාගම් හී කෝටි, ප්‍රකෝටි ගණනින් මුදල් ආයෝජනය කර ඇති ධම්මික පෙරේරා 2013 වසරේදි මෙරට ධනවත්ම පුද්ගලයා බවට ශ්‍රේණි ගත විය.

> "ඉෂාරගේ LOLC සමාගම කොළඹ කොටස් වෙළෙඳපොළ ඇමරිකානු ඩොලර් බිලියනය ඉක්මවූ පළමු සමාගම බවට ද පත් වෙයි."

ගෙවුණු 2020 වසරේ දකුණු ආසියානු කෝටිපතියන් පිළිබඳ විස්තරයන්ට අනුව මෙතෙක් ශ්‍රී ලංකාවේ කෝටිපති ලැයිස්තුවේ ප්‍රථම ස්ථානය තහවුරු කර ගෙන සිටි ධම්මික පෙරේරා දකුණු ආසියානු කලාපයේ කෝටිපති ව්‍යාපාරිකයන් අතර 14 වැනි ස්ථානයද හිමි කර ගෙන සිටි අතර එහිදී පෙන්වන ලද ඔහුගේ සම්පූර්ණ වත්කම ඇමරිකානු ඩොලර් බිලියන 4.56 ක් වේ.

2013 වසරේ සිට ගත වුණු සෑම වසරකදීම මෙරට කෝටිපති ව්‍යාපාරිකයන් අතර පළමු වැනි ස්ථානය ධම්මික පෙරේරා විසින් තමන් සන්තකයේම තබා ගත් අතර ක්‍රමක්‍රමයෙන් තම ව්‍යාපාරික රාජධානියද පුළුල් කර ගනිමින් ලෝක ධන කුබේරයන්ගේ ලැයිස්තුවේ 400 වැනි ස්ථානයට ළඟා වීමට ද සමත් විය.

ධම්මික පෙරේරාගේ ව්‍යාපාරික සමාගම් වලට අභියෝග කරමින් මේ වන විට කොළඹ කොටස් වෙළෙඳපොළ තුළ ද මුල් තැනට ආ සමාගමක් වූ LOLC සමාගම හා එම ව්‍යාපාරයේ සභාපති ඉෂාර නානායක්කාර ජාත්‍යන්තරය තුළද සිය ව්‍යාපාරික මෙහෙයුම් ජය ගනිමින් සිටින අතර ධම්මික පෙරේරා අබිබවා ඉෂාර නානායක්කාර ශ්‍රී ලංකාවේ ධනවත්ම පුද්ගලයා බවට පත්වූයේද LOLC සමූහ ව්‍යාපාරයට අයත් කාම්බෝජියාවේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයක් කොරියානු බැංකුවක් විසින් ඩොලර් මිලියන 603.4කට (ශ්‍රී ලංකා මුදලින් රුපියල් බිලියන 108.5) මිලට ගැනීමට සමඟ බව ආර්ථික විශ්ලේෂකයන් විසින් පෙන්වා දෙන ලදී. ඉෂාර නානායක්කාර මීට පෙර 2020 වසරේදී ශ්‍රී ලංකාවේ දෙවැනි කෝටිපති ව්‍යාපාරිකයා ලෙසද පත්ව තිබුණු අතර ඔහුට මේ වන විටත් LOLC සමූහ ව්‍යාපාරයේ 50%කට වඩා කොටස් හිමිකම් අයිතිය හිමි වී ඇත.

එපමණක්ද නොව ඉෂාර නානායක්කාර හට ලොව බොහෝ රටවල විවිධ ක්ෂේත්‍රයන්ට අයත් ව්‍යාපාර ආයතන රැසක හිමිකාරීත්වය ඇති බවටද මාධ්‍ය වාර්තා පළ වී තිබේ.

ඒ අතර මූල්‍ය සමාගම්, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් හා සංචාරක ක්ෂේත්‍රයට අයත් හෝටල් රැසක්ද ඇති බව සඳහන්ය.

මෙරට ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයකු වූ ඉෂාර ට්‍රේඩර්ස් අධිපති වූ අභාවප්‍රාප්ත රාජා නානායක්කාර; ඉෂාර නානායක්කාරයන්ගේ පියා වන අතර ඔහු LOLC අධ්‍යක්ෂ මණ්ඩලයට පළමුවෙන්ම තේරී පත් වූයේ 2002 වසරේදීයි. 2011 සිට 2018 දක්වා ලංකා ඔරික්ස් ෆිනෑන්ස් හි උප සභාපති ලෙස කටයුතු කිරීමට ඉෂාර නානායක්කාරට හැකියාව ලැබී ඇති අතර; 2013 වසරේදී බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් හි සභාපති ධූරයේද ඔහු කටයුතු කර තිබේ.

2012 වසරේදී පැවැති ආසියා පැසිෆික් ව්‍යවසායකත්ව සම්මාන උළෙලේදී වසරේ කීර්තිමත් තරුණ ව්‍යවසායකයා සම්මානයයද ඉෂාර නානායක්කාර විසින් හිමි කර ගෙන ඇති අතර හෙතෙම 2018 වසරේදී LOLC සමාගමේ සභාපති ධූරයට පත්ව ඇත.

පීපල්ස් ඉන්ෂුවරන්ස් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුමකට

ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය සේවා සැපයුම් සමූහයේ සාමාජිකයකු සහ ප්‍රමුඛතම රක්ෂණ සේවා සැපයුම්කරුවකු වන පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම, විදේශීය සංචාරකයන් සඳහා නැවත වරක් ශ්‍රී ලංකාව විවෘත වීමත් සමඟ ඔවුන් හට ආරක්ෂිතව දිවයිනට පැමිණීම සහ පිටවීම සහතික කිරීමේ අරමුණින් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත්ව ඇත. මෙම රක්ෂණ සේවා සැපයීම සඳහා වන ගිවිසුම්ගත වීම පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පසුගියදා සිදුවිය.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නියම කර ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව, මෙම අනිවාර්ය රක්ෂණ ක්‍රමය අන්තර්ජාල හරහා සංචාරක වීසා සඳහා ඉල්ලුම් කරන ජාත්‍යන්තර සංචාරකයන්, ශ්‍රී ලාංකීය නොවන විදේශ ගමන් බලපත්‍ර දරන්නන්, ද්විත්ව පුරවැසි විදේශ ගමන් බලපත්‍ර දරන්නන්, විදේශීය හෝ ද්විත්ව විදේශ ගමන් බලපත්‍ර දරන්නන් සහ ව්‍යාපාරික වීසා දරන්නන් සඳහා පිරිනමනු ලැබේ.

මෙහිදී සංචාරකයකු ශ්‍රී ලංකාවේ රැඳී සිටින කාලය තුළ COVID-19 ආසාදිතයකු බවට පත්වුවහොත් හෝ ආසාදිත රෝගියෙකුගේ ආශ්‍රිතයෙක් බවට පත්වුවහොත් COVID-19 පැතිරීම වළක්වාලීම සඳහා වන සෞඛ්‍යාරක්ෂිත ක්‍රියාමාර්ගයන් අනුගමනය කරනු ලබන අතර, එහිදී රෝහල් ගතකිරීම, නිරෝධායන හෝටල් ගාස්තු සහ ඒ හා සම්බන්ධ ක්‍රියා පටිපාටි සඳහා වන වියදම් මෙම රක්ෂණයෙන් ආවරණය කෙරේ.

සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 119 රුපියල් 50,000 ක තෑගි

කොන්දේසි

(1) ප්‍රහේලිකාව සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

(2) පළමුවෙන්ම තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10ට රුපියල් 5,000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

(3) සිළුමිණ පුවත්පතේ පළවන ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා ලියුම් කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 119 යනුවෙන් සඳහන් කර ඩේන්ටි මයිලේඩි වොෂ් දවටන 10ක් සමඟ සිළුමිණ ප්‍රහේලිකාව, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට 2021 මාර්තු 10 දිනට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය සහ දුරකතන අංකය ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත තෑග මුදල් පිරිනැමේ. ඔබේ තෑග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ ඩේන්ටි ආයතනයේ, සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.

උපකාරක පද

හරහට...

1 පෙර'පර දෙදිග සංස්කෘතිය හා කලාව පිළිබඳ මෙරට විසූ පඬිවරයෙකි
6 සන්ධ්‍යාව/ සැදෑව
7 ජාලය
8 නැහැයෙන් ගලන මල
9 නෑම
11 භික්ෂූන් වහන්සේ
13 දහය
14 අලුත්
15 ජම්බු ගස
16 රාවණාගේ සිරුර ඇතැයි කියන කන්ද
18 පාරේ ඇවිද යන්නා
20 රතු/ රක්ත
21 ක්‍රිකට් මෙන් ම රගර් ක්‍රීඩාවෙන් ද ලොව දිනූ සීතල රටකි

පහළට....

1 සිබිල් නැන්දාගේ සම්මානනීය ළමා කෘතියකි
2 දිවට දැවෙන සංවේදනය
3 හිට්ලර් ද භාවිතයට ගත් ඉපැරැණි ලාංඡනය
4 භාග්‍යය
5 සොබාවික මිරිදිය ජලාශය
7 ජාතිය
10 මිනිස්
11 අයස නොවේ
12 ස්ත්‍රීන් අරභයා යෙදෙන පදයකි
13 බුදුන් උපන් දේශය
14 සිදාදිය/ සෙයිලම
15 වසඟ කිරීම/ වසඟවීම
17 ලියුම්/ ලිපි
19 මේ සළු මිල අධික බව කියැවේ

1		2	3	4		■	5
	■	6			■	7	
8		■	9		10		■
	■	11				■	12
■	13			■	■	14	
15		■	16	17			
18		19	■		■	20	
21							■

සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 119

නම: .....

ලිපිනය: .....

අත්සන: .....

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරු මාධ්‍ය සේවා

ණය ගන්න, ඇප වෙන්න කලින් මේ ගැනත් දැනගෙන යන්න

● රසික කොටුදුරගේ

වර්ෂ 1990 දී ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය අප රටේ තුළ ස්ථාපිත විය. මෙය දකුණු ආසියාවේ පළමු ණය තොරතුරු කාර්යාංශය විය. ඉන්දියාව වැනි විශාල රටවල පවා ණය තොරතුරු කාර්යාංශය ඇරැඹියේ ඉන්පසුවයි. කිසියම් පුද්ගලයකුට ණය ලබාදෙන්නේ නම් අදාළ ණය දෙන ආයතනය විසින් ඒ පුද්ගයාගේ පසුබිම සොයා බැලීම සාමාන්‍ය සිරිතය. ඔහුට මේ ලබාගන්නා ණය ගෙවිය හැකිද? මිට ප්‍රථම ඔහු විසින් කොපමණ ණය ලබාගෙන ඇතිද? ඒවා පියවා ඇත්තේ කවරාකාරයටද? ආදී වශයෙන් සොයා බලයි. ඒසේ සොයා බැලීමට හැකියාවක් නොමැති නම්, ණය ලබාදීම පහසු කාර්යයක් නොවනු ඇත.

ණය තොරතුරු කාර්යංශය මගින් සිදුකෙරෙනුයේ ණයදෙන ආයතනවලට මෙකී තීරණ ගැනීම සඳහා අවශ්‍ය ණය තොරතුරු සපයා දෙමින් ණය දීමේ ක්‍රියාවලිය පහසු කරවීමයි.

මෙරට සමස්ත ජනගහනයෙන් බොහෝ පිරිසක් කුමන හෝ බැංකුවකින් හෝ කිසියම් මූල්‍ය ආයතනයකින් ණය මුදලක් ලබාගත් අයවලුන් වේ. එසේ ණය ලබාගන්නා සෑම අයකුගේම තොරතුරු ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ දත්ත වාර්තාවල සඳහන් වේ.

කාර්යාංශයේ දත්තවලට අනුව දැනට කාර්යාංශය විසින් පුද්ගලයන් ලක්ෂ අසූවකට වැඩි පිරිසකගේ ණය තොරතුරු පවත්වාගෙන යන අතර එය අප රටේ වැඩිහිටි ජනගහනයෙන් 68.9% නියෝජනය කරයි.

ඔබ ණය මුදල ලබා ගත් බැංකුව හෝ මූල්‍ය ආයතනය කවරක් ද? ලබා ගත් ණය මුදලේ වටිනාකම කොපමණ ද? මාස්පතා ගෙවීමට ඇති වාරිකය කොපමණ ද? යන සියල්ල ම ණය තොරතුරු කාර්යාංශයේ වාර්තා වේ. ඔබ ක්‍රෙඩිට් කාඩ්පතක් ගත්ත ද, නිවාස ණයක් ගත්ත ද, ලීසිං ඒකක් ගත්ත ද, වෙනත් ණයක් ගත්ත ද ඔබ ණය මුදල ලබා ගත් බැංකුව හෝ මූල්‍ය ආයතනය කවරක් ද? ලබා ගත් ණය මුදලේ වටිනාකම කොපමණ ද? මාස්පතා ගෙවීමට ඇති වාරිකය කොපමණ ද? යන සියල්ලම ණය තොරතුරු කාර්යාංශයට අදාළ ආයතනය විසින් වාර්තා කරයි.

තම ගනුදෙනුකරුවට ණය දීම හෝ නොදීමේ තීරණය ණය දෙන ආයතන පමණක් සතුවේ. ඔබේ ණය තොරතුරු වාර්තාවක් කාර්යංශයේ වෙබ් අඩවිය මගින් මාර්ගගත ක්‍රමය ඔස්සේ (online) පහසුවෙන් ලබාගත හැකිය.

ඔබ වඩාත් අවධානයෙන් සිටිය යුත්තේ ඥාතියෙක්, හිතමිත්‍රයෙක් ණයක් ලබා ගනිද්දී ඇපකරුවකු ලෙස ඔබ අත්සන් තැබූවකු නම් ය. එවිට අදාළ පුද්ගලයා එම ණය මුදල නියමිත පරිදි ගෙවන්නේද යන්න පිළිබඳ අවධානයෙන් සිටීම වැදගත්ය. ඔබ මේ වන තෙක් කිසිදු ණය මුදලක් ලබා නොගත්තේ වුව අනාගතයේ දවසක ණය මුදලක් ඉල්ලුම් කරන්නට අපේක්ෂාවෙන් සිටියි නම් ඔබ ඇප වූ පුද්ගලයා නියමිත පරිදි ණය මුදල පියවන්නේදැයි සැලකිලිමත් වීම අත්‍යාවශ්‍යය කාරණයකි. නැති නම් ඔබට ඔබේ අවශ්‍යතාවයකට ණය මුදලක් ලබාගැනීමට යාමේදී ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණදීමට සිදුවිය හැක. මන්ද ඔබ ඇප වී සිටින්නේ අදාළ ණය ලබාගත් පුද්ගලයා විසින් එම ණය නිසිලෙස ගෙවන බවටයි.ඔබ මුදල් නොගෙනම ණය පියවීමට ඉන් බැඳේ.

ඇත්තෙන්ම එය ඔබ ණය මුදලක් ගැනීමට එහාගිය තත්ත්වයකි. එනිසා ඔබ මේ පිළිබඳව අවධියෙන් කටයුතු කරන්න.

ඔබගේ ණය ලකුණ පිළිබඳව දැනුවත්වී සිටීමද අතිශය වැදගත් කාරණයකි. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය කොළඹ කොටුව, සර් බාරෝන් ජයතිලක මාවතේ අංක 25 දරණ 'වයිට්වේස්' ගොඩනැගිල්ලේ පිහිටා ඇත. දුරකතන අංක 0112131313 ඔස්සේ සතියේ කාර්යාලීය දිනවල ණය තොරතුරු කාර්යාංශය හා සම්බන්ධ විය හැකි වේ.

සංවර්ධන ලොතරැයි ජයග්‍රාහකයන්ට අගමැති අතින් චෙක්පත්

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කෝටිපති කප්රුක හා ජයෝදා යන ලොතරැයිපත් හරහා බිහිවූ සුපිරි කෝටිපති ජයග්‍රාහකයින් දෙදෙනෙක් සඳහා චෙක්පත් ප්‍රදානය කිරීම පසුගිය 07වැනි දින අග්‍රාමාත්‍යය සහ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් සිදුකරන ලදී.

එහිදී "කෝටිපති කප්රුක" 652 වැනි වාරයේ සුපිරි ජයමල්ලරු. 87,991,625/- ක මුදල දිනාගත් අඹන්පොල කුමාර පතිරන්නැහැලාගේ සුනිල් මහතාට අදාළ චෙක්පත ප්‍රදානය කෙරුණි.එම වාසනාවන්ත ලොතරැයිපත අලෙවි කර තිබුණේ අඹන්පොල අලෙවි නියෝජිත යූ.ඩී.එල්.දිනේෂ් කුමාර මහතායි.

තවද ජයෝදා 1717 වන වාරයේ සුපිරි ජයමල්ල රු 57,138,276/- ක මුදල දිනාගත් ගල්ගමුව ඒ.ජී.බී.ජී.කොඩිතුවක්කු මහතාටද එහිදී අදාළ චෙක්පත ප්‍රදානය කරන ලදී. එම ජයග්‍රාහී ලොතරැයිපත අලෙවි කර තිබුණේ ගල්ගමුව අලෙවි නියෝජිත ටී.එම්.එස්.බී.මැණිකේ මහත්මියයි.

මෙම අවස්ථාව සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති අමිත ගමගේ මහතා ඇතුළු නිලධාරීන් සහභාගී විය.

කොළඹ සිට සතියකට එමිරේට්ස් ගුවන් ගමන් 06 ක්

එමිරේට්ස් ගුවන් සමාගම සතියකට කොළඹට ක්‍රියාත්මක කරන ගුවන් ගමන් සංඛ්‍යාව හතරේ සිට හයක් දක්වා වැඩිකිරීමට තීරණය කර තිබෙන අතර පෙබරවාරි 18 වැනිදා සිට පස්වන ගුවන් ගමනත් පෙබරවාරි 27 වැනිදා සිට හයවන ගුවන් ගමනත් ආරම්භ කරන බව සමාගම සඳහන් කරයි.

මෙම අමතර ගුවන් ගමන් සමඟ කොළඹ සිටත් කොළඹ දක්වාත් ඩුබායි ඔස්සේ ගුවන් ගමන් සඳහා තිබෙන වෙළෙඳපොළ ඉල්ලුම සපුරාලීමට සැලසුම් කර තිබේ.

අලුතින් එක්කළ මෙම ගුවන් ගමන් දෙක සෑම බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා දිනයන් වලදී සිදුකරනු ඇත. EK650 එමිරේට්ස් ගුවන් ගමන දේශීය වේලාවන්ට අනුව පැය 02:35 ට ඩුබායි වලින් පිටත් වී පැය 08:25 ට කොළඹට ළඟාවේ. එසේම, EK651 එමිරේට්ස් ගුවන් ගමන පැය 09:55 ට කොළඹින් පිටත් වී පැය 13:00 ට ඩුබායි වෙත ළඟා වේ.

එමිරේට්ස් මගීන්ට ඩුබායි සිට ගමනාන්ත 90 ක ජාත්‍යන්තර ජාලයක් වෙත ආරක්ෂාකාරීව සහ පහසුවෙන් ගමන් කළ හැකි බව සමාගම සඳහන් කරයි.

කොළඹට පැමිණීමට එමිරේට්ස් විසින් පුළුල් බඳ සහිත Boeing 777-300ER ගුවන් යානා භාවිතා කරන බවද ප්‍රවේශ පත් emirates.com වෙබ් අඩවියෙන්, එමිරේට්ස් අලෙවි කාර්යාල වලින් හෝ ට්‍රැවල් ඒජන්ත සමාගම් වෙතින් වෙන්කර ගත හැකිබව සමාගම සඳහන් කරයි.

මහින්ද්‍රා අයිඩියල් තාක්ෂණ හුවමාරු වැඩසටහන සාර්ථකව අවසන් කෙරේ

මහින්ද්‍රා අයිඩියල් ලංකා පුද්ගලික සමාගමේ (MILPL) වැලිපැන්න කර්මාන්ත ශාලාවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කළ සදාසිවම් දුරෛයිරාජ් මහතා නම් ඉන්දියානු මෝටර් රථ ඉංජිනේරුවරයා විසින් මෙහෙයවනු ලැබූ පුහුණු වැඩසටහන පසුගියදා සාර්ථකව අවසන් වූ අතර, මින් ඉදිරියට MILPL කර්මාන්ත ශාලාවේ වැඩකටයුතු 100%ක් ශ්‍රී ලාංකික තාක්ෂණ ශිල්පීන්ගේ ශ්‍රම දායකත්වය යටතේ සිදු කිරීමට නියමිතය. ඉංජිනේරු සදාසිවම් දුරෛයිරාජ් මහතා මාධ්‍ය වෙත අදහස් දක්වමින් කියා සිටියේ, වසර දෙකක කාලයක් පුරා ක්‍රියාත්මක කෙරුණු තාක්ෂණ හුවරමාරු වැඩසටහන සහ අංශ ප්‍රධානී ලෙස එතුමන් විසින් හොබවනු ලැබූ සේවා කාලය 2021 ජනවාරි 31 දිනෙන් අවසන් කළ බවත්, මෙම පුහුණුව හරහා ශ්‍රී ලාංකික තාක්ෂණ ශිල්පීන් දැනුම හා නිපුණත්වය අතින් ඉතාමත් සතුටුදායක තලයකට පත් කරන්නට හැකි වීම ගැන තමන් සතුටට පත් වන අතරම ඉන්දියාවේ Mahindra & Mahindra සමාගමේ ක්‍රියාවලියට අනුකූලව ඉදිරි මෙහෙයුම් කටයුතු සිදු කරන්නට ඔවුන්ට හැකිවනු ඇතැයි තමන් තරයේ විශ්වාස කරන බවයි.

"MILPLහි සේවය කරන ශ්‍රී ලාංකික තාක්ෂණ ශිල්පීන්ට මෝටර් රථ එකලස් කිරීමේ සිට දෝෂ නිරාකරණය දක්වා ඕනෑම තාක්ෂණික කටයුත්තක් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවම සිදු කිරීමේ හැකියාව දැන් ලැබී ඇති බව මට සහතික වශයෙන්ම සඳහන් කරන්නට පුළුවන්

HNB FINANCE PLC ස්ලිම් ඩිජිස් සම්මාන උළෙලේදී ඇගයුම්

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සමාගමක් වන HNB FINANCE සිය විශිෂ්ට සේවා තත්වය යළිත් ශක්තිමත් ලෙස සනිටුහන් කරමින් පසුගියදා නිමාවට SLIM DIGIS 2.0 හිදී ලෝකඩ සම්මානයක් හිමි කර ගැනීමට සමත් විය.

HNB FINANCE ආයතනයේ අන්තර්ජාල සෙවුම් ප්‍රශස්තකරණය සහ අන්තර්ජාල සෙවුම් අලෙවිකරණය Search Engine Optimization and Search Engine Marketing යන ක්‍රියාවලීන් මෙහිදී ඇගයීමට ලක් විය. වාර්ෂික SLIM DIGIS සම්මාන උළෙලේදී ඇගයීමට ලක් වූ එකම මූල්‍ය සමාගම HNB FINANCE විය.

HNB FINANCE විසින් ඉදිරිපත් කරනු ලැබූ "Building an organic footprint" යන උපායමාර්ගික ඩිජිටල් අලෙවිකරණ වැඩසටහන SLIM DIGIS සම්මාන උළෙලේදී මෙසේ සම්මානයට පාත්‍ර වූ අතර මෙම සම්මාන උළෙල ජනවාරි 21 වැනි දින සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණ. HNB FINANCE වෙබ් අඩවියෙහි අන්තර්ජාල සෙවුම් ප්‍රශස්තකරණය සහ අන්තර්ජාල සෙවුම් අලෙවිකරණය Search Engine Optimization and Search Engine Marketing යන ක්‍රියාවලීන් SLIM DIGIS සම්මාන උළෙලේදී ඇගයීමට ලක් වීම අප ලද ගෞරවයක් ලෙස නිසැකවම හැඳින්විය හැකියි.

සමාගමක් සිය ඉලක්ක වෙත ගමන් කිරීමේ දී ඒ සඳහා විශාල ජවයක් ඩිජිටල් අලෙවිකරණය තුළින් ලබා දිය හැකියි.

SLT-MOBITEL සන්නාම තානාපතිනියන් පත්වෙයි

ශ්‍රී ලාංකික තාරුණ්‍යයේ ජනප්‍රිය රියැලිටි සිහින තාරකා යුගලය වන ෆැලන් ඇන්ඩ්‍රියා සහ නුවන්ධිකා සේනාරත්න සන්නාම තානාපතිනියන්ලෙස පත් කිරීමට, ජාතික දුරකථන ජාලය වන SLT-Mobitel පසුගියදා පියවර ගත්තේය.

ෆැලන් සහ නුවන්ධිකා ගේ සංයෝගයෙන්මෙරට තරුණ පරපුර SLT-Mobitel සන්නාමය හා හොඳින් සම්බන්ධ කරගැනීමට අවස්ථාවක් උදාවන බව සමාගමේ විශ්වාසයයි. ඔවුන් දෙදෙනාම මෙරට ජනප්‍රිය රියලිටි TV ගායන තරගයකින් ඉදිරියට පැමිණි තාරකාවන් දෙපළකි. එහිදී ෆැලන් එම ගායන කිරුළටත්, නුවන්ධිකා එහි අනුශූරතාවටත් හිමිකම් කීහ.

හයිඩ් පාර්ක් බජාජ් ජෙනුයින් අවුට්ලට් යළි විවෘතයි

ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්හි 27 සංවත්සරය සනිටුහන් කරමින් අංක 75, හයිඩ් පාර්ක් කෝනර්, කොළඹ 02 පරිශ්‍රයේ පැවති බජාජ් ජෙනුයින් අමතර කොටස් අලෙවි මධ්‍යස්ථානය පසුගියදා නැවතත් විවෘත කෙරුණි.

මෙම නව අලෙවි මධ්‍යස්ථානය වෙතින් බජාජ් වාහනවල දිගුකල් පැවැත්ම තහවුරු කරන සහ හොඳින් ඔරොත්තු දෙන බජාජ් ජෙනුයින් අමතර කොටස් කොළඹ සහ තදාන්න ප්‍රදේශවල බජාජ් පාරිභෝගිකයන්ට සුපුරුදු පරිදි පහසුවෙන් මිලදී ගැනීම හැකියාව උදා වී ඇත. මෙම විවෘත කිරීමේ අවස්ථාවට ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්සේවා ඩීලර්වරු, ත්‍රීරෝද රථ සංගම් නියෝජිතයින්, ජෙනුයින් පාර්ට්ස් පාරිභෝගිකයන් මෙන්ම ඩේවිඩ් පීරිස් සමූහ ව්‍යාපාරයේ නිළධාරීන්ද සහභාගී විය. කොවිඩ් - 19 වසංගත තත්ත්වයට නිරාවරණය නොවී, ඔබගේ ආරක්ෂාව තහවුරු කරමින් ඔබට අවශ්‍ය බජාජ් ජෙනුයින් පාර්ට්ස් තම නිවසටම ගෙනවිත් දීමේ සේවාවක්ද ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මේ වන විට හඳුන්වා දී ඇති අතර එම සේවය ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සිටින පාරිභෝගිකයෙකුට අත්විඳිය හැකිය.

සිලෝන් බිස්කට්ස් සමපෝෂ විශිෂ්ටතා සම්මාන 2ක් ලබයි

මෙරට ආහාර නිෂ්පාදනක් ක් ෂේත්‍රයේ ඉදිරිපෙළ දේශීය සමාගමක් වන සිලෝන් බිස්කට්ස් සමාගමේ ප්‍රමුඛතම සන්නාමයක්වන CBL 'සමපෝෂ', පසුගියදා පැවැති SLIM සන්නාම විශිෂ්ටතා සම්මාන උළෙලේදි විශිෂ්ටතා සම්මාන දෙකක් දිනාගැනීමට සමත් විය. එනම්, 'වසරේ දේශීය සන්නාමය' යන කාණ්ඩයේ රිදී සම්මානයත්, 'වසරේ ආයතනික සමාජ සත්කාර සන්නාමය' කාණ්ඩයේ ලෝකඩ සම්මානයත් සමපෝෂ වෙත හිමිවිය.

මෙවර 19වන වරට සංවිධානය කෙරුණු, SLIM සන්නාම විශිෂ්ටතා සම්මාන උළෙල යනු විශිෂ්ට අලෙවිකරණ හැකියාවන් උදෙසා ජාතික මට්ටමේ සම්මාන පිරිනමන ශ්‍රී ලංකාවේ විශිෂ්ට තම සම්මාන ප්‍රදානෝත්සවයකි. සන්නාමකරණයේ ඇති යහපත් භාවිතාවන් ප්‍රචලිත කිරීමට අමතරව, දේශීය සන්නාම ගෝලීය ප්‍රමිතීන්කරා ඔසවා තැබීමද මෙම සම්මාන උළෙලේ අරමුණකි.

සියයට සියයක්ම දේශීය සන්නාමයක් වන CBL සමපෝෂ, දේශීය ගොවි ජනතාවගේ හොඳම නිෂ්පාදන සිය අමුද්‍රව්‍ය ලෙස භාවිත කරමින් නිෂ්පාදනය කෙරේ. තවද සමපෝෂ සන්නාමය, ආයතනික සමාජ සත්කාර අංශයෙන් ද දැවැන්ත මෙහෙවරක් ඉටුකරමින් සිටින අතර, පාරිභෝගිකයන්ට මෙන්ම ගොවිප්‍රජාව වෙතද ඒ හරහා ප්‍රතිලාභ සලසා දීමට කටයුතු කර තිබේ.

60 රස මිතුරු | Uswatte | දිවමිණ

උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි

මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 78

දෙටු ප්‍රවීණ චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මඟින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල්පත්වල පමණක් අලවා උස්වත්ත ටිපිටිප් හෝ බිස්කට් ලාංඡන 2 ක් සමඟ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය.
තැපැල්පත් 2021 මාර්තු 10 වැනිදාට පෙර ගුරුගෝල වෙනස, සිළුමිණ, ලේක්හවුස්, කොළඹ 10 ලිපිනයට එවිය යුතු ය. ගුරු ගෝල වෙනස ජයග්‍රාහකයන්ට රුපියල් 2,500 බැගින් මුදල් ත්‍යාග 09 ක් පිරිනැමේ. ත්‍යාග පිරිනැමීම උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් සමාගමේ අනුග්‍රහයෙනි.

රුපියල් විසිපන්දහසක තෑගි

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)

පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කළ යුතුය.

ඩී.ආර්. විජයවර්ධන දිවි සැරිය

ලේක්හවුස් නිර්මාතෘ
ඩී. ආර්. විජයවර්ධන
135 වැනි
ජන්ම සංවත්සරය

ලේක්හවුස් නිර්මාතෘවරයාණන් දෙස-බස-රැස රැක ගත් හැටි

ඩී. ආර්. විජයවර්ධනයන්ගේ පියා මුහන්දිරම් ඩී.පී. විජයවර්ධන

ඩී. ආර්. විජයවර්ධනයන්ගේ මව හෙලේනා විජයවර්ධන ළමාතැනී

ඩී. ආර්. විජයවර්ධනයන් බ්‍රිතාන්‍යයේදී අධිනීතිඥයකු වූ අවස්ථාව

● නිහාල් පී. අබේසිංහ

රටට නිදහස ලබා ගැනීමට ප්‍රමුඛව කටයුතු කළ ලංකා ජාතික සමිතියේ ලේකම් ලෙස 1913 දී පත්වූ ඩී. ආර්. විජයවර්ධනයන් රටේ නිදහස් අරගලයට සිය පුවත්පත් මඟින් හා උපරිම සංවිධානශීලී හැකියාවෙන් පූර්ණ දායකත්වය දැක්වීය. ඒ ජාති හිතෛෂියාණන්ගේ චරිත කතාව පිළිබඳ කෙටි සටහනකි මේ.

අපේ රටට නිදහස ලබා ගැනීමට උර දුන්, මෙරට ප්‍රථම හා විශාලතම තොරතුරු විකිණීමේ ව්‍යාපාරයේ නිර්මාතෘවරයා වූ ලේක්හවුස් නිර්මාතෘ ඩී.ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන් යනු උගත්, බුද්ධිමත් ජාති හිතෛෂි, නිර්මාණශීලි හා මනා සංවිධානාත්මක හැකියාවක් ඇති ජනහිතකාමියෙකි.

සේදවත්තේ දොන් පිලිප් විජයවර්ධන මුහන්දිරම් මහතාගේ හා හෙලේනා විජයවර්ධන ළමා තැනීගේ තෙවැනි පුත්‍ර රත්නය ලෙස ඔහු උපත ලබා ඇත්තේ 1886 පෙබරවාරි 23 වැනිදාය.

පිලිප් විජයවර්ධන මුහන්දිරම් රාලහාමි තුඩුගල පරපුරට අයත් වන අතර හෙලේනා විජයවර්ධන ළමාතැනී වනාහි එකල ප්‍රකට ව්‍යාපාරිකයකු වූ ඩැප් වීරසිංහ මහතාගේ දියණියයි.

දොන් රිචඩ් විජයවර්ධන නමින් හඳුන්වන අප ආදි කර්තෘවරයාගේ පවුලේ සහෝදර සහෝදරියෝ නම දෙනෙක් වූහ. ඇලෙක්සැන්ඩර්, ලුවිස්, චාර්ලිස්, එඩ්මන්, ඇල්බට් හා චෝල්ටර් එතුමාගේ සොහොයුරෝ වූහ. ඩී.ආර්. විජයවර්ධනගේ සොහොයුරියන් දෙදෙනාගෙන් වැඩිමහල් සොහොයුරිය එකල ශ්‍රේෂ්ඨාධිකරණයේ ජනප්‍රිය විනිශ්චයකාරවරයකු වූ ඊ.ඩබ්ලිව්. ජයවර්ධන අධිනීතිඥවරයා සමඟ විවාහ වූවාය. ලංකාවේ පළමු වැනි මුදල් ඇමතිවරයා වූ ප්‍රථම විධායක ජනපති වූ ජේ.ආර්. ජයවර්ධනයන් ඒ දෙදෙනාගේ කුලුඳුල් පුත්‍රයාය. අනිත් සොහොයුරිය කොළඹ නයනාරෝග්‍ය ශාලාවේ ජනප්‍රිය ප්‍රධාන වෛද්‍යවරයා වූ ආතර් සෙනෙවිරත්න හා විවාහ වූවාය.

මෙම පවුලේ පිරිමි දරුවන් හත්දෙනා මූලික අධ්‍යාපනය ලැබුවේ කොළඹ මෝදර පිහිටි ශාන්ත තෝමස් විදුහලෙනි. එකල මෙරට විශ්වවිද්‍යාලයක් නොතිබූ බැවින් වත්කම් ඇති තරුණයන් උසස් අධ්‍යාපනය සඳහා ගියේ එංගලන්තයටය. ඒ අනුව එතුමාත් කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ගියේ අධිනීතිඥවරයකු ලෙස ඉගෙන ගැනීමේ අභිලාෂයෙනි. ඒ අනුව එතුමා 1912දී නැවත මෙරටට පැමිණියේ අධිනීතිඥවරයකු ලෙසය. ශ්‍රී ලංකාවට නිදහස ලබා ගැනීමේ අභිලාෂයද විජයවර්ධන මහතාගේ හදවතේ එවක සිට පැවති අපේක්ෂාවකි.

අධිනීතිඥයකු ලෙස එතුමා කොළඹ උසාවියේ අලුත්කඩේ නීතිඥවරුන් අතර ප්‍රියමනාප තැනැත්තකු විය. නීතිඥ වෘත්තිය කෙරේ තම පූර්ණ කාලය යොදා වැඩ කිරීමට ඕනෑකමත් දැක්වී නම් ඔහුට එකල දක්ෂ හා ජනප්‍රිය නීතිඥයකු වීමට පුළුවන්කම තිබිණි.

එසේ වුවත් තරුණ ඩී.ආර්. දේශපාලනයට වැඩි උනන්දුවක් දැක්වීමට කටයුතු කළේය. එම උනන්දුව ඔහුට ඇති වූයේ එංගලන්තයේදී ඔහුට ආශ්‍රය කරන්නට ලැබුණු ඉන්දියානු අධිරාජ්‍ය මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු වූ ගෝපාල් කෘෂ්ණ ගොබාලේගේ ඇසුර හා උපදෙස් නිසාය. එමෙන්ම එංගලන්තයේදී නීතිඥ වෘත්තියෙහි සිටි නිදහස් මතධාරි ඉංග්‍රීසි ජාතික එෆ්.එච්.එම්. කෝබට් මහතාගේ අනුබලයද උපදෙස්ද දේශපාලනයට එක්වීමට එතුමාට අත්වැලක් විය. එපමණක් නොව එතුමා මෙරට ප්‍රථම පුවත්පත් ව්‍යාපාරය ලෙස ලේක්හවුස් ආයතනය පටන් ගත්තේද කෝබට් මහතා දුන් උපදෙස් අනුවය.

ඩී.ආර්. විජයවර්ධනයන් සමඟ රටට නිදහස ලබා ගැනීමට එක්ව කටයුතු කළ සර් ඩී.බී. ජයතිලක, ඒ.ඊ. ගුණසිංහ, පොන්නම්බලන් අරුණාචලම්, පොන්නම්බලම් රාමනාදන්, එෆ්.ආර්. සේනානායක, ඩී.එස්. සේනානායක, සිද්ධි ලෙබ්බේ වැනි ජාතික නායකයන් සමඟ කටයුතු කළේ බ්‍රිතාන්‍යයේ සිට මෙරට පැමිණි මුල් කාලයේ සිටය. එකල නිදහස් සටනේ පෙරමුණ ගත්තේ ලංකා ජාතික සමිතියයි. ඉහත අය ඇතුළු දේශප්‍රේමීහු හා මෙරට උගත් සල්ලිකාර සිංහල දෙමළ මුස්ලිම් ප්‍රභූහු මෙහි සාමාජිකත්වය දැරූහ. රටට නිදහස ලබා ගැනීමට පුරෝගාමී වූ ලංකා ජාතික සංගමය බවට පත්වූයේ මේ සමිතියයි.

මේ අතර ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය පිළිබඳව ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලීම් බ්‍රිතාන්‍ය රජයට ශක්තිමත්ව ඉදිරිපත් කිරීම එකල ආරම්භ විය. ඒ පිළිබඳව ප්‍රමුඛත්වය ගත්තේ ලංකා ජාතික සමිතියයි. 1913 ඔක්තෝබර් මස 23 වැනිදා පැවැති ලංකා ජාතික සමිතියේ රැස්වීමේදී ඩී. ආර්. විජයවර්ධනයන් එහි ලේකම් ධුරයට පත්විය. සභාපති වූයේ ආතර් අල්විස් ය.

> ලේක්හවුස් ආයතනය ආරම්භ කිරීමෙන් පසු 1930 මාර්තු 30 වැනිදා මෙරට සිංහල සතිපතා පුවත්පත ලෙස එදත් අදත් පත්තර ලොවේ දිදුලන 'සිළුමිණ' ඉරිදා පුවත්පත ආරම්භ කිරීමට ඩී.ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන් කටයුතු කළේය

ඩී.ආර්. විජයවර්ධනයන් මෙම සමිතියේ ලේකම් බවට පත්වීම එතුමා මෙරට දේශපාලනයට ක්‍රියාශීලීව පිවිසි මුල් අවස්ථාව ලෙස එකල දේශපාලන විචාරකයෝ හැඳින්වූහ.

ඩී.ආර්. විජයවර්ධනයන්ගේ දේශපාලන ආගමනය පිළිබඳ එකල තිබූ 'සිලනිස්' පුවත්පත මඟින් එම සමිතියේ සභාපති ආතර් අල්විස් මහතාද ඇගැයුමට ලක්කර තිබිණ.

ඩී.ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන් 1912 දී බ්‍රිතාන්‍යයේ සිට අධිනීතිඥවරයකු ලෙස ශ්‍රී ලංකාවට පැමිණෙන විට මෙරට තිබුණේ නගරයට සීමාවූ ඉංග්‍රීසි පුවත්පත් අධිරාජ්‍යයකි. එකල මෙරට බහුතර ජනතාව වූ සිංහල ජනතාවට කියවීමට දිනපතා සිංහල පුවත්පතක් නොවීය. ඒ අනුව අපේ රටේ බහුතර සිංහල ජනතාවට සාරගර්භ දැනුම හා චින්තනය සමඟ නිදහස් අරගලයට පණ පෙවීමට පොළඹවන රටටම බෙදාහරින පුවත්පතක අවශ්‍යතාව එකල බහුලව පෙන්නුම් කළේය. ඒ අඩුපාඩුව සැමරීමට 1909 දී ආරම්භ කර තිබූ දිනමිණ පුවත්පත සර් ඩී.බී. ජයතිලකයන්ගේ උපදෙස් මත එච්.එස්. පෙරේරාගෙන් 1914දී ඩී.ආර්. විජයවර්ධනයන් මිලදී ගත්තේය. එය සාර්ථක ලෙස පවත්වාගෙන ගිය ඩී.ආර්. විජයවර්ධනයන් මෙරට ප්‍රථම වරට පුවත්පතක පළවූ වර්ණ ඡායාරූපයක් ලෙස 1915 පෙබරවාරි 2 වැනිදා සිංහ කොඩියක වර්ණ ඡායාරූපයක් දිනමිණ මුල් පිටුවේ පළ කළේය. ඊට පසු 1918දී එතෙක් 'සිලනිස්' නමින් පළවූ ඉංග්‍රීසි පුවත්පත රුපියල් 21000කට මිලදී ගෙන එය 'ඩේලිනිවුස්' ලෙස ප්‍රකාශයට පත් කළේ එකල මෙරට ජීවත්වූ ඉංග්‍රීසි කියවන නමුත් දේශප්‍රේමී ජාතිය සඳහාය.

අනතුරුව 1923දී යුරෝපීයන් සතුව තිබූ ඔබ්සර්වර් පුවත්පත ද ඩී.ආර්. ශ්‍රීමතාණන් මිලදී ගෙන නව්‍යතාවයෙන් යුක්තව මුද්‍රණය කර ලක්වාසි ජනතාවට ලබාදී ඇත්තේ මෙරට ප්‍රථම තොරතුරු විකිණීමේ සන්නිවේදන සමාගම ආරම්භ කිරීමේ අභිලාෂයද ඇතිව බව පෙනේ.

මේ අයුරින් පුවත්පත් ආරම්භ කළත් ඒ ඒ කර්තෘ මණ්ඩල කාර්යාල, දැන්වීම් අංශ හා බෙදාහැරීම් අංශ තිබුණේ කොළඹ නගරයේ විවිධ තැන්වලය. මේ සියල්ල නගරයේ සුවිශේෂ එකම ස්ථානයක එකම ගොඩනැගිල්ලක පැවැත්වීමට හැකියාව තිබුණොත් එය ඉතා ලාභදායක හා ජනතා පහසුව පිණිස වූ ව්‍යාපාරයක් වනු ඇතැයි ඩී.ආර්. විජයවර්ධන ශ්‍රීමතාණෝ අපේක්ෂා කළහ. ඒ අනුව එතුමා 1926දී කොළඹ කොටුවේ බේරේ වැව අසල සුන්දර භූමි භාගයක මෙරට ප්‍රථම වාණිජ පුවත්පත් ආයතනය ලෙස ලේක්හවුස් මන්දිරය විවෘත කළේ එතුමා එහි ස්ථාපනය කළ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සභාපති ලෙසද පත්වෙමිනි.

එකල මෙරට කොළඹ ප්‍රභූ පවුල්වල තරුණයන් රැල්ලකට මෙන් තම සහකාරිය තෝරා ගනු ලැබුවේ උඩරටිනි. ඒ අනුව යමින් තරුණ විජයවර්ධනයන්ද එවකට සබරගමුවේ තුන්කෝරල දිසාවේ දිසාව හා අධිකාරම් පදවියෙන් අභිෂේක ලත් ජොන් හෙන්රි මිදෙණියන්ගේ දෙවැනි දියණිය තම ආදරණීය බිරිය ලෙස තෝරා ගත්තේය.

ඒ අනුව රුබී අලිස් ජී. මිදෙණිය මෙණවිය සමඟ ඩී.ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන් 1916 ජනවාරි 26 දින සාම්ප්‍රදායානුකූලව විවාහ විය. රුබි මිදෙණිය මෙණෙවියගේ වැඩිමහල් සොහොයුරිය විවාහ වූයේ මෙරට ප්‍රථම කථානායක අධිනීතිඥ ප්‍රැන්සිස් මොලමුරේ සමඟය. ලේක්හවුස් ආයතනය ආරම්භ කිරීමෙන් පසු 1930 මාර්තු 30 වැනිදා මෙරට සිංහල සතිපතා පුවත්පත ලෙස එදත් අදත් පත්තර ලොවේ රන් ඔටුන්න ලෙස දිදුලන 'සිළුමිණ' ඉරිදා පුවත්පත ආරම්භ කිරීමට ඩී.ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන් කටයුතු කළේය.

පසු වකවානුවේදි ශ්‍රී ලංකාවේ නිදහස් අරගලයට ක්‍රියාශීලීව සම්බන්ධ වූ මෙතුමා ඒ.ඊ. ගුණසිංහ, පොන්නම්බලම් රාමනායක, ඊ.ඩබ්. පෙරේරා, සර් ඩී.බී. ජයතිලක, පොන්නම්බලම් අරුණාචලම්, එෆ්.ආර්. සේනානායක, ඩී.ඇස්. සේනානායක ඇතුළු ජාතික වීරයන් සමඟ එක්ව නිදහස් අරගලයට පණ පෙවූහ.

විජයවර්ධන යුවළට විවාහයෙන් පසු දරුවන් සිවුදෙනකි. ඔවුන් පිළිවෙළින් සීවලි විජයවර්ධන, නාලනි වික්‍රමසිංහ, රාණි තෝමස්, කුසුමා ගුණරත්න සහ විජය පුවත්පත් සමාගමේ වත්මන් සභාපති රංජිත් සුජීව විජයවර්ධන වෙති. නාලනී වික්‍රමසිංහ වනාහී හිටපු අගමැති රනිල් වික්‍රමසිංහයන්ගේ මෑණියන්ය.

සිළුමිණ ආරම්භ කිරීමෙන් පසු 1932 දී තිනකරන් පුවත්පතද ඊට පසු 'වාරමංජරි' පුවත්පතද පසුව 'බුදුසරණ, සුබසෙත, තරුණි, සරසවිය' ආදී සතිපතා පුවත්පත් ගණනාවක් ලේක්හවුස් ආයතනයෙන් මුද්‍රණය කළ එතුමා ඉන් දෙදහසකට පමණ රැකියා අවස්ථාද ලබාදුන්නේය.

1941 මාර්තු 5 වැනිදා පර්චස් 37ක ඉඩමක් බම්බලපිටිය වජිරාරාමයට පරිත්‍යාග කළ ඩී.ආර්. විජයවර්ධනයන් පේරාදෙණිය සරසවියේ සංඝාරාමයක් සඳහා එකල රුපියල් ලක්ෂ 2 1/2ක් පරිත්‍යාග කර ඇත.

ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඇරැඹීමටත් ඊට පසු ඩොනමෝර් කොමිසන් සභාව ආදී මෙරට නිදහස ලබාදීමට සිදුකළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිටුපස ඩී.ආර්. විජයවර්ධනයන්ද සිටි බව බොහෝ දෙනා නොදනිති. පසුව සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ 1948දී රටට නිදහස ලබා ගැනීමට ද පෙරමුණ ගත් අය අතර එතුමා ප්‍රමුඛයකු විය.

රටට නිදහස ලබා ගැනීමට මෙන්ම රට තුළ අපට ආවේණික පුවත්පත් කලාවක් ස්ථාපනය කිරීමට හා මෙරට ප්‍රථම සන්නිවේදන සමාගම ලෙස ලේක්හවුස් ආයතනය පිහිටුවා තවමත් පවුල් රැසක් ජීවත් කරවන වත්මන් තරුණ පරපුරටත් ආදර්ශයක් දුන් දොන් රිචඩ් විජයවර්ධන ශ්‍රීමතාණන් 1950 ජුනි 13 දින වසර 64ක් ආයු වලඳා වියෝවී ඇත්තේ රටට අදත් අවශ්‍ය එවන් ජාති හිතෛෂියකු අපට අහිමි කරමින්ය.

(ලේඛකයා සිළුමිණ පුවත්පතේ ජ්‍යෙෂ්ඨ සම කතෘවරයා වශයෙන් කටයුතු කරයි.)

සන්දේශන-කතිකා මඟින් නිදහස ලබා ගැනීමට උර දුන් විජයවර්ධන භූමිකාව

● තිලකරත්න කුරුවිට බණ්ඩාර

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් මුදාගැනීමේ අරගලයේ බුද්ධිමය ප්‍රවාහයට ඩී.ආර්. විජයවර්ධනයන් එක් වන්නේ ලංකාවට පැමිණ පුවත්පත් ආරම්භ කිරීමට කලිනි. හිරු නොබසින අධිරාජ්‍යයේදී නීති ශාස්ත්‍රය උගනිද්දීම ඔහු ලංකා දේශපාලනයේ සිදුවන සංසිද්ධීන්ට එහි සිට බලපෑම් කළේය. ප්‍රතික්‍රියා දැක්වූවේය.

අසල්වැසි ඉන්දියාව ඇතුළු අධිරාජ්‍ය සපත්තුවට පෑගුණු ආසියාතික රටවල නිදහස් අරගලයේ ගිනි පුපුරු මතුවෙද්දී, ඩී.ආර්. හුදෙකලාව ලංකාවේ නිදහස් අරගලයට දායක විය. මොහොට්ටිවත්තේ ගුණානන්ද, අනගාරික ධර්මපාලතුමා, එෆ්.ආර්. සේනානායක, වලිසිංහ හරිශ්චන්ද්‍ර, ආතර් ද සිල්වා, සිද්ධි ලෙබ්බේතුමා නිදහසේ ගිනි පුපුරු දල්වද්දී ඩී.ආර්.ගේ චින්තනය අවදි විය.

එංගලන්තයේ ඔහුගේ සමකාලීනයන් වූ සර් ජේම්ස් පීරිස්, එෆ්.එච්.එම්. නෝබට්, සර් ජෝන් ජාඩින්, මැකලම් ස්කොට් සහ ඉන්දියාවේ අධිරාජ්‍ය මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු වූ කෘෂ්ණ ගෝබලේ ද සිටියහ. සිය රටවැසියන් මෙන්ම බ්‍රිතාන්‍යයේ පාලකයන් විසින් එක සේ ගෞරව කරනු ලැබූ ගෝබලේ මහා ප්‍රාඥයෙකි. ස්වකීය රටේ ජනතාව වෙනුවෙන් සේවයක් කිරීම ඉන්දියාවේ වේවා ලංකාවේ වේවා තරුණයන් පිට පැවරුණු යුතුකමකැයි ද රටේ සුබ සිද්ධිය උදෙසා පරිත්‍යාග කිරීමට ඔවුන් සුදුසුකම් විය යුතුයැයි ද ඔහු ඩී.ආර්. ගේ සිතෙහි කාවැද්දුවේය.

හෙතෙම කේම්බ්‍රිජ්හි උගන්නා අතරතුරම ලංකාවේ දේශපාලන නායකයන් සමඟ සමීප සම්බන්ධතා පවත්වාගෙන යමින් බ්‍රිතාන්‍ය මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන් හා වෙනත් ප්‍රභූන් හමු වී වැඩි නිදහසක් ඇති ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් ලංකාවට අවශ්‍ය බව පෙන්වා දුන්නේය. වරෙක නිවාඩුවක් ගත කිරීම සඳහා එංගලන්තයට ගොස් සිටි ලංකාවේ ප්‍රකට නීතිඥයකු වූ එච්.ජේ.සී. පෙරේරාගේ ප්‍රධානත්වයෙන් යටත් විජිත භාර ලේකම්වරයා වෙත නියෝජිත පිරිසක් යැවීමට ඩී.ආර්. විජයවර්ධනයන් පියවර ගත්තේය.

එම නියෝජිත පිරිසට ඊ.ඩබ්ලිව්. පෙරේරා, ජේ.ඩබ්ලිව් ද සිල්වා, එස්.ඒ.කේ. හෝටන් සමඟ ඔහුගේ ඉංග්‍රීසි ජාතික මිත්‍රයා වූ එස්.එච්.එම්. නෝබට ද ඇතුළත් විය. ඩී.ආර්. ඇතුළු ලංකාවේ දේශහිතෛෂීන් ගෙනගිය ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස උගත් ලාංකිකයන්ට තම ඡන්දයෙන් මන්ත්‍රීවරයකු ව්‍යවස්ථාදායක සභාවට යැවීමට අවස්ථාව උදාවිය.

1913දී ලංකාව පැමිණීමෙන් පසු ලංකා ජාතික සංගමයේ ලේකම් ධුරයට පත් වූ ඩී.ආර්. පිළිබඳව 'ද සිලනිස්' පුවත්පත "සුප්‍රසිද්ධ ජනහිතකාමී ප්‍රභූන්ගේ මඟපෙන්වීම හා ඩී.ආර්. විජයවර්ධන වැනි කාර්යශූර ලේකම්වරයකු ඇතිව සංවිධාන වූ ලංකා ජාතික සංගමය අප අතරේ නැඟී එන මහජන මතය එක්තැන් කරමින් රටවැසියන්ගේ බලාපොරොත්තු සපුරාලීමෙහි සමත් බල මණ්ඩලයක් බවට පත්වනු නිසැකය" යනුවෙන් සඳහන් කළේය. ඔහුගේ ඇරයුමින් සර් පොන්නම්බලම් අරුණාචලම් 'අපේ දේශපාලන අවශ්‍යතා' මැයෙන් කළ දේශනයේ අත් වූ ක්ෂණික ප්‍රතිඵලය වූයේ ලංකාවට වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් ලබාගැනීම සඳහා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ නම් සමාගම පිහිටුවා ගැනීමයි. එහිදී ඔහු ඩබ්ලිව්. ආතර් ද සිල්වා සමඟ සමලේකම්වරයා වී ලංකා දේශපාලනයේ වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

අධිරාජ්‍යය විසින් දෙන ලද ඩොනමෝර් කොමිසමේ සාමාජිකයකු වූ සර් ජෙෆ්රි බට්ලර් ඩී.ආර්.ගේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ මිතුරකු විය. එබැවින් ඩොනමෝර් යෝජනා අතීතව විවේචනය කළේ ලංකාවට ආ සර් ඇන්ඩෘ කෝල්සිකොම් හමු වී ඩී.ආර්. පෞද්ගලිකව අදහස් දක්වමිනි.

විජයවර්ධනයන් ශ්‍රී ලංකාවට එන අවධියේ ලංකාලෝකය - ලක්මිණි පහන - සරසවි සඳරැස - සිංහල බෞද්ධයා - සිංහල ජාතිය වැනි පුවත්පත් පළවෙමින් තිබිණි. මේ කර්තෘ මූලික පුවත්පත් දීප ව්‍යාප්තව බෙදාහැරීමේ හෝ අලෙවි කිරීමේ ක්‍රමවේදයක් නිර්මාණය වී තිබුණේ නැත. කොටින්ම කියතොත් 'සිංහල බෞද්ධයා' කර්තෘ අනගාරික ධර්මපාලතුමාට සහ 'සිංහල ජාතිය' කර්තෘ පියදාස සිරිසේනට තම අධිරාජ්‍ය විරෝධී අදහස් ව්‍යාප්ත කිරීමට රට පුරා තැන තැන ගොස් දේශනා පැවත්වීමට සිදුවිය. 1909 එච්.ඇස්. පෙරේරා විසින් ආරම්භ කළ 'දිනමිණ' පත්‍රය ද මේ ගණයේ කර්තෘ මූලික පුවත්පතක් විය. අධිරාජ්‍ය විරෝධී අරගලය 'දුබල ආයුධවලින්' සිදුකළ හැක්කක් නොව, 'තියුණු ආයුධවලින්' කළ යුතු අරගලයක් බව වටහාගත් දේශමාමක ඩී.ආර්. විජයවර්ධනයන් , තමන් එංගලන්තයේදී දුටු සංවිධිත පුවත්පත් ආයතනයක් පිහිටුවීය. නිදහස් අරගලය වූ කලී රටේ සමස්ත ජනතාව එකාවන්ව කළ යුතු අරගලයකි.

ඒ සඳහා සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ජනතාව ඒකරාශී කළ යුතුය. ඒ සඳහා ඔවුන් සියලු දෙනා ඇමතීමට සිංහල - දෙමළ - ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම පුවත්පත් අවශ්‍ය බව ඩී.ආර්. තේරුම් ගත්තේය. එම පුවත්පත් ගෙන් ගෙට යා යුතුය. එමඟින් ජනමතය හැඩගැස්විය යුතුය.

ඩී.ආර්. විජයවර්ධනයන් ලේක්හවුස් ආයතනය ඉදිකිරීමේ දී කටයුතු කළ ආකාරය හොඳින්ම විස්තර කර ඇත්තේ ඔහු සමග සමීපස්ථ සබඳතා පැවැත්වීමේ අවස්ථාව ලත් මාර්ටින් වික්‍රමසිංහයන්ය. එබැවින් ඔහුට ඩී.ආර්. විජයවර්ධන චරිතය පිළිබඳ 'සමීප රූපයක්' ඇත. දීර්ඝ කාලයක් දිනමිණ - සිළුමිණ කර්තෘවරයා ලෙස කටයුතු කළ වික්‍රමසිංහයන් , ඩී.ආර්. ගේ ක්‍රියා කලාපය සියැසින් දුටු සාක්ෂිකාරයකි.

"1914 දී දිනමිණත් - 1918 දී සිලෝන් ඩේලිනිව්ස් පත්‍රයත්, ඔබ්සර්වර්, ඉරිදා ඔබ්සර්වර්, තිනකරන්, ඉරිදා තිනකරන් ආදී ප්‍රධාන පත්‍ර රාශියක් ආරම්භ කළ ඩී.ආර්. විජයවර්ධන, පත්‍ර සකස් කිරීමට ශූර පත්‍රකලාවේදීන් පරපුරක් පුහුණු කළේය. ශූර සංවිධායක මණ්ඩලයක් තැනුවේය. ඒ පත්‍ර පාට කිහිපයකින් විසිතුරු කොට, පැයට පිටපත් විසිදාහක් වුවද මුද්‍රණය කළ හැකි යන්ත්‍රයන්ගෙන් යුතු මහා මුද්‍රණාලයක් පිහිටුවිය.

මුදල් ඇත්නම් මේ සියල්ල කළ හැකිය යනු මහා මෝඩ කියමනකි.

මේ සියල්ල මුදල් විනාශ කළ හැකි තැන් යැයි කීම වඩා නුවණට හුරු කීමකි. විජයවර්ධන මහතා මහා දූර්ගයක් ජයගත්තකු සේ ලේක්හවුස් මන්දිරය 'එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම' යන නම්වලින් හැඳින්වෙන ප්‍රවෘත්ති පත්‍ර ව්‍යාපාරයයට කියන ලද සියල්ලෙන් පිරිපුන් කොට දෙදරුම් නොකන දැඩි අඩිතාලමක් උඩ පිහිටුවාලීය."

"දැන්වීම් ලබා නොදෙමින් රජය අනුගමනය කළ ක්‍රියාකලාපය බ්‍රිතාන්‍ය සාම මන්ත්‍රී මණ්ඩලයේ අවධානයට යොමු කිරීමට සිදුවිණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඩේලි නිව්ස් පත්‍රයට යළි එම අවස්ථාව ලැබුණේය. 1922 දී එවකට ප්‍රකට රහසක් බවට පත්වූයේ සුළුතර ජනයා සැමරීම වෙනුවෙන් ඩේලි නිව්ස් පළ කළ හෙළිදරව්ව පාලකයන්ගේ ප්‍රසාදයට හේතු නොවීම බවය. එහෙත් ඩේලි නිව්ස් පත්‍රය සිය පිළිවෙතින් බැහැර වූයේ නැත. එසේ ක්‍රියා කිරීමේදී ඊට අන් කිසිදු දේශපාලන අභිලාෂයන් තිබුණේ නැත. එය පෙනී සිටියේ ලාංකික ජනයා වෙනුවෙනි යනුවෙන් ඩී.ආර්. විජයවර්ධන 1948 පෙබරවාරි 10 වැනි දින ඩේලි නිව්ස් පත්‍රයට සිය පුවත්පත්වල පරමාර්ථය පැහැදිලි කළේය."

ඩී.ආර්. විජයවර්ධන සුධීහු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සමඟ හා ලංකාවේ ඔවුන්ගේ නියෝජිතයන් සමඟ අරගලයට තියුණු අවියක් ලෙස 'සිලෝන් ඩේලි නිව්ස්' පත්‍රය භාවිත කළ අතර දිනමිණ, සිළුමිණ හා තිනකරන් ශ්‍රී ලාංකේය ජනතාව ඥානනය කිරීමට භාවිත කළහ.

වික්‍රමසිංහයන් හඳුනාගත් ඩී.ආර්. වික්‍රමසිංහයන් කෙසේද යත් ?

"ප්‍රවෘත්ති පත්‍ර පැවැත්වීම හැමට වඩා දුෂ්කර ව්‍යාපාරයකි. සාර්ථක වුවහොත් රටක් ජාතියක් ආණ්ඩුවක් සොලවන්නට තරම් ධනයක් බලයක් එයින් ලැබිය හැකිය. ව්‍යර්ථ වුවහොත් ඒ ව්‍යාපාරය 'මහා කඳු මුඳුනෙන් පෙරළි පෙරළි එන පර්වතයක් සේ ඇරඹූ තැනැත්තා මිරිකා හප කරන්නේය."

සන්නිවේදන පහසුකම් කිසිවක් නැති එකල ඩොනමෝර් වාර්තාව එංගලන්තයේ පළවෙන වෙලාවටම ලංකාවේ ඩේලි නිව්ස් පත්‍රයේ පළ කිරීමට විජයවර්ධනයන් යෙදූ උපාය මාර්ග ගැන තතු කියන වික්‍රමසිංහ, ඔහුගේ චරිත ලක්ෂණ ගැන කියන දේ විජයවර්ධනයන් හඳුනාගැනීමට මඟකි. "කාර්ය ශූරයකු වූ ඒ මහතා උපායෙන් ජයගත යුතු තැන උපාය වහල්කොට ගත්තේය. ඍජු අවංක ගති වහල් කොටගත යුතු තැන ඒ ගති වහල්කොට ගත්තේය. දයාව, කරුණාව දැක්විය යුතු තැන ඒ දෙක වහල්කොට ගත්තේය. ඒ සියල්ල වහල් කොටගත්තේ පෞද්ගලික කීර්තිය පතා නොවේ. තමාගේ නම ගම පළ කරවා ගනු පිණිස ද නොවේ."

"විජයවර්ධන මහතා අනුන්ට පමණක් නොව, තමාටද නිර්දය ලෙස ක්‍රියා කළේ, තමා අතට ගත් කාර්යය සාර්ථක කොට එය අගතැන් පමුණුවනු පිණිසය. එමඟින් රටටත් ජාතියටත් සේවය කරනු පිණිසය."

"විජයවර්ධන මහතා උදේ 10.00 ට කාර්යාලයට ගියේය. මුදල් හදල් පිළිබඳ පැත්තද මුද්‍රණය හා මුද්‍රණය කරන ලද පත්‍ර මිනිසුන් නින්දෙන් අවදිවන්නට පෙර ඒ ඒ පෙදෙස්වලට යැවීම ආදී කටයුතුද සෙවීය. විවේචනය කළේය. අතපසු කරන ලද වැඩ වගකිව යුතු නිලධාරීන්ට පෙන්වීය. වැඩ වැරැද්දුවන්ට තරවටු කළේය. 'අවවාද කළේය' ඇතැම් විට තර්ජනද කළේය. දහවල් එක වන තෙක් මොහොතකුදු අපතේ නොහැර වැඩ කළ විජයවර්ධන මහතා, දහවල් එකට තම නිවසට ගියේය.

අහර ගෙන අනතුරුව ගෙදරදී සිතුවේ, ඊළඟ දවසෙහි පළවිය යුතු ආරංචි පිළිබඳවය. යළිත් තුනට කාර්යාලයට ආ විජයවර්ධන මහතා ප්‍රවෘත්ති අංශයේ ප්‍රවෘත්ති සකසන කර්තෘත් - උපකර්තෘත් හා වාර්තාකරුවන් සමඟ ද සාකච්ඡා කළේය. ඔවුන්ට අමතක වියහැකි කරුණු මතක් කළේය. මහජන ප්‍රශ්න අරබයා ඔවුන් නොසලකන කරුණු පෙන්නා දුන්නේය. වැදගත් ප්‍රවෘත්තියක් කෙටි කොටද නිසරු ප්‍රවෘත්තියක් දික් කොටද පළ කිරීමෙන් වැරදි කළවුන්ට තරවටු කළේය. මහජනයා ආශාවෙන් කියවන පුවතක් කලට වේලාවට පළ නොකරන ලද විට ඊට වගකිව යුත්තා සොයා ඔහුට අවවාද කළේය. තරවටු කළේය. රෑ අට වනතුරු මෙසේ වැඩ කිරීම විජයවර්ධන මහතාගේ දින චර්යාව විය.

වයස හැටක් වනතුරු මෙසේ නොනවත්වා වැඩ කිරීමට ඔරොත්තු දෙන සිතකුත් කයකුත් ලැබිය හැක්කේ දුර්ලභ පුරුෂයකුට පමණි. ඔහු ශ්‍රේෂ්ඨයෙකි."

නිදහස හා සමකාලීන අරගල කළ ඉන්දියාව හා ශ්‍රී ලංකාව තෝරා ගත්තේ ගමන් මාර්ග දෙකක් බව දැකිය හැකිය. ඉන්දියාව නිදහස පතා සිවිල් නීති කඩකිරීම - සත්‍යග්‍රහ සහ උද්ඝෝෂණ වැනි අරගලකාරී ක්‍රියාදාමයකට එළඹුණත්

● මහාචාර්ය
රෝහණ ලක්ෂ්මන් පියදාස

සකච්ඡා කළේ- හර්ෂා සුගතදාස

දකුණු ආසියාවේ සන්නිවේදන විප්ලවය 'පත්තර මහගෙදර'

ලංකාවේ අධිරාජ්‍යවාදී අරගලය අධ්‍යයනය කිරීමේදී පුවත්පත් කලාවේදියාගේ භූමිකාව සුවිශේෂී ලෙස හඳුනාගත හැකි ය. නිදහස් අරගල ගැන විමසා බැලීමේදී එහි අවධි 3ක් තිබේ.

ක්‍රි.ව. 1815දී උඩරට ගිවිසුම අත්සන් කිරීමත් සමඟ වාරියපොල සුමංගල හිමියන්ගේ නායකත්වයෙන් අධිරාජ්‍යවාදී විරෝධී සටන 1818 ඌව වෙල්ලස්සෙන් ඇරඹී නිදහස් සටන් ව්‍යාපාරය දක්වා ඇදී ගියේය. එම ව්‍යාපාරය අවසන් වූයේ දැඩි වේදනාකාරී අත්දැකීම් සමුදායක් සමගිනි. දස දහස් ගණනක් දේශප්‍රේමී භික්ෂූන් සහ සටන්කාමීන් එම අරගලයේදී ජීවිත පරිත්‍යාග කළ අතර තවත් බොහෝ දෙනා වධ හිංසාවලට ලක්වී බන්ධනාගාරගත වූහ. නිදහස් අරගලයේ පළමු අවධිය වශයෙන් මෙය හැඳින්විය හැකිය.

මෙම නැගිටීමෙන් පසුව 2 වැනි අදියර වශයෙන් ක්‍රි.ව. 1848 සහ තවත් වකවානුවලදී විවිධ නැගිටීම් හඳුනාගත හැකි නමුත් ඉන්පසු නැවත එවැනි නැගිටීම් හඳුනාගත නොහැකිය.

ලංකාලෝකයෙන් ලැබුණු ආලෝකය

නිදහස් සටන් ව්‍යාපාරයේ 3 වැනි අදියර නිර්මාණය වන්නේ භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ, ගිහි පැවිදි පඬිවරුන් ගෙන ගිය බුද්ධිමය ශාස්ත්‍රීමය නිදහස් සටන් ව්‍යාපාරයෙනි. මෙරට දකුණු ලකින් ඇරඹෙන මෙම බුද්ධිමය ශාස්ත්‍රීය ව්‍යාපාරයට නායකත්වය දෙන භික්ෂූන් වහන්සේලාගෙන් මෙරට අධිරාජ්‍යවාදී විරෝධී මතය ගොඩනැගෙන පුවත්පත් බිහිවන ආකාරය දැකිය හැකිය. මෙරට පළමු වැනි පුවත්පත වන 'ලංකාලෝකය' බුලත්ගම ධම්මාලංකාර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ඇරඹුණු අතර යටත්විජිත පාලනයට එරෙහි මතවාදයන් ගොඩනගන ව්‍යාපාරයක් ලෙස එම පුවත්පත ශක්තියක් හා ආදර්ශයක් ලබාදුන්නේය. මෙරට ප්‍රථම බෞද්ධ මුද්‍රණාලය වූ 'ලංකෝපකාරය' මුද්‍රණාලයේ බුලත්ගම ධම්මාලංකාර හිමියන් සහ තායිලන්තයේ චූලාලංකාර රජුගේ අනුග්‍රහයෙන් ලැබුණු මුද්‍රණ උපකරණ භාවිත කොට මෙම පුවත්පත ඇරඹිණි. නිදහස පිළිබඳ මුල්ම ස්වදේශික මතය ගොඩනැගෙන මෙම පුවත්පත හරහා බෞද්ධ ප්‍රබෝධයේ කාහලනාදය මීළඟට අපට හමුවන්නේ පංච මහාවාද ප්‍රධාන කොටගත් පානදුරාවාදය කේන්ද්‍ර කොටගෙනය. මිෂනාරිවරුන් සමඟ සිදුවූ මෙම වාද සඳහා නායකත්වය දුන් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, බුලත්ගම ධම්මාලංකාර හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, වස්කඩුවේ සුභූති හිමි ප්‍රධාන භික්ෂූන්වහන්සේලා ප්‍රමුඛ ගිහි පඬිවරුන් සියලුදෙනාම පාහේ මේ අවධියේ ගොඩනැගෙන සිංහල පුවත්පත්වල කතුවරුන් මෙන්ම ලේඛකයන්ද වූ බව පෙනී යයි.

> ලේක්හවුස් ආයතනයේ ආරම්භක පුරෝගාමී පුවත්පත වන 'දිනමිණ' ඇරඹෙන්නේ මෙම ජාතික මෙහෙවර උදෙසාය. 'සරසවි සඳරැස' පුවත්පතෙන් ඉවත් වූ එච්.එස්. පෙරේරා විද්‍යාලංකාර මහ පිරිවෙනෙ පරිවේණාධිපති රත්මලානේ ධර්මාරාම ස්වාමීන් වහන්සේගේ අවවාද අනුශාසනා පරිදි අධිරාජ්‍ය විරෝධී නිදහස් සටන අවදි කළ හැකි පුවත්පතකට නමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටි බව ඉතිහාසයේ සඳහන් වේ

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි 'රිවිරැස' පුවත්පතේ කර්තෘත්වය දැරූ අතර කොග්ගල පඬිවරයාගේ ප්‍රධානත්වයෙන් 'ලක්මිණි පහන' පුවත්පත ඇරඹිණි. පානදුරාවාදය සංලක්ෂ්‍යය කරගෙන ඇතිවූ ප්‍රබෝධය පදනම් කොටගෙන ඕල්කට්තුමාගේ ආගමනය දැකිය හැකි ය. ඕල්කට්තුමාගේ පැමිණීමත් සමඟ පරම විඥාර්ථ සමාගම ආරම්භ වී, අනතුරුව 'සරසවි සඳරැස' හා 'ද බුඩිස්ට්' සඟරාව ඇරඹිණි. මීට සමගාමීව සමකාලීන යුගයේ බිහිවූ අනගාරික ධර්මපාලතුමා, පියදාස සිරිසේන, හේමපාල මුණිදාස, ඩී.ඩබ්ලිව්. වික්‍රමාරච්චි, සී. දොන් බස්තියන් ජයවීර යන කර්තෘවරුන්ගේ මෙහෙයවීමෙන් 'සිංහල බෞද්ධයා', 'සිංහල ජාතිය', 'සිංහල බලය', 'ස්වදේශ මිත්‍රයා', 'දිනපතා ප්‍රවෘත්ති' යන පුවත්පත් ආරම්භ වන ආකාරය දැකිය හැකි ය.

ජාතික වගකීමට උර දුන් 'දිනමිණ'

මෙරට සාමාන්‍ය බහුතර ජනතාව අතර අධිරාජ්‍යවාදයේ සමාජගත බව, නිදහසේ වැදගත්කම, ජාතික අනන්‍යතාවක අවශ්‍යතාව පිළිබඳ මතවාද සමාජගත කෙරිණි. මීට සමාන්තරව උතුරුකරයේ ආරුමුගම් නාවලර්ගේ ප්‍රධානත්වයෙන් ඇරඹි 'හින්දු ඔගන්', 'උදයභානු' පුවත්පත් මඟින් එම සමාජය තුළද නිදහස පිළිබඳ කතිකාව අවදි කළ ආකාරය දැකිය හැකිය. මුස්ලිම් ජාතික සිද්ධි ලෙබ්බෙගේ ප්‍රධානත්වයෙන් 'මුස්ලිම් නේෂන්' පුවත්පත එම ජන කණ්ඩායම් අතරද නිදහස පිළිබඳ සමාජගත කෙරිණි. ලේක්හවුස් ආයතනයේ ආරම්භක පුරෝගාමී පුවත්පත වන 'දිනමිණ' ඇරඹෙන්නේ මෙම ජාතික මෙහෙවර උදෙසාය. 'සරසවි සඳරැස' පුවත්පතෙන් ඉවත්වූ එච්.එස්. පෙරේරා විද්‍යාලංකාර මහ පිරිවෙන පරිවේණාධිපති රත්මලානේ ධර්මාරාම ස්වාමීන් වහන්සේගේ අවවාද අනුශාසනා පරිදි අධිරාජ්‍ය විරෝධී නිදහස් සටන අවදි කළ හැකි පුවත්පතකට නමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටි බව ඉතිහාසයේ සඳහන් වේ.

සඳරැසට මුහුණදිය හැක්කේ හිරුට බැවිනුත් හිරුට කියන්නේ දිනමිණ බැවිනුත් 'දිනමිණ' යන නාමය තබන ලදී. 'දිනමිණ' පුවත්පත මෙරට නිදහස් සටන අවදි කළ කර්තෘ මූලික පුවත්පතක් වශයෙන් ඇරඹිණි. එච්.එස්. පෙරේරාගේ ඇවැමෙන් මේ වනවිට නිදහස් සටන් ව්‍යාපාරයේ තුන්වැනි අදියරට පැමිණ තිබිණි. ඊට නායකත්වය දුන්නේ විදේශීය අධ්‍යාපනය නිමා කර, මෙරටට පැමිණි තරුණ පිරිසකි. මෙම තරුණ පිරිස එකතුවී ලංකා ජාතික සංගමය ආරම්භ කළ අතර එහි නියමුවා වූයේ ඩී.ආර්. විජයවර්ධන තරුණයාය. ඩී.ආර්. විජයවර්ධන සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේ එංගලන්තයේ තිබූ සංවිධානාත්මක පුවත්පත් කර්මාන්තයට ප්‍රවේශ වෙමිනි. මේ වනවිට එච්.එස්. පෙරේරා රෝගාතුර වීම නිසා වරින් වර නැවතෙමින් තිබූ 'දිනමිණ' පුවත්පත ප්‍රකාශයට පත් කිරීමට ඩී.ආර්. විජයවර්ධන මහතා කටයුතු කළේය. මීට අමතරව තවත් නායකයකු වූ එෆ්.ආර්. සේනානායක යටතේ තිබූ 'ද සිලනීස්' පුවත්පතේ අයිතිය ඩී.ආර්. විජයවර්ධන විසින් පවරා ගනු ලැබීය. යටත් විජිත පාලකයන් යටතේ පැවති 'ඔබ්සවර්' සහ 'කොමර්ෂල් ඇඩ්වර්ටයිසර්' පුවත්පත් මිල දී ගෙන ස්වදේශික ව්‍යාපාරික පුවත්පත් ආයතනය වූ 'ලේක්හවුස්' පිහිටුවීමට කටයුතු කළේය.



ඩොමිනියන් නිදහසට පෙරළි කළ පත්තර මහගෙදර

මේ වනවිට ව්‍යවස්ථාදායක නීතිරීති හරහා ඩොමිනියන් තත්ත්වයේ නිදහසක් ලබාගැනීමට කතිකා ආරම්භ වී තිබිණි. මේ අතරතුර මෙරට පුරෝගාමී වාමාංශික ව්‍යාපාරය වූ සමසමාජ පක්ෂය, සූරියමල් ව්‍යාපාරය හරහා 'කම්කරුවා', 'සමසමාජය', 'සමසමාජිස්ට්', 'සමධර්මන්', 'නවශක්ති', 'ජනශක්ති' ආදී පුවත්පත් මඟින් පූර්ණ නිදහසින් යුක්ත ස්වරාජ්‍යයක් සඳහා උද්ඝෝෂණ පැවැත්විණි.

මේ අතරතුර ලංකා ජාතික සංගමයේ නායකයන් ගෙන ගිය පක්ෂ ඇරඹීමේ ව්‍යාපාරය සහ වෙනත් ඉල්ලීම් වෙනුවෙන් ලේක්හවුස් පුවත්පත් 'මත වේදිකාවක්' ලෙස ක්‍රියාත්මක විය. ලංකාවේ නිදහස වෙනුවෙන් ගෙන ගිය වැඩපිළිවෙළවල තීරණාත්මක සාකච්ඡා කෙරුණේ ඩී.ආර්. විජයවර්ධනයන්ගේ දියතලාවේ පිහිටි නිවාඩු නිකේතනයක් වූ 'ආකේඩියා උද්‍යානය නිවෙසේ' සිට බව පොතපත පෙන්වා දෙයි. මීට වසර 73 කට පෙර අත්කරගත් ඩොමිනියන් තත්ත්වයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත සකස් කිරීමෙහිලා ලේක්හවුස් ආයතනය සහ එම පුවත්පත් පුරෝගාමී ලෙස ඩී.ආර්. විජයවර්ධන මහතා සක්‍රියව ක්‍රියා කළ ආකාරය ඉතිහාසය පිරික්සා බැලීමේදී මැනවින් කැපී පෙනෙනු ඇත.

පේරාදෙණිය සරසවියේ විජයවර්ධන සලකුණු

● අසේල කුරුළුවංශ

බ්‍රිතාන්‍යයේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබ බැරිස්ටරවරයකු ලෙස මෙරටට පැමිණි දොන් රිචඩ් විජයවර්ධනයන් මෙරට ජනතාව හඳුනන්නේ ඩී.ආර් විජයවර්ධන නමිනි.

ලේක්හවුස් ආයතනය බිහි කරමින් දිනමිණ, ඩේලි නිවුස්, සිළුමිණ, ඔබ්සවර් වැනි පුවත්පත් පාඨකයන් අතර ජනප්‍රිය කරවමින් ඒ ඔස්සේ නිදහස් සටනට පන්නරය දුන් විජයවර්ධන මහතා මෙරට ආගමික හා අධ්‍යාපන අංශය කෙරෙහි කරනු ලැබූ සුවිශේෂී සේවාව සුළුපටු නොවන්නේය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආරම්භය හා එහි විකාශනය සම්බන්ධව අවධානය යොමු කිරීමේදී එය මොනවට පැහැදිලි වෙයි.

සිලෝන් යුන්වර්සිටි කොලේජ් නමින් 1921 දී කොළඹ සීමිත ඉඩක ආරම්භ කළ ලන්ඩන් විශ්වවිද්‍යාලය පිළිගත් උසස් අධ්‍යාපන ආයතනය කොළඹින් පිටතට ගෙන යායුතු බවට 1938 වසරේදි තීරණය කරනු ලැබුවේ එහි විදුහල්පති ලෙස ශ්‍රීමත් අයිවෝ ජෙනිංගස්ය. ඒ අනුව දිවයිනේ ප්‍රදේශ රැසක් නිරීක්ෂණය කිරීමට ජෙනිංග්ස් මහතා පියවර ගනිත්දී එය සුන්දර හන්තානට හා මහවැලි නදියට මැදිව පේරාදෙණියේ ස්ථාපිත කළ යුතු බවට හඬ නැඟූ පිරිස අතර පෙරමුණ ගත්තේ ඩී.ආර් විජයවර්ධන මහතාය. විශ්වවිද්‍යාලය එම ස්ථානයේ ආරම්භ කිරීමත් නේවාසිකව අධ්‍යාපනය ලබන සිසුන් අතරට භික්ෂූන් වහන්සේලාද ඇතුළත් විය යුතු බවට හඬ නැඟීමෙන් නොනැවතී ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමේ කාර්යයේද නියමුවෙකු ලෙස හෙතෙම කටයුතු කළේය.

"මේ රටේ අධ්‍යාපන හා ආර්ථික කටයුතුවලට බ්‍රිතාන්‍ය රජය මැදිහත්ව කටයුතු කරත්දී අපේ දේශපාලනඥයන්ට වඩා ඒ පිළිබඳ අවබෝධයෙන් කටයුතු කළ ඩී.ආර් විජයවර්ධන මහතා ඔහුගේ එම මතවාදය පුවත්පත් ඔස්සේ ප්‍රබල ලෙස සමාජ ගත කළා. අප රටට විශ්වවිද්‍යාලයක් අවශ්‍ය බවට පොන්නම්බලම් අරුනාචලම් මහතාගේ මූලිකත්වයෙන් ආරම්භ වූ ලංකා විශ්වවිද්‍යාල සංගමයේ හඬ ලේක්හවුස් පුවත්පත් ඔස්සේ ජනතාව අතරට ගෙන යෑමට මූලිකත්වය ගත්තේ විජයවර්ධන මහතා යැයි කීම නිවැරදියි. 1942 වසරේදී ලංකා විශ්වවිද්‍යාලය ආරම්භ කිරීමට

පේරාදෙණිය සරසවියේ විහාර මන්දිරය

මුල්ගල් තැබුණද ගොඩනැගිලි ඉදිකර නිල වශයෙන් එය විවෘත වූයේ 1952 වසරේදීයි.

මේ ස්ථානයේ විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීමට පුරෝගාමී මෙහෙවරක් කරනු ලැබුවේ ඩී. ආර් විජයවර්ධනයන්ය. ගොඩනැගිලි ඉදිකිරීමේ සැලසුම් කිරීම්වලට පැට්‍රික් ඇබර්ක්‍රොම්බි සම්බන්ධ කරමින් ඒ සඳහා ඔහු පෙලඹවීමේ කටයුතු සිදුකර ඇත. ඒ, දෙවන ලෝක යුද්ධයට මැදිවීම නිසා විශ්වවිද්‍යාලය ඉදි කිරීමේ වැඩකටයුතු ඇන හිට තිබීම නිසාය. ඩොනල්ට් ෆර්ගියුසන් මහතා සතුව තිබූ ඕලන්ද හා පෘතුගීසි පොත් හා සිතියම් විශාල ප්‍රමාණයක් ඩී.ආර් විජයවර්ධන මහතාට ලබාදී තිබෙන අතර ඒවා සියල්ල ඒ මහතා පසුව විශ්වවිද්‍යාලයට පරිත්‍යාග කර තිබෙනවා. අදත් එය Ferguson Collection නමින් අප සතුව තිබෙනවා"පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති ආචාර්ය රාසයියා මහේෂ්වරන් මහතා අතීත මතක අවදි

කහගල සාරානන්ද නාහිමි සහ පුස්තකාලාධිපති ආර්.මහේස්වරන්

කරමින් පැවසුවේය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භික්ෂු නේවාසිකාරය පිහිටා තිබෙන සංඝාරාමය සහ කෙහෙල් පන්නල හා හිඳගල වලව් ද්විත්වයත් විහාරයත් සාදවා පරිත්‍යා කර තිබෙන්නේ ඩී.ආර් විජයවර්ධනයන් විසිනි. එම පවුලේ උරුමයක් වූ අක්කර අටකට භූමි ප්‍රදේශයක් පුරා පැතිර පවත්නා ගස් කොළන් සහිත වටිනා ඉඩම පාලනය වන්නේ විශ්වවිද්‍යාලීය සංඝාරාම විහාර භාරකාර මණ්ඩලය මඟිනි. සංඝාරාමය සහ හිඳගල වලව්ව අදටත් ක්‍රියාත්මක වන්නේ භික්ෂු නේවාසිකාගාර ලෙසිනි. මෙම සියලුම ගොඩනැගිලිවල අභ්‍යන්තරයේ ඩී. ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන්ගේ ඡායාරූපයක් ප්‍රදර්ශනය කර ඇත.

"මේවා විජයවර්ධන පවුලේ පාරම්පරික උරුමයන්. ඩී.ආර් විජයවර්ධන මහතා සිංහල බෞද්ධ ව්‍යාපාරය තුළ සිටි ප්‍රභූවරයෙක්. එතුමා ජාතික ව්‍යාපාරය තුළ යම් යම් වැඩ කොටස් කළා. පේරාදෙණිය විශ්වවිද්‍යාල අංශ ගණනාවකින් සුවිශේෂී වෙනවා. ඒ අතරින් මෙහි ගොඩනැගිලිවල දක්නට ලැබෙන පැරණි ගෘහ නිර්මාණ කලාව විශේෂයි. බෞද්ධ ආචාරධර්ම ටික ඔබ්බලා තමයි මේවා හැදුවේ. පැරණි තක්ෂලාවේ අධ්‍යාපන ක්‍රමය තමයි ක්‍රියාත්මක වෙන්නේ.

ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයෝ නේවාසිකයි. ගුරුවරයා ළඟ නැවතිලා සිසුන් ඉගෙන ගන්නවා. භාරකාර මණ්ඩලයක් යටතට විජයවර්ධන මහතා එදා මෙය පත්කළා. 1947 ජනවාරි 23 දා මේ සඳහා වන ප්‍රතිඥා පත්‍රය අත්සන් කර තිබෙනවා. විජයවර්ධන මහතා භාරය හදන්න මුල පුරමින් ඒ සඳහා රුපියල් ලක්ෂ 2 1/2 ක මුදලක් පෞද්ගලිකව ලබාදී තිබෙනවා. ඩී. ආර් විජයවර්ධන, හේම හෙන්රි බස්නායක, පනාගොඩගේ බර්ට්‍රම් ප්‍රනාන්දු, පියදාස ධර්මසිරි, රණතුංග මුදලිඳු, ලියෝ පෝල්ඩ් ජේම්ස් ද සිල්වා සෙනෙවිරත්න යන පස්දෙනා නියෝජනය වෙනවා. ඔවුන්ගේ අභාවයෙන් පසු ඒ පවුල්වල පත්කරනු ලබන සාමාජිකයෙකු භාරකාර මණ්ඩලයට පත් වෙනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන ස්වාමීන් වහන්සේලාට හා ආචාර්ය භික්ෂූන් වහන්සේලාට නේවාසිකව වැඩ ඉන්න පහසුකම් සලසන්න සංඝාරාමය ගොඩ නැඟුවා. ඒක ලේක්හවුස් ශාලාව කියලා තමයි අදටත් හඳුන්වන්නේ. ඒකට සම්බන්ධව විහාරයක් හැදුවා.

කාර්ය මණ්ඩලයට මහෝපාධ්‍යය හිමි, ප්‍රධාන ආරක්ෂක නිලධාරී, අරක්කැමි, ගබඩා බාරකරු හා කම්කරු ඇතුළත් වුණා. මෙහි සිට විශ්වවිද්‍යාලයට යන්නට එන්නට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේට හා ආචාර්ය ස්වාමීන්දයන් වහන්සේලාට වාහනයක් රියදුරු සමඟ ලබාදී තිබුණා.මේ සියල්ල වියදම් භාරය මඟින් දැරුවා. 1971 වනතෙක් මේ භාරය පවත්වාගෙන ගියා.

ඒ වකවානුවේ ඇතිවූ දේශපාලන ගැටලු මත එම කටයුතු විශ්වවිද්‍යාලයට පවරා දුන්නා. දේපොළ තිබෙන්නේ තාමත් භාරය යටතේයි. දැන් පරිපාලනය විශ්වවිද්‍යාලය මඟින් කරන්නේ. මහෝපාධ්‍යය ධූරය හා ආරක්ෂක නිලධාරී පමණයි පැරණි කාර්ය මණ්ඩල සාමාජිකයන් ලෙස ඉන්නේ" භික්ෂු නේවාසිකාගාරයේ පූර්ණකාලීන උප ශාලාධිපති, සංඝරාම විහාර භාරකාර මණ්ඩලයේ උපාධ්‍යය කහගල සාරානන්ද නාහිමියෝ පවසති.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ භික්ෂූන් වහන්සේලාට නේවාසිකව අධ්‍යාපනය ලැබීම සඳහා අවශ්‍ය පහසුකම් සියල්ල සපුරා ලීමට කටයුතු කළ ඩී.ආර් විජයවර්ධනයන් එම ඉඩම් හා ගොඩනැගිලි භාරයක් යටතට පත් කිරීම සඳහා අත්සන් කළ ලියවිල්ල විශ්ලේෂණය කිරීමේදී එතුමා තුළ වූ අභිප්‍රාය මැනවින් හඳුනා ගැනීමට පුළුවන.

ඩී. ආර් විජයවර්ධනයන් සිදු කළ ජාතික, ආගමික හා ශාසනික සේවාව අති මහත්ය. එතුමා තුළ මේ සඳහා වූ අවංක කැපවීම ජාතියක් ලෙස අප අගය කළ යුතුය. විජයවර්ධනයෝ මේ සියල්ල කළේ පෙරළා කිසිදු වරප්‍රසාදයක් අපේක්ෂා නොකරමිනි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමට එතුමා කළ සේවයට ගෞරව කරනු පිණිස ගෞරව උපාධියක් පිරිනැමීමට පාලනාධිකාරිය තීරණය කළත් එතුමා එය පිළි නොගත්තේය. එසේ වුවත් ඩී.ආර් විජයවර්ධන නමින් නේවාසිකාගාරයක් නම් කිරීමට පාලනාධිකාරිය කටයුතු කළේය. විජයවර්ධන ශාලාව නමින් අදටත් පවත්වාගෙන යනු ලබන එම ගොඩනැගිල්ලේ නේවාසිකව සිටින්නේ සායන කටයුතුවලට සහභාගි වන නේවාසික වෛද්‍ය සිසුවියන්ය.

ඡායාරූප-රුවන් මීගම්මන

> පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භික්ෂු නේවාසිකාරය පිහිටා තිබෙන සංඝාරාමය සහ කෙහෙල් පන්නල හා හිඳගල වලව් ද්විත්වයත් විහාරයත් සාදවා පරිත්‍යා කර තිබෙන්නේ ඩී. ආර විජයවර්ධනයන් විසිනි. එම පවුලේ උරුමයක් වූ අක්කර අටකට භූමි ප්‍රදේශයක් පුරා පැතිර පවත්නා ගස් කොළන් සහිත වටිනා ඉඩම පාලනය වන්නේ විශ්වවිද්‍යාලීය සංඝාරාම විහාර භාරකාර මණ්ඩලය මඟිනි.

සංඝාරාමය

විජයවර්ධන ශාලාව නමින් පවත්වාගෙන යන නේවාසිකාගාරය

කැලණි විහාරය

බම්බලපිටිය වජිරාරාමය



බොදු පුනරුදයට පෙරමුණ ගත් ඩී. ආර්. විජයවර්ධන

පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ හිටපු උප කුලපති, කොටුව සම්බුද්ධාලෝක විහාරාධිපති

මහාචාර්ය ඉත්තදෙමළියේ ඉන්දසර නා හිමි

● සාකච්ඡා කළේ - තාරක වික්‍රමසේකර

අනෝරා වැස්ස තොර තෝංචි-යක් නැතිව කඩා හැලෙන්නට විය. එකල වැස්සෙන් මං මාවත් පිරී නොගියද පහත් බිම් මෙන්ම ජන-තාව වැඩි වශයෙන් ගැවසෙන තැන් මඩගොඩවල් නිසා අපවිත්‍ර වී තිබුණි.

අව්ව වැස්ස නොබලා නිතර විහාරස්ථා-නයට පැමිණෙන එක් දායිකාවක් කැලණිය විහාරස්ථානයට පැමිණියාය. විහාරස්ථානයේ ජනතාව ගමන් කළ සෑම තැනකම පයක් තැබීමට නොහැකි ලෙසින් මඩ වී තිබුණි.

ඒ දෙස අවධානයෙන් බැලූ ඇයට පෙනුණේ දුරබැහැර ප්‍රදේශවලින් පැමිණ සිටි බැතිමතුන් පවා දැඩි අපහසුතාවකට පත්ව ඇති බවයි.

ඇය තීරණයක් ගත්තාය. විහාර බිමේ ගඩොල් ඇතිරිය යුතු යැයි සිතූ ඇය වහාම ඒ සඳහා කටයුතු කළාය.

අප මේ පැවසුවේ 1888 වසරේ කැලණි පුදබිමේ වූ සිදුවීමකි. ඒ කාන්තාව වෙන කිසිවකු නොව ඩී. ආර්. විජයවර්ධනයන්ගේ මව වන හෙලේනා විජයවර්ධනයි.

ඇය විහාර බිම ගඩොල් අතුරා ප්‍රතිසං-ස්කරණය කර පූජා කරන ලද්දේ තම කුඩා දරුවන්ද සහභාගි කරගෙනය. එවකට ඇයගේ තුන් වැනි දරුවා වූ ඩී.ආර්. විජය-වර්ධනයන්ගේ වයස අවුරුදු දෙකහමාරක් පමණි. හෙලේනා විජයවර්ධන සෑම විටම කැලණිය විහාරස්ථානයට පැමිණියේ ඩී.ආර්. විජයවර්ධන හා ඩී.සී. විජයවර්ධන පුතුන් දෙදෙනාද සමඟය.

කුඩා කල කැලණි විහාරය අමදියි

මව සමඟ විහාරයට පැමිණෙන ඩී. ආර්. විජයවර්ධනයන් ඉදලක් ගෙන පන්සල ඇම-දීමත් මල් ආසන පිරිසුදු කිරීමත් කළේ ඉතා ආශාවෙනි. දුර බැහැර ගම්වලින් පැමිණි බොදුනුවෝ මේ කුඩා දරුවාගේ ක්‍රියාව මහත් සේ අගය කළහ. කෙදිනක හෝ මේ දරුවා බෞද්ධ පුනරුදයට විශාල සේවාවක් කරනු ඇතැයි ඔවුන් පැවසුවේ ඔහු දානපති යුවළ-කගේ පුතකු බව දැන ගැනීමෙන් පසුවය.

නිරතුරුව කැලණිය රජමහා විහාරයේ අවශ්‍යතා ඉටු කළ හෙලේනා විජයවර්ධන 1902 වසරේ කිරිගරුඬ පූජාසනයක් කැලණිය විහාරස්ථානයට පූජාකිරීමද ඩී. ආර්. විජයව-ර්ධන හොඳින් මතක තබාගත් සිද්ධියකි. එවිට ඔහුගේ වයස අවුරුදු 16කි. මේ තරුණයාට කුඩා කල සිටම තම මවත් පියා වූ දොන් පිලිප් විජයවර්ධනයන් බුදු සසුනට කරන්නා වූ සේවය මැනවින් දක්නට ලැබුණි.

කැලණිය දුරුතු පෙරහර ආරම්භය

ඒ අතර ඩී. ආර්. විජයවර්ධන නීතිය හැදෑ-රීම පිණිස එංගලන්තයට ගොස් යළි මෙරටට පැමිණියේ 1912 වසරේදීය.

එහෙත් තමාගේ ආගම, ජාතිය, භාෂාව ආදී සියල්ල විජයවර්ධනයන්ට ඉතා හොඳින් මතක තිබුණි. එම නිසාම ඩී. ආර්. විජය-වර්ධනයන් හැම විටම පන්සල ඇසුරු කරග-නිමින් මවුපියන්ගේ අඩි පාරේ යන්නට විය.

1927 වසරේ කැලණිය දුරුතු පෙරහර ආරම්භ කරන ලද්දේ ඩී.ආර්. විජයවර්ධන-යන්ගේ මව විසින් වන අතර එහි සියලු වගකීම් කරට ගෙන කටයුතු කළේ ඩී.ආර්. විජයවර්ධන හා ඔහුගේ වැඩිමහල් සොහො-යුරු ඩී. සී. විජයවර්ධන විසිනි. දුරුතු පෙරහරේ නිර්මාතෘ නොවුණත් එහි සියලු මෙහෙයුම් කටයුතු සිදු කළ තැනැත්තා ලෙසින් ඩී. ආර්. විජයවර්ධන ගෞරවයට පාත්‍ර විය.

එම පෙරහර ආරම්භ කළ දිනම කැලණි රජමහා විහාරයේ නව විහාර ගෙයට මුල් ගල තබන ලද අතර එහි කටයුතුද සංවිධානය කිරීමේ වගකීම් කරට ගත්තේද විජයවර්ධන සොහොයුරන් විසිනි.

දරුවන් විසින් ලබා දුන් මේ ශක්තිය නිසා හෙලේනා විජයවර්ධනට තම බෞද්ධ කටයුතු සිතැඟි පරිදි කර ගන්නට හැකි-යාව ලැබුණු අතර ඇයට කැලණි විහාරයේ සිතුවම් අඳින්නට සිත් වූයේද දරුවන් විසින් ලබා දුන් සහයෝගය නිසාමය. ඒ වෙනු-වෙන් සෝලියස් මැන්දිස් ශිල්පියා තෝරා ගැනීමෙන් පසුව ඔහුට ඉන්දියාවේ අජන්තා ඇතුළු සිතුවම් නරඹන්නට යැවුවේද ඩී. ආර්. විජයවර්ධනයන්ගේ උපදෙස් අනුවය. අජන්තා ඇතුළු සිතුවම් නරඹා පැමිණීමෙන් පසුව මාස කිහිපයක් මල්වාන ප්‍රදේ-ශයේ විහාරස්ථානයක සිතුවම් නිර්මාණය කරන්නට සෝලියස් මැන්දිස්ට පැවරුවේ ඔහුගේ නිර්මාණ තව දුරටත් පරීක්ෂා කර බලන්නටය.

නව විහාර මන්දිරයක්

දින දෙක තුනකට වරක් මල්වානට ගොස් ඒවා පරීක්ෂා කරන්නට ඩී.ආර්. විජයවර්ධ-නයන් විසින් කටයුතු කරන ලදී. කැලණිය චිත්‍ර නිර්මාණය කිරීමට සෝලියස් මැන්දිස්ට පැවරුණේ එයින් සෑහීමකට පත්වූ පසුවය. කැලණිය විහාරයේ නඩත්තුවට තම මව විසින් කලා වැව ප්‍රදේශයේ අක්කර 250ක ඉඩමක් ලබා දුන් බව දැනගත් ඩී.ආර්. විජයවර්ධනයන් එහි ගොස් එහි අඩුපාඩු සොයා බැලුවේය. මව විසින් සිදු කරන්නා වූ කුමන හෝ බෞද්ධ වත්පිළිවෙත් හෝ ඩී.ආර්ගේ සහයෝගය ලැබුණි. තම පියාගේ ව්‍යාපාර කටයුතු තිබුණද ඒ ඔස්සේ ගොස් මුදල් උපයන්නට ඔහුට අවශ්‍ය නොවීය. ඔහු කළේ ධාර්මික ලෙසින් තම ශක්තියෙන් දිවි සරිකර ගැනීමකි. එයද සෑම විටම බුදු දහමට මුල්තැන ලබා දීමෙනි.

1941 වසරේ ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියට ගෙන ගිය අවස්ථාවේදී ඩී.ආර්. විජයවර්ධනයන් මහා සංඝරත්නය වෙනුවෙන් භික්ෂූ නේවාසිකාගාරයක් ස්ථාපිත කරන්නට කටයුතු කෙළේය.

අදටත් එහි දක්නට ඇති සංඝාරාමය එම ආරම්භය ලෙස දැක්විය හැකිය.

එමෙන්ම අධ්‍යාපනය ලබන සියලු භික්ෂූන් වහන්සේට අවශ්‍ය දානමාන පහසුකම්ද එහි ඇති කළේය. භික්ෂූන් වහ-න්සේට තම දැනුම වර්ධනය කර ගැනීම පිණිස පහසුකම් ඇති කිරීම ඔහුගේ අරමුණ විය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ බෞද්ධ උරුමය රැක ගන්නට ඔහු විසින් දිගින් දිගටම කටයුතු කළ අතර එහි විජයවර්ධන ශාලාව ස්ථාපිත කෙරුණේ ඔහුට කරන ගෞරවයක් ලෙසිනි.

එකල සේදවත්තේ පදිංචිව සිටි ඩී.ආර්. විජයවර්ධනයන් විසින් කැලණිය විහාර-යට අමතරව, සේදවත්ත විහාරයට, කොළඹ ගංගාරාමය, බම්බලපිටිය වජිරාරාමය ඇතුළු විහාරස්ථානවලට උපරිම ලෙසින් පහසුකම් ඇති කරන ලදී. විශේෂයෙන්ම ඔහු විසින් ඉතා වටිනා පර්චස් 37ක භූමි භාගයක් වජි-රාරාමයට පූජා කිරීම මෙහිලා අගය කළ යුතුමය.

එමෙන්ම ගංගාරාමයේ වැඩ වාසය කළ දෙවුන්දර ජිනරතන හා දෙවුන්දර වාචිස්සර නා හිමිවරුන්ගේ අවවාද හා උපදෙස් අනුව කටයුතු කරමින් ගංගාරාමයේත් කොළඹ නගරය ඇසුරු කරගෙන බෞද්ධ කටයුතු සිදු කරන්නටද කටයුතු කෙළේය.

විශේෂයෙන්ම විහාරය ගොඩ නැංවීම මෙන්ම පොහොය සීමාව සකස් කිරීම වැනි කටයුතු ඩී.ආර්. විජයවර්ධනයන් එදා සිදු කළ සේවාවන් අතර වේ.

එම අනුග්‍රහයෙන් නොනැවතුණු ඔහු ඇති හැකි අය හරහා බුදු දහමේ උන්නතියට හැකි උපරිම දායත්වයක් දැක්වූයේය.

මානෙල්වත්න බුදු සසුනට

ඔහුගේ ඥාතියකු වූ හිටපු ජනාධිපති ජේ.ආර් ජයවර්ධනයන්ගේ පරපුර සතු වූ අක්කර 36ක් පමණ වූ භූමි භාගයක් කැල-ණිය මානෙල්වත්ත දහම් දැනුම ලබා ගනු පිණිස බුදු සසුනට පූජා කරන්නට මුල්වූයේද ඩී. ආර්. විජයවර්ධනයන්ය.

මීට වසර කිහිපයකට පෙර නාගානන්ද විශ්වවිද්‍යාලය බිහිවූයේ එදා එම භූමිය පරි-ත්‍යාග කිරීමෙන් ඇතිවූ බොදු පුනරුදයේ ප්‍රතිඵලයක් මතය.

එංගලන්තයේ අධ්‍යාපනය ලද අවදියේදී ශ්‍රී ජවහල්ලාර් නේරු වැනි ශ්‍රීමතුන්ගේ ආභාස-යෙන් ලද පන්නරයෙන් ජාතිය ආගම ගැන ඇතිවුණු ජාතිමාමකත්වය නිසා මෙරට බ්‍රිතාන්‍ය යටත්විජිතයෙන් මුදාගැන්මේ සටනට ජනතාව දැනුම්වත් කිරීම වෙනුවෙන් මාධ්‍ය ආයතනයක් ආරම්භ කිරීමේ වගකීමද කරට ගත් ඔහු ලේක්හවුස් ආයතනය ආරම්භ කෙළේය. ආගමට දහමට ලැදි ජනතා-වක් ආගමානුකූලව තම අයිතිය ලබාගැනීමට මෙහෙයවීම එහි අරමුණ විය. විශේෂයෙන්ම බෞද්ධ සිරිත් විරිත්වලට මුල්තැනක් ලබා දී බෞද්ධ හැඟීම් උද්දීපනය වන ලෙසින් කට-යුතු කිරීම ඔහුගේ අරමුණ විය.

ඒ අනුව යමින් මාධ්‍ය හැසිර වූ ඔහු 'දිනමිණ' 'සිළුමිණ' ඇතුළු පුවත්පත් ආරම්භ කළේ එම පුවත්පත්වල නාමයන් පවා භික්ෂූන් වහන්සේගෙන් සකස් කරගෙන පුවත්පත්වලට යොදමිනි.

බුදුසරණ පුවත්පතේ ආරම්භය

විශේෂයෙන්ම බුදුසරණ පුවත්පත ඔහු ආරම්භ කෙළේ භික්ෂූන් වහන්සේට තම ලේඛන කලාව වැඩි දියුණු කර ගැනීම පිණි-සත් ජනතාවට බෞද්ධ පුවත්පතක අවශ්‍ය-තාව තිබුණු නිසාත්ය.

සිංහල මාධ්‍යයට අමතරව ඉංග්‍රීසි සහ දෙමළ පුවත්පත්ද ඔහු ආරම්භ කළේ බුදු දහ-මට අනුව සියලු දෙනාට සමව සැලකීමේ සහ තොරතුරු පුවත් දැන ගැනීමේ අවශ්‍යතාව මතය. කිසිවිටෙක අන්තවාදී ලෙස බුදු දහම ප්‍රවර්ධනයට කටයුතු නොකළ අතර සංහිඳි-යාව ඇති කිරීම ඔහුගේ පුවත්පත් ආරම්භයේ මූලික අරමුණ විය.

මහජනතාව සෑම විටම බොදු පිළිවෙත් අනුගමනය කරමින් සාරධර්ම අනුගමනය කරමින් කටයුතු කළ යුතු බවට දිනමිණ හා සිළුමිණ දැඩි අවධානයක් යොමු කරන ලදී. 1924. අප්‍රේල් මස 5 වැනිදා දිනමිණ පුවත්පතේ 'ගමරාලගේ' ලිපිය නමින් පළ වූ විශේෂාංගයේ එක් ඡේදයක් මෙහි ලා දක්වන්නේ එම ලිපිය එකල මෙරට පාල-නය කළ බ්‍රිතාන්‍ය ජාතිකයන් පවා ඇගැයීම් කර ඉංග්‍රීසි බසට පරිවර්තනය කර ආදර්ශයට ගෙන තිබූ හෙයිනි.

"සිංහල බස තුච්ඡ කොට පාගා දමා අනික් භාෂා වැලඳ ගනී නම් එයින් සිදුවිය හැකි හානි වඩාත් බලවත් ය. ස්වභාෂා පොත පත බැලීමත් අමුත්තන් සමඟ සිය බසින් කතා කිරීමත් ලජ්ජාවක් කොට සිතන්නා නියම සිංහලයෙක්දැයි වටහා ගත යුතුයි.

මවුපියන් නොතකන්නා හට මොන ජාති-යක්ද? සිංහල ජාතිය ශ්‍රේෂ්ඨ චාරිත්‍ර වාරිත්‍ර ආරක්ෂා කර ගනිමින් ජාතියක් වශයෙන් අභිවෘද්ධියට පැමිණෙන්නට සිංහල වර්ගයා කැමැති වේ නම් ස්වභාෂාව ඉගෙන, ඒ භාෂාව කෙරෙහි නිසි සම්මානය දැක්වී-මද ස්ථිර ලෙස අධිෂ්ඨාන කර ගත යුතු බව කියමිහ. "

ලේක්හවුස් ආයතනය ගොඩ නැංවීමේදීද එහි අභ්‍යන්තරය බෞද්ධ කලා ශිල්ප අනුව යමින් නිර්මාණය කරන්නට ඔහු කටයුතු කළේය. වෙසක් හා පොසොන් පොහොය දිනවලදී විශේෂ ආගමික පින්කම් රැසක් සිදු කළ ඔහුට අවශ්‍ය වූයේ එකල විදුලි එළිය නොමැතිව තිබූ බෞද්ධ විහාරස්ථාන කිහි-පයක් පොහෝ දිනට ආලෝකවත් කිරීමටය. එය ඔහුගේ ජීවිත කාලයේ සිදු කරන්නට ඔහුට හැකි නොවුණත් ඔහුගේ පුත් රංජිත් විජයවර්ධනයන් ලේක්හවුස් - මිහින්තලා ආලෝක පූජාව 1963 වසරේ ආරම්භ කරන ලද්දේ පියාගේ ඒ අඩි පාරේ යමින් ඔහුගේ අදහසක් මල් පල ගැන්වීමක් ලෙසිනි. පෙර පැවසූ පරිදි නුනුපිටිය ගංගාරාමය සංව-ර්ධනය කෙරෙහිද රංජිත් විජයවර්ධනයන් අවධානය යොමු කළේ පියා විසින් ගෙන තිබූ සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන යාමක් ලෙසිනි. එසේම ලේක්හවුස් ආයතනයේ සේවක සේවිකාවන්ට හා ඔවුන්ගේ දු දරු-වන්ට ශිෂ්‍යත්ව හා සුබසාධන කටයුතු සලස-මින් බුදු දහමට අනුව කටයුතු කළ යුතු බව ඔහු පෙන්වා දුන්නේය.

මිහින්තලාවට ආලෝකයක්

එය සිංහල ජාතික ආයතනයක් විසින් සේවක සුබසාධනය වෙනුවෙන් වැඩි අවධා-නයකින් කටයුතු කළ පළමු අවස්ථාව ලෙස දැක්විය හැකිය. කොළඹ දිස්ත්‍රික්කයේ පෙර-හරක් ආරම්භ කිරීමේ අපේක්ෂාවක් ඩී. ආර්. විජයවර්ධනයන්ට තිබුණු අතර එය ඔහුට ඉටු කළ නොහැකි වුවත් ගංගාරාමයේ නවම් පෙරහර ඔහු වෙනුවෙන් ඔහුගේ පුත් රංජිත් විජයවර්ධන ආරම්භ කළේය.

වර්තමානයේ ගංවතුර වැනි ස්වභාවික උවදු-රුවලින් විපතට පත් වන්නන්ට ආධාර උපකාර කරන්නට විවිධ ආයතන ප්‍රසිද්ධියේ කටයුතු කළත් ඩී. ආර්. විජයවර්ධන එදා කැලණි ගඟ පිටාර ගලා අසරණ වූවන්ට යළි තම නිවාස වෙත යෑමට අවශ්‍ය පහසුකම් සැලසුවේ කිසිදු ප්‍රසිද්ධියක් නොකරය. එය තවත් අයකුට ආද-ර්ශයක් ලෙස ගන්නට පමණක් ඔහු කටයුතු කළේය. වර්තමානයේ බෞද්ධ ප්‍රබෝධයේ මුල් හිමිකරු වශයෙන් කටයුතු කළ ඩී. ආර්. විජය-වර්ධනයන්ගේ බොහෝ සේවාවන් අප්‍රසිද්ධ බව අපට මෙයින් පැහැදිලිය.

බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය, බෞද්ධ සිද්ධස්ථාන ආලෝකවත් කිරීම, පෙරහර ආර-ම්භය, බෞද්ධ පුවත්පත් ආරම්භය, ස්වභාවික ව්‍යසනවලින් අසරණත්වයට පත්වන්නන්ට පිහිට වීම මෙන්ම ආයතන සේවකයන්ට සුබ-සාධන කටයුතු ආරම්භ කිරීම වැනි සාමාන්‍ය පුරවැසියකුට සිදු කළ නොහැකි සේවාවන් රැසක් ඩී.ආර්. විජයවර්ධනයන් අපට උරුම කර දුන් බව මේ අනුව පෙනේ.

ඔහුගේ නාමය සදා අමරණීය වන්නේ මේ සියල්ලේම නිහඬ නියමුවා ඔහු වන හෙයිනි.

ලේක්හවුස් ආයතනයට අසමසම ශක්තියක් වූ බෞද්ධ සංගමයට වසර 41යි

● සුරේකා නිල්මිණී ඉලංගකෝන්

ආගමික සහ සමාජ සත්කාර යනු ලේක්හවුස් ආයත-නයට ආගන්තුක ඒවා නොවේ. ලේක්හවුස් නිර්මාතෘ ඩී. ආර්. විජයවර්ධනයන්ගෙන් මෙරට බොදු පුනරුදයට ලැබුණු පූර්වාදර්ශය සහ දායකත්වය එතරම්ම විශිෂ්ට වූවකි. බෞද්ධාගම අතීතයේ සිටම ලේක්ห-වුස් ආයතනය විසින් මුඳුන්මල්කඩක් ලෙස සලකනු ලැබුවද ජාති, ආගම් භේදයකින් තොරව ආයතනයේ සමස්ත සේවක මණ්ඩලය තුළ ගොඩනැඟී ඇත්තේ අපූර්වතම ආගමික සංහිඳියා-වකි. එම පසුබිම ගොඩනැඟීම සඳහා ආයතනයේ බෞද්ධ සංගමය සිදු කළ සහ තවමත් සිදුකරමින් පවතින කාර්යභාරය ඉතා ප්‍රසංශනීයය.

ඉකුත් වසරේ පැවති ඩී.ආර්. විජයවර්ධනයන්ගේ ජන්ම දින සමරු පින්කමේදී ලේක්හවුස් සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව් දයාරත්නයන් ගරුතර සංඝරත්නයට දන් පිළිගන්වමින්...

සංගමයේ සමාරම්භක ලේකම් එවකට 'බුදුසරණ' පුවත්පතේ කර්තෘත්වය දැරූ ප්‍රේමසිරි අබේසිංහයන්

ඩී. ආර්. විජයවර්ධන ජන්ම දින සමරු පින්කමට දිගුකාලීනව සහාය දක්වන ලේක්හවුස් බෞද්ධ සංගමයේ ආරම්භය සනිටුහන් වන්නේ රණපාල බෝධිනාගො-ඩයන් සභාපතිත්වය දරන සමයේදීය. එනම්, 1980 වසරේ ජනවාරි 10 වැනිදාය. සංග-මයේ ආරම්භක ලේකම්වරයා වන්නේ එව-කට බුදුසරණ පුවත්පතේ කර්තෘත්වය දැරූ ප්‍රේමසිරි අබේසිංහයන්ය. සභාපතිත්වය ඩී.කේ. සෝමසිරි හිටපු අධ්‍යක්ෂවරයා විසින් දරනු ලැබීය.

ප්‍රකට මිහින්තලේ ආලෝක පූජාව පැවැ-ත්වීමට, වෙසක් උත්සවය නිමිත්තෙන් ලේක්හවුස් ආයතනය ඉදිරිපිට වෙසක් කුඩු තරගය, භක්ති ගීත තරගය පැවැත්වීමටත් ආරම්භයේ සිට මෑතක් වන තුරුම ලේක්ห-වුස් බෞද්ධ සංගමය විශාල දායකත්වයක් දක්වනු ලැබුවේ පාලනාධිකාරියේ මඟපෙ-න්වීම සහ පූර්ණ දායකත්වයෙනි. වෙසක් උත්සවය නිමිත්තෙන් ලේක්හවුස් ආයත-නය ඉදිරිපිට පැවැත්වෙන කොත්තමල්ලි දන්සල ආරම්භ කළේද බෞද්ධ සංගමයයි.

ආයතනයේ පාලනාධිකාරියේ මඟපෙ-න්වීම සහ පූර්ණ සහයෝගය ඇතිව එදා සිට මේ දක්වා ලේක්හවුස් බෞද්ධ සංගමය විසින් ඉටු කරන ආගමික හා සමාජ සත්කාර රැසකි. ඒ අතර ලේක්හවුස් බෞද්ධ සංගමය විසින් වාර්ෂිකව අඛණ්ඩව පවත්වනු ලබන වැඩසටහන් අතර සෑම වසරක් ආරම්භයේ-දීම ආයතනයටත් කාර්යමණ්ඩලයටත් සෙත් පතමින් සිදුකරන සෙත් පිරිත් සජ්ඣායනය සහ සම්බුද්ධාලෝක විහාරයට සිදුකරන දහවල් දානමය පින්කම සංවිධානය කරනු ලබන්නේ පාලනාධිකාරියේ උපදෙස් සහ අනුග්‍රාහකත්වය මැදය.

සෑම වසරකම පෙබරවාරි මාසය ලේක්හ-වුස් ආයතනයේ සමස්ත කාර්යමණ්ඩලයටම සුවිශේෂී වන්නේ ආදිකර්තෘ ඩී. ආර්. විජ-යවර්ධන ජන්ම දින සමරු පින්කම හේතු-වෙනි.

ඒ නිමිත්තෙන් සර්ව රාත්‍රික පිරිත් දේශ-නාමය පින්කමත්, පසුදා සාංඝික දානමය පින්කමත්, දහවල් දානමය පින්කමත් සංවි-ධානය කරනු ලබන්නේ බෞද්ධ සංගමය විසිනි. ඒ සඳහා පාලනාධිකාරියේ පූර්ණ මඟපෙන්වීම සහ දායකත්වය ඉහළින්ම ලැබීම එම කටයුතුවල සාර්ථකත්වයට විශේෂයෙන් ඉවහල් වේ.

වෙසක් සහ පොසොන් උත්සව වෙනු-වෙන් පැවැත්වෙන දානමය පින්කම් මෙන්ම ජූලි මාසයේදී ස්වාමින්වහන්සේලා සියක්න-මක් වෙනුවෙන් පැවැත්වෙන පිණ්ඩපාත දානමය පින්කමද ලේක්හවුස් බෞද්ධ සංග-මයට විශේෂිත වේ.

ඔක්තෝබර් මාසයේදී පැවැත්වෙන ලේක්හවුස් ආදිකර්තෘ ඩී.ආර්. විජයවර්ධන-යන්ගේ අනුස්මරණ පින්කම යටතේ ශිෂ්‍යා-ධාර වාර්ෂික වැඩසටහන සංවිධානය කරනු ලබන්නේද බෞද්ධ සංගමයයි. නොවැම්බර් මාසයේදී පැවැත්වෙන වාර්ෂික ලේ දන්දීමේ පින්කම සිදුවන්නේ ලේක්හවුස් කාර්යම-ණ්ඩල සාමාජිකයන්ගේ දායකත්වයෙනි.

ඉහත කී ආගමික වැඩසටහන්වලට අම-තරව සමාජ සහ ප්‍රජා සත්කාරද ලේක්හවුස් බෞද්ධ සංගමය මඟින් සිදු කෙරේ.

සෑම මසකම ධර්ම පත්‍රිකාවක් මුද්‍රණය කර බෙදා හැරීම, වෙහෙර විහාරස්ථාන ගොඩනැඟීම, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සිදුකෙරෙන ඉල්ලීම්වලට කාරක සභා අනු-මැතිය යටතේ මූල්‍යාධාර ලබාදීම, වසර කිහිපයකට වරක් ධර්ම ග්‍රන්ථයක් නොමිලේ ලබාදීම ආදී කටයුතු ඒ අතර වේ.

මහරගම පිළිකා රෝහලේ ළමා වාට්ටු හතරක් සඳහා රුපියල් ලක්ෂයකට අධික වටිනාකමකින් යුත් ඖෂධ සහ උපකරණ ලබාදීමද මෑත කාලයේ ලේක්හවුස් බෞද්ධ සංගමය මුල් වී සිදු කළ සමාජ සත්කාර-යකි.

ආයතනයේ සියලුම බෞද්ධ සේවක සේවිකාවන් බෞද්ධ සංගමයේ සාමාජික-ත්වය දරන අතර ආයතනය තුළ ප්‍රමාණා-ත්මකව විශාලම සංගමය වන්නේද මෙම සංගමයයි. සංගමයේ වත්මන් උප සභා-පති ලෙස රවීන්ද්‍ර විජයගුණවර්ධන කටයුතු කරයි.

වර්තමානයේ සංගමයේ ලේකම් ලෙස ප්‍රියන්ත කුමුදුසිරි, භාණ්ඩාගාරික ලෙස ප්‍රියන්ත විජේසූරිය කටයුතු කරයි. සංගමය විසින් සිදුකරනු ලබන සෑම සද් කාර්යයක් සඳහාම සභාපතිවරයා, අධ්‍යක්ෂමණ්ඩ-ලය ඇතුළු පාලනාධිකාරියෙන් ලැබෙන ආශීර්වාදය සහ මඟපෙන්වීමත් සමස්ත සාමාජිකයන්ගෙන් ලැබෙන සහයෝගයත් නිලධාරි මණ්ඩලය කෘතවේදීව සිහිපත් කරති.

කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කොමිසම් පත් කිරීම

මත ගැටෙන තැන

● සුභද්‍රා දේශප්‍රිය

'යහපාලන' රජය සමයේ වූ දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් සොයා බැලීමට වත්මන් ජනාධිපතිවරයා විසින් විශේෂ පරීක්ෂණ කොමිෂන් සභාවක් පසුගිය වසරේ ජනවාරි මාසයේදී පත් කරන ලදී. මේ කොමිෂන් සභාව විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු වන උපාලි අබේරත්නගේ සභාපතිත්වයෙන් යුක්ත වූ අතර එහි නිර්දේශ වාර්තාව පිටු 2,043කින් සමන්විත විය. එය පසුගිය දෙසැම්බර් මස 8 වැනිදා ජනාධිපතිවරයා වෙත බාර දෙන ලදී.

කොමිෂන් සභාවට අගතියට පත් පාර්ශ්වයන් විසින් සිදු කළ පැමිණිලි ගණන 1,971 කි. මෙම වාර්තාවේ දැක්වෙන්නේ පුද්ගලයන් 22 දෙදෙනෙකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දිවුරුම් සහ ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් පොදු දේපොළ අවභාවිත කර තිබෙන බවයි. දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහාද ජනාධිපතිවරයා විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් පත් කර ඇත.

මේ නව කොමිෂන් සභාව පත් කරනු ලැබ ඇත්තේ නැවත පරීක්ෂණයක් පැවැත්වීම සඳහා යැයි ඇතැමුන්ගේ අදහස වන නමුත් මෙහිදී සිදුවන්නේ පෙර කොමිෂන් සභාවේ නිර්දේශිත කරුණු සංක්ෂිප්ත කර එකී කරුණු ක්‍රියාත්මක කිරීමට සලකා බැලීමකි. රජයේ සේවකයන්ගේ රැකියා අහිමිවීම් අලාභ හානි පිළිබඳව කුමන ක්‍රියාපටිපාටියක් සැකසිය යුතුද? විනය පරීක්ෂණ කටයුතුවලින් අනතුරුව ගත යුතු පියවර සඳහා වූ ක්‍රමවේදයන් මොනවාද යන්න විමසා බැලීම මෙහිදී සිදු කෙරෙයි.

කෙසේ වෙතත් දේශපාලන පළිගැනීම් කොමිෂන් සභාවේ වාර්තාවට අනුව ආණ්ඩු ක්‍රමව්‍යවස්ථාවට පටහැනිව පිහිටුවාගත් ජාතික විධායක සභාව, දූෂණ මර්දන කොමිසම වැනි දේශපාලන ආයතන විසින් පැමිණිලිකරුවන් ගෙන් සෘජුව හෝ වක්‍රව දේශපාලනික වශයෙන් පළිගැනීමට ලක් කර ඇති බව ජනාධිපතිවරයා විසින් නිකුත් කළ ගැසට් නිවේදනයක සඳහන් වේ.

මාස තුනක කාලයක් තුළ විමර්ශන සිදු කර අවශ්‍ය නිගමනයන් හා නිර්දේශ අනුව අසාධාරණයන්ට ලක් වූ පිරිසට සාධාරණයන් ඉටුකිරීමත් දේශපාලන පළිගැනීම් අනුව සේවයෙන් පහ කරන ලද පුද්ගලයන් නැවත සේවයේ පිහිටුවීමට අදාළ කරුණු සලකා බැලීමක් ද මෙහිදී සිදුවෙයි. ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පත් කළ විශේෂ පරීක්ෂණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් නීති විශාරදයෝ විවිධ මත පළ කරති.

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික ගැටලු තියෙනවා

අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක ජනාධිපති නීතීඥ යූ. ආර්. ද සිල්වා

නව විශේෂ කොමිෂන් සභාව පත් කර ඇත්තේ නැවත වරක් පරීක්ෂණයක් පවත්වන්න නොවෙයි. මෙහිදී සිදුවන්නේ කලින් කොමිෂන් සභාවේ නිර්දේශිත කරුණු සංක්ෂිප්ත කරලා එකී කරුණු ක්‍රියාත්මක කළ යුතුයි ද කියලා සලකා බැලීමයි. නැවත දෙපාර්ශ්වය කැඳවලා පරීක්ෂණයක් පවත්වා අභියාචනයක් පැවැත්වීම නොවෙයි. නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික ගැටලුත් තියනවා. නීතිමය ගැටලු තියෙනවා නම් ඒ පිළිබඳව සොයා බැලීමටයි නව කොමිෂන් සභාව පත් කරලා තියෙන්නේ.

මේ අවස්ථාවේදී කොමිෂන් සභාව පත් කරනු ලැබුවේ ජනාධිපතිවරයාට තීරණ ගැනීම පහසු කරගැනීමට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීමටයි.

ඒ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නීතිපතිතුමාට දැනුම් දීමක් කරන්නට අවශ්‍යයි.

නීතිපතිවරයා ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ කෙසේද කියලා බැලිය යුතුයි. ඒ අනුව මෙහි සඳහන් ඇතැම් කරුණු අනුව සමහර අවස්ථාවලදී ඉහළ අධිකරණවලින් නිර්දේශයක් ලැබිය යුතුද නැතිද යන්න සම්බන්ධයෙන් සලකා බැලිය යුතුයි.

රජයේ සේවකයන් ගේ රැකියා අහිමිවීම් අලාභ හානි පිළිබඳව කුමන ක්‍රියාපටිපාටියක් සැකසිය යුතුද විනය පරීක්ෂණ කටයුතුවලින් අනතුරුව යම් යම් පියවර ගන්නා වූ ක්‍රමවේදයන් මෙහිදී සිදු කෙරෙනවා.

මේ ක්‍රියාපාටිය අනුව මෙහිදි නිර්දේශ කරනවා සේවය නැවත පිහිටුවීම වන්දි ලබා දීම ප්‍රායෝගිකව කළ හැකිද කළ නොහැකිද නීතිමය වශයෙන් කරන්නට ඕන.

පෙර කොමිෂන් වාර්තාව විශාල වාර්තාවක් නිසා නිර්දේශ ඉදිරිපත් කිරීමක් මේ නව කොමිෂන් සභාවේදී බලාපොරොත්තු වන්නේ.

තනි මතයක් අනුව කරනවාට වඩා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකු සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරයෙක් පත් කර තියෙන්නේ. ඒ අයගේ අදහස් ලබා ගැනීම සඳහා සිදුවන්නේ මේ කාරණා අනුවයි.

කොමිෂන් සභාවකට පුළුවන් නිර්දේශ ඉදිරිපත් කරන්න පමණයි

නීතිය පිළිබඳ මහාචාර්ය දීපිකා උඩගම

පත් කරන ලද දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිසන් සභාවේ ඇතැම් නඩු දැනට පවත්වා ගෙන යනවා. කොමිෂම විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ බොහොමයක් තියෙනවා, ඒවා අවසන් කළ යුතුයි. මෙතැනදි ඇති ප්‍රශ්නය ජනාධිපති කොමිෂන් සභාවකට පුළුවන් තොරතුරු ගවේෂණය කරලා යම් කිසි දෙයක තොරතුරු විමර්ශනය කරමින් නිර්දේශ නිකුත් කිරීමයි. අධිකරණය ඉදිරියේ නඩු ගැන එවැනි නිර්දේශ කිරීම ප්‍රශ්නයක්. නීතියට අනුව තීන්දු ගන්නේ අධිකරණය විසින්. අධිකරණය විසින් තීරණය කළ යුතුයි නඩු පවත්වාගෙන යනවා ද නැද්ද? සාක්ෂි ප්‍රමාණවත් ද නැද්ද? යන කාරණාව. නීතිපති දෙපාර්තමේන්තු කරුණු විමසමින් නඩු පවරා තියෙන්නේ.

ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය යන ආයතන තුනෙන් ප්‍රධානතම ආයතනයක් තමයි අධිකරණය ඒ ප්‍රබලතම ආයතනය තුළින් ජනතා බලය යොදා ගනිමින් යුක්තිය පසිඳලීම කරනුයේ අධිකරණය විසින්.

නීතිපති දෙපාර්තමේන්තුව නඩු ඉල්ලා අස්කර ගැනීමට ඉල්ලීම් කළත් ඒ පිළිබඳව තීන්දු ගනු ලබන්නේ අධිකරණය විසින්. අධිකරණයේ ස්වාධීනත්වය ගරුත්වය රැකෙන ලෙසින් කවුරුත් කටයුතු කළ යුතුයි. අධිකරණයේ කාර්යයභාරය රටේ පවතින නීතිය අනුව විභාග කරලා බලලා සාධාරණ සැකයකින් තොරව ඔප්පු කරන්න සාක්ෂි තියෙනවාද නැද්ද යන කාරණාව තීන්දු කරන්න ඕන. එවැනි දේ ජනාධිපති කොමිසන් සභා විසින් නිර්දේශ කරනවා නම් එය අධිකරණයේ ස්වාධීනත්වයට සහ අධිකරණයේ බලතලවලට කරනු ලබන හානියක්.

විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමට ගන්නා උත්සාහයක්

නීතීඥ අජිත් පී. පෙරේරා

මේ කොමිෂන් සභාවේ නිර්දේශවල වගඋත්තරකරුවන් ලෙස නම් සඳහන් විපක්ෂයේ දේශපාලඥයන්ගේ ප්‍රජා අයිතිය අහිමි කිරීමටයි මෙවැනි ජනාධිපති කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා පත් කර තියෙන්නේ . මෙවැනි කොමිෂන් සභාවක් හරහා පාර්ලිමේන්තුවේ බහුතරයක් අනුමත කිරීමෙන් චෝදනාවලට ලක් වී ඇති දේශපාලඥයන්ගේ ප්‍රජා අයිතිය වසර හතකට අහෝසි කිරීමේ අයතිය තියෙනවා. එහිදි යම් තැනැත්තෙක් වරදක් කර තියෙනවා නම් රටේ සාමාන්‍ය නීතිය අනුව නීතිපතිවරයා විසින් ඔවුන්ට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අධිකරණයේ නඩුපවරා දඬුවම් පැමිණවිය හැකියි. එයයි නීත්‍යානුකූල ශීලාචාර ක්‍රමවේදය. නමුත් මෙතැනදි ජනාධිපතිවරයා විසින් පත් කරන ලද විනිශ්චයකාරවරුන් භාවිත කර ඒ විනිශ්චයකාරවරයාගෙන් තීන්දු ලබාගත් පසුව පාර්ලිමේන්තුවේ බහුතරය ලබා ගෙන විපක්ෂයේ ප්‍රධාන මන්ත්‍රීවරුන්ගේ සහ ක්‍රියාකාරිකයන්ගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමටයි උත්සාහ කරන්නේ. නීතිපති දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අධිනීතිඥවරුන් කිහිප දෙනෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමටයි මේ උත්සාහ කරන්නේ. අලුතින් පත් කර ඇති කොමිෂමේ අරමුණත් එයයි.

නැවත කොමිෂන් සභාවක් පත්කිරීම ජනාධිපති බලතල අභියෝගයකට ලක් කිරීමක්

මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු කොමසාරිස් රමණී මුරුත්තෙට්ටුවේගම

හැම රජයක්ම පත් වුණාම දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් කොමිෂන් සභා පත් කරනවා. මෙහි නිර්දේශ හැට දෙකක් තියෙනවා. එහිදී නිර්දේශ ඉතාමත් ප්‍රවේශමෙන් ඉතාමත් පැහැදිලිව ලියලා තියෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය නම් ඒවා ක්‍රියාත්මක කරන ආයතන තියෙනවා. ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව වැනි ආයතනත් තිබෙනවා. මෙහි ඇතැම් නිර්දේශ දැනට පවත්වා ගෙන යන නඩු පිළිබඳවයි. ඒවා ක්‍රියාත්මක කරවන්නේ කොහොමද කියලා දෙවැනි කොමිෂන් සභාවකින් බලන්න බැහැ. ඒ තීන්දුවත් එක සාක්ෂියක් පමණයි.

එක කොමිෂන් සභාවක් කරපු නිර්දේශ කිරීමට තවත් කොමිෂන් සභාවක් පත් කිරීමක් කියන්නේ මොකක්ද? එය ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවක් නිර්දේශ දුන්නාම තවත් කොමිෂන් සභාවක් අවශ්‍ය නැහැ. ජනාධිපතිවරයාට ව්‍යස්ථාවෙන් ඇති විශේෂ බලතල අනුවයි කොමිෂන් සභා පත්කරන්නේ. කලින් කොමිෂන් සභාවේ නිර්දේශ හරිද වැරදිද කියලා දෙවැනි පාරත් බලනවා නම් කවදද මේවා ක්‍රියාත්මක වෙන්නේ. මේ නිර්දේශ හැම එකකම කියලා තියෙනවා; නීතිපති දෙපාර්තමේන්තුව පොලිස් දෙපාර්තමේන්තුව කළ යුතු දේ.

අදාළ වන ආකාරය අනුව තැනැත්තන්ගේ පත්වීම් වන්දි ගෙවීම් පිළිබඳව පැහැදිලි කර තියෙනවා. ඒ වගේම පොලිස්පතිගේ අවධානය යොමු කරන්න කියලා ඉතා පැහැදිලිව තියෙනවා. ඒ ඒ ආයතනවල නිලධාරින්ට වගකීම් ලබාදී ආයතනවල නිර්දේශ ක්‍රියාත්මක කළ හැකියි. දෙවැනි කොමිෂන් සභා පත් කිරීම කොමිෂන් සභා පද්ධතියටම එතරම් හොඳ නැහැ. නැවත කොමිෂන් සභාවක් පත්කිරීම ජනාධිපතිවරයාගේ බලතල අභියෝගයකට ලක් කිරීමක්.

මොන ආණ්ඩුව වුණත් නීතිය අවභාවිත කිරීම අනුමත කරන්න බැහැ

සංවර්ධනය පිළිබඳව නීතීවේදීන්ගේ සංවිධානයේ විධායක අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ නීතීඥ කල්‍යාණන්ද තිරාණගම

යම් රජයක් යටතේ දේශපාලන පළිගැනීම් සිදුවී ඇතිද යන්න සොයා බලා කටයුතු කිරීමට කොමිසමක් පත් කිරීම වරදක් නැහැ. වැරදි සිදුවී ඇති නම් සිදුවී ඇත්තේ කිනම් වරදක්ද ඒ අනුව ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග මොනවාද කියලා සලකා බැලීම ඉතා වැදගත්. මේ පත් කර ඇති සාමාජිකයන් විනිසුරුවන් නිසා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ නෛතික පදනම ඒ අය සතු යි. ඒ අයට අපරාධ නඩු පිළිබඳව හොඳ අවබෝධයක් තියනවා.

නඩුවක් සාධාරණව ඔප්පු කිරීමේදී සාක්ෂි ඇති නම් චෝදනාවක් ඉදිරිපත් කිරීමට හැකියාව පවතිනවා. එහෙම දෙයක් සොයා බැලීමේ වරදක් නැහැ. නීතිය අයුතු විදිහට පාවිච්චි කරපු කෙනෙකුට දඬුවම් කළ යුතුයි.

කොයි ආණ්ඩුවක් යටතේ වුවත් නීතිය අවභාවිත කිරීම වැරදියි. මෙහිදී පත් කළ පළමු කොමිෂමෙන් සාක්ෂි විභාගයක් සිදු කළා. ඒ අය විමර්ශනය කරන ලද කරුණු සම්පිණ්ඩනයක් දෙවැනි විශේෂ විමර්ශන කොමිෂන් සභාවෙන් සිදු වුණේ.

එහිදී ගන්නා නිගමන සාධාරණද නැති ද යන්න සොයා බැලීමක් කළාට කමක් නැහැ. රාජ්‍ය මුදල් අවභාවිත වෙලා තියනවාද හිතා මතා පදනම් විරහිතව පළිගැනීම් සඳහා රාජ්‍ය යාන්ත්‍රණය පාවිච්චි කරලා තියනවාද කියලා සොයා බැලීමක් කළාට කමක් නැහැ.

ජනපතිට නීතියෙන් ඇති විධායක බලතල ක්‍රියාත්මක කළ හැකියි

ජ්‍යෙෂ්ඨ නීතීඥ නිමල් ආර්. රණවක.

සාමාන්‍යයෙන් කරුණු සොයා බැලීම සඳහා කොමිෂන් සභාවක් පත් කිරීමෙන් අනතුරුව එම කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ කොමිෂන් සභාවක් පත්කිරීම විශේෂ තත්ත්වයක් යටතේ කරන්න පුළුවන්. මෙවැනි කොමිෂන් පත් කරන්නේ වැරදි සොයා බැලීමටයි.

සාමාන්‍ය උසාවියකින් පරිබාහිරව සොයා බැලිය යුතු මට්ටමක යම් සිදුවීමක් හෝ සිද්ධිදාමයක් පවතින්නේ නම් ජනාධිපතිවරයාට පුළුවන් එතුමාගේ බලතල අනුව කොමිෂන් සභාවක් පත් කරන්න යම් කොන්දේසි සහිතව. එම කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නිර්දේශ අනුව ඉදිරි කටයුතු කළ හැකියි.

පළමුව පත් කරන ලද කොමිසම විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරිමටයි දෙවැන්න පත් කරන්නේ.

මෙවැනි කොමිෂන් සභාවක් පත් කරන්නට පුළුවන් ජනාධිපතිවරයාට පමණයි. එවැනි කොමිෂන් ඉතිහාසයේත් පත් කර තියෙනවා. රටේ අධිකරණය නොවෙයි ජනාධිපති කොමිෂන් කියන්නේ. මෙවැනි කොමිෂන් 1971 කැරැල්ල අවස්ථාවේ දි ඒ පිළිබඳව සොයා බලන්නත් පත් කරනු ලැබුවා.

කරුණු පිළිබඳ වඩා පුළුල්ව සොයා බලන්නට කොමිසමට බලය ලැබෙනවා. අධිකරණයට විභාග කරන්න පුළුවන් කරුණු කාරණා තියනවා.

සියල්ල බලතල අනුවයි ක්‍රියාත්මක වන්නේ. පවතින අධිකරණයන්ට වඩා පුළුල් බලතල සහිත විශේෂ බලයන් සහිත ආයතනයක් අවශ්‍ය නම් ජනාධිපතිවරයාට බලතල තියනවා එවැන්නක් පවා පත් කිරීමට.

ක්‍රියාදාමය පැහැදිලි නැහැ

හිටපු අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතීඥ ශ්‍රීනාත් පෙරේරා

කොමිෂන් සභා පත්කිරීමට රජයකට අයිතිය තියනවා. මේ කරන්නේ ඊට වඩා වෙනස් දෙයක්. පනත යටතේ කොමිසමක් පත් කරලා දවස් තුන්සියයක් සාක්ෂි අහලා කැකිල්ලේ තීන්දු වගේ තීන්දු දීලා ඒක මත ජනාධිපති කොමිෂන් සභාවක් නැවත පත් කරනවා. යම් කිසි පුද්ගලයකුට හෝ පුද්ගලයන් පිරිසකට දේශපාලන පළිගැනීම් සිදු වුවහොත් ඒ ගැන හොයලා බලලා දිය යුතු සහනයක් දෙනවාට අපි කවුරුත් විරුද්ධ නැහැ.

එසේ නම් කළ යුතුව තිබුණේ විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් පත් කිරීමටයි. එසේ කරන්නේ නැතුව පරීක්ෂණ කොමිසමක් පත් කර තියෙනවා. එයින් නිර්දේශ අරගෙන නැවත විශේෂ ජනාධිපති විමර්ශන කොමිසමක් පත් කර තියෙනවා. කරන්න හදන්නේ කුමක්ද යන කාරණාව පැහැදිලි නැහැ. මේ පරීක්ෂණ සභාවේ දැක්කහම පුදුම හිතෙනවා. ලංකාවේ පිළිගත්ත මූලධර්මයක් තියනවා ස්වභාවික යුක්තිය මූල ධර්ම කියලා. මේ නීතිය යටතේ කෙනෙකුට විරුද්ධව නිගමනයකට එන්න නම් ඒ මනුස්සයා දැනගන්න ඕන ඒ කෙනා කරපු වරද කුමක්ද කියා. ඒ වගේම නිදහසට කරුණු කියන්න ඉඩ තියන්න ඕන.

හරි වහර

● ශ්‍රීනාත් ගණේවත්ත

ගිය වර පළ වූ හරි වහර කියැවූ කිහිප දෙනෙක් අක්ෂර පිළිබඳව එහි නොදැක්වූ ප්‍රභේද ද විස්තර කොට දැක්වුව හොත් මැනැවැ යි දැන්වූ හ. එහෙයින් පළමුව ඒ අක්ෂර ප්‍රභේද විමසා බලමු.

ගිය වර ලිපියේ දැක්වුණේ අක්ෂර උත්පත්ති ස්ථාන අනුව කණ්ඨජ, තාලුජ, මූර්ධජ, දන්තජ, ඕෂ්ඨජ, ඖෂ්ඨජ යන නම් ද යට කී අක්ෂර ප්‍රභේද හඳුන්වනු පිණිස පිළිවෙළින් යෙදේ.

අක්ෂර උච්චාරණය කරනු ලබන ආකාරය හෙවත් අක්ෂරයෙන් ඇති වන හඬ (නාදය) අනුව ප්‍රභේද කොට දැක්වෙති යි කියන ලදි. එය දැන් විමැසුමට ලක් කරමු.

වර්ගාක්ෂර

සිංහල හෝඩියේ වර්ගාක්ෂර නමින් හැඳින්වෙන අකුරු විසිපහක් වේ. ඒ 'ක' සිට 'ම' තෙක් ඇති අකුරු විසිපහයි. ඒ එසේ හැඳින්වෙන්නේ අකුරු පහ බැගින් වර්ග පහකට බෙදා ඇති බැවිනි ඒ

ක ඛ ග ඝ ඞ
ච ඡ ජ ඣ ඤ
ට ඨ ඩ ඪ ණ
ත ථ ද ධ න
ප ඵ බ භ ම

ඒ එක් එක් වර්ගය, එහි මුල් අකුර අනුව ත, ච, ට, ත, ප යනුවෙන් හැඳින්වේ. මේ එක් එක් වර්ගයේ මුල් අකුර, එනම් යට කී ත, ච, ට, ත, ප යන අකුරු අල්පප්‍රාණ, අඝෝෂ නම් වේ. අල්පප්‍රාණ නම් වනුයේ අල්ප (මඳ) ශ්වාසයෙන් හෙවත් සාමාන්‍ය ලෙස හුස්ම ගෙන, ආයාසයෙකින් තොරව උච්චාරණය කරන බැවිනි. අඝෝෂ නම් වනුයේ එකී අකුරු කියැවීමේ දී - උච්චාරණයේ දී - උගුරෙහි නිනාදයත් - දෝංකාරය බඳු රාවයත් - ඇති නොවන හෙයිනි.

වර්ග පසෙහි ඊළඟ අකුරු පෙළ වන ච, ඡ, ඨ, ථ, ඵ යන අකුරු හැඳින්වෙන්නේ මහාප්‍රාණ, අඝෝෂ යනුවෙනි.

ඒ උච්චාරණය මහා ශ්වාසයෙන්, තදින් හුස්ම ගෙන, ආයාසයෙන් කළ යුතු බැවින් ද පෙර කී අකුරු මෙන් උගුරෙහි නිනාදයන් ඇති නොවන සේ උච්චාරණය කරන බැවින් ද වේ.

ඉන්පසු එන අකුරු පෙළ වන ග, ජ, ඩ, ද, බ යන අකුරු පහ අල්පප්‍රාණ ඝෝෂ නම් වේ. අල්ප ශ්වාසයෙන්, මඳ හුස්මෙන් උච්චාරණය කරන නමුදු උගුරෙහි නිනාදයත්, ඝෝෂයත් ඇති වන බැවිනි.

ඊළඟට එන ඝ, ඣ, ඪ, ධ, භ යන අකුරු හඳුන්වන්නේ ඝෝෂ මහාප්‍රාණ යන නමිනි. මෙතෙක් දැක්වූ කරුණු අනුව සිතුහොත් එසේ හැඳින්වෙන්නේ කවර හෙයින් ද යනු ඉතා පහසුවෙන් වටහාගත හැකි වනු ඇත.

වර්ගාක්ෂරවල අවසන් පෙළට එන්නේ ඞ, ඤ, ණ, න, ම යන අකුරු පස යි. මේ අකුරු උච්චාරණය කිරීමේ දී නාසය ඔස්සේ හඬ නිකුත් වන බැවින් නාසික්‍ය යනුවෙන් හැඳින්වේ.

අන්තඃස්ථ

වර්ගාක්ෂරවල ප්‍රභේද දන්නා බැවින් දැන් ඉන් පසු ඇති අකුරු විමසා බලමු. මුලින්ම එන්නේ ය, ර, ල, ව යන අකුරු සතර යි. මේ හැඳින්වෙන්නේ අන්තඃස්ථ යන නමිනි. අන්තස්ථා යන්න ද යෙදේ. ස්වර - ව්‍යඤ්ජන වශයෙන් අකුරු බෙදෙන බව අපි දනිමු. ඒ ස්වරවල ස්වභාවයත් ව්‍යඤ්ජනවල ස්වභාවයත් දෙක ම ඇතැයි යන අර්ථයෙනි, මේ අකුරු අන්තඃස්ථ නම් වන්නේ. එසේ සලකන කල, බොහෝ විට හෝඩියෙහි අග ම අකුර හැටියට යොදන (මූර්ධජ) 'ළ' යන්න ද මේ අන්ත:ස්ථ අකුරුවලට ම අයත් හෙයින් එය ද මෙ තන්හි ම (ර අකුරට පසුව) යෙදිය යුතුය.

ඌෂ්ම

අන්තඃස්ථාක්ෂරවලින් පසුව එන්නේ ශ, ෂ, ස, හ, ළ යන පස් අකුරුයි. එයින් 'ළ' ගැන කලින් කියන ලදි. අනෙක් අකුරු සතර හඳුන්වන්නේ 'ඌෂ්ම' යන නමිනි. එසේ හඳුන්වන්නේ එ අකුරු කියැවීමේ දී, උච්චාරණයේ දී මුවින් උණුසුම් වායුව නිකුත් වන බැවිනි. මේ අකුරු හැඳින්වීමේ දී ඒ උපන් තැන අනුව, (තාලුජ) ශ, (මූර්ධජ) ෂ, (දන්තජ) ස යැයි යොදනු ලැබේ. ඇතැමුන් කරන පරිදි 'ශ යනු ශ', 'ප යනු ෂ' ආදී වශයෙන් හැඳින්වීම සුදුසු නොවේ.

සිංහල හෝඩියට අයත් නොවන, ඉංගිරිසියේ 'F' අක්ෂරයේ ශබ්දය දැක්වීම සඳහා දැන් ඇතැමුන් යොදන 'ෆ' යනු ද ඌෂ්ම අක්ෂරයෙකි.

ව්‍යඤ්ජන ලෙස සැලැකිය යුතු තව ද අක්ෂර දෙකක් හෝඩියෙහි වේ. ඒ ං, ඃ යන දෙක යි. ඉන් පළමු වැන්න බින්දුව, අනුස්වාරය යන නම්වලින් ද දෙවැන්න විසර්ගය, විසර්ජනීයය යන නම්වලින් ද හැඳින්වේ. මේ අක්ෂර අනෙක් ව්‍යඤ්ජන මෙන් ස්වර හා එක් නොවේ.

සඤ්ඤක

මෙහි කලින් දක්වන ලද අල්පප්‍රාණ ඝෝෂ අක්ෂර නාසික්‍ය කොට කියැවීමෙන් උපදින සඤ්ඤක නම් අක්ෂර පහක් ද වේ. දැන් ඇතැම්හු මේ අක්ෂර ද හෝඩියට එක්කොට තබති. ඒ සඤ්ඤක අක්ෂර නම් ඟ, ඡ ඬ, ඳ, ඹ යන පස යි. ඝෝෂ අල්පප්‍රාණ අක්ෂර රූපයට ම සඤ්ඤකය නමින් හඳුන්වන ලකුණ එක් කිරීමෙන් මේ අක්ෂර රූප නිපැදැ වී ඇති බව පෙනේ. මේ ලකුණ නිසා රැවැටීමෙන් දෝ බොහෝ දෙන (මූර්ධජ) 'ළ' ද 'සඤ්ඤක ළ' නමින් හඳුන්වති. ඒ බරපතළ වරදෙකි.

මෙහි යට දැක්වුණු සඤ්ඤක අක්ෂර අතුරින් ඡ යන අක්ෂරය වර්තමාන ව්‍යවහාරයෙහි යෙදෙන්නේ ඉතා ම කලාතුරකිනි. මේ සඤ්ඤක අක්ෂරයකට පෙර කිසිම විටෙක නාසික්‍ය අකුරක් හල් නො යෙදේ. එනම් ඹ, ඤ, ණ, න්, ම් යන අකුරක් යෙදේ. බින්දුව ද නො යෙදේ. මේ විශේෂයෙන් සැලකිල්ල යොමු කළ යුතු කරුණෙකි.

ගිය වර විමසා බැලුණේ 'අක්ෂර' යන්නෙහි නිවැරැදි ස්වරූපයයි. ඒ අක්ෂර යන්න තවත් වදන් හා එක්ව යෙදෙන හැටි දැන් විමසා බලමු.

අක්ෂරාභ්‍යාසය යන්න එබඳු වදනෙකි. අක්ෂර + අභ්‍යාස යන වදන් දෙක එක්ව එවදන තැනේ. අකුරු පුහුණුව යන්න එහි අරුතයි.

අක්ෂරෝද්ග්‍රහණය යනු තවත් මෙබඳු වදනෙකි. අක්ෂර + උද්ග්‍රහණ යන දෙක එක්ව එය තැනේ. මෙහි උද්ග්‍රහණ නම් ඉගැනීමයි. අකුරු ඉගැනීම යන්න මෙයින් කියැවේ.

අක්ෂරෝත්පත්ති යන්න තැනෙනුයේ අක්ෂර + උත්පත්ති යන දෙ වදන එක් වීමෙනි. අකුරු ඉපැදීම, ඇති වීම යනු එහි අරුතයි. අක්ෂරෝත්පතිති ස්ථාන අපි කලින් විමසා බැලුවමු.

අක්ෂරෝච්චාරණ යනු අකුරු ඉසිරැවීම හෙවත් කියැවීමයි. අක්ෂර + උච්චාරණ යනු එක් වීමෙන් එ වදන තැනේ.



ශ්‍රී ලංකා සංඥා බළකායේ විරුවන් අවදි කළ SILENT HEROES

අවසන් මානුෂීය සටන පැවැති නන්දිකඩාල්හි වඩ්ඩුවාකල්හි දිය පැන්නුමේ ගමන් ගත් මේ හමුදා ට්‍රක්රථයේ ඇති නවීන තාක්ෂණික ජැමර් යන්ත්‍රය අවසන් සටනේ ජය ගැන්මට ඉටු කළ කාර්යභාරය සුළු නොවේ.

● තාරක වික්‍රමසේකර

චිත්‍රපටයක එහෙමත් නැත්නම් ටෙලිනාටකයක අපට පෙනෙන්නේ එහි නළු නිළියන් පමණි. එහෙත් එහි තිරය පිටුපස සිට විශාල සේවාවක් සිදුකරන්නා වූ තවත් පිරිසක් සිටිති. අප මේ කියන්නට යන්නේ තිරය පිටුපස සිටිමින් රට රැක ගැන්මට එවන් විශාල මෙහෙවරක් සිදු කළ අපේ විරුවන්ගේ කතාවකි.

කණ්ඩායමක් ලෙසින් සැදුම්ලත් පිරිසකගේ ඕනෑම කාර්යයකදී සාමූහිකව අදාළ කාර්යය නිසි පරිදි සිදු කරන්නට නම් නිසි පණිවිඩයක් නැත්නම් නිසි සංඥාවක් ලබා දිය යුතුමය. ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවේ ඒ කාර්ය බාර වී ඇත්තේ ශ්‍රී ලංකා සංඥා බළකායටයි.

සංඥා බළකායේ ඉතිහාසය නිදහසට පෙර යුගය දක්වාම දිව යයි. 1943 ඔක්තෝබර් මස 19 වැනිදා ලංකා ආරක්ෂක හමුදාවේ එක් කොටසක් ලෙසින් අරඹන ලද ශ්‍රී ලංකා සංඥා බළකාය 1949 ඔක්තෝබර් 10 වැනිදා යුද හමුදාව පිහිටුවීමත් සමඟ යුද හමුදාවේ වෙනම ඒකකයක් බවට පත් විය. ශ්‍රී ලංකා සංඥා බළකාය යන නාමය එයට හිමි වූයේ 1972 වසරේදීය.

අප පෙර පැවසුවාක් මෙන් යුද බිමේත් අප රටේ බොහෝ කාර්යයන්හිදීත් ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් සිදු කරන්නේ සුළු පටු සේවාවක් නොවේ. විශේෂයෙන්ම හමුදාවේ සියලු සන්නිවේදන කටයුතු සිදුකිරීමේ වගකීම පැවරී ඇත්තේ සංඥා බළකායටයි.

එමෙන්ම රටේ ස්වභාවික ව්‍යසනයක් ඇති වූ විටෙක මෙන්ම නිදහස් උත්සවය, දැයට කිරුළ වැනි දැවැන්ත සංදර්ශන ව්‍යාපෘතිවලදී සන්නිවේදනයේ ප්‍රමුඛයා වූයේ ශ්‍රී ලංකා සංඥා බළකායයි.

එමෙන්ම 1958 සිට පැවැති සියලු අභ්‍යන්තර ආරාවුල් හර්තාල්වලදීද සන්නිවේදන කටයුතුවල පෙරමුණ ගත්තේ සංඥා බළකායයි.

එපමණක්ම නොවේ බොහෝ දෙනෙක් නොදන්නා තවත් සැඟවුණු කරුණක්ද මෙහිලා පැවසිය යුතුය. මෙරට පළමු වරට රූපවාහිනී වැඩසටහනක් මෙහෙයවීමේ ගෞරවයද හිමිවිය යුත්තේ ශ්‍රී ලංකා සංඥා බළකායටය. ඒ මෙරටට රූපවාහිනී තාක්ෂණය පැමිණීමටත් පෙර, එනම් 1970 වසරේදීය.

අතීතයේ සන්නිවේදනය උදෙසා ගිනි දල්වා දුම් පිටකිරීම මෙන්ම පක්ෂීන් අත යවන ලද පණිවිඩ නුවමාරු ක්‍රම ඇතුළු සියල්ල අධ්‍යයනය කරමින් නව තාක්ෂණයද එයට ඇදාගනිමින් සියලු සන්නිවේදන තාක්ෂණය සංවර්ධනය කරා ගෙන යන්නට කටයුතු කළේ ඔවුන්ය.

සංඥා බළකාය ආ මේ ගමනේ බොහෝ තොරතුරු සැඟවී තිබේ. තතු දත්තෝ ඇත්නම් ඒ සුළු පිරිසක් පමණි. එම නිසා කටු අකුලින් පිරි ඒ ගමන් මඟ පිළිබඳව තම හමුදා සේවා කාලය නිම වන්නට පෙර කෘතියක් එළිදැක්විය යුතු යැයි සංඥා බළකා අධිපති ධුරය දැරූ මේජර් ජෙනරාල් ප්‍රභාත් දෙමටන්පිටියට අදහසක් ඇති විය. ඒ සංකල්පය අනුව කටයුතු කිරීමේ වගකීම ඔහු සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරී බ්‍රිගේඩියර් අජිත් වික්‍රමසේකරට පැවරුවේය. බ්‍රිගේඩියර් අජිත් ඒ වගකීම බාර ගත්තේය.

''මට ලැබුණු ඒ අභියෝගයත් සංඥා බළකායේ කටයුතු වගේම සංකීර්ණ භාරධූර කාර්යයක්. අපට සමස්ත හමුදාවේම සන්නිවේදන කටයුතු මෙහෙයවීම පැවරිලා තිබුණෙ. නමුත් ඒ අභියෝගයත් ජය ගන්න ලැබුණා. ඒ අනුව මම SILENT HEROES කෘතියේ කර්තෘවරයා විදිහට අනෙක් රාජකාරි කටයුතු කරන ගමන් ඒ වෙනුවෙන් කැප වුණා. යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාගේත් අනුග්‍රහය හා උපදෙස් අනුව අපි මේ කාර්යය කරගෙන ගියා. යුද හමුදාපතිවරයාගේ උපදෙස් හා අනුග්‍රහය මේ කෘතිය ඉක්මනින් එළි දක්වන්න අපට හැකියාව ලැබුණා.

මේ කෘතිය එළිදක්වන්න අපිට කිහිප දෙනෙක් විශේෂ දායකත්වයක් ලබා දුන්නා. ඒ අතර සොෆ්ට්වේට් ප්‍රින්ටින් ඇන්ට් පැකේජින් අධිපති චමින්ද කාරියවසම් වගේම ලිපි සංස්කරණයේදී අර්ජුන සෙනෙවිරත්නත් කෘතිය සකස් කිරීමේදී ක්‍රිෂාන්ත දයානන්දත් සහාය ලබා දුන්නා. කෘතියේ තියෙන්නෙ සංඥා බළකාය මේ දක්වා ආපු ගමන වගේම දැඩි දුෂ්කරතාවන් අපි ජය ගත්ත හැටි. මේ සංකල්පය මට බාරදුන්නහම ඒකත් මානුෂීය මෙහෙයුමක් වගේ ලොකු වගකීමක් ඇතිව කළ යුත්තක් වුණා. ඒත් ඒ වගකීම අපි බාරගත්තා.

සංඥා බළකාය සංග්‍රාමික අවධියේ විශේෂ කාර්යයක නියැළිලා සිටියේ. සන්නිවේදනය කියන්නෙ නිතරම අලුත් වෙන දෙයක්. අලුත් තාක්ෂණය කියන්නෙ මුදල් ඒ නිසා අපට නිතරම අලුත් වෙන්න බාධා තිබුණා. නමුත් අපි ඒ සියල්ල ජයගත්තේ අවම සම්පත් පරිභෝජනය කරමින්.

පුදුමාතලන් 58 වන සේනාංකයේ මෙහෙයුම් සංඥා මැදිරිය

ඇතැම් වෙලාවට පාවිච්චියට ගන්න බැරිව ඉවත දමා තිබුණු ගුවන් විදුලි යන්ත්‍ර පවා අපි යළි සකසා ප්‍රයෝජනයට ගත්තා. මෙහිදී යුද සන්නිවේදන තාක්ෂණයේදී අනිවාර්යෙන්ම අප අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් දෙකක් තියෙනවා. එකක් අපේ රහස්‍ය භාවය ආරක්ෂා කර ගැනීම නැත්නම් සතුරා අතට තොරතුරු පත්වීම වළක්වා ගැනීම. ඒ වගේම අපේ පණිවුඩය ලබන්නාට ඒ පණිවුඩය පැහැදිලි විය යුතුයි. ඒ සඳහා අප තාක්ෂණයෙන්ම අනුගත වුණා.

විශේෂයෙන්ම අපට යුද කටයුතුවලදී අනිවාර්යෙන්ම සන්නිවේදන පාලනයකට පවා ලක් විය යුතු වනවා. එසේ නොවුණහොත් සතුරාට අපි ඉන්න තැන් සොයා ගන්න පුළුවන් වෙනවා. මේ නිසා ආරම්භක සමයේ අපි පණිවිඩ වෙනුවෙන් විවිධ සංකේත (කෝඩ්) භාවිත කළා. උදාහරණයක් හැටියට 'ඇල්ෆා' යන්න වෙනුවෙන් ඉලක්කමක් භාවිත කළා වන්නට පුළුවන්. ඒ සියලු කටයුතු මැද අපි 1994 වසරේ සිට පාබල රාජකාරි වෙනුවෙන් හමුදාව සූදානම් කළා. එමෙන්ම අවසන් මානුෂීය මෙහෙයුමේදී බළඇණි 5ක් ස්ථාපිත කරා.

ඒ සියලුම කටයුතු මේ කෘතියේ අන්තර්ගත වෙනවා. නිහඬව අප ආ ගමන් මඟ තමයි මේ කෘතියෙන් අප එළි දක්වා තිබෙන්නේ''

ශ්‍රී ලංකා සංඥා බළකාධිපතිව සිටි මේජර් ජෙනරාල් ප්‍රභාත් දෙමටන්පිටිය විසින් SILENT HEROES කෘතිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් වෙත පිළි ගැන්වූ අයුරු. යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාද මෙහි සිටී.

යෞවනය යුද බිමේ සිට සංඥා බළකායට එක්කර තිබේ.

හමුදාවක සංඥා බළකායේ කාර්යය ශරීරය රැක දීමට ශරීරයේ ස්නායු පද්ධතිය සිදු කරන්නා වූ මෙහෙය හා සමානය. උතුරේ යුද්ධය පවතිද්දී දකුණේ ඇති වූ කැරැල්ල මැඩ පැවැත්වීම වෙනුවෙන්ද හමුදාවට සිදු වූ අතර ඒ සියලු කටයුතු වෙනුවෙන් සංඥා බළකාය ඉටු කරන ලද්දේ නොපසුබස්නා මෙහෙවරකි. බ්‍රිගේඩියර් අජිත් වික්‍රමසේකරයන් පවසන්නේ යුද්ධයක් පවතිද්දී වුවද එක් එක් බළකායන්ට අනුව ලබා දිය යුතු සංඥා වෙනස් හෙයින් ඒ එක් එක් අංශයන්ට අනුකූලව සංඥා ලබා දීම සිදු කළ යුතු වූ බවයි.

උදාහරණයක් ලෙස කාලතුවක්කු බළකායට වෙනමම සංඥා පද්ධතියක් සකස් කළ යුතු අතර සන්නාහ සන්නද්ධ බළකායට වෙනමම සංඥා පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. දිගුදුර විහිදුම් බළකායට වෙනම සංඥාවන් ලබා දිය යුතු බවද ඔහු පෙන්වා දෙයි.

එමෙන්ම ගුවන් හමුදා ප්‍රහාරයන්ද මේ සටන් හා එක්වන කල්හි ඒ වෙනුවෙන් වෙනමම සංඥා ස්ථාපිත කළ යුතු වේ. මේ සියලු කටයුතු සිදු කෙරෙන අතරතුරු රගර් ඇතුළු ක්‍රීඩාවන් කෙරෙහිත් සියලුම සංඥා බළකායේ පිරිස් යෙදී කටයුතු කරති.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ද සංඥා බළකායේ නිලධාරියෙක් වූ අතර බ්‍රිගේඩියර් අජිත් වික්‍රමසේකරයන් විසින් සංස්කරණය කළ කෘතිය ජනාධිපතිවරයාට පිළි ගන්වන ලද්දේ ශ්‍රී ලංකා සංඥා බළකා අධිපති ධුරය දැරූ මේජර් ජෙනරාල් ප්‍රභාත් දෙමටන්පිටිය විසිනි.

SILENT HEROES **කෘතියේ ප්‍රධාන කර්තෘ බ්‍රිගේඩියර් අජිත් වික්‍රමසේකර**

වත්මන් බලකාධිපති මේජර් ජනරාල් අශෝක පීරිස් ද මේ බළකායේ ඉදිරි කටයුතු වෙනුවෙන් දැඩි සේ ඇප කැප වී කටයුතු කරනු ලැබේ.

අද වනවිට ශ්‍රී ලංකා සංඥා බළකාය ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයක් , තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයක්, සයිබර් තාක්ෂණ බළසේනා මූලස්ථානයක්ද රෙජිමේන්තු මධ්‍යස්ථානයකින්ද ආවේනික සංඥා රාජකාරි නිත්‍ය ඒකක 6කින්ද ස්වේච්ඡා ඒකකයකින්ද තොරතුරු තාක්ෂණ නිත්‍ය ඒකක දෙකකින්ද සයිබර් ආරක්ෂණ ඒකකයකින්ද නිත්‍ය සන්නිවේදන තාක්ෂණ ඒකකයකින්ද සංඥා පුහුණු පාසලකින්ද විදූත් සංග්‍රාමික බළගණයකින්ද සමන්විත වේ.

මෙරට සන්නිවේදන ක්‍රියාවලියේ විශේෂ පුරෝගාමියකු ලෙස කටයුතු කරන යුද හමුදාවේ ශ්‍රී ලංකා සංඥා බළකාය වසර 77ක් ආ ගමන එක් රැස් කරන්නට වසර 3ක කාලයක් ගතවිය. මේ කෘතියේ අඩංගුව ඇති මෙහෙයුම් අතර උතුරේ යුද්ධයේ ආරම්භයේ සිට අද දක්වාම ආ ගමනේ විස්තර අතර මෙරට මානුෂීය මෙහෙයුම දක්වා වූ යුද හමුදාවේ යාල්දේවි වඩමාරච්චි රිවිරැස මෙන්ම අවසන් මානුෂීය මෙහෙයුම් දක්වාම ශ්‍රී ලංකා සංඥා බළකායේ මෙහෙයුම් SILENT HEROES කෘතියේ අඩංගුව තිබේ.

එමෙන්ම මාන්කුලම් හමුදා කඳවුර බිඳ වැටීමේදී මෙන්ම යාපනය කොටුව දින 45ක් ත්‍රස්තවාදීන් වටකර පහර දෙද්දී මෙන්ම මඩකළපුව කිරාන් කඳවුර දින 9ක් තිස්සේ වටකර පහර දෙද්දී වුවද සංඥා ලබා දීමට කටයුතු කළ ආකාරයද SILENT HEROES කෘතියේ අන්තර්ගතය. ශ්‍රී ලංකා සංඥා බළකායේ ආ ගමන්මඟ මෙන්ම යා යුතු ගමන් මඟටද පාර කියා දෙන 'නිහඬ විරුවන්' අවදි කළ අවස්ථාවක් ලෙස මෙය හැඳින්විය හැකිය.

කොටි මර්දනයට පෙරමුණ ගත් කෆීර් යානා විස්කම්

● භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

වසර තිහකට ආසන්න කාලයක් මෙරටට මහා විනාශයක් සිදු කරමින් ජනතාව භීතියට පත් කළ කොටි ත්‍රස්තවාදය මානුෂීය මෙහෙයුම මඟින් අවසන් කර වසර එකොළහක් ගතව තිබේ.

මානුෂීය මෙහෙයුම ලෝකයේම ජනතාවගේ මතකයේ රැඳෙන්නට තරම් විශිෂ්ට ලෙස ජය ගන්නට මෙරට රණවිරුවන් දක්ෂ විය.

ගුවනින්, මුහුදෙන් මෙන්ම ගොඩබිමෙන් සන්නද්ධව සිටි කොටි ත්‍රස්තවාදීන් පරාජය කිරීම සඳහා මෙරට හමුදාවන්ට විවිධ උපක්‍රම භාවිතා කිරීමට සිදු විය.

